# අභිමානයෙන් යුතු ශක්තිමත් බැංකුවක්



ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ඒකාබද්ධ වාර්ෂික වාර්තාව

2024



# අභිමානයෙන් යුතු ශක්තිමත් බැංකුවක්

අයෝමය ශක්තියකින් සවිමත් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව, එතුලින් සිය ඔරොත්තුදීමේ හැකියාව සංකේතවත් කරයි. අපගේ පුරාවෘත්තය අභියෝග, අධිෂ්ඨානය සහ ඔරොත්තුදීමේ හැකියාව වටා ගෙතී ඇත. විශේෂඥතාව, නොසැලෙන කැපවීම මතින් අපි නොනිමි ශක්තියක් වර්ධනය කරගන්නෙමු. අනාගතය දෙස බැලීමේදී ශක්තිය වර්ධනය කරගැනීම උදෙසාවූ අපගේ කැපවීම ස්ථාවරව පවතින අතර, බැංකු ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වය මගින් අර්ථ දක්වා ඇති අනාගතයක් කරා අපි පියනගන්නෙමු.

**අභිමානයෙන් යුතු ශක්තිමත් බැංකුවක්**

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව**
**ඒකාබද්ධ වාර්ෂික වාර්තාව 2024**

**©ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

ISBN 978-624-5790-10-4

---

2022



2023



2024



පසුගිය වසර තුන තුළ, බැංකුව සිය වංශ කතාව ඔරොත්තු දීමේ හැකියාව, නව්‍යකරණය, විශිෂ්ටත්වයට පත් කිරීම යන ත්‍රිත්ව ආකාරයකින් සනිටුහන් කර ඇත. එය අපගේ නොනවතින උනන්දුව සහ අරමුණු කේන්ද්‍රීය කැපවීමට සාක්ෂියකි. ගැඹුරු අවිනිශ්චිතතාවයකින් යුත් කාලයක සිට, බැංකුව **අපගේ ශක්තිය වඩාත් කුළුගන්වමින්,** ආර්ථික කම්පනවලට ඔරොත්තු දීම සඳහා එහි අත්තිවාරම් ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර එහි ජනතාවට සේවය කිරීම අඛණ්ඩව කරගෙන ගියේය. තත්වයන් ක්‍රමයෙන් යහපත් අතට පත්වන විට, **NSB දිරියෙන් යුතුව අපගේ ශක්තිය කුළුගන්වමින්,** අභිප්‍රායෙන් පරිවර්තනය වීමට, උපාය මාර්ග නැවත සකස් කිරීමට, නවෝත්පාදනයන් වැළඳ ගැනීමට සහ ජාතික ප්‍රගතිය තුළ එහි කාර්යභාරය නැවත තහවුරු කිරීමට කැපවී සිටියේය. අද වන විට, ආපදා තුලින් ලද පන්නරයෙන් ශක්තිමත්ව, යාවත් කාලීනව, අත්දැකීම් මඟින් ශක්තිමත්ව, ජාතියක විශ්වාසය, නව්‍යකරණය වූ අරමුණු, ස්ථාවරත්වය සහ ශක්තිය ඉදිරියට ගෙන යන **අභිමානයෙන් යුතු ශක්තිමත් බැංකුවක්** ලෙස ස්ථානගත වී ඇත.

# පටුන


අපගේ ඒකාබද්ධ වාර්තාව ගැන 04

ඒකාබද්ධ වාර්තාව

සංයුක්තය

## පූර්විකාව 09

| | |
|---|---|
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව කෙටියෙන් | 10 |
| සන්ධිස්ථාන | 12 |
| නිමැවුම් සහ සේවා | 13 |
| වැදගත් තොරතුරු | 14 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 16 |
| සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය | 20 |

## අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය 26

| | |
|---|---|
| මෙහෙයුම් පරිසරය | 27 |
| අවදානම් සහ අවස්ථා | 32 |
| ප්‍රමාණාත්මකභාවය | 39 |
| ඒකාබද්ධ පාර්ශවකාර සහභාගිත්වය | 52 |
| අපගේ තිරසාර රාමුව | 60 |
| ව්‍යාපාර ආදර්ශය | 64 |
| උපායමාර්ග හා සම්පත් වෙන් කිරීම | 68 |

## කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය 81

| | |
|---|---|
| ව්‍යාපාර අංශ සමාලෝචනය | 82 |
| මූල්‍ය ප්‍රාග්ධනය | 92 |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | 102 |
| මානව ප්‍රාග්ධනය | 108 |
| බුද්ධිමය ප්‍රාග්ධනය | 120 |
| සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | 128 |
| ස්වාභාවික ප්‍රාග්ධනය | 146 |

| | |
|---|---|
| ආයතනික පාලනය පිළිබඳ ප්‍රකාශය | 152 |
| අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය | 153 |
| ස්වාධීන සහතිකවීමේ ප්‍රකාශය | 155 |

## පාලනය 159

| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය | 160 |
| ආයතනික කළමනාකාරිත්වය | 164 |
| විධායක කළමනාකාරිත්වය | 165 |
| ප්‍රධාන කළමනාකරුවන් | 168 |
| ආයතනික පාලනය | 169 |
| අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව | 184 |
| අධ්‍යක්ෂක මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව | 187 |
| අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව | 189 |
| අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව | 191 |
| හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව | 193 |
| අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව වාර්තාව | 194 |
| අවදානම් කළමනාකරණ වාර්තාව | 195 |

## මූල්‍ය වාර්තා 221

| | |
|---|---|
| මූල්‍ය දින දර්ශනය | 222 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 223 |
| මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය | 229 |
| මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය | 230 |
| අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව | 232 |
| සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ වගකීම පිළිබඳ ප්‍රකාශය | 233 |
| විගණකාධිපති වාර්තාව | 234 |
| මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය | 237 |
| ආදායම් ප්‍රකාශය | 238 |
| විස්තීරණ ආදායම් ප්‍රකාශය | 239 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 240 |
| හිමිකමේ වෙනස්වීමේ ප්‍රකාශය | 242 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 246 |
| මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් | 248 |

## අතිරේක තොරතුරු 393

| | |
|---|---|
| 2007 අංක 12 දරන බැංකු පනතේ නියාමනයන් සමඟ අනුකූල වීම | 394 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා යහපරිච සංග්‍රහය 2023 (the code) සමඟ අනුකූලතාවය | 413 |
| ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතා | 419 |
| 2016 අංක 01 දරන බැංකු පනතේ නියෝගයෙහි III උපලේඛන ප්‍රකාර බාසල් III හෙළිදරව් කිරීම් | 426 |
| දේශීය පද්ධති අනුව වැදගත් බැංකු තක්සේරු කිරීමේ ව්‍යවහාරය - 2024 | 438 |
| මධ්‍ය නිර්ණායක සමඟ අනුකූල අන්තර්ගත දර්ශක | 440 |
| ආදායම් ප්‍රකාශය (ඇමරිකානු ඩොලර්) | 444 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය (ඇමරිකානු ඩොලර්) | 445 |
| මූල්‍ය තත්ත්වය ප්‍රකාශය (ඇමරිකානු ඩොලර්) | 446 |
| සංඛ්‍යාලේඛනාත්මක දර්ශකයන් 2015 -2024 | 447 |
| තැන්පතු විශ්ලේෂණය | 448 |
| ආදායම් ප්‍රකාශය පිළිබඳ තිරස් විශ්ලේෂණය | 449 |
| ආදායම් ප්‍රකාශය පිළිබඳ සිරස් විශ්ලේෂණය | 449 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ තිරස් විශ්ලේෂණය | 450 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ සිරස් විශ්ලේෂණය | 451 |
| අනුරූප බැංකු | 452 |
| හුවමාරු සමාගම් | 453 |
| මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂිත වචන මාලාව | 454 |
| ආයතනික තොරතුරු | 460 |

# අපගේ ඒකාබද්ධ වාර්තාව ගැන



GRI 2-3




ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2024 දෙසැම්බර් 31ක් අවසන් වූ මූල්‍ය වසර ආවරණය කරමින් එහි 10 වැනි ඒකාබද්ධ වාර්තාව ඉදිරිපත් කරන්නේ අරමුණු පිළිබඳ හැඟීමෙන් සහ ඉමහත් අභිමානයෙනි. මෙම වාර්තාව සම්ප්‍රදායික මූල්‍ය වාර්තාකරණයෙන් ඔබ්බට ගමන්කර බැංකුවේ කාර්යසාධනය, උපායමාර්ගය, පාලනය හා අප ක්‍රියාත්මක වඩාත් පුළුල් අන්තර්ගතය පිළිබඳ විස්තීර්ණ හා විනිවිද වාර්තාවක් පිරි නමයි.

ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුවේ (<IR>) මූලධර්ම සමග පෙළ ගැසී සකස් කළ, මෙම වාර්තාවෙන් ඒකාබද්ධ චින්තනය කෙරෙහි අපගේ කැපවීම පිළිබිඹු කරන අතර ඒ තුළ මූල්‍ය හා මූල්‍ය නොවන අංගයන් බැංකුව කාලයත් සමග තිරසාර වටිනාකම නිර්මාණය කරන ආකාරය පිළිබඳ සම්පූර්ණ කථාව පවසන අතරම එකිනෙකට සම්බන්ධ කෙරේ. වැඩිවන සංකීර්ණ හා වෙනස්වන මෙහෙයුම් පරිසරයක් හඹායමින් සහ අපගේ විවිධ පාර්ශවකාර පදනමේ අපේක්ෂාවන්ට වගකීමෙන් ප්‍රතිචාර දක්වමින් අපගේ උපායමාර්ගික පරමාර්ථ ලබාදීමේ දී අප සිදුකර ඇති ප්‍රගතිය එය ග්‍රහනය කරයි.

සැලකියයුතු පරිනාමනයන් සලකුණු කළ වසරක් තුළ, මෙම වාර්තාව මගින් ඩිජිටල් පරිවර්තනය වේගවත් කරමින්, ගනුදෙනුකාර විශ්වාසය ශක්තිමත් කරමින් හා සිය මෙහෙයුම්වල කේන්ද්‍රයේ තිරසාරභාවය ඇතුළත් කරමින් බැංකුව සිය ආයතනික ඔරොත්තුදීමට අනුවර්තනයවන, වෙනස් වන හා ශක්තිමත් කරන ආකාර පිළිබඳ අවබෝධයන් ලබා දේ. එමෙන්ම ඉන් අපගේ ව්‍යාපාර ආදර්ශය ආර්ථික තත්ත්වයන්, තාක්ෂණික වර්ධනයන් හා නියාමන අවශ්‍යතා සහ පාරිසරික වගකීම් අතර ගතික අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය මගින් අඛණ්ඩවම හැඩ ගස්වනු ලබයි.

ඒකාබද්ධ දර්ශනයක් ඉදිරිපත් කරමින්, බැංකුව විසින් අපගේ ජාතික වගකීම දරාගනිමින් තුලනාත්මක වර්ධනයක් සාක්ෂාත් කර ගැනීමට සිය සයවැදෑරුම් ප්‍රාග්ධනය එනම් මූල්‍ය, නිෂ්පාදිත, මානව, බුද්ධිමය, සමාජ හා සම්බන්ධතා සහ ස්වභාවික ප්‍රාග්ධනය භාවිතා කරන ආකාරය පෙන්වා දීමට අපි උත්සාහ කරමු. එමෙන්ම අප බැංකුව, අනාගතයට මුහුණ දියහැකි බැංකුවක් සහ වේගයෙන් වෙනස වන ලෝකය සමග අනුගත වීමට ගන්නා ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ අන්තර්ගත වේ. තවද ඒ තුළින් ධනාත්මක, අන්තර්ගත සහ විශාල වශයෙන් ප්‍රතිපල ලැබෙන බලපෑමක් අප සහතික කරයි.

මෙම වාර්තාව අප වර්තමානයේ ස්ථානගතවී සිටින ස්ථානය පිළිබඳ පිළිබිඹුවක් පමණක් නොවන අතර එය අපගේ ගනුදෙනුකරුවන්, අපගේ සේවකයින්, අපගේ ව්‍යාපාරික පාර්ශ්වකරුවන් සහ අවසාන වශයෙන් ජාතිය සඳහා දිගු කාලීන වටිනාකම නිර්මාණය කිරීම කෙරෙහි අපගේ නොසැලෙන අවධානය පිළිබඳ සාක්ෂියක් ද වේ.

## මෙම වාර්තාව කියවීම හා සංචලනය

මෙම වාර්තාව කියවීමේ හැකියාව වැඩි කිරීමට සංචලනය වර්ධනය කිරීමට අනෝන්‍ය වශයෙන් ක්‍රියාකරන අංග සහ සලකුණු විදහා දක්වන අතර ඒකාබද්ධ චින්තනය කෙරෙහි අපගේ කැපවීම පිළිබිඹු කරමින් ප්‍රධාන අංශ අතර සම්බන්ධතාව ඉස්මතු කොට දක්වයි. වාර්තාව පුරා භාවිතා කර ඇති සලකුණු සඳහා මඟපෙන්වීමක් පිටු අංක 8හි දැක්වේ.

## අපගේ වාර්තාකරණ රාමු හා අනුකූලතාව

මෙම වාර්තාව පිළියෙල කිරීමේදී, අදාළ අනාවරණ අවශ්‍යතා සහ මනා පරිචයන් සමග පෙළ ගැසීම සහතික කරමින් ආයතනික වාර්තාකරණ හා නියාමන රාමු පිළිබඳ පුළුල් පැතිකඩකට අපි අනුගත වී ඇත. අපගේ කැපවීම අනුකූලතාවයෙන් ඔබ්බට විහිදෙන අතර ඉන් විනිවිදභාවය, වගවීම සහ වාර්තාකරණ අඛණ්ඩතාවය පිළිබඳ උසස් ප්‍රමිති කරා අපගේ කැපවීම පිළිබිඹු කරයි.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
- <IR> IFRS පදනමේ රාමුව (www.theiirc.org)
- ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) තිරසාර වාර්තාකරණ මාර්ගෝපදේශ GRI ප්‍රමිති (www.globalreporting.org)
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය
- තිරසාර සංවර්ධන අරමුණු (SDGs) - එක්සත් ජාතීන්ගේ අපේක්ෂිත ගෝලීය අරමුණු 17 සමග මූලපිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියෝග සහ මාර්ගෝපදේශ
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) රෙගුලාසි හා නියෝග
- 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත හා එහි සංශෝධන
- 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන

## අපගේ විෂයපථය හා වාර්තාකරණ සීමාව GRI 2-4

අපගේ වාර්තාකරණයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව (මෙහි මින්මතු "බැංකුව" ලෙස හඳුන්වනු ලබන) සමග ඊට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගම් වන එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (සාමූහිකව"සමූහය" ලෙස හඳුන්වනු ලබන) ආවරණය වේ. මූල්‍ය තොරතුරු බැංකුව සහ සමූහය සඳහා ඉදිරිපත් කරන අතර, මූල්‍ය නොවන අනාවරණ මූලිකවම වෙනත් ආකාරයෙන් දක්වා ඇතිනම් මිස බැංකුවට අදාළ වේ.

මෙම වාර්තාව මූල්‍ය හා තිරසාර වාර්තාකරණය සඳහා අපගේ වාර්ෂික චක්‍රය හා අනුගත 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය වර්ෂය ඇතුළත් වේ.

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලත් දිනය වන 2025 පෙබරවාරි 28 දින තෙක් වැදගත් පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම් ද ඇතුළත් වේ. විෂය පථය හා අංශ සීමාවන් අනුව පෙර වාර්තාකරණ කාලසීමාවන්ට සාපේක්ෂව සැලකියයුතු වෙනස්කම් නොමැති නමුත්, සංසන්දනාත්මක දත්තවල නැවත ප්‍රකාශ කිරීම් හෝ නැවත වර්ගීකරණයන් අදාළ අංශවල විධිමත්ව පැහැදිලි කෙරේ.

මූල්‍ය අනාවරණවලින් ඔබ්බට, මෙම වාර්තාවෙන් අපගේ මූල්‍ය නොවන කාර්යසාධනය පිළිබඳ විස්තරාත්මක දැක්මක් ලබා දෙන අතර, මෙහෙයුම් පරිසරය, අවදානම් හා අවස්ථා, ප්‍රමාණාත්මක කරුණු, ඒකාබද්ධ පාර්ශවකාර සහභාගිත්වය, උපායමාර්ගික දිශානතිය, සහ අපගේ ව්‍යාපාර ආදර්ශය හා පාලනය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර විස්තර කරයි.

මෙම වාර්තාව තවදුරටත් 2024 වසර තුළ බැංකුවේ උපායමාර්ගික ඉහළයාම් ග්‍රහනය කරන අතර, අපගේ කෙටි සිට මධ්‍ය කාලීන ප්‍රමුඛතා ඉදිරි වසර දෙකේ සිට තුන දක්වා පෙළ ගැසුණු මූල්‍ය හා මූල්‍ය නොවන පරමාර්ථ සහ ජයග්‍රහන විස්තර කරයි. එමෙන්ම එය ආයතනික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට බැංකුව සනිටුහන් කරමින් සිටින දිගු පරාශයක උපායමාර්ගික ගමන්මඟ සකස් කරන අතර, ශ්‍රී ලංකාවේ ගතික ආර්ථික වාතාවරණය හමුවේ දිගුකාලින අදාළත්වය සහතික කර, අපගේ දැක්ම වසර පහේ සිට දහය දක්වා සහ ඉන් ඔබ්බට ඉදිරි දැක්මක් සහිත සිමාවක් තුළ සකස් කරයි.

## සීමාව හා විෂය පථය

**ඒකාබද්ධ වාර්තාකරණ සීමා**

පහත ත්‍රිත්වය මගින් පැන නගින අවදානම්, අවස්ථා හා ප්‍රතිඵල ආවරණය කරයි.

| | |
|---|---|
| මෙහෙයුම් පරිසරය | පිටු අංක 27 - 31 |
| දැරියහැකි සහ ලබාගතහැකි ප්‍රාග්ධනය ඇතුළුව ව්‍යාපාර ආදර්ශය | පිටු අංක 64 - 67 |
| උපාය මාර්ගික හා සම්පත් වෙන් කිරීම | පිටු අංක 68 - 79 |
| ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය | පිටු අංක 52 - 59 |
| සයවැදෑරුම් ප්‍රාග්ධන භාවිතය හා බලපෑම (FC, MC, HC, IC, SRC, NC) | පිටු අංක 92 - 151 |

**අපගේ මූල්‍ය වාර්තාකරණ සීමා**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**පරිපාලිත සමාගම්**

ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිලිබඳ කෙටියෙන් යන සටහනෙහි පිටු අංක 11 හි මුළුමනින්ම අයිති පරිපාලිත සමාගම් ද්විත්වය දක්වා ඇත

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2024 ජනවාරි 1 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය වර්ෂය, කාර්යසාධන තොරතුරු මගින් ආවරණය වේ. මෙදිනෙන් පසු හා මෙම වාර්තාවේ අනුමැතිය දක්වා දිනට සැලකියයුතු හෝ වැදගත් සිදුවීම් මීට ඇතුළත් කර ඒ අනුව සටහන් කර ඇත.

# අපගේ ඒකාබද්ධ වාර්තාව ගැන



ඒකාබද්ධ චින්තනය

## අපගේ තිරසාර වටිනාකම ඇති කිරීම

බැංකුවේදී, ඒකාබද්ධ චින්තනය යන්න මූලධර්මයක් පමණක් නොවන අතර, එය අප ක්‍රියාත්මක වන, තීරණ ගන්නා සහ දිගු කාලීන වටිනාකම නිර්මාණය කරන ආකාරය තහවුරු කරන ප්‍රධාන විනයකි. වෙනස්වන වාතාවරණයක් තුළ අවස්ථා සහ අවදානම්වලට ඵලදායීව ප්‍රතිචාරය දැක්වීමට අපගේ උපායමාර්ගය, පාලනය සහ පාර්ශවකාර සම්බන්ධතා අප සම්බන්ධ කරන ආකාරය හැඩ ගස්වයි.

මෙම ප්‍රවේශය මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රාග්ධනයන් සම්බන්ධ කිරීම මගින් අපගේ ව්‍යාපාර ආදර්ශය පිළිබඳ සාකල්‍ය දැක්මක් ඉන් දිරිගන්වන අතර, වටිනාකම නිර්මාණය යනු අන්තර්ගතබව සහ තිරසාරභාවය යන දෙකම බව සහතික කරයි. ඒකාබද්ධ චින්තනය තුළින්, කාර්යසාධනය පිළිබඳ කෙටිකාලීන අවශ්‍යතාව ඔරොත්තුදීම, නව්‍යකරණය, සහ වගකීම්සහගත වර්ධනය පිළිබඳ දිගු කාලීන විධානයන් අපි තුලනය කරමු.

උපාය මාර්ගික කළමනාකරණය හා අවදානම් කළමනාකරණයේ සිට පාර්ශවකාර සහභාගිත්වය හා ප්‍රාගධන වෙන් කිරීම දක්වා ආයතනයේ සෑම මට්ටමක් හරහාම ඒකාබද්ධ චින්තනය ඇතුළත් කරමින්, අපි ප්‍රතිඵල අත්කර ගැනීමට මනාව සන්නද්ධ වී ඇති අතර ඉන් අපගේ කොටස්හිමියන් පමණක් නොව ගනුදෙනුකරුවන්,සේවකයින් ප්‍රජාවන් සහ අවසානයේ දී ජාතිය ප්‍රතිලාභ ලබයි.

මෙම මනෝභාවය කඩිසර, අනාගතයට සූදානම් සහ අරමුණ මත පදනම්ව රැඳී සිටීමට ඉඩදෙන අතර, සදාචාරාත්මක පදනමක් ඇති, සමාජීය වශයෙන් වගකීම්සහගත, සහ පාරිසරිකව දැනුවත් ආකාරයකින් අපි වටිනාකම අඛණ්ඩව ලබාදෙන බව සහතික කරයි.

## ප්‍රමාණාත්මතාව

ප්‍රමාණාත්මතා තක්සේරුව අපගේ ඒකාබද්ධ චින්තනය ප්‍රවේශයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව සකස් කරන අතර, බැංකුවේ දිගුකාලීන තිරසාරභාවය නගා සිටුවන හා පාර්ශවකාර වටිනාකම් වැඩි කරන දැනුවත් තීරණ ගැනීමට මඟ පෙන්වයි. මධ්‍ය - සහ දිගු කාලීන ගම්‍යාර්ථ සලකා බලන සාකල්‍ය දර්පන තුළින් තක්සේරු කළ වෙනස්වන කාලසීමාවන් පුරා වටිනාකම උත්පාදනය කර පවත්වා ගැනීමට අපට ඇති හැකියාවට අර්ථවත් අයුරින් බලපෑම් කරන කරුණු අපි ප්‍රමාණාත්මක කරුණු ලෙස සලකයි.

තුලනාත්මක හා විස්තරාත්මක දැක්මක් සහතික කිරීමට, බැංකුව ද්විත්ව ප්‍රමාණාත්මක දර්ශනයන් යොදා ගන්නා අතර ඒවා ආර්ථික වටිනාකම නිර්මාණය කිරීමට හෝ සුරක්ෂිත කිරීමට අපට ඇති හැකියාවට බලපාන කරුණු පිළිබිඹු කරන මූල්‍ය ප්‍රමාණාත්මකතාව සහ පරිසරිය, ප්‍රජාවන් සහ සමාජය කෙරෙහි අපගේ වඩා පුළුල් බලපෑම් සලකා බලන බලපෑම් ප්‍රමාණාත්මකතාව තුළින් අගය කරයි. මෙම වාර්තාව එක් එක් ප්‍රමාණාත්මක කරුණ එයට අදාළ සංදර්භය තුළ පිහිටුවන අතර බැංකුවේ උපායමාර්ගික සහ මෙහෙයුම් ප්‍රමුඛතාවන් තහවුරු කරමින් විවිධ කාලසීමාවන් හරහා වටිනාකම හැඩගැස්වීමට, රඳවා ගැනීමට හෝ වටිනාකම ඛාදනය වීමට විභවතාව ඉස්මතු කර දක්වයි.

### ගතික ප්‍රමාණාත්මකතාව

අඛණ්ඩව වෙනස්වන මෙහෙයුම් වාතාවරණය අපගේ ව්‍යාපාරයට වඩා වැදගත්වන බලපෑම සඳහා එහි විභවතාව අපි හඳුනා ගනිමු. ඒ අනුව, අපි වාර්ෂික, අදාළ සහ ප්‍රතිචාරාත්මකබව සහතික කිරීමට බරපතල, ප්‍රමාණාත්මක සමාලෝචනයක් සිදු කරමු. අපගේ වාර්තාකරණය වටිනාකම නිර්මාණය කිරීමට හා දරා ගැනීමට අපට ඇති හැකියාව හැඩගස්වන ගැටළු පිළිබඳ අස්ථිර හා ගතික ස්වභාවය ග්‍රහනය කරන බව අපට විශ්වාසය.

## අපගේ වාර්තාකරන ව්‍යුහය වැඩිදියුණු කිරීම

තොරතුරු පිළිබඳ වර්ධිත සම්බන්ධතාව

ප්‍රාග්ධනයන්, උපායමාර්ගය, සහ අංශමය කාර්යසාධනය පිළිබඳ වර්ධිත අනාවරණය

වර්ධිත කියවීමේ හැකියාව හා සැලැස්ම



## ඉදිරි දැක්ම

ඉදිරි දැක්ම තොරතුරු පහත තීරණාත්මක ප්‍රශ්ණ විසඳයි. "අපගේ උපායමාර්ග දියත් කිරීමේදී අපට කුමණ අභියෝග, අවස්ථා හා අවිනිශ්චිතතාවයන්ට මුහුණපෑමට සිදුවේද? අපගේ ව්‍යාපාරික ආකෘතියට හා අනාගත කාර්යසාධනයට ඇති විය හැකි බලපෑම් කවරේද?" මෙම ඉදිරිය දකින දර්ශනයන් පහත සඳහන් අංශවලට දැඩි අවධාරණයක් සහිතව මෙම වාර්තාව තුළ දක්වා ඇත.



සභාපතිගේ පණිවිඩය
පිටුව 18



සාමාන්‍යාධිකාරිගේ පණිවිඩය
පිටුව 24

මෙහෙයුම් වාතාවරණය
පිටු අංක 27 - 31

උපායමාර්ගික හා සම්පත් වෙන්කිරීම
පිටු අංක 74 - 79

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 94 - 101

නිෂ්පාදිත ප්‍රාග්ධනය
පිටුව 107

මානව ප්‍රාග්ධනය
පිටුව 119

බුද්ධිමය ප්‍රාග්ධනය
පිටු අංක 127

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
පිටු අංක 136 - 145

ස්වභාවික ප්‍රාග්ධනය
පිටුව 151

## අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් ප්‍රකාශය

මෙම ඒකාබද්ධ වාර්තාකරණයෙහි අඛණ්ඩතාව, නිරවද්‍යතාව සහ විනිවිදභාවය සඳහා ඇති වගවීම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පාලන ආකෘතියෙහි භාරකරුවන් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු හා සහතික කරනු ලබයි. එමෙන්ම මෙම වාර්තාවෙන් බැංකුවේ කාර්යසාධනය, උපාය මාර්ගික දිශානතිය, අවදානම් පැතිකඩ හා පාර්ශවකාර බලපෑම්වල සත්‍ය හා තුලනාත්මක පිළිබිඹුවක් ඉදිරිපත් කරන බවත්, කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දිගුකාලීනව තිරසාර වටිනාකම් උත්පාදනයට එහි හැකියාව පිළිබඳව පැහැදිලි දැක්මක් පිරිනමන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයට විශ්වාසය.

මෙම වාර්තාව කළමනාකරණයේ නිසි අධීක්ෂණය සමඟ සහ ශක්තිමත් අභ්‍යන්තර හා බාහිර සහතික කිරීමේ ක්‍රියාවලිය තුළින් පූර්ණ වලංගු කිරීම සමඟ ඒකාබද්ධ වාර්තාකරණ රාමුවේ මූලධර්මවලට අනුගතව ඒකාබද්ධ වාර්තාව සම්පාදනය කර ඇත. වාර්තාවේ අන්තර්ගතය සහ වගකීම්සහගත, වටිනාකම පදනම් වාර්තාකරණය වෙත බැංකුවේ බැඳීම තුළ එහි කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩලය ඉටු කරයි.

**ආචාර්ය හර්ෂ කබ්රාල් ජනාධිපති නීතිඥ**
සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

**ජුඩ් නිලුක්ෂාන්**
නිල බලයෙන් පත් අධ්‍යක්ෂ ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ

**එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර**
නිල බලයෙන් පත් අධ්‍යක්ෂ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

**දුෂ්‍යන්ත බස්නායක**
ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ

**අශේන් ජයසේකර**
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

## ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය

මෙම වාර්තාව තුළ අපගේ වර්තමාන තක්සේරු කිරීම් සහ අපේක්ෂාවන්නේ ව්‍යුත්පන්න වන බැංකුවේ අනාගත කාර්ය සාධනය සහ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් ඉදිරිය දකින ප්‍රකාශයන් ඇතුළත්ය. කෙසේ වෙතත්, මතුවන විවිධ අවදානම්, අවිනිශ්චිතතාවයන්, සහ වෙනත් වැදගත් සාධක බැංකුවේ ව්‍යාපාරික කටයුතු සහ මූල්‍ය ප්‍රතිඵලවලට සෘණාත්මක බලපෑම් එල්ල කරමින් අපගේ මූලික අපේක්ෂාවන්ගේ ප්‍රතිඵලය ප්‍රමාණාත්මකව වෙනස් කළ හැකි බව සඳහන් කිරීම වැදගත්ය.

## විමසීම්

GRI 2-3

මෙම වාර්තාව සම්බන්ධයෙන් ඔබේ අදහස් හා යෝජනා අප අගය කරන අතර ඒවා පහත දැක්වෙන ලිපිනයට යොමු කළ හැකිය:

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
මුදල් හා සැලසුම් අංශය
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ

## සංචලන සළකුණු

### ප්‍රාග්ධනයන්

| FC | MC | HC | IC | SRC | NC |
|---|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | නිෂ්පාදිත ප්‍රාග්ධනය | මානව ප්‍රාග්ධනය | බුද්ධිමය ප්‍රාග්ධනය | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | ස්වභාවික ප්‍රාග්ධනය |

### පාර්ශවකරුවන්

| | | | | | |
|---|---|---|---|---|---|
| කොටස් හිමියා/ ආයෝජකයා | ගනුදෙනුකරුවන් | සේවකයින් | නියාමකයින් හා රජයේ ආයතන | ව්‍යාපාර හවුල්කරුවන් | සමාජය හා පරිසරය |



ඒකාබද්ධ වාර්තාව

# පූර්විකාව


10
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
පිළිබඳව කෙටියෙන්

12
සංධිස්ථාන

13
නිමැවුම් හා සේවා

14
වැදගත් තොරතුරු

16
සභාපතිතුමාගේ පණිවුඩය

20
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක
නිලධාරීගේ සමාලෝචනය

# ජාතික ඉතිරි කිරීමේ බැංකුව පිළිබඳ කෙටියෙන්



## ජාතික ඉතිරි කිරීමේ බැංකුව: ස්ථාවරත්වය,සවිබලගැන්වීම හා විශ්වාසය පිළිබඳ උරුමයක්

දශක පහකට වැඩි කාලයක් සඳහා, ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වය සහ සවිබලගැන්වීමේ ප්‍රදීපයක් සේ පෙනී සිටින ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඉතුරුම් හා මූල්‍ය විචක්ෂණභාව පිළිබඳ ජාතික සංස්කෘතියක් පෝෂණය කරයි. සම්මානනීය ඉතුරුම් ආයතන හතරක ඒකාබද්ධතාවයකින් 1972 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙරට සාරවත් මූල්‍ය උරුමයේ සාඩම්බර භාරකරුවෙකු ලෙස වර්ධනය වී ඇත.

බැංකුවේ මූලයන් 1832 දී ආරම්භ කරන ලද සිලෝන් ඉතිරිකිරීමේ බැංකුව තෙක් දිවෙන අතර, ඉතිරිකිරීමේ ආචාර ධර්ම වර්ධනය කිරීමේදී සියවසකට අධික ප්‍රවීනතාවට උරුමකම් කියයි. 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස නම් කිරීමක් සමඟ, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ජාතිය, සමාජ පන්තිය හෝ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ බාධක ඉක්මවා යමින් සමාජයේ සියලු අංශ අතර ඉතිරිකිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම මගින් මූල්‍ය අන්තර්ගතභාවය කරා සිය කැපවීම නැවත නැවතත් සහතික කර ඇත.

අද වන විට මිලියන 10කට වැඩි සක්‍රීය ගිණුම්වලට සාඩම්බරයෙන් සේවාව සලසමින් හා අප්‍රමාණ ජීවිත කෙරෙහි කල්පවත්නා බලපෑමක් ඇති කරමින්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකාවේ වඩාත් අන්තර්ගත මූල්‍ය ආයතන අතර පෙනී සිටී.

මෑත වසරවල පැවති ආර්ථික ආකූලතාවන් හමුවේ වුවද, බැංකුව සිය මෙහෙවර තුළ නොසැලී සිට ඇත. පදනම් මූලධර්ම සහ ඔරොත්තුදීම මගින් මෙහෙයවන හා ශක්තිමත් කළ, බැංකුව වෙනස්වීම, යොදා ගැනීම සහ සවිබලගැන්වීම අඛණ්ඩව සිදුකරයි. අභිතකරතාවන් හමුයාමට එයට ඇති හැකියාව පාර්ශවකරුවන් වෙත සිය සේවය ශක්තිමත් කර ඇති අතරම සියලුම ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් වඩා දීප්තිමත්, වඩාත් අන්තර්ගත අනාගතයක් සුරක්ෂිත කරමින් පුද්ගලයින්ට හා ප්‍රජාවන්ට ජය ගැනීමට සහයවීමේදී සිය කාර්යභාරය ද ශක්තිමත් කර ඇත.

## සන්නාම ශ්‍රේණිගත කිරීම්

"ලංකා රේටින්ග් ඒජන්සි" (LRA) ආයතනය විසින් 2024 වසර සඳහා ස්ථාවර දැක්මක් සහිත [SL] AAA නිකුත් කිරීමේ ශ්‍රේණිගත කිරීමක් බැංකුව වෙත ලබා දී ඇත. එමෙන්ම බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ලංකා ලිමිටඩ් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ හත්වන වඩාත් වටිනාම සන්නාමය ලෙස බැංකුව නම් කරනු ලැබිණි.

## ශාඛා ජාලය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉතිරිකිරීමේ බැංකුව ලෙස, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ජාතියට වඩා ඉහළ ප්‍රවේශ්‍යතාව සහ සේවා විශිෂ්ටත්වය සහතික කරමින්, ශාඛා 262 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/CRM යන්ත්‍ර 417 ක් තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල හරහා නියෝජිතායතන 4,006 කින් සමන්විත ජාලයකින් සමන්විත පුළුල් ශාඛා ජාලයක් ක්‍රියාත්මක කරයි.

**අපගේ දැක්ම**
ඉතිරිකිරීම් සහ ආයෝජන විසඳුම් සඳහා වඩාත් ස්ථාවර හා තේරීම බවට පත්වීම.

**අපගේ මෙහෙවර**
ගනුදෙනුකරුවන්ගේ ඉතුරුම් හා ආයෝජන අවශ්‍යතා ප්‍රශස්ත ලෙස සපුරාලීමට අවශ්‍ය පරිපූර්ණ මූල්‍ය විසඳුම් ඔවුන්ට සැපයීම හා සියළුම පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් මුදුන් පැමිණවීම.

**අපගේ වටිනාකම**
අපගේ එදිනෙදා ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී, කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සහ විශ්වාසය, අනොන්‍ය ගෞරවය සහ අඛණ්ඩතාව සමඟ නව්‍යතාවයෙන් කටයුතු කිරීම

**අපගේ අරමුණ**
ජාතියේ වර්ධනය වේගවත් කිරීම

## අපගේ ශක්තිය හා ස්ථාවරත්වය

රූපය 1

ශුද්ධ පොලී ආදායම (NII)




බදු පෙර ලාභය




මුළු වත්කම්




ගනුදෙනුකාර තැන්පතු




සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (ROA)




ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE)




සියලු විනිමය ද්‍රවශීලතා ආවරණය




බාසල් III මුළු ප්‍රාග්ධනය



# ජාතික ඉතිරි කිරීමේ බැංකුව පිළිබඳ කෙටියෙන්



## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### NSB

#### ශාඛා බැංකුකරණය
- ඉතිරිකිරීමේ දැවැන්තයෙකු ලෙස ක්ෂේත්‍රයේ වසර 50 ඉක්මවූ සේවා පළපුරුද්ද
- පුද්ගලික බැංකුකරණය (තැන්පතු භාර ගැනීම පාරිභෝගික ණයදීම, බැංකු ඇපකර, කාඩ් විසඳුම් සහ ගනුදෙනු බැංකුකරණය ඇතුළු සම්පූර්ණ සේවා පරාසයක්)

#### ආයතනික මූල්‍ය
- මූල්‍ය ආයතන සහ ඒවායේ පරිපාලිත සමාගම්වලට සෘජු ණයදීම
- ණය දෙන්නන් සහ ණයගන්නා/ණයගන්නන් අතර නිරවුල් කිරීම සහ ගනුදෙනු කිරීම අතර සම්බන්ධීකරණය කරන සංගත පහසුකම් සඳහා නියෝජිතයාගේ කාර්යභාරය ඉටු කරයි
- භාර සහතිකපත්, පුද්ගලික ස්ථාපන සහ ණයකරවල ආයෝජනය
- යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීමේ ක්ෂේත්‍රයේ ණයදීමේ පළපුරුද්ද
- ණය සුරැකුම්පත් නිකුතුව

#### ජාත්‍යන්තර බැංකුකරණය
- ඇ. ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර්, සිංගප්පූරු ඩොලර් පවුම් සහ ජපන් යෙන් වලින් කරනු ලබන විදේශ මුදල් තැන්පතු (ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු)
- අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ
- විදේශ විනිමය හුවමාරුව
- ආනයන ණයවර ලිපි නිකුත් කිරීම
- ආනයන බිල්පත් නිරවුල් කිරීම
- නැව් හා ගුවන් භාණ්ඩ ඇප නිකුත් කිරීම

#### භාණ්ඩාගාරය
- රජයේ සුරැකුම්පත්, ස්කන්ධ සහ විදේශ විනිමය, ප්‍රතිමිලදී ගැනීමේ ණය දීම් සහ ප්‍රති විකුණුම් ණයදීමේ ගිවිසුම්වල ආයෝජනය

### සී/ස. එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට්
- මූලික වෙළෙඳපොල කටයුතු
- ද්විතීයක වෙළඳපොළ කටයුතු
- මහ බැංකුව සමඟ ගිණුම් පියවීම (Lanka Settle)
- මහ බැංකුව සමඟ පවතින සුරැකුම් ගිණුම (Lanka Secure)
- ආයතනික ණය සුරැකුම්පත් වෙළඳාම
- SWIFT සම්බන්ධතාව
- කළඹ කළමනාකරණය
- මුදල් කළමනාකරණය

### ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුව
- ඉතුරුම්
- ණය
- කල්බදු
- ආයතනික මූල්‍යකරණය
- උකස්

## විවිධාංගීකරණ ක්ෂේත්‍ර

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුටම සරිලන දෛනික බැංකුකරණ විසඳුම් මගින් සන්නද්ධ දීපව්‍යාප්ත 262 ක් වූ ශාඛා ජාලය හා තැපැල් බැංකු ජාලය
- සියලු අංශ හරහා සැලකිය යුතු ගනුදෙනුකාර පදනම
- දේශීය නිවාස ඉදිකිරීම් තුළ ක්ෂේත්‍රයේ පුරෝගාමී විශේෂඥභාවය සහ මූල්‍යකරු

- රජයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රධාන පෙළේ යටිතල පහසුකම් සපයනු ලබන්නන් අතර එක් ආයතනයක් වීම
- මූල්‍ය අභියෝගවලට මුහුණපාන ගනුදෙනුකරුවන්ට සහාය වන ඵලදායී ණය හා රැස්කිරීම් පිළිබඳ විශේෂඥතාව

- විශේෂයෙන් යුරෝපයේ හා දකුණු කොරියාවේ සිට ශ්‍රී ලංකාවට මුදල් ප්‍රේෂණය අතින් විශ්වසනීය පාර්ශවකරු

- ස්ථාවර ආදායම් වෙළෙඳපළ නිර්මාණය
- රාජ්‍ය ණය සම්බන්ධයෙන් මූලික අරමුදල් සැපයීම
- මුදල් කළමනාකරණයේ ප්‍රවණතා සැකසීම

- පුද්ගලගත සංවාද හා උපදෙස් හරහා ධන උත්පාදනය

- අංග සම්පූර්ණ විශේෂිත බලපත්‍රලාභී බැංකුකරණ

රූපය 2

- ප්‍රගතිශීලී ආයතනික සංස්කෘතියකින් සහාය වන අරමුණු සහිත ව්‍යාපාරයක්

  **ඉතිරිකිරීම් සහ ආයෝජන සඳහා ඉතා විශ්වාසදායක සහ ගෞරවනීය තේරීමක්**
- ව්‍යවස්ථාව පරිදි තැන්පතු වලින් 60% ක් ඉතා සුරක්ෂිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම

  **ජාතික මූල්‍ය ස්ථාවරත්වයේ විශ්වාසදායක භාරකරුවෙක්**
- තෝරාගත් උත්පාදිත හා යහපත් අවදානම් කළමනාකරණය

  **ක්ෂේත්‍රයේ සාමාන්‍යයට සාපේක්ෂව අඩු අක්‍රීය ණය අනුපාතයක්**

- සියලුම තැන්පතු හා එහි පොලිය පිළිබඳ 100% රජයේ විශ්වාසය සහිත රටේ එකම බැංකුව

  **රටතුළ ආරක්ෂිත බැංකුව**
- මිලියන10.42 ගිණුම්වලට සේවය සැලසීම

  **ජනතාවගේ තේරීම**

- බදු, අයකිරීම්, ගාස්තු සහ ලාභාංශ මහා භාණ්ඩාගාරයට දායකවීම

  **ජාතික ආර්ථිකයට නොසැලෙන සහයෝගය**
- රජයේ දිගුකාලීන සංවර්ධනය සහ සමාජ-ආර්ථික ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීම

  **ජාතිය ගොඩනැගීම**
- සමාජයට ධනාත්මක බලපෑමක් ඇති කරන ආකාරයෙන් ව්‍යාපාර පැවැත්වීම

  **වගකීම් සහගත බැංකුකරණය තුළින් ධනාත්මක බලපෑම**
- ප්‍රවීණ කළමනාකරණය සමඟ ඒකාබද්ධ වූ පාලනය

  **යහපාලනය තුළින් විශිෂ්ටත්වය**

# සන්ධිස්ථාන



**1972**
රටතුළ සම්ප්‍රදායික ඉතිරිකිරීමේ ආයතන සතරක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමින් හඳුන්වන එක් ආයතනයන් වශයෙන් ඒකාබද්ධ කිරීම සඳහා පාර්ලිමේන්තු පනතක් මගින් පහසුකම් සැලසීම.

**1979**
දිනුම් ඇදීමක් සහිත ඉතුරුම් සහතිකපත් හඳුන්වාදීම

**1981**
ග්‍රාමීය ජන කොටස් වෙත සමීපවීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ජංගම බැංකු සේවය ක්‍රියාත්මක කිරීම

**1994**
පළමු ATM යන්ත්‍රය ස්ථාපිත කිරීම.

**1995**
ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සංශෝධනය කිරීම

**1998**
හපන් පුංචි හපන් නිපැයුම දියත් කිරීම

**1999**
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 100 වැනි ශාඛාව නිට්ටඹුවේදී විවෘත කිරීම

ඉතුරු මිතුරු ගිණුම හඳුන්වාදීම

**2000**
බැංකුවේ පරිපාලිත සමාගම වන හීර් ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම ස්ථාපිත කිරීම

**2002**
ස්ත්‍රී ගිණුම හඳුන්වාදීම.

**2003**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව AAA (lka) ෆිච් ණය ශ්‍රේණිගත කිරීම හිමිකරගත් ප්‍රථම ශ්‍රී ලාංකික බැංකුව බවට පත්වීම

**2004**
ජාත්‍යන්තර බැංකු මෙහෙයුම් ආරම්භ කිරීම

**2008**
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 24x7 ඇමතුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම

**2011**
බැංකුවේ 200 වැනි ශාඛාව මැදවච්චියේදී විවෘත කිරීම

**2012**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය 40 වන සංවත්සරය සමරයි

**2013**
ශ්‍රී ලාංකික බැංකුවක් විසින් නිකුත් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 750 ක විශාලතම බැඳුම්කර නිකුතුව

**2014**
උසස් අධ්‍යාපන කටයුතු සඳහා බුද්ධි පුද්ගලික ණය ක්‍රමය හඳුන්වාදීම. ඇ.ඩො.මි. 250 ජ්‍යෙෂ්ඨ බැඳුම්කර නිකුතුව

**2016**
සිය 250 වන ශාඛාව කෝපායිහිදී ආරම්භ කිරීම

ග්ලෝබල් ෆයිනෑන්ස් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම බැංකුව ලෙස නම් කරනු ලැබීම

වෙළෙඳ මූල්‍ය කටයුතු ආරම්භ කිරීම

බැංකුව විසින් රු. බිලියන 6 ක වටිනාකමකින් යුත් සිය ප්‍රථම ලැයිස්තුගත නොකළ ද්විතියික ණයකරය නිකුත් කිරීම

**2017**
රුපියල් ට්‍රිලියන 1ක වත්කම් පදනමක් හිමිකරගත් මෙරට ප්‍රථම විශේෂිත බැංකුව බවට පත්වීම

**2019**
ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - PCI DSS දත්ත ආරක්ෂණ ප්‍රමිතිය හිමි කරගත් ප්‍රථම ශ්‍රී ලාංකික රාජ්‍ය බැංකුව වීම.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ පරිපාලිත සමාගමක් බවට පත් විම.

තැන්පතු පදනම රුපියල් ට්‍රිලියන 1 ඉක්මවීම

ඇමරිකානු ඩොලර් මිලියන 250 ක බැඳුම්කරය සාර්ථකව ගෙවා අවසන් කිරීම

**2020**
දෙමුහුන් ණය උපකරණ සාර්ථක ලෙස නිකුත් කිරීම. (නිත්‍ය ණයකර)

**2021**
"NSB Pay" ජංගම යෙදුම හඳුන්වාදීම

**2022**
බැංකුව සිය 50 වන සංවත්සරය සමරයි

**2023**
NSB NextGen ඩිජිටල් බැංකුකරණ සේවාව දියත් කිරීම

මුළු ආයෝජන රු. ට්‍රිලියන 1 ඉක්මවීම

**2024**
නව මධ්‍යගත බැංකුකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීම

# නිෂ්පාදන හා සේවා

### ඉතුරුම් තැන්පතු

- සාමාන්‍ය ඉතුරුම්
- ළමා ඉතුරුම් - කිරිකැටි හපන්, පුංචි හපන්, හපන් ළමා ඉතුරුම් ගිණුම
- යෞවන ඉතුරුම් - නියෝ ඉතුරුම් ගිණුම
- තරුණ ඉතුරුම් - I'M ඉතුරුම් ගිණුම
- කාන්තා ඉතුරුම් - ස්ත්‍රී ඉතුරුම් ගිණුම
- විශේෂ ඉතුරුම් - හැපී ඉතුරුම් ගිණුම,
- ස්මයිල් ඉතුරුම් ගිණුම

### ඉතුරුම්/විශ්‍රාම සැලසුම්

- NSB පෙන්ෂන් +
- පස් අවුරුදු ඉතුරුම්
- රියැලිටි ඉතුරුම් සැලසුම
- ප්‍රාර්ථනා
- ප්‍රාර්ථනා +
- සවිබල ඉතුරුම්

### කාලීන තැන්පතු

- සාමාන්‍ය තැන්පතු - ස්ථාවර තැන්පතු (FDs)
- ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු - ගෞරව ස්ථාවර තැන්පතු ගිණුම, ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු විශේෂ ස්ථාවර තැන්පතු

### විදේශ මුදල් නිෂ්පාදන

- පුද්ගලික විදේශ මුදල් ගිණුම් (PFCA)
- ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් (BFCA)
- අභ්‍යන්තර ආයෝජන ගිණුම් (IIA)
- විදේශ මුදල් කාලීන තැන්පතු
- විශේෂ තැන්පතු ගිණුම (SDA)
- ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම (CTRA)
- මුදල් මාරු කිරීමේ ව්‍යාපාර

### පාරිභෝගික ණයදීමේ ව්‍යාපාර

- නිවාස/දේපළ ණය - ගේ දොර, අලංකාර, රාජ්‍ය සේවකයන් සඳහා නිවාස ණය

### පුද්ගලික ණය

- NSB පුද්ගලික ණය
- බුද්ධි ණය
- විශේෂ විශ්‍රාමික ණය
- තැන්පතු මත ණය - ක්ෂණික ණය

### කාඩ්පත් සේවා

- Shopping + ATM කාඩ්පත
- NSB ඊසි කාඩ්පත

### වෙනත් සේවා

- ප්‍රේෂණ - NSB U-Trust
- විකුණුම් ලක්ෂ්‍ය (POS) උපාංගය පදනම් කරගත් ඉතුරුම් බලමුලු ගැන්වීම - NSB Reach
- වෙළෙඳ මූල්‍ය
- ඇපකර
- ස්ථාවර නියෝග
- සෘජු හර පහසුකම්
- ආරක්ෂිත තැන්පතු සේප්පු
- නාමයෝජනා
- උපයෝගිතා බිල්පත් ගෙවීම

### ආයතනික ණයදීම

### ඩිජිටල්/ඉලෙක්ට්‍රොනික් බැංකුකරණය

- NSB PayApp
- ඩිජිටල් බැංකුකරණය
- ක්ෂණික ප්‍රතිචාර කේත බැංකුකරණය

### පාසල්වල එකතු කිරීමේ මධ්‍යස්ථාන

### පාරිභෝගික සම්බන්ධතා මධ්‍යස්ථානය - බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය

### භාණ්ඩාගාරය

- භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ප්‍රවර්ථන (SPOT) සහ ඉදිරි හුවමාරු ගිවිසුම්

# වැදගත් තොරතුරු



## වැදගත් මූල්‍ය තොරතුරු

| | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | 2024 | 2023 | වෙනස% | 2024 | 2023 | වෙනස% |
| **වර්ෂයේ ප්‍රතිඵලය (රු. මිලියන)** | | | | | | |
| දළ ආදායම | **207,637** | 232,064 | (10.53) | **213,417** | 238,825 | (10.64) |
| මූල්‍ය එකතුකළ අගය මත බදු වලට පෙර ලාභය | **35,778** | 5,589 | 540.17 | **38,411** | 10,109 | 279.95 |
| බදුකරණයට පෙර ලාභය (PBT) | **26,431** | 4,287 | 516.47 | **28,522** | 8,022 | 255.53 |
| ආදායම් බදු වියදම් | **10,145** | (2,929) | 446.37 | **10,862** | (1,594) | (781.27) |
| බදුකරණයට පසු ලාභය | **16,285** | 7,216 | 125.67 | **17,660** | 9,617 | 83.63 |
| **වසර අවසානය වන විට මූල්‍ය තත්ත්වය (රු. මිලියන)** | | | | | | |
| කොටස්කරුවන්ගේ අරමුදල් (මුළු හිමිකම්) | **98,843** | 81,374 | 21.47 | **106,835** | 87,788 | 21.70 |
| අනෙකුත් ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු/ගණුදෙනුකරුවන්ගේ තැන්පතු | **1,556,271** | 1,482,532 | 4.97 | **1,556,682** | 1,482,951 | 4.97 |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය සහ වෙනත් උපකරණ | **1,039,035** | 943,705 | 10.10 | **1,048,966** | 953,056 | 10.06 |
| ණය සහ ලැබිය යුතු දෑ | **532,379** | 526,521 | 1.11 | **527,715** | 523,809 | 0.75 |
| මුළු වත්කම් | **1,752,438** | 1,686,965 | 3.88 | **1,779,767** | 1,712,308 | 3.94 |
| **සාමාන්‍ය කොටස් මත තොරතුරු (රු.)** | | | | | | |
| ඉපයුම් (මූලික) | **17.32** | 7.68 | 125.67 | **18.79** | 10.23 | 83.63 |
| ඉපයුම් (diluted) | **17.32** | 7.68 | 125.67 | **18.79** | 10.23 | 83.63 |
| ශුද්ධ වත්කම් වටිනාකම | **105.15** | 86.57 | 21.47 | **113.65** | 93.39 | 21.70 |

| | 2024 | 2023 | වෙනස (bps) | 2024 | 2023 | කස්බටැ :ඉච්* |
|---|---|---|---|---|---|---|
| **අනුපාතික** | | | | | | |
| ශුද්ධ පොලී ආන්තිකය (%) | **4.23** | 1.79 | 244 | **4.31** | 1.91 | 240 |
| සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (%) | **18.07** | 9.36 | 872 | **18.15** | 11.72 | 643 |
| සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ (ROA) (%) | **1.54** | 0.26 | 128 | **1.63** | 0.48 | 115 |
| ඉපයීම් වල වර්ෂ අනුරූප වර්ධනය (%) | **125.67** | 185.27 | (5,961) | **83.63** | 913.37 | (82,974) |
| **ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාතික (%)** | | | | | | |
| රුපියල් - අවම අවශ්‍යතාවය - 100% | **351.33** | 299.20 | 5,213 | **N/A** | N/A | – |
| සියළු මුදල් ඒකක - අවම අවශ්‍යතාවය - 100% | **344.55** | 293.71 | 5,084 | **N/A** | N/A | – |
| ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතිකය - අවම අවශ්‍යතාවය - 100% | **193.53** | 180.49 | 1,304 | **N/A** | N/A | – |
| **ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන අවශ්‍යතා - බාසල් III** | | | | | | |
| ස්ථර 1 – අවම අවශ්‍යතාවය (8.5%) | **23.42** | 16.91 | 651 | **26.69** | 19.94 | 675 |
| සමස්ත ප්‍රාග්ධනය – අවම අවශ්‍යතාවය (12.5%) | **25.88** | 19.26 | 662 | **29.06** | 22.24 | 682 |
| ද්‍රවශීලතා අනුපාතිකය – අවම අවශ්‍යතාවය (3%) | **8.00** | 6.23 | 178 | **8.85** | 7.05 | 180 |

## මූල්‍ය ඉලක්ක සහ කාර්යසාධනය – බැංකුව

| මූල්‍ය දර්ශකය | | කාර්යසාධනය | | | | |
|---|---|---|---|---|---|---|
| | අරමුණ | 2024 | 2023 | 2022 | 2021 | 2020 |
| ශුද්ධ පොලී ආන්තිකය (%) | 2.95 | **4.23** | 1.79 | 2.03 | 3.71 | 2.77 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) % | 0.76 | **1.54** | 0.26 | 0.28 | 1.93 | 1.24 |
| සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (ROE) (%) | 8.66 | **18.07** | 9.36 | 3.40 | 33.92 | 20.15 |
| ආදායමේ වර්ධනය (%) | 0.82 | **(10.53)** | 32.97 | 29.34 | 5.80 | 4.61 |
| වර්ෂය සඳහා ලාභයේ වර්ධනය (බදු පසු ලාභය) (PAT) | 28.84 | **125.67** | 185.27 | (88.56) | 118.83 | 58.40 |
| සමස්ත වත්කම් වල වර්ධනය (%) | 9.51 | **3.88** | 4.35 | 2.38 | 15.79 | 17.78 |
| **ප්‍රාග්ධන අවශ්‍යතා – බාසල් III** | | | | | | |
| ස්ථර 1 – අවම අවශ්‍යතාවය (8.5%) | Over 8.5% | **23.42** | 16.91 | 15.78 | 18.60 | 13.65 |
| මුළු වත්කම් – අවම අවශ්‍යතාවය (12.5%) | Over 12.5% | **25.88** | 19.26 | 18.00 | 20.83 | 16.45 |

වගුව 1 →

## අපගේ ත්‍රිත්ව අවධානය: ආර්ථිකය, සමාජය සහ තිරසාරබව

### 1 ආර්ථික (පාලනය සහ මූල්‍ය කාර්ය සාධනය)

**මූල්‍ය කාර්ය සාධනය**

බදු පසු ලාභය (PAT)
රු. බිලියන 16.29 (2023 – රු. බි. 7.22)

වත්කම් මත ප්‍රතිලාභ (ROA) ↑
1.54% (2023 – 0.26%)

ශුද්ධ මුළු ණය වලට අදියර 3
5.18% (2023 – 2.41%)

තැන්පතු මත ණය අනුපාතය
34.21% (2023 – 35.51%)

ආදායමට පිරිවැය අනුපාතය
38.72% (2023 – 71.59%)

**ආර්ථිකයට දායකත්වය සහ පාලනය**

රජයට දායකත්වය – ගෙවන ලද මුළු බදු සහ අයකිරීම්
රු. බිලියන 19.66
[2023 – (රු. බි. 1.63)]

නායකත්වයේ කාන්තා නියෝජනය ↓
39.6% (2023 – 44.5%)

වංචා සහ සයිබර් ආරක්ෂණ සිදුවීම්
ශුන්‍ය (2023 – ශුන්‍ය)

### 2 සමාජීය (මානව ප්‍රාග්ධනය සහ ප්‍රජා බලපෑම)

**සේවක සුභසාධනය සහ විවිධත්වය**

සේවක පිරිවැටුම් අනුපාතය
3.77% (2023 – 3.70%)

සේවකයෙකුට පුහුණු පැය ගණන ↓
6.97 (2023 – 12.19)

ස්ත්‍රී පුරුෂ විවිධත්ව අනුපාතය ↓
(මුළු සේවකයින්ගෙන් කාන්තා නියෝජනය)
54.7% (2023 – 54.9%)

සෞඛ්‍ය සහ ආරක්ෂක සිදුවීම් ↑
9 (2023 – 7)

**පාරිභෝගික සහ ප්‍රජා බලපෑම**

පාරිභෝගික ස්පර්ශක ස්ථාන ගණන
4,685 (2023 – 4,685)

ගනුදෙනුකරුවන්ට ගෙවන ලද පොලිය
රු. බිලියන 130.97 (2023 – රු. බි. 197.40)

ක්‍රියාකාරී ගිණුම් සංඛ්‍යාව
10.42 මිලියන (2023-13.03 මිලියන)

### 3 පාරිසරික (හරිත මූල්‍ය සහ තිරසාර බව)

**මෙහෙයුම් පාරිසරික බලපෑම**

ශාඛාවකට බලශක්ති පරිභෝජනය
125.51 GJ (2023 – 113.35 GJ)

ජල පරිභෝජනය ↓
62,744 $m^3$ (2023 – 73,895 $m^3$)

සේවකයෙකුට බලශක්ති පරිභෝජනය
7.81 GJ (2023 – 6.8 GJ)

ජාතික පද්ධතියට විදුලිය ලබා දීම
467,762 kWh
(2023 – 461,584 kWh)

**හරිත මූල්‍යකරණය සහ දේශගුණික අවදානම**

පුනර්ජනනීය බලශක්තිය සඳහා ලබා දී ඇති ණය
රු. බිලියන 4.00 (2023 – නැත)

අනුකූල ණය/ආයෝජනවල ප්‍රතිශතය
100% (2023 – 100%)

දේශගුණික ආතති පරීක්ෂාව සිදු කරන ලදී
ඔව් (2023 – ඔව්)

# සභාපතිතුමාගේ පණිවිඩය



## නූතන ශ්‍රී ලංකාවේ ඇතිවී තිබෙන ආර්ථික පුනරුදය මධ්‍යයේ අපේක්ෂා අභිබවන මෙන්ම තිරසාර වර්ධනයක් ළඟා කරගැනීම සඳහා වන අපගේ උපායමාර්ගික සැලසුම තහවුරු කරන ආකාරයේ මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමත් විය.



### අභියෝගාත්මක කාල සීමාවක් තුල දැඩි ස්ථායීතාවයක් පවත්වාගනිමින්

ජාතික ඉතිරිකිරීමේ බැංකුව යනු නොසැලෙන පදනමක් සහිත ආයතනයක් බව ගෙවුණු 2024 වසර විසින් නැවතත් තහවුරු කරනු ලැබ තිබේ. මෙරට ඇතිවූ ආර්ථික විචලන සහ ක්ෂේත්‍රය ආශ්‍රිතව මතුවූ අභියෝග හමුවේ උදාසීන නිරීක්ෂකයෙකු ලෙස නොව මෙරට ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීමෙහිලා සක්‍රියව දායකවූ මූල්‍ය ආයතනයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශක්තිමත්ව නැගී සිටියේය. අපගේ ඒ ඔරොත්තුදීම පාදකවී තිබෙන්නේ දූරදර්ශී අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් සමග මැනවින් සංකලනය කළ උපායමාර්ගික වර්ධන මුලපිරීම් මත පදනම්ව සියුම්ව සකසාගත් සමබර ප්‍රවේශයකි.

ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන් අප කෙරෙහි තබා ඇති විශ්වාසය අපගේ ප්‍රමුඛතම වගකීම මෙන්ම ශක්තිමත්ම වත්කම වේ. නිරන්තරයෙන් වෙනස්වන ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට අවැසි නව්‍යකරණය සිදු කරන අතරතුර ගනුදෙනුකරුවන්ගේ අභිලාෂ ආරක්ෂා කිරීමට ඇති හැකියාව තුල බැංකුවේ සැබෑ ශක්තිය ගැබ්වී තිබෙන බව පිළිඹිබු කරමින් විශ්වාසයේ ස්වර්ණමය සංකේතයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව අඛණ්ඩව නැගී සිටී.

## සංකීර්ණ ආර්ථික පරිසරයක් තුළ ඉදිරියට යමින්

යළි ගොඩනැගීම පිළිබඳව සුහදායී අපේක්ෂා මෙන්ම තවදුරටත් පවතින අභියෝගවලින් සලකුණුවූ පසුගිය වර්ෂය තුළ බහුවිධ ආර්ථික වාතාවරණයක් නිර්මාණයවී තිබිණ. ගෝලීය වශයෙන් විචලනය වෙමින් තිබූ භූදේශපාලනික සාධක සහ මූල්‍ය ප්‍රතිපත්ති විසින් නැගී එන වෙළඳපොළ කෙරෙහි අඛණ්ඩ හා පුළුල් බලපෑමක් ඇති කරන ලදි. ඒ අතර දේශපාලනික ස්ථායීතාවය බලගැන්වීමට සහ පරිවර්තන සීඝ්‍රතාවය ඉහළ නැංවීමට හේතුවූ තීරණාත්මක මැතිවරණ දෙකක් සමග යළිත් නිවැරදි දිශානතියකට යොමු කෙරුණු ශ්‍රී ලංකා ආර්ථිකය කැපී පෙනෙන ඔරොත්තුදීමේ හැකියාවක් පෙන්නුම් කළේය.

ශ්‍රී ලංකා රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අත්කරගත් සාර්ථකත්වය මෙරට ආර්ථික පුනරුදයේ පදනම වන අතර ඒ සඳහා අත්‍යාවශ්‍ය රාජ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා ජාත්‍යන්තර ආයෝජක විශ්වාසය යළිත් තහවුරු කිරීමට එමගින් අවස්ථාව උදාවිය. දූරදර්ශී රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සමගින් ශක්තිමත්වූ මෙම තීරණාත්මක සන්ධිස්ථානයෙහි ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂය තුළ උද්ධමනය අඩු අගයක තනි ඉලක්කමක් දක්වා පහළ ගොස් ස්ථාවර මට්ටමකට පත් විය. දැඩි පරිශ්‍රමයකින් අත්කරගත් මෙම ජයග්‍රහණය හේතුවෙන්, යෝජිත මූල්‍ය ලිහිල්කරණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබිණ.

මෙම ස්ථාවරභාවයේ හිතකර චක්‍රය හා උත්තේජනය මගින් මිල ස්ථායිථාවය පවත්වාගැනීම සහ විදේශ මුදල් සංචිත ක්‍රමිකව යළි ගොඩනගා ගැනීම සඳහා ඉතාමත් සුදුසු වාතාවරණයක් ගොඩනගන අතර ණය ඉල්ලුම දිරිමත් කරමින් පොලී අනුපාත පහළයාම සමග මූල්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ද අවශ්‍ය යහපත් වාතාවරණය නිර්මාණය විය.

කෙසේවුවත්, අඛණ්ඩව පැන නැගුණු අභියෝග මධ්‍යයේ පුනරුදය කරා ආර්ථිකය මෙහෙයවීම ප්‍රවේශමෙන් සිදු කළ යුතු විය. විනිමය විචලන, සංචාරක කර්මාන්තය හා අපනයන ආදී ක්ෂේත්‍ර වලට ආවේණික දුර්වලතා මෙන්ම ගෝලීය ආර්ථික අභියෝග විසින් අපට සිහිපත් කරන ලද්දේ අප ළඟා කරගැනීමට අපේක්ෂා කළ ප්‍රගතිය පහසු හා නියත වූවක් නොවන බවයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අප දියුණු මූල්‍ය කළමනාකරණයක් හා අනුගතවීමේ උපායමාර්ග සමගින් එම අභියෝග වලට ප්‍රතිචාර දැක්වූ හෙයින් එම අභියෝග අවස්ථා බවට පරිවර්තනය කරගැනීමට අපට හැකි විය. වේගවත් වත්කම් වගකීම් ගැළපුම් ක්‍රියාවලියක් සහ ප්‍රවේශමෙන් සකස් කරන ලද ආයෝජන අවදානම් අවම කිරීමේ උපායමාර්ගය ඔස්සේ පොලී අනුපාත විචලන මනාව කළමනාකරණය කරන ලද හෙයින් අපගේ භාණ්ඩාගාර මෙහෙයුම් සුවිශේෂී විශිෂ්ටත්වයක් පෙන්නුම් කළේය. අභියෝගකාරී ආර්ථික තත්ත්වයට ඔරොත්තු දෙන ක්ෂේත්‍ර සඳහා මුදල් සම්පාදනය කිරීම උපායමාර්ගිකව පුළුල් කරන අතරතුර දුර්වල ක්ෂේත්‍ර වලට අදාළ ණය සැපයීමේ කොන්දේසි හා රෙගුලාසි දැඩි කරමින් අපි බහුවිධ ණය ප්‍රවේශයක් අනුගමනය කළෙමු. අවශ්‍ය අවස්ථාවන්හිදී ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් නව අවස්ථා උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට එම සමබර ප්‍රවේශය මගින් හැකියාව ලැබිණ.

අපගේ ඔරොත්තු දීමේ හැකියාව පැහැදිලි කෙරෙන එවැනි සංකීර්ණ තත්ත්වයක් තුළ ශක්තිමත් කාර්යසාධනයක් පවත්වාගැනීම සඳහා අප සතු හැකියාව අපගේ ආයතනයේ ජානමය ව්‍යුහය තුළ ගැබ්ව තිබේ.

## තහවුරු කිරීම හා උපායමාර්ගික ප්‍රවණතා ක්‍රියාවට නැංවුණු වසරක්

2024 වර්ෂය ජාතික ඉතිරිකිරීමේ බැංකු ඉතිහාසයේ සුවිශේෂී පරිච්ඡේදයක් සනිටුහන් කරයි. එය අපගේ ආයතනික ශක්තිය, සාධනීය ප්‍රගතියක් වෙත පරිවර්තනය කළ කාල සීමාවකි. ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතික අභිබවමින් අපි අපගේ ශේෂ පත්‍රය ශක්තිමත් කළෙමු. ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වාගත් අතර නවීන අවදානම් වළක්වාලීමේ ක්‍රමවේද අනුගමනය කළෙමු. මෙම ආරක්ෂක ක්‍රමවේද වලට අමතරව උපායමාර්ගික වර්ධන අවස්ථා නිවැරදිව උපයෝජනය කළ අතර ඉහළ ණය ගුණාත්මකභාවයක් පවත්වාගැනීමට කටයුතු කළෙමු. මෙම කාලසීමාව තුළ බැංකුව ළඟා කරගත් කැපී පෙනෙන කාර්යසාධනය මගින් මූල්‍ය විචක්ෂණශීලීභාවය සහ ජාතික ප්‍රවර්ධනය උදෙසා වන අපගේ දෙයාකාරවූ වගකීම පිළිඹිබු කෙරෙන අතර ස්ථායීතාවය හා ප්‍රගතිය යනු ඓන්ද්‍රීයව බැඳී පවතින සාධක ද්විත්වයක් බව සනාථ කිරීමට එමගින් අපට හැකියාව ලැබිණ.

## අපගේ උපායමාර්ගය තහවුරු කරන මූල්‍ය කාර්යසාධනයක්

නූතන ශ්‍රී ලංකාවේ ඇතිවී තිබෙන ආර්ථික පුනරුදය මධ්‍යයේ අපේක්ෂා අභිබවන මෙන්ම තිරසාර වර්ධනයක් ළඟා කරගැනීම සඳහා වන අපගේ උපායමාර්ගික සැලසුම තහවුරු කරන ආකාරයේ මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමත් විය. බැංකුව සිය බදු පසු ලාභය සම්බන්ධයෙන් 126% ක කැපී පෙනෙන වර්ධනයක් අත්කරගත් අතර එය 2023 දී වාර්තාවූ රු. බිලියන 7.2 ක අගයක සිට 2024 වසර තුළදී රුපියල් බිලියන 16.3 ක් දක්වා ඉහළ ගියේය. එය අපගේ විනයානුකූල ක්‍රියාමාර්ග වල සහ අනුවර්ථනීය මූල්‍ය කළමනාකරණයෙහි සාර්ථකත්වයට සාක්ෂ්‍ය වේ. එපමණක් නොව, දැඩි වියදම් පාලන පවත්වාගත්තා අතරතුර ක්‍රමයෙන් යහපත් වෙමින් තිබෙන ආර්ථික වාතාවරණයේ වාසි ලබාගැනීම සඳහා අප සතු හැකියාව පෙන්වාදෙමින් බැංකුවේ බදු පෙර ලාභය 516% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 26.4 ක් බවට පත්වීම කැපී පෙනේ. පසුගිය වසරට සාපේක්ෂව 256% ක වර්ධනයක් සමගින් ජාතික ඉතිරිකිරීමේ බැංකු සමූහය මෙතෙක් වාර්තා කරන ලද ඉහළම බදු පෙර ලාභය 2024 දී ළඟා කරගත් අතර එය රුපියල් බිලියන 28.5 කි.

අපගේ මූල්‍ය කාර්යසාධනය ඉහළ ජාතික වැදගත්කමකින් සමන්විතවූ අතර බැංකුව, රුපියල් බිලියන 10.1 ක ඍජු ආදායම් බදු ගෙවීම් ඇතුළුව ඍජු බදු ලෙස රුපියල් බිලියන 19.5 ක් භාණ්ඩාගාරයට ලබාදී තිබේ. වාණිජමය සාර්ථකත්වයක් ළඟා කරගත් ආයතනයක් සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධ කිරීම සඳහා වන වැඩපිළිවෙලෙහි ප්‍රධාන හවුල්කරුවෙක් ලෙස අපගේ දෙයාකාරවූ භූමිකාව, ඉහතින් සඳහන් කළ අපගේ කැපී පෙනෙන දායකත්වය මගින් පිළිඹිබු කෙරේ. ඉහළ අගයක් ගන්නා ප්‍රධාන ලාභදායිතා මිනුම් මගින් පැහැදිලි වන අපගේ ඉපයුම් වල ගුණාත්මකභාවයද අපට සුවිශේෂී වේ. වත්කම් මත ආදායම 0.26% සිට 1.54% දක්වා ඉහළ ගිය අතර පසුගිය වසරේ 9.36% ක් ලෙස සටහන්වූ බදු පසු හිමිකම් මත ආදායම ආසන්න වශයෙන් දෙගුණ වෙමින් 18.07% ක අගයක් ගෙන තිබිණ. රඳවාගත් ඉපයුම් පසුගිය වසරට සාපේක්ෂව ආසන්න වශයෙන් දෙගුණවී රුපියල් බිලියන 28.5 ක් බවට පත්වූ අතර අපගේ කාර්යසාධනයේ පදනම ලෙස හඳුන්වාදිය හැකි අපගේ විචක්ෂණශීලී ශේෂ පත්‍ර කළමනාකරණය ඊට හේතු විය. මෙමගින් අනාගත වර්ධනය සඳහා ප්‍රාග්ධනය ශක්තිමත් කෙරේ. මෙරට රාජ්‍ය සුරැකුම් හා සම්බන්ධ ප්‍රමුඛ පෙළේ ආයතනික ආයෝජකයෙක් ලෙස අපගේ ස්ථානය ශක්තිමත් කරගනිමින් සහ ආර්ථික ස්ථායීතාවය සහ ජාතික සංවර්ධනය හැඩගැස්වීමෙහිලා අපගේ උපායමාර්ගික වැදගත්කම අවධාරණය කරමින් අපගේ සමස්ත ආයෝජන රුපියල් ට්‍රිලියන 1.0 සීමාව පසු කර තිබීමද කැපී පෙනේ.

අප විසින් මෙම ජයග්‍රහණ අත්කරගන්නා ලද්දේ වගකීම් විරහිතව අවදානම් වලට නිරාවරණය වීම ඔස්සේ නොව සුපරීක්ෂාකාරීව සකස් කරන ලද තුලිත උපායමාර්ගයක් ඔස්සේය යන කරුණද අපගේ ජයග්‍රහණ වල ගුණාත්මකභාවය ඉහළ නංවයි. එකී උපායමාර්ගය මගින් වර්ධනය ශක්තිමත් පාලනය සමගද නව්‍යකරණය දූරදර්ශීභාවය සමගද වාණිජමය අපේක්ෂාව ඉහළ මට්ටමේ ජාතික වගකීම සමගද බද්ධ කර තිබෙන අතර අපි ස්ථායීතාවය හා ජාතික සංවර්ධනය යන දෙඅංශයටම දායකත්වය ලබාදෙන්නෙමු.

## සුපරීක්ෂාකාරිව ක්‍රියාත්මක වෙමින් උපායමාර්ගික රටාව පවත්වාගැනීම

අප ගොඩනගාගත් ශක්තිමත් පදනමට අනුකූලව අපි ඉදිරි වසර සඳහාද පැහැදිලි උපයාමාර්ගික ප්‍රමුඛතා ප්‍රකාශයට පත් කළෙමු. කෘතිම බුද්ධිය මගින් මෙහෙයවන පුද්ගල බද්ධ සේවාවක් සහ සෘජු සැකසුම් ශක්‍යතාවයක් ඔස්සේ ගුණාත්මක බවින් ඉහළ ගනුදෙනුකාර සේවාවක් සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඩිජිටල් පරිවර්තනයක් කරා අපගේ ආයෝජන අඛණ්ඩව මෙහෙයවීමට කටයුතු කරමින් සිටින්නෙමු. ඒ අනුව, හරිත මූල්‍ය සංකල්පය පමණක් නොව ආර්ථික, සමාජයීය හා පාලන පරාමිතීන්ද අපගේ මෙහෙයුම් හා සැපයුම් ජාලය හා බද්ධ කිරීමට හැකියාව ලැබෙන පරිදි අපගේ තිරසාරභාවය හා සම්බන්ධ න්‍යාය පත්‍රය පුළුල් කෙරෙනු ඇත. ඉලක්කගත නව්‍යකරණය හා ඉහළ ගුණාත්මකභාවයකින් යුතු සේවා සැපයුම් වලට අදාළ සබඳතා ඔස්සේ මූල්‍ය අන්තර්ග්‍රහණය උදෙසා වන අපගේ ප්‍රයත්නය තීව්‍ර කෙරේ. නුදුරු අනාගතයේදී බැංකු ක්ෂේත්‍රය තුල සිදුවන පරිවර්තන වලට අනුගත වෙමින් අභියෝග වලට මුහුණදීමට හැකි අයුරින් අපගේ ශ්‍රම බලකාය සූදානම් කිරීමට උපකාර වන කුසලතා සංවර්ධන වැඩසටහන් ඔස්සේ අපගේ මානව ප්‍රාග ධනය ශක්තිමත් කිරීමටද අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු. මෙම මුලපිරීම් එකිනෙකට වෙනස්වූ හුදෙකලා ව්‍යාපෘති නොවේ. ඒවා, අපගේ මූල්‍ය ශක්තිය, තාක්ෂණික ප්‍රවණතා හා සමාජයීය පරමාර්ථ සමග බද්ධ කරමින්, අනාගතය සඳහා ඉහළම පෙර සූදානමක් සහිත බැංකුව බවට පත්වීමේ අපගේ දැක්ම නිර්මාණය කරන එකිනෙක හා බැඳුණු සාධක වේ.

## ඩිජිටල් පරිවර්තනය: බැංකුකරණ අත්දැකීම යළි හැඩගස්වමින්

2024 වසර තුලදී දිගහැරුණු අපගේ ඩිජිටල් විකාශනය නියත හා ක්‍රමික ප්‍රගතියක් නොව විසල් තාක්ෂණික පිම්මක් ලෙස හඳුන්වාදිය හැකිය. විශිෂ්ට කාර්යක්ෂමතාවයක් හා ඉහළ විභවතාවයක් සහතික කරමින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අපගේ අති නවීන මධ්‍යගත බැංකු පද්ධතිය හේතුවෙන් පසුපෙළ මෙහෙයුම් ආශ්‍රිතව විප්ලවීය වෙනසක් සිදු විය. මාස්ටර් කාඩ් ප්ලැටිනම් හර කාඩ්පත් වල පහසුව සහ ආරක්ෂාව බලගැන්වෙන Pay by Account වැනි ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත් නව්‍යකරණ විසින් පහසුව යන යෙදුම නැවත නිර්වචනය කරනු ලැබ තිබෙන අතර, දියුණු සයිබර් ආරක්ෂණ ක්‍රමවේද ඩිජිටල් ගනුදෙනු සඳහා දැඩි ආරක්ෂාවක් සපයයි. මෙම ප්‍රවණතා මගින් නියෝජනය වන්නේ තාක්ෂණික දියුණු කිරීම් පමණක් නොවේ. අසමසම ආරක්ෂාවක් හා අති නවීන ශක්‍යතාවයන් එකිනෙක බද්ධ කරන, අනාගතයට සූදානම් බැංකුවක් ලෙස ඉදිරියට යාම සඳහා වන අපගේ කැපවීමද එමගින් පෙන්වා දෙයි. දිවයින පුරා ඩිජිටල්කරණය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් තිබෙන පසුබිමක කිසිදු ගනුදෙනුකරුවෙකු මග නොහැරෙන බව සහතික කරන අතරතුර මෙම පරිවර්තනයට සාර්ථකව මුහුණදීමට ජාතික ඉතිරීකිරීමේ බැංකුව සැදි පැහැදි සිටී.

## තිරසාරභාවය සහ ආර්ථික, සමාජයීය හා පාලන සාධක: අරමුණ හා ලාභදායිතාවය ඒකාබද්ධ කරමින්

ආර්ථික, සමාජයීය හා පාලන මූලධර්ම අපගේ මෙහෙයුම් සමග ගැඹුරින් බද්ධ කිරීමට කටයුතු කරන ලද හෙයින් 2024 වර්ෂයේදී ජාතික ඉතිරීකිරීමේ බැංකුවේ තිරසාරභාවය පිළිබඳ මෙහෙයුම සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන තිබිණ. අපගේ හරිත මූල්‍ය කළඹ, විශේෂයෙන් පුනර්ජනනීය බලශක්ති මූල්‍යයනය ආශ්‍රිතව සැලකිය යුතු ලෙස පුළුල් කරන ලද අතර කඩදාසි රහිත බැංකුකරණය සහ බලශක්තිමය වශයෙන් කාර්යක්ෂම ශාඛා වැනි අභ්‍යන්තර මුලපිරීම් මගින් අප විසින් පරිසරයට මුදා හැරෙන කාබන් ප්‍රමාණය අවම කරගැනීමට අපට හැකි විය. ඵලදායී තිරසාරභාවය යනු අනුකූලතාවය ඉක්මවා යන ක්‍රියාවලියක් බවත් බැංකුකරණය මගින් ධනාත්මක වෙනසක් ඇති කළ හැක්කේ කෙසේද යන්න නැවත සලකා බැලීම එහිදී අත්‍යාවශ්‍ය කරුණක් බවත් අපි නිවැරදිව අවබෝධ කරගෙන සිටිමු. අපගේ ණයදීමේ පරිචයන් තිරසාර සංවර්ධන ඉලක්ක වලට අනුකූල බව සහතික කරගැනීම සහ ආර්ථික, සමාජයීය හා පාලන මූලධර්ම ආශ්‍රිත හෙළිදරව් කිරීම් ඉහළ නැංවීම ඔස්සේ අපගේ අනාගත ව්‍යාපාරික කටයුතු වලට වටිනාකමක් ලබාදෙන අතරම වඩාත් ඔරොත්තු දෙන ශ්‍රී ලාංකික ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා සක්‍රියව දායක වන්නෙමු.

## ගනුදෙනුකරු කේන්ද්‍ර කරගත් බැංකුකරණයක්: ජීවන සබඳතා ගොඩනගා ගනිමින්

ගනුදෙනුකරුගේ අවශ්‍යතා කෙරෙහි ස්ථිර ලෙස අවධානය යොමු කිරීම අපගේ සාර්ථකත්වයේ හරය විය. 2024 වසර පුරා අපි, පුද්ගල බද්ධ සේවා, නවෝත්පාදන නිමැවුම් සහ පුළුල් කරන ලද ප්‍රවේශය ඔස්සේ අපගේ වටිනාකම් වර්ධනය කරගැනීමට කටයුතු කළෙමු. වැඩි දියුණු කොට නැවත හඳුන්වාදෙන ලද අපගේ ජංගම දුරකතන යෙදවුම ගනුදෙනුකරුවන්ට පෙර නොවූ විරූ පහසුවක් හා වේගයක් තිලිණ කළ අතර ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද මුලපිරීම් සමග බොහෝ පිරිසකට අත්‍යවශ්‍ය මුදල් කළමනාකරණ කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව උදා විය. ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින විවිධ ප්‍රජාවන්ට සමානවම විධිමත් මූල්‍ය සේවා වෙත ළඟාවීමේ හැකියාව පවතින බව සහතික කරමින් අපගේ ශාඛා ජාලය මගින් ග්‍රාමීය හා නාගරික භේදය අවම කිරීම සඳහා දායක වීමට අපට හැකි විය. බෙහෙවින් තරඟකාරී ව්‍යාපාරික පසුබිමක ගනුදෙනුකරුවා සැබෑ ලෙස අවබෝධ කරගැනීම සහ කෙටි කාලීන ප්‍රතිලාභ වලට වඩා දිගු කාලීන සබඳතා ඇති කරගැනීම කෙරෙහි කැපවීම ඔස්සේ ජාතික ඉතිරීකිරීමේ බැංකුව සිය මෙහෙවර හඳුනාගනී.

## පාලන හා අවදානම් අධීක්ෂණය ශක්තිමත් කිරීම

2024 වසර තුල අප ලබාගත් ජයග්‍රහණ වල ශක්තිමත් පදනම සකස් කරනු ලැබූයේ අපගේ දැඩි පාලන පරිචයන් විසිනි. ඉහළ මට්ටමේ විශ්ලේෂ හා සංසිද්ධි සැලසුම්කරණය ඔස්සේ අප අපගේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව තව දුරටත් ශක්තිමත් කරන ලද අතර එමගින්, ඇති විය හැකි අවදානම් ක්‍රියාකාරීව හඳුනාගැනීම සහ වළක්වාගැනීම සඳහා ඉඩ සැලසිණ. බාසල් III මූලධර්ම සමග අනුකූලතාවය තවදුරටත් ශක්තිමත් කරන ලද අතර මුදල් විශුද්ධිකරණය (AML) සහ ගනුදෙනුකරුවා හඳුනාගැනීම (KYC) සඳහා වන ක්‍රමවේද මගින් ක්ෂේත්‍රයේ ප්‍රමිතිය ස්ථාපිත කෙරිණ. අපගේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යරාමුවට දේශගුණික අවදානම් ඇතුළත් කරන ලද අතර එය පාලනය කෙරෙහි වන අපගේ පෙරටුගාමී ප්‍රවේශය පෙන්වාදෙන පුරෝගාමී පියවරක් ලෙස හඳුන්වාදිය හැකිය. වර්ධනය කරා යන ගමනේදී අපේක්ෂාසහගතව අවදානම් වලට මුහුණදීම සඳහා අත්‍යාවශ්‍ය මගපෙන්වීමක් සපයමින් ජාතික ඉතිරීකිරීමේ බැංකුව උපරිම අවංකභාවයෙන් හා සවලතාවයෙන් යුතුව ක්‍රියාත්මක වන අතරතුර වේගයෙන් විකාශය වන නියාමන පසුබිමක අප පාර්ශවකරුවන්ගේ අභිලාෂ දැඩි ඕනෑකමකින් ආරක්ෂා කරන බව ඉහත කී පාලන ආශ්‍රිත වැඩිදියුණු කිරීම් වලින් පැහැදිලි වේ.

## අපගේ සාමාජිකයන්: විශිෂ්ටත්වයේ පදනම

ජාතික ඉතිරීකිරීමේ බැංකුවේ සාර්ථකත්වය, එහි ජීවනාලිය වන ශ්‍රම බලකායේ කැපවීම, විශේෂඥතාවය සහ නොසැලෙන ගුණය සමග ඓන්ද්‍රීයව බැඳී පවතී. 2024 වර්ෂය තුල අප ලබාගත් සෑම ජයග්‍රහණයක්ම යථාර්ථවත් කරගැනීමට හැකිවූයේ අපගේ සුවිශේෂී කණ්ඩායමේ අප්‍රතිහත උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. විශිෂ්ටත්වය උදෙසා වන ඔවුන්ගේ කැපවීම, අනුගතවීමේ හැකියාව සහ ගනුදෙනුකරු කේන්ද්‍ර කරගත් ප්‍රවේශය ජාතික ඉතිරීකිරීමේ බැංකුවේ වටිනාකම් නිරූපණය කරයි. බැංකුව සාර්ථකත්වය කරා මෙහෙයවීමෙහිලා එහි කාර්යමණ්ඩලය ඉටු කළ තීරණාත්මක මෙහෙවර හඳුනාගනිමින් සේවා නියුක්තිකයන්ගේ කුසලතා පෝෂණය කිරීම සහ

එමගින් ඔවුන් සවිබලගැන්වීම යන සාධක වල අවශ්‍යතාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවධාරණය කරන ලදි. වේගයෙන් වෙනස් වන සන්දර්භය තුල නොසැලී ඉදිරියට යාමේ හැකියාව ඇති විචක්ෂණශීලී නායකයන් බිහි කිරීම ඉලක්ක කරගත් පුහුණු කිරීම් හා සංවර්ධනය සඳහා සිදු කරන ලද ආයෝජන, කාර්යමණ්ඩලය ශක්තිමත් කිරීමෙහිලා බැංකුවේ කැපවීම සනාථ කරයි.

කෘතිම බුද්ධිය, සයිබර් ආරක්ෂාව සහ දත්ත විශ්ලේෂක වැනි නූතන තාක්ෂණික ප්‍රවණතා හා සම්බන්ධ විශේෂඥ පුහුණු වැඩසටහන් සහ කුසලතා සංවර්ධන වැඩසටහන් සමග ඩිජිටල් බැංකුකරණය ආශ්‍රිත කුසලතා වර්ධනයට ප්‍රමුඛතාව ලබා දෙන ලදි. නවෝත්පාදන බිහි කිරීමට සහ ඩිජිටල් පරිවර්තනය හැසිරවීමට සමත් හා සූදානමින් සිටින අපගේ සේවක මණ්ඩලය ඩිජිටල් පරිණාමය තුල පෙරමුණේ සිටින බවට ඉහත මුලපිරීම් සාක්ෂ්‍ය දරයි.

අභියෝගාත්මක කාලසීමාවකදී වුවද නොපසුබස්නා වීර්යයෙන් හා විශිෂ්ටත්වය කරා ළඟාවීමේ තිර අදිටනින් කටයුතු කරමින් අඛණ්ඩ හා පෙර නොවූ විරූ ආකාරයේ සේවාවක් අපගේ ගනුදෙනුකරුවන් හට ලබාදීමට අපගේ සේවක මණ්ඩලය උත්සුක විය. අසීමිත විචලන වල බලපෑමට ලක්වූ රටක පවත්නා අවිනිශ්චිත වාතාවරණයට අනුගත වෙමින් හා ඔරොත්තු දෙමින් විශිෂ්ට ගනුදෙනුකාර සේවාවක් ලබාදීමට ඔවුන් කටයුතු කළ අතර එය ඔවුන්ගේ කැපවීම හා කණ්ඩායම් හැඟීම මැනවින් පැහැදිලි කරයි.

අප මෙලෙස අපගේ මෙහෙයුම් නවීකරණය කරමින් තාක්ෂණික ප්‍රවණතා සමග සංයෝජනය කිරීමට උත්සුක වන අතරතුර දශක ගණනාවක් මුළුල්ලේ මෙරට ජනතාවගේ විශ්වාසය ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත රඳවා තැබීමට හේතුවූ අපගේ මානව කේන්ද්‍රීය සංස්කෘතිය රැකගැනීමට අපි අඛණ්ඩව කැපවී සිටිමු. අන්‍යෝන්‍ය ගරුත්වය, සහයෝගීතාවය සහ නව්‍යකරණය මත ගොඩනැගුණු මෙම සංස්කෘතිය අපගේ කාර්යසාධනය ශක්තිමත් කරන අතරම අපගේ සාමාජිකයන් අතර සහෝදරත්වය හා විශ්වාසය තීව්‍ර කරයි.

අපගේ කාර්යමණ්ඩලය ජාතික ඉතිරිකිරීමේ බැංකුව කෙරෙහි තබා ඇති විශ්වාසය සම කළ හැක්කේ අපි අපගේ උරුමය ඉදිරියට ගෙනයාමෙහිලා ඔවුන් සතු ශක්තිය කෙරෙහි තබා ඇති විශ්වාසයට පමණි. ඔවුන්ගේ අපේක්ෂා බැංකුවේ දැක්ම සමග ගළපාගැනීම ඔස්සේ නව්‍යකරණය, අවංකභාවය හා පොදු අරමුණක් වෙනුවෙන් කැපවූ ශ්‍රම බලකායක් මඟින් බලගැන්වුණු, අනාගත අභියෝග ජයගැනීමට සූදානම් ආයතනයක් අපි ගොඩනග මින් සිටිමු. ඉදිරිය පිළිබඳව සලකා බැලීමේදී අපගේ සාමාජිකයන්ගේ සාමූහික ශක්තිය තවදුරටත් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඉදිරියට ගෙන යමින් විශිෂ්ටත්වයේ නිම්වළලු කරා මෙහෙයවනු ඇති බව විශ්වාස කළ හැකිය.

## තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම ඔස්සේ පාර්ශවකරුවන් සවිබලගැන්වීම

අපගේ පාර්ශවකරුවන් සමග ගැඹුරු හා අර්ථවත් සබඳතා ගොඩනගා ගැනීම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපගේ සාර්ථකත්වය කුළුගන්වන සාධකයකි. ගනුදෙනුකරුවන්, නියාමකයන්, සේවා නියුක්තිකයන් සහ ප්‍රජා නායකයන් සමග විවෘත සංවාදයක යෙදීමෙන් ඔවුන්ගේ වෙනස්වන අවශ්‍යතා හා අපේක්ෂා අවබෝධ කරගෙන ඒවා සපුරාලීමට උපකාර වන ආකාරයේ උපායමාර්ග සකස් කිරීමට අපි උත්සුක වෙමු. මෙම සහයෝගීතා ප්‍රවේශය මගින් විශ්වාසය හා විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම පමණක් නොව නිමැවුම් සැලසුම් කිරීම, ප්‍රතිපත්තිමය උපදෙස් හෝ සමාජ ආයෝජනය යන ඕනෑම කරුණකට අදාළ සෑම තීරණයක්ම, ඊට අදාළ පාර්ශව වලට දැනෙන ආකාරයේ ප්‍රතිලාභ ජනනය කරන බවද සහතික කරයි.

ගනුදෙනුකාර සබඳතා ඉක්මවමින් සමස්ත පරිසර පද්ධතියම ඔසවා තැබීමට ආධාර වන හවුල් මුලපිරීම් ඔස්සේ දිගු කාලීන වටිනාකම් නිර්මාණය කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව කැපවී සිටී. බැංකු හා මූල්‍ය සේවා වෙත ළඟාවීමේ පහසුකම් තවමත් නොලද ජනතාව සවිබලගැන්වීම අරමුණු කරගෙන ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් වල සිට තිරසාර යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ සම්මුති දක්වා වන පරාසයක අප සමග සම්බන්ධ වන පාර්ශවකරුවන්ගේ සාමූහික විශේෂඥතාවය සහ සම්පත් අපි උපයෝජනය කරන්නෙමු. එමගින්, නවෝත්පාදනය කුළුගැන්වෙන හා සවලතාවය මුල්බැසගත් පරිසරයක් නිර්මාණය වන අතර අප එක්ව ඇති කරගත් සෞභාග්‍යය තවත් පරම්පරා ගණනාවක් පුරා පවතිනු ඇත.

## අදිටනින් හා කෘතඥතාවයෙන් යුතුව ඉදිරියට

විශ්වාසය, නව්‍යකරණය සහ අපගේ ජාතියට පිදෙන සේවාව යන සාධක මතින් දිවෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගමන්මග සබඳතාවයේ හා ප්‍රගතියේ ප්‍රතිමූර්තියකි. අපගේ සාර්ථකත්වය උදෙසා දායකවූ සියළුදෙනාටම හදපිරි කෘතඥතාවය පුද කරමින් එකී හවුල් ජයග්‍රහණ දෙස මෙසේ හැරී බලමු.

මා වෙත ලබාදුන් මිල කළ නොහැකි මගපෙන්වීම හා උපායමාර්ගික උපදෙස් වෙනුවෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත ලබාදුන් කැපී පෙනෙන නායකත්වය හා එහි සාර්ථකත්වය උදෙසා ප්‍රකට කළ නොසැලෙන කැපවීම වෙනුවෙන් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී වෙත මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි. එසේම, බැංකුවේ මෙහෙයුම් සම්බන්ධයෙන් සුවිශේෂී ප්‍රගතියක් අත්කර ගැනීමෙහිලා දැක්වූ කැපවීම හා උද්යෝගය වෙනුවෙන් බැංකුවේ කළමනාකාරීත්වයට සහ නොසැලී, කැපවීමෙන් හා වීර්යයෙන් යුතුව අපගේ අභිවෘද්ධියට පන පොවන අපගේ සේවා නියුක්තිකයන්ට ස්තූතිවන්ත වෙමි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව කෙරෙහි දැක්වූ හිතෛෂීභාවය හා තැබූ විශ්වාසය වෙනුවෙන් අපගේ ගනුදෙනුකාරභවතුන්ට සහ වටිනාකම් ජනනය කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ අපගේ විනයානුකූල ප්‍රවේශ වලට පාදකවූ, අප කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් අපගේ කොටස්කරුවා වන ශ්‍රී ලංකා රජයට මාගේ ස්තූතිය පුද කරමි. එසේම, දැක්මක් සහිත නායකත්වය හා සහයෝගය වෙනුවෙන් අතිගරු ජනාධිපති සහ ගරු මුදල් අමාත්‍යවරයාට මෙන්ම අප වෙත දැක්වූ සහය හා දිරිදීම වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමියට හා නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයාටද මම බෙහෙවින් කෘතඥ වෙමි.

අප වෙත ලබාදුන් සහයෝගය හා මගපෙන්වීම වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්තුමාට මෙන්ම විචක්ෂණශීලි නියාමන උපදෙස් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාටද මගේ ස්තූතිය පුද කරමි. අවසාන වශයෙන්, අනෙකුත් අදාළ ආයතන වල නිලධාරින්, ජනාධිපති ලේකම්තුමා, නීතිපතිතුමා හා විගණකාධිපතිතුමා අප වෙත ලබාදුන් අත්‍යාවශ්‍ය මගපෙන්වීම හා සහයෝගය වෙනුවෙන් ස්තූතිවන්ත වීමට මම මෙය අවස්ථාව කරගනිමි.

ඉදිරිය දෙස බැලීමේදී, මූල්‍ය විශිෂ්ටත්වය ළඟා කරගැනීම සහ ජාතික සංවර්ධනය බලගැන්වීම යන දෙයාකාරවූ සිය කාර්යභාරය නොපිරිහෙළා ඉටු කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව තවදුරටත් කැපවී සිටී. අපි තවදුරටත් වගකීමෙන් යුතුව නව්‍යකරණයට යොමුවන්නටත් තිරසාරභාවයෙන් යුතුව වර්ධනය වන්නටත් මානව දයාවෙන් යුතුව ගනුදෙනුකරුවන්ට සේවය සලසන්නටත් ප්‍රතිඥා දෙමු. ඒ, ශේෂ පත්‍රයෙන් ඔබ්බට ගොස් අප සමග සම්බන්ධ වන ජීවිත හා අප ඔවුන් වෙනුවෙන් උදාකර දීමට උත්සාහ කරන අනාගතය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අප, අපගේ සාර්ථකත්වයේ පදනම ලෙස හඳුනාගන්නා නිසාවෙනි. අපි, එක්ව, ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය පිළිබඳ මීළඟ පරිච්ඡේදය ලියමින් සිටිමු.



**ජනාධිපති නීතීඥ ආචාර්ය හර්ෂ කබ්රාල්**
සභාපති

2025 මාර්තු 25

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ සමාලෝචනය



## අනාගතයට සූදානම් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා මෙරට ජනතාව සවිබලගැන්වීම, ඩිජිටල් නවෝත්පාදනය, මූල්‍ය සචලතාව සහ තිරසාර වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2025 වර්ෂයට පිවිසෙයි.



### පරිවර්තන ආර්ථිකයක් තුල නොසැලී පෙරටම...

53 වසරක සිය මෙහෙයුම් කාල සීමාව තුල ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙරට මූල්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයෙක් ලෙස නොසැලී නැගී සිටියේය. ජාතියේ ඉතුරුම් සඳහා උපරිම ආරක්ෂාවක් ලබාදෙමින් සහ මූල්‍ය අන්තර්ග්‍රහණය සඳහා පහසුකම් සලසමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය ආරම්භයේ සිට පරම්පරා ගණනාවක ශ්‍රී ලාංකිකයන් වෙත විශ්වාසයෙන් යුතුව සිය සේවය ලබාදී තිබේ. මේ වසරේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ තේමාව වන "අභිමානයෙන් යුතු ශක්තිමත් බැංකුවක්" සමග අනුකූලව 2024 යනු අපගේ සචලතාවය, අනුගතවීමේ හැකියාව සහ යෝග්‍ය බව නැවත වරක් තහවුරු කළ වසරක් ලෙස හඳුන්වාදිය හැකිය.

පසුගිය වසර කිහිපය තුලදී, සාර්ව ආර්ථික විචලන, ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගතකරණය සහ පුළුල් ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා ආදී සාධක වෙතින් එල්ලවූ බරපතල ආර්ථික පීඩන රැසකට මුහුණ පෑමට ශ්‍රී ලංකාවට සිදු විය. මෙකී දුෂ්කරතා විසින් සියළු ක්ෂේත්‍ර සතු ඔරොත්තුදීමේ හැකියාව පරික්ෂාවට ලක් කෙරිණ. ඒ සියළු බාධක මධ්‍යයේ, මහජන විශ්වාසය සුරැකීම, අඛණ්ඩ සේවාවක් සැපයීම හා ජාතික ආර්ථිකය යථා තත්ත්වයට පත්කරගැනීම සහ එහි ප්‍රගතිය උදෙසා අර්ථවත්ව දායකවීම යන සිය කාර්යභාරය හා වගකීම නොසැලී ඉටුකිරිමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමත් විය.

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

2024 වසරේදී මෙරට ආර්ථිකය ක්‍රමිකව යළි ගොඩනැගෙමින් තිබූ හෙයින් ඊට අනුරූපීව යළි සැලසුම් සකස් කිරීම හා මනා දැක්මකින් යුතුව ඉදිරියට යාම සිදු කළ යුතු විය. ක්‍රමයෙන් අවම වෙමින් තිබූ උද්ධමනය හා පහළ ගිය පොලී අනුපාත, ණය ගැනුම්කරුවන්ට යම් සහනයක් ලබාදුන්නද ඉහළ පොලී අනුපාත යටතේ මෙතෙක් පවත්වාගෙන ගිය තැන්පතු කළඹ කළමනාකරණය කරගැනීමේ අභියෝගයට මුහුණ පෑමට මූල්‍ය ආයතන වලට සිදු විය. සක්‍රිය මූල්‍ය කළමනාකරණය, අවදානම් ගළපන ලද ඵලදායී වත්කම් වෙන්කිරීම හා තිරසාර මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විනයානුකූලව හා විචක්ෂණශීලීව අභියෝග වලට මුහුණදීමට සමත් විය.

වසර තුළදී පැවති අභියෝගකාරී මෙහෙයුම් පරිසරය මධ්‍යයේ වුවද, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් ළඟා කරගැනීමට සමත් විය. උපායමාර්ගිකව වත්කම් නැවත වෙන්කිරීම සහ විචක්ෂණශීලී වියදම් කළමනාකරණයක් සමග අපි ශක්තිමත් ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගතිමු. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට සහ ආර්ථිකයේ අගතියට පත් ක්ෂේත්‍ර වලට සහයදීමට අපට අවස්ථාව ලබාදෙමින් අපගේ ද්‍රවශීලතා මට්ටම් නියාමන මට්ටම් වලට වඩා ඉහළින් පැවතියේය.

ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම බැංකුව ලෙස අපගේ භූමිකාව අඛණ්ඩව ඉටු කරන අතරතුර තැන්පතුකරුවන්ගේ විශ්වාසය තවදුරටත් අප වෙත රඳවාගැනීමට, මනා පාලනය හා වගකිවයුතු වර්ධනයක් උදෙසා වන අපගේ කැපවීම මගින් අපට හැකියාව ලැබිණ.

2024 වසරේදී බැංකුව වාර්තා කළ කාර්යසාධනය පිළිබිඹු කරන්නේ අපගේ මූල්‍ය ශක්තිය පමණක් නොවේ. එය අපගේ ආයතනික චරිත ලක්ෂණ ප්‍රකට කරයි. මුල්බැසගත් අවංකභාවය, අරමුණක් මත පිහිටා කටයුතු කිරීම සහ දිගු කාලීන නායකත්වයක් විසින් මග පෙන්වනු ලැබීම සමග වර්තමාන අවශ්‍යතා වලට ප්‍රතිචාර දැක්වීමට පමණක් නොව අනාගත අභියෝග වලට මුහුණදිය හැකි අයුරින් අපි අඛණ්ඩව වර්ධනය වෙමින් සිටිමු. අභිමානවත් ශක්තිමත් බැංකුවක් ලෙස අපගේ උරුමය විසින් නොසැලෙන, සියළුදෙනා ඇතුළත් සහ ශ්‍රී ලංකාවේ වඩාත්ම අනාගතයට සූදානම් බැංකුව ලෙස අප හැඩගස්වනු ලබන බව දන්නා නිසාම අපි සුපැහැදිලි බවින් හා විශ්වාසයෙන් යුතුව ඉදිරියට යන්නෙමු.

## ➔ මූල්‍ය ශක්තියඃ සැලකිය යුතු සහ තිරසාර ප්‍රතිඵල ලබාගනිමින්...

උපායමාර්ගිකව අනුගතවීම, මෙහෙයුම් විනය පවත්වාගැනීම සහ ආදායම් ප්‍රවේශ ප්‍රශස්ත මට්ටමකට පත්කරගැනීම සඳහා පවතින සිය හැකියාව විදහාපාමින් විචලනය වන ආර්ථික සාධක මධ්‍යයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2024 වසරේදී දීප්තිමත් මූල්‍ය කාර්යසාධනයක් ළඟා කරගැනීමට සමත් විය. මෙම කැපී පෙනෙන ජයග්‍රහණය මගින් පෙන්වා දෙන්නේ සියළු පාර්ශවකරුවන් සඳහා තිරසාර වටිනාකමක් ජනනය කිරීම කෙරෙහි බැංකුවේ නොවෙනස් අවධානයයි.

පසුගිය වසරට සාපේක්ෂව 126% ක සුවිශේෂී වර්ධනයක් වාර්තා කරමින් බැංකුවේ බදු පසු ලාභය රුපියල් බිලියන 16.3 ක් බවට පත්වූ අතර බදු පෙර ලාභය 516% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 26.4ක් බවට පත්වෙමින් තවත් කැපී පෙනෙන ජයග්‍රහණයක් සනිටුහන් කළේය. මෙම කැපී පෙනෙන මූල්‍ය ප්‍රතිඵලයට කේන්ද්‍රීය වූයේ පිරිවැය කාර්යක්ෂමතාව සඳහා ක්‍රියාකාරී ප්‍රවේශයක් අනුගමනය කිරීම වන අතර එය පොලී වියදම්වල සැලකිය යුතු 34% ක අඩුවීමක් මගින් ඉස්මතු කර දක්වයි. එවකට පැවති අඩු පොලී අනුපාත හේතුවෙන් පොලී ආදායම 10% කින් සංකෝචනය වීම, පොලී වියදමේ පහළයාම මගින් සාර්ථකව හිලව් කරගැනීමට අපට හැකිවූ අතර අභියෝගාත්මක වාතාවරණයකදී වුවද නොසැලී ඉදිරියට යාමට බැංකුව සතු හැකියාව එමගින් පැහැදිලි වේ.

2023 වර්ෂයේදී 1.79% ක් ලෙස සටහන්වූ බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය 2024 වර්ෂයේදී 4.23% ක් දක්වා ඉහළ යමින් තීව්‍ර වර්ධනයක් අත් කරගෙන තිබිණ. ලාභදායීතාවය උපරිම කරගැනීම සඳහා සිය පොලී උපදවන වත්කම් හා වගකීම් කළමනාකරණයෙහි ලා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු උපායමාර්ගික ප්‍රවීණතාවය එමගින් පිළිඹිබු විය. ඩිජිටල් බැංකුකරණය සහ කාඩ්පත් ආශ්‍රිත ගනුදෙනු වැනි සේවාවන් සැපයීම ඉහළ යාම හේතුවෙන් ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායමේ සැලකිය යුතු 37% ක වැඩිවීමක් සමඟින්, පොලී නොවන ආදායම සමස්ත ආදායම් වර්ධනයට තවදුරටත් අනුපූරක විය. ඊට අමතරව, අයෝජන අවස්ථා උපයෝජනය කිරීම සඳහා බැංකුව සතු හැකියාව පෙන්වා දෙමින් රුපියල් මිලියන 912 ක වෙළඳ ලාභයක් වාර්තා කිරීමට බැංකුවට හැකි විය.

ප්‍රධාන මූල්‍ය දර්ශක මගින්ද බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ලාභදායීතාවය ද අවධාරණය කෙරිණිග බදු ගෙවීමට පෙර වත්කම් මත ප්‍රතිලාභය (ROA) 1.54% දක්වා ඉහළ ගිය අතර, එය වත්කම් උපයෝජනය වැඩිදියුණු කළ බව පෙන්නුම් කළ අතර, බදු ගෙවීමෙන් පසු කොටස් මත ප්‍රතිලාභය (ROE) ආකර්ෂණීය 18.07% දක්වා ඉහළ ගිය අතර, එය ශක්තිමත් කොටස් හිමියන්ගේ වටිනාකමක් නිර්මාණය කිරීම අවධාරනය කරයි. එසේම, බැංකුවේ මෙහෙයුම් විශිෂ්ටත්වයේ ශක්තිය තවදුරටත් ඉහළ නංවමින් හා සුවිශේෂී කාර්යසාධනයක් පිළිබිඹු කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකු සමූහය විශිෂ්ට ප්‍රතිඵල වාර්තා කිරීමට සමත් විය. එහිදී, වත්කම් මත ප්‍රතිලාභ හා 1.63% ක් හා කොටස් මත ප්‍රතිලාභ 18.15% ක් ලෙස සටහන් විය. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශක්තිමත් මූල්‍ය පසුබිම තවදුරටත් තහවුරු කරමින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය ඉහළ අගයක් ගෙන තිබිණ. අනපේක්ෂිත අභියෝග වලට මුහුණදීම සඳහා බැංකුවේ සූදානම සහතික කරමින් ස්ථර I හා සමස්ත ප්‍රාග්ධන අනුපාතික අවම නියාමන අගයන් ඉක්මවමින් පිළිවෙලින් 23.42% හා 25.88% ලෙස සටහන් විය. පිළිවෙලින් 351.33% හා 344.55% ක අගයක් ගත් ශ්‍රී ලංකා රුපියල් හා සියළු මුදල් ඒකක සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය ඉහළ සාධන මට්ටමක් පිළිබිඹු කරයි. දුෂ්කර තත්ත්වයන්හිදී පවා ඉහළ මට්ටමේ කෙටි කාලීන ප්‍රතිරෝධී බව පවත්වාගැනීම සහ ද්‍රවශීලතා ඉල්ලුම සපුරාලීම සඳහා බැංකුව සතු හැකියාව ඉහත සංඛ්‍යා හා දත්ත මගින් ඉස්මතු කෙරේ.

සමස්තයක් වශයෙන් ගත් කල, NSB හි 2024 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය එහි උපායමාර්ගිකව අනුවර්තනය වීමේ හැකියාව, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සඳහා නොසැලෙන කැපවීම පෙන්නුම් කරයි. මෙම පදනම ඉදිරි වසරවලදී තිරසාර වර්ධනයක් අත්කර ගැනීමට, ජාතික ආර්ථික සංවර්ධනයට සහාය වීමට සහ සියලුම පාර්ශවකරුවන් සඳහා වටිනාකම් බෙදා හැරීම වැඩි දියුණු කිරීමට ඇති හැකියාව ශක්තිමත් කරයි.


**බැංකුවේ කාර්යසාධනය පිළිබඳව වඩා පුළුල් දැක්මක් සැපයීම සඳහා පිටු අංක 92 සිට 101 දක්වා පිටු වල ඇතුළත් "මූල්‍ය ප්‍රාග්ධනය" යටතේ ඒ පිළිබඳව වඩා විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත.**


## ➔ වර්ධනයේ පදනමඃ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ව්‍යාපාර අංශවල කාර්යසාධනය නිරාවරණය කිරීම...

මූල්‍ය පද්ධතිය තුල වැදගත් කාර්යභාරයක් ඉටු කරන පාරිභෝගික බැංකුකරණ අංශය තවදුරටත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මෙහෙයුම්හි ප්‍රධාන සංඝටකය ලෙස පැවතියේය. මෙම අංශය ශුද්ධ පොලී ආදායමෙන් (NII) ආකර්ෂණීය 66% ක කොටසක් අත්පත් කරගත් අතර, ඉතිරිකිරීම් සහ කාලීන තැන්පතු ආශ්‍රිතව සැලකිය යුතු 9% ක වෙළඳපල කොටසක් සාර්ථකව පවත්වා ගැනීමට අපට හැකි විය. එය පුද්ගලික ගනුදෙනුකරුවන් අප කෙරෙහි තබා ඇති විශ්වසනීයත්වය පිළිබඳ

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ සමාලෝචනය



සාක්ෂියකි. පරිභෝජනය අඩුවීම හේතුවෙන් ණය ගැනීම් අඩුවූ අභියෝගාත්මක පරිසරයක් මධ්‍යයේ වුවද, පාරිභෝගික ණය දීම්, ස්ථාවර ගම්‍යතාවයක් පවත්වා ගනිමින් ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළේය. විශ්වසනීය මූල්‍ය උපකරණයක් වන උකස් කිරීම් පාරිභෝගික ණය අංශයේ ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායකවූ අතර, ඒ යටතේ වසර තුළදී 29% ක සමස්ත උකස් ණය ප්‍රමාණයක් ලබාදීම සිදු කර ඇත. ඊට අමතරව, කාඩ්පත් හා ඩිජිටල් බැංකු සේවා ආශ්‍රිත ආදායම් ගාස්තුව 10%ක කැපී පෙනෙන වර්ධනයක් අත්කරගත් අතර තාක්ෂණික ප්‍රවණතා පිළිබඳ දැනුමක් හා නැඹුරුවක් සහිත වර්තමාන ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන සුළු අභිරුචිය සහ ඩිජිටල් නාලිකා භාවිතයට ගැනීම එම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

ශුද්ධ පොලී ආදායමට 27% ක සැලකිය යුතු දායකත්වයක් ලබාදෙමින් බැංකුවේ මූල්‍ය කාර්යසාධනය ශක්තිමත් කිරීමෙහිලා බැංකුවේ **ආයතනික ණය අංශය** වැදගත් කාර්යභාරයක් ඉටු කර තිබේ. උපායමාර්ගික සබඳතා ඔස්සේ ජාතික ආර්ථික සංවර්ධනය ඉලක්ක කරගත් මහා පරිමාණ ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පාදනය කිරීමේ මුලපිරීම් සඳහා මෙම අංශය සැලකිය යුතු දායකත්වයක් ලබාදී තිබේ. පරිවර්තනීය වර්ධනයක් උදෙසා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කැපවීම පෙන්වාදෙමින් ආයතනික මූල්‍ය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් ළඟා කරගැනීමට, සහයෝගිතා මූල්‍ය විසඳුම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම මගින් බැංකුවට හැකියාව ලැබිණ.

රට තුල පැවති හිතකර ආර්ථික වාතාවරණය විසින් අප හමුවේ තැබුණු අයෝජන අවස්ථා උපයෝජනය කිරීමෙහිලා **භාණ්ඩාගාර හා ගනුදෙනු මෙහෙයුම් අංශය** ප්‍රකට කළ ප්‍රවීණතාවය ප්‍රශංසනීය වන අතර, ඒ අනුව, ප්‍රධාන වශයෙන් රාජ්‍ය සුරැකුම් මඟින් ඉහළ ආදායම් ලබාගැනීමට බැංකුවට හැකි විය. ආදායම් ප්‍රවාහ විවිධාංගීකරණය කිරීම සහ ලාභ ප්‍රශස්ත මට්ටමකට පත් කරගැනීම යන කරුණු වලදී එහි උපායමාර්ගික වැදගත්කම පැහැදිලි කරමින් මෙම අංශය විසින් සමස්ත ශුද්ධ පොලී ආදායම සඳහා 5% ක දායකත්වයක් ලබාදෙන ලදී.

සීමිත බාහිර නිරාවරණයන් මධ්‍යයේ වුවද, **ජාත්‍යන්තර බැංකු අංශය** වසර තුළ ස්ථාවර කාර්ය සාධනයක් පවත්වා ගෙන ගියේය. විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ උපායමාර්ග භාවිතයට ගැනීම සහ දේශසීමා මෙහෙයුම් ආශ්‍රිතව විනයානුකූල ප්‍රවේශයක් අනුගමනය කිරීම ඔස්සේ මෙම අංශය විසින්, අවිනිශ්චිත ගෝලීය මූල්‍ය පරිසරයක් තුල විශ්වසනීය දායකත්වයක් ලබාදීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු ශක්තිය අවධාරණය කරනු ලැබිණ.

බැංකුවේ ප්‍රධාන අංශ විසින් වාර්තා කරන ලද මෙම බහුවිධ කාර්යසාධනය මගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන පෙළේ ආයතනයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ භූමිකාව නිර්වචනය කරන උපායමාර්ගික දිශානතිය හා මෙහෙයුම් විශිෂ්ටත්වය ඉස්මතු කර දක්වයි.

**පිටු අංක 82 සිට 91 දක්වා වන පිටුවල ඇතුළත් ව්‍යාපාර අංශ සමාලෝචනය යටතේ බැංකුවේ එක් එක් අංශ වල කාර්යසාධනය පිළිබඳව වඩා විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කර ඇති අතර එක් එක් ව්‍යාපාර අංශයට අදාළ දායකත්වය හා උපායමාර්ග පිළිබඳව වටිනා විග්‍රහයක් එමඟින් සපයා ඇත.**

## ඩිජිටල් පරිවර්තනය කඩිනම් කරමින්...

2024 වසරේදී අපි ඩිජිටල්කරණය කරා යන ගමනෙහි සැලකිය යුතු දුරක් පසු කළෙමු. මධ්‍යගත බැංකුකරණ යටිතල පහසුකම් නවීකරණය කිරීම, ඩිජිටල් සේවා සැපයුම ඉහළ නැංවීම සහ සමස්ත ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීම සඳහා එහිදී අපි වැඩි අවධානයක් යොමු කළෙමු. නව මධ්‍යගත බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සමග වේගවත් පිරිසැකසුමක්, පද්ධතිය පිළිබඳ ඉහළ විශ්වාසයක් සහ ශාඛා හා ඩිජිටල් අවකාශය ඔස්සේ සැපයෙන සේවා වල කාර්යක්ෂමතාවය ඉහළ යාම සහතික කෙරිණ.

එසේම, පහසු හා සරල අතුරු මුහුණතක් සහ තත්කාලීන මුදල් හුවමාරු, සුරක්ෂිතව සත්‍යාපනය කිරීමේ ක්‍රමවේද සහ පුළුල් ප්‍රවේශය ඇතුළු දියුණු කරන ලද පහසුකම් සමග ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඩිජිටල් බැංකුකරණ යෙදවුම නැවත හඳුන්වා දෙන ලදී. ගනුදෙනුකරුවන්ට වඩා හොඳ බැංකුකරණ අත්දැකීමක් ලබාදීමට මෙන්ම ඩිජිටල්කරණය ඉදිරියට පැමිණ තිබෙන පසුබිමක වඩා ඵලදායීව සිය මෙහෙයුම් සිදු කිරීම සඳහා බැංකුව ස්ථානගත කිරීමට එම වැඩිදියුණු කිරීම් උපකාරී විය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම "Pay by Account" පහසුකම සහිත ප්ලැටිනම් හර කාඩ්පත වෙළඳපලට හඳුන්වාදීම සඳහා මාස්ටර්කාඩ් ආයතනය සමග අප ඇති කරගත් උපායමාර්ගික සම්බන්ධතාවය මෙහිදී සුවිශේෂී වේ. එය, NSB PayApp සමඟ ඒකාබද්ධ වූ මෙම විසඳුම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගෙවීම් හැකියාව පුළුල් කිරීමට හේතු වූ අතර දේශීයව හා විදේශීයව අපගේ ගනුදෙනුකරුවන්ට සුරක්ෂිතව අසීමිතව ගනුදෙනු කිරීමට ඉඩ සලසාදී තිබේ.

විශේෂයෙන්, ඩිජිටල්කරණය අපගේ මෙහෙයුම් සමග බද්ධ කිරීමෙහිලා සිදු කරන ලද වේගවත් වැඩිදියුණු කිරීම් සමග දැඩි සයිබර් ආරක්ෂණ ක්‍රමවේද භාවිතයට ගැනීම සහතික කිරීම කෙරෙහි අපි අඛණ්ඩව අවධානය යොමු කළෙමු. සිද්ධි හඳුනාගැනීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ඵලදායී යාන්ත්‍රණ මගින් බලගන්වන ලද නිරන්තරයෙන් ක්‍රියාත්මක නිරීක්ෂණ පද්ධති සඳහා ආයෝජනය කරන අතරතුර පිළිගත් සයිබර් ආරක්ෂණ ප්‍රමිති හිමි කරගැනීමට අපට හැකියාව ලැබිණ. දැඩි දත්ත ආරක්ෂණ ප්‍රමිති පවත්වාගැනීම සඳහා තොරතුරු ආරක්ෂණ කාර්යරාමු වැඩිදියුණු කිරීම සඳහාද කටයුතු කර ඇත.

## ගනුදෙනුකරු කේන්ද්‍ර කරගත් සේවා සැපයුමක්...

ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා අපේක්ෂා කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදීමට බැංකුව දැඩි කැපවීමකින් හෙයින් 2024දීද වර්ෂයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උපායමාර්ගික දැක්මෙහි ගනුදෙනුකරුවන් කේන්ද්‍රස්ථානය ලෙස සැලකීම මෙයින් පිළිබිඹු වේ. අප විසින් ගනුදෙනුකරු වෙත පිරිනමනු ලබන බැංකුකරණ අත්දැකීම තවදුරටත් උසස් තත්ත්වයකට පත්කිරීම සඳහා විවිධ ආකාරයේ සේවා වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. සාම්ප්‍රදායික ලෙස සතියේ වැඩ කරන දිනවලදී බැංකුවට පැමිණීමට නොහැකි ගනුදෙනුකරුවන් වෙනුවෙන් තෝරාගත් ශාඛා සති අන්තයේදී නැවතත් විවෘතව තැබීම මේ අතර සුවිශේෂී වේ. බැංකුව ගනුදෙනුකරුවන්ට බැංකු සේවා වෙත ප්‍රවේශවීම සඳහා පවතින බාධක ඉවත්කිරීම සඳහා උත්සුක වන බව මෙම මුලපිරීම මගින් පෙන්වාදෙයි.

භෞතික බැංකුකරණ අත්දැකීම ඉහළ නැංවීම සඳහා විවිධ ශාඛා ඔස්සේ උපායමාර්ගික වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. අපගේ සෑම සේවා කවුළුවක්ම ගනුදෙනුකරුවන්ගේ විවිධවූ අවශ්‍යතා සපුරාලීමට සමත් නවීන හා ආකර්ෂණීය පරිසරයකින් යුතු බව සහතික කරමින් ගනුදෙනුකරුට අසීමිත ගනුදෙනු ප්‍රමාණයකට පහසුකම් සැලසීම අරමුණු කරගෙන මෙම වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කර ඇත. සිය සේවා කවුළු වෙත පිවිසෙන සෑම ගනුදෙනුකරුවෙකුටම සුව පහසුව හා කාර්යක්ෂමතාවය සහතික කිරීම සඳහා බැංකුව සිය ශාඛාවල අභ්‍යන්තර හා බාහිර පෙනුම මෙන්ම ඒවායේ පහසුකම් වැඩි කිරීමට පියවර ගෙන තිබේ.

සිය ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන සුළු චර්යාරටා හා අපේක්ෂා තෘප්තිමත් කරන ආකාරයෙන් සිය නිමැවුම් සකස් කිරීම සඳහා ගනුදෙනුකරුවන්ගේ අදහස් හා යෝජනා උපයෝගී කරගැනීමට බැංකුව ක්‍රියා කර ඇත. මෙම රටා පිළිබඳව ගැඹුරින් අවබෝධ කරගැනීම මගින් ඉහළම යෝග්‍යතාවයක් සහ අගයක්

සහිතව සකස් කරන ලද නිමැවුම් ගනුදෙනුකරුට තිළිණ කිරීමට අපට හැකියාව ලැබෙන අතර අපගේ ගනුදෙනුකරුවන් සමග වඩා ශක්තිමත් සබඳතාවයක් පවත්වාගැනීමට එය උපකාරී වේ.

ඩිජිටල් පරිවර්තනය, ප්‍රවේශය හා පහසුව සම්බන්ධයෙන් තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. සිය නවෝත්පාදක ඩිජිටල් මුලපිරීම් මගින් සිය ප්‍රවේශය පුළුල් කරගැනීමට හා භෞතික හා තත්කාලීන ගනුදෙනු අතර පවතින පරතරය අවම කිරීමට බැංකුවට හැකි විය. සිය නිවසේ සිට හෝ ගමනේ යෙදෙන අතරතුර පුළුල් පරාසයක පැතිරුණු බැංකු සේවා රැසක් වෙත ළඟාවීමේ පහසුව ගනුදෙනුකරුට ලබාදෙමින් බැංකුවේ ඩිජිටල් සේවා කවුළු වැඩිදියුණු කරන ලදී. බාධාවකින් තොරව අරමුදල් මාරු කිරීම්, ක්ෂණික ගිණුම් යාවත්කාලීන කිරීම් සහ ඒකාබද්ධ ගෙවීම් විසඳුම් වැනි විශේෂාංග මගින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය ක්‍රියාකාරකම් කෙරෙහි වැඩි පාලනයක් ලබා දී ඇත.

මේ සියළු ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස බැංකුව සමග වඩා ශක්තිමත් සබැඳියාවක්, ඉහළ තෘප්තියක් සහ අසමසම පහසුවක් ගනුදෙනුකරුට හිමිවූ අතර ප්‍රතිචාරාත්මක හා සර්වග්‍රාහී මූල්‍ය ආයතනයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කීර්තිනාමය එමගින් තවදුරටත් ඔපමට්ටම් විය. සෑම තීරණයකදීම ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත් බැංකුකරණ විසඳුම් සැපයීම සඳහා බැංකුව අඛණ්ඩව ඉලක්ක සකසයි.

## තිරසර බැංකුකරණ පරිචයන් සමග පාරිසරික, සමාජයීය හා පාලන මූලධර්ම ඒකාබද්ධ කරගැනීම

සිය මෙහෙයුම් වලට අදාළ සියළු අංශ සමග පාරිසරික, සමාජයීය හා පාලන මූලධර්ම සූක්ෂම ලෙස ඒකාබද්ධ කිරීම ඔස්සේ ඉහළ මට්ටමේ තිරසාර බැංකුකරණ පරිචයන් භාවිතයට ගැනීමෙහිලා බැංකුව 2024 වසර තුළදී නව මානයන් වෙත ගමන් කළේය. පුනර්ජනනීය බලශක්ති මුලපිරීම් සහ පාරිසරික වශයෙන් කාර්යක්ෂම නිවාස විසඳුම් සඳහා සහය දැක්වීමේ අරමුණින් සකස් කරන ලද ණයදීමේ වැඩසටහන් සමග සිය හරිත මූල්‍ය කළඹ පුළුල් කිරීමට බැංකුව විසින් පියවර ගන්නා ලදී. ජාතික පාරිසරික ඉලක්ක වලට අනුකූලව තිරසාර පරිචයන් භාවිතයට ගැනීමට පුද්ගලයන් හා ව්‍යාපාර යොමු කිරීමට මෙම ඉදිරිගාමී ප්‍රවේශ මගින් අවස්ථාව උදාවිය.

වැඩිදියුණු කළ දේශගුණික අවදානම් තක්සේරු රාමුවක් ක්‍රියාත්මක කිරීම තුලින් ආයතනික ණය දීමේ තීරණවලදී දේශගුණික අවදානම් තක්සේරු කිරීම හරහා පාරිසරික සාධක අප ඉතා උවමනාවෙන් සැලකිල්ලට ගන්නා බව තහවුරු වේ. වගකිවයුතු ණයදීමේ ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව නිරන්තරයෙන් අවධානය යොමු කරන ආකාරය එම විධිමත් ප්‍රවේශය මගින් පැහැදිලි වන අතර තිරසාර ආර්ථික සංවර්ධනයෙහිලා උත්ප්‍රේරකයක් ලෙස බැංකුවේ භූමිකාව ශක්තිමත් කෙරේ.

සිය මෙහෙයුම් මගින් මුදාහැරෙන කාබන් ප්‍රතිශතය අවම කිරීම සඳහා බැංකුව හැමවිටම වගබලාගත් අතර එය බැංකුවේ තිරසාරභාවය පිළිබඳ න්‍යාය පත්‍රය තවදුරටත් අර්ථවත් කිරීමට උපකාර විය. බලශක්තිමය වශයෙන් කාර්යක්ෂම උපායමාර්ග සහ කඩදාසි භාවිතය රහිත බැංකුකරණ පද්ධතියක් වෙත යොමු වෙමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව, දේශගුණික විපර්යාස වල බලපෑම අවම කිරීම සහ අවම කාබන් ප්‍රතිශතයක් මුදාහැරෙන බැංකුකරණයක් වෙත පරිවර්තනය වීම සඳහා සිය දායකත්වය ලබාදෙයි. මෙම මුලපිරීම් සමගින් බැංකුව සිය මෙහෙයුම්, ජාතික තිරසාරභාවය පිළිබඳ ප්‍රමුඛතා වලට අනුකූලව සිදුකිරීමට උත්සුක වන අතරම ගෝලීය පාරිසරික පරමාර්ථ සපුරාගැනීම සඳහාද දායක වෙයි.

හරිත යටිතල පහසුකම් මූල්‍යකරණයේ තම කාර්යභාරය පෙන්නුම් කරමින්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව ප්‍රධාන ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරීව දායක වූ අතර, තිරසාර බලශක්ති සංවර්ධනයට සහාය වෙමින් සහ පාරිසරික තිරසාරභාවය සඳහා වූ තම කැපවීම ශක්තිමත් කළේය. මන්නාරම ප්‍රදේශයේ "සීලෙක්ස් රිනීවබල්ස්" මැයෙන් ක්‍රියාත්මක මෙගාවොට් 19.2 ක සුළං බලශක්ති ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කෙරෙන ණය හවුලේ ප්‍රධාන බැංකුව සහ ප්‍රධාන භාරකරු ලෙස ක්‍රියාකරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව තීරණාත්මක බලශක්ති යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සලසා තිබේ. තිරසාර බලශක්ති විසඳුම් යථාර්ථවත් කිරීමෙහිලා සිය ශක්‍යතාවය යළිත් වරක් විදහා දක්වමින් බැංකුව රිවිදනව් ව්‍යාපෘතියේ රුපියල් බිලියන 10.0 ක ණය හවුලට සහභාගීවීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත. මෙම උපායමාර්ගික සහභාගීත්වය හරිත මූල්‍යයනය සම්බන්ධයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථානය තහවුරු කරන අතර ජාතික සංවර්ධනය සඳහා සිය දායකත්වය කුළුගන්වමින් එහි වෙළඳපොල පැවැත්ම ප්‍රසාරණය කෙරිණ.

මෙරට තිරසාරභාවය පිළිබඳ න්‍යාය පත්‍රයට අනුකූලවන ආකාරයෙන් සිය මූල්‍ය උපායමාර්ග සකස් කිරීම සහ පරිසර හිතකාමී පරිචයන් සිය මෙහෙයුම් වලට අදාළ කරගැනීම ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය යෝග්‍යතාව, නායකත්වය සහ බලපෑම ශක්තිමත් කරගැනීමට සමත්ව තිබේ. එය, වඩා තිරසාර සහ ඔරොත්තු දෙන අනාගතයකට මගපාදනු ඇත.

## අපගේ ශ්‍රම බලකාය සවිබලගන්වමින්: ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිවර්තනයේ හදවත

ජාතික ඉතිරිකිරීමේ බැංකුව ලද සාර්ථකත්වයේ හරය වන්නේ එහි වටිනාම වත්කම වන කාර්යමණ්ඩලයයි. සිය සේවානියුක්තිකයන් සවිබලගැන්වීම සහ අධිවේගයෙන් වෙනස් වන අනාගතයක් කරා බැංකුව මෙහෙයවීමට ඔවුන් සූදානම් කිරීම අරමුණු කරගෙන පරිවර්තනීය මුලපිරීම් රැසක් ක්‍රියාත්මක කිරීම මගින් 2024 වර්ෂයේදී බැංකුව සිය විශ්වාසය යළිත් තහවුරු කර ඇත.

සමර්ථ නායකත්වයක් සහ ඵලදායී අනුප්‍රාප්තික සැලසුමක් බැංකුව සතුව තිබෙන බව සහතික කිරීම සඳහා උපායමාර්ගිකව අයෝජනය කරන ලද අතර බැංකුව ඉදිරියටම මෙහෙයවීමට සමත් පිරිපුන් නායක පිරිසක් බිහිකරගැනීමට බැංකුව අඛණ්ඩව කටයුතු කරන බව එමගින් තහවුරු කෙරේ. බැංකු ක්ෂේත්‍රය හැඩගැස්වීමෙහිලා ඩිජිටල්කරණය පිළිබඳ විශේෂඥතාව කෙතරම් වැදගත්ද යන්න නිවැරැදිව අවබෝධ කරගනිමින්, කෘතිම බුද්ධිය, සයිබර් ආරක්ෂණය සහ දත්ත විශ්ලේෂක වැනි වර්තමානයේදී වඩාත් අවධානය යොමුව තිබෙන විෂයය ක්ෂේත්‍ර ආශ්‍රිතව සිය ශ්‍රම බලකායේ කුසලතා වර්ධනය කිරීම පිණිස බැංකුව විසින් විශේෂයෙන් සකස් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙවැනි මුලපිරීම් මගින් අපගේ සාමාජිකයන්ට අනාගත අභියෝග සහ අවස්ථා විශ්වාසයෙන් යුතුව ජයගැනීමට හැකියාව ලබාදෙමින් ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමට අපේක්ෂිතය.

බහුවිධ සමාජ, ආර්ථික හා අධ්‍යාපන පසුබිම් නියෝජනය කරන ශ්‍රම බලකායකගේ වෙනස් වන අවශ්‍යතා ආමන්ත්‍රණය කරමින් බැංකුව විසින් සිය සේවා නියුක්තිකයන්ගේ සුවතාවය හා මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන ලදී. සෑම සේවකයෙකුටම ආයතනය තුළදී වටිනාකමක් සහ නිසි ගරුත්වයක් හිමිවන බව සහතික කරමින්, සර්වග්‍රාහිත්වය, සහයෝගීතාවය සහ නවෝත්පාදනය යන ලක්ෂණ වලින් සුසැදි සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලද අතර එමගින් අපගේ සේවකයන්ගේ යහපැවැත්ම සහතික කිරීමේ වැඩපිළිවෙල සම්පූර්ණ විය. සේවකයන්ගේ සාමූහික යහපැවැත්ම කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙන සහ පුද්ගලික හා වෘත්තීය කුසලතා වර්ධනය දිරිමත් කරන කාර්යාලයීය පරිසරයක් ගොඩනැගීමට බැංකුව උත්සුක වේ. අභිප්‍රේරිත, සුචල්‍ය හා ඉදිරි දැක්මක් සහිත ශ්‍රම බලකායක් බිහිකිරීමට බැංකුව එමගින් අපේක්ෂා කරයි.

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය



මෙම සංකීර්ණ මුලපිරීම් මගින් වෙනස්වන පරිසරයට අනුගතවීම සඳහා මෙන්ම ආදර්ශමත් හා අනාගතයට සූදානම් ආයතනයක් ලෙස ඉදිරියට යාම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උත්සාහය පෙන්වාදෙයි. සාර්ථක ඉදිරිගමනක යෙදීම සඳහා අවශ්‍ය මෙවලම්, දැනුම සහ පරිසරය අපගේ සේවකයන්ට හිමිකර දීමට බැංකුව කටයුතු කරන්නේ එහි තිරසාර පරිවර්තනයෙහි ක්‍රියාකාරී සාධකය සිය සේවා නියුක්තිකයන් බව මැනවින් අවබෝධ කරගෙන සිටින බැවිනි. එය, නව්‍යකරණය, සචලතාවය සහ කල්පවතින සාර්ථකත්වය ළඟා කරගැනීමට උපකාරී වේ.

## ඉදිරිය දෙස නෙත් යොමු කරමින්: 2025 වසර සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා

සියළු නාලිකා ඔස්සේ සේවා සැපයීමේ හැකියාව ඉහළ නැංවීම, බැංකු හා මූල්‍ය සේවා ආශ්‍රිත තාක්ෂණික විසඳුම් භාවිතයට ගැනීම සහ මුදල් රහිත ගෙවීමේ පද්ධති වලට ප්‍රවේශ වීමේ පහසුව පුළුල් කිරීම ඔස්සේ ඩිජිටල් පරිවර්තනය කඩිනම් කිරීම කෙරෙහි 2025 වසර තුළදී වැඩි අවධානයක් යොමු කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව අපේක්ෂා කරයි. අසීමාන්තික හා වඩා පහසු බැංකුකරණ අත්දැකීමක් ගනුදෙනුකරුවන්ට තිළිණ කිරීමට මෙම මුලපිරීම මගින් අපට හැකියාව ලැබෙනු ඇත. එසේම, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය වඩා පුළුල් ලෙස නවීකරණය කිරීමට අනුරූපව භෞතික හා ඩිජිටල් සේවා නාලිකා අතර පවතින පරතරය අවම කිරීමටද එමගින් අවස්ථාව උදා කරනු ඇත.

පොලී නොවන ආදායම් ඉහළ නැංවීම ඔස්සේ ආදායම විවිධාංගීකරණය කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇත. අපගේ ගනුදෙනුකරුවන්ට වැඩිදියුණු කළ සේවා විසඳුම් සපයන අතර සාම්ප්‍රදායික පොලී ආදායම් මත යැපීම අවම කරන නවෝත්පාදක මූල්‍ය විසඳුම් හා ගාස්තු පදනම් කරගත් සේවා පිළිබඳව අපි ඉදිරියටත් සොයා බලන්නෙමු.

අපි අපගේ තිරසාරභාවය ආශ්‍රිත න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට කැපවී සිටිමු. 2025 දී ප්‍රධාන ප්‍රමුඛතාවයක් වනුයේ දේශගුණික මූල්‍ය කටයුතු අඛණ්ඩව ව්‍යාප්ත කිරීම වන අතර, හරිත ණය දීම, පුනර්ජනනීය බලශක්ති ආයෝජන සහ කාබන්-උදාසීන බැංකු විසඳුම් සංවර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කෙරේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති – එස් 1 හා එස් 2 අනාවරණ ප්‍රමිති වලට අනුකූලව දේශගුණය ආශ්‍රිත කරුණු සිය ප්‍රධාන මූල්‍ය හා උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලි සමග බද්ධ කිරීම සඳහා බැංකුව සූදානමින් සිටී. පාරිසරික අවදානම් හා අවස්ථා හඳුනාගැනීම, ඇගයීම හා විධිමත්ව කළමනාකරණය කිරීම සඳහා අප සතු හැකියාව වර්ධනය කිරීමටද නියමිතය. ගෝලීය තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණ ප්‍රමිති සමග පූර්ණ අනුකූලතාවය සහතික කිරීමට අප හැමවිටම වගබලාගන්නා අතර විනිවිදභාවය, විශ්වසනීයත්වය සහ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව සහිත දේශගුණය ආශ්‍රිත මූල්‍ය අනාවරණ සකස් කිරීම සඳහා පාලන ව්‍යුහ, දත්ත පද්ධති සහ අවදානම් ඇගයීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සිදුවේ. අපගේ මූල්‍ය කාර්යසාධනය, දිගු කාලීන පාරිසරික භාරකාරීත්වයක් සමග පෙළගැස්වීම සඳහා අප කැපවන අයුරු මෙම ක්‍රියාමාර්ග මගින් පැහැදිලි වේ.

ජාතියේ ඉතිරිකිරීමේ දැවැන්තයා ලෙස, තවමත් විධිමත් බැංකු හා මූල්‍ය සේවා ලබාගැනීමට යොමු නොවූ සහ ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන ජනතාව වෙනුවෙන් අපගේ ප්‍රවේශය පුළුල් කිරීමට අපි සූදානම්ව සිටිමු. එමගින්, සියළුදෙනා ඇතුළත් වන පරිදි මූල්‍යය ප්‍රවර්ධනය කිරීම අපගේ අභිප්‍රායයි. රටපුරා විහිදුණු මෙවැනි ක්‍රියාමාර්ග ඔස්සේ බැංකු සේවා වෙත වඩා පහසුවෙන් ළඟාවීමට ජනතාවට අවස්ථාව සැලසෙන අතර දීපව්‍යාප්තව සමාජ ආර්ථික සචලතාවය ශක්තිමත් කිරීමට උපකාර වනු ඇත.

අපගේ සේවක මණ්ඩලයේ අභිවෘද්ධිය සඳහා ආයෝජනය කිරීම අපගේ දැක්මෙහි කේන්ද්‍රීය සාධකයක් වේ. කෘතිම බුද්ධිය, දත්ත විශ්ලේෂක සහ සයිබර් ආරක්ෂණය ආදී නූතන තාක්ෂණ ප්‍රවණතා පිළිබඳව විශේෂිත පුහුණුවක් ලබාදීම ඔස්සේ ඩිජිටල්කරණයේ සමර්ථ ශ්‍රම බලකායක් බිහිකිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව තවදුරටත් කටයුතු කරයි. එසේම, සේවා නියුක්තිකයන්ගේ සුවතාවය හා යහපැවැත්ම ඉලක්ක කරගත් වැඩසටහන් වැඩි ප්‍රමාණයක් සංවිධානය කිරීමටත් උපදේශකත්වය, අනුප්‍රාප්තික සැලසුම් සහ කාර්යසාධනය පදනම් කරගත් සංස්කෘතියක් ඇති කිරීම වැනි ක්‍රමවේද ඔස්සේ අනාගතයට සූදානම් නායකත්වයක් බිහිකිරීමටත් අපි අපේක්ෂා කරමු.

අප ජාතික යටිතල පහසුකම් සංවර්ධනය සහ ආර්ථිකය යළි ගොඩනැගීම උදෙසා සහය දක්වන අතර රාජ්‍ය සහ පෞද්ගලික අංශ අතර සහයෝගීතාවය වර්ධනය කරගැනීම එහිලා උපායමාර්ගික ප්‍රවේශයක් ලෙස හඳුනාගත හැක. රාජ්‍ය ආයතන හා ආයතනික පාර්ශවකරුවන් සමග සමීපව කටයුතු කිරීම ඔස්සේ වර්ධනය සඳහා පවතින නව අවස්ථා උදාකර ගන්නා අතර ශ්‍රී ලංකාවේ තිරසාර සහ සර්වග්‍රාහී ආර්ථික ප්‍රගමනයකට දායකවීම අපගේ ඉලක්කය වේ.

අපි අඛණ්ඩ වර්ධනය හා පරිවර්තනය පිළිබඳ බලාපොරොත්තු රැගෙන තවත් වසරකට එළඹ සිටින මේ මොහොතේ නව්‍යකරණය ඉදිරියට ගෙනයාම, තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රජාව සවිබලගැන්වීම සඳහා අඛණ්ඩව කැපවීමට ප්‍රතිඥා දෙමු. මේ කාර්යයේදී අපගේ දැක්ම හා උපායමාර්ගික ප්‍රමුඛතා අපට මගපෙන්වයි. එම පන්නරය සමග අපි, ශ්‍රී ලංකාවේ විශ්වසනීයම ඉතුරුම් දැවැන්තයා ලෙස, අපගේ උරුමය ඉදිරියට රැගෙන යන අතර අපගේ සියළු පාර්ශවකරුවන්ට වඩා දීප්තිමත්, සර්වග්‍රාහී අනාගතයක් උදාකරදීමට සූදානම්ව සිටිමු.

## ඇගයීම

අප කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් අපගේ ගනුදෙනුකරුවන්ට, සිය අප්‍රතිහත කැපවීම වෙනුවෙන් අපගේ සේවා නියුක්තිකයන්ට සහ මා වෙත ලබාදුන් උපායමාර්ගික මාර්ගෝපදේශකත්වය වෙනුවෙන්, බැංකුවේ සභාපති, ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ හදපිරි කෘතඥතාවය පුද කරමි. එසේම, මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කරන අතිගරු ජනාධිපතිතුමාට, අග්‍රාමාත්‍යතුමියට, නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයාට, භාණ්ඩාගාර ලේකම්වරයා සහ අනෙකුත් නිළධාරීන්ට, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා හා සෙසු නිළධාරීන්ට, අප වෙත දැක්වූ මිල කළ නොහැකි සහය වෙනුවෙන් ඉතා ස්තූතිවන්ත වෙමි.

අප වෙත ලබාදෙන අඛණ්ඩ සහයෝගය හා අප සමග පවත්නා සබඳතාවය වෙනුවෙන් නීතිපතිවරයාට, විගණකාධිපතිවරයාට, තැපැල්පතිවරයාට සහ ඔවුන්ගේ කණ්ඩායම් වලට මෙන්ම අනෙකුත් නියාමන ආයතන වල ප්‍රධානීන් හා ඔවුන්ගේ කණ්ඩායම් වලටද විශේෂ ස්තූතිය පුදකිරීමට මම මෙය අවස්ථාව කරගනිමි. අපගේ සාර්ථකත්වය සැබෑවක් කරමින් අප වෙත සහය දැක්වූ අපගේ පාර්ශවකරුවන්ට සහ හවුල්කරුවන්ටද මම හෘදයාංගම ස්තූතිය පුද කරමි.

නව අදිටනක් සමගින් අප නව වසරට එළඹ සිටින මේ මොහොතේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිරසාර වටිනාකම්, නවෝත්පාදක අභිප්‍රාය සහ කැපවීමෙන් සේවයේ නියුතු සේවක මඬුල්ල වඩා සචල, සර්වග්‍රාහී සහ සෞභාග්‍යමත් අනාගතයක් කරා බැංකුව රැගෙන යනු ඇති බව මම විශ්වාස කරමි.



**ශෂී කණ්ඩම්බි**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

25 මාර්තු 2025



ඒකාබද්ධ වාර්තාව

# අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය


27
මෙහෙයුම් පරිසරය

32
අවදානම් හා අවස්ථා

39
ප්‍රමාණාත්මකභාවය

52
ඒකාබද්ධ පාර්ශවකාර සහභාගිත්වය

60
අපගේ තිරසාර රාමුව

64
ව්‍යාපාර ආදර්ශය

68
උපායමාර්ග හා සම්පත් වෙන් කිරීම

## ගෝලීය ආර්ථිකය

ආර්ථිකය ව්‍යාකූල වූ වසර ගණනකින් පසු, 2024 භූ දේශපාලනික ආතතින් ඉහළින් පැවති බැවින් තවදුරටත් අභියෝග ඉදිරිපත් කරයි. වසංගතය, පවත්නා භූදේශපාලන ආරාවුල් සහ අහිතකර කාලගුණ සිදුවීම්වල සංයෝජනයක් සැපයුම් දාම බිඳදමමින් බලශක්ති සහ ආහාර අර්බුද ඇති කළ අතර, ජීවිත සහ ජීවනෝපායන් සුරක්ෂිත කිරීමට රජයට පෙරනොවූවිරූ ක්‍රියාමාර්ග ගැනීමට පොළඹවන ලදී. ගෝලීය ආර්ථිකය ඔරොත්තුදීම පෙන්වා ඇති බැවින්, මෙම ප්‍රතිසාධනය කල්පවතින අනතුරු සමඟ කලාපය පුරා සමානව පැවතුණි.

ලෝක බැංකුවට අනුව, මානව ඉතිහාසය තුළ මෙයට පෙර නොදුටු අති විශේෂ අවස්ථාවක් දැකගන්නට ලැබුණ අතර, බොහෝ ජනතාව අතිශය දිළිඳු බවට පත්විය. ඉදිරි දශක කිහිපයක් තුළ, ගෝලීය මධ්‍යම පන්තිය ක්‍රමානුකූලව පුළුල් වනු ඇති බවට අපේක්ෂා කරන අතර, ගෝලීය ජනගහනයෙන් මිලියන 440 සිට 1.2 බිලියන දක්වා හෝ 7.6% සිට 16.1% දක්වා වර්ධනය වියහැක. මෙම වර්ධනයෙන් වැඩි කොටසක් චීනය හා ඉන්දියාවෙන් පැමිණේ.

ධනය බටහිර සිට නැගෙනහිරට විතැන්වීම පමණක් නොව එය රාජ්‍ය පාලනය යටතේ වැඩි වැඩියෙන් සංකේන්ද්‍රණය වේ.

2008 මූල්‍ය අර්බුදයේ ප්‍රතිවිපාක තුළ, ආර්ථික කළමනාකරණය තුළ රාජ්‍යයේ කාර්යභාරය වඩාත් පුළුල්ව පිළිගන්නා බවට පත්ව ඇත. බටහිර නිදහස් ආර්ථිකයන්වල මෙන් නොව, චීනය, රුසියාව සහ ගල්ෆ් රාජ්‍ය වැනි මෙම ධනය විතැන්වීමේ ප්‍රතිලාභීන් බොහොමයක් ප්‍රජාතාන්ත්‍රික නොවන අතර රජය හා පුද්ගලික අංශය අතර මාර්ග බොඳ කරයි. සම්ප්‍රදායික නිදහස් වෙළෙඳපොළ ආදර්ශයන් අනුගමනය කිරීම වෙනුවට, මෙම ජාතීන් "රාජ්‍ය ධනේශ්වර ක්‍රමය" ලෙස සැමවිටම හඳුන්වන ක්‍රමයක් වැළඳ ගන්නා අතර, ඒ තුළ ආර්ථික සැලසුම් කිරීම සහ ආයෝජනය තුළ රාජ්‍ය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.

මේ සමඟම, පශ්චාත් වසංගත සැපයුම් දාම බිඳවැටීම් සහ වැඩිවන ඉල්ලුම හේතුවෙන් උද්ධමනීය පීඩනයන් බොහෝ ආර්ථිකයන් හි පැවතුණි, තියුණු ආර්ථිකයන් හී මහ බැංකුවලින් උද්ධමනය වර්ධනය කිරීමට දැඩි මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් අපේක්ෂා කරන අතර, එය විශේෂයෙන් ඇමෙරිකාව සහ යුරෝපයේ වර්ධනය අඩු කළ හැකිය. උද්ධමන අනුපාත ස්ථාවර කරනු ලැබුවද, ඒවා ඉහළ පූර්ව වසංගත මට්ටම්වලට ඉහළින් පවතී.

## ගෝලීය වර්ධනය

ගෝලීය වර්ධනය 2025 සහ 2026 දි ඇස්තමේන්තුකළ 3.5%ක අඩු මට්ටමක ස්ථිරව පවතිනු ඇති බවට අපේක්ෂා කෙරේ. වඩා දිගු කාලයක් පුරා, 2023 දී 3.3% ක් වූ වර්ධනය 2029 වන විට 3.1% දක්වා ක්‍රමයෙන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමනය ලිහිල් වන විට, මූර්ත පොලී අනුපාවල අධික වැඩිවීම වලක්වමින්, ප්‍රතිපත්ති අනුපාත ඒ අනුව සකස් වනු ඇතැයි අපේක්ෂා කෙරේ, පොලී අනුපාත කාලය සමඟ ඒවායේ සමතුලිත මට්ටම්වලට ක්‍රමයෙන් ආපසු පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 2025 දී ක්‍රමවිකාශය වර්ධන පුරෝකථන

ප්‍රස්ථාරය 1




මූලාශ්‍රය: IMF කාර්ය මණ්ඩල ගණනය

සටහන: X-අක්ෂයෙන් World Economic Outlook ප්‍රකාශිත මාසය පෙන්වයි. AEs = උසස් ආර්ථිකයන්; EMDEs = නැගීඑන වෙළෙඳපොළ සහ සංවර්ධනය වන ආර්ථිකයන්ය.

| | 2026 % | 2025 % | 2024 % | 2023 % |
|---|---|---|---|---|
| ගෝලීය වර්ධනය | 3.3 | 3.3 | **3.2** | 3.3 |

වගුව 2

සිය පරිමාණය, වේගය, සහ බටහිරින් නැගෙනහිරට දිශාගත ප්‍රවාහය මගින් සලකුණු කළ ධනය හා ආර්ථික බලය තුළ ගෝලීය වශයෙන් පවතින විතැන්වීම තුළින් නවීන ඉතිහාසය තුළ වඩාත් වැදගත් පරිනාමනයන් නියෝජනය කරයි. මෙම සංක්‍රාන්තිය මූලිකවම ප්‍රධාන සාධක දෙකක් මගින් මෙහෙයවනු ලබයි. පළමුවැන්න, ඉන්ධන හා පාරිභෝගික භාණ්ඩ මිල ගණන්වල නැගීම දරා ගැනීම ගල්ෆ් රටවල් හා රුසියාව වැනි සම්පත්වලින් පොහොසත් ජාතීන්ට සැලකියයුතු අහඹු ලාභ උත්පාදනය කර ඇත, දෙවන්න, තරඟකාරී ශ්‍රම පිරිවැය සහ උපායාමර්ගික රාජ්‍ය ප්‍රතිපත්ති භාවිතය තුළින් ආසියාව ගෝලීය නිෂ්පාදකයෙක් සහ සේවා මධ්‍යස්ථානයක් ලෙස සිය තත්ත්වය ස්ථිර කරගෙන ඇත. ශක්තිමත් ගෝලීය ඉල්ලුම මත ප්‍රාග්ධනනීයකරමින්, වඩා ඉහළ ප්‍රතිලාභ අත්කරගත් චීනය සහ ඉංදියාව වැනි ආර්ථික දැවැන්තයින් සමඟ කලාපය සැලකියයුතු ආර්ථික පරිමාණ සාක්ෂාත් කරගෙන ඇත. චීනය හා ඉංදියාව තමන් මිට දශක දෙකකට පෙර දරන ලද ආර්ථික ප්‍රමුඛත්වය නැවත ලබාගනිමින් සිටින අතර ගෝලීය ධනයෙන් චීනය 30%කට සහ ඉංදියාව 15% ආසන්න වශයෙන් දායක වේ. 18 වැනි සියවසේ සිට පළමුවරට, මෙම ජාතීන් දෙක ගෝලීය ආර්ථික වර්ධනයට විශාලම දායකයින් බවට පත්ව ඇත. 2025 වන විට, චීනය හා ඉංදියාව ඇමෙරිකාව සහ ජපානය හැර සියලූම ආර්ථිකයන්ගේ දළ දේශීය නිෂ්පාදිතය පසුකරනු ඇති බවට පුරෝකථනය කෙරේ. කෙසේවෙතත්, සිය ආර්ථික ශක්තීන් හමුවේ, රටවල් දෙක ද්විත්ව ආර්ථික යථාර්ථයක් තුළ ඇතිවන දශකයන් සඳහා ඒක පුද්ගල ආදායම තුළ අඛණ්ඩව ගමන් කිරීම අපේක්ෂා කෙරේ. එහි දී ඔවුන් සැලකියයුතු ගෝලීය බලපෑමක් පවත්වන අතර ඔවුන්ගේ පුරවැසියන්ගෙන් බොහෝ දෙනෙක් බටහිරට සාපේක්ෂව සාමාන්‍ය ජීවන තත්ත්වයන්ට පහළ තත්ත්වයන් තවමත් අත්විඳිමින් සිටී.

## ගෝලීය උද්ධමය

ගෝලීය ශීර්ෂ උද්ධමනය 2023 දි පැවති 6.7%ක වාර්ෂික සාමාන්‍ය 2024 දී 5.8% සහ 2025 දි 4.3% දක්වා දක්වා පහත වැටෙන බවට පුරෝකථනය කෙරේ.

දියුණු ආර්ථිකයන් නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වන ආර්ථිකයන්ට වඩා ඉක්මණින් ඔවුන්ගේ උද්ධමන ඉලක්ක වෙත ආපසු ලඟාවීම නිසා එය සිදුවේ. 2024 වසර ආරම්භවේ සිට, ප්‍රධාන ආර්ථිකයන් හී ආර්ථික කටයුතු සිය විභවතාවන් සමඵ වඩා යහපත් ලෙස පෙළ ගැසීමත් සමඟ, චක්‍රීය අසමතුලිතතාවන් ක්‍රමානුකූලව විසඳන බව සලකුණු පෙන්වා ඇත. මෙම ප්‍රවණතා රටවල් හරහා වඩාත් සමීප උද්ධමන අනුපාත ගෙන ඒමට සහය වී ඇති නමුත් ගෝලීය අවධමනයේ ගම්‍යතාව තුළින් වසරේ පළමු අර්ධය තුළ මන්දගාමී වී ඇති බව පෙන්නුම් කරයි.

| | 2026 % | 2025 % | 2024 % | 2023 % |
|---|---|---|---|---|
| ගෝලීය උද්ධමනය | 3.5 | 4.2 | **5.8** | 6.7 |

වගුව 3

## උද්ධමන දැක්ම

ප්‍රස්ථාරය 2




මූලාශ්‍රය: මහ බැංකු වෙබ් අඩවි: Haver විශ්ලේෂණත සහ IMF කාර්ය මණ්ඩල ගණනය කිරීම්ග

**සටහන:** 1 පැනලයෙහි, බර ලෙස මිලදීගැනිමේ ශක්තිය - සමාන GDPs භාවිතා කරමින් සාමාන්‍යයන් ගණනය කෙරේ.
2 පැනලයෙන් සෑම WEO වාර්තාවකින්ම ව්‍යාප්තිය පෙන්වයි. (box-whisker plot) කොටුවේ මැද අවහිර කිරීම මධ්‍යස්ථ වන අතර, කොටුවල ඉහළ (පහළ) සීමා තෙවැනි (පළමු) චතුර්ථක වේ. ඉහළ සහ පහළ චතුර්ථකවලින් පිළිවෙලින් අන්තර් චතුර්ථක පරාසය මෙන් 1.5 ගුණයක සීමාවක් තුළ ඉතා කෙටි දුරින් උපරිම සහ අවම අගයන් පෙන්වයි. AEs = දියුණු ආර්ථිකයන්ත EMDEs = නැගීඑන වෙළෙඳපොල සහ සංවර්ධනය වන ආර්ථිකයන්ත WEO = World Economic Outlook.

## පොලී අනුපාත

ගෝලීය අවධමන ප්‍රවණතාවයට ප්‍රතිචාර වශයෙන්, බොහෝ ආර්ථිකයන් වඩාත් උපකාරක මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයකට මාරු වී ඇත. 2024 වසර පුරාම, ලොව පුරා මහ බැංකු උපායමාර්ගික පොලී අනුපාත ගැලපීම් තුළින් ආර්ථික වර්ධනය පවත්වා ගනිමින් උද්ධමන පාලනය සමතුලිත කිරීමට උත්සාහ කරමින් සංකීර්ණ අභියෝගයකට මුහුණ දුන්නේය.

| | | 2025 % | 2024 % |
|---|---|---|---|
| මාස 3 රජයේ බැඳුම්කර ආදායම | ඇමෙරිකාව | 3.9 | **5.4** |
| | යුරෝ කලාපය | 2.8 | **3.5** |
| | ජපානය | 0.5 | **0.1** |
| මාස 10 රජයේ බැඳුම්කර ආදායම | ඇමෙරිකාව | 3.5 | **4.1** |
| | යුරෝ කලාපය | 2.5 | **2.4** |
| | ජපානය | 1.3 | **1.0** |


වගුව 4


## එක්සත් ජනපද G6 සෘණ සැබෑ අවුරුදු 2 බැඳුම්කර ව්‍යාප්තිය*

ප්‍රස්ථාරය 3




* G6 යන්නෙන් DXY USD දර්ශකය තුළ සමන්විත රටවල් අර්ථවත්වන අතර ඒ අනුව බරතබා ඇත.

මූලාශ්‍රය: PinPoint Macro විශ්ලේෂණයල Marobond (2025 මාර්තු 3 දිනට)

## හුවමාරු අනුපාත

2024 මූල්‍ය වසර තුළ, අභියෝගාත්මක ගෝලීය ආර්ථික වාතාවරණයක් හමුවේ මුදල් වෙළෙඳපොල සැලකියයුතු විතැන්වීම්වලට මුහුණ දෙන ලදී. එක්සත් ජනපද ආර්ථිකය මන්දගාමී සලකුණු පෙන්වීමත් සමඟ, ෆෙඩරල් සංචිත 2024 වසර තුළ විශේෂයෙන් පොලී අනුපාත කැපීම් තුනක් සලකුණුකළ බැවින් ඇමෙරිකානු ඩොලරය දුර්වල විය. මෙම වෙනස්වීමෙන් ලොවපුරා ආර්ථිකයන්ගෙන් මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිචාර කඩිනම් කරමින් ගෝලීය මුදල් මත විශාල ප්‍රතිඵල ඇතිකරන බලපෑම් තිබුණි.

යුරෝ කලාපය ඔරොත්තුදීම පෙන්වා ඇති අතර, මෙම සංවර්ධනයන්ගේ ප්‍රතිලාභ ගැනීමට යුරෝව (EUR) ස්ථානගත විය. ඩොලරය පහත වැටෙන විට අපේක්ෂා කල ප්‍රමාණයට වඩා ශක්තිමත් ජංගම ගිණුම් අතිරික්තයක් EUR/ USD විනිමය අනුපාතයේ වැඩිවීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සමගම, එක්සත් රාජධානියේ ආර්ථික වර්ධන පුරෝකතනයන්ට ඉහළ සංශෝධන මගින් ඇතිකළ බ්‍රිතාන්‍ය පවුම (GBP) සිය තරගකරුවන්ට වඩා වෙනස්ව පැවතියේය. එංගලන්ත බැංකුව පොලී අනුපාත කැපීම් ක්‍රියාත්මක කරනු ලැබුවද, පවුම දුර්වල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ස්ථාවරව පැවතීම අපේක්ෂා කෙරේ.

ඇමෙරිකානු ඩොලරය විශේෂයෙන් ප්‍රධාන G10 සහ ආසියානු මුදල්වලට අනුව තවදුරටත් පහත වැටෙනු ඇති බව අපේක්ෂා කෙරේ. මෙම පහත වැටීම රේඛීය විය නොහැකි අතර, USD දර්ශකය සිය වර්තමාන මට්ටමින් 2.0%ක් පහත වැටිය හැකි බවට විශ්ලේෂකයින් අපේක්ෂා කරයි

## ඇමෙරිකානු ඩොලරයට අනුව ප්‍රධාන හුවමාරු අනුපාත

ප්‍රස්ථාරය 4

(USD අනුව තෝරාගත් මුදල්වල වෙනස්වීම් %| ශූන්‍ය පදනම = වසර එකට පෙර)




* USD අනුව කාර්යසාධනය පෙන්වීමට සම්ප්‍රදායික නොවන මාර්ගල CNY, සහ CAD ඕනෑකමින් උපුටා දක්වා ඇත

මූලාශ්‍රය: PinPoint Macro විශ්ලේෂණයල Marobond (2025 මාර්තු 3 දිනට)

## ශ්‍රී ලංකා ආර්ථිකය

ශ්‍රී ලාංකීය ආර්ථිකය 2024 දී වසර දෙකකට පෙර අත්විඳි දැඩි ආර්ථික පහත වැටීමෙන් පසු ශක්තිමත් ලෙස අඛණ්ඩව ප්‍රතිසාධනය වේ. ප්‍රතිසාධනය පසුපස මූලික ධාවකයින් මිලදී ගැනීමේ ශක්තියේ අර්ධ ප්‍රතිසංස්කරණයක් සහ අවිනිශ්චිතතාව තුළ සැලකියයුතු අඩුකිරීමක් විය. 2024 ප්‍රගතිගාමී, මැතිවරණ අදාළ අවිනිශ්චිතතා ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා අඛණ්ඩ කැපවීමක් සහ වැඩි ප්‍රතිපත්ති අනුකූලතාවක් පිළිබඳ දෘශ්‍යමාන සලකුණු මගින් සහාය දක්වමින් විසුරුවා හරින ලදි. තවද, විශ්වාසය ශක්තිමත් කිරීම බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ ආසන්න සම්පූර්ණ කිරිම සහ සීමිත පැහැරහැරීමේ තත්ත්වයන්ගෙන් රටේ සාර්ථක පිටවීම වූ අතර මේ දෙකම ආයෝජකයින්ගේ හැඟීමට සහ වඩා පුළුල් පාර්ශවකාර විශ්වාසය සැලකියයුතු ලෙස වැඩි කර ඇත.

වර්ධනය කර්මාන්ත අංශය තුළ ප්‍රතිසාධනයක් සහ සංචාරක කර්මාන්තයට අදාළ සේවාවන්හී ශක්තිමත් කාර්යසාධනයක් මගින් විශාල වශයෙන් මෙහෙයවන ලදී. 2024 වසර තුළ, නියාමන ප්‍රතිපත්තිය ලිහිල් කරන ලද බැවින් පොළී අනුපාතවල තවදුරටත් අඩුකිරීම සඳහා ඉඩදෙමින් උද්ධමනය අඩුමට්ටමක පැවතුණි.

2024 මුලදී පුද්ගලික අංශයට ණයවල අසමාන ප්‍රවනතාවක් පෙන්වන අතර, වෙනස්වන ආර්ථික තත්ත්වයන් හමුවේ ණය සඳහා අඛණ්ඩ ණයදීමේ හැසිරීම සහ උදාසීන ඉල්ලුම පිළිබිඹු කරන ලදී. කෙසේවෙතත්, 2024 මැද සිට, පුද්ගලික අංශයේ ණයවල බහුවිධ සාධක මගින් ස්ථිර සහ සැලකියයුතු පුළුල් කිරීම දක්නට ලැබුණි.

ජංගම ගිණුමේ තත්ත්වය සංචාරක සහ ප්‍රේෂණවලින් වඩා ඉහළ ඉපයීම් හේතුවෙන් ශක්තිමත් කරන ලද අතර, බාහිර ණය සේවාකරණය නතර වී පැවතුණි. මෙය ගෙවුම් ශේෂ අතිරික්තයකට දායක වූ අතර මාස තුනක පමණ ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් සංචිත රැස් කිරීමට උපකාරී විය.

මූල්‍ය පෙරමුණ මත, රජයේ ආදායම වැඩි වී ඇති අතර, වියදම් පාලනය මූල්‍ය ශේෂය වර්ධනය කර ඇත. බදු ආදායම් 2024 දී වාර්ෂිකව 36.2%කින් වර්ධනය වූ අතර, එයට ප්‍රධාන වශයෙන් වඩා ඉහළ අගය එකතුකළ බදු රැස්කිරීම හේතු විය. ආර්ථික ස්ථායිකරණය හමුවේ, බොහෝ පවුල් දැඩි දරිද්‍රතාවයට, ආහාර හිඟයට, සෞඛ්‍ය ප්‍රතිඵල පිරිහීමට හා පහත වැටෙන ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතයකට මුහුණ දෙමින් අඛණ්ඩව වෙහෙසට පත්විය. දළ දේශීය නිෂ්පාදිත වර්ධනය 2024-2025 තුළ සාමාන්‍යය වාර්ෂිකව 4%ක පුරෝකථනය කරමින් අපේක්ෂාවට වැඩි ස්ථායිකරණය කෙටි කාලීන වර්ධන අපේක්ෂාවන් වර්ධනය කරන ලදී. ආර්ථිකය පහළ පදනමක සිට ශක්තිමත් වෙමින් සිටි අතර, සිය මධ්‍යකාලීන විභවතා අර්බුදයේ කල්පවතින බලපෑම් මගින් බලපෑම් සහගතව පැවතුණි.

## දේශීය වර්ධනය

ආර්ථිකය මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරිමේ චක්‍රය තුළින් ප්‍රගතිය ලද බැවින් හා හිතකර උද්ධමන ගමන්මඟ තුළින් ප්‍රතිලාභ ලද බැවින්, ආර්ථික කටයුතු පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේවෙතත්, මෙම වර්ධනය හමුවේ, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පූර්ව නිශ්චිත මට්ටම්වලට වඩා පහළින් පැවති අතර. මූර්ත ආදායම මත දැඩි බලපෑම ඉස්මතු කරන ලදී. ඊට අමතරව, ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය 50%ට පහළින් පැවති අතර, ඉන් වැඩකරන වයස් ජනගහනයෙන් සැලකියයුතු කොටසක් ආර්ථික වශයෙන් අක්‍රීයව සිටින බව පෙන්නුම් කරයි. මෙම ව්‍යුහගත දුර්වලතාව ආර්ථික ප්‍රතිසාධන පියවරට බාධා ඇති කළ හැකිය. තවද, ආදායම මට්ටම් පූර්ව වසංගත මිණුම් සලකුණුවල පවතින බව මූර්ත වැටුප් අනුපාත දර්ශකවලින් අඛණ්ඩවම පෙන්වා ඇත.

## මූර්ත දළ දේශීය නිෂ්පාදිත වර්ධනය

ප්‍රස්ථාරය 5




## උද්ධමනය

උද්ධමනය මහ බැංකුවේ ඉලක්කයට වඩා පහත වැටුනද, මිල මට්ටම් පසුගිය උද්ධමණීය පීඩනයන් හේතුවෙන් ඉහළ මට්ටමක පැවතුණි. 2024 දී, ශ්‍රී ලංකාව උද්ධමනයෙහි සැලකියයුතු පහළයාමක් අත්විඳි අතර, වසර අවසානය වන විට අවධමන කලාපයකට පරිවර්තනය වෙමින් තිබුණි. 2024 දෙසැම්බර්වල කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) 1.7%ක අවධමන අනුපාතයක් වාර්තකළ අතර, ඉන් අනුරූප කාලසීමාවට සාපේක්ෂව සමස්ත මිල ගණන්වල පහත වැටීම පිළිබිඹු කරයි. මෙම අවධමන ප්‍රවණතාවය 2025 මුල් භාගය දක්වා පැවති අතර, CCPI 2025 ජනවාරි මාසයේදී 4.0% ක අවධමනයක් වාර්තා කළේය. ඉදිරිය දෙස බැලීම්දී,  ආසියානු සංවර්ධන බැංකුව 2025 දී ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතය 5.5% ක සාමාන්‍යයක් වනු ඇතැයි පුරෝකථනය කරයි. මහබැකුව 2025 මැදවන විට 5%ට ආසන්නව උද්ධමනය ස්ථාවර කිරිමට අරමුණු කරයි. මෙවැනි ප්‍රක්ෂේපනයන් තුළින් 2024 අවසානය හා 2025 මුල නිරීක්ෂණය වූ අවධමන තත්ත්වයන් ඉල්ලුම ශක්තිමත් වන මධ්‍යම උද්ධමන මට්ටම් කරා සංක්‍රාන්තියක් යෝජනා කරයි.

### ප්‍රක්ෂේපිත ශීර්ෂ උද්ධමනය (කාර්තුමය, CCPI, වාර්ෂික, %)

ප්‍රස්ථාරය 6

2025 ජනවාරි මූල්‍ය ප්‍රතිපත්ති වටය තුළ ප්‍රක්ෂේපන මත පදනම් වේ




මූලාශ්‍රය: මහ බැංකු කාර්ය මණ්ඩල ප්‍රක්ෂේපන

### පොලී අනුපාත

2024 දී, මහ බැංකුව උද්ධමනය පහත වැටීම හමුවේ ආර්ථික ප්‍රතිසාධන උත්තේජනය කිරීමට වඩාත් උපකාරක මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයක් යොදා ගත්තේය. වසර පුරා, මහ බැංකුව වෙළෙඳපොළ පොලී අනුපාත සැලකියයුතු ලෙස අඩු කිරීමට හේතුවන ප්‍රතිපත්ති අනුපාතවල බහුවිධ අඩුකිරීම් ක්‍රියාත්මක කළේය. මෙම ප්‍රතිපත්තිමය වෙනස පුළුල් ආර්ථිකය පුරා මුදල් ලිහිල් කිරීමේ වඩා ඉහළ සංක්‍රමණයකට පහසුකම් සැලසීය. 2024 නොවැම්බර් 27 දින, මහ බැංකුව තනි ප්‍රතිපත්ති පොලී අනුපාත යාන්ත්‍රණයක් හඳුන්වා දුන් අතර, අනපේක්ෂිත ප්‍රතිපත්ති අනුපාතය (OPR) 8.00% ක් ලෙස නියම කළේය. මෙම නව පද්ධතිය පෙර ද්විත්ව අනුපාත රාමුව වෙනස් කළ අතර, එය ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) සහ ස්ථාවර ණයදීමේ පහසුකම් අනුපාතයෙන් (SLFR) සමන්විත විය.

### හුවමාරු අනුපාත

2024 දී, ශ්‍රී ලංකා රුපියල (LKR) ප්‍රධාන මුදල්වලට අනුව සාපේක්ෂ ස්ථාවරත්වයක් පෙන්වන අතර ජාතියේ ආර්ථික ප්‍රතිසාධන උත්සාහයන් ඉන් පිළිබිඹු කරයි. ඇ.ඩොලරය/රුපියල් හුවමාරු අනුපාතය වසර පුරාම පටු පරාසයක් තුළ පැවතියේය. මහ බැංකුවේ දත්තවලට අනුව, හුවමාරු අනුපාතය 2024 වසර තුළ 289.87 සහ 290.50 අතර උච්ඡාවචනය විය. මෙම ස්ථාවරත්වය සාධක කිහිපයක් මගින් තහවුරු කළ අතර එයට 2024 නොවැම්බර්වල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇ.ඩොලර් බිලියන 2.9ක ඇපවීමේ ශ්‍රී ලංකාවේ තෙවැනි සමාලෝචනයේ සාර්ථකව අවසන්වීම ඇතුළත්ය. මෙම සමාලෝචනය ඇ.ඩොලර් මිලියන 333ක අමතර නිදහස් කිරීමකට හේතු වූ අතර, එය සංචිත තවදුරටත් ශක්තිමත් කරමින් ආර්ථික ප්‍රතිසාධන මුලපිරීම්වලට සහය විය.

### බැංකු අංශයේ දැක්ම

ශ්‍රී ලංකාව 2025 තුළින් ප්‍රගතිය ලබන බැවින් හා අනාගතය දකින බැවින්, මෑතකාලීන ආර්ථික ප්‍රතිසාධන හා ප්‍රධාන මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ මත ගොනුගෙමින් බැංකු ක්ෂේත්‍රය පරිවර්තනීය වර්ධනයක් සිදුකරනු ඇති බවට අපේක්ෂා කරයි. මෙම අංශය සැලකියයුතු වර්ධිත ලාභදායිතාවක් සමග ඔරොත්තුදීම පෙන්වා ඇත.

ලිහිල් සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ 2024 පළමු අර්ධයේදී මූල්‍ය ආයතනනවල ඔරොත්තුදීම ක්‍රමානුකූලව වර්ධනය විය. ණයවල තත්ත්වය, ද්‍රවශීලතාව, සහ ප්‍රාග්ධණ ප්‍රමාණාත්මතාව ඇතුළුව ප්‍රධාන මූල්‍ය යහපත් දර්ශකවල මෙය පිළිබිඹු කරන ලදී.

2024 දී, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ වර්ධිත ආර්ථික තත්ත්වයන් මූල්‍ය අතරමැදිකරණයේ පුනර්ජීවනයට උපකාරී විය. සාමාන්‍ය බර තබන ලද ණය අනුපාතිකය 2022 දෙසැම්බර්වල 18.7% ක උපරිමයක සිට 2024 දෙසැම්බර්වල 11.9% දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, නව ණය අනුපාත සාමාන්‍යය 11.5% විය. පුද්ගලික අංශයේ ණය වර්ධනය 2024 අවසානයට 10.7%ක සැලකියයුතු වාර්ෂික වැඩිවීමක් පෙන්වා ඇත.

ආර්ථික අර්බුදය විසින් දැඩි පීඩනයට ලක්වූ අය අතර සිටින, ක්ෂුද්‍ර සුළු, හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSMEs), ණය සේවාකරණය සහ හිතකර ණය නියමයන් සඳහා ප්‍රවේශය ගැනීමේදී අඛණ්ඩව අභියෝගවලට මුහුණ දී ඇත.

තැන්පතු අනුපාත ද ණය අනුපාතවලට වඩා වේගයෙන් පහත වැටුණු අතර, 2023 දෙසැම්බර් පැවති 11.6%ක ඉහළ අගයට සාපේක්ෂව 2023 දෙසැම්බර් වන විට 7.5% දක්වා සාමාන්‍ය තැන්පතු

### තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතවල වෙනස්වීම

ප්‍රස්ථාරය 7




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

### හුවමාරු අනුපාත වෙනස්වීම්

ප්‍රස්ථාරය 8 ප්‍රස්ථාරය 9

දෛනික හුවමාරු අනුපාතය




මාසික යෙදුම ඩොලරයට අනුව (+)/Dep(-)




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුපාතය පහත වැටුණි. තැන්පතු අනුපාතයෙහි මෙම පහත වැටීම ඒහි ශුද්ධ පොලී ආන්තිකය වර්ධනය කර ගැනීමට බැංකුවට සහය වූ අතර, වඩා ඉහළ ආර්ථික ස්ථාවරත්වය සහ අලුත් කළ ආයෝජන විශ්වාසය පිළිබිඹු කරමින් 2024 දී මුළු තැන්පතු වාර්ෂිකව 8.1%කින් වර්ධනය විය.

## නියාමන ක්‍රියාමාර්ග හා බැංකු ප්‍රතිසංස්කරණ

මහ බැංකුව විසින් බැංකු අංශය තුළ මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් ඔරොත්තුදීම වැඩි කිරිමට මුල්පිරීම් කිහිපයක් ගෙන ඇත.

- **බැංකුවේ ප්‍රතිප්‍රාග්ධනනීයකරණ උපායමාර්ගය:** දේශීය විශාල බැංකු නවයක් ප්‍රාග්ධන වර්ධන සැලසුම් ඉදිරිපත් කර ඇති අතර, ඒවා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් සමඟ අනුකූලතාව සහතික කිරීමට අර්ධ වාර්ෂිකව නියාමනය කරනු ලැබේ.
- **වෙළඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීමේ රාමුව:** අවශ්‍ය අවස්ථාවන්හිදී බැංකු ඒකාබද්ධ කිරීම් සඳහා පහසුකම් සැලසීම සඳහා නව රාමුවක් හඳුන්වා දෙනු ලැබේ.
- **නියාමන වර්ධනයන්:** මහ බැංකුව විසින් ණයදීමේ සීමා, ආයතනික පාලනය, ද්‍රවශීලතා කළමනාකරණය, සහ අක්වෙරළ බැංකු රෙගුලාසි වැනි ක්ෂේත්‍ර ආවරණය කරමින් බැංකු (සංශෝධිත) පනත යටතේ දැඩි රෙගුලාසි ක්‍රියාත්මක කළේය.
- **අක්වෙරළ බැංකු පුළුල් කිරිම:** මහබැංකුව නියාමනය කළ අක්වෙරල බැංකු රාමුවක් ස්ථාපිත කිරිමට කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව සමඟ සහයෝගී වනු ඇත.
- **අර්බුද කළමනාකරණය හා අවදානම් අධීක්ෂණය:** මූල්‍ය ක්ෂේත්‍රයේ අර්බුද කළමනාකරණ කමිටුවට අමතර සහය ලැබෙන අතර, මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහතික කිරිමට අවදානම පදනම් අධීක්ෂණය වැඩි කරනු ලැබේ.
- **AML/CFT අනුකූලතාව:** මහ බැංකුව ජාත්‍යන්තර නියාමන ප්‍රමිති සමඟ අනුකූලාතව සහතික කිරිමට සිය මුදල් විශුද්ධිකරණ විරෝධී (AML) සහ ත්‍රස්තවාදයට මූල්‍යකරණ වැලැක්වීමේ (CFT) වැඩසටහන් තීව්‍ර කරනු ඇත.

මෙම ප්‍රතිසංස්කරණවලින් අරමුණු කරන්නේ ශ්‍රී ලංකාව තුළ වඩාත් ඔරොත්තු දෙන, මනාව නියාමනය කරන සහ ස්ථාවර බැංකුකරණ පද්ධතියක් නිර්මාණය කිරිමයි.

## බැංකු ක්ෂේත්‍රයට අනුව බැංකුවේ කාර්යසාධනය

| | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු ක්ෂේත්‍රය | බැංකුවේ වෙළෙඳපොල කොටස (%) | බැංකුව | බැංකු ක්ෂේත්‍රය | බැංකුවේ වෙළෙඳපොල කොටස (%) |
| **වත්කම් හා වගකීම් (රු. ට්‍රිලියන)** | | | | | | |
| ණය හා අත්තිකාරම් | **0.5** | **10.5** | **4.8** | 0.5 | 10.1 | 5.0 |
| ආයෝජන | **1.1** | **9.1** | **12.0** | 1.0 | 7.3 | 13.7 |
| තැන්පතු | **1.6** | **18.0** | **8.9** | 1.5 | 16.6 | 9.0 |
| මුළු වත්කම් | **1.8** | **22.2** | **8.1** | 1.7 | 20.4 | 8.3 |
| **ලාභදායිතාව (%)** | | | | | | |
| වත්කම් මත ඉපයීම (ROA) | **1.5** | **2.6** | | 0.3 | 1.5 | |
| ස්කන්ධය මත ඉපයීම් (ROE) | **18.1** | **15.6** | | 9.4 | 11.5 | |
| ශුද්ධ පොලී ආන්තිකය (NIM) | **4.2** | **4.3** | | 1.8 | 3.7 | |
| ආදායමට පිරිවැය (බදු රහිත) | **38.7** | **73.2** | | 71.6 | 80.5 | |
| **වත්කම්වල තත්ත්වය (%)** | | | | | | |
| අදියර 3 මුළු ණයට ණය අනුපාතය | **5.2** | **12.1** | | 2.4 | 12.8 | |
| අදියර 3 හානිකරණ ආවරණ අනුපාතය | **44.5** | **54.1** | | 53.3 | 49.0 | |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව (%)** | | | | | | |
| පළමු පෙළ ප්‍රාග්ධනය | **23.4** | **14.9** | | 16.9 | 15.2 | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය | **25.9** | **18.4** | | 19.3 | 18.4 | |
| **ද්‍රවශීලතාව (%)** | | | | | | |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලුම මුදල්) | **344.6** | **313.8** | | 293.7 | 288.4 | |
| ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය | **193.5** | **164.8** | | 180.5 | 158.4 | |
| තැන්පතුවලට රජයේ සුරැකුම්පත් | **67.5** | | | 66.1 | | |

වගුව 5 →

# අවදානම් සහ අවස්ථා



## දේශපාලනමය

ශ්‍රී ලංකාව දැඩිව වෙනස්වන දේශපාලන පරිවර්තනයකට මුහුණදී ඇත. මෙය පාලනයේ, ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ ආයතනික ව්‍යුහයන්හි සැලකිය යුතු වෙනස්කම්වලින් යුක්තය.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) මගින් සහාය දක්වන ආර්ථික ප්‍රතිසංස්කරණ සැලැස්ම මගින් ස්ථායිත්වය පවත්වාගෙන යයි.

  NSB මත බලපෑම — H

- ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) සිදුකරන නියාමන ප්‍රතිසංස්කරණ, බැංකු ක්ෂේත්‍රය නැවත හැඩගැස්වීමක් සිදුකරයි.

  NSB මත බලපෑම — H

- බලවත් රාජතාන්ත්‍රික සබඳතා සහ ජාත්‍යන්තර සහයෝගීතාවන් මගින් ආර්ථික සහ වෙළෙඳ අවස්ථා වර්ධනය වේ.

  NSB මත බලපෑම — H

- දේශපාලන විනිවිදභාවය සහ දූෂණ විරෝධී ක්‍රියාමාර්ගවලට වැඩි අවධානයක් යොමු වීමෙන් ආයෝජක විශ්වාසය වර්ධනය වේ.

  NSB මත බලපෑම — H

H ඉහළ M මධ්‍යම L අඩු

### අවදානම් සහ අවස්ථා

**අවදානම්**

- නිතර වෙනස්වන රාජ්‍ය ප්‍රතිපත්ති ආර්ථික අස්ථිරතාවයට සහ ආයෝජකයින්ගේ අවිනිශ්චිතභාවයට හේතු විය හැක.
- පාලනය සහ ආයතනික ව්‍යුහයන්හි වෙනස්කම් නිසා වැඩි අනුකූලතා අනුවර්තනය වීම අවශ්‍ය විය හැක.

**අවස්ථා**

- පාලනය සහ සේවාවන්හි ඩිජිටල් පරිවර්තනය.
- හරිත බලශක්තිය තිරසාර ක්‍රියාමාර්ගවලට අවධානය යොමු කිරීම මගින් නවෝත්පාදනය සහ ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය වෙයි.

### ඒකාබද්ධ උපායමාර්ග

- ඩිජිටල් සහ තිරසාර නවෝත්පාදන ක්ෂේත්‍ර අරමුණුකරගත් වැඩසටහන් සංවර්ධනය කිරීම
- ආර්ථික වර්ධනය සහ සමාජ සමානාත්මතාවය අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීම සඳහා හරිත බලශක්ති මූල්‍යකරණය
- අනුකූලතාවය සහ උපදේශනය සහතික කිරීම සඳහා නියාමන අධිකාරීන් සමඟ පූර්ව ක්‍රියාකාරී සම්බන්ධතාවයක් පවත්වාගැනීම
- ප්‍රතිපත්ති වෙනස්වීම පුරෝකථනය කිරීමට හැකි අභ්‍යන්තර අවදානම් කළමනාකරණය සහ අනුකූලතා රාමුවල ශක්තිමත් කිරීම

### අදාළ වැදගත් කරුණු

1. පරිවර්තනීය දේශපාලන විතැන් වීම
2. සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය
15. පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

### අදාළ ප්‍රාග්ධනයන්

FC HC SRC NC

### අදාළ ප්‍රමාණාත්මක අවදානම්

මූල්‍ය අවදානම
කාර්යමූල අවදානම
මෙහෙයුම් අවදානම :
කීර්තිනාම අවදානම
ණය අවදානම
වෙළෙඳපොළ අවදානම
ද්‍රවශීලතා අවදානම

### අදාළ ප්‍රධාන උපායමාර්ග

ඓන්ද්‍රිය වර්ධනය ප්‍රවර්ධනය කිරීම
ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම
අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම
තිරසාර බව

### UN SDGs බලපෑම



### අනාගත දැක්ම

**දේශීය**

2025 දී ශ්‍රී ලංකාවේ දේශපාලන දැක්ම ආර්ථික ප්‍රතිසංස්කරණ, සියල්ල ඇතුළත් පාලනය සහ සමබර විදේශ සබඳතා සඳහා කැපවූ ප්‍රගතිශීලී නායකත්වය මගින් අර්ථ දැක්වේ. මේ සියල්ල ජාතිය යථා තත්ත්වයට පත් කිරීම සහ සමෘද්ධිය කරා මෙහෙයවීම අරමුණු කර ගෙන ඇත.

**ජාත්‍යන්තර**

ගෝලීය දේශපාලන භූ දර්ශනය උත්සන්න වන භූ දේශපාලනික ආතතීන්, ආර්ථික අවිනිශ්චිතතා සහ පාරිසරික අභියෝග මගින් හැඩගස්වා ඇත. ප්‍රධාන වර්ධනයන් අතර එක්සත් ජනපද තීරුබදු හඳුන්වාදීම, ප්‍රධාන ආර්ථික අතර වෙළෙඳ ආතතීන් අවුලුවාලීම, අභ්‍යන්තර දේශපාලන බෙදීම් සහ බාහිර බලපෑම් මගහරවා ගැනීමට යුරෝපීය සංගමයේ උත්සාහයන් සහ මැදපෙරදිග ආතතීන් සහ යුක්රේනරුසියානු යුද්ධය වැනි අඛණ්ඩ ගැටුම් ඇතුළත් වේ.



# ආර්ථික

- මෑතකදී ශ්‍රී ලංකා මහ බැංකුව එහි ප්‍රාථමික පොලී අනුපාත යාන්ත්‍රණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) භාවිතා කිරීමට මාරු විය. 2024 දෙසැම්බර් මාසයේදී, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය OPR 8% දක්වා අඩු කළේය.

  NSB මත බලපෑම — H

- උද්ධමනය 2024 දෙසැම්බර් මාසයේ -1.7% දක්වා අඩු වීම නිසා මිල ස්ථායී බවට පත්විය. උද්ධමනය අඩු වීමෙන් තැන්පතු වර්ධනය අඩු විය.

  NSB මත බලපෑම — H

- 2024 පළමු මාස 9 කාලය තුළ රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශක්තිමත් විය. මෙයට හේතු වුණේ වැඩිදියුණු වූ ගලා ඒවී සහපාලිත පිටතට ගලායාම් වේ.

  NSB මත බලපෑම — M

- 2024 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 5% කින් වර්ධනය වූ අතර, එය 2017 සිට සිදුවූ වේගවත්ම ප්‍රසාරණය වන අතර, දශක ගණනාවකට පසු රට එහි දරුණුතම මූල්‍ය අර්බුදයෙන් ගොඩ ඒම අඛන්ඩව සිදුවිය.

  NSB මත බලපෑම — H

- ආර්ථික ප්‍රකෘතිමත් වීම හේතුවෙන් ණය වර්ධනයේ කැපී පෙනෙන ප්‍රසාරණය, අඩු පොලී අනුපාත ණය ගැනීම දිරිමත් කළේය.

  NSB මත බලපෑම — H

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබන ආර්ථික ස්ථාවරකරණය ජාත්‍යන්තර විශ්වාසය වැඩි දියුණු කිරීමේ උත්සාහයන්. ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම මූල්‍ය විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම.

  NSB මත බලපෑම — H

H ඉහළ M මධ්‍යම L අඩු

## අවදානම් සහ අවස්ථා

**අවදානම්**

- OPR වෙත මාරුවීම කෙටි කාලීන පොලී අනුපාතවල උච්චාවචනයන්ට හේතුවිය හැකි අතර, එය ණය මිලකරණයට සහ ලාභදායිතාවයට බලපායි.
- විනිමය අනුපාතිකය ඉහළ යාම හේතුවෙන් ප්‍රේෂණ ගලා ඒම අඩුවීම තැන්පතු රැස්කිරීමට බලපෑ හැකිය.
- ශක්තිමත් වර්ධනයක් තිබියදීත්, බාහිර කම්පන හෝ ව්‍යුහාත්මක දුර්වලතා ප්‍රකෘතිමත් වීම අස්ථාවර කළ හැකිය.

**අවස්ථා**

- ණය පැහැර හැරීමේ අවදානම අවම කිරීම සඳහා පවතින ණය ගැතියන් සඳහා ප්‍රතිමූල්‍යකරණ විකල්ප ලබා දීමේ හැකියාව.
- පාරිභෝගික සහ ව්‍යාපාර විශ්වාසය ඉහළ යාම ණය සහ මූල්‍ය සේවා සඳහා ඇති ඉල්ලුම වැඩි කරයි.
- ඩිජිටල් බැංකුකරණය සහ ESG කේන්ද්‍ර කරගත් නිෂ්පාදන සඳහා ආයෝජනය කිරීමට හැකි වන පරිදි ආර්ථික ප්‍රකෘතිමත් වීම.

## ඒකාබද්ධ උපායමාර්ග

- ශුද්ධ පොලී ආන්තිකය පවත්වා ගැනීම සඳහා ණය දීමේ සහ තැන්පතු අනුපාත ගතිකව සකස් කිරීම.
- නිවාස ණය, පුද්ගලික ණය, උකස් ණය, අධ්‍යාපන ණය මගින් පාරිභෝගික ණය අංශයට බලශක්ති අංශයට ලබාදුන් ණය මගින් ආයතනික ණයද පුළුල් කිරීම.
- වත්මන් පරිසරය තුළ ණය ගැනීමේ සහ ඉතිරි කිරීමේ ප්‍රතිලාභ පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුම්වත් කිරීම සඳහා ඉලක්කගත අලෙවිකරණ ව්‍යාපාර භාවිතා කිරීම.
- කළඹේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අවදානම මත පදනම් වූ ණය දීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

## අදාළ වැදගත් කරුණු

2. සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය
3. වත්කම් වල ගුණාත්මකභාවය සහ වර්ධනය
4. මූල්‍ය තිරසාරභාවය
5. වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
7. කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය

## අදාළ ප්‍රාග්ධනයන්

FC MC HC IC SRC

## අදාළ ප්‍රමාණාත්මක අවදානම්

මූල්‍ය අවදානම
උපායමාර්ගික අවදානම
ක්‍රියාකාරිත්ව අවදානම
වෙළෙඳ මට්ටම අවදානම
ද්‍රවශීල අවදානම

## අදාළ ප්‍රධාන උපායමාර්ග

ගනුදෙනුකාර කේන්ද්‍රියතාවය
ඖෂධීය වර්ධනය ප්‍රවර්ධනය
සේවක සහභාගිත්වය වැඩි කිරීම
ඩිජිටල් පරිනාමනය වේගවත් කිරීම
අවදානම් හඳුනාගැනීමේ සංස්කෘතිය ශක්තිමත් කිරීම
තිරසාරභාවය

## UN SDGs බලපෑම

1 NO POVERTY, 2 ZERO HUNGER, 3 GOOD HEALTH AND WELL-BEING, 4 QUALITY EDUCATION, 8 DECENT WORK AND ECONOMIC GROWTH, 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE, 11 SUSTAINABLE CITIES AND COMMUNITIES

## අනාගත දැක්ම

**දේශීය**

2025 දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 3.5% ක් වනු ඇතැයි ලෝක බැංකුව පුරෝකථනය කරයි. පෙර පැවති පසුබෑමේ කල් පවතින බලපෑම් පිළිගනී. 2025 මැද භාගය වන විට උද්ධමනය 5%ක මට්ටමක ස්ථාවර කිරීම අරමුණු කරගත් ආර්ථික ප්‍රකෘතියට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති අනුපාතය 8% ක් ලෙස පවත්වා ගෙන ගොස් ඇත. 2023 දී ඇමරිකානු ඩොලර් බිලියන 29ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ඇපකරයකින් පසුව, ශ්‍රී ලංකාව සිය ඇමරිකානු ඩොලර් බිලියන 83ක ණය ක්‍රියාකාරීව ප්‍රතිව්‍යුහගත කරමින් සිටී. රජය මූල්‍ය ස්ථාවරත්වය, ආර්ථික ප්‍රතිසංස්කරණ සහ සමාජ සාධාරණත්වය කෙරෙහි අවධානය යොමු කරමින් 2025 අයවැය සකස් කර ඇත. අයවැයගත පියවර අතරට බදු කප්පාදු, වැඩි කළ සුභසාධන වියදම් සහ ව්‍යාපාර සහන මුලපිරීම් ඇතුළත් වන අතර IMF ඉලක්කවලට අනුකූල වේ.

**ගෝලීය**

2025 සහ 2026 යන දෙකෙහිම ගෝලීය වර්ධනය 3.2% ක් ලෙස IMF පුරෝකථනය කරයි. එය ඓතිහාසික සාමාන්‍යය වන 3.7% ට වඩා තරමක් අඩුය. ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD) එහි සාමාජික රටවල් තුළ උද්ධමනය 2024දී 5.4% සිට 2025 දී 3.8% දක්වා සහ 2026 දී 3.0% දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කරයි, එයට සීමාකාරී මුදල් ප්‍රතිපත්ති මගින් සහාය වේ. කෙසේ වෙතත්, දැනට පවතින එක්සත් ජනපද-චීන වෙළඳ ආතතීන් සහ පනවන ලද තීරු බදු ගෝලීය ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ කනස්සල්ල මතු කරයි.

# අවදානම් සහ අවස්ථා



## සමාජ

- පාරිභෝගිකයින් අත්‍යවශ්‍ය මිලදී ගැනීම්වලට ප්‍රමුඛත්වය දෙමින්, ආර්ථික අභියෝග වලට අනුවර්තනය වෙමින්, සෞඛ්‍ය, යහපැවැත්ම සහ තිරසාර නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කරමින් සිටී.

  NSB මත බලපෑම — H

- ශ්‍රී ලංකාව තම කුසලතා ඇති ශ්‍රම බලකාය වැඩි දියුණු කිරීමෙන් දැනුම පදනම් කරගත් ආර්ථිකයක් කරා සංක්‍රමණය වෙමින් පවතී. 2030 වන විට පිරිමින්ට සහ කාන්තාවන්ට තාක්ෂණික, වෘත්තීය සහ විශ්ව විද්‍යාල වැඩසටහන් ඇතුළුව ගුණාත්මක අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් ලබා දීම රට අරමුණු කරයි.

  NSB මත බලපෑම — H

| පාර්ශවකාර webcasts | අඛණ්ඩ |

**සහභාගිත්ව වාරගණන**

වාර්ෂික · කාර්තුමය · මාසික · අවශ්‍ය පරිදි · අඛණ්ඩ

### සම්බන්ධතාවල තත්ත්වය

★★★★☆ −

### සම්බන්ධිත ප්‍රමාණාත්මක කරුණු

1 පරිවර්තනීය දේශපාලන විතැන්වීම
2 සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය
3 වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
4 මූල්‍ය තිරසාරභාවය
5 වැඩි වන ගනුදෙනුකාර අපේක්ෂාවන්
7 කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය
10 නව තාක්ෂණික දියුණුව
14 දේශගුණික විපර්යාස සහ පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව
15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC MC HC IC SRC NC

### UN SDGs සම්බන්ධතාව

8 DECENT WORK AND ECONOMIC GROWTH
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

# ගනුදෙනුකරුවන්

අපගේ ගලපනලද මූල්‍ය විසඳුම් මත රඳා පවතින පුද්ගලයින්, ව්‍යාපාර සහ ආයතනවල විවිධ පරාසයකින් ගනුදෙනුකාර පදනම සමන්විත වේ. මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කරන පිවිසියහැකි බැංකු සේවා සහ මුලපිරීම් පිරිනමමින් වැටුප් සේවකයින්, විශ්‍රාමිකයින්, සහ අඩු ආදායම් අංශ ඇතුළුව පාරිභෝගික ගනුදෙනුකරුවන්ට අපි සේවය කරමු. ඊට අමතරව, අපි රජයේ ආයතන සහ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේදී සහ ප්‍රතිපත්ති පදනම් මූල්‍ය වැඩසටහන් උසස් කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටුකරන රාජ්‍ය අංශයේ ආයතනවලට සහය වෙමු. සේවා විශිෂ්ඨත්වය, නව්‍යකරණය සහ සමාජීය වගකීම කරා අපගේ නොසැලෙන කැපවීම තුළින්, අපි අපගේ ගනුදෙනුකරුවන් අඛණ්ඩව සවිබල ගන්වන අතර, ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනයට දායක වෙමු.

## උපායමාර්ගයට ඇතුළත් කිරීම

### ගනුදෙනුකරුට වටිනාකම නිර්මාණය

| වටිනාකම් අපේක්ෂාව | වාර්ෂික වෙනස % | බලපෑම | 2024 | 2023 |
|---|---|---|---|---|
| සක්‍රීය ගනුදෙනුකාර ගිණුම් (මිලියන) | 20.0 | − | **10.4** | 13.0 |
| තැන්පතුකරුවන්ට ගෙවන ලද පොලිය (රු.බි.) | 33.3 | − | **123.9** | 185.7 |
| තැන්පතු වෙළෙඳපොළ කොටස (%) | 11 bps | + | **8.66** | 8.55 |
| ඩිජිටල් බලගැන්වූ ගනුදෙනුකරුවන් | 53.9 | + | **618,314** | 401,812 |
| ශාඛා ගණන | No change | ↔ | **262** | 262 |
| විසඳන ලද පැමිණිලි ගණන | 26.0 | + | **455** | 361 |

| ප්‍රධාන මාතෘකා සහ අදහස් | අපි ප්‍රතිචාර දක්වන ආකාරය |
|---|---|
| ශාඛා සහ ඩිජිටල් මාර්ග තුළින් බැංකු සේවා කරා පහසු පිවිසීම | ශාඛා ජාලය සහ ඩිජිටල් නිෂ්පාදන තුළින් වැඩිකළ බැංකු සේවා (නිෂ්පාදිත ප්‍රාග්ධනය 102-107 දක්වා පිටුවල සහ බුද්ධිමය ප්‍රාග්ධන 120-127 දක්වා පිටුවල දැක්වේ.) |
| කාලීන සහ ඵලදායි ගනුදෙනුකාර සේවය | ඇමතුම් මධ්‍යස්ථානය සහ වෙනත් අන්තර්ජාල මාර්ග තුළින් 24/7 ගණුදෙනුකාර ප්‍රවේශ්‍යතාව (නිෂ්පාදිත ප්‍රාග්ධනය 102-107 දක්වා පිටුවල දැක්වේ). |
| තරඟකාරී පොලී අනුපාත | තරඟකාරී මිලකරණ යාන්ත්‍රණය |
| ඵලදායී පැමිණිලි මෙහෙයවීම | විශේෂිත පැමිණිලි මෙහෙයවීමේ නිලධාරී |
| මූල්‍ය සාක්ෂරතාවය | සෘතුමය මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් |
| සංවේදී ගනුදෙනුකාර තොරතුරුවල ආරක්ෂාව සහ රහස්‍යතා | PCI DSS අනුකූලතාව<br>(බුද්ධිමය ප්‍රාග්ධනය 120-127 දක්වා පිටුවල දැක්වේ) |

### පාර්ශවකාර සහභාගිත්වයට ප්‍රවේශය

- ශාඛා සහ අංශ තුළින් පුද්ගල මැදිහත් වීම
- විද්‍යුත් ලිපිනය, ආයතනික වෙබ් අඩවිය, දුරකථනය ඇතුළුව විවිධ වේදිකා
- ප්‍රවර්ධන වැඩසටහන්, ආයතනික වෙබ් අඩවිය, ජන මාධ්‍ය හා සහ සමාජ මාධ්‍ය
- ඇමතුම් මධ්‍යස්ථාන, ආයතනික සිදුවීම්

**සහභාගිත්ව වාරගණන**

වාර්ෂික · කාර්තුමය · මාසික · අවශ්‍ය පරිදි · අඛණ්ඩ

### සම්බන්ධතාවල තත්ත්වය

★★★★☆ −

### සම්බන්ධිත ප්‍රමාණාත්මක කරුණු

- 4 මූල්‍ය තිරසාරභාවය
- 5 වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
- 10 නව තාක්ෂණික දියුණුව
- 12 ඩිජිටල් සාක්ෂරතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතා
- 15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC · MC · HC · IC · SRC · NC

### UN SDGs සම්බන්ධතාව

8 DECENT WORK AND ECONOMIC GROWTH · 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

# ඒකාබද්ධ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය



## සේවකයින්

අපගේ සේවකයින්, සේවා විශිෂ්ටත්වය ඇතිකරන, රජයට අයත් බලපත්‍රලාභී බැංකුවක් ලෙස අපගේ කාර්යභාරය ඉටු කිරීමට අපව ශක්තිමත් කරන අපගේ ආයතනයේ පදනම සකස් කරයි. පළපුරුදු වෘත්තිකයින්, මූල්‍ය ප්‍රවීනයින්, සහ නැගීඑන දක්ෂයින්ගෙන් සමන්විත විවිධ කණ්ඩායම් සමඟ, අඛණ්ඩතාව, නවෝත්පාදනය සහ ශක්තිමත් ගනුදෙනුකාර අවධානය මත ගොඩනැගුණු සංස්කෘතියක් අපි පෝෂණය කරමු. අපි අඛණ්ඩ ඉගෙනුම, වෘත්තීය සංවර්ධනය, සහ තාක්ෂණය පදනම් ඵලදායිතාව සහ අනුවර්තනය ශක්තිමත් කිරීමට හැකියාවන් වැඩි කිරීමට අපි කැපවී සිටිමු. රාජ්‍ය භාරයේ භාරකරුවන් ලෙස, අපගේ සේවකයින් මූල්‍ය අන්තර්ගතභාවය උසස් කිරීමේදී, ජාතික ආර්ථික ප්‍රමුඛතාවන්ට සහයවීමේදී සහ තිරසාර වර්ධනය සහතික කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. සහයෝගී සහ ඇතුළත් සේවා ස්ථානයක් තුළින්, අපි අපගේ සේවකයින් විශිෂ්ටත්වය දැක්වීමට සවිබලගන්වා ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයට අර්ථවත් දායකත්වයක් සිදු කරමු.

### උපායමාර්ගයට ඇතුළත් කිරීම

**සේවක වටිනාකම නිර්මාණය**

| වටිනාකම් අපේක්ෂාව | වාර්ෂික වෙනස % | බලපෑම | 2024 | 2023 |
|---|---|---|---|---|
| සේවකයෙකුට එකතුකළ වටිනාකම (රු.මි.) | 168.0 | ⊕ | **13.4** | 5.0 |
| මුළු ශ්‍රමබලකා පිරිවැය | 26.1 | ⊕ | **20.3** | 16.1 |
| කාන්තා නායකත්වය | 6.2 | ⊖ | **241** | 257 |
| තීරණ ගැනීමේ තනතුරුවල තරුණ ජවය | 5.7 | ⊕ | **202** | 191 |
| සේවක පිරිවැටුම | 7 bps | ⊖ | **3.77** | 3.70 |
| පුහුණු පැය ගණන | 44.6 | ⊖ | **29,165** | 52,630 |

| ප්‍රධාන මාතෘකා සහ අදහස් | අපි ප්‍රතිචාර දක්වන ආකාරය |
|---|---|
| තරඟකාරී පාරිශ්‍රමිකය | සාමූහික කේවල් කිරීම තුළින් වැටුප් වර්ධක (මානව ප්‍රාග්ධනය 108-119 දක්වා පිටුවල දැක්වේ) |
| රැකියා ආරක්ෂාව | රැකියා ආරක්ෂාව පිළිබඳ සහතික ලබාදීම |
| වෘත්තීය වර්ධනය හා වෘත්තීය සංවර්ධනය සඳහා අවස්ථා | අඛණ්ඩ කාර්යසාධන ඇගයීම් හා උසස්වීම් (මානව ප්‍රාග්ධනය 108-119 දක්වා පිටුවල දැක්වේ.) |
| විශ්‍රාම ප්‍රතිලාභ | බැංකුව තුළ සේවක අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම අරමුදල පවත්වා ගනී (මානව ප්‍රාග්ධනය 108-119 දක්වා පිටුවල දැක්වේ.) |
| වැඩ-ජීවිත තුලනය | වසර පුරා රැකියාවන්ට අදාළ නොවන කටයුතු සංවිධානය කිරීම (මානව ප්‍රාග්ධනය 108 -119 දක්වා පිටුවල දැක්වේ.) |

### පාර්ශවකාර සහභාගිත්වයට ප්‍රවේශය

| | |
|---|---|
| සේවකයින් හා රේඛීය කළමනාකරුවන් අතර සම්මුඛ මැදිහත්වීම් | අඛණ්ඩ |
| ශාඛා කළමනාකරුවන්ගේ සම්මන්ත්‍රණය | වාර්ෂික |
| ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ රැස්වීම් | කාර්තුමය |
| සේවක ප්‍රදාන සහ පිළිගැනීමේ වැඩසටහන් | වාර්ෂික |
| කාර්යසාධන සමාලෝචන | වාර්ෂික |
| පිටවීම් සමාලෝචන | අවශ්‍ය පරිදි |
| සංස්කෘතික උත්සව | වාර්ෂික |
| වෘත්තීය සමිති සාකච්ඡා | අවශ්‍ය පරිදි |

**සහභාගිත්ව වාරගණන**

වාර්ෂික · කාර්තුමය · මාසික · අවශ්‍ය පරිදි · අඛණ්ඩ

### සම්බන්ධතාවල තත්ත්වය

★★★★☆ ⊖

### සම්බන්ධිත ප්‍රමාණාත්මක කරුණු

- 4 මූල්‍ය තිරසාරභාවය
- 7 කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය
- 8 අනාගතය අරමුණු කරගත් නිපුනතා
- 9 සේවක සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC HC IC SRC

### UN SDGs සම්බන්ධතාව



# නියාමකයින් හා රාජ්‍ය ආයතන

GRI 207-1, 2, 3

අපගේ මෙහෙයුම් මුල්‍ය ස්ථායිතාව, අනුකූලතාව,සහ ජාතික ආර්ථික පරමාර්ථවලට පෙළගැසීම සහතික කිරිමට ශක්තිමත් නියාමන රාමුවකින් පාලනය වේ. අපගේ ප්‍රධාන නියාමකයින්ට ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මූල්‍ය බුද්ධි ඒකකය (FIU – Sri Lanka), ජාතික විගණන කාර්යාලය සහ වෙනත් නියාමන ආයතන ඇතුළත් වේ. මෙවැනි නියාමන රාමු දැඩි ලෙස පිළිපැදීම තුළින්, අපි විනිවිදභාවය, වගවීම සහ මූල්‍ය විනය නගා සිටුවන අතර ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා සංවර්ධනයට අපගේ අඛණ්ඩ දායකත්වය සහතික කරමු.

## උපායමාර්ගයට ඇතුළත් කිරිම

### නියාමනයික් හා රාජ්‍ය ආයතන වෙත වටිනාකම නිර්මාණය

| වටිනාකම් අපේක්ෂාව | වාර්ෂික වෙනස % | බලපෑම | 2024 | 2023 |
|---|---|---|---|---|
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%) | 662 bps | ● | **25.88** | 19.26 |
| NSFR (%) | 1,304 bps | ● | **193.53** | 180.49 |
| සියලුම ව්‍යවහාර මුදල් LCR (%) | 5,084 bps | ● | **344.55** | 293.71 |
| තෝලන අනුපාතය | 177 bps | ● | **8.00** | 6.23 |
| ගෙවනලද බදු (රු. බි.) | 1,318.8 | ● | **19.5** | (1.6) |
| අනුකූල නොවීමේ සිදුවීම් | No change | ● | **None** | None |

| ප්‍රධාන මාතෘකා සහ අදහස් | අපි ප්‍රතිචාර දක්වන ආකාරය |
|---|---|
| • නියාමන අනුකූලතාව | • නියෝග සහ රෙගුලාසිවලට අනුව කාලීනව වාර්තා සම්පාදනය |
| • කාලීනව වාර්තා ඉදිරිපත් කිරිම සහ වාර්තා කිරිම | • කාලීන වාර්තාකරණය |
| • ගනුදෙනුකාර දත්ත ආරක්ෂාව | • PCI DSS, දත්ත කාන්දුවීම් වැලැක්වීම, ISO 27001:013 (බුද්ධිමය ප්‍රාග්ධනය 120-127 දක්වා පිටුවල දැක්වේ) |
| • මුල්‍ය අන්තර්ගතභාවය | • කාන්තාවන් සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් |
| • ඩිජිටල්කළ මුල්‍ය සේවා | • ඩිජිටල් බැංකු නිෂ්පාදන හඳුන්වාදීම |
| • මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව | • ජාතික ආර්ථික රාමු සමඟ පෙළ ගැසීම |

### පාර්ශවකාර සහභාගිත්වයට ප්‍රවේශය

| | |
|---|---|
| උපදෙස් සහ චක්‍රලේඛ | ● |
| පරීක්ෂණ (අභ්‍යන්තර සහ බාහිර) | ● |
| රැස්වීම් | ● |
| ප්‍රතිඵල නියාමන වාර්තාකරණය | ● |
| සම්මුඛ පරීක්ෂණ | ● |

**සහභාගිත්ව වාරගණන**

වාර්ෂික | කාර්තුමය | මාසික | අවශ්‍ය පරිදි | අඛණ්ඩ

### සම්බන්ධතාවල තත්ත්වය

★★★★☆ ⊖

### සම්බන්ධිත ප්‍රමාණාත්මක කරුණු

1 පරිවර්තනීය දේශපාලන විතැන්වීම
2 සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය
3 වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
4 මූල්‍ය තිරසාරභාවය
5 වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
11 සයිබර් තර්ජන සහ තොරතුරු ආරක්ෂාව
13 මූල්‍ය අපරාධ
15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC IC SRC

### UN SDGs සම්බන්ධතාව



# ඒකාබද්ධ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය



## ව්‍යාපාර හවුල්කරුවන්

අපගේ සේවා ලබාදීම වැඩි කිරීමේදී, මූල්‍ය අන්තර්ගතභාවය පුළුල් කිරීමේදී සහ ජාතික ආර්ථික සංවර්ධනයට දායක වීමේදී අපගේ ව්‍යාපාර හවුල්කරුවන් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. අපගේ ප්‍රධාන ව්‍යාපාර හවුල්කරුවන්ට තාක්ෂණික සහ ෆින්ටෙක් හවුල්කරුවන්, අනුරූප බැංකු, සහ මූල්‍ය ආයතන, රක්ෂණ හා ආයෝජන හවුල්කරුවන් සහ වෙනත් සැපයුම්කරුවන් ඇතුළත් වේ.

### උපායමාර්ගයට ඇතුළත් කිරීම

**ව්‍යාපාර හවුල්කරුවන්ට වටිනාකම නිර්මාණය** වගුව 10

| වටිනාකම් අපේක්ෂාව | වාර්ෂික වෙනස % | බලපෑම | 2024 | 2023 |
|---|---|---|---|---|
| දේශීය ප්‍රසම්පාදනය මත වියදම (රු. බි.) | 87.5 | ⊕ | **3.0** | 1.6 |
| තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනය (රු. මි.) | 483.1 | ⊕ | **2,044.2** | 350.6 |
| අනුකූල නොවීම | No change | ⊕ | **None** | None |

| ප්‍රධාන මාතෘකා සහ අදහස් | අපි ප්‍රතිචාර දක්වන ආකාරය |
|---|---|
| නව තාක්ෂණික වර්ධනයන් | තාක්ෂණයේ අඛණ්ඩ උසස් කිරීම |
| ගනුදෙනුවල විනිවිදභාවය | ගනුදෙනුවල විනිවිදභාවය පවත්වා ගැනීම |
| කාලීන ගෙවීම් | කාලීන ආකාරයෙන් ගෙවීම් සිදුකිරීම |
| කොන්ත්‍රාත්තුව යටතේ කාර්යසාධනය | කාලීනව ගිවිසුම්ගත බැඳුම් ඉටු කිරීම |

### පාර්ශවකාර සහභාගිත්වයට ප්‍රවේශය

| | |
|---|---|
| ටෙන්ඩර් ක්‍රියාපටිපාටි | ● |
| රැස්වීම් | ● |
| අඛණ්ඩ සන්නිවේදනය | ● |

**සහභාගිත්ව වාරගණන**

වාර්ෂික · කාර්තුමය · මාසික · අවශ්‍ය පරිදි · අඛණ්ඩ

### සම්බන්ධතාවල තත්ත්වය

★★★★☆ ⊖

### සම්බන්ධිත ප්‍රමාණාත්මක කරුණු

- 3 වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
- 4 මූල්‍ය තිරසාරභාවය
- 10 නව තාක්ෂණික දියුණුව
- 11 සයිබර් තර්ජන සහ තොරතුරු ආරක්ෂාව
- 15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC IC SRC NC

### UN SDGs සම්බන්ධතාව

8 DECENT WORK AND ECONOMIC GROWTH · 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE · 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

# සමාජය හා පරිසරය

අපගේ අරමුණ සම්ප්‍රදායික මූල්‍ය සේවා සීමාවන් ඉක්මවා යන අතර, අර්ථවත් හා කල්පවත්නා වෙනස ඇති කිරීමට තියුණු වගකීම වැළඳ ගනී. අපි තිරසාර සමාජීය හා පාරිසරික ප්‍රගතිය, ප්‍රජාවන් සවිබලගැන්වීම, ඇතුළත් වර්ධනයට සහයවීම සහ අපගේ මෙහෙවරේ අත්‍යවශ්‍ය කුළුණ ලෙස පාරිසරික භාරකාරත්වය ප්‍රධාන කර ගැනීමට කැපවී සිටිමු. මෙවැනි වඩා පුළුල් කාර්යභාරයන් තුළින්, පරම්පරාවන් හරහා කල්පවත්නා වටිනාකම නිර්මාණය කිරීමට අපි උත්සාහ කරමු.

## උපායමාර්ගයට ඇතුළත් කිරීම

**සමාජය හා පරිසරියට වටිනාකම නිර්මාණය**

| වටිනාකම් අපේක්ෂාව | වාර්ෂික වෙනස % | බලපෑම | 2024 | 2023 |
|---|---|---|---|---|
| ජල පරිභෝජනය (m³) | 15.1 | ⊕ | **62,744** | 73,895 |
| බලශක්ති පරිභෝජනය (GJ) | 7.4 | ⊖ | **32,883** | 30,621 |
| අනුකූල නොවීම | No change | ⊕ | **None** | None |
| හරිත මූල්‍ය (බිලියන) | 100.0 | ⊕ | **4.0** | – |
| මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් | 8.6 | ⊕ | **985** | 907 |

| ප්‍රධාන මාතෘකා සහ අදහස් | අපි ප්‍රතිචාර දක්වන ආකාරය |
|---|---|
| මූල්‍ය අන්තර්ගතභාවය | කාන්තාවන් සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් |
| ප්‍රජා සංවර්ධනය | වසර තුළ සිදුකළ ආයතනික සමාජ වගකීම් කටයුතු |
| සදාචාර බැංකුකරණය හා පාලනය | මනාව ස්ථාපිත සදාචාර බැංකුකරණය සහ පාලන ව්‍යවහාර |
| හරිත මූල්‍යකරණය | මුදල් ලබා දුන් හරිත ව්‍යාපෘති |
| මෙහෙයුම් තිරසාරභාවය | අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල සෑම අංගයකටම තිරසාරභාව ඇතුළත් කිරීම |

### පාර්ශවකාර සහභාගිත්වයට ප්‍රවේශය

- පොදු උත්සව
- මුහුණට මුහුණ සන්නිවේදනය
- රජයේ බලධාරීන් සමඟ රැස්වීම
- පුවත් නිවේදන හා සමාජ මාධ්‍ය
- ආයතනික සමාජ වගකීම් මුලපිරීම්

**සහභාගිත්ව වාරගණන**

වාර්ෂික | කාර්තුමය | මාසික | අවශ්‍ය පරිදි | අඛණ්ඩ

### සම්බන්ධතාවල තත්ත්වය

★★★☆☆ ⊖

### සම්බන්ධිත ප්‍රමාණාත්මක කරුණු

1. පරිවර්තනීය දේශපාලන විතැන්වීම
2. සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය
4. මූල්‍ය තිරසාරභාවය
5. වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
6. සමාජ මාධ්‍යවල බලපෑමේ වර්ධනය
7. කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය
10. නව තාක්ෂණික දියුණුව
14. දේශගුණික විපර්යාස සහ පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව
15. පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC | MC | HC | IC | SRC | NC

### UN SDGs සම්බන්ධතාව

4 QUALITY EDUCATION | 7 AFFORDABLE AND CLEAN ENERGY | 11 SUSTAINABLE CITIES AND COMMUNITIES

# අපගේ තිරසාර රාමුව



GRI 2-2, 22

ජාතික ඉතිරි කිරිමේ බැංකුවේදි, තිරසාරභාවය යනු පාර්ශවකරුවන් සඳහා දිගුකාලීන අගයන් නිර්මාණය කරන සහ වගකිම් සහගත මූල්‍ය මෙහෙයුම් සහතික කරන අපගේ ආයතනික උපායමාර්ගයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාවක් වේ. අපගේ තිරසාර රාමුව අපගේ ව්‍යාපාරයේ සෑම අංගයකටම පාරිසරික, සමාජීය හා පාලන මූලධර්ම ඒකාබද්ධ කිරීමට සැලසුම් කරන අතර, එමගින් අපි උද්යෝගීව, සහ ජාතික සහ ගෝලීය තිරසාර අරමුණු සමඟ පෙළ ගැසී සිටින බව සහතික කරයි. මෙම රාමුව ප්‍රධාන කුළුණු තුනක් මත ගොඩ නගයි. ඒවානම්, තිරසාර මූල්‍ය සහ අන්තර්ගත වර්ධනය, මෙහෙයුම් තිරසාරභාවය සහ පාරිසරික වගකීම, පාලනය, අවදානම් කළමනාකරණය සහ සදාචාරාත්මක නායකත්වය වේ. මෙම අවධානිත ක්ෂේත්‍ර හරහා, අපගේ බැංකු සේවා ආර්ථිකයට, සමාජයට සහ පරිසරයට ධනාත්මක දායකත්වයක් ලබා දෙන බව සහතික කරමින්, හරිත මූල්‍යකරණය, මූල්‍ය අන්තර්ගතභාවය, ඩිජිටල් පරිනාමනය සහ සදාචාරාත්මක ව්‍යාපාරික ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීම අපි අරමුණු කරමු. තිරසාරභාවය අපගේ තීරණ ගැනීමට එකතු කරමින්, ජාතික ප්‍රගතිය හා ගෝලීය මනා පරිචයන්ට කැපවූ වගකීම්සහගත මූල්‍ය ආයතනයක් ලෙස අපගේ කාර්යභාරය අපි ශක්තිමත් කරමු.

## තිරසාර පාලනය හා නායකත්වය GRI 2-14

ශක්තිමත් පාලන ව්‍යුහයක් අපගේ තිරසාර වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරිම සඳහා අත්‍යවශ්‍යය. බැංකුවේ දී, තිරසාර පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන අතර, එමඟින් ආර්ථික, සමාජීය හා පාලන ප්‍රතිෂ්ඨාවන් අපගේ ආයතනික උපාය මාර්ගයට ඵලදායී ලෙස ඒකාබද්ධ කර ඇති බව සහතික කිරීම සඳහා උපායමාර්ගික අධීක්ෂණයක් සපයයි ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගෙන් සමන්විත ආයතනික තිරසාරභාවය පිළිබඳ කමිටුව, සියලුම ව්‍යාපාරික කාර්යයන් හරහා තිරසාරභාවය පිළිබඳ මුලපිරීම් ඇගයීම, නියාමනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය. ඊට අමතරව, අපගේ අවදානම්, විගණනය, සහ අනුකූලතා කණ්ඩායම් විසින් තිරසාරභාවයට අදාළ අවදානම් හඳුනාගෙන පූර්ව ක්‍රියාකාරි කළමනාකරණය කරන බව සහතික කිරිමට සහයෝගයෙන් කටයුතු කරයි. මෙම පාලන ව්‍යුහය විනිවිදභාවය, වගකීම සහ සදාචාර නායකත්වය ප්‍රවර්ධනය කරන අතර, බැංකුවේ මෙහෙයුම්වල කේන්ද්‍රයේ තිරසාරභාවය පවතින බව සහතික කරයි.






ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දිගුකාලීන දැක්ම තුළ කේන්ද්‍රිය සාධකයක් වන තිරසාරභාවය, ආර්ථික වර්ධනය, පාරිසරික වගකීම සහ සමාජ යහපැවැත්ම වෙත අපිව යොමුකරයි. පාරිසරික, සමාජීය හා පාලන මූලධර්ම අපගේ මෙහෙයුම් හරහා ඒකාබද්ධ කිරීමට මෙන්ම දිගුකාලීන වටිනාකම් නිර්මාණය කරන වගකීම්සහගත බැංකු පරිචයන් සහතික කිරිමට අපි කැපවී සිටිමු. හරිත මූල්‍යකරණය, මූල්‍ය අන්තර්ගතභාවය සහ සදාචාරාත්මක පාලනය තුළින්, අපි SLFRS S1 සහ S2 වැනි වැඩි දියුණු වන නියාමන රාමු සඳහා සූදානම් වන අතරම, ජාතික ප්‍රමුඛතා සහ ගෝලීය තිරසාර ඉලක්ක සමඟ පෙළ ගැසෙමු. ඩිජිටල් පරිනාමනය, අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරිම, සහ වගවීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරිම වෙනුවෙන් ආයෝජනය කරමින්, ශ්‍රී ලංකාව සඳහා අනුගත වූ, අන්තර්ගත සහ පාරිසරිකමය වගකීම් සහගත මූල්‍ය අනාගතයක් ගොඩ නැගීමට අපි උත්සාහ ගනිමු.

**ශෂී කණ්ඩම්බි මිය**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

### තිරසාරභාවය පිළිබඳ අපගේ දැක්ම

**අනාගත පරම්පරාවන් සඳහා කල් පවත්නා වටිනාකම නිර්මාණය කිරිමට ආර්ථික ප්‍රගතිය, පාරිසරික වගකීම සහ සමාජීය යහපැවැත්ම ඒකාබද්ධ කරමින් තිරසාර වර්ධනය ඇති කිරීම**

### ප්‍රධාන අවධානිත කරුණු

- තිරසාර පාලනය හා නායකත්වය
- අවදානම් කළමනාකරණය හා තිරසාරභාවය
- තිරසාර මූල්‍ය හා නිෂ්පාදන
- මෙහෙයුම් තිරසාරභාවය
- පාර්ශවකාර සහභාගිත්වය හා විනිවිදභාවය
- තිරසාර වාර්තාකරණය හා අනුකූලතාව

පසටමරු 7

## අවදානම් කළමනාකරණය හා තිරසාරභාවය

තිරසාරභාවය ආශ්‍රිත අවදානම් වඩ වඩාත් සැලකියයුතු බවට පත්වන බැවින්, පාරිසරික, සමාජීය හා පාලන අවදානම් ඇතුළත් කිරීම සඳහා අපි අපගේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කර ඇත්තෙමු.

වියහැකි බිඳවැටීම් අවම කිරීම සඳහා දේශගුණික ආශ්‍රිත මූල්‍ය අවදානම්, නියාමන වෙනස්වීම්, සමාජ විෂමතාවයන් සහ පාලන අභියෝග අඛණ්ඩව තක්සේරු කරනු ලැබේ. දේශගුණික අවදානම් තක්සේරු කිරීම් අපගේ ණය කළඹ තුළ නිරාවරණය ඇගයීමට සහය වන අතර, නියාමන අවදානම් අවම කිරීමේ උපායමාර්ග වැඩිදියුණු වන තිරසාර රෙගුලාසි සමඟ පූර්ණ අනුකූලතාව සහතික කරයි. ඊට අමතරව, සමාජීය සහ කීර්තිනාම අවදානම් පාර්ශවකරුවන් සමඟ සක්‍රිය සහභාගිත්වය තුළින් සහ සදාචාරාත්මක බැංකු භාවිතයන් පවත්වා ගැනීමෙන් කළමනාකරණය කරනු ලබයි. මෙම පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශය තුළින්, බැංකුව සිය දිගුකාලීන මූල්‍ය ස්ථායිතාව වැඩි කරන අතර, පාරිසරික, සමාජීය හා පාලනය ආශ්‍රිත අභියෝගවලට අනුව පාර්ශවකාර බැඳියාවන් ආරක්ෂා කරයි. වැඩි විස්තර සඳහා අවදානම් කළමනාකරණ වාර්තාව 154 පිටුවේ දැක්වේ.

## තිරසාර මූල්‍ය හා සේවා

තිරසාර මූල්‍යකරණය යනු වගකීම්සහගත බැංකුකරණයක් සඳහා බැංකුවේ කැපවීමේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාවකි. අපගේ ණය දීමේ සහ ආයෝජන තීරණ පාරිසරික හා සමාජීය යහපැවැත්මට දායක වන බව සහතික කරමින්, අපි අපගේ හරිත කළඹ සහ තිරසාරභාවයට සම්බන්ධ මූල්‍ය නිෂ්පාදන අඛණ්ඩව පුළුල් කරමින් සිටිමු. අපගේ හරිත ණය යෝජනා ක්‍රම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන අතර, අපගේ මූල්‍ය අන්තර්ගතභාවය සහිත වැඩසටහන්වලින් ග්‍රාමීය සහ අඩු පහසුකම්ලත් ප්‍රජාවන්ට බැංකු සේවා පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරමු. අපගේ නිෂ්පාදන තිරසාර ඉලක්ක සමඟ පෙළගස්වා ගැනීමෙන්, අපි ධනාත්මක පාරිසරික හා සමාජීය බලපෑමක් සහතික කරන අතරම ආර්ථික සංවර්ධනයට සහාය වෙමු, වැඩි විස්තර සඳහා ස්වභාවික ප්‍රාග්ධන සාකච්ඡාව 148 පිටුව බලන්න.

## මෙහෙයුම් තිරසාරභාවය

බැංකුවේ දී, අපගේ පාරිසරික පාසටහන කාර්යක්ෂම සම්පත් කළමනාකරණය හා පරිසර හිතකාමී බැංකුකරණ ව්‍යවහාර තුළින් අවම කිරීමට අපි උත්සාහ ගන්නා බැවින් මෙහෙයුම් තිරසාරභාවය ප්‍රධාන අවධානිත ක්ෂේත්‍රයකි. අපගේ බලශක්ති කාර්යක්ෂමතා මූලපිරීම් අතරට සූර්ය බල ශක්තිය භාවිතා කරන ශාඛා වෙත මාරුවීම සහ අපගේ මෙහෙයුම් හරහා විදුලි පරිභෝජනය ප්‍රශස්ත කිරීම ඇතුළත් වේ. ජංගම බැංකුකරණ විසඳුම්, විද්‍යුත් ප්‍රකාශන, සහ ස්වයංක්‍රීයකළ ගනුදෙනු පද්ධති තුළින් කඩදාසි රහිත බැංකුකරණය ප්‍රවර්ධනය කරමින් අපගේ ඩිජිටල් පරිනාමන ගමන්මග අපි වේගවත් කර ඇත. ඊට අමතරව, අපගේ සැපයුම් දාමය අපගේ පාරිසරික සහ සමාජීය බැඳීම් සමඟ පෙළ ගැසෙන බව සහතික කිරීමට අපි තිරසාර ප්‍රසම්පාදන ප්‍රතිපත්ති හඳුන්වා දී ඇත. මෙවැනි උත්සාහයන් ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික කාර්යය වැඩසටහන්වලට සහයවීම පමණක් නොව බැංකුව තුළ පිරිවැය කාර්යක්ෂමතාව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය වැඩි කරයි. ස්වභාවික ප්‍රාග්ධන සාකච්ඡා 146 සිට 151 පිටුවේ දැක්වේ.

## පාර්ශවකාර සහභාගිත්වය සහ විනිවිදභාවය

බැංකුවේ තිරසාරභාවය ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස්හිමියන්/ ආයෝජකයින්, නියාමකයින්, සහ රජයේ ආයතන, වඩා පුළුල් ප්‍රජාව ඇතුළත් අපගේ පාර්ශවකරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා මගින් මෙහෙයවනු ලබයි. අපගේ පාර්ශවකාර සහභාගිත්ව උපායමාර්ගය විනිවිදභාවය, අන්තර්කරණය, සහ දිගුකාලීන වටිනාකම නිර්මාණය කෙරෙහි අවධානය යොමු කෙරේ තිරසාර මූල්‍ය තීරණ ගැනීමට අවශ්‍ය දැනුමෙන් ඔවුන් සන්නද්ධ කරන බව සහතික කරන වැඩසටහන් තුළින් අපි අපගේ ගනුදෙනුකරුවන් සමඟ සක්‍රීයව සම්බන්ධ වෙමු. සේවකයින් සඳහා, අපි විවිධත්වය, අන්තර්ගතභාවය සහ උපකාරී සේවා පරිසරයක් පෝෂණය කිරීමට සහ යහ පැවැත්මට අදාළ වැඩසටහන් අපි ප්‍රවර්ධනය කරමු. අපි විස්තීර්ණ ආර්ථික, සමාජීය හා පාලන වාර්තාකරණය සහ සදාචාර පාලන ව්‍යවහාර තුළින් කොටස්හිමියන්/ආයෝජකයින් සහ නියාමකයින් සමඟ විවෘත සන්නිවේදනයක් පවත්වා ගනිමු. ඊට අමතරව, අධ්‍යාපනය, සෞඛ්‍ය, සහ ග්‍රාමීය සංවර්ධනය ආයතනික සමාජීය වගකීම් සහගත වැඩසටහන් ඇතුළත් අපගේ ප්‍රජා සහභාගිත්ව උත්සාහයන් සමාජීය වශයෙන් වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස අපගේ කාර්යභාරය ශක්තිමත් කරයි. පාර්ශවකාර සහභාගිත්ව සාකච්ඡාව 52 පිටුවේ සහ ප්‍රජා ප්‍රාග්ධන සාකච්ඡාව 143 සිට 145 දක්වා පිටුවල දැක්වේ.

## තිරසාර වාර්තාකරණය හා අනුකූලතාව

බැංකුවේ දී, විනිවිදභාවය සහ වගවීම අපගේ තිරසාරභාවය පිළිබඳ උත්සාහයන් සඳහා මූලික වේ. අපගේ තිරසාරභාවය පිළිබඳ මූලපිරීම් ඵලදායී ලෙස මනිනු ලබන, නිරීක්ෂණය කරන ලද සහ අනාවරණය කරන බව සහතික කරමින්, අපි ජාත්‍යන්තර සහ ජාතික පාරිසරික, සමාජීය හා පාලන වාර්තාකරණ රාමු දෙකටම අනුගත වෙමු. අපගේ වාර්තාකරණය ශ්‍රී ලංකා බැංකුකරණ මූලධර්ම (SLSBP), ගෝලීය වාර්තාකරණ මූලපිරීමේ (GRI) ප්‍රමිති, සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (UN SDGs) සමඟ පෙළ ගැසේ. විස්තීරණ තිරසාර අනාවරණයන් පවත්වා ගනිමින්, අපගේ ප්‍රගතිය, බැඳීම්, සහ දිගුකාලීන තිරසාර උපායමාර්ගවලට පැහැදිළි දර්ශයන් අපි පාර්ශවකරුවන්ට සපයන්නෙමු.

නියාමන අනුකූලතාව අපගේ තිරසාර වැඩසටහනේ මධ්‍යයේ පවතින අතර එමගින් බැංකුව දේශීය සහ ගෝලීය මූල්‍ය රෙගුලාසි සමඟ අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කරයි. මහ බැංකුවේ මාර්ගෝපදේශ, මූල්‍ය තිරසාර ප්‍රතිපත්ති සහ පාරිසරික, සමාජීය හා පාලනය ආශ්‍රිත නියෝග පිළිපැදීමට අපි සම්පූර්ණයෙන්ම කැපවී සිටිමු. අපගේ අභ්‍යන්තර පාලන රාමුව දූෂණ විරෝධී ප්‍රතිපත්ති, සදාචාරාත්මක බැංකුකරණය සහ වගකිවයුතු ආයෝජන මූලධර්ම ශක්තිමත් කරන අතර, තිරසාරභාවය සහ ආයතනික අඛණ්ඩතාව අපගේ ව්‍යාපාරයේ කේන්ද්‍රයේ පවතින බව සහතික කරයි, නියාමන සංවර්ධනයන් අඛණ්ඩව අධීක්ෂණය කරමින්, සහ ඒ අනුව අපගේ උපායමාර්ගය යොදා ගනිමින්, බැංකුව වගකීම්සහගත බැංකුකරණය සහ අවදානම් කළමනාකරණයට කැපවූ විශ්වාසී අනාගතයට සූදානම් මූල්‍ය ආයතනයක් ව පවතී.

## SLFRS S1 සහ S2 අනුකූලතාව සඳහා සූදානම

ශ්‍රී ලංකාව SLFRS S1 සහ S2 තිරසාර වාර්තාකරණ ප්‍රමිති යොදා ගැනීම කරා විතැන් වන බැවින්, බැංකුව අනුකූලතාව සහතික කිරීමට සහ සිය තිරසාර අනාවරණයන් ශක්තිමත් කිරීමට පූර්ව ක්‍රියාකාරී ක්‍රියාමාර්ග ගෙන ඇත. ජාත්‍යන්තර තිරසාර ප්‍රමිති මණ්ඩලය (ISSB) සමඟ සහයෝග යෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් හඳුන්වාදෙන ලද, මෙවැනි ප්‍රමිති ගෝලීය වාර්තාකරණ මුලපිරීමේ (GRI) ප්‍රමිති සහ තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයේ (SASB) ප්‍රමිති වැනි ගෝලීය රාමු සමඟ පෙළ ගැසෙන අතර තිරසාර වාර්තාකරණය වඩාත් ව්‍යුහගත සහ අනිවාර්ය බවට පත් කරයි.

විනිවිදභාවය, අවදානම් කළමනාකරණය සහ නියාමන අනුකූලතාව වැඩි කිරීම සඳහා, බැංකු සිය පාරිසරික, සමාජීය හා පාලන දත්ත රැස්කිරීමේ පද්ධති ශක්තිමත් කර ඇති අතර, තිරසාර අනාවරණයන්ගේ නිරවද්‍යතාව සහ අනුරූපතාව සහතික කරයි. ඊට අමතරව, අපගේ කණ්ඩායම් වෙනස්වන නියාමන අවශ්‍යතාවන් පිළිබඳ දැනුවත්ව සිටීමට පුහුණු සහ හැකියා ගොඩනැගීමේ වැඩසටහන් අපි ක්‍රියාත්මක කරමු.

SLFRS S1 සහ S2 සමඟ අනුකූලතාව තිරසාර වර්ධනය පෝෂණය කිරීම, ආයෝජක විශ්වාසය වර්ධනය කිරීම, සහ කාලගුණ වෙනසට අදාළ මූල්‍ය අලාභ අවම කිරීම සඳහා අත්‍යවශ්‍යය. මෙවැනි ප්‍රමිති වැළඳගනිමින්, වඩා ස්ථාවර සහ තිරසාර මූල්‍ය පරිසර පද්ධතියක් කරා දායක වන වගකීම්සහගත බැංකුකරණය, නියාමන අනුකූලතාව, සහ දිගුකාලීන ඔරොත්තු දීම කරා සිය බැඳීම බැංකුව ශක්තිමත් කරයි.

### SLFRS S1

**තිරසාරභාවයට අදාළ මූල්‍ය තොරතුරු අනාවරණ සඳහා පොදු අවශ්‍යතා**

තිරසාරභාවයට අදාළ අවදානම් සහ අවස්ථා පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට ආයතන සඳහා පොදු අවශ්‍යතා අර්ථ දක්වයි. ආයතනයට සම්පත් වෙන් කිරීම පිළිබඳව දැනුවත් තීරණ ගැනීමට පොදු අරමුණු මූල්‍ය වාර්තාවල මූලික පරිශීලකයින්ට සහයවීම මෙම තොරතුරුවලින් අපේක්ෂා කරයි.

### SLFRS S2

**කාලගුණයට අදාළ අනාවරණ**

කාලගුණයට අදාළ අවදානම් සහ අවස්ථා පිළිබඳ තොරතුරු හඳුනාගැනීම, මැනීම සහ අනාවරණය කිරීම සඳහා අවශ්‍යතා ස්ථාපිත කරයි. ආයතනයට සම්පත් වෙන් කිරීම පිළිබඳව දැනුවත් තීරණ ගැනීමට පොදු අරමුණු මූල්‍ය වාර්තාවල මූලික පරිශීලකයින්ට සහයවීමට මෙම තොරතුරු සැලසුම් කර ඇත. TCFD හි රාමුව මත SLFRS S2 ගොඩ නංවයි.

### යොදා ගැනීම සඳහා කාලසීමාවන්

- 2025 – මැද: SLFRS S1 සහ S2 ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ පසුබිම් වැඩ ආරම්භ කිරීම.
- 2025 – අවසානː පරතර තක්සේරු කිරීම, ප්‍රමාණාත්මක තක්සේරු කිරීම සහ හැකියා ගොඩ නැගීම.
- 2026 – මැදː මූල්‍ය බලපෑම් තක්සේරුව සහ තිරසාර ප්‍රතිපත්ති රාමුව.
- 2026 – අවසානː මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම.

SLFRS S1 සහ S2 සඳහා අපගේ යොදා ගැනීමේ කාලසීමාවන් 1995 අංක 5 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාවේ අනෙකුත් සියලුම විශේෂිත ව්‍යාපාර ව්‍යවසාය යටතේ 2030 ජනවාරි 1 දිනය වේ.

### උපායමාර්ගයට පාරිසරික, සමාජීය හා පාලනය අපි ඒකාබද්ධ කරන ආකාරය

තිරසාරභාවය බැංකුවේ තනිව පවත්නා මුලපිරීමක් නොව, එය අපගේ දිගුකාලීන ආයතනික උපායමාර්ගයට දැඩිව ඒකාබද්ධ කෙරේ. අපගේ ණය දීමේ සහ ආයෝජන තීරණ හරිත හා වගකිවයුතු මූල්‍යකරණයට ප්‍රමුඛත්වය දෙන අතර, තිරසාරභාවය පිළිබඳ ප්‍රතිඥාවන් අවදානම් තක්සේරු කිරීම් සහ මූල්‍ය නිෂ්පාදන සංවර්ධනයට ඒකාබද්ධ කරන බව සහතික කරයි. ඊට අමතරව, අපගේ ඩිජිටල් පරිනාමන මුලපිරීම් අපගේ කාබන් පාසටහන අඩු කිරීමට, සේවා කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සැලසුම් කරන අතර, අපගේ පාලන රාමුව මගින් සදාචාර ව්‍යාපාර ව්‍යවහාර අපගේ මෙහෙයුම් මෙහෙයවන බව සහතික කරයි. අපගේ ප්‍රධාන තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට තිරසාරභාවය ඒකාබද්ධ කිරීම මගින්, බැංකුව ඔරොත්තු දීම, ලාභදායිතාව, සහ දිගුකාලීන පාර්ශවකාර විශ්වාසය වැඩි කරයි.

| අපගේ ප්‍රමුඛ උපායමාර්ග | පාරිසරික ඒකාබද්ධකිරීම | සමාජීය ඒකාබද්ධකිරීම | පාලන ඒකාබද්ධ කිරීම |
|---|---|---|---|
| **ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව**<br> | ✓ පරිසර හිතකාමී මූල්‍ය නිෂ්පාදන හරහා හරිත බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම: පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ආයතනික ණය, පාරිභෝගික ගනුදෙනුකරුවන් සඳහා සූර්ය ණය.<br>✓ කඩදාසි රහිත බැංකුකරණය සහ ඩිජිටල් සේවා භාවිතය දිරිමත් කිරීම.<br>✓ පරිසර හිතකාමී ශාඛා සැලසුම් සැපයීම | ✓ අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පුළුල් කිරීම.<br>✓ තිරසාර මූල්‍ය භාවිතයන් පිළිබඳ ගනුදෙනුකාර අධ්‍යාපනය වැඩි කිරීම. | ✓ සදාචාරාත්මක බැංකුකරණ ව්‍යවහාර සහ විනිවිද ගනුදෙනුකාර ප්‍රතිපත්ති සහතික කිරීම.<br>✓ ඩිජිටල් බැංකුකරණයේ දත්ත ආරක්ෂාව සහ රහස්‍යතාව ශක්තිමත් කිරීම |
| **ශෛන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය**<br> | ✓ තිරසාරභාවය හා සම්බන්ධ ණය සහ හරිත මූල්‍ය වර්ධන උපාය මාර්ගවලට ඒකාබද්ධ කිරීම.<br>✓ නව ශාඛාවල මෙහෙයුම් කාබන් පාසටහන අඩු කිරීම. | ✓ අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පුළුල් කිරීම.<br>✓ දේශීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා සහාය වීම | ✓ උපායමාර්ගික සැලසුම්කරණය සහ තීරණ ගැනීමේදී ESG සාධක ඒකාබද්ධ කිරීම<br>✓ වාර්ෂික වාර්තාවේ තිරසාර කාර්ය සාධනය පිළිබඳ වාර්තාව.<br>✓ පාරිසරික රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරීම.<br>✓ වගකිවයුතු ව්‍යාප්තිය සහතික කිරීම සඳහා පාලන රාමු ශක්තිමත් කිරීම. |
| **සේවක සහභාගිත්වය වැඩි කිරිම**<br> | ✓ පරිසර හිතකාමී ව්‍යවහාර සඳහා අඛණ්ඩ දිරිගැන්වීම, තිරසාරභාවය අගය කරන සේවා ස්ථාන සංස්කෘතියක් ඇති කිරීම.<br>✓ බලශක්ති කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය අවම කිරීම සහ සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය කරන අදහස් සහ මුලපිරීම් පිළිගැනීම.<br>✓ පාරිසරික දැනුවත්භාවය පිළිබඳ පුහුණුව ලබා දීම. | ✓ සේවා ස්ථානයේ විවිධත්වය සහ ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම.<br>✓ සේවක යහපැවැත්ම සහ වැඩ-ජීවිත සමතුලිතතාවය කෙරෙහි අවධානය යොමු කිරීම.<br>✓තිරසාරභාවය පිළිබඳ දැනුවත් ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා පුහුණුව සහ සංවර්ධනය ශක්තිමත් කිරීම. | ✓ සදාචාරාත්මක මානව සම්පත් ප්‍රතිපත්ති, සාධාරණ රැකියා ව්‍යවහාර සහ පාලනය මත පදනම් වූ තීරණ ගැනීම ක්‍රියාත්මක කිරීම.<br>✓ විනිවිදභාවය සහිත නායකත්වයක් සහතික කිරීම සහ වගවීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම. |
| **අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරිම**<br> | ✓ දේශගුණයට අදාළ අවදානම් තක්සේරු කිරීම්වලට ඇතුළත් කිරීම.<br>✓ ණය දීමේ සහ ආයෝජන කළඹවල පාරිසරික බලපෑම තක්සේරු කිරීම.<br>✓ දේශගුණික ක්‍රියාදාම විශ්ලේෂණය සංවර්ධනය කිරීම. | ✓ ණය දීම සහ ආයෝජන කටයුතුවලට අදාළ සමාජ අවදානම් තක්සේරු කිරීම.<br>✓ කම්කරු සහ මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලතාව සහතික කිරීම.<br>✓ සදාචාරාත්මක ණය දීමේ ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීම | ✓ ESG අවදානම් පාලනය ශක්තිමත් කිරීම සහ වෙනස් වන තිරසාර රෙගුලාසිවලට අනුකූල වීම.<br>✓ ගෝලීය තිරසාර වාර්තාකරණ ප්‍රමිතීන් සමඟ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති පෙළගස්වා ගැනීම. (SLFRS S1 සහ S2, සහ TCFD). |
| **ඩිජිටල් පරිනාමනය වේගවත් කිරිම**<br> | ✓ කඩදාසි රහිත ගනුදෙනු සහ පරිසර හිතකාමී බැංකු වේදිකා වැඩි කිරීම.<br>✓ ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම | ✓ සියලුම ගනුදෙනුකාර අංශ අතර ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම.<br>✓ ග්‍රාමීය සහ අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට ඩිජිටල් බැංකුකරණ ප්‍රවේශය පුළුල් කිරීම.<br>✓ ප්‍රජා සහභාගීත්වය සහ අධ්‍යාපනය සඳහා ඩිජිටල් වේදිකා භාවිතා කිරීම.<br>✓ දත්තවල රහස්‍යතාව සහ ආරක්ෂාව සහතික කිරීම. | ✓ ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම.<br>✓ ඩිජිටල් වේදිකා ප්‍රවේශ්‍යතා ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම.<br>✓ දත්ත භාවිතය සහ ආරක්ෂක ව්‍යවහාර පිළිබඳව විනිවිදව වාර්තා කිරීම. |
| **තිරසාරභාවය**<br> | ✓ හරිතාගාර වායු (GHG) විමෝචනය අඩු කිරීම.<br>✓ ජලය සහ බලශක්තිය සුරැකීම.<br>✓ තිරසාර ප්‍රසම්පාදනය ප්‍රවර්ධනය කිරීම.<br>✓ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම | ✓ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම.<br>✓ ප්‍රජා සංවර්ධනයට සහාය විම<br>✓ සේවක යහපැවැත්ම සහතික කිරීම.<br>✓ විවිධත්වය සහ ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම. | ✓ තිරසාර කමිටුවක් ස්ථාපිත කිරීම<br>✓ අවදානම් කළමනාකරණයට ESG ඒකාබද්ධ කිරීම.<br>✓ තිරසාර කාර්ය සාධනය පිළිබඳ වාර්තාව.<br>✓ සදාචාරාත්මක ව්‍යාපාරික ව්‍යවහාර සහතික කිරීම. |

# ව්‍යාපාර ආකෘතිය GRI 2-6



අපගේ දැක්ම පිටුව 10

අපගේ අරමුණ පිටුව 10

| පාර්ශ්වකරුවන් | යෙදවුම් | ප්‍රවේශ්‍යතාව කළමනාකරණය කිරීම සඳහා අපගේ ප්‍රවේශය |
|---|---|---|
| කොටස් හිමි/ ආයෝජකයින් | **FC** **මූල්‍ය ප්‍රාග්ධනය**<br>• කොටස් හිමියන්ගේ අරමුදල්<br>• ණය ගැනීම්<br>• ගනුදෙනුකරුවන්ගෙන් තැන්පතු<br>• ආයෝජන | • අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්තා තක්සේරු ක්‍රියාවලිය (ICAAP)<br>• බාසල් III අවශ්‍යතාවලට අනුකූල වීම (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද)<br>• ලාභ රඳවා ගැනීමේ සහ ලාභාංශ ප්‍රතිපත්තිය<br>• අවදානම් බර තැබූ වත්කම් (RWA) ප්‍රශස්තිකරණය<br>• අර්බුද සූදානම සහ ප්‍රාග්ධන බෆර |
| ගනුදෙනුකරුවන් | **MC** **නිෂ්පාදිත ප්‍රාග්ධනය**<br>• ශාඛා ජාලය සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල<br>• ස්මාර්ට් කලාප<br>• තොරතුරු තාක්ෂණ දෘඩාංග සහ මූලික බැංකු පද්ධතිය<br>• ආරක්ෂක පද්ධති<br>• ඩිජිටල් යටිතල පහසුකම් සහ ජාල<br>• අනෙකුත් භෞතික යටිතල පහසුකම් | • පිරිවැය කාර්යක්ෂමතාව අනුපාතය සහ ලාභදායීතාවය මත පදනම්ව එක් එක් ශාඛාවේ කාර්ය සාධන ප්‍රවේශය<br>• අවම ස්ථාවර යටිතල පහසුකම් සමඟ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ජංගම බැංකු ඒකක, නියෝජිත බැංකුකරණය (තැපැල් ජාලය) භාවිතා කිරීම<br>• මලික බැංකු පද්ධති වැඩිදියුණු කිරීම්<br>• ආපදා ප්‍රතිසාධන ස්ථාන (DRS) සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් (BCP)<br>• නිෂ්පාදිත ඩිජිටල් ප්‍රාග්ධනය ආරක්ෂා කිරීම සඳහා ෆයර්වෝල්, අධීක්ෂණ පද්ධති සහ ආරක්ෂිත අන්ත ලක්ෂ්‍යවල ආයෝජනය කිරීම |
| සේවකයින් | **HC** **මානව ප්‍රාග්ධනය**<br>• සියලුම අදියරවල සේවකයින්<br>• කුසලතා සංවර්ධනය සහ නායකත්ව පුහුණුව<br>• විවිධත්වය සහ ඇතුළත් කිරීම<br>• සමාන අවස්ථා<br>• සංස්කෘතික පෙළගැස්ම<br>• වැඩ-ජීවිත සමතුලිතතාවය | • කුසලතා ඉල්ලුම පුරෝකථනය කිරීම සහ පරතරය විශ්ලේෂණය<br>• සේවක සංවර්ධනය සහ කුසලතා වැඩි දියුණු කිරීම<br>• විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල භූමිකාවන්හි කාන්තා නායකත්වය ප්‍රවර්ධනය කිරීම<br>• සේවකයින්ගේ විවිධත්වය පිළිබිඹු කිරීම සඳහා ශ්‍රී ලංකාව පුරා බඳවා ගැනීම් සහ ශාඛා මෙහෙයුම් වැඩි දියුණු කිරීම<br>• මහජන සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව ආරක්ෂිත වැඩ පරිසරයන් සඳහා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම |
| නියාමකයින් සහ රජයේ ආයතන | **IC** **බුද්ධිමය ප්‍රාග්ධනය**<br>• විශ්වාසදායක වෙළඳ නාමය<br>• ආයතනික සංස්කෘතිය<br>• උපායශීලී දැනුම<br>• ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි<br>• තාක්ෂණය සහ නවෝත්පාදනය | • දැනුම කළමනාකරණ පද්ධති (KMS)<br>• ආපදා ප්‍රතිසාධනය සහ තොරතුරු තාක්ෂණ උපස්ථ<br>• පාරිභෝගික විශ්වාසය සහ සේවක අභිමානය ශක්තිමත් කරන ස්ථාවර, වටිනාකම් මත පදනම් වූ වෙළඳ නාමකරණයක ආයෝජනය කිරීම<br>• දත්ත රහස්‍යතාව, ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාව සඳහා CBSL අනුකූල භාවිතයන් සහතික කරන්න |
| ව්‍යාපාර හවුල්කරුවන් | **SRC** **සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය**<br>• සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය<br>• පාරිභෝගිකයින්<br>• ව්‍යාපාරික හවුල්කරුවන්<br>• නියාමන නිලධාරීන්<br>• සමාජය සහ පරිසරය | • විනිවිද පෙනෙන සන්නිවේදනය<br>• වගකිවයුතු වෙළඳ දැන්වීම්<br>• ජංගම බැංකුකරණය සහ නියෝජිත බැංකුකරණය හරහා අඩු පහසුකම් සහිත ප්‍රදේශවල බැංකු ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම<br>• රජයේ සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සම්බන්ධතාවය |
| සමාජය හා පරිසරය | **NC** **ස්වභාවික ප්‍රාග්ධනය**<br>• ස්වභාවික ප්‍රාග්ධනය<br>• හරිත ගොඩනැගිලි සහ පරිසර හිතකාමී පද්ධති<br>• පුනර්ජනනීය බලශක්තිය<br>• නැවත වන වගා වැඩසටහන් | • හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්ට අනුකූලව බැංකු ගොඩනැගිලි සැලසුම් කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම<br>• සූර්ය බලශක්තියට මාරුවීම<br>• කඩදාසි පරිභෝජනය අඩු කිරීම සඳහා විද්‍යුත් ප්‍රකාශන, මාර්ගගත යෙදුම් සහ ජංගම බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම<br>• තිරසාර ප්‍රසම්පාදනය සහ අපද්‍රව්‍ය කළමනාකරණය |

මෙහෙයුම් පරිසරය පිටු 27 සිට 31

P E S

රූපය 8

අපගේ වටිනාකම් පිටුව 10

අපගේ මෙහෙවර පිටුව 10







## නිමැවුම්

**නිෂ්පාදන**
පිටුව 13

**තැන්පතු**
- ඉතුරුම් තැන්පතු
- කාලීන තැන්පතු

**ණය නිෂ්පාදන**

**සිල්ලර ණය**
- පුද්ගලික ණය
- නිවාස ණය
- උකස් අත්තිකාරම්
- තැන්පතු වලට එරෙහිව ණය
- වාහන ණය

**ආයතනික ණය**
- මූල්‍ය ආයතනවලට සෘජු ණය
- ණය සින්ඩිකේෂන්
- ව්‍යාපෘති ණය

**සේවා**
පිටුව 13

**අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ**

**වෙළඳ මූල්‍ය**

**අගය එකතු කළ සේවා**
- කාඩ්පත් සේවා
- උපයෝගිතා බිල්පත් ගෙවීම්
- NSB PayApp

**පාරිසරික තිරසාරභාවය**

**GRI අන්තර්ගත දර්ශකය**
පිටුව 440

## ප්‍රතිඵල

- බදු වලට පෙර ලාභය – රු. බිලියන 26.4
- බදු වලට පසු ලාභය – රු. බිලියන 16.3
- ගෙවන ලද පොලිය – රු. බිලියන 130.9
- රජයට දායකත්වය රු. බිලියන 19.7

- ශාඛා නැවත ස්ථානගත කිරීම් – 1
- ප්‍රාග්ධන වියදම – රු. බිලියන 3
- මෘදුකාංග අත්පත් කර ගැනීම – රු. බිලියන 2
- ශාඛා ජාලය – 262
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/CRM – 417

- අභිප්‍රේරිත සහ නියැලී සිටින ශ්‍රම බලකාය
- පිරිස් වියදම් – රු. බිලියන 20.3
- වෘත්තීය සුදුසුකම් ලත් සේවකයින් – 531
- ඉහළ රඳවා ගැනීමේ අනුපාතය – 96.2%

- ක්‍රියාකාරී පාරිභෝගික ගිණුම් – මිලියන 10.4
- අනුකූල නොවීම ශුන්‍ය
- 100% දේශීය ඒකියා

- මූලික බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) ක්‍රියාත්මක කිරීම
- NSB Virtual කාඩ්පත දියත් කිරීම

- හරිත හා සමාජීය වශයෙන් වගකිවයුතු බැංකුවක් ලෙස පිළිගැනීම
- ව්‍යාපාරික ක්‍රියාකාරකම්
- ණය දීම
- වගකිවයුතු ණය දීමේ පිළිවෙත් හරහා ණය ලබා දීම

T E L

## ප්‍රාග්ධනය ව්‍යාප්ත වීමේ ප්‍රකාශය

| | 2024 | 2023 | 2022 | CAGR % | ප්‍රාග්ධන සම්පාදනයට මඟ පාදන මූලපිරීම් |
|---|---|---|---|---|---|
| **FC මූල්‍ය ප්‍රාග්ධනය** | | | | | ස්ථාවර මූල්‍ය කාර්ය සාධනයක් ලබා දීම, වත්කම් වර්ධනය ප්‍රශස්ත කිරීම සහ විචක්ෂණශීලී ප්‍රාග්ධන කළමනාකරණය සහතික කිරීම, එමඟින් දිගුකාලීන ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම සහ පාර්ශවකරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීම. |
| මුදල් හා මුදල් වලට සමානයන් (රු. බි) | **8.4** | 9.5 | 8.7 | (2.17) | |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පතු (රු. බි) | **1,556.3** | 1,482.5 | 1,476.7 | 2.66 | |
| ණය ගැනීම් (රු. බි) | **65.6** | 94.4 | 44.6 | 21.28 | |
| ප්‍රාග්ධනය සහ සංචිත (රු. බි) | **98.8** | 81.4 | 72.9 | 16.45 | |
| ශුද්ධ පොලී ආන්තිකය (%) | **4.23** | 1.79 | 2.03 | – | |
| අයිතිකරුවන්ගේ හිමිකමේ සාමාන්‍යය මත ප්‍රතිලාභය (ROE) (%) | **18.07** | 9.36 | 3.40 | – | |
| වත්කම්වල සාමාන්‍යය මත ප්‍රතිලාභය (ROA) (%) | **1.54** | 0.26 | 0.28 | – | |
| **MC නිශ්පාදිත ප්‍රාග්ධනය** | | | | | අපගේ ශාඛා ජාලය නවීකරණය කිරීම, ඩිජිටල් යටිතල පහසුකම් පුළුල් කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, රට පුරා සිටින ගනුදෙනුකරුවන් සඳහා වැඩි ප්‍රවේශ්‍යතාවයක් සහ වැඩිදියුණු කළ සේවා සැපයීමක් සහතික කිරීම සඳහා ආයෝජනය කිරීම. |
| දේපල, පිරියත සහ උපකරණ (රු. බි) | **20.6** | 19.2 | 16.7 | 11.12 | |
| ප්‍රාග්ධන වියදම් (රු. බි) | **3.0** | 1.6 | 0.9 | 83.29 | |
| ශාඛා සංඛ්‍යාව | **262** | 262 | 262 | – | |
| ඒ ටී එම්/ සී ආර් එම් සංඛ්‍යාව | **417** | 417 | 390 | – | |
| ශාඛාවකට අනුයුක්ත කළ හැකි මුළු මෙහෙයුම් ආදායම (රු. මි.) | **291.4** | 131.1 | 129.1 | 50.24 | |
| ශාඛාවකට අනුයුක්ත කළ හැක ලාභය (රු. මි.) | **100.9** | 16.4 | 17.2 | 142.09 | |
| **HC මානව ප්‍රාග්ධනය** | | | | | සේවක සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම, ඇතුළත් කිරීමේ හා කාර්ය සාධනයේ සංස්කෘතියක් පෝෂණය කිරීම සහ නායකත්ව විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම, කුසලතා ඇති, අභිප්‍රේරිත සහ අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් සහතික කිරීම. |
| මුළු සේවක සංඛ්‍යාව | **4,212** | 4,358 | 4,528 | – | |
| සේවකයකුට අනුයුක්ත කළ හැකි ආදායම (රු. මි.) | **49.3** | 53.3 | 38.5 | 13.09 | |
| සේවකයකුට අනුයුක්ත කළ හැක ලාභය (රු. මි.) | **6.3** | 1.0 | 1.00 | 151.01 | |
| ධාරණ අනුපාතය (%) | **96.23** | 96.30 | 98.10 | – | |
| මුළු පුහුණු කාලය (පැය) | **29,165** | 52,630 | 22,603 | – | |
| ඉහල තීරණ ගැනීමේ තනතුරු වල සිටින තරුණ සේවකයින් සංඛ්‍යාව | **202** | 191 | 241 | | |
| කාන්තා නායකත්වය (සේවක සංඛ්‍යාව) | **241** | 257 | 269 | | |
| **IC බුද්ධිමය ප්‍රාග්ධනය** | | | | | නවෝත්පාදනය පෝෂණය කිරීම, සේවක ප්‍රාගුණ්‍ය වැඩි දියුණු කිරීම සහ දැනුම වැඩි දියුණු කිරීම හා ඩිජිටල් වේදිකා වල ආයෝජනය කිරීම, සේවා විශිෂ්ටත්වය සහ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහතික කිරීම. |
| අස්පෘශ්‍ය වත්කම් වල ආයෝජනය (රු. බි) | **2.2** | 0.7 | 0.8 | 70.95 | |
| සන්නාම වටිනාකම (රු. බි) | **N/A** | 23.0 | 30.4 | – | |
| ණය ශ්‍රේණිගත කිරීම | **AAA** | AAA | AAA | – | |
| වසර 10ට වඩා පැරණි සේවක සංඛ්‍යාව | **1,895** | 1,916 | 1,648 | – | |
| **SRC සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය** | | | | | පාර්ශවකරුවන් සමඟ විශ්වාසය වර්ධනය කිරීම, මූල්‍ය ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රජාවන් සමඟ අර්ථවත් ලෙස සම්බන්ධ වීම, එමඟින් තිරසාර සංවර්ධනයට සහාය වන කල්පවත්නා හවුල්කාරිත්වයන් ගොඩනැගීම. |
| රජයට දක්වන ලද දායකත්වය (රු. බි) | **19.7** | (1.6) | 5.3 | 93.34 | |
| භාවිතයේ ඇති කාඩ්පත් සංඛ්‍යාව | **1,171,547** | 1,147,651 | 2,203,309 | – | |
| **NC ස්වාභාවික ප්‍රාග්ධනය** | | | | | හරිත මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම, මෙහෙයුම් පරිසර කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ පාරිසරික සංරක්ෂණ මූලපිරීම් සඳහා සහාය වීම, අනාගත පරම්පරාවන් සඳහා ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමට උපකාරී වීම. |
| බලශක්ති පරිභෝජනය GJ | **32,883** | 30,621 | 29,218 | – | |
| ජල පරිභෝජනය $m^3$ | **62,744** | 73,895 | 70,430 | – | |
| ජාතික බලශක්ති ජාලයට එකතු කළ අගය නළය | **467,762** | 461,584 | 344,347 | – | |

වගුව 12

## ආර්ථිකයට අගය එකතු කළ ප්‍රකාශය GRI 201-1

| | 2024<br>රු. මි. | 2023<br>රු. මි. |
|---|---|---|
| **ඍජු ආර්ථික අගය එකතු කිරීම** | | |
| පොලී ආදායම | **203,748** | 226,967 |
| ගාස්තු සහ අනෙකුත් ආදායම් | **2,079** | 1,593 |
| වෙනත් ආදායම් | **1,810** | 3,504 |
| **ජනනය කරන ලද ආර්ථික වටිනාකම** | **207,637** | 232,064 |
| **බෙදා හරින ලද ආර්ථික වටිනාකම** | | |
| **සේවකයින්ට** | | |
| වැටුප් සහ අනෙකුත් ගෙවීම් | **20,306** | 16,110 |
| | **20,306** | 16,110 |
| **බාහිර අරමුදල් සපයන්නන්ට** | | |
| පොලී වියදම් | **130,966** | 197,402 |
| | **130,966** | 197,402 |
| **රජයට ගෙවීම** | | |
| ඒකාබද්ධ අරමුදල/ලාභාංශ | **–** | – |
| ඪ්ඕීඛ සහ ආදායම් බද්ද | **19,493** | (1,628) |
| ගෙවන ලද විශේෂ ගාස්තු | **320** | 320 |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය | **163** | – |
| | **19,976** | (1,308) |
| **මෙහෙයුම් පිරිවැය** | | |
| ණය හා අනෙකුත් පාඩු සඳහා වන හානිකරණය | **11,206** | 4,259 |
| අනෙකුත් වියදම් | **9,060** | 8,384 |
| | **20,104** | 12,643 |
| **වර්ධනයට හා පුළුල් කිරීමට** | **16,285** | 7,216 |
| **වෙන් කරන ලද මුළු වටිනාකම** | **191,352** | 224,848 |

ඕලකැ 13

### ජනනය කළ හා බෙදාහැරි ආර්ථික වටිනාකම – 2024

ප්‍රස්ථාරය 10




### ජනනය කළ හා බෙදාහැරි ආර්ථික වටිනාකම – 2023

ප්‍රස්ථාරය 11



# උපායමාර්ගය හා සම්පත් වෙන්කිරීම



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වටිනාකම් නිර්මාණය අපගේ ව්‍යාපාර ආදර්ශයට තියුණු ලෙස ඇතුළත් කර ඇති අතර, ඉන් මූල්‍ය ස්ථායිතාව, තිරසාර විශ්වාසය, සහ දිගු කාලීන ආර්ථික වර්ධනය සහතික කරයි. රජයට අයත් මූල්‍ය ආයතනයක් ලෙස, අපගේ ප්‍රධාන ශක්තිය ආර්ථික, සියල්ල ඇතුළත්, සහ තිරසාර බැංකුකරණ විසඳුම්වල පවතින අතර, මූල්‍ය අන්තර්ගතභාවය සහ ජාතික ආර්ථික ඔරොත්තුදීම වෙත අපගේ වගකීම අපි නගා සිටවමු. අපගේ අසමසම වටිනාකම කොටස, උපායමාර්ගික මුලපිරීම්, සහ වගකීම්සහගත බැංකුකරණ ව්‍යවහාරවලින් ඇතිවන වටිනාකම ජනනය කිරීමට අපට ඇති හැකියාව පුද්ගලයින්, ව්‍යවහාර සහ අවසාන වශයෙන් ආර්ථිකය සඳහා බැංකුව විශ්වාසී හවුල්කරුවෙක් බවට පත්කරයි.

## අපගේ අසමසම වටිනාකම් කොටස: 100% පැහැදිලි රජයේ සහතිකවීම

බැංකුවේ සමකළනොහැකි විශ්වාසය හා ස්ථාවරත්වය පිළිබඳ නිශ්චිත සුරැකුම සියලුම තැන්පතු සහ එහි උපචිත පොලිය පිළිබඳ 100%ක රජයේ සහතික වීමක් වන අතර, ස්වෛරී පිටුබලය සහිත සහතික කිරීම සමඟ ශ්‍රී ලංකාව තුළ අපව එකම මූල්‍ය ආයතනය බවට පත්කරයි. මෙම සහතික වීමෙන් ගනුදෙනුකාර අරමුදල් ආරක්ෂා කරන අතර, පරම මූල්‍ය ආරක්ෂාව ශක්තිමත් කරමින් සහ රටේ වඩාත් විශ්වාසී ඉතුරුම් සහ ආයෝජන හවුල්කරු ලෙස බැංකුව ස්ථානගත කරයි. මෙම රජයේ පිටුබලය සහිත සහතික කිරීම සමඟ, අපි තැන්පත්හිමියන්ගේ මානසික සහනය පිරිනැමීම පමණක් නොව මූල්‍ය පද්ධතිය තුළ මහජන විශ්වාසය පවත්වාගැනීම සහ දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීමට දායක වේ.

## අපගේ උපායමාර්ගික ප්‍රවේශය තුළින් වටිනාකම් නිර්මාණය

මූල්‍ය ශක්තිය, ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව සහ තිරසාරභාවය පදනම් බැංකුකරණය ඒකාබද්ධකරමින් සහ අපගේ මෙහෙයුම්වලින් සියලුම පාර්ශවකරුවන් ප්‍රතිලාභ ලබන බව සහතික කරමින් අපි වටිනාකම නිර්මාණය කරමු. අපගේ වටිනාකම නිර්මාණ ආදර්ශයෙන් අවධානය යොමු කළේ:

**විශ්වාසය, ආරක්ෂාව සහ ස්ථාවරත්වය:** තැන්පතු පිළිබඳව 100%ක රජයේ පිටුබලය සහිත ආරක්ෂාව සමඟ, දිගුකාලීන සම්බන්ධතා සහ තැන්පතු වර්ධනය පෝෂණය කරමින් ආරක්ෂාව පිළිබඳ සමකළ නොහැකි මට්ටමක් අපි ගනුදෙනුකරුවන්ට පිරිනමමු.

**මූල්‍ය අන්තර්ගතභාවය සහ ප්‍රවේශ්‍යතාව:** තැපැල් බැංකුකරණය, ශාඛා පුළුල් කිරීම, සහ ඩිජිටල් බැංකුකරණ විසඳුම් තුළින්, බැංකුකරණ සේවා සමාජයේ සෑම අංශයකටම විශේෂයෙන් අඩුවෙන් සේවයලද ප්‍රජාවන්ට ලඟාවෙන බව අපි සහතික කරමු.

**තිරසාර වගකීම්සහගත බැංකුකරණය:** හරිත මූල්‍යකරණය, සදාචාර ණයදීම සහ ESG පදනම් ආයෝජන තීරණ අපි ප්‍රමබ කරන අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික තිරසාරභාවය තුළ අපගේ කාර්යභාරය අපි ශක්තිමත් කරමු.

**නව්‍යකරණය සහ ඩිජිටල් පරිනාමනය:** ඩිජිටල් බැංකුකරණ හැකියාවන් වැඩි කරමින්, අපි ගනුදෙනුකාර පහසුව,මෙහෙයුම් කාර්යක්ෂමතාව, සහ මූල්‍ය ප්‍රවේශ්‍යතාව වර්ධනය කරමු.

**ශක්තිමත් පාලනය හා අවදානම් කළමනාකරණය:** ශක්තිමත් පාලන රාමු, නියාමන අනුකූලතාව සහ සදාචාර බැංකුකරණ ව්‍යවහාරවලට පිළිපදිමින්, අපි දිගු කාලීන ඔරොත්තුදීම සහ මූල්‍ය අඛණ්ඩතාව සහතික කරමු,

අපගේ ස්වෛරී පිටුබලය සහිත සහතිකවීම, උපායමාර්ගික බැංකුකරණ මුලපිරීම්, සහ තිරසාරභාවය සහ නව්‍යකරණය කරා කැපවීම භාවිතා කිරීම මගින්, බැංකුව දිගුකාලීන වටිනාකම නිර්මාණය කිරීම, පාර්ශවකාර විශ්වාසය ශක්තිමත් කිරීම, සහ ආර්ථික ප්‍රගතිය ඇති කිරීම අපි අඛණ්ඩව සිදුකරන අතර, ශ්‍රී ලංකාවේ ආරක්ෂිත සහ වඩාත් විශ්වාසී මූල්‍ය ආයතනය ලෙස සිය තත්ත්වය ශක්තිමත් කරයි.

ආර්ථික අර්බුදය හමුවේ, අපි 2024 දී මූල්‍ය ශක්තිය, ස්ථායිතාව සහ විචක්ෂණ වර්ධනය පෙන්වා ඇති අතර, අපගේ දැක්ම, මෙහෙවර සහ අරමුණ හා බැඳුණු අපගේ ප්‍රමුඛ උපායමාර්ග හය තුළින් ඔරොත්තුදීම පවත්වා ගනිමු.

## අපගේ උපායමාර්ගික සැලසුම්කරණයේ සැලැස්ම: ව්‍යුහගත රාමුවක්

අභ්‍යන්තර සහ බාහිර අභියෝගවලට බැංකුව කඩිසරව, කාර්යක්ෂමව, සහ ප්‍රතිචාරාත්මකව පවතින බව සහතික කිරීමට උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලිය අත්‍යාවශ්‍ය වේ. සම්පත් ඵලදායිව පෙළ ගැසීමෙන් අපගේ දිගු කාලීන පරමාර්ථ අත්කර ගැනීම සඳහා රාමුවක් සපයන අතර, බැංකුකරණ පරිසරය තුළ වෙනස්වීම් යොදා ගනී. මෙම සැලැස්මෙන් තිරසාර වර්ධනය, ලාභදායිතාව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය ඇති කිරීමට සැලසුම්කළ උපායමාර්ගික සැලසුම්කරණයට අපගේ ප්‍රවේශය විස්තර කෙරේ.

### ඒකාබද්ධ සැලසුම්කරණ ක්‍රියාවලියි

බැංකුවේ දි, අපගේ ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලිය පොදු අරමුණ සඳහා ආයතනයේ සෑම කොටසක්ම පෙළගැසෙන තීරණ ගැනීම සඳහා ඒකීය රාමුවක් නිර්මාණය කිරීමට සැලසුම් කෙරේ. සියලුම ක්‍රියාත්මක ක්ෂේත්‍ර එනම්, මූල්‍යමය, මෙහෙයුම්, අලෙවිකරණ, මානව සම්පත්, සහ තාක්ෂණය උපායමාර්ගිකව පෙළගැසෙන බව සහ එම අරමුණ හරහා කටයුතු කරන බව  මෙම ක්‍රියාවලියෙන් සහතික කරයි. මෙම ඒකාබද්ධ ප්‍රවේශය තුළින් විවිධ දෙපාර්තමේන්තු හරහා සහ ක්‍රියාකාරකම්වල වාසිය ගැනීමට අපව ශක්තිමත් කරන අතර, බැංකුවේ සියලුම මට්ටම් අතර උපායමාර්ගික දිශානතිය තුළ සන්නිවේදනය, සහ සහයෝගිතාව සහ අනුරූපතාව වැඩි කරයි. ඒකාබද්ධ ක්‍රියාවලිය දිගු කාලීන උපායමාර්ගික අරමුණු කෙටි කාලීන පරමාර්ථ සහ මෙහෙයුම් සැලසුම් සමඟ සම්බන්ධ කරන අතර, අපගේ උපායමාර්ගික ක්‍රියාවන් සුසංයෝගී, මැණියහැකි සහ ඵලදායී වන බව සහතික කරමු.

අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික දිශානතිය අර්ථවත් කරමින් සමාජීය බලපෑම් සහගත ආයතනික පරමාර්ථ ස්ථාපිත කරමින් බැංකුවේ අනාගතය හැඩ ගැස්වීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. පාලනය පිළිබඳ වගකීම පවරා දෙමින්, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ප්‍රධාන වටිනාකම් සහ වෙළෙඳපොළ සත්‍යතාවයන් සමඟ දිගු කාලීන අරමුණු සමඟ පෙළ ගැසෙන දැක්මක් සහිත නායකත්වය ලබා දේ. පරීක්ෂාකාරී විචාරණය සහ දැනුවත් තීරණ ගැනීම තුළින්, බැංකුව සැමදා වෙනස්වන ව්‍යාපාර වාතාවරණයක් යොදා ගැනිම පමණක් නොව එය තුළ ජයගැනීම සහතික කරයි. පැහැදිලි ප්‍රමුඛතාවන් නියම කරමින් සහ විධායක කළමනාකාරිත්වය මෙහෙයවමින්, අධ්‍යක්ෂ මණ්ඩලය කොටස්හිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කරන අතර, තිරසාර වර්ධනය සහ නව්‍යකරණය පෝෂණය කරයි.

## ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියේ ප්‍රධාන අදියර

**උපායමාර්ගික දැක්ම සහ පාරිසරික නිවාරණය**
- SWOT විශ්ලේෂණය
- PESTEL විශ්ලේෂණය
- අවදානම් සහ අවස්ථා

**උපායමාර්ගික පරමාර්ථ නියම කිරීම**
- දැක්ම, මෙහෙවර, වටිනාකම්, සහ අරමුණ
- ප්‍රමාණාත්මක කරුණු
- පාර්ශවකාර අපේක්ෂාවන්

**උපායමාර්ගික හැඩගැසීම**
- උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම
- වාර්ෂික අයවැය

**කාර්ය සැලසුම්කරණය හා සම්පත් වෙන් කිරීම**

**කාර්යසාධනය මැනීම සහ මූලික කාර්යසාධන දර්ශක ස්ථාපිත කිරීම**

**කාර්තුමය/මාසික නියාමනය හා සමාලෝචනය**

**ප්‍රතිපෝෂණ වළල්ල සහ අඛණ්ඩ වර්ධනය**

රූපය 9

## අභ්‍යන්තර විශිෂ්ඨත්වය මෙහෙයවන SWOT විශ්ලේෂණය

### ශක්තීන්

- තැන්පතු සහ පොලී ගෙවීම් ශ්‍රී ලංකා රජය විසින් සම්පූර්ණයෙන්ම සහතික කර ඇත.
- සම්පූර්ණයෙන්ම රජයට අයත් බැංකුවක් ලෙස විශ්වාසය සහ ලැදියාව.
- වසර 190 කට වැඩි බැංකු උරුමයක්.
- තැපැල් ජාලය සමඟ සහයෝගීතාවය.
- සේවා ස්ථාන 4,000+ ඉක්මවන දිවයින පුරා පුළුල් ගනුදෙනුකාර ලඟාවිම.

### දුර්වලතා

- ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ විධිවිධානවලින් ඇතිවන ව්‍යාපාර වර්ධනය කෙරෙහි සංරෝධක.
- රජයේ සුරැකුම්පත්වල තැන්පතු වලින් 60% ක් ආයෝජනය කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් සීමිත කළඹ විවිධාංගීකරණය.
- දැඩි මාර්ගෝපදේශ නව තාක්ෂණයන් යොදා ගැනීම මන්දගාමී කරයි.

### අවස්ථා

- ඩිජිටල්කරණ වර්ධනය සහ ඩිජිටල් ආර්ථිකයක් සඳහා රජයේ බලපෑම.
- හරිත මූල්‍ය, ESG සහ තිරසාර ඉලක්ක කෙරෙහි අවධානය යොමු කිරීම.
- යටිතල පහසුකම් සංවර්ධන මුලපිරීම් ඉහළ නැංවීම.
- මූල්‍ය සාක්ෂරතා මට්ටම් ඉහළ යාම.
- වැඩිවන සංක්‍රමණයෙන් ප්‍රේෂණ වෙළෙඳපොළ පුළුල් කිරීම.

### තර්ජන

- වේගයෙන් වෙනස් වන ගනුදෙනුකාර හැසිරීම් සහ කඩාකප්පල්කාරී තාක්ෂණයන්.
- ආරක්ෂාව, සත්‍යාපනය සහ සයිබර් ආරක්ෂණ අවදානම් ඉහළ යාම.
- නියාමන අවදානම් සහ අනුකූලතා ඉල්ලීම් වැඩි වීම.
- ආර්ථික තත්ත්වයන් සහ බුද්ධි ගලනය හේතුවෙන් දක්ෂයින් රඳවා ගැනීමේ අභියෝග
- බැංකුවේ සහ බැංකු නොවන තරඟකරුවන්ගෙන් තීව්‍ර තරඟය

## ප්‍රමුඛ උපායමාර්ග



### ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව

අපගේ සේවාදායකයින්ගේ අවශ්‍යතා අපගේ මෙහෙයුම්වල කේන්ද්‍රයේ තබමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශයක් සඳහා අපි කැපවී සිටිමු.

අපගේ නිෂ්පාදන, සේවා සහ ඩිජිටල් බැංකුකරණ හැකියාවන් අඛණ්ඩව වැඩි කරමින්, බාධා රහිත, ආරක්ෂිත, සහ පිවිසිය හැකි මූල්‍ය විසඳුම් ලබාදීම අපි අරමුණු කරමු. අපගේ විශේෂිත ගනුදෙනුකාර සේවා මුලපිරීම්, ප්‍රතිපෝෂණ පදනම් වර්ධනයන්, සහ මූල්‍ය අන්තර්ගතභාව උපායමාර්ගවලින් දිගුකාලින සම්බන්ධතා සහ විශ්වාසය පෝෂණය කරමින් විවිධ ගනුදෙනුකාර අංශ වෙත අපි පහසුකම් සලසන බව සහතික කරයි.

### ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය

අපගේ උපායමාර්ගයේ හරය වන්නේ ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම තුලින් තිරසාර දිගුකාලීන වටිනාකමක් ඇතුලතින් ගොඩනැගීමයි.

අපගේ අභ්‍යන්තර ශක්තීන් ශක්තිමත් කරමින්. අපි මෙහෙයුම් කාර්යක්ෂමතාවන් වැඩි කිරිම, ගනුදෙනුකාර සම්බන්ධතා තියුණු කිරීම, සහ අපගේ නිෂ්පාදන පිරිනැමීම් නව්‍යකරණය කිරිම කෙරෙහි අපි අවධානය යොමු කරමු. මෙම ප්‍රවේශය අඛණ්ඩ වර්ධනය ප්‍රශස්ථකරණ ක්‍රියාවලි, ඩිජිටල් පරිනාමනයේ ආයෝජනය, ගතික, කඩිසර, ශ්‍රමබලකායක් පෝෂණය කිරිම කරා බැඳීමක් මගින් මෙහෙයවනු ලබයි. අපගේ පවත්නා වත්කම් සහ වෙළෙඳපොල තත්ත්වය භාවිතා කරමින්, ශක්තිමත් පුළුල් කිරීම සාමුහිකව පෝෂණය කිරිමට වර්ධනීය ලාභ ග්‍රහනය කිරිමට අපි අරමුණු කරන අතර, අපගේ වර්ධනය ලාභදායකවීම පමණක් නොව අපගේ දිගුකාලීන උපායමාර්ගික දැක්ම සමඟ පෙළ ගැසෙන බව සහතික කරයි.

### සේවක සහභාගිත්වය වැඩි කිරීම

සේවක සහභාගිත්වය වැඩි කිරිම නව්‍යකරණ, කඩිසරකම, සහ සවිබලගැන්වූ ශ්‍රමබලකායක් පෝෂණය කිරීමේ අපගේ දැක්ම කේන්ද්‍රීය වේ.

අපගේ උපායමාර්ගය විස්තීර්ණ සහ දක්ෂයින් සංවර්ධනය, විවෘත සන්නිවේදනය සහ විනිවිද නායකත්වය එකට එකතුකරන සාකල්‍ය ප්‍රවේශයක් අපි වැළඳ ගනිමු. ශක්තිමත් පුහුණු වැඩසටහන්, උසස් කළ සහයෝගිතා මෙවලම් සහ පුද්ගලාරෝපිත වෘත්තීය සංවර්ධන මාර්ගවල ආයෝජනය කරමින්, සිය උපරිමය දායක කිරිම අගයකරන, සවන්දෙන සහ අභිප්‍රේරණය කරන බව සේවකයින්ට දැනෙන පරිසරයක් අපි නිර්මාණය කරමු. දත්ත පදනම් අවබෝධයන් භාවිතා කරමින්, සැමදෙනාගේම හඬ අපගේ සාමුහික දිශානතියට බලපෑම් කරන බව සහතික කිරිමට අපි අපගේ කාර්යසාධන කළමනාකරණය සහ ප්‍රතිපෝෂණ පද්ධති අඛණ්ඩව නිවැරදි කරමු. මෙම ගතික සහ සියල්ල ඇතුළත් සංස්කෘතිය පුද්ගල වර්ධනය සහ තෘප්තිමත්භාවය පෝෂණය කිරීම පමණක් නොව ආයතනයේ තිරසාර සාර්ථකත්වය, නව්‍යකරණය සහ තරඟකාරී වාසිය ද ඇති කරයි.









## අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම

අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම තිරසාර විශිෂ්ටත්වය සහ මෙහෙයුම් අඛණ්ඩතාව සඳහා අපගේ බැඳීම මූලික වේ.

අපගේ උපායමාර්ගය පරීක්ෂාකාරී, දත්ත පදනම් අවදානම් කළමනාකරණ රාමුව බැංකුව තුළ අප්‍රමාද, දත්ත පදනම් අවදානම් කළමනාකරණයක් ඇතුළත් කිරීම හා සම්බන්ධ වන අතර, එහිදී උසස් විශ්ලේෂණ, ශක්තිමත් අභ්‍යන්තර පාලනයන්, සහ අඛණ්ඩ පුහුණු වැඩසටහන් සක්‍රීය අවදානම-දැනුවත් පරිසරයක් නිර්මාණය කිරීම ආවරණය කරයි.

විභව තර්ජන කලින් හඳුනාගෙන ඵලදායි අයුරින් අවම කර විනිවිදභාවය සන්නිවේදනය කරන බව මෙම විස්තීර්ණ ප්‍රවේශය සහතික කරන අතර ඒතුළින් පාර්ශවකාර විශ්වාසය ශක්තිමත් කරමින් අපගේ වත්කම් ආරක්ෂා කරයි. අවදානම් කළමනාකරණය සෑම තීරණයකටම අත්‍යවශ්‍ය වන සංස්කෘතියක් වර්ධනය කිරීමෙන්, අපි වැඩිවන සංකීර්ණ මූල්‍ය වාතාවරණයක් තුළ අපගේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම පමණක් නොව, සදාචාරාත්මක සහ නියාමන අනුකූලතාවයේ ඉහළම ප්‍රමිතීන් ද ආරක්ෂා කරමු.

## ඩිජිටල් පරිනාමනය වේගවත් කිරීම

තිරසාරභාවය අපගේ දිගුකාලීන දැක්ම තුළ කේන්ද්‍රයේ පවතින අතර, පාරිසරික භාරකාරත්වය සහ සමාජීය වගකීම සමඟ වර්ධනය වැඩි කරයි.

නවීන තාක්ෂණයන් කඩිසර ඩිජිටල් වේදිකා සකස් කරමින්, අපි ඔරොත්තුදෙන සහ අනාගතයට සූදානම් තොරතුරු තාක්ෂණ පරිසර පද්ධතියක් ගොඩ නගමින් සිටින අතර, එය නව්‍යකරණ ඇතිකර, බාධාරහිත දත්ත පදනම් තීරණ ගැනීම පෝෂණය කරයි. ඩිජිටල්කරණය සඳහා අපගේ කැපවීම අතත්‍ය ගණනය, උසස් විශ්ලේෂණ, සහ සයිබර් ආරක්ෂාව තුළ ශක්තිමත් ආයෝජනයන් තුළ පිළිබිඹු කරන අතර, අපගේ සේවා අනුවර්තක සහ ආරක්ෂිතව පවත්නා බව අපි සහතික කරමු. මෙම සක්‍රීය ප්‍රවේශය අභ්‍යන්තර ක්‍රියාවලි විධිමත් කිරිම පමණක් නොව අපගේ ශ්‍රමබලකාය සවිබලග න්වා අපගේ තරඟකාරී වාසිය වැඩි කරයි. එමගින් වෙළෙඳපොල විතැන්වීම් අපේක්ෂා කිරීමට සහ වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන් සපුරාලීමට අපව ස්ථානගත කරයි.

## තිරසාරභාවය

අපගේ පරිනාමන න්‍යාය පත්‍රයේ පෙරමුනේදී ඩිජිටල්කරණය වේගවත් කිරිමට උපායමාර්ගිකව අත්‍යවශ්‍ය වන අතර ගනුදෙනුකාර අත්දැකීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව නැවත සකස් කිරීමට අපට හැකියාව ඇති කරයි.

හරිත මූල්‍යකරණය සහ බලශක්ති කාර්යක්ෂම ඩිජිටල් යටිතල පහසුකම් වල සිට වගකීම් සහගත සම්පත් කළමනාකරණය සහ ප්‍රජාව අවධානිත මුලපිරීම් දක්වා අපගේ මෙහෙයුම්වල සියලු මානයන් හරහා තිරසාර ව්‍යවහාර ඒකාබද්ධ කිරීමට අපි කැපවී සිටිමු. ගෝලීය තිරසාර රාමු සහ ආර්ථික සමාජීය හා පාලන මූලධර්ම සමඟ අපගේ ව්‍යාපාර ආදර්ශය පෙළගසමින්, අපි අපගේ පාරිසරික පාසටහන අඩු කරන අතර, ඇතුළත් ආර්ථික සංවර්ධනය පෝෂණය කරයි. තිරසාරභාවය සඳහා අපගේ උපායමාර්ගික කැපවීම නව්‍යකරණ නිෂ්පාදන පිරිනැමීම්, තිරසාර ආයෝජන අවස්ථා සහ ශක්තිමත් ආයතනික, සමාජීය වගකිම් වැඩසටහන් මගින් තවදුරටත් සාක්ෂි දරන අතර, මේ සියල්ල අපගේ පාර්ශවකරුවන් සඳහා කල්පවත්නා වටිනාකම උත්පාදනය කිරීමට සහ සමාජයට ධනාත්මකව දායකවීමට සැලසුම් කර ඇත.

# උපායමාර්ගය හා සම්පත් වෙන්කිරීම



## සම්පත් වෙන් කිරීම

සම්පත් වෙන් කිරීම සඳහා අපගේ ප්‍රවේශය, තිරසාර වර්ධනයක් සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සහතික කරමින්, අපගේ දිගුකාලීන ඉලක්ක සමඟ අපගේ මූල්‍ය, තාක්ෂණික සහ මානව ප්‍රාග්ධන ආයෝජන උපායමාර්ගිකව පෙළගැස්වීම සඳහා සකස් කර ඇත. ඩිජිටල් පරිනාමනය ඇතිකරන, ගනුදෙනුකාර අත්දැකීම වැඩිකරන සහ අවදානම් කළමනාකරණය ශක්තිමත් කරන මුලපිරීම් ප්‍රමුඛ කරමින් අපි අගය නිර්මාණය උපරිම කරන අතර, මුල්‍ය විචක්ෂණභාවය පවත්වා ගනිමු. මෙම සාකල්‍ය හා ගතික උපායමාර්ගය මූල්‍ය, මානව, තාක්ෂණික, සහ පාරිසරික වැනි විවිධ සම්පත් අතර ප්‍රශස්ථ ශේෂයක් සහතික කරන අතර, උපායමාර්ගික විභව්‍ය හුවමාරුවීම් කළමනාකරණය කරයි. සය වැදෑරුම් ප්‍රාග්ධනය එනම්  මූල්‍ය, නිෂ්පාදිත, බුද්ධිමය, මානව, සමාජ හා සම්බන්ධතා සහ ස්වභාවික ප්‍රාග්ධනය භාවිතා කරමින්, සෑම ආයෝජනයක්ම තිරසාර වටිනාකම් නිර්මාණය සහ දිගු කාලීන ඔරොත්තුදීමට දායක වන බව අපි සහතික කරමු.

## ප්‍රධාන උපායමාර්ගික සක්‍රීයකරුවන්

අපගේ ප්‍රධාන උපායමාර්ගික සකීයකරුවන් අපගේ දිගුකාලින සාර්ථකත්වය ඇතිකරන පදනම සකස් කරන අතර, අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා ඵලදායීව ක්‍රියාවට නංවන අතර ඔරොත්තුදීම සහ නව්‍යකරණය පෝෂණය කරන බව සහතික කරයි. මෙම සක්‍රීයකරුවන් සහක්‍රියාවෙන් කටයුතු කරන අතර මෙහෙයුම් කාර්යක්ෂමතාව, ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව, සහ දිගුකාලින තිරසාරභාවය තුළනය කරමින් වෙනස්වන මූල්‍ය වාතාවරණය තුළ නායකයෙක් ලෙස බැංකුව ස්ථානගත කරයි.

### ඒකාබද්ධ ඩිටල් යටිතලපහසුකම

ඩිජිටල් යටිතලපහසුකම අපගේ මෙහෙයුම්වල ප්‍රධාන ප්‍රතිෂ්ඨාව ලෙස සේවය කරන අතර, උසස් විශ්ලේෂණ, දත්ත පදනම් තීරණ ගැනීම සහ සයිබර් ආරක්ෂාව තුළින් බාධාරහිත සේවා ලබාදීම, ස්වයංක්‍රීයකරණය, සහ වැඩිකළ ගනුදෙනුකාර අත්දැකීම ශක්තිමත් කරයි.

### නිපුනතා කඩිසරකම

අපගේ ශ්‍රමබලකාය නව්‍යකරණය හා සහයෝගිතාවය පෝෂණය කරන නායකත්ව සංවර්ධනය තුළ අඛණ්ඩ ආයෝජනය, නිපුනතා වැඩි කිරීමේ වැඩසටහන් සහ ගතික වැඩ සංස්කෘතියක් සමඟ අනුවර්තක සහ අනාගතයට සූදානම්ව පවතින බව නිපුනතා කඩිසරකම සහතික කරයි.

### දැඩිකළ පාලන ප්‍රමිති

පාලන දැඩි බව විනිවිදභාවය, අවදානම් කළමනාකරණය සහ සදාචාරාත්මක තීරණ ගැනීම ශක්තිමත් කරන අතර, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය පවත්වා ගනිමින් නියාමන අනුකූලතාව සහතික කරයි.

## සක්‍රීයකරුවන් සියලූම උපායමාර්ග හරහා යොදා ගන්නා ආකාරය

| උපායමාර්ගය | ඒකාබද්ධ ඩිජිටල් යටිතලපහසුකම් | නිපුනතා අනුගතවීමේ සීඝ්‍රතාවය | දැඩි පාලන ප්‍රමිති |
|---|---|---|---|
| **ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව** | ඩිජිටල් වේදිකා තුළින් බාධා රහිත ගනුදෙනුකාර අත්දැකීම් සක්‍රීය කිරීම. | වෙනස් වන ගනුදෙනුකාර අවශ්‍යතාවලට ඉක්මනින් අනුවර්තනය වීමට සහ ප්‍රතිචාර දැක්වීමට සේවකයින් සවිබල ගන්වයි | ගනුදෙනුකාර විශ්වාසය සහ තෘප්තිය වැඩි කිරීම සඳහා විනිවිදභාවය, වගවීම සහ විශ්වාසය ප්‍රවර්ධනය කරයි. |
| **ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය** | පරිමාණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා සහයවේ. | බහුශ්‍රැත සහ ප්‍රතිචාරාත්මක ශ්‍රම බලකායක් පෝෂණය කරන අතර, එමගින් බැංකුවට ඉක්මනින් අනුවර්තනය වීමට සහ අවස්ථා මත ප්‍රාග්ධනනීයකරණය කිරිමට හැකියාව ඇති කරයි. | ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය කරන ස්ථාවර පරිසරයක් පෝෂණය කරමින්, සදාචාරාත්මක ව්‍යවහාර සහ අවදානම් කළමනාකරණය සහතික කරයි. |
| **සේවක සහභාගිත්වය වැඩි කිරීම** | සහයෝගීතාවය සහ පුහුණුව සඳහා ඩිජිටල් මෙවලම් සපයයි | අඛණ්ඩ ඉගෙනීම සහ අනුවර්තනය වීමේ හැකියාව, සේවකයින් සවිබලගැන්වීම සහ නියැලීම පෝෂණය කරයි. | සේවක විශ්වාසය, චිත්ත ධෛර්යය සහ සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කරයි. |
| **ඩිජිටල්කරණය වේගවත් කිරීම** | ඩිජිටල් පරිවර්තනයේ කොඳු නාරටිය සකස් කරයි | ඉක්මන් හා ඵලදායී ඩිජිටල් පරිවර්තනයක් ඇති කරමින්, නව තාක්ෂණයන්ට ඉක්මනින් අනුවර්තනය වීමට ශ්‍රම බලකාය දිරිමත් කරයි. | තාක්ෂණික භාවිතය විශ්වාසයෙන් වේගවත් කිරීම සඳහා ආරක්ෂිත සහ අනුකූල ඩිජිටල් පරිවර්තනයක් සහතික කරයි. |
| **අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම** | උසස් නියාමනය තුළින් අවදානම් කළමනාකරණය වැඩි කරයි | සේවක අනුවර්තනය වීමේ හැකියාව සහ සක්‍රීය අවදානම් කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම මගින් අවදානම් සංස්කෘතිය පෝෂණය කරයි. | දැඩි අනුකූලතාව, වගවීම සහ සක්‍රීය අවදානම් කළමනාකරණය සහතික කිරීම. |
| **තිරසාරභාවය** | බලශක්ති කාර්යක්ෂම මෙහෙයුම් සහ කඩදාසි රහිත බැංකුකරණය සඳහා පහසුකම් සපයයි | කඩදාසි රහිත බැංකුකරණය තිරසාර භාවිතයන් සහ තාක්ෂණයන් වේගයෙන් යොදා ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට සේවකයින් සන්නද්ධ කිරීම. | සදාචාරාත්මක භාවිතයන් සහ ශක්තිමත් අධීක්ෂණයක් තුළින් වගකිවයුතු සම්පත් භාවිතය සහ දිගුකාලීන පාරිසරික භාරකාරත්වය ප්‍රවර්ධනය කිරීම. |

## උපායමාර්ගික විභව්‍ය හුවමාරුවීම්

උපායමාර්ගික විභව්‍ය හුවමාරුවීම් තිරසාර සහ දිගුකාලින වර්ධනය සාක්ෂාත් කර ගැනීමට තරඟකාරී ප්‍රමුඛතාවන් අතර පරීක්ෂාකාරි තුළනයක් අවශ්‍යකරන තීරණ ගැනිමේදී නොවැලැක්වියහැකි අංගයක් වෙති. මෙවැනි විභව්‍ය හුවමාරුවීම් කළමනාකරණය මූල්‍ය කාර්යසාධනය, ගනුදෙනුකාර කේන්ද්‍රියතාව, ඩිජිටල් පරිනාමනය, අවදානම් කළමනාකරණය, සහ තිරසාර මුලපිරීම් බැංකුවේ උපායමාර්ගික දැක්ම සමඟ පෙළගැසෙන බව සහතික කරයි. සය වැදෑරුම් ප්‍රාග්ධනය එනම් මූල්‍ය, නිෂ්පාදිත, බුද්ධිමය, මානව, සමාජ හා සම්බන්ධතා සහ ස්වභාවික ප්‍රාග්ධනය හරහා විභව්‍ය හුවමාරුවීම් ඇගයීම මගින්, අවධානය අවම කරමින් කාර්යක්ෂමතාව, ඔරොත්තුදීම, සහ පාර්ශවකාර වටිනාකම වැඩි කිරීමට සම්පත් වෙන් කිරිම බැංකුව ප්‍රශස්ත කරයි.

දත්ත මත පදනම් වූ, තාක්ෂණයෙන් සවිබලගත්වන ලද, සහ පාලනය කෙරෙහි අවධානය යෙමුකළ ප්‍රවේශයක් මගින් කෙටිකාලීන ලාභදායිතාවය දිගු කාලීන ආයෝජන සමඟ සමතුලිත කිරීම, මානව සහභාගීත්වය සමඟ ස්වයංක්‍රීයකරණය සහ අනුගතවීමේ සීඝ්‍රතාවය සමඟ අනුකූලතාව වැනි අභියෝග ජය ගැනීමට බැංකුවට හැකියාව ලැබේ. පහත සාකච්ඡාකරන පළල් විභව්‍ය හුවමාරුවීම් මෙවැනි උපායමාර්ගික තීරණවල සංකීර්ණතා ඉස්මතු කරන අතර, සමස්ත බලපෑම උපරිම කිරිමට සෑම ප්‍රමුඛතාවයක්ම පරිස්සමින් කළමනාකරණය කරන බව සහතික කරයි. ඩිජිටල් යටිතලපහසුකම්, නිපුනතා අනුගතවීමේ සීඝ්‍රතාවය, සහ පාලන දැඩිකම භාවිතා කරමින්, බැංකුව සිය උපායමාර්ග වෙනස්වන වෙළෙඳපොල ගතිකතාවන්ට අනුවර්තකව පවතින බව සහතික කරයි. අඛණ්ඩ තක්සේරුව, කාර්යසාධන නියමානය, සහ උපායමාර්ගික පිරිසිදුකිරිම් තුළින්, බැංකුව මූල්‍යමය වශයෙන් යහපත්, ගනුදෙනුකාර කේන්ද්‍රීය සහ සමාජීය වශයෙන් වගකීම්සහගත ආයතනයක් ලෙස, ඇතුළත් ආර්ථික වර්ධනය සහ දිගු කාලීන පාර්ශවකාර විශ්වාසය පෝෂණය කරමින් සිය ස්ථානය ශක්තිමත් කරයි.

## දිගුකාලීන වර්ධනය එදිරිව කෙටි-කාලීන ලාභ

නව්‍යකරණය, තිරසාරභාවය සහ ඩිජිටල් පරිනාමනය තුළ ආයෝජනය සඳහා සැලකියයුතු ඉහළ ප්‍රාග්ධනය හා කාලය අවශ්‍ය වන අතර එය ආසන්න ලාභදායිතාව අඩුකරයි. කෙසේවෙතත්, මෙවැනි ආයෝජන දිගුකාලින තරඟකාරිත්වය, ඔරොත්තුදීම සහ වෙළෙඳපොල නායකත්වය සඳහා පදනම සකස් කරයි. හදිසි මූල්‍ය ලාභ සාක්ෂාත්කර ගැනීම සහ ව්‍යූහගත ආයෝජන සිදුකිරීම අතර නිවැරදි තුලනයක් ඇති කිරීම මගින් කෙටි කාලින කාර්යසාධනය අනාගත වර්ධනයේ වියදමින් නොපැමිණෙන බව සහතික කරයි ආසන්න ප්‍රතිඵල පිළිබඳ අදූරදර්ශී අවධානයක් යොමුකිරිම එකතැන පල්වීමට හේතුවන බවට සහ පුරෝකත්‍ය ලාභදායිතා පරීක්ෂා කිරිම නොමැති දිගුකාලින උපායමාර්ග පිළිබඳව අධි අවධාරණයක් මූල්‍ය පීඩාවක් නිර්මාණය කරන බවට බැංකුව දැනුවත්ය.

## අභිරුචිකරණය එදිරිව මෙහෙයුම් කාර්යක්ෂම

ප්‍රමිතිගතකරණ ක්‍රියාවලිය හා ස්වයංක්‍රීයකරණය භාවිතා කිරිම මෙහෙයුම් කාර්යක්ෂමතාව, පිරිවැය ඵලදායිත්වය, සහ පරිමාව සැලකියයුතු ලෙස වර්ධනය කරයි. කෙසේවෙතත්, අධික ලෙස දැඩි මෙහෙයුම් ආදර්ශය පුද්ගලාරෝපිත ගනුදෙනුකාර අත්දැකිම් හෝ ගලපන ලද සේවක ප්‍රතිලාභ පිරිනැමීමේ හැකියාව අඩුකරයි. අනෙක් අතට, නිෂ්පාදන, සේවා හෝ සේවක සහභාගිත්වය අභිරුචිකරණය ප්‍රමුඛ කිරිම පාර්ශවකාර තෘප්තිය වැඩිකල හැකි නමුත් ඉහළ මෙහෙයුම් සංකීර්ණත්වයට, වැඩි වූ පිරිවැයට, සහ මන්දගාමී ක්‍රියාවට නැංවිමට හේතු විය හැක. ප්‍රධාන අභියෝග නම්‍යශීලි පද්ධති සැලසුම්කරණයට මඟ පාදන අතර ඒවා කාර්යක්ෂමතාව පවත්වා ගනිමින් පුද්ගලාරෝපනය සඳහා ඉඩකඩ ලබාදෙන අතර එහි දී එය ඉහළම වටිනාකම ලබා දේ.

## නව්‍යකරණය එදිරිව අවදානම් ව්‍යවර්තනය

සම්ප්‍රදායික අවදානම් කළමනාකරණ සංස්කෘතියක් මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කර, පාලනය ශක්තිමත් කරමින් නියාමන අනුකූලතාව වැඩි කරන අතර, මේ සියලුම දෙය ආයතනික විශ්වාසය සඳහා තීරණාත්මකය. කෙසේ වෙතත්, අධික අවදානම් ව්‍යවර්තනය නවෝත්පාදනය, ඩිජිටල් යොදා ගැනීම සහ නව වෙළඳපොළවල් වෙත ව්‍යාප්ත වීමට බාධාවක් විය හැකිය. අනෙක් අතට, ප්‍රමාණවත් අවදානම් පාලනයකින් තොරව නව්‍යකරණය සඳහා අධික ලෙස ආක්‍රමණශීලී ප්‍රවේශයක් මඟින් බැංකුව මූල්‍ය, මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම්වලට නිරාවරණය කළ හැකිය.

නිවැරදි තුලනයක් පවත්වා ගැනිම මගින් ව්‍යවසායකත්ව මුලපිරිම් දිරිගන්වන බව සහතික කරන අතර, අවිනිශ්චිතතා සහ නියාමන අවශ්‍යතා කළමනාකරණය කිරිමට විනයානුකූල ප්‍රවේශයක් පවත්වා ගනී.

## තත්ත්වය වැඩිකිරිම එදිරිව පිරිවැය ප්‍රශස්තකරණය

ක්‍රියාවලි, ස්වයංක්‍රීයකරණය, අඩු මෙහෙයුම් සහ ඩිජිටල් කාර්යක්ෂමතාවන් තුළින් පිරිවැය අඩුකිරිම මූල්‍ය කර්යසාධනය වර්ධනය කරමින්, ලාභදායිතාව වැඩි කරයි. කෙසේ වෙතත්, ආක්‍රමණශීලී පිරිවැය අඩු කිරීමේ පියවර නොදැනුවත්වම ගනුදෙනුකාර අත්දැකීම්, සේවක තෘප්තිය හෝ තිරසාරභාවය පිළිබඳ මුලපිරීම් අවදානමට ලක් කළ හැකිය. ගුණාත්මක සේවාව, ශක්තිමත් සේවක පුහුණුව, සහ පාරිසරික තිරසාර මුලපිරීම්වල ආයෝජනය කෙටි කාලිනව වියදම් ඉහළ යා හැකි නමුත් සන්නාම පක්ෂපාතිකම, ශ්‍රමබලකා සහභාගිත්වය සහ දිගු කාලින කීර්තිනාමය ඇති කළ හැකිය. අභියෝගය වන්නේ පාර්ශවකරුවන්ට ලබා දෙන වටිනාකම අඩු නොකර කාර්යක්ෂමතාව වැඩි කරන ආකාරයෙන් පිරිවැය ප්‍රශස්ත කිරීමයි.

## මානව ස්පර්ශය එදිරිව තාක්ෂණය පදනම් වර්ධනය

ඩිජිටල් පරිනාමනය ගනුදෙනුකාර පහසුව, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම වැඩි දියුණු කරන අතර එමඟින් ඉහළ කාර්යක්ෂමතාවයක් සහ පරිමාණයක් ලබා ගත හැකිය. කෙසේ වෙතත්, බැංකු ස්වයං සේවා ආකෘති, චැට්බෝට් සහ කෘතිම බුද්ධිය මත පදනම් වූ ගනුදෙනුකාර අන්තර්ක්‍රියා වෙත මාරු වන බැවින්, සම්බන්ධතා මත පදනම් වූ බැංකුකරණයේ මානව සහභාගීත්වය අඩු කිරීමේ අවදානම වැඩි වේ. ස්වයංක්‍රීයකරණය මගින් වේගය සහ පරිමාණය වර්ධනය කරනු ලැබුවද, විශේෂයෙන් සම්ප්‍රදායික බැංකුකරණ අංශ තුළ බොහෝ ගනුදෙනුකරුවන් තවමත් පුද්ගලාරෝපිත සේවාව අගය කරයි. මෙයට සමානවම, බැංකුව තුළ, මානව කේන්ද්‍රීය සංස්කෘතියක් නොමැතිව ඩිජිටල් මෙවලම් මත අධික ලෙස රඳා පැවතීමක් සේවක සහභාගීත්වයට සහ සහයෝගීතාවයට බලපෑම් කළ හැකිය. තාක්ෂණික දියුණුව අර්ථවත් මානව අන්තර්ක්‍රියා සමඟ ඒකාබද්ධ කරන පරමාදර්ශී ප්‍රවේශය කෙරෙහි බැංකුව සැමවිටම අවධානය යොමු කරන අතර එහිදී ඒවා ඉහළම වටිනාකමක් එකතු කරයි.

## නියාමන එදිරිව අනුකූලතා අනුගතවීමේ සීඝ්‍රතාවය

ශක්තිමත් අනුකූලතා රාමුවක් විනිවිදභාවය, සදාචාර පාලනය සහ නෛතික හා නියාමන ප්‍රමිතිවලට අනුකූලතාව සහතික කරන අතර මේ සියල්ල ආයතනික අඛණ්ඩතාව සහ පාර්ශවකාර විශ්වාසය සඳහා තීරණාත්මකය, කෙසේවෙතත්, දැඩි නියාමන අවශ්‍යතා තීරණ ගැනීම මන්දග ාමි කරන අතර ව්‍යාපාර ආදර්ශ නම්‍යතාව සීමාකර, කඩාකප්පල්කාරී නව්‍යකරණ සඳහා බාධක නිර්මාණය කරයි. අධික ලෙස දැඩි නියාමන පරිසරයක් ව්‍යවසායකත්වය සහ ඩිජිටල් පරිනාමනය මැඩපවත්වන අතර අධික නම්‍යතා ප්‍රවේශයක් අනුකූලතා අවදානම් සහ කීර්තිනාම හානියකට ආයතනය නිරාවරණය කළ හැකිය. මෙහිදී ප්‍රධාන වන්නේ අවදානම් ඵලදායිව අවමකරමින් නව්‍යකරණය සඳහා ඉඩදෙන අනුගතවීමේ සීඝ්‍රතාවය හා පෙළගැසෙන සක්‍රිය අනුකූලතා උපායමාර්ගයක් සංවර්ධනය කිරීමයි.

# උපායමාර්ගය හා සම්පත් වෙන්කිරීම



## උපායමාර්ගය අනුව කාර්යසාධනය

# ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව

### අපගේ අවධානය

තාක්ෂණික ගනුදෙනුකරු ගුණාත්මකභාවය සහ අඛණ්ඩ වර්ධනයට අපගේ කැපවීම ඇතිකරන අපගේ මෙහෙයුම් විශිෂ්ටත්වයේ කේන්ද්‍රයේ සිටින බව අපි විශ්වාස කරමු.

### එය වැදගත් වන ආකාරය

තරඟකාරී සහ වේගයෙන් වෙනස්වන බැංකු පරිසරයක් තුළ, සුවිශේෂී ගනුදෙනුකාර අත්දැකීම ලබාදීම බැංකුවේ දිගුකාලීන වටිනාකම නිර්මාණය සහ සිය වෙළෙඳපොළ කොටස ශක්තිමත් කිරීම සඳහා තීරණාත්මකය.

### සම්පත් වෙන් කිරීම

අපි උපායමාර්ගිකව සම්පත් වෙන් කරන අතර ගනුදෙනුකාර අවශ්‍යතා, මනාප, දැඩි ගනුදෙනුකාර අත්දැකීම සඳහා අපේක්ෂාවන් සමඟ ආයෝජන පෙළ ගැසෙන බව සහතික කරයි. මෙය ගනුදෙනුකාර අත්දැකීම ඵලදායි අයුරින් වැඩි කරන අතර, තෘප්තිය, පක්ෂපාතිකම, සහ ගනුදෙනුකරුවන් සමඟ දිගුකාලීන සම්බන්ධතා ඇති කරයි. අපි සැමවිටම ස්පෘශ්‍ය වටිනාකම ලබාදෙන සහ බැංකුවේ සමස්ත උපායමාර්ගික ප්‍රමුඛතාවන් සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය දැක්ම සමඟ පෙළ ගැසෙන ආයෝජනය ප්‍රමුඛ කරමු.

### අපගේ ප්‍රගතිය

වගුව 14

| | 2024 | 2023 | 2022 |
|---|---|---|---|
| ආබාධිත ප්‍රවේශය සහිත ශාඛා ගණන | **229** | 229 | 229 |
| ගනුදෙනුකාර පැමිණිලි ගණන | **492** | 488 | 252 |
| ගනුදෙනුකාර ස්පර්ශක ස්ථාන | **4,685** | 4,685 | 4,648 |
| ඩිජිටල් දැනුවත් කිරීමේ වැඩසටහන් | **683** | 2,703 | 547 |

### උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේ කටයුතු

- ගනුදෙනුකරුවන්ට බාධා රහිත බැංකු අත්දැකීමක් වැඩි කිරීම හා ලබා දීම සඳහා වසර තුළ නව මධ්‍යගත බැංකුකරණ විසඳුමක් ක්‍රියාත්මක කිරීම.
- වඩා යහපත් ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දීම සඳහා බැංකුවට වර්ධනය කළ හැකි ක්ෂේත්‍ර තක්සේරු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා දත්ත විශ්ලේෂණ පැවැත්වීම.

### ඉදිරි දැක්ම

**දිගු-කාලය**

- ගනුදෙනුකරුට මුල් තැන දෙන සංස්කෘතියක් අඛණ්ඩව ගොඩනැගීම
- පුරෝකථන විශ්ලේෂණ, සක්‍රීය ගනුදෙනුකාර සහභාගීත්වය සහ වංචා වැළැක්වීම සඳහා කෘතිම බුද්ධිය සහ යන්ත්‍ර ඉගෙනීම භාවිතා කිරීම
- දත්ත මත පදනම් වූ, පුද්ගලාරෝපිත අන්තර්ක්‍රියා සඳහා උසස් ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණ (CRM) පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

**කෙටි සිට මධ්‍ය කාලීන**

- ගනුදෙනුකාර සේවය සහ අත්දැකීම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- ඩිජිටල් සහ ස්වයං සේවා හැකියාවන් ශක්තිමත් කිරීම.
- මූල්‍ය සාක්ෂරතාවය සහ අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම.
- ශාඛා සහ සර්ව-මාර්ග අත්දැකීම් ප්‍රශස්ත කිරීම.
- ගනුදෙනුකාර සහභාගීත්වය අඛණ්ඩව පුද්ගලාරෝපනය කිරීම.
- පැමිණිලි විසඳීම සහ ගනුදෙනුකාර සහාය වැඩි කිරීම.
- හරිත බැංකුකරණ නිෂ්පාදන සහ ESG-බැඳුණු ආයෝජන අවස්ථාව සංවර්ධනය කිරීම.

### සම්බන්ධිත පාර්ශවකරුවන්

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC MC HC IC SRC

### බලපානලද UN SDGs

8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
11 SUSTAINABLE CITIES AND COMMUNITIES

### අදාළ ප්‍රමාණාත්මක කරුණු

3 වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
4 මූල්‍ය තිරසාරභාවය
5 වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
6 සමාජ මාධ්‍යවල බලපෑමේ වර්ධනය
7 කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය
8 අනාගතය අරමුණු කරගත් නිපුනතා
10 නව තාක්ෂණික දියුණුව
12 ඩිජිටල් සාක්ෂරතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතා

# ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය

### අපගේ අවධානය

අභ්‍යන්තර සම්පත් හා හැකියාවන් ප්‍රශස්තකරණය තුළින් තිරසාර හා දිගුකාලීන සංවර්ධනය සහතික කිරීම.

### එය වැදගත් වන ආකාරය

මූල්‍ය අන්තර්ගතභාවයට සහයවීම, ජාතික ආර්ථික සංවර්ධනයට සහයවීම සහ දිගු කාලින කොටස්හිමි වටිනාකම සහතික කිරීම.

### සම්පත් වෙන් කිරීම

අපි හරිත මූල්‍යකරණය, ආර්ථික, සමාජීය හා පාලන අනුකූල ව්‍යාපෘති, ඩිජිටල් බැංකුකරණ විසඳුම්, බලශක්ති කාර්යක්ෂමතාව, තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම්, සහ අත්‍යා පදනම් ව්‍යාපාතිවලට ඕනෑකමින් අපගේ සම්පත් වෙන් කරන්නෙමු. අපි කාබන් උදාසීන සහ අපද්‍රව්‍ය අවම කිරීමේ මුලපිරීම් යොදා ගන්නා අතර තිරසාරභාවය පිළිබඳ අනුකූලතාව, සහ නියාමන වාර්තාකරණය සඳහා කාර්ය මණ්ඩලය වෙන් කරමු.

### අපගේ ප්‍රගතිය

වගුව 15

| | 2024 | 2023 | 2022 |
|---|---|---|---|
| තැන්පතුවල වෙළෙඳපොළ කොටස (%) | **8.66** | 8.55 | 9.23 |
| ශුද්ධ පොලී ආන්තිකය (%) | **4.23** | 1.79 | 2.03 |
| ස්කන්ධය මත ඉපයීම (%) | **18.07** | 9.36 | 3.40 |
| ආදායමට පිරිවැය අනුපාතය (බදු රහිත) (%) | **38.72** | 71.59 | 62.93 |
| ශාඛාවකට ලාභය (බදු පෙර) (රු. බිලියන) | **100.88** | 16.4 | 17.2 |

### උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේ කටයුතු

- තැන්පතු, ණය දීම සහ ජාත්‍යන්තර මෙහෙයුම් වලදී බැංකුවේ ගාස්තු ව්‍යුහය නැවත සලකා බැලීම.
- බලතල සීමාවන් පැවරීම වෙනස් කිරීම, පද්ධතිවල තොරතුරු ආරක්ෂාව වර්ධනය කිරීම සහ උසස් තොරතුරු තාක්ෂණ විසඳුම් ක්‍රියාත්මක කිරීම (නව ප්‍රධාන බැංකු පද්ධතිය)

### ඉදිරි දැක්ම

**දිගු-කාලය**

- දිගුකාලීන හරිත මූල්‍යකරණ ඉලක්කයකට කැපවීම.
- අඩු පහසුකම් ලත් ප්‍රජාවන් සඳහා දැරිය හැකි බැංකු විසඳුම් සංවර්ධනය කිරීම.
- සියල්ල ඇතුළත් ආර්ථික වර්ධනය ඇති කිරීම සඳහා රජය සමඟ හවුල්වීම.
- GRI සහ UN SDGs වැනි ගෝලීය තිරසාර රාමු සමඟ පෙළ ගැසීම.

**කෙටි සිට මධ්‍ය කාලීන**

- පරිසර හිතකාමී ව්‍යාපෘතිවලට සහාය වීම සඳහා හරිත ණය සහ ආයෝජන නිෂ්පාදන දියත් කිරීම.
- ශාඛා සහ කාර්යාලවල බලශක්ති කාර්යක්ෂම ව්‍යවහාර යොදා ගැනීමෙන් කාබන් පාසටහන අඩු කිරීම.
- ආර්ථික, සමාජ හා පාලන මූලධර්ම සහ වගකීම්සහගත බැංකුකරණය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු පැවැත්වීම.
- අපද්‍රව්‍ය අවම කිරීම සඳහා කඩදාසි රහිත බැංකුකරණය සහ ඩිජිටල් පරිනාමනය වැඩි කිරීම.
- අධ්‍යාපනය, ව්‍යවසායකත්වය සහ ප්‍රජා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ ආයතනික සමාජ වගකීම් මුලපිරීම් වැඩි කිරීම

### සම්බන්ධිත පාර්ශවකරුවන්



### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC MC HC IC SRC NC

### බලපානලද UN SDGs




### අදාළ ප්‍රමාණාත්මක කරුණු

1 පරිවර්තනීය දේශපාලන විතැන්වීම
2 සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය
3 වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
4 මූල්‍ය තිරසාරභාවය
5 වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
7 කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය
10 නව තාක්ෂණික දියුණුව
11 සයිබර් තර්ජන සහ තොරතුරු ආරක්ෂාව
15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

# උපායමාර්ගය හා සම්පත් වෙන්කිරීම



## සේවක සහභාගිත්වය වැඩි කිරීම

### අපගේ අවධානය

සේවකයින් අභිප්‍රේරිතව, කඩිසරව, සහ බැංකුවේ දිගුකාලීන දැක්ම සමඟ පෙළ ගැසී සිටින බව සහතික කිරීම.

### එය වැදගත් වන ආකාරය

සහභාගිත්ව ශ්‍රමබලකාය සුපිරි බැංකු සේවා ලබාදීමේදී, ඩිජිටල් පරිනාමනය යොදා ගැනීමේදී සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශයක් දරා ගැනීමේදී අත්‍යවශ්‍යය.

### සම්පත් වෙන් කිරීම

පුහුණු හා සංවර්ධන වැඩසටහන්, සේවක සුභසාධන මුලපිරීම්, කාර්යසාධන-පදනම් ප්‍රදාන, සහ ඩිජිටල් සහභාගිත්ව මෙවලම්වල ආයෝජනය මගින් සේවක සහභාගිත්වය වැඩි කිරීමට අපි උපායමාර්ගිකව සම්පත් වෙන් කරමු. මූල්‍ය සම්පත්වලින් කොටසක් නායකත්ව සංවර්ධනය, නිපුනතා ඉහළදැමීම, සහ වෘත්තිය ප්‍රගතිමය අවස්ථා, අනාගතයට සූදානම් ශ්‍රමබලකායක් සහතික කිරීම සඳහා යොමු කරනු ලැබේ.

### අපගේ ප්‍රගතිය

වගුව 16

| | 2024 | 2023 | 2022 |
|---|---|---|---|
| සේවක පිරිවැටුම් අනුපාතය (%) | 3.8 | 3.7 | 1.9 |
| සාමාන්‍ය සේවක කාලය (වසර) | 11.4 | 10.6 | 9.8 |
| සේවකයෙකුට පුහුණු සහ සංවර්ධන පැය ගණන | 7.0 | 12.2 | 5.0 |
| ආයෝජන මත මානව ප්‍රාග්ධන ප්‍රතිලාභය (HCROI) (වාරගණන) | 9.2 | 13.4 | 11.6 |
| සේවකයෙකුට ලාභය (රු. මිලියන) | 6.3 | 1.0 | 1.0 |
| ස්වේච්ඡා පිරිවැටුම් අනුපාතය (%) | 2.5 | 2.2 | 1.0 |
| අභ්‍යන්තර උසස්වීම් අනුපාතය (%) | 12.6 | 0.1 | 0.5 |

### උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේ කටයුතු

- බැංකුවට නිපුනතා හඳුනාගෙන ආකර්ෂණය කර ගැනීම සහ සේවක රඳවා ගැනීමේ උත්සාහයන් අඛණ්ඩව සිදු කිරීම
- පාඨමාලා, සහතිකපත් සහ උපකාරක පන්ති ප්‍රතිපූරණය සඳහා ප්‍රවේශය ලබා දීම.
- බැංකුවේ කාර්ය සාධනය සහ ඉලක්ක පිළිබඳ මාසික/කාර්තුමය යාවත්කාලීන කිරීම් බෙදා ගැනීම.

### ඉදිරි දැක්ම

#### දිගු-කාලය

- වත්මන් තෘප්තිමත් මට්ටම් තක්සේරු කිරීම සහ වර්ධනය සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා නිතිපතා සේවක සහභාගිත්ව සමීක්ෂණ දියත් කිරීම.
- ඉලක්කගත නිපුනතා පුහුණුව සහ නායකත්ව වැඩමුළු පිරිනමමින් ඉගෙනුම් හා සංවර්ධන අවස්ථා පුළුල් කිරීම.
- විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල් සහභාගිත්ව මෙවලම් සහ නායකත්ව ප්‍රශ්නෝත්තර සැසි තුළින් අභ්‍යන්තර සන්නිවේදනය ශක්තිමත් කිරීම.

#### කෙටි සිට මධ්‍ය කාලීන

- ව්‍යුහගත අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ උපදේශක වැඩසටහන් හරහා නායකත්ව මාර්ගයක් සංවර්ධනය කිරීම.
- වෘත්තීය සංවර්ධන සැලසුම් පුද්ගලාරෝපනය කිරීමට සහ සේවක අත්දැකීම් වැඩි කිරීමට කෘතිම බුද්ධිය පදනම් මානව සම්පත් විශ්ලේෂණ ඒකාබද්ධ කිරීම.
- සේවකයින් සහ අනාගතයට සහතික ශ්‍රමබලකායක් සවිබලගැන්වීමට අඛණ්ඩ ඉගෙනුම් නව්‍යකරණය සහ හරස් කාර්යය සහයෝගිතාව පිළිබඳ සංස්කෘතියක් අඛණ්ඩව පෝෂණය කිරීම

### සම්බන්ධිත පාර්ශවකරුවන්

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC HC SRC

### බලපානලද UN SDGs

4 QUALITY EDUCATION
8 DECENT WORK AND ECONOMIC GROWTH
10 REDUCED INEQUALITIES

### අදාළ ප්‍රමාණාත්මක කරුණු

- 3 වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
- 4 මූල්‍ය තිරසාරභාවය
- 5 වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
- 7 කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය
- 8 අනාගතය අරමුණු කරගත් නිපුනතා
- 9 සේවක සෞඛ්‍ය, ආරක්ෂාව සහ යහපැවැත්ම
- 15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

# ඩිජිටල්කරණය වේගවත් කිරීම

### අපගේ අවධානය

උසස් තාක්ෂණයන් සහ ඩිජිටල් විසඳුම් ඉක්මණින් වැළඳගනිමින් බැංකුවේ මෙහෙයුම් පරිනාමයට උත්සාහ කිරීම, ගනුදෙනුකාර අත්දැකීම් වැඩි කිරීම, සහ වෙළෙඳපොළ පිරිනැමීම් නැවත සකස් කිරීම. මෙම ප්‍රවේශයෙන් ක්‍රියාවලි ප්‍රශස්තකරණය, කාර්යක්ෂමතාව වර්ධනය කිරීම, නව්‍යකරණය පෝෂණය කිරීම අරමුණු කරයි.

### එය වැදගත් වන ආකාරය

තිරසාර වර්ධනය හා නියාමන අනුකූලතාව සහතික කරමින් කාර්යක්ෂමතාව, ගනුදෙනුකාර අත්දැකීම්, සහ තරඟකාරිත්වය වැඩි කිරීමට ඩිජිටල්කරණය බැංකුව සඳහා තීරණාත්මක වේ.

### සම්පත් වෙන් කිරීම

2024 වසර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඩිජිටල්කරණය පිළිබඳ වසරක් විය. නව මධ්‍යගත බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, සයිබර් ආරක්ෂක වර්ධනයන් සිදුකිරීම, ඩිජිටල් නිපුනතාවන් හී සේවකයින් පුහුණු කිරීම, තාක්ෂණික විශේෂඥයින් බඳවාගැනීම සහ ඩිජිටල් පළමු වන සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා අපි අපගේ සම්පත්වලින් බොහොමයක් වෙන් කළෙමු. අපි සර්වමාර්ග බැංකුරණය, දත්ත විශ්ලේෂණ හා ෆින්ටෙක් හවුල්කාරත්වයන් මත කේන්ද්‍රගත වුනෙමු.

### අපගේ ප්‍රගතිය

වගුව 17

| | 2024 | 2023 | 2022 |
|---|---|---|---|
| ඩිජිටල්ව ශක්තිමත් ගනුදෙනුකරුවන් | **618,314** | 401,812 | 351,658 |
| සේවකයින් ඩිජිටල් යොදා ගැනීමේ දර්ශකය (%) | **98** | 98 | 98 |
| දත්ත රහස්‍යතා උල්ලංඝනයන් | **0** | 0 | 0 |
| NSB PayApp සම්බන්ධ ගිණුම් | **553,389** | 268,581 | 228,067 |

### උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේ කටයුතු

- නව මධ්‍යගත බැංකුකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම.
- සියලුම පද්ධති සඳහා නව උපස්ථ විසඳුමක් ක්‍රියාත්මක කිරීම.
- PCI DSS සහතිකය පවත්වා ගැනීම.

### ඉදිරි දැක්ම

#### දිගු-කාලය

- 24/7 ගනුදෙනුකාර සේවාව සඳහා කෘතිම බුද්ධිය බලගැන් වූ චැට්බොක්ස් සහ අතත්‍ය සහය සංවර්ධනය.
- උසස් ආරක්ෂක ප්‍රොටෝකෝල බොට් සහ තර්ජන බුද්ධිය සහිත සයිබර් ඔරොත්තුදීම ශක්තිමත් කිරීම.

#### කෙටි සිට මධ්‍ය කාලීන

- ෆින්ටෙක් හා ගෙවීම් සේවා සපයන්නන් සමඟ හවුල්කාරත්වයන් ශක්තිමත් කිරීම.
- සේවකයින් සහ ගනුදෙනුකරුවන් සඳහා සයිබර් ආරක්ෂක දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පැවැත්වීම
- නියාමන ප්‍රමිතීන් සපුරාලීම සඳහා ඩිජිටල් අනුකූල නියාමන මෙවලම් ක්‍රියාත්මක කිරීම.
- අඩු සේවා ලත් ජනගහනයන්ට ඩිජිටල් බැංකු සේවා පුළුල් කිරීම.
- කඩදාසි රහිත බැංකුකරණය සහ පරිසර හිතකාමී මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම.

### සම්බන්ධිත පාර්ශවකරුවන්



### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC MC HC IC SRC NC

### බලපානලද UN SDGs




### අදාළ ප්‍රමාණාත්මක කරුණු

- 4 මූල්‍ය තිරසාරභාවය
- 5 වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
- 10 නව තාක්ෂණික දියුණුව
- 11 සයිබර් තර්ජන සහ තොරතුරු ආරක්ෂාව
- 12 ඩිජිටල් සාක්ෂරතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතා
- 15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

# අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම

### අපගේ අවධානය

ස්ථාවරත්වය පවත්වාගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ ඔරොත්තුදීම සඳහා අත්‍යවශ්‍ය අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, සහ කළමනාකරණය කිරීම සඳහා සක්‍රීය ප්‍රවේශය සහතික කිරීම.

### එය වැදගත් වන ආකාරය

බලගන්වනලද අවදානම් සංස්කෘතියක් අනුකූලතා ව්‍යාභාරයක් පමණක්ම නොවේ. එය තරඟකාරී වෙනස්කරන්නෙක් වන අතර, එය බැංකුවට අවිනිශ්චිතතාව අභිබවායාමට, සිය සමාජීය කාර්යභාරය දරා ගැනීමට, සහ විශ්වාසී මූල්‍ය භාරකරුවෙක් ලෙස සිය උරුමය පවත්වා ගැනීමට බැංකුවට හැකියාව ඇති කරයි.

### සම්පත් වෙන් කිරීම

අවදානම් කළමනාකරණය, අනුකූලතාව, සදාචාර හැසිරීම පිළිබඳ විස්තීර්ණ පුහුණු වැඩසටහන් සංවර්ධනය, අපි සම්පත් වෙන් කළ අතර, ශක්තිමත් අවදානම් දැනුවත් සංස්කෘතියක් පෝෂණය කරන නායකත්ව සංවර්ධන මුලපිරීම් ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩි කිරීමට, කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය වර්ධනය කිරීමට, සහ නියාමන අවශ්‍යතාවන්ට සහ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට දැඩි අනුකූලතාව සහතික කිරීමට අනුකූලතා නියාමන වැඩසටහන් ශක්තිමත් කිරීමට උසස් තාක්ෂණික විසඳුම්වල අපි ආයෝජනය කරමු.

### අපගේ ප්‍රගතිය

වගුව 18

| | 2024 | 2023 | 2022 |
|---|---|---|---|
| නියාමන උල්ලංඝනයන් ගණන | නැත | නැත | නැත |
| සන්නාම ශ්‍රේණිගතකරණය | අදාළ නැත | 7 | 5 |
| ණය ශ්‍රේණිගතකරණය | **AAA** | AAA | AAA |
| බාසල් III - මූළු ප්‍රාග්ධන අනුපාතය (%) | **25.88** | 19.26 | 18.00 |
| NSFR (%) | **193.53** | 180.49 | 180.51 |
| තෝලන අනුපාතය (%) | **8.00** | 6.23 | 7.43 |

### උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේ කටයුතු

- බැංකුවේ උපායමාර්ගය සහ මෙහෙයුම් පරිසරය සැලකිල්ලට ගනිමින් වර්ෂය තුළ අවදානම් රුචි රාමුව සමාලෝචනය කිරීම.
- බැංකුවේ උපායමාර්ගය, අවදානම, අනුකූලතාවය සහ මෙහෙයුම් පරිසරයේ වෙනස්වීම්වලට වඩා යහපත් ප්‍රතිචාර සහතික කිරීම සඳහා බැංකුවේ ක්‍රමය ඇතුළත් කරමින් තුන් අවුරුදු උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම කෙටුම්පත් කිරීම.

### ඉදිරි දැක්ම

#### දිගු-කාලය

- වත්මන් තෘප්තිමත් මට්ටම් තක්සේරු කිරීම සහ වර්ධනය සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා නිතිපතා සේවක සහභාගිත්ව සමීක්ෂණ දියත් කිරීම.
- ඉලක්කගත නිපුනතා පුහුණුව සහ නායකත්ව වැඩමුළු පිරිනමමින් ඉගෙනුම් හා සංවර්ධන අවස්ථා පුළුල් කිරීම.

#### කෙටි සිට මධ්‍ය කාලීන

- ව්‍යුහගත අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ උපදේශක වැඩසටහන් හරහා නායකත්ව මාර්ගයක් සංවර්ධනය කිරීම.
- සේවකයින් සහ අනාගතයට ඔරොත්තුදෙන ශ්‍රමබලකායක් සවිබලගැන්වීමට අඛණ්ඩ ඉගෙනුම් නව්‍යකරණය සහ හරස් කාර්යය සහයෝගිතාව පිළිබඳ සංස්කෘතියක් අඛණ්ඩව පෝෂණය කිරීම.
- ආයතනික උපාය මාර්ගයට සේවක සහභාගීත්වය අඛණ්ඩව ඇතුළත් කිරීම, සේවක කළමනාකරණ පිළිවෙත් බැංකුවේ දිගුකාලීන වර්ධන දැක්ම සමඟ පෙළ ගැසෙන බව සහතික කිරීම.

### සම්බන්ධිත පාර්ශවකරුවන්

### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC HC IC SRC

### බලපානලද UN SDGs

8 DECENT WORK AND ECONOMIC GROWTH
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

### අදාළ ප්‍රමාණාත්මක කරුණු

3 වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
4 මූල්‍ය තිරසාරභාවය
11 සයිබර් තර්ජන සහ තොරතුරුවල ආරක්ෂාව
13 මූල්‍ය අපරාධ
15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

# තිරසාරභාවය

### අපගේ අවධානය

වෙනස්වන ගෝලීය ප්‍රවනතා, නියාමන ඉල්ලුම, සහ පාර්ශවකාර අපේක්ෂාවන් සමඟ පෙළ ගැසීම. පාරිසරික, සමාජීය හා පාලන (ESG) අදහස් මූල්‍ය ක්ෂේත්‍රය නැවත හැඩගස්වන බැවින්, බැංකුව තරඟකාරීව සහ අනුකූලව සිටීමට අනුවර්තනය විය යුතුය.

### එය වැදගත් වන ආකාරය

වේගයෙන් වෙනස්වන ලෝකයක අභියෝග ජයගැනීමට මනාව සූදානම් කළ ඉදිරිය දකින වගකීම්සහගත ආයතනයක් ලෙස බැංකුව ස්ථානගත කිරීම.

### සම්පත් වෙන් කිරීම

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති වැඩි කිරීම, ජල පරිභෝජන තාක්ෂණ ප්‍රවර්ධනය කිරීම, සහ තිරසාර මූලපිරිම්වල සේවකයින් සහභාගිකරවීම මගින් තිරසාරභාවය සඳහා අපි සම්පත් වෙන් කළෙමු. මෙවැනි ආයෝජනයන් බැංකුවේ පාරිසරික පාසටහන් අඩු කිරීමට, දිගුකාලීන සම්පත්වල කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීමට, සහ තිරසාර ව්‍යවහාරයන් හී නායකයෙක් ලෙස බැංකුව ස්ථානගත කිරීමට සහය වනු ඇත.

### අපගේ ප්‍රගතිය

වගුව 19

| | 2024 | 2023 | 2022 |
|---|---|---|---|
| හරිත මූල්‍යකරණ කළඹ - ලබාදුන් ණයමුදල (රු. මිලියන) | 4,000 | – | 5.8 |
| ජාතික පද්ධතියට ලබා දුන් පුනර්ජනනීය බලශක්තිය (කි. වො.) | 467,762 | 461,584 | 344,347 |
| සේවක විවිධත්වය හා ඇතුළත්වීමඃ ස්ත්‍රීපුරුෂ සමානතාව | | | |
| පිරිමි (%) | 45 | 45 | 45 |
| කාන්තා (%) | 55 | 55 | 55 |

### උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේ කටයුතු

- ඩිජිටල් බැංකුකරණය සහ කඩදාසි රහිත ක්‍රියාවලීන් ප්‍රවර්ධනය කිරීම.
- තිරසාර ව්‍යාපෘති සඳහා ණය සහ මූල්‍යකරණය පිරිනැමීම.
- සේවක සෞඛ්‍ය, ආරක්ෂාව සහ වැඩ-ජීවිත සමතුලිතතාවය ප්‍රවර්ධනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සියලුම ව්‍යාපාර මෙහෙයුම්වලදී ඉහළම සදාචාරාත්මක ප්‍රමිතීන් ආරක්ෂා කිරීම.

### ඉදිරි දැක්ම

**දිගු-කාලය**

- සමාජීය තිරසාරභාවය ශක්තිමත් කරමින් සේවය අඩුවෙන් ලද සහ ග්‍රාමීය ජනගහනය වෙත බැංකු සේවා ලබාදීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම.
- හරිත ණය, තිරසාර ආයෝජන නිෂ්පාදන, සහ පරිසර හිතකාමී විසඳුම් බැංකු විසඳුම් හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම.
- ජාතික සහ ගෝලීය තිරසාර ප්‍රමිති සමඟ පෙළගැසුණු පැහැදිළි ESG අරමුණු, ඉලක්ක, සහ වාර්තාකරණ රාමු ස්ථාපිත කිරීම.

**කෙටි සිට මධ්‍ය කාලීන**

- තිරසාර මූල්‍ය පිරිනැමීම් පුළුල් කිරීම - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, තිරසාර කෘෂිකර්මාන්තය සහ සමාජීය වශයෙන් වගකීම්සහගත ව්‍යවසායන් සඳහා අරමුදල් වැඩි කිරීම.
- SLFRS S1, SLFRS S2 සහ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව තිරසාරභාවය පිළිබඳ හෙළිදරව් කිරීම්, බලපෑම් තක්සේරු කිරීම් සහ වාර්තාකරණය වැඩි කිරීම.
- තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා අධ්‍යාපනය, මූල්‍ය සාක්ෂරතාවය සහ ව්‍යවසායකත්ව වැඩසටහන්වල ආයෝජනය කිරීම.

### සම්බන්ධිත පාර්ශවකරුවන්



### සම්බන්ධිත ප්‍රාග්ධනයන්

FC SRC NC

### බලපානලද UN SDGs




### අදාළ ප්‍රමාණාත්මක කරුණු

- 9 සේවක සෞඛ්‍ය, ආරක්ෂාව සහ යහපැවැත්ම
- 14 දේශගුණික විපර්යාස සහ පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව
- 15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය



ඒකාබද්ධ වාර්තාව

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

82
ව්‍යාපාර අංශ සමාලෝචනය

92
මූල්‍ය ප්‍රාග්ධනය

102
නිෂ්පාදිත ප්‍රාග්ධනය

108
මානව ප්‍රාග්ධනය

120
බුද්ධිමය ප්‍රාග්ධනය

128
සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

146
ස්වභාවික ප්‍රාග්ධනය

# ව්‍යාපාර අංශ සමාලෝචනය



## පාරිභෝගික බැංකුකරණ අංශය

GRI 203-2

### අංශයේ පරමාර්ථ

බැංකුව සහ පොදු ජනතාව අතර ප්‍රධාන අතුරුමුහුණතක් ලෙස සේවය කරන බැංකුවේ මෙහෙයුම්වල ප්‍රධාන අංශය ලෙස පාරිභෝගික බැංකුකරණය පවතී. මෙම අංශයේ ඒකායන පරමාර්ථය වන්නේ සියල්ල ඇතුළත් පිවිසියහැකි, මූල්‍ය සේවා පිරිනමමින් ශ්‍රී ලංකාවේ සිටින තනි පුද්ගලයින් හා කුටුම්බයන් සවිබලගැන්වීමයි.

බැංකුව අරමුණු කරන දෑ:

- තිරසාර ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා තැන්පතු සංචලනය.
- ඉලක්කගත ප්‍රවේශය සහ ඩිජිටල් ප්‍රවේශය තුළින් මූල්‍ය අන්තර්ගතභාවය තියුණු කිරීම.
- වගකිවයුතු ණය විසඳුම් හරහා ධනය නිර්මාණය කිරීම සහ නිවාස හිමිකම වැඩිදියුණු කිරීම.
- මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සහ ජීවිත කාලය පුරාම පවතින බැංකු සබඳතා වර්ධනය කිරීම.

### අප පිරිනමන දෑ

බැංකුවේ පාරිභෝගික බැංකුකරණ කළඹට සිය ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද පුළුල් නිෂ්පාදන හා සේවා කට්ටලයක් ඇතුලත් වේ.

- **තැන්පතු නිෂ්පාදන:** ඉතුරුම් තැන්පතු, ස්ථාවර තැන්පතු, ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු යෝජනා ක්‍රම. විශ්‍රාම ගිණුම්, යෞවන ගිණුම් සහ බාලවයස්කාර ඉතුරුම් ගිණුම්
- **ණය කළඹ:** නිවාස ණය, පුද්ගලික ණය, තැන්පතුවලට මත ණය, උකස් අත්තිකාරම්, වාහන ණය සහ සේවක ණය
- **ඩිජිටල් මාර්ග:** NSB Mobile, NSB PayApp, සහ බැංකුවේ ඩිජිටල් බැංකුකරණය.

### බැංකුවට දායකත්වය

**58.5%**
ශුද්ධ මෙහෙයුම් ආදායම

**27.2%**
අංශයේ වත්කම්

**94.2%**
අංශයේ වගකීම්

### 2024 දී මෙහෙයුම් වාතාවරණය

| මෙහෙයුම් පරිසරය | බැංකුව කෙරෙහි බලපෑම |
|---|---|
| **පොළී අනුපාත පහත වැටීම:** මහ බැංකුවේ ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ ප්‍රතිපත්ති පොළී අනුපාත අඩුකරන ලදි. | ආන්තික සම්පීඩනය, තැන්පතු සඳහා තරඟකාරිත්වය වැඩි වීම, තැන්පතු සඳහා ගනුදෙනුකාර රුචිය අඩු වීම සහ පාරිභෝගික ණය සඳහා රුචිය වැඩි වීම. |
| සාර්ව ආර්ථික ස්ථායිකරණය: යහපත් අතට හැරුණු උද්ධමනය හා විනිමය අනුපාත ස්ථාවරත්වය | ගනුදෙනුකාර විශ්වාසය සහ ණය සුදුසුකම් වැඩි වීම සහ නිවාස සහ පුද්ගලික ණය සඳහා ඇති ඉල්ලුම අලුත් වීම. |
| ඩිජිටල් බැංකුකරණ ඉල්ලුම ඉහළයාම | ජංගම, කාඩ්පත් රහිත සහ දුරස්ථ බැංකුකරණය සඳහා ගනුදෙනුකාර ඉල්ලුමේ වැඩිවීම, |
| සයිබර් අවදානම් ඉහළයාම | පාරිභෝගික බැංකු පද්ධතිවල අවදානම වැඩි වීම. |
| පුද්ගලාරෝපිත මූල්‍ය විසඳුම් සඳහා ඉල්ලුම | සම්මත නිෂ්පාදන අපේක්ෂාවන්ගෙන් රුචිය මත පදනම් වූ නිෂ්පාදන අපේක්ෂාවන්ට මාරුවීම |
| දැඩි නියාමන අනුකූලතාව: KYC, AML, දත්ත රහස්‍යතාව | ඉහළ පරිපාලන බර සහ අනුකූලතා අවදානම |
| **මෙහෙයුම් පිරිවැය ඉහළයාම:** ඩිජිටල් ආයෝජනයන් සහ උද්ධමන සම්බන්ධ සේවා වියදම් හේතුවෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ යාම | පිරිවැයට-ආදායම් අනුපාතය මත පීඩනය වැඩි වීම |

### ප්‍රධාන මූල්‍ය සිදුවීම්

#### පොළී ආදායම

ප්‍රස්ථාර 12




ණය හා අත්තිකාරම්
**රු. බි.419**
2% ↓

තැන්පතු
**රු. බි. 1,531**
5% ↑

## අංශමය උපායමාර්ග, අවදානම් සහ අවස්ථා මිනුම

| උපායමාර්ගික අවධානය | අවදානම් හා අවස්ථා | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| නිවාස ණය ප්‍රවර්ධනය කිරීම | අඩු ආදායම්ලාභී ණය අවදානම වැඩි වීම | තක්සේරු කිරීම සහ නිසි යෝග්‍යතාවය තහවුරු කරන මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම. |
| ඩිජිටල් යොදා ගැනීම ප්‍රසාරණය | ස්වයං සේවා හරහා ඉහළ ආන්තිකයන් සඳහා අවස්ථාව | නව මධ්‍යගත බැංකුකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, සහ සුහුරු කාඩ් ක්‍රියාකාරිත්වය යටතේ Virtual Travel Card (VTC) සහ NSB PayApp හි Smart Wallet හඳුන්වාදීම |
| පුද්ගලික ණය වර්ධනය | සුරැකුම් රහිත ණය ලබාදීම තුළින් ගෙවීම් පැහැර හැරීම ඉහළ යාම | පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හරහා ණය ගැතියන්ගේ අවදානම් පැතිකඩ සහ නියාමනය දැඩි කිරීම, ප්‍රමුඛතම ණය දීමේ නිෂ්පාදනය ලෙස උකස් වලට ප්‍රමුඛත්වය දීම, දේපල උකස් මගින් ලබාගන්නා පුද්ගලික ණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සහ අක්‍රිය ණය අයකර ගැනීමට පහසුකම් සැලසීම සඳහා බාහිර ණය එකතු කරන්නෙකුගේ සේවය ලබා ගැනීම. |
| ඩිජිටල් පිරිනැමීම් වැඩි කිරීම | සයිබර් ආරක්ෂක තර්ජන | වංචා හඳුනාගැනීම පහසුකිරීම සඳහා අයෝජනය |
| ගනුදෙනුකාර පදනම වැඩි කිරීම | පොලී අනුපාත පහත දැමීම තුළින් ආන්තික සංකෝචනය | ගාස්තු මත පදනම් වූ ආදායම සහ හරස් විකිණීම කෙරෙහි අවධානය යොමු කිරීම |
| මූල්‍ය සාක්ෂරතාව වර්ධනය | ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව මූල්‍ය සාක්ෂරතාවයට අනුවර්තනය වීම අඩු වීම | ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් හරහා තියුණු වෙළෙඳපොල විනිවිද යාම |
| ඉතුරුම් තැන්පතු කොටස වැඩි කරමින් අඩු පිරිවැය තැන්පතු පදනම් වර්ධනය | පොලී අනුපාත සංවේදී ගනුදෙනුකාර ඉවත් වීමේ අවදානම සහ ද්‍රවශීලතාවය වැඩි කිරීමේ අවස්ථාව | තරුණයින් සඳහා ඉතිරිකිරීමේ ගිණුම් ප්‍රවර්ධනය වැඩි කිරීම. |

## සම්පත් වෙන් කිරීම

බැංකුවේ පාරිභෝගික බැංකුකරණ අංශය වත්කම්වලින් 27%කට දායක වූ අතර, 2024යේ දී බැංකුවේ වගකීම් වලින් 94% කට දායක විය.

- **තාක්ෂණික ආයෝජන:** බැංකුව ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට NSB ජංගම දුරකථන යෙදවුම, API gateway සංවර්ධනය, සහ නව මධ්‍යගත බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම වැනි ඩිජිටල් බැංකු වේදිකාවල සැලකියයුතු ආයෝජන සිදුකර ඇත.
- **සේවක සංවර්ධනය:** බැංකුව තාක්ෂණික වර්ධනයන් සහ වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා සඳහා අනුවර්තනය විමට සිය ශ්‍රමබලකාය පුහුණුව කෙරෙහි අවධානය යොමු කරන ලදි. සේවකයින් උසස් තත්ත්වයේ සේවාවක් ලබාදීමට මනාව සන්නද්ධ කර ඇති බව මෙයින් සහතික කරයි.

## 2024 සඳහා උපායමාර්ගික වැඩසටහන්

- "NSB රන් තෙමස" වැඩසටහන උකස් ගනුදෙනුකරුවන්ට ආකර්ශණීය ත්‍යාග ලබාදෙමින් බැංකුවේ උකස් සේවාව ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදී.
- සිය ණය කළඹ විවිධාංගීකරණය කිරීමට සහ විදේශිය ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීමට, සංක්‍රමණික සේවකයින් සඳහා විශේෂයෙන් සැලසුම්කරන ලද දේපල උකස් ණය බැංකුව හඳුන්වාදෙන ලදි,
- කාලීන ණය වැඩසටහනක් වන, උත්සව අවස්ථාව තුළ ගනුදෙනුකාර අවශ්‍යතා ලබාදීම සඳහා උපායමාර්ගිකව "උත්සව අත්තිකාරම් ණය යෝජනා ක්‍රමය" දියත් කරන ලදි.
- ප්‍රවේශය සහ මෙහෙයුම් කර්යක්ෂමතාව වැඩි කිරීමට තැපැල් කාර්යාල වෙත ජංගම උපාංග 20ක් සේවයේ යොදවමින් බැංකුව සිය ෘජුදීම නිෂ්පාදනය දියත් කරන ලදි.
- බැංකු මෙහෙයුම් ක්‍රමවත් කරමින් හා සේවා ලබාදීම වර්ධනය කරමින් T24 මධ්‍යගත බැංකුකරණ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.
- විශේෂිත ආකර්ෂණීය ප්‍රතිලාභ සමගින් දිගු කාලීන ඉතුරුම් විසඳුමක් පිරිනමමින් "අභිමන් සැමරුම්" ලෙස සන්නාම කළ මාස 24ක ස්ථිර තැන්පතු යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදි.
- පුනර්ජනනීය බලශක්තිය සහ තිරසාර සංවර්ධන උත්සාහයන් වැඩි කිරීමට ගනුදෙනුකරුවන්ට සහයවීමට හේලීස් ෆෙන්ටන්ස් සමඟ සහයෝගයෙන් සූර්ය බලශක්ති ණය යෝජනා ක්‍රමයක් දියත් කරන ලදි.
- සිය 52 වන සංවත්සරය සැමරීම සඳහා, බැංකුව "සෙනෙහසේ දායාද" විශේෂ ප්‍රවර්ධන වැඩසටහන හඳුන්වා දුන්නේය. මෙම මුලපිරීමේ කොටසක් ලෙස, ළදරු වියේ සිට ඉතිරිකිරීමේ සංස්කෘතියක් පෝෂණය කරමින්, 2024 මාර්තු 16 සිට 31 දක්වා උපත ලැබූ සියලුම ළදරුවන් සඳහා රු. 2,000 ක මූලික තැන්පතුවක් සමඟ හපන් ළමා ඉතුරුම් ගිණුම් බැංකුව විවෘත කළේය.
- ගනුදෙනුකරුවන්ට වර්ධිත පිවිසීම සහ පහසුව ලබාදෙමින් සෙනසුරාදා දිනවල ශාඛා 39ක් විවෘත කරමින් සහ ඉරිදා දිනවල ශාඛා 7ක් විවෘත කරමින් තෝරාගත් ශාඛාවල සති අන්ත මෙහෙයුම් නැවත ආරම්භ කරන ලදි.

## මූල්‍ය සමාලෝචනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2024 රු. මි. | මුළු ගණනින් % |
|---|---|---|
| ශුද්ධ පොලී ආදායම | 47,861 | 65.8 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 38,090 | 58.5 |
| අංශයේ වත්කම් | 476,386 | 27.2 |
| අංශයේ වගකීම් | 1,557,461 | 94.2 |

වගුව 20

ණය හා අත්තිකාරම් ඇතුළුව පාරිභෝගික බැංකුකරණ අංශයේ තැන්පතු පසුගිය වසරවල ස්ථිර ඉහළ යාමක් පෙන්නුම් කර ඇත. පොලී ආදායම තුළ සුළු පහත වැටීමක් පෙන්නුම් කළ අතර, ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය හේතුවෙන් හානිකරණ වියදම් වැඩි වී ඇත. කෙසේ වෙතත්, බැංකුවේ පාරිභෝගික අංශය තුළ ඉදිරි වසර වර්ධනීය ගමනක් අපේක්ෂා කරයි.

**ශුද්ධ පොලී ආදායමට (NII) ප්‍රධාන දායකත්වය:**
පාරිභෝගික බැංකුකරණ අංශය යනු රු. බිලියන 47.86ක් ජනනය කරමින් බැංකුවේ පොලී ආදායමේ ප්‍රධාන දායකයා වන අතර මුළු ශුද්ධ පොලී ආදායමෙන් 65.8%කට ඉන් දායක වේ.

සිය පුළුල් පාරිභෝගික තැන්පතු පදනම තුළින් පොලී ඉපයීමේදී සහ විශේෂයෙන් නිවාස, උකස් හා පුද්ගල ණය ලබා දීමේදී අංශයේ මූලික කාර්යභාරය මින් තහවුරු කරයි.

**ගාස්තු ආදායමේ ප්‍රමුඛයා:**
පාරිභෝගික බැංකුකරණ අංශය බැංකුවේ මුළු ගාස්තු සහ කොමිස් ආදායමෙහි ඉහළම කොටස් දායකත්වය සපයයි. මෙයට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් ආදායම, කාඩ් සේවා සහ ඩිජිටල් බැංකුකරණ ගාස්තු සහ ගිණුම් පවත්වාගැනීම ඇතුළත් වන අතර, බැංකුවේ ඩිජිටල් සහ ගනුදෙනුමය සේවාවල ඵලදායිත්වය පිළිබිඹු කරයි. 2024 වසර සඳහා කාඩ් සහ ඩිජිටල් බැංකුකරණයේ ගාස්තු ආදායම තුළ 10%ක වැඩිවීමක් වාර්තා කරන ලදී.

**මධ්‍යස්ථ අනෙකුත් ආදායම:**
මෙම අංශය බැංකුවේ මුළු අනෙකුත් ආදායමෙන් 6.5% ක් සඳහා දායක විය. මෙයට අනුබද්ධ පාරිභෝගික දීමනා, ලබාදීම තුළින් ලැබෙන ආදායම, අයකිරීමේ ආදායම වන අතර ආදායම් මූලාශ්‍ර පුළුල් කිරීම සඳහා විභවය පෙන්නුම් කරයි.

**ශක්තිමත් මෙහෙයුම් කාර්යක්ෂමතාව:**
සිය විශාල පරිමාව හමුවේ, ශුද්ධ මෙහෙයුම් ආදායම රු. බිලියන 38.1ක් වූ අතර, එය ව්‍යාපාර අංශවල මුළු මෙහෙයුම් ආදායමෙන් 58.5%කින් සමන්විත වේ. පරිමාණය පදනම් මෙහෙයුම් හමුවේ ස්ථිර පිරිවැය සහ ආදායම් කළමනාකරණය මින් පෙන්නුම් කරයි.

**ශේෂ පත්‍ර බලපෑම:**
පාරිභෝගික බැංකුකරණ අංශය මුළු වත්කම්වලින් 27.2%ක් නියෝජනය කරන අතර, ණය කළඹ පුළුල් කිරීම සහ ඉතුරුම් සේවයේ යෙදවීම තුළ සිය මූලික කාර්යභාරය ඉන් සහතික කරයි. ඒ සමගම, එය මුළු වගකීම්වලින් සැලකියයුතු 94.2% කට දායක වන අතර, බැංකුවේ අරමුදල් ව්‍යුහය සඳහා තීරණාත්මක සාධකයක් වන තැන්පතු ගැනීම තුළ අංශයේ ප්‍රමුඛතාව පිළිබිඹු කරයි.

**2025 සහ ඉන් ඉදිරියට අනාගත දැක්ම**
2024 වසර සඳහා පාරිභෝගික ණය ලබාදීම් වලින් බහුතරය උකස් ණය සඳහා වූ අතර, පාරිභෝගික ණයදීමෙන් එය 29%කට දායක විය. අවශේෂ ආර්ථික බිඳවැටීම් හේතුවෙන්, පරිභෝජන ණය සඳහා ඉල්ලුම සමස්තයක් ලෙස ක්ෂේත්‍රය තුළ පහත වැටුණ අතර, බැංකුවේ පාරිභෝගික ණයදීමේ කළඹ 2%ක සුළු පහත වැටීමක් වාර්තා කර ඇත.

බැංකු ක්ෂේත්‍රය තුළ ඉතුරුම් සහ කාලීන තැන්පතුවල වෙළෙඳපොල කොටසින් 8.6% ක් බැංකුව විසින් දරනු ලබයි. මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය හරහා ඇති වූ පොලී අනුපාත කපාහැරීම් හමුවේ පාරිභෝගික බැංකුකරණ අංශය විසින් සංචලනය කරනලද ඉතුරුම් සහ කාලීන තැන්පතු 2024 දි 5%කින් වර්ධනය වී ඇත.

## 2025 සහ ඉන් ඉදිරියට අනාගත දැක්ම

| අවධානිත ක්ෂේත්‍රය | උපායාමර්ගික දිශානතිය |
|---|---|
| පරිපූර්ණ ඩිජිටල් පද්ධතියක් පවත්වාගෙන යාම | ඉතුරුම්, ගෙවීම් ආයෝජන සහ ණය ඒකාබද්ධ කරමින් ඒකීය ඩිජිටල් බැංකුකරණ පරිසර පද්ධතියක් දියත් කිරීම |
| දැරියහැකි නිවාස ණය ලබාදීම | රාජ්‍ය හා පුද්ගලික සංවර්ධකයින් සමග නිවාස මූල්‍යකරණ හවුල්කාරත්වයන් ශක්තිමත් කිරීම |
| කෘතීම බුද්ධිය හා විශ්ලේෂණ තුළින් වැඩිකළ පුද්ගලගතකරණය | පුරෝකථ්‍ය බැංකුකරණ මෙවලම් පිරිනැමීම සහ අධි-පුද්ගලගත නිෂ්පාදන නිර්දේශ කිරීම් |
| මූල්‍ය සාක්ෂරතාව සහ අන්තර්ගතභාවය තියුණු කිරීම | "Branch-on-Wheels" සහ තාරුණ්‍යය සවිබලගැනීමේ වැඩසටහන් පළාත් පුරා ක්‍රියාත්මක කිරීම |
| පාරිභෝගික බැංකුකරණ අංශයේ ලාභදායිතාව ප්‍රශස්තකරණය | හරස් විකුණුම් ශක්තිමත් කිරීම සහ ණය පැහැර හැරීමේ අනුපාත අඩු කිරීම සහ පොලී නොවන ආදායම් මාර්ග වර්ධනය. |

# ආයතනික බැංකුකරණ අංශය

GRI 203-1, 2

## අංශයේ පරමාර්ථ

බැංකුවේ ආයතනික බැංකුකරණ අංශය සෘජු ණය, ආයතන කිහිපයක් සමඟ ඒකාබද්ධ වී ණය ලබාදීම (Long Syndication), සිය ව්‍යාපාර චක්‍රය හා උපායමාර්ගික අරමුණු අනුව ගලපන ලද ණය විසඳුම් පිරිනමමින් විශාල ආයතන, බැංකු, මූල්‍ය ආයතන, සහ පරිපාලිත සමාගම් මෙන්ම රජයට අයත් ආයතන වෙත සහයවීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. මෙම අංශය ශක්තිමත් ණය අවදානම් කළමනාකරණය සහ වටිනාකම් නිර්මාණය සහතික කරන අතරම තීරණාත්මක බලශක්ති හා බලශක්ති ව්‍යාපෘති සහ විශාල සමාගම්වල ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මූල්‍යකරණය කිරීමෙන් ජාතික සංවර්ධනයට සිය දායකත්වය වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදු කළේය.

අංශයේ ප්‍රධාන පරමාර්ථවලට පහත දෑ ඇතුළත්ය:

- ගලපන ලද මූල්‍යකරණ ව්‍යුහයන් තුළින් ආයතනික සබඳතා ශක්තිමත් කිරීම.
- යටිතල පහසුකම්, පුනර්ජනනීය බලශක්තිය ආදිය සඳහා අංශීය නිරාවරණය වැඩි කිරීම.
- ව්‍යුහගත ණය දීම සහ ආයතනික මූල්‍යකරණය තුළින් ගාස්තු මත පදනම් වූ ආදායමක් ලබා ගැනීම.

## අප පිරිනමන දෑ

බැංකුවේ ආයතනික බැංකුකරණ නිමැවුම් ආයතනික සේවා දායකයින් සඳහා පහත දෑ ඇතුළුව විස්තීර්ණ සහ ගලපනලද මූල්‍ය සේවා ලබාදෙයි.

- **කාරක ප්‍රාග්ධන මූල්‍යකරණය:** කෙටි කාලීන ණය, චක්‍රීය ණය පහසුකම්
- **කාලීන ණයදීම:** ප්‍රාග්ධන වියදම සහ ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා මධ්‍ය සිට දිගුකාලීන ණය
- **ව්‍යුහගත මූල්‍යකරණය:** ආයතන කිහිපයක් සමඟ ඒකාබද්ධ වී ණය ලබාදීම සහ අවශ්‍යතා වලට ගලපන ලද මූල්‍යකරණ යෝජනා
- **රාජ්‍ය අංශයේ මූල්‍යකරණය:** රජ්‍ය ව්‍යවසාය සහ රාජ්‍ය ආයතන වෙත ණයදිම
- සුරැකුම්පත්කරණය, පෞද්ගලික නිකුතු සහ ණයකර වල ආයෝජනය

## බැංකුවට දායකත්වය

**30.3%**
ශුද්ධ මෙහෙයුම් ආදායම

**11.7%**
අංශයේ වත්කම්

**3.9%**
අංශයේ වගකීම්

## 2024 දී මෙහෙයුම් පරිසරය

| මෙහෙයුම් පරිසරය | බැංකුව කෙරෙහි බලපෑම |
|---|---|
| පශ්චාත් අර්බුද ආර්ථික ස්ථායිකරණය | ප්‍රාග්ධනය පුළුල් කිරීම සහ ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වැඩි වූ ණය ඉල්ලුම |
| පුනර්ජනනීය බලශක්තිය සහ යටිතලපහසුකම්වල වැඩිවන ඉල්ලුම | තිරසාර මූල්‍යකරණය තුළ නව ණයදීමේ අවස්ථා |
| **පොලී අනුපාත පහත වැටීම:** මහබැංකුවේ ප්‍රසාරණාත්මක මුල්‍ය ප්‍රතිපත්තිය මගින් ප්‍රතිපත්ති අනුපාත අඩු කිරීම. | දිගුකාලීන ණය ගැනීම දිරිමත් කිරීම සහ ණය ආපසු ගෙවීමේ චක්‍ර දිරිමත් කිරීම |
| නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා | ප්‍රශස්ථ අවදානම බර තබනලද වත්කම් වෙන් කිරීමේ අවශ්‍යතාව |

## ප්‍රධාන මූල්‍ය සිදුවීම්

### පොලී ආදායම

ප්‍රස්ථාර 13




ආයෝජනය
**රු.බි. 134**

නිකුත් කළ ණය සුරැකුම්
**රු.බි. 65**
174%

ණය හා අත්තිකාරම්
**රු.බි. 72**
19%

# ව්‍යාපාර අංශ සමාලෝචනය



## අංශයේ උපායමාර්ග, අවදානම සහ අවස්ථා මිනුම

| උපායමාර්ගික අවධානය | අවදානම් හා අවස්ථා | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| අංශ-විශේෂිත කළඹ විවිධාංගීකරණය | රාජ්‍ය අංශයට ණය සංකේන්ද්‍රණය වීමේ අවදානම | මහ බැංකුවේ උපදෙස් පරිදි නිරාවරණ සීමාවන් හඳුන්වා දීම සහ පුනර්ජනනීය බලශක්ති අංශයට විවිධාංගීකරණය වූ ණය නිරාවරණයක් හඳුන්වා දීම. |
| අවශ්‍යතා මත ගලපන ලද ආයතනික ණය ව්‍යුහගතකරණය | අවශ්‍යතා මත ගලපන ලද මූල්‍යකරණය තුළින් පශ්චාත් අර්බුද ප්‍රතිසාධනයට සහයවීමේ අවස්ථා | ව්‍යුහගත ණය නිෂ්පාදන සහ ආයතන කිහිපයක් සමග ඒකාබද්ධව ණය ලබාදීම |
| ESG-හා බැඳුණු ණය දීම | හරිත ආයෝජන සහ තිරසාරත්වය හා බැඳුණු ණය කරා අවස්ථාව. | ව්‍යාපෘති ඇගයීම් වලදී ESG හා බද්ධ සාධකයන් ඒකාබද්ධ කිරීම අඛණ්ඩව සිදු කිරීම |

## සම්පත් වෙන් කිරීම

ආයතනික බැංකුකරණ අංශය වත්කම්වලට 12%ක් දායක වූ අතර, වගකීම්වලට දායකත්වය 4%කි.

- **විශේෂිත සම්බන්ධතා කණ්ඩායම්:** විවිධ අංශ කේන්ද්‍ර කරගත් ආයතනික සබඳතා කළමනාකරුවන් මගින් වඩාත් වැදගත් ගනුදෙනුකරුවන් හඳුනාගැනීම
- **ණය අවදානම් ප්‍රවීනතාව:** පුහුණුව සහ පද්ධති සහාය තුළින් කර්මාන්ත-විශේෂිත අවදානම් තක්සේරුව ශක්තිමත් කිරීම.
- **අලෙවිකරණය සහ ප්‍රචාරණය:** ආයතනික සේවාදායකයින් ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම සඳහා ඉලක්කගත වැඩසටහන් සඳහා සම්පත් යොමු කරන ලද අතර විශ්වාසදායක සහ නව්‍යකරණ මූල්‍ය විසඳුම් ලබා දීමේදී බැංකුවේ ප්‍රවීනතාව අවධාරණය කිරීම.

## 2024 සඳහා උපායමාර්ගික මුලපිරීම්

- ප්‍රධාන බැංකුව සහ භාරකරු ලෙස සාර්ථකව කටයුතු කරමින්, බැංකුව "Windscape Mannar" යන සන්නාමය යටතේ "Ceylex" පුනර්ජනනීය සුළං බලශක්ති සුරැකුම්කරණයක් අවසන් කළේය.

  ක්‍රියාවලි ක්‍රමවත් කරමින් ආයතනික ණය මෙහෙයුම් කළමනාකරණය තුළ කාර්යක්ෂමතාව වැඩි කරමින් ප්‍රධාන බැංකු පද්ධතියේ ආයතනික ණය මොඩියුලය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.
- ආයතනික ණය අනුමත කිරීම් සඳහා බලතල මට්ටම් පැවරීම ඉහළ නංවන ලද අතර, වඩා ඉහළ මෙහෙයුම් කාර්යක්ෂමතාව අත්කර ගැනීම සඳහා ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ප්‍රශස්ත කර කඩිනම් කිරීම.

## මූල්‍ය සමාලෝචනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2024 රු. මි. | මුළු ගණනින් % |
|---|---|---|
| ශුද්ධ පොළී ආදායම | 19,624 | 27.0 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 19,721 | 30.3 |
| අංශයේ වත්කම් | 205,653 | 11.7 |
| අංශයේ වගකීම් | 65,162 | 3.9 |

**ශුද්ධ පොළී ආදායමට ශක්තිමත් දායකත්වය:** ආයතනික බැංකු අංශය රුපියල් බිලියන 19.62 ක ශුද්ධ පොළී ආදායමක් උපයා ඇති අතර එය බැංකුවේ සමස්ත ශුද්ධ පොළී ආදායමට සැලකිය යුතු 27.0% ක දායකත්වයක් සපයයි. මෙම ශක්තිමත් කාර්ය සාධනය ණය පහසුකම්වල ඵලදායී මිලකරණය, ප්‍රශස්ත වත්කම්-වගකීම් කළමනාකරණය සහ ආයතන ඉලක්ක කරගත් වැඩිදියුණු කළ අවදානම්-පාදක ණය දීමේ පිළිවෙත් පිළිබිඹු කරයි.

**මධ්‍යස්ථ පොලී නොවන ආදායම:** ගාස්තු සහ කොමිස් ආදායම මුළු අංශයේ ආදායමෙන් සාපේක්ෂව කුඩා කොටසක් නියෝජනය කළේය. මෙහි මධ්‍යස්ථ ඉහළ යාමක් පිළිබිඹු කරන අතර, ව්‍යුහගත ගාස්තු පදනම් කරගත් නිෂ්පාදන සහ හරස් විකුණුම් අවස්ථාවල වර්ධනය සඳහා ඉඩක් යෝජනා කරයි.

**වෙනත් ආදායම් පහත වැටීම:** මෙම අංශය සෘණාත්මක වෙනත් ආදායම් වාර්තාකළ අතර, ආයතනික නිරාවරණයන්ට බැඳුණු ප්‍රතිපාදන ගැලපීම් හේතුවෙන් ඇතිකළ අලාභ සංරචකයක් පෙන්වයි.

**මෙහෙයුම් ආදායම හා වත්කම් කොටස:** අනෙකුත් ආදායම් පහත වැටීමක් තිබියදීත්, ආයතනික බැංකුකරණය ශක්තිමත් මෙහෙයුම් පදනමක් පවත්වා ගෙන ගිය අතර, මෙහෙයුම් ආදායමෙන් රුපියල් බිලියන 19.72 ක් වාර්තා කළ අතර එය මුළු අංශ ලාභදායිතාවයෙන් 30% කි. මෙම අංශය රුපියල් බිලියන 205.7 ක වත්කම් කළමනාකරණය කරන අතර එය මුළු වත්කම්වලින් 11.7% ක් වන අතර එය හීර් හි ශේෂ පත්‍ර මිශ්‍රණය තුළ එහි වර්ධනය කිරීමේ වැදගත්කම අවධාරනය කරයි.

**කාර්යක්ෂම වගකීම් කළමනාකරණය:** අංශය යටතේ වගකීම් රු. බිලියන 65.16ක් වූ අතර, බැංකුවේ මුළු වගකීම්වලින් 3.9%ක් පමණක් එය නියෝජනය කරයි. අරමුදල් බැඳීම්වලට අදාළ ශක්තිමත් වත්කම් උත්පාදනය මින් පෙන්නුම්කරන අතර ආයතනික ණය මෙහෙයුම් සඳහා මධ්‍යම හෝ භාණ්ඩාගාර මට්ටමේ අරමුදල්කරණය පිළිබඳ ඔරොත්තුදීම සලකුණු කරයි.

## 2025 සහ ඉන් ඉදිරියට අනාගත දැක්ම

| අවධානිත ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය |
|---|---|
| තාක්ෂණික ඒකාබද්ධකරණය | ආයතනික බැංකු මෙහෙයුම් විධිමත් කිරීම සහ සේවාදායක අත්දැකීම් වර්ධනය කිරීම සඳහා ඩිජිටල් වේදිකා වැඩිදියුණු කිරීම. |
| අවදානම් කළමනාකරණය | ණය ඇගයීම සඳහා වන රාමු ශක්තිමත් කිරීම සහ වෙළෙඳපොළ අනුපාත මත පදනම් වූ මිල සුරැකුම්කරණ පහසුකම් සඳහා ගණිතමය ආකෘති යොදා ගැනීම සහ කළඹ ස්ථාවරත්වය සහතික කිරීම තුළින් අවදානම් අවම කිරීම. |
| නිෂ්පාදන නව්‍යකරණය | වෙනස්වන සේවාදායක අවශ්‍යතා සපුරාලීම සඳහා තිරසාර මූල්‍ය විසඳුම් ඇතුළුව ගලපන ලද මූල්‍ය නිෂ්පාදන සංවර්ධනය කිරීම. |
| සේවකයන් ප්‍රවර්ධනය | සංකීර්ණ ගනුදෙනු සඳහා අවශ්‍ය ප්‍රවීනතාවයෙන් කාර්ය මණ්ඩලය සන්නද්ධ කිරීම සඳහා උසස් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| තිරසාර වැඩසටහන් | පරිසර හිතකාමී ආයතනික ආයෝජන සඳහා සහය වීම අරමුණු කරගෙන හරිත මූල්‍යකරණ විකල්ප පුළුල් කිරීම. |
| වෙළෙඳපොළ ව්‍යාප්තිය | සේවාදායක පදනම විවිධාංගීකරණය කිරීම සහ ලාභදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා අඩුවෙන් විනිවිදගිය අංශ සහ කලාපවල වර්ධනය ඉලක්ක කර ගැනීම. |

වගුව 21

# ජාත්‍යන්තර බැංකුකරණ අංශය

## අංශයේ පරමාර්ථ

බැංකුවේ ජාත්‍යන්තර බැංකුකරණ අංශය දේශසීමා හරහා මූල්‍ය ප්‍රවාහ, විදේශීය ප්‍රේෂණ, ජාත්‍යන්තර වෙළෙඳ මූල්‍ය, සහ අනුරූප බැංකුකරණ සම්බන්ධතාවන්ට සහයවීමට බැංකුව උපායමාර්ගිකව ස්ථානගතකර ඇත. අංශයේ ඒකායන අරමුණ වන්නේ විදේශ විනිමය ශක්තිමත් කරමින් සහ ජාත්‍යන්තර මූල්‍ය අවශ්‍යතා සමඟ ගනුදෙනුකරුවන්ට සහයවෙමින් ගෝලීය වෙළෙඳපොළ සමඟ ශ්‍රී ලංකාවේ ආර්ථික ඒකාබද්ධතාවට පහසුකම් ඇති කිරීමයි.

2024 දී අංශය අවධානය යොමුකළ දෑ:

- ප්‍රේෂණ මාර්ග සහ අනුරූප බැංකු හවුල්කාරිත්වයන් වැඩි කිරීම.
- විදේශ මුදල් තැන්පතු සංචලනය සහ වෙළෙඳ මූල්‍ය සේවා පුළුල් කිරීම.
- ආරක්ෂිත සහ ප්‍රවේශවිය හැකි බැංකු විසඳුම් සමඟ විදේශගත ශ්‍රී ලාංකිකයින්ට සහාය වීම.
- ජාත්‍යන්තර මුදල් විශුද්ධිකරණයට විරෝධී ප්‍රමිතීන්ට (AML) අනුකූලතාව ශක්තිමත් කිරීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම් (CFT) මර්දනය කිරීමට සහාය වීම.

## අප පිරිනැමෙන දෑ

- **විදේශීය විනිමය ගිණුම්:** පුද්ගලික විදේශ විනිමය ගිණුම (PFCA), ව්‍යාපාර විදේශ විනිමය ගිණුම (BFCA), විශේෂ තැන්පතු ගිණුම (SDA) සහ USD, EUR, GBP, AUD, වලින් අභ්‍යන්තර ආයෝජන ගිණුම (IIA)
- **අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ:** SWIFT සහ ඩිජිටල් මාර්ග හරහා ප්‍රේෂණ හවුල්කරුවන්
- **විදේශ විනිමය:** විදේශ විනිමය හුවමාරුව, ආනයන ණයවර ලිපි නිකුතුව, ආනයන බිල්පත් පිරිසැකසුම සහ නෞභාර හා ගුවන් ගැල්කුලිය නිකුත් කිරීම.
- **අනුරූප බැංකු සේවා:** බහු මුදල් ගනුදෙනු සඳහා ගෝලීය හවුල්කාරත්වයන්.

## බැංකුවට දායකත්වය

**3.2%**
ශුද්ධ මෙහෙයුම් ආදායම

**1.0%**
අංශයේ වත්කම්

**1.6%**
අංශයේ වගකීම්

## 2024 දී මෙහෙයුම් පරිසරය

| මෙහෙයුම් පරිසරය | බැංකුව කෙරෙහි බලපෑම |
|---|---|
| ආර්ථික අවිනිශ්චිතතාවය ගනුදෙනුකරුවන් රජයේ බැංකු වෙත යොමු කරයි. | ආයෝජන සහ තැන්පතු සංචලනය ඉහළ නංවමින් විශ්වාසදායක රජයේ බැංකුවක් ලෙස බැංකුව සඳහා ඇති කැමැත්ත වැඩි වීම. |
| ශ්‍රී ලංකාවෙන් ඉහළ සේවක සංක්‍රමණය | විදේශ විනිමය සංචිත සහ තැන්පතු පරිමාවන් වැඩි කරමින් අභ්‍යන්තර ප්‍රේෂණ වැඩි වීම |
| විදේශ අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම | බාහිර ප්‍රේෂණවල වර්ධනය, සිසුන් සඳහා ඉලක්කගත මූල්‍ය නිෂ්පාදන සඳහා ඉල්ලුමක් ඇති කිරීම. |
| දේශීය සංචාරක ව්‍යාපාරයේ වර්ධනය | ප්‍රේෂණ වෙළෙඳපොළ සඳහා ධනාත්මක සංඥා, සංචාරක ව්‍යාපාරයට අදාළ මූල්‍ය සේවාවන්හි විභව පෝෂණය කිරීම |
| ප්‍රමුඛ රටවල ගෝලීය ප්‍රේෂණ වෙළෙඳපොළ අවස්ථා | අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ සේවා වැඩිකිරීමට සහ ජාත්‍යන්තරව තැන්පතු සේවයේ යෙදවීමට අවස්ථාව. |
| ජාත්‍යන්තර ප්‍රේෂණ සඳහා ශ්‍රී ලංකා තැපැල් සේවය සමඟ සහයෝගීතාවය | වැඩිදියුණු කළ ප්‍රවේශ්‍යතාව තුළින් විවිධ ජනවිකාස මට්ටම් හරහා පාරිභෝගික සහභාගීත්වය පුළුල් කිරීම |

## ප්‍රධාන මූල්‍ය සිදුවීම්

### පොලී ආදායම

වගුව 14




බැංකුවල ඇති තැන්පතු
**රු.බි. 15**
34% ↓

තැන්පතු
**රු.බි. 25**
6% ↓

## අංශයේ උපායමාර්ග, අවදානම සහ අවස්ථා මිනුම

| උපායමාර්ගික අවධානය | අවදානම් හා අවස්ථා | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම | ගෝලීය ශ්‍රම වෙළඳපොළවල, අස්ථාවරත්වය, නියාමන දැඩි කිරීමේ ප්‍රවනතාවය | බැංකුවේ නියෝජිතයන් හරහා විනිමය ආයතන සමඟ සබඳතා වැඩිදියුණු කිරීම හා විදේශ ප්‍රේෂණ වෙළෙඳපොළ ග්‍රහනය කර ගැනීම |
| සම්බන්ධිත බැංකු සබඳතා පුළුල් කිරීම | විදේශීය බැංකු මඟින් අවදානම් ඉවත් කිරීමේ අවදානම | ප්‍රධාන අනුරූප සබඳතා පවත්වා ගැනීම සඳහා අවදානම් ශ්‍රේණිගත කිරීමේ මිනුම් සහ අනුකූලතා විනිවිදභාවය වැඩිදියුණු කිරීම |
| දේශීය වෙළෙඳපොළ විනිවිදයාම ශක්තිමත් කිරීම | පෞද්ගලික බැංකුවලින් වර්ධනය වන තරඟකාරිත්වය, දිවයින පුරා ශාඛා ජාලයෙන් ප්‍රයෝජන ගැනීමට අවස්ථාව. | ශාඛා මට්ටමේ ඩිජිටල් විසඳුම් සහ පාරිභෝගික කේන්ද්‍රීය සම්බන්ධතා වැඩසටහන් හරහා ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීම. |
| ගනුදෙනුකාර අත්දැකීම් වැඩි කිරීම | බාධාවකින් තොර ඩිජිටල් සහ පුද්ගලාරෝපිත බැංකු සේවා සඳහා ගනුදෙනුකාර අපේක්ෂාවන් ඉහළ යාම. | දියුණු ඩිජිටල් වේදිකා ක්‍රියාත්මක කිරීම. |
| අවදානම් අවම කිරීමේ රාමුව වර්ධනය කිරීම | ඉහළ ගිය ණය අවදානම් සහ මුදල් උච්චාවචනයන් | නිරාවරණය අවම කිරීම සඳහා දියුණු අවදානම් විශ්ලේෂණ සහ සක්‍රීය නියාමන පද්ධති සේවයේ යෙදවීම. |

## සම්පත් වෙන් කිරීම

ජාත්‍යන්තර බැංකු අංශය බැංකුවේ වත්කම්වලින් 1.0%කට සහ අංශයේ වගකීම්වලින් 1.6%කට දායක විය.

- **තාක්ෂණික ආයෝජන:** නව මධ්‍යගත බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
- **අනුකූලතාව වැඩි කිරීම:** ජාත්‍යන්තර ගනුදෙනු සඳහා විස්තරාත්මක අනුකූලතා වාර්තාකරණ යාන්ත්‍රණ සංවර්ධනය වඩා ඉහළ විනිවිභාවය ලබාදෙන අතර කීර්තිනාම අවදානම අවම කරයි.
- **මානව ප්‍රාග්ධන සංවර්ධනයන්:** අඛණ්ඩ නිපුනතා ඉහළ දැමීමේ වැඩසටහන් මඟින් වැඩිකළ ජාත්‍යන්තර බැංකු සේවා ලබාදීමේදී නවීන තාක්ෂණික වේදිකාවල වාසිය ලබා ගැනිමට සේවකයින් සන්නද්ධ කරයි.
- **ගනුදෙනුකාර කේන්ද්‍රීය මුලපිරීම්:** විදේශයන් හී පත්කළ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් හරහා ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදි.
- 2024 දෙසැම්බර් 31 දිනට, අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ පවුල් වෙත මුදල් ආපසු යැවීම සඳහා හුවමාරු මධ්‍යස්ථාන 28ක් සහ අනුරූප බැංකු 12ක් සමඟ බැංකුව සම්බන්ධ විය.

## මූල්‍ය සමාලෝචනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2024 රු. මි. | මුළු ගණනින් % |
|---|---|---|
| ශුද්ධ පොළී ආදායම | 1,859 | 2.6 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 2,059 | 3.2 |
| අංශයේ වත්කම් | 17,057 | 1.0 |
| අංශයේ වගකීම් | 26,007 | 1.6 |

වගුව 22

2024 දී, බැංකුවේ ජාත්‍යන්තර බැංකුකරණ අංශය සිය මායිම් හරහා මූල්‍ය සේවා, ප්‍රේෂණ ගලාඒම්, සහ විදේශ විනිමය මෙහෙයුම්වල සිය පහසුකම් සලසන කාර්යභාරය සමඟ බැඳුණු සුවිශේෂි මෙන්ම උපායමාර්ගිකව අදාළ කාර්යසාධනය ලබා දී ඇත. වත්කම් හා වගකිම් දායකත්වය අනුව සාපේක්ෂව කුඩා වුවද, මෙම අංශය බැංකුවේ විවිධාංගීකරණය හා විනිමය හුවමාරු ද්‍රවශීලතා උපායමාර්ගත සඳහා තීරණාත්මකව වේ.

**ශුද්ධ පොළී ආදායම** රු. මිලියන 1.859 ක් වූ අතර, බැංකුවේ මුළු ශුද්ධ පොළී ආදායමෙන් 2.6%කට දායක විය. ජාත්‍යන්තර ණයදීම, විදේශ තැන්පතු ස්ථාපන, Nostro ගිණුම් තුළින් මූලිකවම උපයන ලද ආදායම මින් පිළිබිඹු කරයි.

ප්‍රේෂණ සේවා, SWIFT – ආශ්‍රිත අයකිරීම් සහ අනුරූප බැංකු ගාස්තු වලින් **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** මූලිකවම ලබා දෙන ලදි.

මෙම අංශයේ **වෙනත් ආදායම** බැංකුවේ මුළු වෙනත් ආදායමෙන් 8.3%ක් නියෝජනය කර ඇත. මෙම අනුපාතයෙන් විදේශ විනිමය ගනුදෙනු සහ සීමා හරහා බැංකු මෙහෙයුම්වලින් පොළී නොවන ආදායමේ වැදගත්කම ඉස්මතු කරයි.

**ශුද්ධ මෙහෙයුම් ආදායම** රු. මිලියන 2.059ක් වාර්තා කළ අතර, මුළු ආදායමෙන් 3.2%කට එය දායක විය. මේ තුළින් අංශයේ අඩු පිරිවැය ව්‍යුහය තුළින් ඇතිකළ යහපත් මෙහෙයුම් ආන්තිකයක් පිළිබිඹු කරයි.

මෙම අංශයේ **වත්කම්** වල වටිනාකම රු. මිලියන 17,057ක් වූ අතර මුළු බැංකු වත්කම්වලින් 1.0%ක අවම දායකත්වයක් දැක්වූ අතර එය මෙම අංශයේ සීමිත වත්කම් සමඟින් තීව්‍ර මෙහෙයුම් අවධාරණය කරයි.

**වගකීම්** රු. මිලියන 26.007ක් (මුළු වගකීම්වලින් 1.6%ක්) වූ අතර, එය ප්‍රධාන වශයෙන් විදේශ විනිමය බැදීම් සහ ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ ශේෂවලින් සමන්විත වේ.

ආර්ථික කුණාටු මධ්‍යයේ වුවද, අපගේ කීර්තිමත් බැංකුව කෙරෙහි FC තැන්පතු හිමියන් තබා ඇති විශ්වාසය නොවෙනස්ව පවතී. පසුගිය වසර කිහිපය තුළ සීමිත ප්‍රවර්ධන අයවැයක් හේතුවෙන් ජාත්‍යන්තර ව්‍යාපාරවලින් ලැබෙන ඉපැයීම් ද එකතැන නැවතී තිබිනි.

### 2025 වසර සහ ඉන් ඉදිරි දැක්ම

| අවධානිත ක්ෂේත්‍ර | උපායමාර්ගික දිශානතිය |
|---|---|
| වෙළෙඳපොල විනිවිදයාම | විනිමය ආයතන සමඟ නව හවුල්කාරිත්වයන් ඇති කිරීම, විනිමය ආයතන සහ බැංකු සමඟ උපායමාර්ගික ගිවිසුම්වලට එළඹීම, දේශසීමා ප්‍රේෂණ සේවා විධිමත් කිරීම සහ මෙහෙයුම් ප්‍රවේශය පුළුල් කිරීම සඳහා සහයෝගීතාව වැඩි දියුණු කිරීම. |
| පහසුව වැඩි කිරීම, හුවමාරු ක්‍රමවත් කිරීම සහ වෙළෙඳපොල ලඟාවීම පුළුල් කිරීම | බාධාරහිත, ආරක්ෂිත සහ කාර්යක්ෂම හරස් මායිම් ගනුදෙනු පිරිනමන පරිශීලකයින්ට පහසුකම ඇති කිරීමට සැලසුම් කළ විශේෂ ප්‍රේෂණ යෙදුමක් නිර්මාණය ප්‍රවේශ්‍යතාව වැඩිකළ අතර ජාත්‍යන්තර ප්‍රේෂණ කළමනාකරණය සඳහා ඩිජිටල් අත්දැකීම ක්‍රමවත් කරන ලදි. |

## භාණ්ඩාගාර හා ගනුදෙනු අංශය

### අංශයේ පරමාර්ථ

භාණ්ඩාගාර හා ගනුදෙනු අංශය බැංකුවේ මූල්‍ය දිරිමත් මධ්‍යස්ථානය ලෙස සේවය කරන අතර, ද්‍රවශීලතාව, පොලී අනුපාත ස්ථානගත කිරීම විදේශ විනිමය සංචිත සහ ආයෝජන කළඹ ප්‍රශස්ත අයුරින් කළමනාකරණය පිළිබඳ අවධානය යොමු කරයි. එහි මූලික රාජකාරිය වන්නේ බැංකුයේ ආයෝජනවල ඉපැයීම් වර්ධනය කිරීම වන අතර නියාමන අනුකූලතාව, වෙළෙඳපොල අවදානම් අවම කිරීම, සහ වඩා පුළුල් මූල්‍ය පද්ධතිය සඳහා ක්‍රමානුකූල ද්‍රවශීලතා සහය සහතික කරයි.

අංශයේ ප්‍රධාන පරමාර්ථවලට පහත දෑ ඇතුළත්ය:

- රජයේ සහ ඉහළ ශ්‍රේණියේ ණය උපකරණවල අතිරික්ත අරමුදල් උපායමාර්ගිකව යෙදවීම තුළින් ප්‍රතිලාභ උපරිම කිරීම.
- වෙළෙඳපොළ උච්ඡාවචනය හමුවේ යහපත් විදේශ විනිමය ද්‍රවශීලතා කළමනාකරණය සහතික කිරීම.
- එලදා වක්‍රය ස්ථානගත කිරීම සහ පොලී අනුපාත හෙජින් කිරීම හරහා බැංකුවේ වත්කම්-වගකීම් කළමනාකරණ (ALM) උපාය මාර්ගයට සහාය වීම.
- ප්‍රාථමික සහ ද්විතීයික රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළවල බැංකුවේ වෙළෙඳපොළ නිර්මාණ ධාරිතාව ශක්තිමත් කිරීම.

### 2024 තුළ මෙහෙයුම් පරිසරය

| අභියෝග හා ප්‍රවණතා | බැංකුව කෙරෙහි බලපෑම |
|---|---|
| පොලී අනුපාත පරිසරය පහත වැටීම | ස්ථිර ආදායම් සුරැකුම්පත් වෙළෙඳපොල අගයට ගැලපීමේ අවස්ථාවන් |
| විනිමය අනුපාතික අගය ඉහළයාම හා අස්ථාවරත්වය | විදේශ විනිමය ප්‍රත්‍යාගණනය වන නමුත් පරතරය අඩුවීම |
| රජයේ ණය ප්‍රතිව්‍යුහගත වැඩසටහන | දේශිය බැඳුම්කර වෙළෙඳපොල තුළ වර්ධනය වූ ආයෝජක හැඟීම |

## අප පිරිනමන දෑ

- **රජයේ සුරැකුම්පත් වෙළෙඳාම:** භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ප්‍රාථමික අලෙවි නියෝජිතභාවය.
- **ස්ථාවර ආදායම් ආයෝජන කළමනාකරණය:** ශුන්‍ය අවදානම් සහිත ස්වෛරී සුරැකුම්පත් කළඹ
- **ස්කන්ධ ආයෝජන:** ස්කන්ධ සුරැකුම්පත් වෙළෙඳාම සහ ආයෝජනය
- **විදේශ විනිමය කළමනාකරණය:** ප්‍රධාන මුදල් වර්ගවල spot, forward, swap ගනුදෙනු.
- **ද්‍රවශීලතා සහ පොලී අනුපාත අවදානම් කළමනාකරණය:** මුදල් ප්‍රවාහ පුරෝකථනය, කාලසීමා ගැලපීම සහ හෙජින් උපකරණ
- **අන්තර් බැංකු වෙළෙඳපොළ සහභාගිත්වය:** ප්‍රති මිලදී ගැනීමේ/විකිණීමේ ගිවිසුම
- **අරමුදල් රැස් කිරීම:** ප්‍රශස්ත මූල්‍ය ස්ථායිතාව සහ සම්පත් ලබා ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා බැංකුවේ ද්‍රවශීලතා අවශ්‍යතා සමග උපායමාර්ගිකව පෙළගැස්වූ, ණයකර සහ බැඳුම්කර නිකුත් කිරීම හරහා අරමුදල් රැස් කිරීමේ මුලපිරීම් සිදු කිරීම.

## බැංකුවට දායකත්වය

**8.0%**
ශුද්ධ මෙහෙයුම් ආදායම

**58.3%**
අංශයේ වත්කම්

**0.04%**
අංශයේ වගකීම්

## අංශයේ උපායමාර්ග, අවදානම සහ අවස්ථා මිනුම

| උපායමාර්ගික අවධානය | අවදානම් සහ අවස්ථා | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| ආයෝජන කළඹේ ඉපයීම් ප්‍රශස්ත කිරීම | නැවත ආයෝජන ප්‍රතිලාභ අඩු කරන පොලී අනුපාත පහත වැටීමේ අවදානම. | නැවත සකස් කළ කළඹ කාල සීමාව සහ නැවත සමතුලිත කළ ඵලදා වක්‍ර. |
| විදේශ විනිමය ගනුදෙනු සහ වෙළඳාම ශක්තිමත් කිරීම | තියුණු මුදල් විනිමය අනුපාත විචලනයන්ගෙන් ඇති වන අවදානම; හිමිකාර වෙළෙඳ ලාභ සඳහා අවස්ථාව. | ක්‍රමාංකනය කරන ලද විදේශ විනිමය ස්ථාන සීමාවන් සහ ගනුදෙනුකාර පරිවර්තන සඳහා වැඩිදියුණු කළ මිලකරණය. |
| ද්‍රවශීලතා කළමනාකරණ මෙවලම් තියුණු කිරීම | නොගැලපෙන කල්පිරීම් හෝ ද්‍රවශීලතා කවුළු අවදානම. | වැඩිදියුණු කළ කෙටිකාලීන ද්‍රවශීලතා පුරෝකථනය සහ ALM අවධානය. |
| අවදානම්-ගැලපුම් ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම | ප්‍රශස්ත භාණ්ඩාගාර මුසුව තුළින් ශුද්ධ පොලී ආදායම වර්ධනය කිරීමේ අවස්ථාව. | සක්‍රීය ඵලදා සහ කාලසීමා කළමනාකරණය සඳහා අවදානම් මත පදනම් වූ වත්කම් හා වගකීම් කළමනාකරණ උපාය මාර්ග යොදා ගැනීම. |

## සම්පත් වෙන් කිරීම

2024 සඳහා භාණ්ඩාගාර හා ගනුදෙනු අංශය බැංකුවේ වත්කම් වලින් 58.3%කට සහ වගකීම්වලින් 0.04%කට දායක විය.

- **තාක්ෂණික ආයෝජනය:** තත්‍ය-කාලීන ස්ථාන නිරීක්ෂණය සහ වර්ධිත අනුකූලතාව සඳහා ණය භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (TMS) හඳුන්වාදෙන ලදි.
- **නිපුනතා සංවර්ධනය:** බහු-වත්කම් පන්ති කළමනාකරණ ප්‍රවීනතාවය සහ හරස්-කාර්යය තීරණ ගැනීමේ කඩිසරකම වර්ධනය කිරීම සඳහා ව්‍යුත්පන්න මිලකරණය, සාර්ව ආර්ථික ආකෘති නිර්මාණය සහ ගෝලීය වෙළෙඳපොළ විශ්ලේෂණය ALM හරහා කාර්ය මණ්ඩල වටමාරුව, විදේශ විනිමය, ස්ථාවර ආදායම් සහ මුදල් වෙළෙඳපොළ පිළිබඳ කාර්ය මණ්ඩලය ඉහළ කුසලතා ඇති කිරීම.
- **යටිතලපහසුකම් උසස් කිරීම:** නිරවුල් කිරීමේ කාර්යක්ෂමතාව සහ ප්‍රතිපාර්ශව කළමනාකරණය වර්ධනය කරමින් මහ බැංකුවේ RTGS සහ LankaSecure වේදිකා සමග සම්බන්ධතාව වැඩි කිරීම.

## ප්‍රධාන මූල්‍ය සිදුවීම්

### පොලී ආදායම

ප්‍රස්ථාරය 15




ආයෝජන
**රු. බි. 980**
10%

## අවදානම හා අනුකූලතාව ශක්තිමත් කිරීම

- අභ්‍යන්තර අවදානම් වටිනාකම් රාමුව සහ පීඩන පරීක්ෂණ හා බැඳුණු වැඩිකළ වෙළෙඳපොල අවදානම් උපකරණ පුවරුව ක්‍රියාත්මක කරන ලදි.
- සීමිත ශාඛාවල රඳා පැවැත්ම, අවදානම බරතබන ලද වත්කම් ප්‍රශස්තකරණය, සහ ලාභාලාභ ආරෝපනය සඳහා භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලයේ කාර්යයන් ශක්තිමත් කරන ලදි.

## මූල්‍ය සමාලෝචනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2024 රු. මි. | මුළු ගණනින් % |
|---|---|---|
| ශුද්ධ පොළී ආදායම | 3,438 | 4.7 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 5,189 | 8.0 |
| අංශයේ වත්කම් | 1,022,223 | 58.3 |
| අංශයේ වගකීම් | 738 | 0.04 |

වගුව 23

2024 දී, බැංකුවේ භාණ්ඩාගාර හා ගනුදෙනු අංශය බැංකුවේ සමස්ත ලාභදායිතාවයට හා වත්කම් ව්‍යුහයට සැලකියයුතු දායකත්වයක් සිදුකර ඇති අතර, ද්‍රවශීලතා කළමනාකරණය, ආයෝජන කළඹ මෙහෙයවීම, සහ විදේශ විනිමය වෙළෙඳාම තුළ සිය ප්‍රධාන කාර්යයන් ඉන් පිළිබිඹු කරන ලදි. මෙම අංශය විශේෂයෙන් වෙළෙඳපොල සංවේදී මෙහෙයුම් හා කාර්යක්ෂම වත්කම් යෙදවීමේ උපායමාර්ග තුළින් ප්‍රධාන ආදායම් උත්පාදකයෙක් ලෙස මතු විය.

- **ශුද්ධ පොළී ආදායම:** රු. මිලියන 3,438ක් වූ අතර, එය බැංකුවේ මුළු ශුද්ධ පොළී ආදායමෙන් 4.7%ක් නියෝජනය කරයි. මෙම ආදායම ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්, මුදල් වෙළෙඳපොල ස්ථාපන සහ පොළී අනුපාත ස්ථානගත කිරීම තුළින් ව්‍යුත්පන්න විය.
- **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම:** විදේශ විනිමය ගනුදෙනු, සහ ආයතනික ගනුදෙනු වැනි භාණ්ඩාගාරයට අදාළ ගනුදෙනුකාර සේවාවන්ගෙන් ප්‍රධාන වශයෙන් උපයන ලදි.
- **වෙනත් ආදායම** බැංකුවේ වෙනත් මුළු ආදායමෙන් 94.1%ක් සඳහා දායක විය. විදේශ විනිමය වෙළෙඳාම, සහ වෙළෙඳපොල ලාභ තුළින් පොළී නොවන ආදායම උත්පාදනයේදී අංශයේ ශක්තිය මින් පිළිබිඹු කරයි.
- **ශුද්ධ මෙහෙයුම් ආදායම:** රු. මිලියන 5,189 දක්වා ලඟා වූ අතර එය බැංකුවේ මුළු ශුද්ධ මෙහෙයුම් ආදායමෙන් 8.0%කි. එමගින් අඩු පිරිවැය ව්‍යුහයක් සමඟ අංශයේ ඉහළ ලාභදායිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉස්මතු කරයි.
- **අංශයේ වත්කම්** රු. මිලියන 1,022,223ක් වූ අතර, එය 58.3%ක් වන මුළු වත්කම්වලින් විශාලම කොටස නියෝජනය කරයි. ආයෝජන කළඹ, ද්‍රවශීලතා ස්වාරක්ෂක සහ වෙළෙඳ සුරැකුම්පත් ඇතුළුව වත්කම් වගකීම් කළමනාකරණය තුළ අංශයේ ප්‍රධාන කාර්යභාරය ඉන් පිළිබිඹු කරයි.
- **අංශයේ වගකීම්** රු. මිලියන 738ක අවමයක් වූ අතර, බැංකුවේ මුළු වගකීම්වලින් 0.04කට දායක විය. ණයගැනීම් සහ ගනුදෙනුකාර තැන්පතු මත අංශයේ සීමිත විශ්වාසය සහ අරමුදල්කරණයයට වඩා යෙදවීම පිළිබඳ සිය අවධානය මින් පෙන්නුම් කරයි.

## 2025 සහ ඉන් ඉදිරියට දැක්ම

| අවධානිත ක්ෂේත්‍ර | උපායමාර්ගික දිශානතිය |
|---|---|
| භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම | සියලුම භාණ්ඩාගාර මෙහෙයුම් වලදී සෘජු-සැකසුම්කරණය සාක්ෂාත් කර ගැනීම. |
| ප්‍රාථමික අලෙවි ක්‍රියාකාරිත්වය | බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ මෙහෙයුම් භාණ්ඩාගාරයට ඒකාබද්ධ කරමින් විශේෂිත ප්‍රාථමික අලෙවිකරු ඒකකයක් ලෙස ස්ථාපිත කිරීම. |
| විදේශ විනිමය වෙළෙඳපල පැවැත්ම | විදේශ විනිමය ගනුදෙනු කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකරුවන්ගේ සහභාගීත්වය වැඩි කිරීම සඳහා විදේශ විනිමය වෙළෙඳ වේදිකාවක් දියත් කිරීම. |
| අන්තර් බැංකු වෙළඳපොළ සහභාගීත්වය තියුණු කිරීම | මුදල් වෙළෙඳපොළ තුළ සක්‍රීය ද්‍රවශීලතා සැපයුම්කරුවෙකු සහ අනුපාත සකසන්නෙකු ලෙස කාර්යභාරය ශක්තිමත් කිරීම. |

# මූල්‍ය ප්‍රාග්ධනය



තිරසාර වර්ධනය සඳහා පදනමක්

## බැංකුව තුළ මූල්‍ය ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය එහි මෙහෙයුම් හා උපාය මාර්ගික දිශානතියේ පදනම සකස් කරයි. එය ගනුදෙනුකාර තැන්පතු, ණයගැනීම්, රඳවාගත් ඉපැයීම්, සහ තැන්පතුවලින් සමන්විත වන අතර, ද්‍රවශීලතාව, ඵලදායී අවදානම් කළමනාකරණය, සහ තාක්ෂණය සහ නව්‍යකරණය තුළ ආයෝජනය කිරීමේ හැකියාව සවිබල ගන්වයි. මෙම ශක්තිමත් ප්‍රාග්ධන පදනම වර්ධනය හඹායාමට, මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීමට සහ අපගේ පාර්ශවකරුවන්ට දිගුකාලීන වටිනාකම ලබාදීමට අපව ශක්තිමත් කරයි.**

### අපගේ අවධානය

තිරසාර වර්ධනයට සහයවන ශක්තිමත් සහ ඔරොත්තුදෙන මූල්‍ය පදනමක් ගොඩනැගීමට අපි කැපවී සිටිමු. විචක්ෂණ ද්‍රවශීලතා කළමනාකරණය හා කාර්යක්ෂම ප්‍රාග්ධන වෙන් කිරීම කෙරෙහි මෙන්ම ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වා ගැනීමට ගනුදෙනුකාර තැන්පතු, ණයගැනීම් හා රඳවාගත් ඉපයීම් අතර යහපත් සමබරතාවයක් පවත්වා ගැනීම කෙරෙහි අපගේ අවධානය යොමු වේ.



## මූල්‍ය ප්‍රාග්ධනය අපගේ උපායමාර්ගය හා සම්බන්ධ වන ආකාරය

- එය බැංකුවට නවීන තාක්ෂණය, නව්‍යකරණ සේවා සහ උපායමාර්ගික වර්ධන මුලපිරීම් තුළ ආයෝජනය කිරීමට හැකියාව ඇති කරන අතර, ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයේ අපව තබා ගැනීම සහතික කරයි.
- එය අවදානම් අවම කිරීමේ උපායමාර්ග ඉහළ දැමීමට, පාර්ශවකරුවන් අතර දිගුකාලීන ස්ථාවර්තවය සහ විශ්වාසය පෝෂණය කිරීමට සහය වේ.
- ශක්තිමත් ද්‍රවශීලතාව සහ විචක්ෂණ ප්‍රාග්ධන වෙන් කිරීම පවත්වා ගනිමින්, එය වෙළෙඳපොල වෙනස්වීම් තුළ ඉදිරියට යාමට සහ මතුවන අවස්ථා ග්‍රහනය කර ගැනිමට අපව සූදානම් කරයි.
- ස්ථාවර මූල්‍ය පදනමක්, ශක්තිමත් හවුල්කාරත්ව ගොඩනගා පවත්වා ගැනිමට, අපගේ පැවැත්ම පුළුල් කිරිමට සහ අපගේ සේවා පිරිනැමීම් වැඩි කිරිමට අපට ඉඩ ලබා දේ.

## අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට මූල්‍ය ප්‍රාග්ධනය සහයවන ආකාරය

මූල්‍ය ප්‍රාග්ධනය අපගේ වටිනාකම් නිර්මාණයට සහයවීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, එහිදි තිරසාර වර්ධනය ශක්තිමත් කිරිම, අවදානමට ඔරොත්තුදිම වැඩි කිරිම, ලාභදායිතාව මෙහෙයවිම සිදු කරයි. එය තැන්පතුහිමියන් ආරක්ෂා කරමින් සහ බැංකු පද්ධතිය තුළ විශ්වාශය රඳවා ගනිමින් අවදානම්වලට එරෙහිව ස්වාරක්ෂකයක් ලෙස කටයුතු කරයි.

## තිරසාර කර්යසාධනය කෙරෙහි මූල්‍ය ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රාග්ධනය යනු බැංකුවල තිරසාර කාර්යසාධනයේ ප්‍රධාන ධාවකයෙක් වන අතර, දිගුකාලීන ස්ථාවරත්වය, වගකිම් සහගත වර්ධනය, සහ ආර්ථික කම්පනවලට ඔරොත්තු දිම සහතික කරයි. මූල්‍ය ප්‍රාග්ධනය කාර්යක්ෂමව කළමනාකරණය කිරිම තුළින්, සියලූම පාර්ශවකරුවන් සඳහා කල්පවත්නා වටිනාකම් නිර්මාණය කරමින් පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අරමුණු සමඟ අපි ලාභදායිතාව සමඟ පෙළ ගැසෙමු.

## සම්බන්ධිත පාර්ශව



## ප්‍රමුඛ උපායමාර්ග සමඟ සම්බන්ධතාව

| | | | |
|---|---|---|---|
| ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව | ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය | අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරිම | තිරසාරභාවය |

## ප්‍රමාණාත්මක කරුණු

1. පරිවර්තනීය දේශපාලන විතැන්වීම
2. සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය
3. වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
4. මූල්‍ය තිරසාරභාවය

5. වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
7. කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය
10. නව තාක්ෂණික දියුණුව
15. පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

## SDGs ට දායකත්වය






## විභව්‍ය හුවමාරුකර ගැනීම

**මානව ප්‍රාග්ධනය** (−)
ලාභය උපරිම කිරීමට සේවක ශුභසාධනය, පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය අඩු කිරීම.

**නිෂ්පාදිත ප්‍රාග්ධනය** (−)
හදිසි මුදල් ලාභ ප්‍රමුඛ කිරීමට යටිතලපහසුකම් සහ මෙහෙයුම් වතක්කම්වල අඩු ආයෝජනය.

**බුද්ධිමය ප්‍රාග්ධනය** (−)
කෙටි කාලීන මූල්‍ය කාර්යසාධනය කෙරෙහි අවධානය යොමුකර පර්යේෂණ හා නව්‍යකරණය සඳහා අරමුදල් සීමා කිරීම.

**සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය** (−)
පාර්ශවකාර සහභාගිත්වය හෝ සමාජ සත්කාර (CSR) කටයුතුවල වියදම් අවම කිරීම කීර්තිනාමය හා විශ්වාසය හානිකළ හැකිය.

**ස්වභාවික ප්‍රාග්ධනය** (−)
තිරසාරභාවයට වඩා මූල්‍යමය ප්‍රතිලාභ වලට ප්‍රමුඛත්වය දීම, සම්පත් ක්ෂය වීමට හෝ පාරිසරික හානියට හේතු වේ.

ධනාත්මක බලපෑම (+) | ඍණාත්මක බලපෑම (−)

## තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රීයකරුවන්

| | |
|---|---|
| 1 | ශුද්ධ පොලී ආදායම් වර්ධනය තුළින් ප්‍රධාන ඉපයීම් ශක්තිමත් කිරීම |
| 2 | පොලී නොවන ආදායම තුළින් ආදායම විවිධාංගීකරණය |
| 3 | හානිපූර්ණය තුළින් ණය අවදානම කළමණාකරනය කිරීම |
| 4 | පිරිවැය කළමනාකරණය හා ධාරිතා වර්ධනයේ උපායමාර්ගික ආයෝජනය |
| 5 | බදු දායකත්වයන් තුළින් මූල්‍ය වගකීම ඉටු කිරීම |
| 6 | තිරසාර ලාභදායිතාව සහ වටිනාකම ලබාදීම සහතික කිරීම |
| 7 | සමබර හා ඔරොත්තු දෙන ශේෂ පත්‍ර පුළුල් කිරීම |
| 8 | වත්කම්වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම |
| 9 | දිගුකාලීන වර්ධනය සඳහා උපායමාර්ගික ආයෝජන වෙන් කිරීම |
| 10 | විචක්ෂණශීලී ණය හා වගකීම් කළමනාකරණය |
| 11 | ශක්තිමත් ප්‍රාග්ධනය හා ද්‍රවශීලතා අවරෝධක පවත්වා ගැනීම |
| 12 | තිරසාර පාර්ශවකාර වටිනාකම් නිර්මාණය මෙහෙයවීම |

**පොලී ආදායම** (↓)
රු. බිලියන 203.7
(2023 - රු. බිලියන 227)

**ශුද්ධ පොලී ආදායම් වර්ධනය** (↑)
146.2% [2023 - (8.9)%]

**ආදායමට පිරිවැය අනුපාතය** (↓)
38.7% (2023 - 71.6%)

**පාර්ශවකරුවන් සඳහා වටිනාකම**
ස්කන්ධය මත ඉපයීම් (↑)
18.1% (2023 - 9.4%)

**වෙන්කිරීම් ආවරණය**
හානිකරණ ආවරණ අනුපාතය (අදියර3) (↓)
44.5% (2023 - 53.3%)

**වත්කම් හා තැන්පත්වල වර්ධනයි**
වත්කම් වර්ධනය (↓)
3.9% (2023 - 4.3%)

තැන්පතු වර්ධනය (↑)
5.0% (2023 - 0.4%)

**ශක්තිමත් ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාව**
මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (↑)
25.9% (2023 - 19.3%)

සියලුම ව්‍යවහාර මුදල් (↑)
344.5% (2023 - 293.7%)

## 1 ශුද්ධ පොලී ආදායම් වර්ධනය තුළින් ප්‍රධාන ඉපැයීම් ශක්තිමත් කිරීම

බැංකුවේ ශුද්ධ පොලී ආදායම (NII) සුවිශේෂී රු. බිලියන 72.8 දක්වා සුවිශේෂී ආකාරයෙන් ඉහළ ගිය අතර, පොලී ආදායම 10%ක පහත වැටීම හමුවේ පසුගිය වසරට සාපේක්ෂව 146%ක සැලකියයුතු වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම සුවිශේෂී කාර්යසාධනය පොලී වියදම තුළ 34%ක පහත වැටීම මගින් මූලික වශයෙන් මෙහෙයවන ලද අතර, ශුද්ධ පොලී ආදායම සැලකියයුතු ලෙස වැඩි කරමින් පොලී ආදායමේ සිදුවූ තුළ අඩුවීම මර්ධනය කරන ලදි.

මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති සහ පරිපාලන ක්‍රියාමාර්ගවලින් ඇති වූ වෙළෙඳපොල පොලී අනුපාතවල පහත වැටීමේ ප්‍රවනතාවය නිසා පොලී වියදම අඩුවීම මෙයට විශාල වශයෙන් හේතු විය. මෙයට පෙළ ගැසීමේදී, බැංකුව පොලී පිරිවැය ඵලදායීව අවම කරමින් තැන්පතු සක්‍රියව ප්‍රතිමිලකරණය කරන ලදි.

පොලී ආදායම 2023 දී පැවති රු. බිලියන 227.0 සිට රු. බිලියන 203.7 දක්වා 10%කින් පහත වැටුණි. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන්ම ඇතිවූ ආර්ථික අවපාත තත්ත්වය නිසා සිදුවූ ණය හා අත්තිකාරම් කළඹේ පහත වැටීම හේතු වූ අතර, 2024 වසර පුරා වඩා අඩු පොලී අනුපාතයන් පැවතුණි. රජයේ සුරැකුම්පත්, ණය කර හා ආයතනික ණය උපකරණ ඇතුළුව ණය උපකරණවල ආයෝජනයෙන් ජනනය වූ ආදායම ද ආන්තික බෑවුමක් පෙන්නුම් කළේය. මෙම උපකරණ මුළු පොලී ආදායමෙන් 60%කට වඩා සාමූහිකව දායක විය. සාමාන්‍ය පොලී උපයන වත්කම්වල වාර්ෂිකව 4.4%ක වැඩි වීමක් හමුවේ මෙම අඩුවීම සිදු විය.

පොලී වියදම 2023 දී පැවති රු. බිලියන 197.4ට සාපේක්ෂව රු. බිලියන 131.0 දක්වා රු. බිලියන 66.4 කින් පහත වැටුණි. මුළු පොලී ආදායමේ අනුපාතයක් ලෙස, මුළු පොලී වියදම් පෙර වසරේ 87.0% සිට 64.3% දක්වා පහත වැටුණි.

මෙවැනි ගතිකතාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස, බැංකුව 4.23%ක ශුද්ධ පොලී ආන්තිකයක් වාර්තා කළ අතර, එය පසුගිය දශකවල වාර්තාකළ ඉහළම ආන්තිකය සලකුණු කරමින් 2023 දී 1.79% සිට 244 දක්වා පදනම් ලකුණුවල වැඩිවීමකි.

### ශුද්ධ පොලී ආන්තිකයට අනුව ශුද්ධ පොලී ආදායම ප්‍රස්ථාරය 16




**ප්‍රධාන අවදානම්**

වෙළෙඳපොල අනුපාත වෙනස්වීම, වත්කම් හා වගකීම් අතර නොගැලපෙන ප්‍රතිමිලකරණය, අඩුවූ ඉල්ලුම හා වත්කම්වල තත්ත්වය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී සැලකියයුතු අභියෝග මතු කර ඇත. නියාමන සංරෝධක හා ආර්ථික ප්‍රතිසාධනයේ මන්දගාමී මුහුණුවර විශේෂයෙන් ණය කළඹ පුළුල් කිරීමට බාධාවක් වී ඇති අතර එම නිසාම ඉපැයීම්වල අගයද හානිකරණයට ලක්ව ඇත.

**දැක්ම**

විශේෂයෙන් පාරිභෝගික අංශයේ ණය ඉල්ලුම වැඩිවීම සහ වඩාත් නිවැරදි වත්කම්-වගකීම් කළමනාකරණ ව්‍යවහාර මගින් සහය ලබමින් ශුද්ධ පොලී ආදායම ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2 පොලී නොවන ආදායම තුළින් ආදායම විවිධාංගීකරණය

පොලී නොවන ආදායමට විවිධ ආදායම් ප්‍රවාහ එනම් ශුද්ධ ගාස්තු සහ කොමිස් මුදල්, වෙළෙඳ ලාභ හෝ අලාභ, මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම්, සහ වත්කම් විකිණීමෙන් ලාභ හෝ අලාභ, විදේශ විනිමය උච්චාවචන සහ ලාභාංශ ආදායම ඇතුළුව වෙනත් මෙහෙයුම් ආදායම ඇතුළත් වේ.

2024 වසර තුළ, ශුද්ධ ගාස්තු සහ කොමිස් මුදල් ආදායම 37.2%කින් වර්ධනය වූ අතර, 2023 දී පැවති රු. බිලියන 1.3 සිට රු. බිලියන 1.8 දක්වා වැඩි විය. මෙයට නව ණය බෙදාහැරීම, කලින් ණය නිරවුල් කිරීම, වැඩි කළ කාඩ් නිකුතුව, සහ වඩා ඉහළ වෙළෙඳ හා ප්‍රේෂණ ආශ්‍රිත ගාස්තු හේතු විය.

කෙසේවෙතත්, වෙළෙඳ කළඹින් වෙළෙඳපොල ලාභය 2023 දී පැවති රු. බිලියන 1.4ට සාපේක්ෂව 2024 දී රු. මිලියන 911.6 දක්වා පමණක් වැඩි විය. විදේශ විනිමය ප්‍රත්‍යාගණනය හා ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අලාභ ද මුළු පොලී නොවන ආදායමේ 26%ක අඩුවීමකට දායක විය.

### අරමුදල් පදනම් නොවන ආදායම ප්‍රස්ථාරය 17




**ප්‍රධාන අවදානම්**

ගාස්තු මත නියාමන සීමා කිරීම් වෙළෙඳපොල උච්චාවචන, සහ පොලී අනුපාත පහත වැටීම ආදායම් ප්‍රවාහයන්ට පීඩනය ඇති කළ අතර, ස්ථිර ආදායම් සුරැකුම්පත් කළඹේ අලාභ ඇති කරමින් පොලී නොවන ආදායමට පීඩනය ඇති කළේය. ඊට අමතරව, දුර්වල ණය ඉල්ලුම සහ මන්දගාමී ආර්ථික ප්‍රතිසාධනය ගාස්තු පදනම් ආදායම හා ආයෝජන ඉපයීම්වල වර්ධනය සංකෝචනය කර ඇත.

**දැක්ම**

උද්ධමනය ලිහිල් කිරීම හා පොලී අනුපාත ස්ථායිතාව සමග, සුරැකුම්පත් කළඹේ ඉපයීම් සඳහා සහ ආයෝජන බැංකුකරණය පුළුල් කිරීම සඳහා වාතාවරණය වඩාත් හිතකර බවට පත්විය. නව්‍යකරන මූල්‍ය නිෂ්පාදන තුළින් ආදායම විවිධාංගීකරණය හා වැඩිකළ ගාස්තු පදනම් සේවා සඳහා තාක්ෂණයේ වාසිය ලබාගැනීම අවදානම අවම කිරීමේදී හා පොලී නොවන ආදායමේ තිරසාර වර්ධනයට සහයවීමේදී තීරණාත්මක වේ.

## 3 හානිපූර්ණය තුළින් ණය අවදානම කළමණාකරනය කිරීම

2024 දී, බැංකුව ණය අවදානම් කළමනාකරණය සඳහා ඉදිරිය දකින සහ අවදානම සංවේදී ප්‍රවේශයක් යොදා ගත් අතර, එය වාර්ෂිකව 163%ක සැලකියයුතු වැඩිවීමක් සලකුණු කරමින් 2023 දී පැවති රු. බිලියන 4.3 සිට රු. බිලියන 11.2 දක්වා හානිකරණ අයකිරීම්වල සැලකියයුතු වැඩිවීමකට හේතු විය. මෙම වැඩිවීමට ගනුදෙනුකාර ණය කළඹ තුළ වෙන් කිරීම් පමණක් නොව SLFRS 9 යටතේ බැංකුවේ විස්තීර්ණ ණය නිරාවරණ ආවරණයට අනුකූලව භාණ්ඩාගාර ලැබීම්වල කොටසක් ද ඇතුළත්ය.

පවත්නා සාර්ව ආර්ථික අවිනිශ්චිතතාවන් හමුවේ ණයගැතියන්ගේ විශ්වාසනීයත්වය තුළ පහත වැටීම පිළිබිඹු කිරීමට පැහැර හැරීමේ සම්භාවිතාව(PD), අලාභ දෙන පැහැරහැරීම (LGD), පැහැරහැරීමේදී නිරාවරණය (EAD) යන ප්‍රධාන පරාමිති නැවත ක්‍රමාංකනය මගින් හානිකරණය තුළ ඉහළයාම ප්‍රධාන වශයෙන් සිදු විය.

බැංකුව වඩාත් සියුම් ලෙස බණ්ඩනය කිරීම සහ සාර්ව ආර්ථික ආවරණ යෙදීම හරහා එහි අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘති තවදුරටත් වැඩිදියුණු කරන ලද අතර, පීඩන තත්ත්වයන් ඇතුළුව ඉදිරි දැක්මක් සහිත අවස්ථා කිහිපයක් එහි ප්‍රතිපාදන ක්‍රමවේදයට ඇතුළත් කළේය. වැඩිකළ හානිකරණ මට්ටම්වලින් විශේෂයෙන් කල්පවත්නා මුදල් ප්‍රවාහ පීඩනයන්ට මුහුණපාන පාරිභෝගික හා ආයතනික ණයගැතියන් අතර අදියර 2 සහ අදියර 3 නිරාවරණවල වැඩිවීමක් පිළිබිඹු කළේය. ඊට අමතරව, බාහිර අංශයේ උවදුරු සහ මූල්‍ය ඒකාබද්ධ අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විචක්ෂණ වෙන්කිරීම් ස්වාරක්ෂක හඳුන්වා දෙමින් භාණ්ඩාගාර ලැබිය යුතු දෑ සඳහා වඩාත් දැඩි අදියරකරණ නිර්ණායක බැංකුව යොදා ගෙන ඇත.

### වෙන්කිරීම් ආවරණය

ප්‍රස්ථාරය 18




අදියර 3 හානිකරණය (රු. මිලියන)

අදියර 3 වෙන් කිරීම් ආවරණය (%)

**ප්‍රධාන අවදානම්**

ආර්ථික අවිනිශ්චිතතාව, නියාමන වෙනස්වීම්, සහ වෙළෙඳපොල තත්ත්වයන් වෙනස්වීම අඩුකළ වත්කම් වටිනාකම්වලට දායක වූ අතර, වඩා ඉහළ හානිකරණ අයකිරීම්වලට හේතු විය. දුර්වල ඉල්ලුම සහ වැඩිවන නියාමන අවශ්‍යතා වැනි අංශ විශේෂිත අභියෝග වත්කම් අයකරගැනීමේ හැකියාවට හා මූල්‍ය කාර්යසාධනයට තවදුරටත් බලපාන ලදී.

**දැක්ම**

සමහර ස්ථායිකරණය ආර්ථික දර්ශක වර්ධනයක් සමග අපේක්ෂා කරන අතර, ලිහිල් උද්ධමනීය පීඩනයන් සහ ණය අවදානම් වැඩි වී පැවතුණි. ණයගැතියන්ගේ මුදල් ප්‍රවාහ ප්‍රතිසාධනය හා තිරසාර සාර්ව ආර්ථික ස්ථායිතාව මත රඳමින් මධ්‍ය කාලීනව හානිකරණ මට්ටම් ක්‍රමානුකූලව පහත වැටීම බැංකුව අපේක්ෂා කරයි.

## 4 පිරිවැය කළමනාකරණය හා ධාරිතා වර්ධනයේ උපායමාර්ගික ආයෝජනය

සේවක පිරිවැය, ක්ෂය කිරීම හා ක්‍රමක්ෂය හා වෙනත් පොදු කාර්ය වියදම් ඇතුළත් මෙහෙයුම් වියදම් 2024 දී සැලකියයුතු ලෙස රු. බිලියන 29.3 දක්වා වැඩි වූ අතර, බැංකුව පිරිවැය දරා සිටීමේ මුලපිරීම් ක්‍රියාත්මක කරනු ලැබුවද 2023 දී පැවති රු. බිලියන 24.5 සිට එය 19.8%ක වැඩිවීමක් සලකුණු කරයි. මුළු මෙහෙයුම් පිරිවැයෙන් 69.2%ක් සමන්විත සේවක පිරිවැය රු. බිලියන 20.3 දක්වා වර්ධනය විය. මෙයට 2024 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ සාමූහික වැටුප් ගිවිසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම මූලිකවම හේතු විය.

ක්ෂය කිරීම හා ක්‍රමක්ෂය වියදම් මුළු මෙහෙයුම් පිරිවැයෙන් 5.7%ක් සඳහා දායක වූ අතර, 2023 දී පැවති රු. බිලියන 1.4ට සාපේක්ෂව රු. බිලියන 1.7 දක්වා 16.9%ක වැඩිවීමකි. නව මධ්‍යගත බැංකුකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ සයිබර් ආරක්ෂාව වැඩි කිරීම ඇතුළුව ඩිජිටල් සේවා ලබාදීම වැඩි කිරීමට තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් උසස් කිරීම තුළ උපායමාර්ගික ආයෝජන මගින් මෙම වැඩිවීම සිදු කරන ලදී.

පරිපාලන, ආයතනික පිරිවැය, සහ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික ආවරණය කරන වෙනත් මෙහෙයුම් වියදම් රු. බිලියන 7.4 දක්වා 6.1%කින් වර්ධනය විය. කෙසේවෙතත්, බැංකුවේ ආදායමට පිරිවැය අනුපාතය (බදු රහිත) පසුගිය වසරේ 71.6% සිට 38.7% දක්වා සැලකියයුතු ලෙස වර්ධනය වූ අතර, ක්ෂේත්‍රයේ සාමාන්‍යවන 73.2%ට පහළින් පැවතියේය.

### පිරිවැය සහ ආදායම් වර්ධනය ප්‍රස්ථාරය 19




● ආදායම වර්ධනය (LHS)
● මෙහෙයුම් වියදම් (VAT රහිත) වර්ධනය (LHS)
— VAT රහිත ආදායමට පිරිවැය අනුපාතය (RHS)

**ප්‍රධාන අවදානම්**

පවත්නා පිරිවැය පරිමේයකරණය හමුවේ, මෙහෙයුම් පුළුල් කිරීම, නියාමන අනුකූලතාව සපුරාලීම සහ උසස් කළ තාක්ෂණික වේදිකා ක්‍රියාත්මක කිරීම මෙහෙයුම් වියදම්වල සැලකියයුතු වැඩිවීමකට දායක විය.

**දැක්ම**

බැංකුව කාර්යක්ෂමතාව වැඩි කිරීමට, ගනුදෙනුකාර අත්දැකීම සහ අනාගත මෙහෙයුම් වැඩිකිරීමට දිගුකාලීන හැකියා ගොඩනැගීම විශේෂයෙන් ඩිජිටල් නව්‍යකරණය, මානව ප්‍රාග්ධන සංවර්ධනය, සහ අවදානම් පාලනය තුළ බැංකුව ආයෝජනය කරන බැවින් පිරිවැයෙහි ඉහළයන ප්‍රවනතාව තවදුරටත් අපේක්ෂා කෙරේ.

## 5 බදු දායකත්වයන් තුළින් මූල්‍ය වගකීම ඉටු කිරීම

GRI 207-3

2023 දී රු. බිලියන 1.6ක බදු ආපසු හැරවීමට ප්‍රතිවිරුද්ධව ජාතික ආර්ථිකයට රු. බිලියන 19.5ක සැලකියයුතු මූල්‍ය දායකත්වයක් සිදුකර ඇත. මෙම එකතුවට මූල්‍ය සේවා මත අගය එකතුකළ බදු (VAT) සමාජ ආරක්ෂක දායකත්ව බදු (SSCL), සහ ආදායම් බදු ඇතුළත්ය.

ශක්තිමත් ඉහළ මාර්ගයේ වර්ධනය හා වැඩිකළ ලාභදායිතාව, ආදායම් බදු බැඳීම් රු.බිලියන 10.1 දක්වා වැඩි වී ඇති අතර, එය පසුගිය වසරේ රු. බිලියන 2.9ට වඩා 446%ක වැඩිවීමකි. එයට සමානව, මූල්‍ය සේවා මත අගය එකතුකළ බදු සහ සමාජ ආරක්ෂක දායකත්ව බදු 2023 දී පැවති රු. බිලියන 1.3 සිට රු. බිලියන 9.3 දක්වා ලගාවෙමින් 618%ක තියුණු වැඩිවීමක් පෙන්නුම් කරයි. ඵලදායී බදු අනුපාතය (විලම්බිත බදු හැර) පසුගිය වසරේ 10.7% සිට 2024 දී 33.8% දක්වා වැඩිවී ඇති අතර මෙයට ප්‍රධාන වශයෙන් ලාභදායිතාවයේ සැලකියයුතු නැගීම හේතු විය.

### ලාභදායිතාව කෙරෙහි බදු බලපෑම ප්‍රස්ථාරය 20




● ගෙවන ලද මුළු බදු (රු. බි.) (RHS)
● බදු පදු ලාභය (රු. බි.) (RHS)
— ඵලදායී ආදායම් බදු අනුපාතය (PBT මත පදනම්) (%) (LHS)
— ඵලදායී බදු අනුපාත (මෙහෙයුම් ලාභය මත පදනම්) (%) (LHS)

**ප්‍රධාන අවදානම්**

2024 දී, බදු දායකත්වයන්ට මූල්‍ය හා නියාමන අවදානම් කිහිපයක් බලපාන ලදි. යම් ඍජු හා වක්‍ර බදු නැවත හඳුන්වාදීම නිතර නිතර ප්‍රතිපත්ති වෙනස්වීම්, සහ බදු රෙගුලාසිවල දැඩි බලාත්මකවීම අනුකූලතා සංකීර්ණතාව සහ පරිපාලන බර වැඩි කර ඇත.

**දැක්ම**

රජය විසින් ණය තිරසාරතාව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණවලට සහයවීමට ආදායම් රැස්කිරීම වැඩි කිරීමට උත්සාහ දරන බැවින් මූල්‍ය ප්‍රතිපත්ති පරිසරය තුළ අඛණ්ඩ උච්චාවචනය බැංකුව අපේක්ෂා කරයි.

## 6 තිරසාර ලාභදායිතාව සහ වටිනාකම ලබාදීම සහතික කිරීම

බැංකුවේ බදු පෙර මෙහෙයුම් ලාභය 2023 දී පැවති රු.බිලියන 5.6ට සාපේක්ෂව රු. බිලියන 35.8ට ලගාවෙමින් 2024 දී 540%කින් ඉහළ ගියේය. මෙහෙයුම් ආදායම තුළ 122%ක විශාල වැඩිවීමත් මගින් මෙහෙය වූ වැඩිකළ හානිකරණ අයකිරීම් සහ වෙනත් මෙයුම් වියදම් හමුවේ මෙම සුවිශේෂී වර්ධනය අත්කරගන්නා ලදි. ප්‍රධාන දායකයා ශුද්ධ පොලී ආදායමේ 146%ක ඉහළයාම වූ අතර, එය බැංකුවේ මූල්‍ය කාර්යසාධනය සැලකියයුතු ලෙස වැඩි කරන ලදි.

වසර සඳහා බදු පෙර ලාභය රු. බිලියන 26.4ක් වූ අතර ඉන් 2023 වසරේ රු.බිලියන 4.3ට සාපේක්ෂව 516%ක වැඩිවීමක් පිළිබිඹු කරයි. මෙයට පොලී වියදම්වල තියුණු අඩුවීම හේතු විය.

අභියෝගාත්මක ආර්ථික පරිසරය හමුවේ බැංකුව රු. බිලියන 16.3ක ශක්තිමත් බදු පසු ලාභයක් ලබාගෙන ඇති අතර, 126%ක ශක්තිමත් වර්ධනයක් නියෝජනය කරමින් පසුගිය වසරේ රු. බිලියන 7.2 මෙන් එය දෙගුණයකටත් වඩා වැඩි අගයකි. සාමාන්‍ය කොටසකට ඉපයීම් 2024 දී රු. බිලියන 17.32 දක්වා සැලකියයුතු ලෙස ඉහළ ගිය අතර, බැංකුවේ වර්ධිත ලාභදායිතාව සහතික කරමින් 2023 දී පැවති රු. බිලියන 7.68ට වඩා එය වැඩි අගයකි.

මෙම ප්‍රතිඵලවලට අනුකූලව, ස්කන්ධය මත ඉපයීම් (ROE) 2023 අවසානයට පැවති 9.36% සිට 2024 දෙසැම්බර් 31 දිනට 18.07 දක්වා ඉහළ ගියේය. මෙයට සමානව වත්කම් මත ඉපයීම් (ROA) ද පසුගිය වසරේ 0.26%ට සාපේක්ෂව 1.54% දක්වා සැලකියයුතු ලෙස වර්ධනය වී ඇත.

බදු පසු ලාභය බැංකුව සිය මෙහෙයුම්වලින් තිරසාර ඉපයීම් ජනනය කිරීමට බැංකුවේ හැකියාව පිළිබඳ ප්‍රධාන දර්ශකයක්ව පවතී. 2024 දී ඉපයීම් කාර්යසාධනයේ ප්‍රධාන ධාවකයින් පහත වගුවෙන් පැහැදිලි කරයි.

**ප්‍රධාන අවදානම්**

ආර්ථික උච්චාවචනය, වෙනස්වන රෙගුලාසි, වැඩිවන මෙහෙයුම් පිරිවැය සහ සැපයුම් දාම බිඳවැටීම් ප්‍රධාන අභියෝග ඉදිරිපත් කරන ලදි, තරඟකාරී සහ අංශ විශේෂිත පිඩනයන් සමඟ තාක්ෂණය හා තිරසාරභාවය තුළ ආයෝජන ද දිගුකාලීන වටිනාකම නිර්මාණයට බලපාන ලදි.

**දැක්ම**

දිගුකාලීන ලාභදායිතාව රඳවා ගැනීමට හා ශක්තිමත් කිරීමට විචක්ෂණ අවදානම් කළමනාකරණය, ආදායම් විවිධාංගීකරණය සහ ඩිජිටල් පරිවර්තනය මත අඛණ්ඩ අවධානය.

## ඉපයීම්වල ධාවකයින්

ප්‍රස්ථාරය 21




A - 2023 බදු පසු ලාභය
B - ශුද්ධ පොලී ආදායම
C - ශුද්ධ පොලී නොවන ආදායම
D - හානිකරණය
E - පරිපාලන හා වෙනත් පොදු කාර්ය වියදම්
F - බදු
G - 2024 බදුපසු ලාභය

## ලාභදායිතා අනුපාත

ප්‍රස්ථාරය 22




## කොටසකට ඉපයීම්

ප්‍රස්ථාරය 23




## විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වෙනස්වීම්

අනෙකුත් විස්තීර්ණ ආදායමෙහි වැඩිවීමේ මූලික ධාවකයා වූයේ ආදායම් ප්‍රකාශයට නැවත-වර්ගීකරණය නොකළ අයිතම්වල ඉපයීමයි. බැංකුව අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට නම්කළ ස්කන්ධ ආයෝජනවල සාධාරණ අගයේ වෙනසින් රු. බිලියන 2.5ක ලාභයක් වාර්තා කළේය. කෙසේවෙතත්, පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැඳීම් නැවත ඇගයීම හේතුවෙන් රු. බිලියන 1.7ක (බද්දෙන් ශුද්ධ) අලාභය මගින් මෙය අර්ධ වශයෙන් හිලව් කරන ලදි. ආදායම් ප්‍රකාශයට නැවත-වර්ගීකරණය කරනු ලබන අයිතමවලින් ලාභය රු. මිලියන 388.2ක් විය.

## 7 සමබර හා ඔරොත්තු දෙන ශේෂ පත්‍ර පුළුල් කිරීම

### මුළු වත්කම්

බැංකුවේ මුළු වත්කම් පදනම 2024 දී 3.9%කින් වර්ධනය වූ අතර, 2023 අවසානයේ දී රු. ට්‍රිලියන 1.7ට සාපේක්ෂව රු. ට්‍රිලියන 1.8ට ළඟා විය. මෙම වර්ධනයෙන් ප්‍රධාන මෙහෙයුම් ප්‍රශස්තකරණය හා මතුවන අවස්ථා භාවිතා කිරීම අරමුණු කළ විචාරවත් හා අරමුණු සහගත උපායමාර්ගය පිළිබිඹු කරයි. මෙම ශේෂ පත්‍ර වර්ධනය ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්වල 19%ක වැඩිවීම මගින් තහවුරු කරන අතර, එය ණය හා වෙනත් උපකරණවල ආයෝජනයේ 10%ක වැඩිවීමකි. එමෙන්ම එය පසුගිය වසරේ රු. බිලියන 943.8 සිට රු. ට්‍රිලියන 1 දක්වා වැඩිවීමකි. මේ සමඟම, ශුද්ධ ණය හා අත්තිකාරම් 1%කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර 2023 දී පැවති රු. බිලියන 526.5 සිට 2024 දී රු. බිලියන 532.4ට ළඟාවීමකි.

## වත්කම් වර්ධනය

ප්‍රස්ථාරය 24




### මුළු වගකීම්

බැංකුවේ තැන්පතු පදනම 2023 දී පැවති රු. ට්‍රිලියන 1.5 සිට 2024 අවසානයට රු. ට්‍රිලියන 1.6 දක්වා ලඟාවෙමින් 5%කින් වැඩි වූ අතර, ඉන් ශක්තිමත් තැන්පතුහිමියන්ගේ විශ්වාසය හා ඵලදායී ස්ථායිකරණ උත්සාහයන් පිළිබිඹු කරයි.

මුළු ණය 30.5%කින් පහත වැටුණ අතර එයට ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත, ජ්‍යෙෂ්ඨ සුරැකුම් රහිත මුදාහැරියහැකි ණයකරවල රු. බිලියන 6.3ක් නිදහස් කිරීම හා මහ බැංකුවේ රු. බිලියන 33.5ක ණය පහසුකම නැවත ගෙවීම හේතු විය.

## 8 වත්කම්වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම

2024 දී, බැංකුව රජයට අයත් ව්‍යාපාරවලට (SOEs) අදාළ අක්‍රීය ණය අදියර 3ට නැවත වර්ගීකරණය කළ අතර, ඉන් ශක්තිමත් ණය අවදානම් කළමනාකරණයට බැඳීම පිළිබිඹු කරයි. මෙය 2023 දී පැවති රු. බිලියන 27.1 සිට 2024 දී රු. බිලියන 49.7 දක්වා අදියර 3 ණයවල ඉහළයාමකට හේතු වූ අතර, වාර්ෂිකව 83%ක සැලකියයුතු වැඩිවීමක් මින් නියෝජනය කරයි. වැඩිවීම හමුවේ, බැංකුව තීරණාත්මක සම්බන්ධතා පවත්වා ගනිමින් ප්‍රධාන පාර්ශවකරුවන් සමග සහයෝගිත්වයෙන් ප්‍රතිසාධන මූලපිරීම් ක්‍රියාත්මක කරන ලදි.

රජයට අයත් ව්‍යාපාරවල ණය අවදානම සඳහා අනාගත දැක්ම මෑතකාලීන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවලින් වර්ධනය කර සහය විය. මනාව සමබර වෙන්කිරීම් උපායමාර්ගයක් සහතික කරමින් වෙන්කිරීම් ආවරණය අදියර 3 ණය සඳහා 44% සහ අදියර 1 සහ අදියර 2 සඳහා පිළිවෙලින් 1% සහ 11% මට්ටම්වල පවත්වා ගන්නා ලදි.

### වත්කම්වල ගුණාත්මකභාවය

ප්‍රස්ථාරය 25




## 9 දිගුකාලීන වර්ධනය සඳහා උපායමාර්ගික ආයෝජන වෙන් කිරීම

### ආයෝජන

ස්කන්ධය හා ණය උපකරණවලින් සමන්විත බැංකුවේ සමස්ත ආයෝජන කළඹ 2024 වසර තුළ 8%කින් වැඩි වී ඇත. රජයේ සුරැකුම්පත්, ආයතනික ණය, සහ භාර සහතිකපත් ඇතුළත් ණය උපකරණ මුළු කළඹ තුළ 97.5% කට දායක වේ. ඉහළ පොලී අනුපාත හමුවේ අඩුකළ පුද්ගලික ණය සමඟ, බැංකුව 10%කින් රජයේ සුරැකුම්පත්වල ආයෝජන වැඩි කර ඇත. විදේශ විනිමය ස්ථාපන 34%කින් පහත වැටුන අතර, එයට විනිමය අනුපාත උච්චාවචනවලට ප්‍රතිචාරාත්මකව උපායමාර්ගික ආයෝජන ඉවත් කිරීම හේතු විය.

### ආයෝජනවල සංයුතිය

ප්‍රස්ථාරය 26




### ණය හා අත්තිකාරම්

නිවාස ණය, උකස් අත්තිකාරම්, පුද්ගලික ණය සහ වෙනත් වර්ගයේ ණය ප්‍රධාන වශයෙන් ඇතුළත් බැංකුවේ ණය හා අත්තිකාරම් කළඹ, 2024 අවසානය වන විට රු. බිලියන 532ක් වූ අතර, පෙර වසරේ වාර්තාකළ රු. බිලියන 526 සිට 1.1%ක වැඩිවීමක් ඉන් පෙන්නුම් කරයි. මෙම වැඩිවීමට ප්‍රතිවිකුණුම් ගිවිසුම් (Repo) යටතේ මිලදී ගත් සුරැකුම්පත් ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, එය 2024 දී 322%කින් වැඩි වී ඇත. දිගුකාලීන ණයවල රු. බිලියන 44.5ක පහත වැටීම හමුවේ, උකස් අත්තිකාරම් 2024 දී රු. බිලියන 24.7 දක්වා වැඩි විය.

### ශුද්ධ ණය හා අත්තිකාරම්

ප්‍රස්ථාරය 27




## 10 විචක්ෂණශීලී ණය හා වගකීම් කළමනාකරණය

### තැන්පතු

ගනුදෙනුකාර තැන්පතු බැංකුවේ මූලික අරමුදල් මූලාශ්‍රය ලෙස අඛණ්ඩව පැවති අතර, 2024 දී මුළු වත්කම්වලින් 89%ක් සඳහා දායක විය.

වසර තුළ, බැංකුව අඩු පිරිවැය ඉතුරුම් තැන්පතු වැඩි කිරීම කෙරෙහි උපායමාර්ගික අවධානයක් සමග රු. බිලියන 84.9ක් සාර්ථකව සේවයේ යොදවන ලදි. 2024 අවසානය වන විට, මුළු තැන්පතු පදනම 2023 දී පැවති රු. ට්‍රිලියන 1.5 සිට රු. ට්‍රිලියන 1.6 දක්වා 5%කින් ඉහළ ගියේය.

අඩුවන පොලී අනුපාත වාතාවරණය හමුවේ, ඉතුරුම් හා ස්ථාවර තැන්පතු යන ද්විත්ව කළඹ 2024 වසර අවසානයේදී ස්ථිර වර්ධනය පෙන්නුම් කළේය. වසර අවසානය වන විට ඉතුරුම් තැන්පතු රු. බිලියන 302.5 දක්වා 9.0% කින් වැඩි වූ අතර, ස්ථිර තැන්පතු රු. ට්‍රිලියන 1.3 දක්වා 4.0%කින් ඉහළ ගියේය. තැන්පතු සංයුතිය ස්ථාවරව පැවති අතර, මුළු ගණනින් ඉතුරුම් 20% දක්වා දායක වූ අතර, පසුගිය වසරට සාපේක්ෂව සුළු අඩුවීමක් සමග ඉතිරිය ස්ථිර තැන්පතුවලින් සමන්විත විය.

### කාලීන තැන්පතුවලට සාපේක්ෂව ඉතුරුම්

ප්‍රස්ථාරය 28




### වෙනත් වගකීම් සහ ස්කන්ධය

වෙනත් වගකීම් 2023 දී වාර්තාකළ රු. බිලියන 123.1 සිට 2024 දී රු. බිලියන 97.3 දක්වා පහත වැටුණ අතර, එයට ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් රහිත මුදාහැරියහැකි ණයකර රු. බිලියන 6.3ක් නිදහස් කිරීම හා රු. බිලියන 33.5ක මහ බැංකු ණය පහසුකම සම්පූර්ණයෙන් ගෙවා දැමීම ප්‍රධාන වශයෙන් හේතු විය. ශක්තිමත් ලාභදායිතාව මගින්, මුළු ස්කන්ධය වසර අවසානයේදී රු. බිලියන 98.8 දක්වා 21%කින් වර්ධනය විය.

### අරමුදල් ව්‍යුහය

ප්‍රස්ථාරය 29




## 11 ශක්තිමත් ප්‍රාග්ධනය හා ද්‍රවශීලතා අවරෝධක පවත්වා ගැනීම

### ප්‍රාග්ධන කළමනාකරණය

විචක්ෂණ ප්‍රාග්ධන කළමනාකරණය බැංකුවේ ඉහළම ප්‍රමුඛතාවයකි. බැංකුව බාහිරින් ප්‍රාග්ධනය අවශ්‍යතාවයකින් තොරව දැඩි මෙහෙයුම් පරිසරයක් හමුවේ ශක්තිමත් ප්‍රාග්ධන ස්වාරක්ෂක පවත්වා ගෙන ගියේය.

මුළු කොටස්හිමියන්ගේ ස්කන්ධය 2023 දී පැවති රු. බිලියන 81.4ට වඩා 2024 දී රු. බිලියන 98.8 දක්වා ඉහළ ගිය අතර, එය බැංකුවේ මූල්‍ය තත්ත්වය තවදුරටත් ශක්තිමත් කර ඇත. 2023 දී පැවති රු. 7.68 සිට රු. 17.32 දක්වා කොටසක ඉපැයීම් වැඩිවීම සමඟ වර්ධිත ලාභදායිතාව මගින් මෙය සිදු විය.

එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රධාන ප්‍රාග්ධන අනුපාත නියාමන අවශ්‍යතාවන් වඩා ඉහළින් පැවතුණි. 2024 අවසානය වන විට, පිළිවෙලින් 8.5% සහ 12.5% යන නියමන අවශ්‍යතාවන්ට සැලකියයුතු ලෙස ඉක්මවමින් ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය 23.42%ක් වූ අතර, මුළු ප්‍රාග්ධන අනුපාතය 25.88% ක් විය. මෙය 2023 දී වාර්තාකළ 16.91% සහ 19.26% සිට වර්ධනයකි. තවද, බැංකුවේ බාසල් III තෝලන අනුපාතය ද වසරකට පෙර වාර්තාකළ 6.23% සිට 2024 දී 8.0% දක්වා වර්ධනය වූ අතර 3.0%ක නියාමන අවම අවශ්‍යතාවය සැලකිය යුතු ලෙස ඉක්මවා ඇත.

### ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත

ප්‍රස්ථාරය 30




### අවදානම මත බර තබන ලද වත්කම්වල සාමාන්‍ය අගයට ප්‍රතිලාභය

ප්‍රස්ථාරය 31




### ද්‍රවශීලතා කළමනාකරණය

පීඩන වෙළෙඳපොල තත්ත්වයන් යටතේ ද්‍රවශීලතා අවදානම ඇගයීමට අනුකූලව බැංකුව ප්‍රමාණවත් ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වාගැනීම සහතික කළ අතර, ද්‍රවශීලතා කළමනාකරණයට සක්‍රිය ප්‍රවේශයක් යොදා ගෙන ඇත. මෙමඟින් අස්ථාවර හා සීමාසහිත ද්‍රවශීලතා පරිසරයක් මධ්‍යයේ වුවද ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගැනීමට බැංකුවට හැකිවිය.

අනපේක්ෂිත මුදල් ප්‍රවාහ බිඳවැටීම් සුරක්ෂිත කිරීමට හා නියාමන අවශ්‍යතා සපුරාලීමට, බැංකුව උපායමාර්ගිකව ඉක්මණින් අලෙවිකළහැකි හා ද්‍රවශීල උපකරණවලින් සමන්විත කළඹක් පවත්වාගෙන ඇත. මෙම කළඹ බැංකුවේ මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව සහ මෙහෙයුම් ස්ථාවරත්වය ශක්තිමත් කරමින් විභව ආතති අවස්ථාවන් හිදී විශ්වාසදායක ආරක්ෂකයෙක් ලෙස ක්‍රියා කරයි.

බැංකුව 2024 වසර තුළ 100%ට වඩා වැඩි ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් (LCR) පවත්වාගෙන ඇති අතර, එය දින 30ක කාලසීමාවක් තුළ ශුද්ධ මුදල් පිටතට ගලායාම්වලට සාපේක්ෂව උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම්වල අනුපාතය ලෙස ගණනය කර ඇත. සියලුම ව්‍යවහාර මුදල් සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය වසර අවසානයට 344.6%හි පැවති

අතර, රුපියල් LCR 351.3%ක් විය. තවද, දිගුකාලීන අරමුදල් ස්ථාවරත්වය තක්සේරු කිරීම සඳහා ප්‍රධාන මාත්‍රිකයක් වන, ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR), 2025 අවසානයට 193.5%ක් වාර්තා කළ අතර, එය අවම සීමාව වන 100% සැලකියයුතු ලෙස ඉක්මවා යාමකි.

### ද්‍රවශීලතා අනුපාත

ප්‍රස්ථාරය 32




## 12 තිරසාර පාර්ශ්වකාර වටිනාකම් නිර්මාණය මෙහෙයවීම

2024 දී, ලාභදායිතාව, ප්‍රාග්ධන ප්‍රශස්තකරණය සහ උපායමාර්ගික නැවත ආයෝජනය කරා සමබර ප්‍රවේශයක් තුළින් සිය කොටස්හිමියාට තිරසාර වටිනාකම ලබාදීමට බැංකුව ස්ථිරවම කැපවී සිටියේය. වැඩිකළ ඉපැයීම් කාර්යසාධනය, විචක්ෂණ අවදානම් කළමනාකරණය හා විධිමත් පිරිවැය පාලනය බැංකුවේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමට සාමූහිකව දායක විය. කොටසක ඉපැයීම සහ හිමිකම මත ප්‍රතිලාභය වැඩිවීම මගින් කොටස්හිමිගේ ප්‍රාග්ධනය ඵලදායීව සේවයේ යෙදවීම සහ බැංකුවේ ප්‍රධාන මෙහෙයුම්වල ඔරොත්තුදීම පිළිබිඹු කරයි.

ප්‍රාග්ධනය සුරක්ෂිත කර ගැනීමට සහ අනාගත වර්ධනයට අරමුදල් යෙදවීම සඳහා 2024 වසර තුළ කිසිදු ලාභාංශයක් ප්‍රකාශ නොකරන ලදී. මෙම උපායමාර්ගය මගින් මූල්‍ය ස්ථායිතාව සුරක්ෂිත කිරීම පමණක් නොව බැංකුවේ දිගුකාලීන දැක්ම තුළ කොටස්හිමියන්ගේ විශ්වාසය ශක්තිමත් කරමින් ආර්ථිකය ප්‍රතිසාධනයේදී ඇතිවන අවස්ථා ග්‍රහනය කර ගැනීමට බැංකුවට අවස්ථාව සැලසුනි.

වැඩිදුර විස්තර සඳහා, 223 සිට 228 දක්වා පිටුවල අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ විස්තර බලන්න.

### සිරස් හා තිරස් විශ්ලේෂණ

වසර පහක කාලසීමාවක් පුරා විහිදෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ආදායම් ප්‍රකාශය පිළිබඳ විස්තරාත්මක සිරස් හා තිරස් විශ්ලේෂණය පිටු අංක 449 සිට 451 දක්වා දැක්වේ.

මෙම අවබෝධය මූල්‍ය ප්‍රවණතා නිරීක්ෂණය කිරීමට ඓතිහාසික කාර්යසාධනය සංසන්දනය කිරීමට සහ බැංකුවේ මූල්‍ය සෞඛ්‍යයේ ප්‍රධාන ශක්තීන් හා අවදානම් ක්ෂේත්‍ර ඉස්මතු කිරීමට උපකාරී වේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2024 | 2023 | 2022 | 2021 | 2020 |
|---|---|---|---|---|---|
| කොටස්හිමි සාමාන්‍ය අගය මත ප්‍රතිලාභය (ROE) % | **18.07** | 9.36 | 3.40 | 33.92 | 20.15 |
| කොටසක ඉපැයීම (රු.) | **17.32** | 7.68 | 2.69 | 23.53 | 10.75 |
| කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (NAV) (රු.) | **105.15** | 86.57 | 77.54 | 80.86 | 57.89 |

වගුව 24

### සමූහයේ කාර්යසාධනය

බැංකුවේ සමූහය සිය ඉතිහාසය තුළ සැලකියයුතු සන්ධිස්ථාන සලකුණු කරමින් 2024 දී වාර්තා බිඳෙන ප්‍රතිඵල ලබාදී ඇත. සමූහයේ මුළු වත්කම්වලින් 98.5%ක් සඳහා බැංකුව දායක වන අතර, සමූහයේ වත්කම් 2023 දී පැවති රු. ට්‍රිලියන 1.7 සිට 2024 දී රු. ට්‍රිලියන 1.8 දක්වා 4%කින් වර්ධනය විය. මෙම වර්ධනයෙන් ගතික ආර්ථික තත්ත්වයන් හමුවේදී පවා ශක්තිමත් හා ඔරොත්තුදෙන වත්කම් පදනමක් පවත්වා ගැනීමට සමූහයට ඇති හැකියාව ඉස්මතු කර දක්වයි.

ඉතිහාසයේ වාර්තා කරන ලද ඉහළම බදු පෙර ලාභය වාර්තා කරමින් NSB සමූහය වර්ෂ 2024 දී රු. බිලියන 28.5ක බදු පෙර ලාභයක් වාර්තා කරන ලදී. එය පෙර වසරේදී වාර්තා කළ රු. බිලියන 8ට සාපේක්ෂව 256%ක සැලකියයුතු වර්ධනයකි. ඒ හා සමානව බදු පසු ලාභය 2023 දී වාර්තා කරන ලද රු. බිලියන 9.6 සිට 2024 දී රු. බිලියන 17.7 දක්වා වර්ධනය විය.



## මූල්‍ය ප්‍රාග්ධන අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ උපායමාර්ග

| අවදානම් හා අභියෝග | බැංකුව කෙරෙහි බලපෑම | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| **ආර්ථික උච්ඡාවචනය** | පොලී අනුපාත සහ උද්ධමනයේ උච්ඡාවචනයන් ලාභදායිතාව සහ වර්ධනය කෙරෙහි බලපෑම | ආයෝජන කළඹ විවිධාංගීකරණය සහ ස්ථාවර ආදායම් මාර්ග කෙරෙහි අවධානය. |
| **ණය අවදානම** | වත්කම්වල ගුණාත්මකභාවය හා මූල්‍ය ස්ථාවරත්වයට බලපාන අක්‍රීය ණය වැඩිවීම | ණය ඇගයීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ අයකිරීමේ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම. |
| **නියාමන වෙනස්වීම්** | වෙනස්වන රෙගුලාසි අනුව අනුකූලතා පිරිවැය සහ මෙහෙයුම් ගැලපීම්. | බැංකුවේ අනුකූලතා කණ්ඩායම වෙනස්වන නියාමන අවශ්‍යතාවන්ට අනුකූලතාවය උනන්දුවෙන් නියාමනය කරන අතර, ශක්තිමත් අනුකූලතා රාමු පවත්වා ගැනීමට උසස් නියාමන තාක්ෂණය තුළ සක්‍රිය ආයෝජන සිදු කිරීම. |
| **ද්‍රවශීලතා අවදානම** | මූල්‍ය අංශය දැඩි තරඟකාරීත්වය හේතුවෙන් ආන්තිකයන් මත පීඩනය | ප්‍රශස්ත ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගැනීම සහ හදිසි අවස්ථා අරමුදල් සැලසුම |
| **වෙළෙඳපොළ තරඟය** | මූල්‍ය ක්ෂේත්‍රය තුළ තීව්‍ර තරඟය නිසා ආන්තික පීඩනය. | පක්ෂපාතිත්වය පවත්වාගැනීමට ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීම. |

### අනාගත දැක්ම

**කෙටි කාලීන**

- වත්කම් වගකීම් නැවත තුලනය කිරීම සහ පොලී අනුපාත ප්‍රශස්තකරණය තුළින් ශුද්ධ පොලී ආන්තික වර්ධනය.
- ව්‍යාපාර වර්ධනයට සහයවීමට නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවයන් සහ ද්‍රවශීල තත්ත්වයන් පවත්වා ගැනීම.

**මධ්‍ය සිට දිගුකාලීන**

- අනාගත සහතික මූල්‍ය සේවා සඳහා මධ්‍යගත බැංකුකරණ උසස් කිරීම්, අත්‍යතා පරිගණකගතකරණය කිරීම් සහ කෘත්‍රිම බුද්ධිය තුළ අඛණ්ඩ ආයෝජනය.
- ජාතික තිරසාර අරමුණුවලට සහයවීමට හරිත මූල්‍යකරණය සහ ESG-ආශ්‍රිත ණයදීම වැඩි කිරීම
- පොලී ආදායම මත යැපීම අඩු කිරීමට ගාස්තු පදනම් කරගත් සේවාවන්, ඩිජිටල් මූල්‍ය නිෂ්පාදන සහ හවුල්කාරත්වයන් පුළුල් කිරීම.
- විචක්ෂණ ලාභ රඳවාගැනීම සහ ප්‍රශස්ත කළඹ කළමනාකරණය තුළින් ප්‍රාග්ධන ව්‍යුහය ශක්තිමත් කිරීම
- සාර්ව ආර්ථික කම්පන අවශෝෂණය කර ගැනීමට ශක්තිමත් ද්‍රවශීල ස්වාරක්ෂක හා අවදානම් ගලපන ලද වත්කම් වෙන් කිරීම.



# නිෂ්පාදිත ප්‍රාග්ධනය





අපගේ මෙහෙයුම්වල ප්‍රධාන ප්‍රතිෂ්ඨාව

## බැංකුව තුළ නිෂ්පාදිත මූල්‍ය ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

නිෂ්පාදිත ප්‍රාග්ධනය මගින් බැංකුවේ භෞතික හා තාක්ෂණික යටිතලපහසුකම් නියෝජනය කරන අතර, එය පහසු, නව්‍යකරණ, සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය බැංකු විසඳුම් ලබාදීම සඳහා ප්‍රධාන ප්‍රතිෂ්ඨාව ලෙස සේවය කරයි.

### අපගේ අවධානය

නිෂ්පාදිත ප්‍රාග්ධනය පිළිබඳ අපගේ අවධානය වන්නේ දිවයින පුරා ශාඛා ජාලය හා තැපැල් ජාලය සමඟ නවීන ඩිජිටල් යටිතල පහසුකම් තුළින් ශ්‍රී ලාංකීය මූල්‍ය වෙළෙඳපොලේ ඉතාම දුර ස්ථානය දක්වා ලඟාවීමයි.



### නිෂ්පාදිත ප්‍රාග්ධනය අපගේ උපායමාර්ගය හා සම්බන්ධ වන ආකාරය

- නවීන තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම්, ඩිජිටල් වේදිකා, සුහුරු ශාඛා සහ සුහුරු කලාප තුළින් අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම
- ඩිජිටල් වේදිකා සහ උසස් කළ ශාඛා ජාලය හරහා අපගේ වෙළෙඳපොල පැවැත්ම පුළුල් කිරීම සහ සේවය නොකළ වෙළෙඳපොල කරා ලඟාවීම
- අපගේ හරිත ගොඩනැගිලි සහ සූර්ය බලශක්ති ශාඛා කාබන් පාසටහන අඩු කරයි.

### අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට මූල්‍ය ප්‍රාග්ධනය සහයවන ආකාරය

නිෂ්පාදිත ප්‍රාග්ධනය බැංකුවේ වටිනාකම නිර්මාණයට සහයවෙන අතර, නවින යටිතලපහසුකම්, ඩිජිටල් වේදිකා සහ පරිසර හිතකාමි පදධති තුළින් මෙහෙයම් කාර්යක්ෂමතාව, ගනදෙනුකාර අත්දැකීම සහ නව්‍යකරණය වැඩි කරයි.

### තිරසාර කාර්යසාධනය කෙරෙහි නිෂ්පාදිත ප්‍රාග්ධනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය පරිසර කාර්‍යක්‍ෂම යටිතලපහසුකම්, ඩිජිටල්කරණය සහ සම්පත් ප්‍රශස්තකරණය ප්‍රවර්ධනය කරමින් අපගේ තිරසාර කාර්යසාධනය වැඩි කරයි. හරිත ගොඩනැගිලිවල ආයෝජනය, බලශක්ති කාර්යක්ෂම පද්ධති, සහ කඩදාසි රහිත බැංකුකරන වේදිකා පාරිසරික පාසටහන අඩුකරන අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කරයි.

### සම්බන්ධිත පාර්ශව



### ප්‍රමුඛ උපායමාර්ග සමඟ සම්බන්ධතාව

| | | | | |
|---|---|---|---|---|
| ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව | ජෛවින්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය | සේවක සහභාගිත්වය වැඩි කිරීම | ඩිජිටල් පරිනාමනය වේගවත් කිරීම | තිරසරභාවය |

### ප්‍රමාණාත්මක කරුණු

- 2 සාර්ව ආර්ථික ස්ථායිතාව හා වර්ධනය
- 4 මූල්‍ය තිරසාරභාවය
- 5 වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
- 10 නව තාක්ෂණික දියුණුව

### SDGsට දායකත්වය






## විභව්‍ය හුවමාරුවීම්

**මූල්‍ය ප්‍රාග්ධනය** (−)
ශාඛා ව්‍යාප්තිය හේතුවෙන් වැඩි වූ පිරිවැය කෙටිකාලීන ලාභදායිතාව අඩු කරයි.

**බුද්ධිමය ප්‍රාග්ධනය** (+)
ඩිජිටල් පරිනාමනය හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල ආයෝජනය

**මානව ප්‍රාග්ධනය** (−)
ඩිජිටල් පරිනාමනය සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය රැකියා උත්පාදනය අවම කිරීමට හේතු වේ.

**සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය** (+)
යටිතලපහසුකම් කෙරෙහි අවධානය ප්‍රජා සහභාගිත්වය අඩුකරයි.

**ස්වභාවික ප්‍රාග්ධනය** (+)
හරිත බැංකුකරණ යටිතල පහසුකම් කාබන් පාසටහන අඩුකරයි

බලපෑම: ධනාත්මක (+) සෘණාත්මක (−)

## තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රීයකරුවන්

1 අපගේ පැවැත්ම

2 ශාඛා ජාලය හා භෞතික යටිතලපහසුකම් ශක්තිමත් කිරීම

3 ඩිජිටල් පරිනාමනය සහ තාක්‍ෂණය ඒකාබද්ධ කිරීම

4 මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය

ඩිජිටල් ප්‍රාග්ධනය තුළ ආයෝජනය
රු. මිලියන 2,044.2.
(2023 – රු. මිලියන 350.6)

භාවිතය තුළ ඇති කාඩ් ගණන
මිලියන 1.2




NSB nextGen සන්නාම නාමය යටතේ ඩිජිටල් නිෂ්පාදන

Virtual Card

NSB PayApp

NSB e-kyc

NSB e-Post



# නිෂ්පාදිත ප්‍රාග්ධනය



## 1 අපගේ ශාඛා ජාලය

බැංකුවක් ලෙස, දිවයින පුරා අපගේ විස්තීර්ණ ශාඛා ජාලය පිළිබඳ අපට ගෞරවයක් ඇති අතර, ඒ මගින් අපගේ නිෂ්පාදන හා සේවා සෑම පළාතක්, දිස්ත්‍රික්කයක්, ප්‍රජාවක් සහ සමාජ අංශ වෙත ලඟාවෙන බවට සහතික කරයි. අපගේ ජාලය ශාඛා 262කින්, ප්‍රාදේශීය කාර්යාල 8කින්, සහ විසා සහ මාස්ටර් ඩෙබිට් කාඩ් පහසුකම් සහිත ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර/මුදල් ප්‍රතිචක්‍රියකරණ යන්ත්‍ර 417කින් සමන්විත වේ. තවද, ලංකා පේ පොදු ATM ස්විචය සමඟ හවුල්කාරත්වය දීප ව්‍යාප්ත මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs) සහ මුදල් පත්‍රිචක්‍රියකරණ යන්ත්‍ර (CRMs), ඇතුළු ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 6,000කට වැඩි විශාල ජාලයක් කරා පිවිසීම ලබා දේ.

| උතුරු පළාත | 20 | 30 | 10 |
|---|---|---|---|
| 1. යාපනය | 14 | 21 | 7 |
| 2. කිළිනොච්චිය | 1 | 2 | 1 |
| 3. මන්නාරම | 2 | 3 | 1 |
| 4. මුලතිව් | 2 | 2 | - |
| 5. වවුනියාව | 1 | 2 | 1 |

| උතුරු මැද පළාත | 15 | 21 | 4 |
|---|---|---|---|
| 6. අනුරාධපුරය | 12 | 18 | 4 |
| 7. පොළොන්නරුව | 3 | 3 | - |

| වයඹ පළාත | 27 | 41 | 11 |
|---|---|---|---|
| 8. පුත්තලම | 8 | 14 | 5 |
| 9. කුරුණෑගල | 19 | 27 | 6 |

| බස්නාහිර පළාත | 82 | 162 | 60 |
|---|---|---|---|
| 10. කොළඹ | 43 | 97 | 36 |
| 11. ගම්පහ | 27 | 48 | 19 |
| 12. කළුතර | 12 | 17 | 5 |

| දකුණු පළාත | 39 | 53 | 13 |
|---|---|---|---|
| 13. ගාල්ල | 15 | 20 | 5 |
| 14. මාතර | 13 | 19 | 4 |
| 15. හම්බන්තොට | 11 | 14 | 4 |

| මධ්‍යම පළාත | 28 | 39 | 7 |
|---|---|---|---|
| 16. මාතලේ | 4 | 6 | 2 |
| 17. නුවරඑළිය | 7 | 8 | 1 |
| 18. මහනුවර | 17 | 25 | 4 |

| නැගෙනහිර පළාත | 17 | 21 | 3 |
|---|---|---|---|
| 19. ත්‍රිකුණාමලය | 2 | 2 | – |
| 20. අම්පාර | 8 | 10 | 2 |
| 21. මඩකලපුව | 7 | 9 | 1 |

| ඌව පළාත | 13 | 21 | 6 |
|---|---|---|---|
| 22. බදුල්ල | 6 | 13 | 4 |
| 23. මොණරාගල | 7 | 8 | 2 |

| සබරගමුව පළාත | 21 | 29 | 8 |
|---|---|---|---|
| 24. කෑගල්ල | 10 | 13 | 3 |
| 25. රත්නපුර | 11 | 16 | 5 |




ශාඛා ATMs/CRMs සුහුරු කලාප

රූපය 10

අපගේ ශාඛා සහ ජාලය පිළිබඳ වැඩි විස්තර සඳහා ස්කෑන් කරන්න

## 2 ශාඛා ජාලය සහ භෞතික යටිතල පහසුකම් ශක්තිමත් කිරීම

ශක්තිමත් භෞතික පැවැත්ම විශේෂයෙන් වේගවත් ඩිජිටල් පරිනාමන යුගයක් තුළ වුවද, පුද්ගලික බැංකුකරණ සේවා පිළිබඳ විශ්වාසය තබන ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශවල ගනුදෙනුකරුවන් සඳහා මූල්‍ය අන්තර්ගතභාවය අත්‍යවශ්‍ය සාධකයක් බව බැංකුව හඳුනාගනී. දීප ව්‍යාප්ත ප්‍රවේශය, ගනුදෙනුකාර පහසුව සහ සේවා විශිෂ්ඨත්වය කරා අපගේ කැපවීම අපගේ ශාඛා ජාලය පුළුල්කිරීම සහ වැඩිදියුණු කිරීම තුළ අඛණ්ඩ ආයෝජනය තුළින් මෙහෙයවනු ලබයි.

පවත්නා ශාඛා ජාලය නවීකරණය සහ නව සේවා ආදර්ශ හඳුන්වාදීම තුළින්, බැංකුව සියලුම ශ්‍රී ලාංකිකයින් සඳහා සිය විශ්වාසී හා පිවිසිය හැකි බැංකුකරණ හවුල්කරුවෙක් ලෙස සිය කාර්යභාරය බැංකුව NSB යළි ශක්තිමත් කරමින් සිටී.

## වඩා වැඩි ලඟාවීම සඳහා ශාඛා ජාලය පුළුල් කිරීම

ඉහළ විභවතාවක් ඇති සහ මෙතෙක් සේවය නොලද ප්‍රදේශ වෙත උපායමාර්ගිකව සිය ශාඛා ජාලය පුළුල් කිරීමට බැංකුව කැපවී සිටින අතර ඒ තුළින් විශේෂයෙන් දුෂ්කර හා ග්‍රාමීය කලාපවල ගනුදෙනුකරුවන් සඳහා වඩා පුළුල් මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය තහවුරු කරයි. මෙම ව්‍යාපෘතිය මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ බැංකුවේ ප්‍රධාන රාජකාරි හා සමපාත වන අතර, විධිමත් බැංකු පද්ධතියට ඒකාබද්ධ කිරීමට සහ ආර්ථික වර්ධනය ඇති කිරීමට පුද්ගලයින් සහ ව්‍යාපාර සවිබල ගන්වයි. බැංකු සේවා නොලබන සහ සීමිත බැංකු සේවා ලබන ප්‍රජාවන් වෙත ළඟා වීම පුළුල් කරමින්, බැංකුව ඉතුරුම්, ණය පහසුකම් සහ ඩිජිටල් බැංකුකරණ විසඳුම් වැනි අත්‍යවශ්‍ය බැංකු සේවා සඳහා ප්‍රවේශ්‍යතාව බැංකුව වැඩි කරන අතර ජනතාවගෙන් විශාල කොටසකට දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වය පෝෂණය කරයි.

කෙසේවෙතත්, 2024 වසර තුළ, පැවති වෙළෙඳපොල තත්ත්වයන්, උපායමාර්ගික ප්‍රතිෂ්ඨාවන්, සහ පවත්නා මෙහෙයුම් ප්‍රශස්ත කිරීම කෙරෙහි වඩා ඉහළ අවධානය වැනි හේතු නිසා කිසිදු නව ශාඛාවක් විවෘත කර නොමැත. ඒ වෙනුවට, බැංකුව සේවා ලබාදීම, යටිතලපහසුකම් වර්ධනය, සහ ඩිජිටල් පරිනාමනය තුළ වැඩි දියුණු කිරීම් මගින් සිය පවත්නා ශාඛා ජාලය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

වර්ධිත ගනුදෙනුකාර පහසුව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කරමින් අම්පාර ශාඛාව වඩාත් උපායමාර්ගිත හා පිවිසියහැකි ස්ථානයක නැවත ස්ථානගත කිරීම මේ සම්බන්ධයෙන් සැලකියයුතු සංවර්ධනයකි.

මෙම නැවත ස්ථානගත කිරීම තුළින් සිය ශාඛා පාසටහන ප්‍රශස්ත කිරීමට බැංකුවේ අඛණ්ඩ උත්සාහයන් පිළිබිඹු කරන අතර, ඒ තුළින් භෞතික බැංකුකරණ යටිතල පහසුකම් වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා සහ ජනවිකාශ සමඟ පෙළ ගැස්වීම සිදුකරයි.

## දැනට පවතින ශාඛා ප්‍රතිසංස්කරණය හා නවීකරණය

සේවා කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සහ ගනුදෙනුකාර අත්දැකීම ඉහළ දැමීමට, කාලීන අභ්‍යන්තර අලංකරණය සහ නවීන අයුරින් සැලසුම්කළ සේවා කවුළු සමගින් සිය මොරටුව ශාඛාව උසස් කරන ලදී. මෙම නැවත සැලසුම් කිරීමෙන් කාර්ය මණ්ඩලයට හා ගනුදෙනුකරුවන්ට ඇතිවන පහසුව කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙහිදී කවුළුවල උස, වින්‍යාස සැලැස්ම, සහ පිවිසිය හැකිබව සහතික කරන අතර ඒ තුළින් විඩාව සහ පීඩාව අවමකර වඩා පහසු බැංකු අත්දැකීමක් සහතික කරයි. ඊට අමතරව, සේවා ලබාදීමට ඇතුළත් කරමින් විවිධ ආබාධ ඇති පුද්ගලයින්ට ශාඛා වෙත පිවිසීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කර ඇත.

## පරිසර හිතකාමී බැංකු අවකාශ ඒකාබද්ධ කිරීම

තිරසාරභාවය පිළිබඳ බැංකුවේ කැපවීම සමඟ පෙළ ගැසෙමින්, ශාඛා කිහිපයක හරිත ගොඩනැගිලි මූලධර්ම යොදා ගෙන ඇත.

ප්‍රතිසංස්කරණ වලට පහත දෑ ඇතුළත්ය:

- විදුලි පරිභෝජනය අඩු කිරීමට බලශක්ති කාර්යක්ෂම ආලෝකය සහ චලන සංවේදී තාක්ෂණය
- කඩදාසි භාවිතය අවම කිරීමට ඩිජිටල් ලේඛණගතකරණ පද්ධති
- පාරිසරික වගකීම්සහගත යටිතල පහසුකම් සඳහා තිරසාර ගොඩනැගිලි ද්‍රව්‍ය

ස්වභාවික ප්‍රාග්ධනය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා පිටු අංක 146 සිට 151 දක්වා බලන්න.

## 3 ඩිජිටල් පරිනාමනය හා තාක්ෂණය ඒකාබද්ධ කිරීම

වේගවත් ඩිජිටල්කරණ යුගයක් තුළ, බැංකුව සිය වර්ධනයේ හා සේවා විශිෂ්ටත්වයේ ප්‍රධාන සක්‍රියකරු ලෙස තාක්ෂණය අඛණ්ඩව වැළඳ ගනී. වෙනස්වන ගනුදෙනුකාර මනාපයන්, පහසුව සඳහා වැඩිවන ඉල්ලුම, සහ ආරක්ෂක ගනුදෙනු සඳහා අවශ්‍යතාව සඳහා ඩිජිටල් පළමු ප්‍රවේශයක් අවශ්‍ය බව බැංකුව හඳුනා ගනී. 2024 වසර තුළ, බැංකුව ඩිජිටල් බැංකු මාර්ග පුළුල් කිරීම, තොරතුරු තාක්ෂණ පද්ධති උසස් කිරීම, සහ සිය සේවා පිරිනැමීම් වැඩි කිරීමට සයිබර් ආරක්ෂක රාමු ශක්තිමත් කිරීම සිදුකරමින් බැංකුව වැදගත් පියවරක් තබා ඇත. මෙවැනි වැඩසටහන් ශ්‍රී ලංකාවේ ඩිජිටල් බැංකුකරණ විප්ලවය තුළ බැංකුව පෙරමුණේ තබා ඇති අතර ගනුදෙනුකරුවන්ට ආරක්ෂිත, පහසු, සහ නව්‍යකරණ බැංකු විසඳුම් කරා ප්‍රවේශය ඇති බව සහතික කරයි.

## ස්ථාවර වත්කම් වෙන් කිරීම

විවිධ වත්කම් වර්ගවල විස්තරාත්මක වෙන් කිරීම් ඇතුළුව අපගේ ස්ථාවර වත්කම්වල ව්‍යාප්තිය පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් පරීක්ෂාකාරී අයුරින් 302 පිටුවේ දක්වා ඇත.

**දේපල, පිරියත හා උපකරණවලට නව එකතු කිරීම්** ප්‍රස්ථාරය 33




**දේපල, පිරියත හා උපකරණවල සංයුතිය** ප්‍රස්ථාරය 34



# නිෂ්පාදිත ප්‍රාග්ධනය



## නව මධ්‍යගත බැංකුකරණ පද්ධතිය (CBS) ක්‍රියාත්මක කිරීම

අපගේ ඩිජිටල් පරිනාමන ගමන්මගේ ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස, බැංකුව 2024 දී T24 මධ්‍යගත බැංකුකරණ පද්ධතිය (CBS) සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. අභ්‍යන්තර පද්ධතියේ සිට විශ්වීය T24 CBS දක්වා මෙම පරිනාමනය සංකීර්ණ කාර්යයක් වුවත් එය සැලකියයුතු වාසි ලබාදී ඇත.

වැඩි විස්තර සඳහා බුද්ධිමය ප්‍රාග්ධනය පිටු අංක 122 බලන්න.

## මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS)

අපගේ නව මානව සම්පත් තොරතුරු පද්ධතිය යනු පරිවර්තන උසස් කිරීමක් වන අතර එය අපගේ සේවා ස්ථානයේ වෙනස්වන ඉල්ලුම සපුරාලීමට හේතුවන අතර මානව සම්පත් ක්‍රියාවලි කාර්යක්ෂම සහ ගනුදෙනුකාර කේන්ද්‍රිය බව සහතික කරයි. කාර්යසාධන ඇගයීම් නිවාඩු කළමනාකරණය වැනි එදිනෙදා කටයුතු ස්වයංක්‍රීයකරණය කරමින්, අතින් සිදුකරන දෝෂ සහ කඩදාසි භාවිතය අඩුකර ඒ තුළින් වඩා උපායමාර්ගික වැඩසටහන් සඳහා මානව සම්පත් නිදහස් බව සහතික කරයි.

වැඩි විස්තර සඳහා බුද්ධිමය ප්‍රාග්ධනය පිටු අංක 122 බලන්න.

## භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය

බැංකුව නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටී. එය උපායමාර්ගික ආයෝජනයක් වන අතර ඉන් මුදල් ප්‍රවාහ කළමනාකරණය, බැංකු සැසඳීම් සහ කෙටි සහ දිගුකාලීන බැඳීම්වල ද්‍රවශීලතාව සහතිත කිරීමට ද්‍රවශීලතා පුරෝකථනය වැනි තීරණාත්මක කාර්යයන් ස්වයංක්‍රියකරණය කරමින් මූල්‍ය මෙහෙයුම් ප්‍රශස්ත කරන ලදී.

## EPOST

තැපැල් අංශයේ ඩිජිටල් පරිනාමනය **EPOST** නිෂ්පාදනය හඳුන්වාදීම සමඟ සැලකියයුතු පියවරක් ඉදිරියට තබා ඇත. නවීන ඩිජිටල් විසඳුම් සම්ප්‍රදායික තැපැල් සේවාවන්ට ඒකාබද්ධ කිරීමට සැලසුම්කළ, EPOST තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ගනුදෙනු ක්‍රමවත් කරමින් ගනුදෙනුකාර සහභාගිත්වය වැඩි කර ඇති අතර, තැපැල් කාර්යල හරහා තත්කාලීන සන්නිවේදන සවිමත් කර ඇත. දැනටමත්, උසස්කළ ජංගම උපාංග 20ක් තෝරාගත් තැපැල් කාර්යාලවල සේවයේ යොදවා ඇති අතර, ඩිජිටල් ගෙවීම් ආරක්ෂාව වේගවත් කර කළමනාකරණය කිරීමට ක්‍රියාවලි ඉල්ලීම් සඳහා අවශ්‍ය තාක්ෂණය සමග තැපැල් කණ්ඩායම් සන්නද්ධ කෙරේ. මෙම වැඩසටහන් සේවය ලබාදීමේ රාමු නවීනකරණයට ලක් කිරීම පමණක් නොව ඒකාබද්ධ ඩිජිටල් පරිසර පද්ධතියකට මාර්ගය නිර්මාණය කරන ලද අතර තැපැල් බැංකු සේවා සීඝ්‍ර, පිවිසියහැකි බව පවත්වා ගන්නා අතර සමකාලීන ගනුදෙනුකාර අවශ්‍යතා සමඟ පෙළ ගැස්වේ.

## බැංකුයේ ඩිජිටල් බැංකු සේවා පුළුල් කිරීම

### NSB අනන්‍ය කාඩ්පත

නව්‍යකරණය සඳහා බැංකුවේ බැඳීම පිළිබිඹු කරන සුවිශේෂී සහයෝගයක් තුළ, ශ්‍රී ලංකාවේ මේ දක්වා Pay by Account (PbA) තාක්ෂණයෙන් බල ගැන් වූ පළමු මාස්ටර්කාඩ් ප්ලැටිනම් ණයපත හඳුන්වාදීම සඳහා මාස්ටර් කාඩ් සමග බැංකුව හවුල් වී ඇත. මෙම සහයෝගිතාව බැංකුවේ NSB PayApp ගෝලීය වේදිකාවට ගෙනයාම පමණක් නොව, අපගේ වටිනා ගනුදෙනුකරුවන් සඳහා ආකර්ශණීය ප්‍රදාන සමඟින් වැඩිකළ පරිශීලක අත්දැකීමක් ලබා දේ.

වැඩි විස්තර සඳහා බුද්ධිමය ප්‍රාග්ධනය පිටු අංක 122 බලන්න.

## නැවත සැලසුම්කළ බැංකුවේ අන්තර්ජාල බැංකුකරණය

අපගේ නවිකරණය කළ බැංකුවේ අන්තර්ජාල බැංකුකරණ වේදිකාවට වැඩිකළ ආරක්ෂක ලක්ෂණ, තත්‍යකාලීන ගනුදෙනු පසුවිපරම සහ ප්‍රශස්ත පරිශිලක ඇතිදැකීම සම්බන්ධකළ ඩිජිටල් බැංකුකරණය තුළ පරිවර්තනීය පියවරක් එකතු කර ඇත.

## සයිබර් ආරක්ෂාව හා දත්ත ආරක්ෂාව

වැඩිවන ඩිජිටල් හා අන්තර් සම්බන්ධ මූල්‍ය වාතාවරණයක් තුළ, සයිබර් ආරක්ෂාව සහ දත්ත ආරක්ෂාව බැංකු මෙහෙයුම්වල ආරක්ෂාව, අඛණ්ඩතාව සහ විශ්වාසය සහතික කිරීමේදි ප්‍රමුඛතාවයට පත්ව ඇත. සයිබර් ආරක්ෂාව තවදුරටත් සංකීර්ණතාව සහ පරිමාණයෙන් වෙනස්වන බැවින්, බැංකුව ගනුදෙනුකාර තොරතුරු ආරක්ෂා කිරීමට, මූල්‍ය වංචා වැලැක්වීමට, සහ ගෝලීය ආරක්ෂක ප්‍රමිති සමඟ අනුකූලතාව සහතික කිරීමට සිය සයිබර් ආරක්ෂක රාමුව සක්‍රියව වැඩි දියුණු කර ඇත.

වැඩිකළ සයිබර් ආරක්ෂක උපායමාර්ග, නවීන තාක්ෂණය, ආයෝජනය, සහ සුවිශේෂී සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (ĐOC) තුළින්, බැංකුව සයිබර් තර්ජනවලට අනුව සිය ඔරොත්තුදීම ශක්තිමත් කර ඇති අතර, ආරක්ෂක, පහසු, සහ කාර්යක්ෂම ඩිජිටල් බැංකුකරණ අත්දැකීම් ලබා දේ.

අපගේ මාර්ගගත බැංකුකරණ වේදිකා, ජංගම බැංකුකරණය සහ ගෙවීම් මාර්ග උසස් මට්ටමේ සමමිතිකකරණයෙන් සහ ආරක්ෂක පොරාතු ලේඛනවලින් සුරක්ෂිත කර ඇත. අපගේ API යෙදවුම් ආරක්ෂා කර ඇති අතර වටිනා ගනුදෙනුකාර දත්ත ආරක්ෂා කිරීමට මේස ආරක්ෂක ක්‍රියාමාර්ග ගනිමින් පවති.

බරපතල අනතුරු තක්සේරු කිරීම්, නිරන්තර විනිවිදයාමේ පරීක්ෂණ, සහ ස්ථිර පද්ධති විගණන ආරක්ෂක පරතර සක්‍රියව හඳුනාගෙන නිවැරදි කිරීමට සහය වේ. මෙම තාක්ෂණික ක්‍රියාමාර්ග ඌණපූරණය කරමින්, විස්තීර්ණ සේවක පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ආයතනය තුළ ආරක්ෂාව පිළිබඳ නිසි දැනුවත්කම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරයි.

පහත සඳහන් ක්‍රියාමාර්ග මගින් තොරතුරු ආරක්ෂාව අපි තවදුරටත් සහතික කර ඇත.

- ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය – දත්ත ආරක්ෂණ ප්‍රමිතිය (PCI DSS)
- මූලික ආරක්ෂක ප්‍රමිතිය (BSS)
- වරප්‍රසාදිත ප්‍රවේශ කළමනාකරණ පද්ධතිය
- වෙබ් යෙදුම් Firewall (WAF)
- ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණය (SIEM)
- SWIFT CSP (ගනුදෙනුකාර ආරක්ෂක වැඩසටහන)

වැඩි විස්තර සඳහා බුද්ධිමය ප්‍රාග්ධනය පිටු අංක 122 සිට 123 බලන්න.

## 4 මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය

වර්තමාන තරඟකාරී සහ තාක්ෂණය- පදනම් බැංකුකරණ වාතාවරණය තුළ, දිගු කාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා මෙහෙයුම් කාර්යක්ෂමතාව සියල්ලටම ප්‍රධාන වේ. මෙම වසරේ, අපි කාර්යක්ෂමතාව, අනුකූලතාව, සහ පිරිවැය-ඵලදායිත්වය කෙරෙහි ශක්තිමත් අවධානයක් යොමු කරමින් අපගේ පසු කාර්යාල මෙහෙයුම් ක්‍රමවත් කිරීමට සැලකියයුතු පියවර ගෙන ඇත.

### ව්‍යාපාරික පොදු ලෙජර් (EGL) ක්‍රමය

මෙම වසරේ ගමන්මඟ තුළ ප්‍රධාන වැඩසටහනක් වන්නේ උසස් ව්‍යාපාරික පොදු ලෙජර ක්‍රමයක් යොදවා ගැනීම තුළින් අපගේ පොදු ලෙජරය ස්වයංක්‍රීයකරණය කිරීමයි. මෙම පරිනාමනය උසස් කිරීම අපගේ ගිණුම් ක්‍රියාවලි ක්‍රමවත් කර ඇති අතර එමගින් අතින් සිදුකළ ඇතුළත් කිරීම් ස්වයංක්‍රීයකරණය විවිධ දෙපාර්තමේන්තු හරහා දත්ත ඒකාබද්ධ කිරීම, සහ තත්‍ය කාලීන මූල්‍ය වාර්තාකරණයට පහසුකම් ලබාදීම සිදු කෙරේ. මෙම පොදු ලෙජර් ක්‍රමය දෝෂ අඩු කිරීම, සැසැඳීම සඳහා යන කාලය අවම කිරීම පමණක් නොව වඩා උසස් උපායමාර්ගික කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට අපගේ කණ්ඩායම් සවිබලගන්වයි. පහසු දත්ත ප්‍රවාහ සහ වැඩිකළ විශ්ලේෂණය තුළින්, නියාමන වෙනස්වීම් හා වෙළෙඳපොළ ගතිකතාවන්ට ප්‍රතිචාරාත්මකව ඉක්මන් තීරණ ගැනීමට හැකියාව ඇති කරයි. අවසානයේදී, මෙම විස්තීර්ණ ස්වයංක්‍රීයකරණ උත්සායන් වැඩිවන ඩිජිටල් යුගයක් තුළ තිරසාර වාසිය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීමට බැංකුව ස්ථානගත කරයි.

### කඩදාසි රහිත බැංකු වැඩසටහන්

- මෙහෙයුම් පිරිවැය අඩු කරමින් පාරිසරික බලපෑම අවම කිරීම සඳහා කඩදාසි රහිත මුලපිරීම් දියත් කිරීම.
- වඩාත් තිරසාර බැංකු අත්දැකීමක් සඳහා විද්‍යුත් ප්‍රකාශන, ඩිජිටල් රිසිට්පත් සහ මාර්ගගත ආකෘති භාවිතා කිරීමට ගනුදෙනුකරුවන් දිරිමත් කිරීම.

වැඩි විස්තර සඳහා ස්වභාවික ප්‍රාග්ධනය පිටු අංක 150 බලන්න.

### අනාගත දැක්ම

**කෙටිකාලීන**

- ස්වයං සේවා kiosks සහිත සුහුරු ශාඛා පුළුල් කිරීම.
- වේගවත් සැකසුම් සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම.
- කෘතිම බුද්ධිය මත පදනම් වූ වංචා හඳුනාගැනීම ක්‍රියාත්මක කිරීම.
- සයිබර් ආරක්ෂණ රාමු වැඩිදියුණු කිරීම.
- සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා පුළුල් කිරීම

**මධ්‍යකාලීන සිට දිගුකාලීන**

- කඩදාසි රහිත බැංකුකරණ මුලපිරීම් පුළුල් කිරීම.
- අතත්‍ය බැංකුකරණයට පූර්ණ පරිමාණයෙන් සංක්‍රමණය වීම.
- තොරතුරු තාක්ෂණ පාලනය සහ අනුකූලතාව ශක්තිමත් කිරීම.

### නිෂ්පාදිත ප්‍රාග්ධන අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ උපායමාර්ග

| අවදානම් හා අභියෝග | බැංකුව කෙරෙහි බලපෑම | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| ප්‍රධාන බැංකු වේදිකා, ජංගම යෙදුම් හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල පද්ධති දෝෂ | සේවා ඇනහිටීම් හෝ දත්ත කඩකිරීම් හේතුවෙන් පාරිභෝගික විශ්වාසය අහිමිවීම. | නවීන, පරිමාණය කළ හැකි තාක්ෂණය සමඟ පැරණි පද්ධති උසස් කිරීම |
| යල්පැනගිය ශාඛා, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ දත්ත මධ්‍යස්ථාන | මෙහෙයුම් අසාර්ථකත්වයන් සහ වඩා ඉහළ නඩත්තු වියදම්. | භෞතික වත්කම් නිතිපතා නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම. |
| නවීන යටිතල පහසුකම් සඳහා අඩු ආයෝජනයක් කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය අඩු කරයි. | යල් පැන ගිය යටිතල පහසුකම් හේතුවෙන් ව්‍යාපාරික අවස්ථා අහිමි වීම. | පරිසර හිතකාමී සහ ඔරොත්තු දෙන යටිතල පහසුකම් සඳහා ආයෝජනය |
| ඩිජිටල් යටිතල පහසුකම් ඉලක්ක කරගත් සයිබර් ආරක්ෂණ තර්ජන | සේවා බිඳවැටීම් ගනුදෙනුකාර අතෘප්තියට සහ කීර්තිනාම හානියට හේතු වේ. | ශක්තිමත් සයිබර් ආරක්ෂක ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සහ නිරන්තර විනිවිදයාම පරීක්ෂණය |

# මානව ප්‍රාග්ධනය





අපගේ සේවකයින්, අපගේ ප්‍රමුඛතාව

## බැංකුව තුළ මානව ප්‍රාග්ධනයෙන් අදහස් කරන දෑ

මානව ප්‍රාග්ධනය අප බැංකුවේ වඩාත් වැදගත් වත්කම වන අතර, එය තරඟකාරී බැංකු ව්‍යාපාරය තුළ රඳාපැවැත්මට සහ ජය ගැනීමට අපට සහය වේ.

### අපගේ අවධානය

සංවර්ධනය සඳහා අවස්ථාවන් නිර්මාණය කරමින් ධනාත්මක හා උපකාරී සේවා පරිසරයක් පවත්වා ගැනීම කෙරෙහි අපි අවධානය යොමු කරමු.



## මානව ප්‍රාග්ධනය අපගේ උපායමාර්ගය හා සම්බන්ධ වන ආකාරය

මානව ප්‍රාග්ධනය අපගේ සියලුම පරමාර්ථවල මධ්‍යයේ පවතින අතර, අපගේ කෙටි හා දිගුකාලීන උපායමාර්ග මෙහෙයවයි. එය අපගේ සියළු අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කණ්ඩායම පොළඹවයි.

- අපගේ කණ්ඩායම වෙනස්වීම්වලට අනුවර්තනය වන අතර අභියෝග සක්‍රීයව කළමනාකරණය කරයි.
- අපගේ කණ්ඩායම අපගේ ගනුදෙනුකරුවන්ට විශිෂ්ට සේවාවක් ලබාදෙන අතර, එමඟින් තරඟකාරී වාසිය අප වෙත ලබාගනිමින් අප තිරසාර වර්ධනය වෙත මෙහෙය වයි.
- අපගේ කණ්ඩායම ශක්තිමත් පාලන රාමුවක් දරාගැනීමට කැපවී සිටී.

## අපගේ වටිනාකම් නිර්මාණයට මානව ප්‍රාග්ධනය සහයවන ආකාරය

අපගේ කණ්ඩායමේ නිපුනතා, දැනුම, සහ හැකියාවන් වැඩිකළ ගනුදෙනුකාර තෘප්තිය සහතික කර, මූල්‍ය ලාභ වැඩිකරමින් කාර්යසාධනය වර්ධනය කර ඇත.

## තිරසාර කර්යසාධනය කෙරෙහි මූල්‍ය ප්‍රාග්ධනය

අපගේ දක්ෂ සහ අනුබද්ධිත කණ්ඩායම උසස් කාර්යසාධනය සඳහා කැපවී සිටින අතර, අපගේ තරඟකරුවන්ගෙන් අපව වෙන් කර හඳුනා වෙළෙඳපොළ තුළ තිරසාර සාර්ථකත්වය ඇති කරයි.

## සම්බන්ධිත පාර්ශව



## ප්‍රමුඛ උපායමාර්ග සමඟ සම්බන්ධතාව

| | | |
|---|---|---|
| ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව | සේවක සහභාගිත්වය වැඩි කිරීම | ඓෛන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය |

## ප්‍රමාණාත්මක කරුණු

- 4 මූල්‍ය තිරසාරභාවය
- 7 කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය
- 8 අනාගතය අරමුණු කරගත් නිපුනතා
- 9 සේවක සෞඛ්‍ය, ආරක්ෂාව සහ යහ පැවැත්ම
- 15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

## SDGs ට දායකත්වය






## විභව්‍ය හුවමාරු කර ගැනීම්

**මූල්‍ය ප්‍රාග්ධනය**

− සේවක පුහුණුව සහ ප්‍රතිලාභවල වඩා ඉහළ ආයෝජනය කෙටිකාලීන ලාභ අඩු කරයි.

+ වර්ධිත සේවක ඵලදායිතාව සහ නව්‍යකරණය දිගුකාලීන ලාභදායිතාව වැඩි කළ හැක.

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**

− ස්වයංක්‍රීයකරණය හා ඩිජිටල්කරණය ශ්‍රමබලකාය ප්‍රතිව්‍යුහගතකරණයට මඟ පාදමින් මානව ප්‍රාග්ධනය කෙරෙහි විශ්වාශය මත ඔරොත්තුදීම අවම කළ හැකිය.

+ දක්ෂ ශ්‍රමබලකාය භෞතික හා තාක්ෂණික වත්කම් භාවිතයේදී කාර්යක්ෂමතාව වැඩි කරයි.

**බුද්ධිමය ප්‍රාග්ධනය**

+ සේවක වර්ධනය තුළ ආයෝජනය කිරීම මඟින් දැනුම කුසලතා සහ ආයතනයේ ප්‍රවීනතාවය වැඩි කරයි.

− පළපුරුදු සේවකයන්ගේ දැනුම් හුවමාරුව නොමැති වීම මඟින් බුද්ධිමය ප්‍රාග්ධනය දුර්වල කරයි.

**සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**

+ ශක්තිමත් සේවක සහභාගිත්වය වඩා යහපත් ගනුදෙනුකාර සම්බන්ධතා සහ ආයතනික කීර්තිනාමය පෝෂණය කරයි.

− ශ්‍රමබලකාය වෙනස්වීම් හෝ ප්‍රතිව්‍යුහගතකරණය පාර්ශ්වකරුවන් සමඟ විශ්වාසය හා සම්බන්ධතාවන්ට බලපානු ලබයි.

ධනාත්මක බලපෑම + සෘණාත්මක බලපෑම −

## තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රීයකරුවන්

1. බැංකුවේදී මානව ප්‍රාග්ධනය කළමනාකරණය
2. සේවක සහභාගිත්වය හා සන්නිවේදනය
3. පුහුණුව හා සංවර්ධනය
4. පාරිශ්‍රමිකය හා පිළිගැනීම
5. කාර්යසාධන කළමනාකරණය
6. සේවක සෞඛ්‍ය, ආරක්ෂාව සහ යහපැවැත්ම
7. විවිධත්වය, සමානතාව සහ ඇතුළත්වීම

GRI 405-1

### වර්ගය අනුව සේවකයින්

ප්‍රස්ථාරය 35




● ස්ථිර ● කොන්ත්‍රාත්/පුහුණු

### ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවකයින්

ප්‍රස්ථාරය 36




● පිරිමි ● කාන්තා

### පුහුණු පැය අනුව ස්ත්‍රීපුරුෂභාවය

ප්‍රස්ථාරය 37




● පිරිමි ● කාන්තා

# මානව ප්‍රාග්ධනය



## 1 බැංකුවේ මානව ප්‍රාග්ධන කළමනාකරණය

බැංකුවේ දී, මානව ප්‍රාග්ධන කළමනාකරණය උපායමාර්ගික කුළුණක් වන අතර, එය ආයතනික විශිෂ්ටත්වය, තිරසාර වර්ධනය, සහ දිගුකාලීන වටිනාකම නිර්මාණය මෙහෙයවයි. දක්ෂයින් පෝෂණය කිරීම, සෑම දෙනාම ඇතුළත් කිරීම සහ සේවක යහපැවැත්ම වැඩි කිරීම සඳහා දැඩි කැපවීමක් සමඟ, බැංකුව ගතික හා අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් සූදානම් කරයි. විස්තීර්ණ දක්ෂයින් අත්කර ගැනීම, නායකත්ව සංවර්ධනය, සහ අඛණ්ඩ ඉගෙනුම් මුලපිරීම් තුළින්, වෙනස්වන මූල්‍ය වාතාවරණය තුළ ජයගැනීමට බැංකුව සිය සේවකයින් සවිමත් කරයි.

කාර්යසාධන කළමනාකරණය, වෘත්තීය ප්‍රගතිය සහ සේවක සහභාගීත්වය සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් මඟින් වගවීම, නව්‍යකරණය හා ඉහළ ඵලදායිතාවය පිළිබඳ සංස්කෘතියක් ශක්තිමත් කරයි. නවීන මානව සම්පත් තාක්ෂණයන්, දත්ත පදනම් තීරණ ගැනීම, සහ ප්‍රගතිගාමී සේවා ස්ථාන ප්‍රතිපත්ති ඒකාබද්ධ කරමින්, බැංකුව සුවිශේෂී සේවාවක් ලබාදීමට සහ බැංකුවේ උපායමාර්ගික දැක්ම උසස් කිරීමට කැප වූ ඔරොත්තුදෙන, කඩිසර හා අරමුණු පදනම් සේවා බලකායක් ගොඩනැගීමේ පෙරමුණේ සිටී.

### මානව සම්පත් පාලන රාමුව

GRI 408-1 GRI 409-1

බැංකුවේදී, ආයතනික වටිනාකම් සහ නියාමන රාමු සමඟ ගැළපෙන ඉහළ කාර්යසාධන, සදාචාර හා සියලු දෙනා ඇතුළත් සේවා ස්ථානයක් නිර්මාණය සඳහා මානව සම්පත් පාලනය ප්‍රධාන ප්‍රතිෂ්ඨාව වේ. අපගේ පාලන රාමුව විනිවිදභාවය හා වගවීම සහ ජාතික කම්කරු නීති සහ ගෝලීය මනා පරිචයන් සමඟ අනුකූලතාව සහතික කිරීමට ඉතා පරීක්ෂාකාරීව සැලසුම් කෙරේ.
බඳවාගැනීම, වැටුප් ගෙවීම, කාර්යසාධන කළමනාකරණය, විවිධත්වය සහ සේවක යහපැවැත්ම නගා සිටුවමින්, බැංකුව සියලුම මානව ප්‍රාග්ධන තීරණවලදී සාධාරණත්වය හා අවංකකම පිළිබඳ ඉහළම ප්‍රමිති පිළිගනී.

අපගේ මානව සම්පත් උපායමාර්ගය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. ආයතනික අරමුණු සමඟ පෙළ ගැසීම සහතික කරමින් බැංකුවේ සේවක උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම මානව සම්පත් සංවර්ධන (HRD) අංශය වෙත පවරා ඇත. සිය මෙහෙයුම්වල විනිවිදභාවය සහ වගවීම පවත්වා ගනිමින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය මුලපිරීම් හා ප්‍රගතිය පිළිබඳ නිරන්තරව යාවත්කර විස්තරාත්මක වාර්තා ඉදිරිපත් කරයි.

### බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්ති GRI 2-23, 24 GRI 402-1

| නිර්ණායක ක්ෂේත්‍රය | දේශීය ව්‍යවස්ථාකරණය | බැංකුවේ ප්‍රතිපත්තිය |
|---|---|---|
| බැංකුවේ මානව සම්පත් කාර්යය කළමනාකරණය | අදාළ නීතිකරණයඃ සාප්පු හා කාර්යාල පනත | මානව සම්පත් ප්‍රතිපත්තිය |
| මැසිවිලි මෙහෙයවීම | ක්ෂේත්‍රයේ මනා පරිචය | මානව සම්පත් ප්‍රතිපත්තිය |
| වැටුප් හා වැටුප් නොවන ප්‍රතිලාභ | සාප්පු හා කාර්යාල සේවක පනත | සාමූහික ගිවිසුම |
| බඳවාගැනීම සහ සේවය අවසන් කිරීම | සේවය අවසන් කිරීම කම්කරු පනත | බඳවාගැනීම – අනුමත බඳවාගැනීමේ යෝජනා ක්‍රමය විනයානුකූල අවසන් කිරීම – බැංකුවේ විනය සංග්‍රහය |
| පුහුණුව | ක්ෂේත්‍රයේ මනා පරිචය | පුහුණු හා සංවර්ධන ප්‍රතිපත්තිය |
| වෘත්තීමය සෞඛ්‍ය හා ආරක්ෂාව | සාප්පු හා කාර්යාල පනත | මානව සම්පත් ප්‍රතිපත්තිය |
| මානව අයිතිවාසිකම | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | මානව සම්පත් ප්‍රතිපත්තිය |
| අල්ලස හා දූෂණය | අල්ලස් හා දූෂණ විරෝධී පනත | අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය |
| හිරිහැර කිරීම විසඳීමඃ ලිංගික/ලිංගික නොවන හිරිහැර කිරීම | දණ්ඩ නීති සංග්‍රහය | මානව සම්පත් ප්‍රතිපත්තිය |
| අභ්‍යන්තර ආරාවුල් විසඳීම | ක්ෂේත්‍රයේ මනා පරිචය | බැංකුවේ විනය සංග්‍රහය |
| කාර්යසාධන කළමනාකරණය හා අනුප්‍රාප්තික සැලැස්ම | ක්ෂේත්‍රයේ මනා පරිචය | මානව සම්පත් ප්‍රතිපත්තිය සහ චක්‍රලේඛ |

බැංකුව පසුගිය වසර පුරා කඩකිරීම් හෝ දඬුවම් කිසිවක් වාර්තා නොවී ශ්‍රී ලංකාවේ සියලුම සේවකයින්ට ආදාළ නීති හා රෙගුලාසිවලට සම්පූර්ණයෙන් අනුකූල වී ඇත.

සදාචාර කම්කරු ව්‍යවහාර දරා ගැනීමට, බැංකුව නිරන්තර අභ්‍යන්තර විගණන පවත්වා ඒවායේ සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කරන අතර, වැඩි දියුණුවන් කඩිනමින් ක්‍රියාත්මක කරයි. දැඩිව පසුබිම් පරීක්ෂාවන්, සැපයුම්කාර තක්සේරු කිරීම් සහ ගිවිසුම්ගත ආරක්ෂාවන් ළමා හෝ බලාත්කාර ශ්‍රමය නොමැතිබව සහතික කරයි. ඊට අමතරව, බැංකුව සේවක දැනුවත්කම පෝෂණය කරන අතර, සාධාරණ හා වගකීම්සහගත රැකියා ප්‍රමිති පවත්වා ගැනීමට නියාමන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

**මානව අයිතිවාසිකම්**

බැංකුවේදී, මානව අයිතිවාසිකම් වෙත අපගේ කැපවීම පසුගිය කොටසේ දක්වා ඇති පරිදි අදාළ රෙගුලාසි සහ නීති සමඟ අනුකූලතාවයෙන් ඔබ්බට ගමන් කරයි. අපි අපගේ දෛනික මෙහෙයුම්වලට මානව අයිතිවාසිකම් පිළිගෙන ඒකාබද්ධ කරන අතර, ඒ තුළින් සියලුම සේවකයින්ට ගරුත්වය ඇතිව ගෞරවයෙන් සහ සාධාරණව සලකනු ලබන බව සහතික කරයි. අපගේ ප්‍රතිපත්ති සහ ව්‍යවහාරවලින් සමාන අවස්ථා ලබාදීමට සහ වෙනස් ලෙස සැලකීම වළක්වා ගැනීමට අපගේ කැපවීම පිළිබිඹු කරන අතර සැමදෙනා සඳහාම ආරක්ෂිත සහ සියලු දෙනා ඇතුළත් පරිසරයක් පෝෂණය කරයි. දේශීය ප්‍රමිති සහ සාදාචාර අපේක්ෂාවන් සමඟ පෙළ ගැසීමේදී, අභ්‍යන්තර මෙහෙයුම්වල සිට බාහිර සහභාගිත්වයන් දක්වා අපගේ ව්‍යාපාරයේ සෑම අංශයකම මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අපි උත්සාහ ගනිමින් සිටින්නෙමු.

## දක්ෂයින් අත්කරගැනීම, රඳවා ගැනීම සහ අනුප්‍රාප්තික

GRI 202-2 GRI 401-1

### බඳවාගැනීම සහ වෘත්තීය ප්‍රගතිය

බැංකුවේදී, බඳවාගැනීම සහ වෘත්තීය ප්‍රගතිය දක්ෂ හා ක්‍රියාශීලී ශ්‍රමබලකායක් පෝෂණය කිරීමේදී මූලික වේ. අපගේ ව්‍යුහගත සහ විනිවිද බඳවාගැනීමේ ක්‍රියාවලිය නිවැරදි ප්‍රවීනතා සහ සුදුසුකම් ඇති සහ අපගේ වටිනාකම් සහ දැක්ම සමඟ පෙළ ගැසෙන පුද්ගලයින් හඳුනා ගනී. විවිධ දර්ශනයන් සමඟ අපගේ කණ්ඩායම පොහොසත් කිරීමට පළපුරුදු වෘත්තිකයින් සහ නැවුම් උපාධිධාරීන් ඒකාබද්ධ කරන විවිධ මූලාශ්‍රවලින් අපි දක්ෂයින් බඳවා ගනිමු.

බඳවාගැනීමෙන් පසු, සේවකයින්ට පැහැදිලි වෘත්තීය ගමන්මඟක් ලබාදෙන අතර, ඒවාට ව්‍යුහගත සංවර්ධන වැඩසටහන්, උපදෙස් ලබාදීම සහ නිරන්තර කාර්යසාධන ඇගයීම් තුළින් සහය වේ.

කුසලතාව අවධාරණය කරමින්, සේවකයින්ට විවිධ කාර්යභාරයක් ගවේශනය කිරීමට හා ඔවුන්ගේ ප්‍රවීණතාව පුළුල්කර ගැනීමට ඉඩදෙමින් අපි අභ්‍යන්තර ජංගමතාව ප්‍රවර්ධනය කරමු. අඛණ්ඩ ඉගෙනුම සහ අවස්ථාව පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරමින්, බැංකුව සිය ශ්‍රමබලකාය එහි සම්පූර්ණ හැකියාව කරා ළඟාවීමට සවිබලගන්වන අතර, බැංකුවේ දිගුකාලීන සාර්ථකත්වය මෙහෙයවනු ලබයි.

### බැංකුවේ බඳවාගැනීමේ ක්‍රියාවලිය




රූපය 11

### වයස හා ස්ත්‍රීපුරුෂභාවය අනුව මුළු බඳවාගැනීම්

ප්‍රස්ථාරය 38




**ස්ථිර සේවක සංඛ්‍යාව තුළ වෘත්තීමය වශයෙන් සුදුසුකම් සහිත සේවකයින්**

**531**

වසර තුළ, බැංකුව සේවකයින් 530ක් (පිරිමි 215ක් හා කාන්තා 315ක්) උසස් කරන ලද අතර 16%ක අභ්‍යන්තර ජංගමතා අනුපාතයක් සමඟ සේවකයින් 677ක් ස්ථානමාරු කරන ලදි.

### දක්ෂයින් රඳවාගැනීම

GRI 401-1

බැංකුවේ දී, අපගේ වඩාත් වටිනා වත්කම වන අපගේ සේවකයින් අපි අතිශයින් අගය කරන අතර, දක්ෂයින් ශක්තිමත් වන සහ දක්ෂ පුද්ගලයින් අපත් සමඟ සිටින පරිසරයක් පෝෂණය කිරීමට අපි කැපවී සිටිමු. සේවකයින් වෘත්තීය වර්ධනය සහ අඛණ්ඩ ඉගෙනුම, රැකියා-ජීවිත සමබරතාව සහ තරඟකාරී මූල්‍ය ප්‍රදාන තුළින් පුද්ගල යහපැවැත්ම සාක්ෂාත් කරගන්නා බව අපි සහතික කරමු. අපගේ සාකල්‍ය ප්‍රවේශය විශිෂ්ටත්වය, පක්ෂපාතිකම සහ ඉටුකිරීමට පොළඹවන අතර, බලසම්පන්න හා ප්‍රදානයන් සමඟ ඔවුන්ගේ ගමන්මඟ සකස් කරගනී.

**රඳවාගැනීමේ අනුපාතය**

**96.23%**

**2023 – 96.30%**

| වාර්ෂික පිරිවැටුම් අනුපාතය සැසඳීම | 2024 % | 2023 % | 2022 % |
|---|---|---|---|
| පිරිවැටුප | **3.77** | 3.70 | 1.90 |
| ස්වේච්ඡා පිරිවැටුම | **2.52** | 2.20 | 1.00 |

වගුව 25

**ස්වේච්ඡා පිරිවැටුප**
**2.52%**
2023 – 2.20%

**පුහුණුව සඳහා මුළු ආයෝජනය**
**රු. මිලියන 15.9**
2023 – රු. මිලියන 13.2

### අනුප්‍රාප්තික සැලසුම්කරණය

බැංකුවේ අනුප්‍රාප්ති සැලසුම්කරණ උපායමාර්ගය මගින් ප්‍රධාන කාර්යභාරයන් සඳහා ඉහළ විභව සේවකයින් හඳුනාගනිමින් හා පුහුණු කරමින් නායකත්ව අඛණ්ඩතාව සහතික කරයි. ව්‍යුහගත දක්ෂයින් තක්සේරු කිරීම්, නායකත්ව පුහුණුව, සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුළින්, බැංකුව අනාගත නායකයින්ගේ ගමන්මග පෝෂණය කරයි. නිරන්තර කාර්යසාධන ඇගයීම් සහ උපදේශන මුලපිරීම් ආයතනික අරමුණු සමඟ පුද්ගල වර්ධනය පෙළ ගැසීමට සහය වේ. මෙම සක්‍රිය ප්‍රවේශය ආයතනික ඔරොත්තුදීම ශක්තිමත් කරන අතර, බිඳවැටීම් අවම කරමින් බැංකුවේ දිගුකාලීන උපායමාර්ගික දැක්ම පවත්වා ගනී.

වසර තුළ, තීරණාත්මක ආයතනික කළමනාකරණ තනතුරු (තීරණාත්මක ව්‍යාපාර තනතුරු) ඇබෑර්තු වූ නමුත් බාහිර බඳවාගැනීම් තුළින් කඩිනමින් එය පුරවන ලදි. මේ තුළින් බැංකුවේ ශක්තිමත් අනුප්‍රාප්තික සැලසුම්කරණය පෙන්නුම් කරයි.

### නායකත්ව සංවර්ධනය

බැංකුවේදී, නායකත්ව සංවර්ධනය අපගේ ආයතනික සාර්ථකත්වයන් මෙහෙයවීමේදී අත්‍යවශ්‍යය. අපි නායකත්ව භාරය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම ප්‍රමුඛ කරන අතර එහිදී විනිවිදභාවය, වගවීම, සහ සදාචාර තීරණ ගැනීම අපගේ නායකත්ව ප්‍රවේශයේ පදනම සකස් කරයි. මෙම විශ්වාසය බැංකුවේ උපායමාර්ගික අරමුණු සමඟ ඔවුන්ගේ කණ්ඩායම් පෙළඹවීමට සහ සිය උත්සාහයන් පෙළ ගැසීමට සියලුම මට්ටම්වලදී නායකයින් සවිමත් කරයි. අපගේ නායකත්ව සංවර්ධන වැඩසටහන් මතුවන නායකයින් පෝෂණය කිරීමට ඉතා පරීක්ෂාවෙන් සැලසුම් කරන අතර, ඉලක්කගත පුහුණු සැසි, උපදේශනය, සහ අඛණ්ඩ ඉගෙනුම් වැඩසටහන් තුළින් අපගේ දැනට සිටින නායකත්ව කණ්ඩායම්වල දක්ෂතා අපි වැඩි කරන්නෙමු. මනාව ව්‍යුහගත පාලන කාලයක් පවත්වා ගනිමින්, නායකයින්ට සිය කණ්ඩායම් ඵලදායීව අධීක්ෂණය කළ හැකි බව අපි සහතික කරන අතර, අර්ථවත් සහභාගිත්වය සහ පුද්ගලගත මඟපෙන්වීම සහ පුද්ගල සහ ආයතනික සාර්ථකත්වයන් ඇතිකරන සහයෝගී සේවා පරිසරයක් පෝෂණය කරමු. මෙය ගතික සහ ප්‍රතිචාරාත්මක නායකත්ව ව්‍යුහයක් ශක්තිමත් කරන අතර, එය බැංකුවේ වර්ධනය සහ බැංකු ක්ෂේත්‍රයේ වෙනස්වන ඉල්ලුමට සහය වේ. මෙවැනි උත්සාහයන් තුළින්, බැංකුව නියාමකයින් සංවර්ධනය කිරීම අරමුණු කරන අතර, ඔවුන් අවංකකම සමඟ මෙහෙයවීමට, නවෝත්පාදනය ඇති කිරීමට සහ විශ්වාසයෙන් අනාගතය මෙහෙයවීමට ඔවුන් සවිමත් කරයි.

## 2 පුහුණුව හා සංවර්ධනය

GRI 404-1, 2, 3

ව්‍යුහගත පුහුණු හා සංවර්ධන වැඩසටහන් තුළින් අඛණ්ඩ ඉගෙනුම සහ වෘත්තීමය වර්ධනය සඳහා බැංකුව කැපවී සිටී. සේවක දක්ෂතා සහ වෘත්තීය ප්‍රගතිය වැඩි කිරීමට තාක්ෂණික, නායකත්වය හා මෘදු කුසලතාවල මුසුවක් බැංකුව පිරිනමනු ලබයි.

ගලපනලද වැඩමුළු, ඉ-ඉගෙනුම් මොඩියුල සහ බාහිර සහතික කිරීම් මගින් කාර්ය මණ්ඩලය ක්ෂේත්‍රයේ මනා පරිචයන් සහ නියාමන යාවත්කාලීන සමඟ සන්නද්ධව සිටින බව සහතික කරයි. ඉගෙනුම් සංස්කෘතියක් පෝෂණය කරමින්, බැංකුව නවෝත්පාදනය ඇති කිරීමට, සේවා විශිෂ්ඨත්වය වැඩි කිරීමට බැංකුවේ දිගු-කාලීන සාර්ථකත්වයට දායකවීමට සහ අපගේ සේවාදායකයින්ට හා පාර්ශවකරුවන්ට සුවිශේෂී වටිනාකමක් ලබාදීමට සිය ශ්‍රමබලාකය ශක්තිමත් කරයි.

### පුහුණු හා සංවර්ධන ක්‍රියාවලිය

**අවශ්‍ය නිපුනතා හඳුනා ගැනීම:**
විශේෂ කාර්යභාර හෝ ව්‍යාපාතිවල සාර්ථකත්වය සඳහා අවශ්‍ය නිපුණතා අර්ථ දැක්වීම.

↓

**පවත්නා පුහුණු මට්ටම් තක්සේරු කිරීම:**
සේවකයින්ගේ වර්තමාන හැකියාවන් ඇගයීම.

↓

**පුහුණු පරතර තීරණය කිරීම:**
අවශ්‍ය සහ පවතින නිපුනතා අතර වෙනස හඳුනා ගැනීම.

↓

**සොයාගැනීම් ඇගයීම:**
ආයතනික අවශ්‍යතා මත පදනම් වී පරතර විශ්ලේෂණය හා ඒවා ප්‍රමුඛ කිරීම.

↓

**අවශ්‍ය පුහුණු වර්ග තීරණය කිරීම:**
සුදුසු පුහුණු ක්‍රම තෝරා ගැනීම (උදා - සේවාස්ථ පුහුණු, වැඩමුළු, ඉ-ඉගෙනුම)

↓

**පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම:**
පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

↓

**පුහුණු ඵලදායිත්වය ඇගයීම:**
පුහුණුවල සාර්ථකත්වය මැනීම සහ වර්ධනයන් සිදු කිරීම.

## පුහුණු වැඩසටහන් ගණන

ප්‍රස්ථාරය 39




## ශ්‍රේණිය අනුව පුහුණු පැය

ප්‍රස්ථාරය 40




## බැංකුවේ සංක්‍රමණය හා අනාගත ශ්‍රමබලකා හැකියාවන් තක්සේරුව

බැංකුව නිපුනතා වැඩි කිරීම, නැවත ඇති කිරීම සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය තුළින් අනාගතයට සූදානම් නිපුනතා වැඩි කිරීම මගින් සක්‍රීයව ශ්‍රමබලකාය සංක්‍රමණය කළමනාකරණය කරයි. ක්ෂේත්‍රයේ වෙනස්වන ඉල්ලුම් සමඟ, මතුවන කාර්යභාරයන් සඳහා සේවකයින් සන්නද්ධ කිරීමට පුහුණුව, ඩිජිටල් සාක්ෂරතාව සහ නායකත්ව සංවර්ධනය කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු. නිරන්තර හැකියා තක්සේරු කිරීම් නිපුනතා පරතර හඳුනා ගැනීමට සහයවන අතර, ව්‍යුහගත සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරයි. ඉන් දිගුකාලීන වර්ධනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය ඇතිකරන ඔරොත්තුදෙන සහ නව්‍යකරණ ශ්‍රමබලායක් සහතික කරයි.

## 3 සේවක සහභාගිත්වය

බැංකුවේදී, සේවක සහභාගිත්වය අපගේ ආයතනික ආචාර විධිවල කේන්ද්‍රයේ පවතී. අභිප්‍රේරිත හා සම්බන්ධිත ශ්‍රමබලකායක් යනු අපගේ සාර්ථකත්වයේ කොඳුනාරටිය වන බව අපි විශ්වාස කරන අතර, සහයෝගිතාව, පිළිගැනීම සහ සවිමත් කිරීම පිළිබඳ සංස්කෘතියක් අපි සක්‍රියව පෝෂණය කරමු. නිරන්තර සන්නිවේදනය, අර්ථවත් ප්‍රතිපෝෂණය, සහ වෘත්තීමය වර්ධනය සඳහා අවස්ථාවන් තුළින්, සෑම සේවකයෙක්ම අගයකරන බව සහ ඔවුන්ට සවන්දෙන බව අපි සහතික කරමු. කණ්ඩායම් ගොඩනැගීමේ කටයුතුවල සිට යහපැවැත්ම වැඩසටහන් සහ නායකත්ව සංවර්ධනය දක්වා වන අපගේ මුලපිරීම් ලැදියාව, තෘප්තිය, සහ කැපවීම ප්‍රබෝධමත් කිරීමට සැලසුම් කෙරේ.

## වර්ගය හා ස්ත්‍රීපුරුෂභාවය අනුව පුහුණු පැය

ප්‍රස්ථාරය 41




අරමුණ සහ හිමි දේ පිළිබඳ හැඟීමක් පෝෂණය කරමින්, අපි සේවකයින් සම්බන්ධ වී සිටින පරිසරයක් නිර්මාණය කිරීම පමණක් නොව, බැංකුවේ මෙහෙවරෙහි ගැඹුරින් ආයෝජනය කරමින්, නවෝත්පාදනය සහ විශිෂ්ටත්වය එක්ව මෙහෙයවන පරිසරයක් නිර්මාණය කරමු.

සේවකයෙකුට ආදායම
**රු. මිලියන 49.6**
2023 – රු. මිලියන 53.8

සේවකයෙකුට ලාභය
**රු. මිලියන 6.3**
2023 – රු. මිලියන 1.0

මානව ප්‍රාග්ධනය ROI
**වාර 9.2**
2023 – වාර 13.4

## සේවක හඬ

බැංකුව සේවක සමීක්ෂණ, යෝජනා ක්‍රම, සහ නිරන්තර සන්නිවේදන සංසද වැනි ව්‍යුහගත මාර්ග තුළින් සිය අදහස්, ප්‍රතිපෝෂණ සහ ගැටළු හුවමාරු කර ගැනීමට සේවකයින් දිරි ගන්වයි. සිය ශ්‍රමබලකායට සක්‍රියව සවන් දෙමින්, සේවකයින් අගයකරන බව සහ සවිබලගන්වන බව ඔවුන්ට දැනෙන බව බැංකුව සහතික කරන අතර, ඒ අනුව කළමනාකරණය, නව්‍යකරණය සහ ආයතනික සාර්ථකත්වය මෙහෙයවයි. මින් අභිප්‍රේරණ ශ්‍රමබලකායක් පවත්වා ගැනීම සහ සිය ගනුදෙනුකරුවන්ට සුවිශේෂී සේවාවක් ලබාදීමේ බැංකුවේ වඩාත් පුළුල් අරමුණ සමඟ සේවක හඬ පෙළ ගැසෙන බව අවධාරණය කරයි.

තවද, බැංකුව රැස්වීමේ නිදහස, බැංකුවේ ක්‍රියාත්මක සේවක වෘත්තීය සංගම් සමඟ සාකච්ඡාවන් සහ ගිවිසගැනීම් නගා සිටුවයි. මේ තුළින් තීරණාත්මක සේවක ආශ්‍රිත තීරණවලදී විනිවිදභාවය, ධනාත්මක සම්බන්ධතා සහ සේවක සහභාගිත්වය දිරි ගන්වයි.

### රැස්වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම

GRI 2-30 GRI 407-1

සේවකයින්ට සහ ආයතනයට ප්‍රතිලාභ ලබමින් දිගුකාලීන වර්ධනය සඳහා වෘත්තීය සංගම් සහ සංවිධාන නියෝජිතයින් සමඟ සිය සම්බන්ධතාවල වැදගත්කම බැංකුව හඳුනා ගනී. කළමනාකරණය යහපත් සම්බන්ධතා සහතික කිරීමට වෘත්තීය සංගම් සාමාජිකයින් වුවද නොවූවද සියලුම සේවකයින් සමඟ විවෘත සහ නිතර සිදුවන සන්නිවේදනය ප්‍රමුඛගත කරයි. වෘත්තීය සංගම් නියෝජිතයින් සමඟ නිරන්තර මැදිහත්වීම තුළින් යහපත් තොරතුරු හුවමාරුවට ඉඩලබාදෙන අතර, අන්‍යෝන්‍ය අවබෝධය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරමින් සියලුම පාර්ශවයන්ට බැංකුවේ කටයුතු සහ අරමුණු අවබෝධ කර ගැනීමට සහය වේ.

## 4 පාරිශ්‍රමිකය හා පිළිගැනීම

GRI 201-3 GRI 202-1
GRI 401-2 GRI 405-2

බැංකුවේදී, ඉහළ දක්ෂයින් ආකර්ෂණය, රඳවාග ැනීම සහ අභිප්‍රේරණය සඳහා තරඟකාරී සහ සාධාරණ පාරිශ්‍රමිකය අත්‍යවශ්‍ය බව අපි හඳුනාගනිමු. සේවකයින්ගේ කැපවීම, ප්‍රවීනත්වය සහ කාර්යසාධනය සඳහා ඔවුන්ට ප්‍රදාන ලබාදෙන බව සහතික කරමින් අපගේ සේවකයින්ගේ දායකත්වයන් කෙරෙහි අප තබන වටිනාකම පිළිබිඹු වන ආකාරයෙන් අපගේ වැටුප් ගෙවීමේ දර්ශනය සැලසුම් කෙරේ. අපි විස්තීර්ණ පාරිශ්‍රමිකයක් පිරිනමන අතර, එයට තරඟකාරීත්වය පදනම් වැටුප පමණක් නොව කාර්යසාධනය පදනම් දිරි දීමනා, ප්‍රසාද දීමනා සහ දිගු කාලීන මූල්‍ය ප්‍රතිලාභ ඇතුළත් වේ. ඔවුන්ගේ මාසික වැටුපට අමතරව, සියලුම ස්ථිර සේවකයින් ඔවුන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව වැඩි කිරීමට සැලසුම්කළ විස්තීර්ණ මූල්‍ය ප්‍රතිලාභ රාශියකට හිමිකම් ලබයි. මෙයට වාර්ෂික වැටුප් වර්ධක, කාර්යසාධනය පදනම් ප්‍රසාද දීමනා, නිවාඩු මුදල් කිරීම සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම ඇතුළත් වේ.

බැංකුව මරණය, ස්ථිර ආබාධිතතාවය හෝ අර්ධ ආබාධිතතාවය වැනි අවස්ථාවකදී සහන ණය අනුපාත සහ ගෞරව දීමනා සහන ණය ගෙවීම් සමඟ සානුකම්පිත වන්දි ගෙවීමේ යෝජනා ක්‍රමයක් ද ලබා දේ. තවද, දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය සහ මානසික සතුට සහතික කරමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යටතේ ආවරණය කෙරෙන සාමාජික ප්‍රතිලාභවලින් සේවකයින් ප්‍රතිලාභ ලබයි. සෑම අදියරකදීම, සේවකයින්ගේ සෞභාග්‍ය හා ඉෂ්ටකිරීම කරා අපගේ කැපවීම පිළිබිඹු කරන සාකල්‍ය සහය ක්‍රමයක් පිරිනැමීමට අපි උත්සාහ දරමු. අපගේ පාරිශ්‍රමික උපායමාර්ගය ක්ෂේත්‍රයේ ප්‍රමිති හා තනිපුද්ගල ජයග්‍රහනයන් සමඟ පෙළ ගසමින්, අපි පිළිගැනීමේ සහ සාධාරණය පිළිබඳ සංස්කෘතියක් නිර්මාණය කිරීමට උත්සාහ ගන්නා අතර, ඒ තුළ සේවකයින් බැංකුවේ සාර්ථකත්වය කෙරෙහි ඔවුන්ගේ බලපෑම සැබැවින්ම අගය කරන බව හැඟී යනු ඇත.

බැංකුව විවිධ මුලපිරීම් තුළින් සේවකයින්ගේ දායකත්වයන් හඳුනාගැනීම සහ ප්‍රදාන ලබාදීම මගින් අගය කිරීමේ සංස්කෘතියක් පෝෂණය කරයි. බැංකුව කුසලතා පදනම් දිරිදීමනා, සේවා සම්මාන, වෘත්තීය වර්ධන අවස්ථා සහ කෘතඥතාව පිළිබඳ සැමදිනම හැසිරීම සමඟ කැපී පෙනෙන කාර්යසාධනය පිළිගන්නා අතර, දුෂ්කර කාර්යය හා නව්‍යකරණය නොපෙනී නොයන බව අපි සහතික කරමු. විශේෂ පිළිගැනීමේ වැඩසටහන් දිගුකාලීන සේවාව, කැපීපෙනෙන දායකත්වයන් සහ නව්‍යකරණයට ගරුකරන අතර, ක්‍රීඩා, කලාව සහ සාහිත්‍ය වැනි ක්ෂේත්‍රවල සේවක දක්ෂතා ද පිළිගනිමු. මෙවැනි මුලපිරීම්වලින් ආයතනය තුළ අගය කිරීම, අභිප්‍රේරණය සහ හිමිකාරත්වය පිළිබඳ හැඟීමක් පෝෂණය කරයි. කැපවීම සහ විශිෂ්ටත්වය අගය කරනු ලබන සේවා ස්ථානයක් ගොඩ නැගීම මගින්, බැංකුව සේවක සහභාගිත්වය, පක්ෂපාතිත්වය සහ සමස්ථ ආයතනික සාර්ථකත්වය ශක්තිමත් කරයි.

මුළු ශ්‍රම බලකාය පිරිවැය
**රු. මිලියන 20,306.1**
2023 – රු. මිලියන 486.0

බාහිර ශ්‍රම බලකාය පිරිවැය
**රු. මිලියන 20,306.1**
2023 – රු. මිලියන 16,110.5

ජාතික මට්ටමේ සම්මාන සුරක්ෂිත කරන සේවකයින් පිළිගැනීම

**අධ්‍යාපනය 4**
**ක්‍රීඩා 1**
**සෞන්දර්ය 1**

## 5 කාර්යසාධන කළමනාකරණය

GRI 404-3

අපි අපගේ කණ්ඩායම තුළ වර්ධනය සඳහා ශක්තීන් සහ ක්ෂේත්‍ර නිරාවරණය කිරීමට සැලසුම් කළ ශක්තිමත් හා විස්තීර්ණ කාර්යසාධන ඇගයීම් ක්‍රමයක් ස්ථාපිත කර ඇත. අපගේ කාර්යසාධන කළමනාකරණ රාමුව අපගේ ආයතනික පරමාර්ථ සමඟ පහසුවෙන් පෙළ ගැසීමට ඉතා පරීක්ෂාකාරීව නිර්මාණය කෙරේ. අපගේ කාර්යසාධන කළමනාකාර ප්‍රතිපත්තියේ කේන්ද්‍රය තුළ පහත දෑ කෙරෙහි අවධානය යොමු කෙරේ:

- සාර්ථකත්වය ඉදිරියට ගෙනයාමට නිපුනතා පරතර යාකිරීම
- වඩා ශක්තිමත් වඩා සංශක්ති කණ්ඩායම් ගොඩ නැගීමට නිපුනතා විෂමතාවන් හඳුනා ගැනීම සහ විසඳීම, සහ
- අපගේ කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම සහ ප්‍රශස්ත කිරීම

සෑම වසරකම, විවිධ රැකියා තලවල අසමසම ඉල්ලීම් පිළිබිඹු කරන ගලපන ලද නිර්ණායක් භාවිතා කරමින් සියලුම සේවකයින් සඳහා සමාලෝචන අපි පවත්වමු. තක්සේරු කිරීම් සාධාරණ, අදාළ සහ තනිපුද්ගල කාර්යභාරයන් සහ වගකීම් සමඟ ඍජුව ගැට ගැසී ඇති බව මින් සහතික කරයි. සාධාරණත්වය තවදුරටත් වැඩි කිරීමට සහ අපක්ෂපාතී සමබර ලකුණුකාඩ්

ප්‍රවේශයක් සේවයේ යොදවන ලද අතර එය මූලික කාර්යසාධන දර්ශක අනුව ආයතනික කළමනාකරණය ඇගයීමට ලක් කරයි. මෙම ඉලක්ක පදනම් පද්ධතියෙන් විෂය මූලිකත්වය පෝෂණය කරන අතර, සේවකයින්ගේ උත්සාහයන් බැංකුවේ ඒකායන අරමුණුවලට දායක වන ආකාරය ඔවුන්ට බලාගැනීමට හැකියාව ඇති කරයි.

මෙම ක්‍රියාවලිය තුළින්, සුවිශේෂී හැකියාවන් හා විභවතා සහිත පුද්ගලයින් හඳුනා ගැනීමට අපි සමත් වන අතර, අනාගත නායකයින් ලෙස පෝෂණය කිරීමේ අවස්ථාවන් ඔවුන්ට ලබා දේ. මේ මගින් අපගේ දක්ෂයින්ගේ ගමන්මග ශක්තිමත් කිරීම පමණක් නොව අපගේ ආයතනයේ අඛණ්ඩ වර්ධනය හා සාර්ථකත්වය සහතික කරයි.

බැංකුව 2024 තුළ කාර්යසාධන ඇගයීම් ක්‍රමය සම්පූර්ණයෙන් ස්වයංක්‍රිය කර ඇත.

කාර්යසාධන ඇගයීම් තුළ සේවකයින් 4.183ක් සහභාගි වී ඇත.

පිරිමි 1.898ක හා කාන්තා 2.285ක ඇගයීම්

## 6 වෘත්තීමය සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුහසාධනය

GRI 403-1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10

බැංකුව ආරක්ෂිත සේවා පරිසරයක් පෝෂණය කරමින් සිය සේවකයින්ගේ සෞඛ්‍යාරක්ෂාව සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීමට දැඩිව කැපවී සිටී. ජාතික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රතිපත්තිය, සාප්පු හා කාර්යාල පනත සහ අදාළ සංශෝධනවලට සහ ගෝලීය වශයෙන් පිළිගත් ආරක්ෂක ප්‍රමිතිවලට දැඩිව අනුකූල වෙමින්, බැංකුව දැඩි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අතර, උපරිම ආරක්ෂක ප්‍රමිති නගා සිටුවීමට නිරන්තර අවදානම් තක්සේරු කිරීම් පවත්වනු ලබයි.

දැනුවත්කම සහ සූදානම්වීම පිළිබඳ සංස්කෘතියක් ගොඩ නැගීමට, බැංකුව විස්තීරණ පුහුණු වැඩසටහන් පිරිනමන අතර, ඒ තුළින් සේවා ස්ථාන උවදුරු ඵලදායිව හඳුනාගෙන අවම කිරීමේ ප්‍රවීනතානව සමඟ සේවකයින් සවිබල ගන්වයි. තවද, මූලපිරීම් තුළින් බැංකුව සේවක ශුභසාධනය ප්‍රමුඛ කරන අතර ඒ තුළින් මානසික යහපැවැත්ම, කාර්යක්ෂම හා ඵලදායී සේවා ස්ථාන, ගුණාත්මක වෛද්‍ය ආරක්ෂාව සඳහා පහසු ප්‍රවේශය ප්‍රවර්ධනය කරන අතර, සෞඛ්‍ය සහ ඵලදායිතාව යන ද්විත්වයම ප්‍රමුඛ කරන සේවා ස්ථානයක් සහතික කරයි.

**සෞඛ්‍ය හා ආරක්ෂක විස්තර**

| සිදුවීම් | 2024 | 2023 |
|---|---|---|
| වෘත්තීමය අනතුරු | 9 | 7 |
| වැඩකරන දින අහිමිවීම | 433 | N/A |
| වැඩ අදාළ තුවාල | Nil | Nil |

වගුව 26 →

## රැකියා-ජීවිත සමබරතාව

රැකියා-ජීවිත සමබරතාව වැඩිකරන සහ සේවකයින් අතර මිත්‍රත්වය ශක්තිමත් කරන සමාජීය හා විනෝදාත්මක කටයුතු ප්‍රවර්ධනය කරමින් උනන්දු සහ සහභාගී සේවා ස්ථාන සංස්කෘතියක් පෝෂණය කිරිමට බැංකුව කැපවී සිටී. මෙවැනි වැඩසටහන් ධනාත්මක හා එකමුතු සේවා පරිසරයක් ගොඩ නැගිමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. බැංකුවේ වර්ණ රාත්‍රිය, වෙසක් බැති ගී, නත්තල් කැරොල්, සහ අලුත් අවුරුදු උත්සවය වැනි උත්සව වාර්ෂික සම්ප්‍රදායන් සුරකින වැඩසටහන් ලෙස සේවය කරයි. මෙවැනි උත්සව තුළින්, එක්සත්කම සහ හිමිකාරත්වය පිළිබඳ හැඟීමක් පෝෂණය කිරිම පමණක් නොව සේවක සුභසාධනය හා සේවා ස්ථාන අත්දැකීම ඉටුකිරිම කරා එහි කැපවීම ශක්තිමත් කරයි.

මීට අමතරව, බැංකුව අපගේ කණ්ඩායමේ රැකියා-ජීවිත සමබරතාව ප්‍රවර්ධනය කිරිමට පහත සඳහන් සුභසාධන හා විනෝදාත්මක පහසුකම් ලබා දේ.

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද රෝහලක් මගින් ක්‍රියාත්මක අංග සම්පූර්ණ අභ්‍යන්තර වෛද්‍ය මධ්‍යස්ථානයක් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන අතර එය මසකට දෙවරක්, උපදෙස් ලබා දෙන විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත වේ.
- සේවකයන්ට ගුණාත්මක සෞඛ්‍යාරක්ෂාව කරා පහසු ප්‍රවේශය සහතික කරමින්  ප්‍රධාන කාර්යාලයේ දී වෛද්‍ය සායන පැවැත්වීමට ප්‍රධාන පෞද්ගලික රෝහල් සමඟ බැංකුව සහයෝගයෙන් කටයුතු කරයි.
- සුභසාධන අංශය මගින් පීඩන කළමනාකරණය, ඇස් ආරක්ෂාව, සහ හෘදවාහිනී රෝග නිවාරණය ඇතුළුව අත්‍යවශ්‍ය සෞඛ්‍ය හා යහපත පිළිබඳ මාතෘකා සම්බන්ධයෙන් ප්‍රවීන සම්පත් දායකයින් විසින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ සහ දේශන සංවිධානය කරයි.
- සුභසාධන අංශය මගින් සනීපාරක්ෂාව සහ තත්ත්ව ප්‍රමිති අධීක්ෂණය සහිත සහනදායක මිලට ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාවෙන් පෝෂණීය ආහාර පිරිනමයි.
- බැංකුවේ ක්‍රීඩා සමාජය සේවකයින්ගේ මළල ක්‍රීඩා කුසලතා පෝෂණය කර ගැනීමට දිරිග න්වන අතර විවිධ ක්‍රීඩා කටයුතු තුළින් යහපත් තරඟකාරිත්වයක් ඇති කිරීමට දිරි ගන්වයි.
- බැංකුවේ ක්‍රීඩා සමාජය විසින් කළමනාකරණය කරන අභ්‍යන්තර ව්‍යායාම් ශාලාව ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන අතර සේවක යෝග්‍යතාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරයි.
- සේවකයින්ගේ දැනුම සහ වෘත්තීය ප්‍රවීනතාව වර්ධනය කිරීමට ඔවුන්ට සහයවන මනාව සපිරුණු පුස්තකාල පහසුකම් ලබා දේ.
- බැංකුවේ කලා කවය විසින් නාට්‍ය, චිත්‍රපට සහ සංගීත සංදර්ශන වැනි සංස්කෘතික හා විනෝදාස්වාද උත්සව සංවිධානය කරමින් සේවා ස්ථාන පළපුරුද්ද පොහොසත් කරයි.



# මානව
# ප්‍රාග්ධනය



## මැසිවිලි විසඳීම

බැංකුව සාධාරණ හා විනිවිද මැසිවිලි විසඳීම මේ රාමුවක් ක්‍රියාවට නංවා ඇති අතර, ඉන් මෙවැනි ගැටළු ඵලදායීව විසඳීමට විවිධ ස්ථාන සේවකයින්ට පිරිනමයි. බැංකුව ව්‍යුහගත ප්‍රවේශයන් වන "පියවර ඉනිමඟ පද්ධතිය" අනුගමනය කරන අතර එහිදී කාලීන සහ සුදුසු විසඳීම සහතික කිරීමට නිශ්චිත ධූරාවලියක් තුළින් මැසිවිලි සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි. මෙයට සමාන්තරව, "දොර විවෘත ප්‍රතිපත්තිය" ක්‍රියාවට නංවා ඇත. ඉන් මානව සම්පත් කමිටුව විසින් පත්කළ ස්වාධීන පාර්ශ්වයකට තම අදහස සෘජුව ඉදිරිපත් කිරීමට සේවකයාට ඉඩ ලැබෙන අතර, අපක්ෂපාතිත්වය සහ රහස්‍යතාව සහතික කරයි. හැකි සෑම අවස්ථාවකදීම "පියවර ඉනිමඟ පද්ධතිය" තුළින් විසඳුම් සෙවීමට සේවකයින් දිරි ගන්වන අතර, යාන්ත්‍රණ දෙකම උපකාරී සහ සාධාරණ වැඩ පරිසරයක් පෝෂණය කිරීමේ බැංකුවේ අත්‍යවශ්‍ය කුළුණක් ලෙස සේවය කරයි. ක්‍රියාවලිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

**පියවර ඉනිමඟ පද්ධතිය**




**දොර විවෘත ප්‍රතිපත්තිය**




රූපය 12

බැංකුව කාන්තා සේවිකාවන් විසින් මුහුණපාන ගැටළු විසඳීම සඳහා විශේෂයෙන් නිර්මාණය කළ විශේෂිත මැසිවිලි නිරාකරණ කමිටුවක් ස්ථාපිත කර ඇත. කාන්තා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්ගෙන් සමන්විත මෙම කමිටුව ගැටළු විසඳීම සඳහා උපකාරී, සහකම්පන, සහ අවබෝධාත්මක පරිසරයක් සහතික කරයි. මෙම වැඩපියවර මෙහෙයවීමට කාන්තාවන් සවිබල ගන්වමින්, බැංකුව ස්ත්‍රීපුරුෂ සමානතාව සහ සියලු දෙනා ඇතුළත් බව සහ සියලුම දෙනාගේ හඬට සවන්දෙන සහ අගය කරන සේවා ස්ථානයක් පෝෂණය කිරීම කරා එහි කැපවීම තහවුරු කරයි.

මානව සම්පත් කමිටුව තුළින් නිරාකරණය කළ මැසිවිලි ගණන

**29**

## සේවා ස්ථානයේ හිරිහැර කිරීම නොරිස්සීම GRI 406-1

බැංකුවට කිසියම් ආකාරයක සේවා ස්ථාන හිරිහැර කිරීම සඳහා ශුන්‍ය ඉවසුම් මට්ටමක් ඇති අතර ඒවා සේවකයාගේ මානව අයිතිවාසිකම් කඩකිරීමක් ලෙස මෙන්ම ඔහුගේ/ඇයගේ බරපතල මානසික සෞඛ්‍ය ගැටළු ඇති කරන පෞද්ගලික ගරුත්වය පිළිබඳ ප්‍රශ්න ලෙස දකී.

එම නිසා, බැංකුවට එවැනි අවස්ථා සිදුවීම වැලැක්වීමට දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇත.

ගනුදෙනුකරුවන්, වෙළෙන්ඳන්, වෙනත් සේවකයින්, හෝ අමුත්තන් ඇතුළුව බැංකුවේ යම් පාර්ශ්වකරුවන්ට හිරිහැර කිරීම සේවකයින්ට අතිශයින් තහනම් කර ඇත. උසස්වීම්, වැටුප් වර්ධක, ස්ථානමාරු, හෝ යම් සමාන පොරොන්දු සඳහා ප්‍රතික්‍රියා ලෙස යටත් සේවකයෙකුට හිරිහැර කරන හෝ කැමතිවන ලෙස බලකරන (ලිංගික කැමැත්ත ඇතුළුව) යම් සේවකයෙක් සම්බන්ධව බැංකුවේ විනය සංග්‍රහ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. යම් සේවකයෙක්ට ඔහු/ඇය හිරිහැරකිරීමට හෝ වෙනස් ලෙස සැලකීමට ලක්වන බව දැනුනහොත්, එම ගැටළුව සමඟ කටයුතු කිරීමට බැංකුවට පැහැදිලි ක්‍රියාපටිපාටියක් ඇත.

වෙනස් ලෙස සැලකීම සම්බන්ධ පැමිණිලි ගණන:

**0**

## තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය

දූෂණය හෝ වංචාව වාර්තා වූ විට කොන් කිරිම හෝ පහකිරිමට එරෙහිව සේවකයින් ආරක්ෂා කිරිමට සැලසුම්කළ, මෙම ප්‍රතිපත්තියට වැලැක්වීම, මුලින් හඳුනා ගැනීම, වාර්තාකරණය, නියාමනය, අයකිරිම, සහ පසුවිපරම් ක්‍රියාමාර්ග ඇතුළත්ය. ඉන් සේවකයින්ට විශ්වාසය සපයන අතර, ගිණුම්කරණ අක්‍රමිකතා, විගණන විෂමතා, බලහත්කාරය, කුමන්ත්‍රණය, දූෂණය, අභ්‍යන්තර පාලන කඩකිරීම්, මූල්‍ය වැරදි වාර්තාකරණය, වංචාව, වැරදි පරිහරණය හෝ වෙනත් විෂමාචාරයන්ට අදාළ යම් තොරතුරු දැනුම්දීම උපරිම අවංකව සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූලව විසඳනු ලැබේ. ඒ සමඟම, ආයතනය තුළ විනිවදභාවය, වගවීම සහ විශ්වාසය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරමින් තොරතුරු දැනුම්දෙන්නා සඳහා ශක්තිමත් අනාගත ආරක්ෂාව සහතික කරයි.

## 7 විවිධත්වය, සමාන අවස්ථාව සහ ඇතුළත් වීම GRI 405-1

බැංකුවේ දී විවිධත්වය, සමාන අවස්ථාව සහ ඇතුළත්වීම මූලික උපායමාර්ගයන් වන අතර, ඉන් සෑම පුද්ගලයෙකුම අගයකරන බව, ගරුකරන බව සහ සවිමත්කරන බවට හැඟීමක් ඇති කරන සේවා ස්ථානයක් නිර්මාණය කිරිමට බැංකුවේ කැපවීම මෙහෙයවයි. ස්ත්‍රීපුරුෂභාවය, ජාතිය, වයස, සහ පසුබිම යන සියලුම ආකාරයේ විවිධත්වයන් වැළඳ ගනිමින්, බැංකුව නව්‍යකරණ සහ සහයෝගී සංස්කෘතියක් පෝෂණය කරයි. සියලුම සේවකයින්ට ජයගැනීමට සහ ඔවුන්ගේ සම්පූර්ණ හැකියාවන්ට ළඟාවීමට ඔවුන් සවිබල ගන්වමින් අවස්ථා, සම්පත්, සහ සහය සඳහා සියලුම සේවකයින්ට සාධාරණ ප්‍රවේශය ඇති බව සමානතාව සහතික කරයි. සියලුම දෙනාට සවන්දෙන බව සහ ගරුකරන බව සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කර ගන්නා බව සහතික කරන බැංකුවේ ආචාරවිධිවල කේන්ද්‍රයේ ඇතුළත් වීම පවතී.

ඉලක්කගත වැඩසටහන්, ප්‍රතිපත්ති සහ පුහුණුව තුළින්, බැංකුව විවිධත්වය පිළිග න්නා, සාධාරණත්වය ප්‍රවර්ධනය කරන, සියලු දෙනාට අයත් බවට හැඟීමක් ගොඩනගන සේවා ස්ථානයක් කරා බැංකුව පෙරමුණ ගනී.

අපගේ කණ්ඩායම විවිධ පුද්ගලයින්ගෙන් සමන්විත වන අතර, ඔවුන් විවිධ ජාතීන්ට, ආගම්වලට, අයත් සහ ස්ත්‍රී පුරුෂ මෙන්ම කායික ශක්තීන් සහිත වන අතර, මෙවැනි විවිධතාවන් හමුවේ සෑම දෙනාටම අපි සමාන අවස්ථාවන් ලබා දෙන්නෙමු. නව සේවකයන් බඳවා ගැනීම සඳහා රැකියා විස්තර පළ කිරීමේදී එය හැකිතාක් අපක්ෂපාතී ලෙස පළකිරීමට බැංකුව සෑම උත්සහයක්ම දරයි. අපගේ උසස්වීම් ප්‍රතිපත්තිය ද අපගේ කණ්ඩායම තුළ යම් වෙනසක් කරා ඇති නැඹුරුව ඉවත් කරයි.

### වර්ගය සහ වයස මත පදනම්ව සේවක සංඛ්‍යාව

| වර්ගය | ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය | කළමනාකරුවන් | විධායකයින් | මාණ්ඩලික සහකාර | කාර්යාල සහයක | එකතුව |
|---|---|---|---|---|---|---|
| අවුරුදු 25ට අඩු | – | – | – | 1 | 4 | 5 |
| අවුරුදු 25-40 | 1 | 167 | 803 | 1,619 | 408 | 2,998 |
| අවුරුදු 40-50 | 11 | 224 | 264 | 159 | 157 | 815 |
| අවුරුදු 50-60 | 16 | 194 | 80 | 33 | 42 | 365 |
| **මුළු ගණන** | 28 | 585 | 1,147 | 1,812 | 611 | 4,183 |

වගුව 27

### තීරණ ගැනීමේ තනතුරුවල තාරුණ්‍ය දායකත්වය

| ශ්‍රේණිය | 2024 | 2023 | වෙනස |
|---|---|---|---|
| සහකාර සාමාන්‍යාධිකාරී | 1 | – | 1 |
| ප්‍රාදේශීය කළමනාකරුවන් | – | – | – |
| ශාඛා කළමනාකරුවන් | 78 | 97 | (19) |
| වෙනත් ප්‍රධානී/ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | 123 | 94 | 29 |
| **මුළු ගණන** | **202** | 191 | 11 |

වගුව 28

### කාන්තා නායකත්වය

| ශ්‍රේණිය | 2024 | 2023 | වෙනස |
|---|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 3 | 3 | – |
| සහකාර සාමාන්‍යාධිකාරී | 10 | 8 | 2 |
| ප්‍රාදේශීය කළමනාකරුවන් | 2 | 3 | (1) |
| ශාඛා කළමනාකරුවන් | 96 | 99 | (3) |
| වෙනත් ප්‍රධානී/ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | 130 | 144 | (14) |
| **මුළු ගණන** | **241** | 257 | (16) |

වගුව 29

GRI 401-3

ප්‍රසූත නිවාඩු ලබාගත් සේවිකාවන් ගණන

**172**

ප්‍රසූත නිවාඩු ලබාගැනීමෙන් පසු ආපසු සේවයට පැමිණි සේවිකාවන් ගණන

**172 (100%)***



## මානව සම්පත් අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ උපායමාර්ග

| අවදානම් හා අභියෝග | බැංකුව කෙරෙහි බලපෑම | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| දක්ෂයින් රඳවා ගැනීම | ඉහළ පිරිවැටුම දැනුම අහිමිවීමට හා බඳවාගැනීමේ පිරිවැයට හේතු වේ. | වැඩිකළ සේවක වටිනාකම් කොටස අභ්‍යන්තර උසස්වීම් අවස්ථා, සහ තරඟකාරී ප්‍රතිලාභ |
| නිපුනතා පරතර හා සේවා ස්ථාන අනුවර්තනතාව | අඩුකළ ඵලතායිතාව සහ ක්ෂේත්‍රයේ වෙනස්වන ඉල්ලුම සපුරාලීමේ දුෂ්කරතාව | අනාගත කාර්යභාරයන් සඳහා සේවකයින් සූදානම් කිරීමට කුසලතා වැඩි කිරීම, නැවත ඇති කිරීම, සහ නායකත්ව පුහුණු වැඩසටහන් |
| වෙනස කළමනාකරණය | වෙනස්වීමට ප්‍රතිරෝධය නියමිත ඉලක්ක සාක්ෂාත් කර නොගැනීමට හෝ අර්ධ ලෙස සාක්ෂාත් කරගැනීමට හේතු වේ. | වසර තුළ, නව මධ්‍යගත බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කළ අතර, කාර්යසාධන ඇගයීම් ස්වයංක්‍රිය කර ඇත.<br><br>පද්ධතිවල ක්‍රියාකාරිත්වයන් පිළිබඳ අඛණ්ඩ පුහුණ පැවැත්වීම |
| වෙනස්වන නියාමන පරිසරය | අනුකූල නොවීමේ අවදානම්, වියහැති දඩ, සහ මෙහෙයුම් අකාර්යක්ෂමතාවන් | නියාමන වෙනස්වීම් සමඟ පෙළ ගැසීමට නිරන්තර අනුකූලතා පුහුණු සහ ප්‍රතිපත්ති යාවත් කිරීම් |

### අනාගත දැක්ම

**කෙටි කාලීන**

- සේවක සහභාගීත්වය සහ රඳවා ගැනීමේ උපාය මාර්ග ශක්තිමත් කිරීම
- කාර්ය මණ්ඩලය අතර ඩිජිටල් සාක්ෂරතාවය සහ තාක්ෂණය භාවිතා කිරීම වැඩි දියුණු කිරීම
- නායකත්ව සංවර්ධන මුලපිරීම් පුළුල් කිරීම

**මධ්‍යම සිට දිගු කාලීන දක්වා**

- අඛණ්ඩ ඉගෙනීමේ සහ නවෝත්පාදන සංස්කෘතියක් ඇතුළත් කිරීම
- නැගී එන කර්මාන්ත අවශ්‍යතා සඳහා ශ්‍රම බලකා සැලසුම් දියුණු කිරීම
- කර්මාන්ත පරිවර්තනය සමඟ පෙළගැසී අනාගතයට සූදානම් ශ්‍රම බලකා කණ්ඩායමක් ගොඩනැගීම
- මානව ප්‍රාග්ධන කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම සඳහා AI සහ ස්වයංක්‍රීයකරණය උපයෝගී කර ගැනීම
- දිගුකාලීන වර්ධනයක් ඇති කිරීම සඳහා ඉහළ කාර්යසාධන සංස්කෘතියක් පවත්වා ගැනීම
- බැංකු අංශයේ තෝරාගත් සේවායෝජකයෙකු ලෙස හීර් ස්ථාපිත කිරීම

# බුද්ධිමය ප්‍රාග්ධනය





අපගේ දැනුම සහ සන්නාම ශක්තිය

## බැංකුව තුළ බුද්ධිමය ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනය මගින් සාමූහික ප්‍රවීනත්වය, නවෝත්පාදන හැකියාව, සහ දැනුම පදනම් වත්කම් මූර්තිමත් කරන අතර, අපගේ උපායමාර්ගික සහ තරඟකාරී වාසිය ඉදිරියට ගෙන යයි. එය අපගේ ශ්‍රමබලකායේ නිපුනතා සහ තීක්ෂණ බුද්ධියද, අපගේ ක්‍රියාවලියන් හා නවෝත්පාදන තුළ ඇතුළත් බුද්ධිමය දේපල සහ අඛණ්ඩ වර්ධනය හේතුවන ආයතනික ඉගෙනුම් ඇතුළත් වේ.

### අපගේ අවධානය

අඛණ්ඩ ඉගෙනුම, නවෝත්පාදනය හා දැනුම හුවමාරුව පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම.



### බුද්ධිමය ප්‍රාග්ධනය අපගේ උපායමාර්ගය හා සම්බන්ධ වන ආකාරය

අපගේ දිගුකාලින උපායමාර්ගයේ ඇතුළත් බුද්ධිමය ප්‍රාග්ධනය තුළින් පහත පරිදි අපව ශක්තිමත් කරයි:

- නවෝත්පාදනය, කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය වර්ධනය පෝෂණය කරයි
- ක්ෂේත්‍රයේ අභියෝග හඹායමින් වෙනසට ඵලදායීව අනුවර්තනය වීම
- අඛණ්ඩව සුවිශේෂී බැංකුකරණ අත්දැකීම ලබාදීම හා ගනුදෙනුකාර පක්ෂපාතිකම සහ විශ්වාසය ශක්තිමත් කිරීම.
- වෙළෙඳපොල තුළ බැංකුව වෙනස් කොට දැක්වීම

### අපගේ වටිනාකම් නිර්මාණයට බුද්ධිමය ප්‍රාග්ධනය සහයවන ආකාරය

දැනුම, නවෝත්පාදනය හා විශ්වාසය මගින් අර්ථදක්වන යුගයක, අපගේ ව්‍යූහගත හා කීර්තිනාම ප්‍රාග්ධනයේ ශක්තිය මූල්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛයෙකු ලෙස බැංකුවේ තත්ත්වය තහවුරු කරයි.

### තිරසාර කාර්යසාධනය කෙරෙහි බුද්ධිමය ප්‍රාග්ධනය

දිගුකාලීන තිරසාර සාර්ථකත්වයන් ඇති කිරීමට අපගේ මූල්‍ය සහ මූල්‍ය නොවන කාර්යසාධනය වැඩි කිරීමට අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය අපි අඛණ්ඩව ආයෝජනය කර පුළුල් කරමු.

### සම්බන්ධිත පාර්ශවකරුවන්



### ප්‍රමුඛ සමඟ සම්බන්ධතාව

| | | | |
|---|---|---|---|
| ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව | ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය | සේවක සහභාගිත්වය වැඩි කිරීම | ඩිජිටල් පරිනාමනය වේගවත් කිරීම |

### ප්‍රමාණාත්මක කරුණු

2 සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය

4 මූල්‍ය තිරසාරභාවය

7 කුසලතා රඳවා තබා ගැනීම සහ කළමනාකරණය

8 අනාගතය අරමුණු කරගත් නිපුනතා

10 නව තාක්ෂණික දියුණුව

12 ඩිජිටල් සාක්ෂරතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතා

15 පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

### SDGs දායකත්වය






## විභව්‍ය හුවමාරුවීම්

**මූල්‍ය ප්‍රාග්ධනය**

පර්යේෂණ සහ සංවර්ධනය තාක්ෂණය තුළ ආයෝජන කෙටිකාලීන ලාභදායිතාව අඩුකරයි. (−)

නව්‍යකරණයේ ඉහළ පිරිවැය මූල්‍ය සම්පත් පීඩාවට පත්කළ හැකිය. (−)

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**

වැඩිකළ ඩිජිටල්කරණය භෞතික යටිතලපහසුකම් මත විශ්වාසය අඩු කරයි. (+)

**මානව ප්‍රාග්ධනය**

ස්වයංක්‍රියකරණට ශ්‍රමබලකායේ සමතිරික්තතාව අවශ්‍ය වියහැක. (−)

සේවක සංවර්ධනය ප්‍රවීනතාව සහ නව්‍යකරණය වැඩි කරයි. (+)

**සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**

දත්ත පදනම් බැංකුකරණය ගනුදෙනුකාර අත්දැකීම වැඩි කරනු ලැබුවද මානව මැදිහත්වීම අඩුකළ හැකිය. (−)

**ස්වභාවික ප්‍රාග්ධනය**

තාක්ෂණය යොදා ගැනීම බලශක්ති පරිභෝජනය හා ඉ-අපද්‍රව්‍ය වැඩිකළ හැකිය. (−)

ඩිජිටල් පරිනාමනය කඩදාසි භාවිතය අඩුකර තිරසාරභාවය වැඩි කරයි. (+)

ධනාත්මක බලපෑම (+) | සෘණාත්මක බලපෑම (−)

## තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රීයකරුවන්

| | |
|---|---|
| 1 | ව්‍යූහගත ප්‍රාග්ධනය |
| 2 | උපාය දැනුම |
| 3 | කීර්තිනාම ප්‍රාග්ධනය |

සන්නාම වටිනාකම:
**රු. බිලියන 23** (2023)

සන්නාම ශ්‍රේණිගතකරණය:
**AA** (2023)

වසර 10ට වැඩි සේවා කාලයක් සහිත සේවකයින්:
**1,895**
2023 - 1,916

ණය යෝග්‍යතාව:
**AAA**
2023 - AAA

ඩිජිටල්කරණය තුළ ආයෝජනය:
**රු. බිලියන 2.0**
2023 - රු. බිලියන 0.4



## 1 ව්‍යූහගත ප්‍රාග්ධනය

ව්‍යූහගත ප්‍රාග්ධනය යන්නෙන් ආයතනිකමය දැනුම, ක්‍රියාවලි, තාක්ෂණයන්, සහ පාලන රාමු නියෝජනය කරන අතර එය බැංකුවේ කාර්යක්ෂමතාව, නව්‍යකරණය, සහ සේවා විශිෂ්ඨත්වය ඇති කරයි. බැංකුව කඩිසරකම, අවදානම් ඔරොත්තුදීම, සහ සුපිරි සේවා ලබාදීම සහතික කිරීමට සිය අභ්‍යන්තර පද්ධති අඛණ්ඩව සකස් කරයි.

### ක්‍රියාවලි හා ක්‍රියාපටිපාටි

අප විසින් කාර්යක්ෂමතාව, නියාමන අනුකූලතාව සහ පහසු ගනුදෙනුකාර අත්දැකීමක් ඇති කිරීමට අපගේ මෙහෙයුම් වැඩප්‍රවාහ ක්‍රමානුකූලව වැඩි කර ඇත. බැංකුවේ සේවා ලබාදීම වේගවත්, ආරක්ෂිත සහ අනාගත අවශ්‍යතාවන්ට ගැලපෙන බව සහතික කිරීම සඳහා ස්වයංක්‍රියකරණය, විශ්ලේෂණ සහ අඩු ක්‍රමවේදයන් වැළඳගනිමින් ක්‍රියාවලි නවීකරණය පිළිබඳ උපායමාර්ගයක් බැංකුව යොදා ගෙන ඇත.

### අඩු කළමනාකරණය තුළින් ක්‍රියාවලි ප්‍රශස්තකරණය

බැංකුවේ දී, ක්‍රියාවලි ප්‍රශස්තකරණය කරා අපගේ කැපවීම අඩු කළමනාකරණ ශිල්ප ක්‍රමය පිළිබඳ අපගේ උපායමාර්ගික යොදා ගැනීම තුළ ඇතුළත් කරන අතර, එය මෙහෙයුම් ක්‍රමවත් කිරීමට, අකාර්යක්ෂමතාවන් ඉවත් කිරීමට, සහ සමස්ත කඩිසරකම වැඩි කිරීමට අපව සවිබල ගන්වයි. විස්තරාත්මක වටිනාකම් ප්‍රවාහ අනුරූපනය පවත්වමින්, අගය එකතු නොකල කටයුතු හඳුනාගෙන ඉවත් කිරීමට ගනුදෙනුකරුවන් ඇතුළත් කිරීම සහ ගනුදෙනු පිරිසැකසුමේ සිට පසු කාර්යාල ක්‍රියාවන් දක්වා අපගේ වැඩ ප්‍රවාහවල සෑම පියවරක්ම අපි ඉතා පරීක්ෂාකාරීව විශ්ලේෂණය කරන්නෙමු. මෙම අඛණ්ඩ වර්ධනීය ප්‍රවේශය ක්‍රියාවලි සරල කිරීම පමණක් නොව ගතවන කාලය වේගවත් කිරීම සහ පිරිවැය ඉතුරුම් ඇති කරයි.

### සම්මතකරණය හා ක්‍රියාවලි අත්පොත්

අපගේ ක්‍රියාවලි පරික්ෂාකාරීව සම්මතකරණය තුළින් මෙහෙයුම් විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීමට බැංකුව කැපවී සිටී. මේ සඳහා, අපි යාවත්කාලීන කරන ලද ක්‍රියාවලි අත්පොත් සහ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOPs) අඩංගු මධ්‍යගත ඩිජිටල් සුරක්ෂිතාගාරයක් සංවර්ධනය කර ඇත්තෙමු. මෙම සුරක්ෂිතාගාරය ශාඛා සහ අංශ හරහා සියලුම කාර්ය මණ්ඩලයට තනි බලයලත් මගපෙන්වීමේ මූලාශ්‍රයක් ලෙස සේවය කරන අතර, සෑම කණ්ඩායම් සාමාජිකයෙක්ටම නවීන ක්‍රියාපටිපාටි සහ මනා පරිචයන් කරා ක්ෂණික ප්‍රවේශය ලබාදෙන සහතික කරයි. මෙවැනි ද්‍රව්‍ය ඩිජිටල්කරණය කිරීම මගින්, අපි අනුරූප සහ ප්‍රමිතිගත සේවාවන් ලබාදෙන අතර, විවිධත්වය අඩුකර, විවිධ ස්ථාන අතර දෝෂ අවම කරමු. තවද, ඩිජිටල් වේදිකාව තත්‍ය කාලීන යාවත් කිරීම්, පිටපත් පාලනය සහ ප්‍රතිපෝෂණ ශක්තිමත් කරමින් අඛණ්ඩ ඉගෙනුමට හා වර්ධනයට සහය වේ. මෙසේ, ක්‍රියාවලි වර්ධනයන්ට දායකවීමට සේවකයින් සවිබල ගන්වයි.

### තාක්ෂණය හා නව්‍යකරණය

තාක්ෂණය හුදෙක් සහය කාර්යයක් පමණක්ම නොව සංක්‍රමණයේ උපායමාර්ගික සක්‍රියකරුවෙක් ද වන බව බැංකුව හඳුනාගනී. 2024 දී, ඩිජිටල් ඔරොත්තුදීම ශක්තිමත් කිරීමට, නව්‍යකරණය ඇති කිරීමට සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය සේවා ලබාදීම ඉහළ දැමීමට අපගේ තාක්ෂණික මාර්ග සිතියම අපි පුළුල් කළෙමු.

### නව මධ්‍ය බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

අපගේ ඩිජිටල් සංක්‍රාන්ති ගමන්මගේ කොඳුනාරටියක් ලෙස, බැංකුව 2024 දී Temenos T24 මධ්‍ය බැංකුකරණ පද්ධතිය (CBS) සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. අභ්‍යන්තර වර්ධන පද්ධතියක සිට විශ්වීය T24 CBS වෙත සංක්‍රාන්තිය සැලකියයුතු අභියෝගයක් වූ අතරම, මෙම කාර්යය මගින් සැලකියයුතු ප්‍රතිලාභ අත්කරගෙන ඇත.

විමධ්‍යගත බැංකුකරණ පද්ධතියක සිට T24 CBS ක්‍රියාත්මක කිරීම මගින් බැංකුවේ මෙහෙයුම් පරිවර්තනය කර ඇති අතර, ඉන් වර්ධිත කාර්යක්ෂමතාව, පරිමාණ හැකියාව සහ ගනුදෙනුකාර තෘප්තිය පිරිනමන ලදී. සංක්‍රාන්තියට උත්සාහයන් අවශ්‍ය වුවද, දිගුකාලීන ප්‍රතිලාභ, අභියෝග වලට වඩා බෙහෙවින් වැඩිවන අතර, ඩිජිටල් යුගය තුල තිරසාර වර්ධනයක් සහ තරඟකාරීත්වයක් සඳහා බැංකුව සූදානම් කරයි. එවැනි විශාල පරිමාණයේ පරිවර්තනයකට ආවේණික සංකීර්ණතාවන් හමුවේ, බැංකුව ප්‍රධාන පද්ධතිය ඵලදායීව ස්ථාපිත කර ඇති අතර අනෙකුත් තීරණාත්මක මුලපිරීම් ඉදිරියට ගෙන යාම සඳහා උපායමාර්ගිකව ස්ථානගත කර ඇත.

### මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS)

බැංකුවේ දැනට කෙරීගෙන යන ඩිජිටල් සංක්‍රාන්තියේ සහ අනාගතයට සූදානම් ශ්‍රමබලකායක් ගොඩ නැගීම සඳහා කැපවීමේ කොටසක් ලෙස, 2024 දී නව මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) හඳුන්වාදීම මගින් බැංකුව සිය මානව ප්‍රාග්ධනය කළමනාකරණය කරන, සහයවන, සහ සම්බන්ධ කරන ආකාරය පිළිබඳ තීරනාත්මක විතැන්වීමක් සිදුකර ඇත. මෙම උසස්කිරීමෙන් නවීන මනා පරිචයන් සමඟ මානව සම්පත් මෙහෙයුම් පෙළගැසීමට බැංකුවේ උපායමාර්ගය පිළිබිඹු කරන අතර, විනිවිදභාවය, සවිබලගැන්වීම සහ අඛණ්ඩ සංවර්ධනය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරයි.

නව මානව සම්පත් තොරතුරු පද්ධතිය සේවකයින් සවිමත්කිරීමේ මූලධර්මය වටා ගොඩ නගනු ලබයි. සියලුම ශාඛාවන් සහ අංශ අතර සේවකයින්ට පහසුවෙන් මානව සම්පත් සේවා කරා පිවිසියහැකි බව සහතික කරමින් ඩෙස්ක්ටොප් තුළින් පිවිසිය හැකි පරිශීලක හිතකාමී අතුරු මුහුණතක් ඉන් පිරිනමයි.

කාර්යසාධන ඇගයීම්, පැමිණීම පරීක්ෂාව, නිවාඩු ඉල්ලීම් සහ සේවක වාර්තා කළමනාකරණය වැනි තීරණාත්මක මානව සම්පත් ක්‍රියාවලි සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රිය කර ඇත. මේ තුළින් අතින් සිදුකළ කඩදාසි වැඩ සැලකියයුතු ලෙස අඩුකර ඇති අතර, මානව දෝෂ අවම කර, පිරිසැකසුම් කාලය වේගවත් කර ඇත. ඒ තුළින් සිය අවධානය ගනුදෙනුමය කාර්යයන්වල සිට උපායමාර්ගික ශ්‍රමබලකා සංවර්ධනයට විතැන් කිරීමට මානව කණ්ඩායමට ඉඩ ලබා දේ.

ශක්තිමත් දත්ත ආරක්ෂක ප්‍රොටෝකෝල සමඟ ගොඩනගන ලද, මෙම පද්ධතියෙන් කාර්යභාරයන් හා වගකීම් මත පදනම් වී සේවක දත්ත සඳහා සීමිත ප්‍රවේශය සමඟ ආරක්ෂිතව ගබඩා කරන බව සහතික කරයි.

### NSB වර්චුවල් කාඩ්පත

නව්‍යකරණය පිළිබඳ බැංකුවේ අඛණ්ඩ භාගයාම තහවුරු කරන හවුල්කාරත්වයන් පුරෝගාමී වෙමින්, Pay by Account (PbA) තාක්ෂණය මගින් බල ගැන් වූ ශ්‍රී ලංකාවේ මේ දක්වා පළමු මාස්ටර්කාඩ් ප්ලැටිනම් ණය පත දියත් කිරීමට මාස්ටර් කාඩ් සමඟ බැංකුව අත්වැල් බැඳ ගනී. මෙම සහයෝගිතාව බැංකුවේ NSB PayApp ගෝලීය වේදිකාවට ගෙනයාම පමණක් නොව, අපගේ වටිනා ගනුදෙනුකරුවන් සඳහා ආකර්ශණීය ප්‍රදාන සමඟින් වැඩිකළ පරිශීලක අත්දැකීමක් ලබා දේ.

නව්‍යකරණ Pay by Account (PbA) තාක්ෂණය මගින් බල ගැන් වූ මාස්ටර්කාඩ් ණය පත හඳුන්වාදීම ඩිජිටල් ගෙවීම් හැකියාවන් හී සැලකියයුතු පිම්මක් නියෝජනය කරන අතර, ගෙවීම් පරිසර පද්ධතිය තුළ ගණනය කළ නොහැකි අවස්ථාවන් සඳහා දොර විවෘත කර ඇත. ඩිජිටල් බැංකුකරණ සේවාවන් හී ඩිජිටල් දැනුමක් සහිත සහ නව පරිශීලකයින්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීමට ගලපන ලද විස්තීර්ණ ඩිජිටල් හැකියාවන් සහිත මෙතෙක් පළමු වර්චුවල් කාඩ්පත විවෘත කරමින් බැංකුව ශ්‍රී ලංකාවේ වෙළෙඳපොල මෙහෙයවනු ලබයි.

මෙය ඉ-වාණිජ්‍ය, QR සහ සබඳතා රහිතව විවෘත ගෙවීම් පරිසර පද්ධතිය තුළ පහසු ගෙවීම්වලට පහසුකම් සලසමින් විවිධ මූල්‍ය උපකරණ සංකේතනය කිරීමට බැංකුවේ ගනුදෙනුකරුවන් බලය ලබා දේ.




### ගෙවීම් කාඩ් ක්ෂේත්‍රයේ දත්ත ආරක්ෂක ප්‍රමිතිය (PCI DSS)

PCI DSS යනු ප්‍රධාන කාඩ් යෝජනා ක්‍රමවලින් සන්නාමකළ හර/බැරපත් මෙහෙයවන ආයතන සඳහා තොරතුරු ආරක්ෂණ ප්‍රමිතියකි. එය ගෙවීම්පත් ආරක්ෂාව සඳහා වඩාත් පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතිවලින් එකක් වන අතර, එය කාඩ් මෙහෙයුම් හා අදාළ තොරතුරු පද්ධති සඳහා

විශේෂිත තාක්ෂණික හා මෙහෙයුම් පාලනයන් මත පදනම් වේ. වර්තමානයේ, ගනුදෙනුකරුවන්ට බැංකුව විසින් මාස්ටර්කාඩ් සහ වීසා සන්නාමණය කාඩ් ලබාදෙන අතර, PCI DSS විසින් කාඩ්හිමියන්ගේ දත්තවල ආරක්ෂාව සහතික කරයි. 2024 දී, බැංකුව PCI DSS සහතික කිරීමේ නව පිටපතට අනුකූලවීමට පියවර ආරම්භ කර ඇත.

## මූලික ආරක්ෂක ප්‍රමිතිය (BSS)

බැංකුව 2024 දි සිය ශාඛා ජාලය හරහා BSS ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා පරිගණක හදිසි සූදානම් කණ්ඩායම, සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ශ්‍රී ලංකා CERT|CC) සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (SLBA) විසින් තොරතුරු ආරක්ෂාව සඳහා ගෝලිය වශයෙන් පිළිගත් ISO 27000 ජාත්‍යන්තර ප්‍රමිති මාලාව මත පදනම් වී තොරතුරු ආරක්ෂාව කළමනාකරණය පිණිස BSS ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

## වරප්‍රසාදගත් ප්‍රවේශ කළමනාකරණ පද්ධතිය

බැංකුව විශ්වාසයට හේතුවන සොරකම සහ වරප්‍රසාද අවභාවිතය මගින් ඇතිකළ තර්ජනවලින් ආරක්ෂා වීමට වරප්‍රසාදලත් ප්‍රවේශ කළමනාකරණය ක්‍රියාත්මක කරයි. වරප්‍රසාදලත් ප්‍රවේශ කළමනාකරණය යන්නෙන් විස්තීර්ණ සයිබර් ආරක්ෂක උපායමාර්ගයක් අර්ථවත් වන අතර, එය ව්‍යවසාය තොරතුරු තාක්ෂණ පරිසරයක සියලුම මානව සහ මානව නොවන වරප්‍රසාදලත් අනන්‍යතා සහ කටයුතු පාලනයට, නියාමනයට, ආරක්ෂා කිරීමට සහ විගණනය සඳහා සේවකයින්, ක්‍රියාවලි, සහ තාක්ෂණයෙන් සමන්විත වේ.

## වෙබ් යෙදුම් Firewall (WAF)

අපි සිදුවීම් නියාමනය ශක්තිමත් කරමින් 2024 දි WAF හි හැකියාව වැඩි කළෙමු. වෙබ් යෙදුම සහ අන්තර්ජාලය අතර HTTP ගනුදෙනුව පේරණය සහ නියාමනය කරමින් වෙබ් යෙදුම් ආරක්ෂා කිරීමට WAF සහය වේ. එය වෙනත් කරුණු අතර හරස් අඩවි ව්‍යාජ ලේඛණ සැකසීම, හරස් අඩවි පිටපත්කරණය (XSS), ගොනු ඇතුළත් කිරීම සහ SQL ඇතුළත් කිරීම වැනි ප්‍රහාරවලින් වෙබ් යෙදුම් ක්‍රමානුකූලව ආරක්ෂා කරයි.

## ආරක්ෂක තොරතුරු හා සිදුවීම් කළමනාකරණය (SIEM)

බැංකුව 2024 දී සිය ආරක්ෂක තොරතුරු හා සිදුවීම් කළමනාකරණය වැඩි දියුණු කරන ලදී. ආරක්ෂක ලෝකය තුළ, ලොග් එකතු කරන, ඒවා නිරීක්ෂණය කරන සහ විය හැකි ආරක්ෂක පද්ධති පිළිබඳ ඇඟවීම් ජනනය කරන ප්‍රාථමික පද්ධතිය යනු ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණ (SIEM) විසඳුමකි.

## SWIFT ගනුදෙනුකාර ආරක්ෂක වැඩසටහන (CSP)

අපි 2024 සඳහා සාර්ථකව SWIFT CSP අවශ්‍යතා සමඟ අනුකූල වුවෙමු. Swift's ගනුදෙනුකාර ආරක්ෂක වැඩසටහන, පුළුල් මූල්‍ය ජාලයේ අඛණ්ඩතාව ආරක්ෂා කිරිම සදහා සයිබර් ප්‍රහාරවලට එරෙහිව අපගේ ආරක්ෂාව යාවත්කාලීන සහ ඵලදායී බව සහතිකකිරීමට අපට උපකාරී වේ.

## පාලනය හා අවදානම් කළමනාකරණය

බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනය ශක්තිමත් පාලනය හා සක්‍රිය අවදානම් කළමනාකරණය පිළිබඳ සංස්කෘතියක් විසින් දැඩිව තහවුරු කර ඇත. මෙවැනි පදනම් නියාමන අනුකූලතාව පවත්වා ගැනීම සඳහා පමණක් නොව මෙහෙයුම් අඛණ්ඩතාව, පාර්ශවකාර විශ්වාසය හා තිරසාර වර්ධනය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. බැංකුවේ ශක්තිමත් රාමු, පද්ධති, සහ අධීක්ෂණ යාන්ත්‍රණ විසින් සියලුම කාර්යයන් හරහා අවදානම් ඵලදායීව හඳුනාගෙන, තක්සේරු කර, අවමකර සහ නියාමනය කරන බව සහතික කරයි.

## ඒකාබද්ධ අවදානම් කළමනාකරණ (IRM) රාමුව

අපගේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ (IRM) රාමුව ශක්තිමත් ආරක්ෂක ත්‍රිත්ව මාර්ග ආදර්ශය මගින් මෙහෙයවන උපායමාර්ගික සැලසුම්කරණය හා දෛනික මෙහෙයුම් හරහා අවදානම් දැනුවත්භාවය ඇතුළත් කර ඇත. බැංකුව වෙනස්වන ආර්ථික හා ඩිජිටල් වාතාවරණය පිළිබිඹු කිරිමට සිය අවදානම් රුචි රාමුව නිවැරදි කළ අතර, නිරන්තර පීඩන පරීක්ෂණ හා ක්‍රියාදාම සැලසුම්කරණය පවත්වමින් ගෝලීයව මතුවන නිරාවරණවලට අනුකූලව කාලගුණයට අදාළ අවදානම් නියාමනය කිරීමට උත්සාහයන් ආරම්භ කර ඇත.

## සයිබර් ආරක්ෂණ පාලනය

බැංකුව සිය ඩිජිටල් පාසටහන් පුළුල් කිරීම අඛණ්ඩව සිදුකරන බැවින්, සයිබර් ආරක්ෂාව සිය බුද්ධිමය ප්‍රාග්ධන පදනමට අත්‍යවශ්‍ය උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස මතු වි ඇත. වෙනස්වන තර්ජන වාතාවරණය හඳුනා ගනිමින්, බැංකුව බහු ස්ථර සයිබර් ආරක්ෂක උපායමාර්ගයක් යොදා ගෙන ඇති අතර, ඒ තුළින් දත්ත ආරක්ෂාව, ගනුදෙනුකාර රහස්‍යතාව සහ පද්ධති අඛණ්ඩතාව සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවන, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව සහ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව (ITSC) වර්තමාන හා අනාගත ඉල්ලුම සපුරාලන තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා යටිතලපහසුකම් ලබාදීමට කැපවී සිටින අතර, කාර්යක්ෂම මෙහෙයුම් කළමනාකරණය සහතික කරයි. ආරක්ෂිත, පහසු සහ කාර්යක්ෂම ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීමේ බැංකුවේ පරමාර්ථයට සහයවිම සඳහා, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව නියාමන රාමුව තුළ බැංකුව පුරා පාලන ප්‍රමිතීන් හා උපායමාර්ග ක්‍රියාත්මක කර ඇත.

බැංකුව අභ්‍යන්තර හා ආංශික තර්ජන අවම කිරිමට සියලුම පරිශීලකයින් හා උපාංගවල අඛණ්ඩ සත්‍යාපනය බල ගන්වමින් ශූන්‍ය විශ්වාස නිර්මාණ ශිල්පයක් යොදා ගෙන ඇත. සයිබර් ඔරොත්තුදීම වැඩි කිරීමට, බැංකුව පියින් මියුලේෂන් සහ අනිවාර්ය පුහුණුව ඇතුළුව පුළුල් සේවක සයිබර් හයිජීන් දියත් කරන ලද අතර, සයිබර් ආරක්ෂක විගණන සහ ISO/IEC 27001 ප්‍රමිතිවලට අනුකූලව විනිවිදයාමේ පරීක්ෂණය සිරිත් පරිදි පවත්වනු ලබයි.

## බුද්ධිමය ප්‍රාග්ධනය හා ඒකාබද්ධ චින්තනය

බැංකුවේ දි, අපි අපගේ ව්‍යාපාර මෙහෙයුම් සහ අපගේ පාර්ශවකරුවන් කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ සාකල්‍ය ප්‍රවේශයක් සඳහා උපායමාර්ගය, පාලනය හා කාර්යසාධනය ඒකාබද්ධ කරයි. මෙම ක්‍රියාවලිය තුළ, උපාය දැනුම, ප්‍රවීනත්වය, සහ නිපුනතාවන්ගෙන් සමන්විත, අපගේ බුද්ධිමය

# බුද්ධිමය ප්‍රාග්ධනය



ප්‍රාග්ධනය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. වඩා යහපත් තීරණ ගැනීම සඳහා අඛණ්ඩවම බැංකුවේ සියලුම අංග පෙළ ගැස්වීමට අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය අපි අඛණ්ඩව භාවිතාකර, කළමනාකරණය කර සංවර්ධනය කරමු.

**අපගේ ප්‍රතිඥාවන්**

- අපගේ ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීමට නව නිෂ්පාදන සංවර්ධනය කිරීමට අපි නිහඬ දැනුම සහ නව්‍යකරණ චින්තනය භාවිතා කරමු.
- අපගේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි බැංකුවේ සෑම මට්ටමකදීම නියාමන අනුකූලතාව බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සහතික කරයි.
- මනාව ස්ථාපිත සන්නාමයන් හා ශක්තිමත් කීර්තිනාමය බලපෑම්සහගත සමාජ වගකීම් මුලපිරීම් තුළින් සමාජය සමඟ සම්බන්ධවීමට අපට හැකියාව ලබා දේ.
- අපගේ ආයතනික සංස්කෘතිය දැනුවත් මූල්‍ය හා මූල්‍ය නොවන තීරණ ගැනීමට අපව සවිමත් කරයි.
- විශ්වාසය හා වගවීම පෝෂණය කරමින් අපගේ පාර්ශවකරුවන්ට බුද්ධිමය ප්‍රාග්ධනය තුළ අපගේ ශක්තීන් හා වර්ධනය කළ යුතු ක්ෂේත්‍ර විවෘතව සන්නිවේදනය කරමින් අපි විනිවිදභාවය පවත්වා ගනිමු.

## 2 නිහඬ දැනුම

නිහඬ දැනුම යනු අස්පෘශ්‍ය නමුත් බැංකුවේ මානව නිර්මාණය තුළ ඇතුළත් අත්හල නොහැකි ප්‍රවීනතාවයයි. එයට නිපුනතා, පළපුරුද්ද, අන්තර්ඥාණය, සහ වසර ගණනාවක සේවය තුළ සංවර්ධනය කළ සේවක අවබෝධයන් ඇතුළත් වේ. මෙවනි වර්ගයේ බුද්ධිමය ප්‍රාග්ධනය අඛණ්ඩතාව පවත්වා ගැනීමේදී, නව්‍යකරණය ඇති කිරීමේදී, සහ වැඩිවන ඩිජිටල් හා නියාමන පරිසරය තුළ බැංකුවේ අනුවර්තන හැකියාව ශක්තිමත් කිරීමේදී තීරණාත්මක වේ. මෙම දැනුම ලේඛනගතකිරීම සෑමවිටම දුෂ්කරවන බැවින්, එය ගනුදෙනුකාර සම්බන්ධතා හැඩගැස්වීමේදී, අවදානම් කළමනාකරණ උපායමාර්ග නැවත සකස් කිරීමේදී, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමේදී, සහ ව්‍යාපාර කඩිසරකම වැඩි කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

බැංකුව ව්‍යුහගත උපදේශන වැඩසටහන්, හරස් කාර්ය සහයෝගිතාව, නායකත්ව සංවර්ධන වැඩසටහන් තුළින් නිහඬ දැනුම රඳවාගැනීම සහ මාරු කිරීම සහ අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් සක්‍රියව පෝෂණය කරයි. ඊට අමතරව, බැංකුව තීරණාත්මක අවබෝධයන් ග්‍රහනය කර ගැනීමට හා බෙදාහැරීමට ඩිජිටල් වේදිකා සහ දැනුම හුවමාරු ක්‍රම භාවිතා කරන අතර, ආයතනික දැනුම සුරකින බවට සහ උපායමාර්ගික වාසිය සඳහා භාවිතා කරන බවට සහතික වේ.

සිය සේවකයින්ගේ සාමූහික ප්‍රවීනතාව වර්ධනය කරමින්, ගනුදෙනුකරුවන්ට, පාර්ශවකරුවන්ට සහ වඩා පුළුල් ප්‍රජාවට තිරසාර වටිනාකම ලබා දෙමින් වෙනස්වන මූල්‍ය වාතාවරණය තුළ ඉදිරියට යාමට බැංකුව කඩිසරව, නව්‍යකරණ සහ මනාව සන්නද්ධ වී සිටී.

වසර 20කට වැඩි පළපුරුද්ද සහිත සේවකයින්
**333**

වසර 10කට වැඩි පළපුරුද්ද සහිත සේවකයින්
**1,895**

වෘත්තීමය වශයෙන් සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය
**531**

පුහුණු වියදම
**රු. මිලියන 15.9**

## 3 කීර්තිනාම ප්‍රාග්ධනය

කීර්තිනාම ප්‍රාග්ධනය යන්නෙන් බැංකුවේ විශ්වාසනීයත්වය, සදාචාර හැසිරීම, සහ ආයතනික අවංකකම පිළිබඳ සාමූහික අනුබෝධය නියෝජනය කරයි. එය අනුරූප ලබාදීම, විනිවිදභාවය සහ පාර්ශවකාර සහභාගිත්වය තුළින් දශක ගණනාවක් පුරා ගොඩ නගන අතර, තරඟකාරී මූල්‍ය සේවා අංශය තුළ ශක්තිමත් වෙනස්කරන්නෙක් ලෙස සේවය කරයි.

### විශ්වාසදායී සන්නාමයක්

මූල්‍ය ක්ෂේත්‍රය තුළ විශ්වාසය, ස්ථාවරත්වය සහ විශිෂ්ටත්වය පිළිබඳ ප්‍රමුද්‍රාවක් ලෙස බැංකුවේ සන්නාමය පෙනී සිටින අතර, ප්‍රමුඛ හා ආරක්ෂිත බැංකු ආයතනයක් ලෙස සිය තත්ත්වය ශක්තිමත් කරයි. බැංකුවේ සන්නාමය මූල්‍ය ශක්තිය, ගනුදෙනුකාර විශ්වාසය, සහ ජාතික ආර්ථික සංවර්ධනයට නොසැලෙන බැඳීම පිළිබඳ දශක ගණනාවක් තුළ ගොඩනැගී ඇත.

අපගේ කීර්තිනාමය විශ්වාසදායී බැංකු විසඳුම් අනුරූපීව ලබාදීම, සදාචාර ව්‍යාපාර ව්‍යවහාර සහ සහ ශක්තිමත් පාලන ප්‍රමිති, මගින් හැඩ ගස්වනු ලැබේ. අපගේ වෙළෙඳපොළ පැවැත්ම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, නව්‍යකරණ ඩිජිටල් බැංකු සේවා, ගනුදෙනුකාර කේන්ද්‍රීය මුලපිරීම් සහ උපායමාර්ගික හවුල්කාරත්වයන් තුළින් සන්නාම සංවර්ධනය තුළ අපි අඛණ්ඩව ආයෝජනය කරමු.

ශක්තිමත් සන්නාම අනන්‍යතාවක් පවත්වා ගනිමින්, බැංකුව ගනුදෙනුකාර පක්ෂපාතිත්වය තියුණු කිරීම පමණක් නොව පාර්ශවකාර විශ්වාසය ද ශක්තිමත් කරයි. ඒතුළින් දිගුකාලීන තිරසාරභාවය සහ වෙනස්වන මූල්‍ය වාතාවරණය තුළ තරඟකාරී වාසියක් සහතික කරයි.

- සියලුම තැන්පතු හා ඒවායේ පොළිය හිමිකම් දරා ගැනීමට අසමසම රජයේ ඇපවීම ආරක්ෂාව තහවුරු කරයි.
- සන්නාමය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ඉතුරුම් බැංකුවක් ලෙස විශ්වාසය සමඟ තුල්‍යාර්ථික වේ.
- ලංකා ශ්‍රේණිගතකරණ ආයතනය (LRA) විසින් AAA ණය ශ්‍රේණිගතකරණ
- බොහෝ මූල්‍ය හා මූල්‍ය නොවන සන්ධිස්ථාන අත්කරගෙන තිබීම
- දිවයින පුරා පුළුල් ජාලය වඩා පුළුල් ලඟාවීමක් ලබා දේ.

රු. බිලියන 23ක් වටිනා "NSB" සන්නාමය හිමිකම Brand Finance Sri Lanka (2023) අනුව ශ්‍රී ලංකාවේ වඩාත් වටිනා 7ත් වැනි සන්නාමය වේ.

2024 වසර තුළ, අපගේ සන්නාමය අපගේ ගනුදෙනුකාර මනස තුළ කාවැද්දීම පිණිස අපි මුලපිරීම් කිහිපයක් දියත් කරන ලදී. ප්‍රජාව තුළ සමාජ සත්කාර (CSR) වැඩසටහන් 143 සිට 145 දක්වා පිටුවල දැක්වේ)

මෙම ඩිජිටල් යුගය තුළ, සමාජ මාධ්‍ය මගින් සන්නාම කොටස හැඩගැස්වීමේදී සහ ගනුදෙනුකාර සහභාගිත්වය ශක්තිමත් කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙය හඳුනා ගනිමින්, පසුගිය වසරට සාපේක්ෂව සමස්ත වර්ධනය සාක්ෂාත් කර ගනිමින් අපගේ සමාජ මාධ්‍ය පැවැත්ම අපි පුළුල් කර ඇත.

### CSR සහ මූල්‍ය අන්තර්ගතභාවය

බැංකුවේ ආයතනික සමාජීය වගකීම්සහගත වැඩසටහන් මගින් කාන්තා ව්‍යවසායකයින් සවිබලගන්වමින් සහ සිසුන් අතර ඉතුරුම් පුරුද්ද පෝෂණය කරමින් මෙතෙක් සේවය නොකල ප්‍රදේශවල මූල්‍ය සාක්ෂරතා පරතරය යාකිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙවැනි වැඩසටහන් ප්‍රජාවන් නගා සිටුවීම පමණක් නොව ලාභයෙන් ඔබ්බට අරමුණක් සහිත බැංකුවක් ලෙස බැංකුවේ ප්‍රතිරූපය ශක්තිමත් කරයි.

වැඩි විස්තර සඳහා පිටු අංක 143 සිට 145 දක්වා ප්‍රජා ප්‍රාග්ධනය බලන්න.




රූපය 13

## සම්මාන සහ පිළිගැනීම්

2024 දී, අපගේ විශ්වාසනීයත්වය සහ ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය තවදුරටත් වැඩි කරමින් අපගේ ශක්තිමත් පදනම මත අපි අඛණ්ඩව ගොඩ නැගුවෙමු. ක්ෂේත්‍රය තුළ අපගේ පැවැත්ම අපගේ වර්ධනීය කීර්තිනාමය ශක්තිමත් කරමින් සම්මානිත පුරෝගාමීන් විසින් පිළිගෙන ඇත.




**Pinnacle Sri Lanka 2024**

- 2024 වසර සඳහා විශිෂ්ටතම ගනුදෙනුකාර සේවා සපයන බැංකුව
- 2024 වසර සඳහා විශිෂ්ටතම කාන්තා ඉතුරුම් සැලැස්ම
- 2024 වසර සඳහා විශිෂ්ඨතම විධායක නිලධාරී (සමස්ථ අංශය)




**TAGS සම්මාන 2024**

- රාජ්‍ය බැංකු අංශය - රිදී
- ඒකාබද්ධ වාර්තාකරණය - පිළිගැනීමේ සහතිකය



**2024 ඒකාබද්ධ වාර්තාකරණ සම්මානවල CMA විශිෂ්ටත්වය**

- විශිෂ්ඨ ඒකාබද්ධ වාර්තා දහයෙන් එකකි
- විශිෂ්ටතම ඒකාබද්ධ වාර්තාව බැංකුකරණ අංශය - රාජ්‍ය ජයග්‍රහකයා




**Satyn**

- කාන්තා හිතවාදී සේවා ස්ථාන සම්මාන - ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම කැපී පෙනෙන කාන්තා හිතවාදී සේවා ස්ථානයකි




**ටෙක්නොවේෂන් 2024**

- මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වසරේ බැංකුව වර්ගීකරණය ආ - රන්
- ගනුදෙනුකාර පහසුව තුළ විශිෂ්ටත්වය සඳහා වසරේ බැංකුව වර්ගීකරණය ඇ - රන්
- ඩිජිටල් ගෙවීම්වල සමස්ත සම්මාන විශිෂ්ටත්වය බැංකුකරණ ආයතන - කුසලතා

රූපය 14

අපි මූල්‍ය කාර්යසාධනය තුළ විශිෂ්ටත්වයට පත්වීම පමණක් නොව මූල්‍ය නොවන ජයග්‍රහන තුළ, උපායමාර්ගික පරමාර්ථ සඳහා අපගේ නොසැලෙන කැපවීම අපි පෙන්වා ඇත. මෙවැනි ගෞරවයට පාත්‍රවීම් අපගේ වෙළෙඳපොල වටිනාකම ඉහළ දැමීම පමණක් නොව අපගේ පාර්ශවකරුවන්ට වඩා ඉහළ වටිනාකමක් ලබාදීමට අපිව පොළඹවනු ලබයි.

## සහතික කිරීම්

- මූලික ආරක්ෂක ප්‍රමිති (BSS)
- PCI DSS සහතික කිරීම
- SWIFT CSP අනුකූලතාව

## ආයතනික සංස්කෘතිය

බැංකුව වටිනාකම පදනම්කරගත් ආයතනයක් වන අතර, සියලුම ව්‍යාපාර පරිචයන් හී විශ්වාසය, අනෝන්‍ය ගෞරවය, අවංකකම, ආරක්ෂාව සහ නිර්මාණශීලිත්වය පෝෂණය කිරීමට දැඩිව කැපවී සිටී. මෙම මූලධර්ම පසුගිය දශක 5 තුළ බැංකුවේ සංස්කෘතිය හැඩගස්වා ඇති අතර, පාර්ශවකරුවන් සමඟ අර්ථවත් සම්බන්ධතා ගොඩ නැගීමේදී සිය සේවකයින්ට සහ කළමනාකාරිත්වයට මඟ පෙන්වා ඇත.

අපගේ ශක්තිමත්, ධනාත්මක සංස්කෘතිය සදාචාර බැංකු ව්‍යවහාරවලින් මුල්බැසගෙන ඇති අතර, ඒ තුළ දැනුම් හුවමාරුව, විනිවිදභාවය සහ ප්‍රජාව ගොඩනැගීම අපි ප්‍රවර්ධනය කරමු. මනාව නිශ්චිත මූලධර්ම කිහිපයක් බැංකු මෙහෙයුම්වල සෑම අංගයක්ම පාලනය කරන අතර, අනුරූපතාව සහ වගකීම් සහතික කරයි. අපගේ ව්‍යවහාර නිරන්තරව තක්සේරු කිරීම, වර්ධනය සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ අනාගත සාර්ථකත්වය ඇති කිරීමට අවශ්‍ය වර්ධනයන් සිදුකිරීම තුළින් ආයතනයේ සෑම මට්ටමකදීම මෙවැනි වටිනාකම් අපි අඛණ්ඩව ශක්තිමත් කරමු.



### නිර්මාණශීලිත්වය
පවත්නා ව්‍යවහාර අභියෝගයට ලක් කිරීම සහ අඛණ්ඩව නව සංකල්ප සෙවීම.



### විශ්වාසය
සම්බන්ධ සියලුම දෙනාගේ බැඳියාවන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීම තුළින් සම්බන්ධතා ගොඩ නැගීම.



### අවංකකම
අපගේ සියලුම කාර්යයන් හා තීරණවලදී අවංක, අනුරූප සහ විනිවිද වීම.



### අනෝන්‍ය ගෞරවය
සෑම පුද්ගලයෙකුගේම ආවේනික වටිනාකම හඳුනා ගනිමින් සෑම දෙනාට ගෞරවයෙන් සැලකීම.

## බුද්ධිමය ප්‍රාග්ධන අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ උපායමාර්ග

| අවදානම් හා අභියෝග | බැංකුව කෙරෙහි බලපෑම | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| ප්‍රධාන දක්ෂයින් අහිමිවීම | ආයතනික දැනුම හා ප්‍රවීනතාව ක්ෂයවීම | ශක්තිමත් අනුප්‍රාප්තික සැලසුම්කරණය ක්‍රියාත්මක කිරීම |
| | උපායමාර්ගික තීරණ ගැනීම සහ මෙහෙයුම්වල බිඳවැටීම | තරඟකාරී ප්‍රතිලාභ සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුළින් සේවක රඳවාගැනීම වැඩි කිරීම |
| විශ්‍රාමයැම නිසා දැනුම ගලායාම | පලපුරුදු වෘත්තියකින් අහිමිවීම | ව්‍යුහගත දැනුම හුවමාරු වැඩසටහන් |
| | තීරණාත්මක ක්ෂේත්‍රවල විභව නිපුනතා පරතර | අනාගත නායකයින් සූදානම් කිරීමට උපදේශන වැඩසටහන් |
| බුද්ධිමය දේපලවලට සයිබර් ආරක්ෂක තර්ජන | හිමිකාර මූල්‍ය ආකෘති හා උපායමාර්ගවල නිරාවරණ | තොරතුරු තාක්ෂණ ආරක්ෂක පෙරාතු ලේඛණ |
| | විභව දත්ත කඩවීම් ගනුදෙනුකාර විශ්වාසයට බලපායි | නිරන්තර සයිබර් ආරක්ෂක දැනුවත් කිරීමේ පුහුණු පැවැත්වීම |

## අනාගත දැක්ම

**කෙටිකාලීන**

- ඩිජිටල් බැංකුකරණය හා නියාමන අනුකූලතාව පිළිබඳ සේවක පුහුණුව වැඩි කිරීම
- තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම් සහ සයිබර් ආරක්ෂක ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම.
- මෙහෙයුම් ප්‍රශස්තකිරීමට, ගනුදෙනුකාර මැදිහත්වීම් පුද්ගලගත කිරීමට සහ නව වර්ධන අවස්ථා හඳුනා ගැනීමට දත්ත පදනම් තීරණ ගැනීම සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය ශක්තිමත් කිරීම.

**මධ්‍ය සිට දිගුකාලීන**

- කෘතීම බුද්ධිය පදනම් බැංකුකරණ විසඳුම් සහ තීරණ ගැනීම වැඩිදියුණු කිරීමට සහ පාරිභෝගික සේවයේ විශිෂ්ටවීමට පින්ටෙක් සහයෝගිතාවන් ඉදිරියට ගෙන යාම
- ගනුදෙනුකරුවන් සහ සේවකයින් අතර ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාව පුළුල් කිරීම

# සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය





විශ්වාසය ගොඩනැගීම, වටිනාකම ගොඩ නැගීම

## බැංකුව තුළ සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

සමාජ සම්බන්ධතා ප්‍රාග්ධනයෙන් අපගේ ශක්තිමත් පාර්ශ්වකාර සම්බන්ධතා, ප්‍රජා සහභාගිත්වය සහ මූල්‍ය අන්තර්ගතභාවයට බැඳීම තුළින් ව්‍යුත්පන්න වූ වටිනාකම පිළිබිඹු කරයි. එමෙන්ම ඉන් ගනුදෙනුකරුවන්, ව්‍යාපාර හවුල්කරුවන්, නියාමකයින් සහ පුළුල් ප්‍රජාව සමඟ විශ්වාසය, කීර්තිනාමය සහ දිගුකාලීන හවුල්කාරිත්වයන් අපි එළදායීව ගොඩ නගන ආකාරය පෙන්නුම් කරයි.

### අපගේ අවධානය

බැංකු ප්‍රවේශය පුළුල් කිරීම, සදාචාර බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම සහ උපායමාර්ගික හවුල්කාරත්වයන් ශක්තිමත් කිරීම මගින් අපි මූල්‍ය අන්තර්ගතභාවය, පාර්ශ්වකාර විශ්වාසය, සහ ප්‍රජා සහභාගිත්වය කෙරෙහි අවධානය යොමු කරමු. අධ්‍යාපනය, සෞඛ්‍ය සහ තිරසාරතාවය වෙත අපගේ සමාජ සත්කාර (CSR) වැඩසටහන් සමාජීය වගකීම වෙත අපගේ බැඳීම සවිමත් කරන අතර, දිගුකාලීන පාර්ශ්වකාර විශ්වාසය සහ වටිනාකම නිර්මාණය පෝෂණය කරයි.



## සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය අපගේ උපායමාර්ගය හා සම්බන්ධ වන ආකාරය

- ගනුදෙනුකරුවන් සමඟ විශ්වාසය සහ සහභාගිත්වය ශක්තිමත් කිරීම ඉහළ රඳවාගැනීම, හරස් විකුණුම් අවස්ථා සහ ඩිජිටල් යොදා ගැනීමට හේතු වේ.
- නියාමකයින් සමඟ විනිවිද සම්බන්ධතා පවත්වා ගැනීම තුළින් අනුකූලතා අවදානම කළමනාකරණය. සහ මෙහෙයුම් ස්ථායිතාව සහතික කරයි.
- හුවමාරු ප්‍රතිමාන, වටිනාකම් සහ විශ්වාසය ඇති කිරීම මගින්, අපගේ සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය පාර්ශවකාර විශ්වාසය වැඩිකර, නව්‍යකරණය පෝෂණය කර ජාතියේ ආර්ථික ප්‍රගතිය සඳහා තිරසාර වටිනාකම මෙහෙයවයි.
- සමාජීය වගකීම්සහගත වැඩසටහන්වල ආයෝජනය ප්‍රජාවගේ විශ්වාසය ශක්තිමත් කරන අතර ESG අරමුණු සමඟ පෙළ ගැසේ.

### අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය සහයවන ආකාරය

හුවමාරු ප්‍රතිමාන, වටිනාකම් සහ විශ්වාසය ඇති කිරීම මගින්, අපගේ සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය පාර්ශවකාර විශ්වාසය වැඩිකර, නව්‍යකරණය පෝෂණය කර ජාතියේ ආර්ථික ප්‍රගතිය සඳහා තිරසාර වටිනාකම මෙහෙයවයි.

### තිරසාර කර්යසාධනය කෙරෙහි සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

අපි තිරසාර මූල්‍ය විසඳුම් සහ මෙම දැඩි මුල්බැසගත් සම්බන්ධතා තුළින් අවධානාත්මක සමාජ ආර්ථික බලපෑමක් ලබාදීම අපි අරමුණු කරමු.

### සම්බන්ධිත පාර්ශව



### ප්‍රමුඛ උපායමාර්ග සමඟ සම්බන්ධතාව

| | | | |
|---|---|---|---|
| ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව | ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය | ඩිජිටල් පරිනාමනය වේගවත් කිරීම | තිරසරභාවය |

### ප්‍රමාණාත්මක කරුණු

1. පරිවර්තනීය දේශපාලන විතැන්වීම
2. සාර්ව ආර්ථික ස්ථායිතාව සහ වර්ධනය
3. වත්කම්වල ගුණාත්මකභාවය සහ වර්ධනය
4. මූල්‍ය තිරසාරභාවය
5. වැඩිදියුණු වන පාරිභෝගික අපේක්ෂාවන්
6. සමාජ මාධ්‍යවල බලපෑමේ වර්ධනය
10. නව තාක්ෂණික වර්ධනයන්
11. සයිබර් තර්ජන සහ තොරතුරු ආරක්ෂාව
12. ඩිජිටල් සාක්ෂරතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතා
14. දේශගුණික විපර්යාස සහ පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව
15. පාලනයේ සහ නියාමන කටයුතුවල විශිෂ්ටත්වය

### SDGs ට දායකත්වය








රූපය 15

# ගනුදෙනුකාර ප්‍රාග්ධනය

## තිරසාර වර්ධනය සඳහා සම්බන්ධතා ශක්තිමත් කිරීම

බැංකුවේ ගනුදෙනුකාර ප්‍රාග ්ධනයට විශ්වාසය ගොඩනැගීම, මූල්‍ය අන්තර්ගතභාවය පෝෂණය, ඩිජිටල් ලෙස පිවිසීම වැඩි කිරීම සහ සහය බැංකු අත්දැකීම් ලබාදීම කරා අපගේ බැඳීම ඇතුළත් කරයි. අපගේ ප්‍රවේශය බාධාරහිත සහ පූර්ණ බැංකු සේවා ලබාදීම සඳහා වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා අවබෝධකර ගැනීම, පුද්ගලාරෝපිත මූල්‍ය විසඳුම් පිරිනැමීම, ඩිජිටල් නව්‍යකරණය භාවිතා කිරීම කෙරෙහි මධ්‍යගත කෙරේ.

බැංකුවේ දී, ගනුදෙනුකාර සම්බන්ධතා අපගේ දිගුකාලීන සාර්ථකත්වයේදී අත්‍යවශ්‍ය වන බව අපි පිළිගනිමු. සේවා තත්ත්වය අඛණ්ඩව වැඩිකරමින්, මූල්‍ය සේවා කරා ප්‍රවේශය පුළුල් කරමින්, සහ වගකීම්සහගත බැංකු ව්‍යහාර ඇතුළත් කර ගනිමින්, අපගේ ගනුදෙනුකාර අත්දැකීම බැංකු සේවාවක් පමණක්ම නොව සිය අපේක්ෂාවන් සහ මූල්‍ය යහපැවැත්ම පෝෂණය කර විශ්වාසී මූල්‍ය හවුල්කරුවෙක් වන බව සහතික කරයි.

2024 දී, සෑම ගනුදෙනුකාර ස්පර්ශක ස්ථානයකටම තිරසාරභාවය ඇතුළත් කිරීමට අපගේ කැපවීම තියුණු කළ අතර, අපගේ සේවා වේගයෙන් වෙනස්වන මූල්‍ය වාතාවරණයක් තුළ ජයගැනීමට පුද්ගලයින්, ව්‍යාපාර, සහ ප්‍රජාවන් අපි සවිබල ගන්වමු. අපගේ ගනුදෙනුකාර කේන්ද්‍රීය උපායමාර්ග පාර්ශ්වකරුවන්ට සහ සමාජයට සමානව වටිනාකම නිර්මාණය කරන ආකාරය මෙම කොටසින් ඉස්මතු කරයි.

තැන්පතුකරුවන්ට හා ණයකරුවන්ට බෙදාහැරි ආර්ථික වටිනාකම
**බිලියන 131**
2023 – බිලියන 197

සක්‍රීය ගනුදෙනුකාර ගිණුම්
**බිලියන 10.42**
2023 – බිලියන 13.03

# සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය



## අපගේ ගනුදෙනුකාර වටිනාකම කොටස

බැංකුවේදී, අපගේ ගනුදෙනුකාර වටිනාකම් කොටස විවිධ ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීමට ගලපනලද සුවිශේෂී මූල්‍ය විසඳුම් ලබාදීම තුළින් ඇති වන අතර ඉන් විශ්වාසය, නව්‍යකරණය සහ තිරසාරභාවය පෝෂණය කරයි. අපි ගනුදෙනුකාර වත්කම්වල ආරක්ෂාව සහ රහස්‍යතාව සහතික කරන අතර විශ්වාසය පිළිබඳ ශක්තිමත් උරුමයකින් සහය වෙමු. නවීන ඩිජිටල් වේදිකා හරහා, අපි බාධා රහිත බැංකු අත්දැකීම පිරිනමමින් පහසුව සහ ප්‍රවේශ්‍යතාව ගනුදෙනුකරුවන්ට ලබා දෙන්නෙමු. හරිත මූල්‍ය විසඳුම් සහ තිරසාර ව්‍යවහාර ප්‍රවර්ධනය කරමින්, අපි පරිසරය දැනුවත් වටිනාකම් සමඟ පෙළගැසෙන අතර, මූල්‍ය සාක්ෂරතාව සහ අධ්‍යාපනය තුළින් ජීවිත පොහොසත් කරමු. සුපිරි සේවාව සහ පුද්ගලාරෝපිත සහය සඳහා අපගේ නොසැලෙන කැපවීම තුළින් අපි ගනුදෙනුකාර අපේක්ෂාවන් සපුරාලීම පමණක් නොව ඒවා ඉක්මවා යමින් මූල්‍ය සාර්ථකත්වය සහ තිරසාර වර්ධනය තුළ බැංකුව විශ්වාසී හවුල්කරුවෙක් බවට පත් කරයි. අපගේ වටිනාකම යෝජනාව ලාභය පමණක්ව නොව එය අරමුණක් පිළිබඳව වේ.

### 100% රජයේ සහතිකවීම

# AAA lka

(LRA 2024)

ශ්‍රී ලංකා රජයේ ඇප සහිත එකම ශ්‍රී ලාංකීය බැංකුව ලෙස බැංකුව විසින් නැවත ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක් තුළ සම්පූර්ණ තැන්පතුව සහ එහි පොලිය ආපසු ගෙවීම සහතික කරයි.




### විභව්‍ය සමතුලිතතා

**මූල්‍ය ප්‍රාග්ධනය**
භෞතික ශාඛා පැවැත්ම පුළුල් කිරීම සහ යහපත් ගනුදෙනුකාර සේවාව සඳහා යටිතලපහසුකම් උසස් කිරීමට ඉහළ ප්‍රාග්ධන ආයෝජනයක් අවශ්‍ය වේ. (−)

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**
ගනුදෙනුකාර අත්දැකීම වැඩිකිරීමට භෞතික වත්කම්වල ආයෝජනය නිෂ්පාදන සහ තාක්ෂණික උසස් කිරීම්වලින් සම්පත් විතැන් කළ හැකිය. (−)

**බුද්ධිමය ප්‍රාග්ධනය**
පුද්ගලාරෝපිත ගනුදෙනුකාර සේවාවල වැඩිපුර ආයෝජනය කෘතීම බුද්ධිය හා ස්වයංක්‍රියකරණය තුළ ඩිජිටල් නව්‍යකරණය පහළ හෙළනු ඇත. (−)

**මානව ප්‍රාග්ධනය**
ගනුදෙනුකාර ඉල්ලුම සපුරාලීමට පීඩනය කාර්යමණ්ඩලයට අධික බරක් වියහැක. (−)

**ස්වභාවික ප්‍රාග්ධනය**
වැඩිකළ බැංකු කටයුතු හා ප්‍රවර්ධන සිදුවීම් වඩා ඉහළ කාබන් පාසටහනට සහ සම්පත් පරිභෝජනයට දායක විය හැකිය. (−)

බලපෑම: ධනාත්මක (+) සෘණාත්මක (−)

## තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රීයකරුවන්

| | |
|---|---|
| 1 | බාධාරහිත බැංකුකරණය සඳහා ඩිජිටල් පරිනාමනය |
| 2 | විවිධ ගනුදෙනුකාර පදනමක් සඳහා පුද්ගලාරෝපිත සේවා |
| 3 | පක්ෂපාතිත්වය හා දිගුකාලීන සම්බන්ධතා පෝෂණය කිරීම |
| 4 | සදාචාර සහ තිරසාර බැංකුකරණය |
| 5 | මූල්‍ය සාක්ෂරතාව සහ ගනුදෙනුකරු සවිබලගැන්වීම |

### 1 බාධාරහිත බැංකුකරණය සඳහා ඩිජිටල් පරිනාමනය

මූල්‍ය තාක්ෂණයේ පහසුව, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව නවීන බැංකු අත්දැකීම්වල මූලික ප්‍රතිෂ්ඨාව බවට පත් කරමින් වේගවත් පරිණාමය ගනුදෙනුකාර අපේක්ෂාවන් නැවත අර්ථ දක්වා ඇත. වර්තමාන ගනුදෙනුකරු ඕනෑම වේලාවක සහ ඕනෑම ස්ථානයක ප්‍රවේශ විය හැකි ක්ෂණික, අවබෝධාත්මක සහ පුද්ගලාරෝපිත මූල්‍ය සේවා ඉල්ලා සිටී. එයට ප්‍රතිචාරාත්මකව, බැංකුව මහත් අපේක්ෂා සහිත ඩිජිටල් පරිවර්තනීය ගමන් මගක් දියත් කර ඇති අතර, ඒ තුලින් බැංකුව සේවා ලබාදෙන ආකාරය නැවත මූර්තිමත් කරමින් පිවිසීම, ආරක්ෂාව සහ ගනුදෙනුකාර තෘප්තිය සහතික කරයි.

අපගේ ඩිජිටල් පළමු ප්‍රවේශය වැඩිවන තාක්ෂණය දැනුවත් ගනුදෙනුකාර පදනමක අවශ්‍යතා සපුරාලීමට සැලසුම්කරන අතර, මූල්‍ය සේවා කාර්යක්ෂම කිරීම පමණක් නොව සියල්ල ඇතුළත් ආරක්ෂිත හා අනාගතයට සූදානම් බව සහතික කරයි.

#### ඩිජිටල් බැංකුකරණ යටිතල පහසුකම් පුළුල් කිරීම

බාධාරහිත පැය විසිහතරේ බැංකු ප්‍රවේශ්‍යතාව සහතික කිරීමට, ගනුදෙනුකාර අත්දැකීම වැඩි කරන නව්‍යකරණ සේවා රාශියක් හඳුන්වාදෙමින් අපගේ ඩිජිටල් බැංකුකරණ පරිසර පද්ධතිය අපි සැලකියයුතු ලෙස පුළුල් කර ඇත.

#### Temenos T24 මධ්‍යගත බැංකුකරණ පද්ධතිය (CBS) සාර්ථකව ක්‍රියාත්මක කිරීම

විමධ්‍යගත CBS සිට Temenos T24 CBS වෙත පරිනාමනය බැංකුවේ මෙහෙයුම්, පරිනාමනය කර ඇති අතර කාර්යක්ෂමතාව, ප්‍රමාණතාව සහ ගනුදෙනුකාර තෘප්තිය වැඩි කර ඇත. පරිනාමනය අභියෝග ඇති කරන අතර, දිගුකාලීන ප්‍රතිලාභ සංකීර්ණතා ඇති කරමින් ඩිජිටල් යුගයක් තුළ තිරසාර වර්ධනය හා තරඟකාරිත්වය සඳහා බැංකුව ස්ථානගත කරයි. දැනට පද්ධතිය ස්ථාපිතකර ඇති අතර, වෙනත් තීරණාත්මක මුලපිරීම් උසස් කිරීමට බැංකුවට හැකියාව ඇති කරයි.

(වැඩි විස්තර සඳහා 122 පිටුවේ බුද්ධිමය ප්‍රාග්ධනය බලන්න).

#### වැඩිකළ ජංගම බැංකුකරණය සහ ස්වයං සේවා වේදිකා

අපගේ ජංගම බැංකුකරණ යෙදුම් වර්තමානයේ සහජ ඥානය පිළිබඳ අතුරු මුහුණතක් පෙන්වන අතර, පිරිසැකසුම් කාලය හා පුද්ගලාරෝපිත මූල්‍ය අවබෝධතා වේගවත් කරමින් ගනුදෙනුකරුවන්ට සිය ගිණුම් පහසුවෙන් කළමනාකරණයට ඉඩ ලබා දේ.

#### ඩිජිටල් ඇතුළත්කර ගැනීම සහ දුරස්ථ බැංකුකරණය ශක්තිමත් කිරීම

මූල්‍ය අන්තර්ගතභාවය කරා අපගේ බැඳීම සමග යමින්, බැංකුව ඩිජිටල් ඇතුළත් කර ගැනීමේ විසඳුම් තුළින් සම්ප්‍රදායික බාධා ඉවත් කරමින් සිටී.

#### බාධාරහිත ගිණුම් විවෘත කිරීම සහ e-KYC (ඔබගේ ගනුදෙනුකරු ඉලෙක්ට්‍රොනිකව හඳුනා ගන්න)

කඩදාසි වැඩ අවම කරමින් සම්පූර්ණයෙන් ඩිජිටල්කළ ඇතුළත් කිරීමේ ක්‍රියාවලියක් තුළින් ගනුදෙනුකරුවන්ට දැන් දුරස්ථව නව ගිණුම් විවෘත කළ හැකි අතර, මුදල් විශුද්ධිකරණ විරෝධී රෙගුලාසි සමග අනුකූලතාව සහතික කරයි.

#### සයිබර් ආරක්ෂාව සහ ඩිජිටල් විශ්වාසය වැඩි කිරීම

ඩිජිටල් බැංකුකරණයේ වර්ධිත යොදා ගැනීම සමඟ, සයිබර් ආරක්ෂාව සහ වංචා වැලැක්වීම අපගේ උපායමාර්ගයේ පෙරමුණේ සිටී. සියලුම ගනුදෙනුකාර ගනුදෙනු ආරක්ෂිත, පුද්ගලිකව පවතින බව සහ සයිබර් තර්ජනවලින් ආරක්ෂා කරන බව සහතික කිරීමට නවීන ආරක්ෂක ක්‍රියාමාර්ග යොදවා ඇත.

- තත්‍ය කාලීන ගනුදෙනු නියාමනය – වංචා හඳුනාගැනීමේ පද්ධති තත්‍ය කාලීනව සැක සහිත කටයුතු හඳුනාගෙන වළක්වයි.
- අවසානය දක්වා සංකේතනය සහ බහු සාධක සත්‍යාපනය – උසස් සංකේතන ප්‍රොටෝකෝල සහ අවසානය දක්වා සංකේතනය ගනුදෙනුකාර දත්ත ආරක්ෂා කරන අතර අනවසර ප්‍රවේශය වළක්වයි.
- ඩිජිටල් ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාර – මාර්ගගත වංචා, තතුබෑම් වංචා සහ අනන්‍යතා සොරකම් වලින් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සඳහා, අපි සමාජ මාධ්‍ය සහ අපගේ නිල වෙබ් අඩවිය හරහා නිතිපතා ඩිජිටල් ආරක්ෂක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමු.

(වැඩි විස්තර සඳහා 123 පිටුවේ බුද්ධිමය ප්‍රාග්ධනය බලන්න)

#### බාධාරහිත සහ මුදල්රහිත බැංකු අත්දැකීමක් සඳහා ගෙවීම් විසඳුම් පරිනාමනය

බැංකුව වේගය, ආරක්ෂාව සහ පහසුව වැඩි කරන ඊලඟ පරම්පරාවෙ ගෙවීම් විසඳුම් හඳුන්වා දෙමින් මුදල් රහිත ආර්ථිකයක් කරා පරිනාමනය සක්‍රියව සිදුකරනු ලබයි.

#### මූලික ගෙවීම් නව්‍යකරණය

- සබඳතා රහිත ගෙවීම් සහ QR කේත පදනම් ගනුදෙනු - අපගේ පරිසර පද්ධතිය ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදන ගෙවීම් (NFC) සහ QR කේත පදනම් ගනුදෙනුවලට සහයවන අතර භෞතික මුදල් මෙහෙයවීම නොමැතිව ගනුදෙනුකරුවන්ට ආරක්ෂක මිලදීගැනීම් සිදු කිරීමට ඉඩදේ.
- ක්ෂණික අරමුදල් මාරු කිරීම තත්‍ය කාලීන නිරවුල් කිරීම් - බැංකුව තුළ සහ පිටත ක්ෂණික අරමුදල් මාරු කිරීම ඇතිකරමින් වේගවත් ගෙවීම් ජාල අපි ඒකාබද්ධ කර ඇත.

## 2 විවිධ ගනුදෙනුකාර පදනමක් සඳහා පුද්ගලාරෝපිත සේවා

බැංකුවේ, අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධ මූල්‍ය අවශ්‍යතා අපි හඳුනා ගන්නා අතර ප්‍රවේශ්‍යතාව වැඩිකරන, ව්‍යාපාර වර්ධනය ඇති කරන සහ දිගු-කාලින මූල්‍ය ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරන ගලපනලද බැංකු විසඳුම් ලබාදීමට කැපවී සිටී. පුද්ගලයින් සහ විශාල ආයතන සඳහා ගලපනලද මූල්‍ය නිෂ්පාදන පිරිනමමින්, අසමසම මූල්‍ය ඉලක්ක සහ අපේක්ෂාවන් සමඟ පෙළ ගැසුණු විසඳුම් සඳහා සෑම අංශයකටම ප්‍රවේශය ඇති බව සහතික කරමින් අපි ශක්තිමත් කල්පවත්නා ගනුදෙනුකාර සම්බන්ධතා පෝෂණය කරමු. පහත සඳහන් රූපයෙන් අපගේ පිරිනැමීම් පිළිබඳ පළල සහ ගැඹුර විස්තර කරයි.



රූපය 16

මූල්‍ය අන්තර්ගතභාවය වැඩි කිරීමට, තරුණයින් අරමුණු කරගත් බැංකු වැඩසටහන් අපි සපයන අතර, ඉන් මුල් යුගයේදීම යහපත් මූල්‍ය පුරුදු සහ ජ්‍යෙෂ්ඨ පුරවැසි බැංකුකරණ විසඳුම් දිරිගන්වන අතර, එය ආරක්ෂාව, ප්‍රවේශ්‍යතාව සහ භාවිතයේ පහසුව ප්‍රමුඛ කරයි. බාහිර උපදේශකයින්ගේ සහය ඇතිව දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට අපගේ පුද්ගලාරෝපිත උපදේශන සේවා තවදුරටත් සවිබල ගන්වයි.

නියාමන අනුකූලතාව අපගේ සියලුම නිෂ්පාදන නව්‍යකරණ හා වර්ධනයන්ගේ ප්‍රධාන අංගයක් බව බැංකුව සහතික කරයි. නිෂ්පාදන සංවර්ධන කමිටුව (PDC) විසින් අධීක්ෂණය කරන දැඩි නිෂ්පාදන සංවර්ධන රාමුවක් තුළින්, සෑම මූල්‍ය විසඳුමක්ම ගනුදෙනුකාර අවශ්‍යතා, නියාමන ප්‍රමිති, සහ සදාචාර බැංකුකරණ මූලධර්ම සමඟ ගැලපීමට විස්තීර්ණ ඇගයීමකට ලක් කරයි. අනුකූලතාවය සහ නව්‍යකරණය සහ අපගේ

සේවා ආදර්ශයට ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව ඒකාබද්ධ කරමින්, අපි විශ්වාසී සහ අනාගතය දකින මූල්‍ය ආයතනයක් ලෙස අපගේ තත්ත්වය අපි ශක්තිමත් කරමු.

### විවිධ ආබාධ සහිත පුද්ගලයින්ට සේවය කිරීම

ප්‍රවේශ්‍යතාව සහ ඇතුළත්වීම කරා අපගේ බැඳීමට අනුව, අපි බාධා රහිත ශාඛා ස්ථාපිත කිරීම ප්‍රමුඛ කර ඇති අතර, ඒවා විවිධ ආබාධ සහිත පුද්ගලයින්ට පහසුකම් සලසයි. අලුතින් පිහිටුවන ලද සියලුම ශාඛා මෙන්ම නැවත ස්ථානගත කරන ලද ශාඛා සඳහා එවැනි ප්‍රවේශ්‍යතාවයක් සම්මත අවශ්‍යතාවයක් බව අපි සැමවිටම සහතික කරමු. අද දක්වා, අපගේ ශාඛාවලින් 229 ක් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට පහසුකම් සැලසීම සඳහා ආබාධිත ප්‍රවේශ පහසුකම් වලින් සන්නද්ධ කර ඇත. අපගේ ශාඛා ජාලය පුරා

ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදු කරමින්, සෑම ගනුදෙනුකරුවෙක්ම බාධා රහිතව සහ ගෞරවනීය බැංකු අත්දැකීමක් භුක්ති විඳින බව සහතික කරමින්, සියලු දෙනා ඇතුළත් බැංකුකරණය සඳහා අපගේ කැපවීම අපි නැවත තහවුරු කරමු.

## 3 පක්ෂපාතිකම සහ දිගුකාලින සම්බන්ධතා පෝෂණය කිරීම

බැංකුවේ දී, ගනුදෙනුකාර පක්ෂපාතිත්වය සහ දිගුකාලීන සම්බන්ධතා පෝෂණය කිරීම අපගේ ගනුදෙනුකාර ප්‍රාග්ධන උපායමාර්ගයේ ප්‍රධාන කුළුණක් වන අතර, අපගේ ගනුදෙනුකරුවන් සමඟ අර්ථවත් සහ කල් පවත්නා සම්බන්ධතා නිර්මාණය කිරීමට ගනුදෙනුමය බැංකුකරණයෙන් ඔබ්බට අපි ගමන් කරමු. විශ්වාසය, පුද්ගලාරෝපිත සහභාගිත්වය සහ සක්‍රිය සේවා පිළිබඳ ශක්තිමත් පදනමක් සමඟ පුද්ගලයින්, ව්‍යාපාර සහ ආයතන සමඟ ජීවකාල සම්බන්ධතා ගොඩ නැගීමට අපට හැකියාව ඇති කරයි. ගනුදෙනුකාර අත්දැකීම් අඛණ්ඩව නවීකරණය සහ වැඩි කිරීම මගින්, සැමට මූල්‍ය ආරක්ෂාව, ස්ථායිතාව සහ වර්ධනීය අවස්ථා ලබා දෙමින් පරම්පරාවන් සඳහා තෝරාගත් බැංකුව වශයෙන් අප බැංකුව පවතින බව අපි සහතික කරමු.

### ගනුදෙනුකරුවන්ට බැඳීම – කේන්ද්‍රීය සේවා විශිෂ්ටත්වය

සුවිශේෂී සේවා තත්ත්වයක් සහ පුද්ගලාරෝපිත බැංකුකරණ අත්දැකීම්වල පදනමක් මත ගනුදෙනුකාර පක්ෂපාතිත්වය ගොඩ නගනු ලබයි.

**බැංකුවේදි අපගේ ප්‍රමුඛතා පහත දැක්වේ:**

- **සර්වමාර්ග සේවා විශිෂ්ටත්වය** – සෑම ස්පර්ශක ස්ථානයකම ප්‍රවේශ්‍යතාව සහ පහසුව ලබාදෙමින් අපගේ ශාඛා 262, බැංකුවේ ඩිජිටල් බැංකුකරණ වේදිකා, NSB PayApp, සහ අපගේ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හරහා බාධාරහිත ගනුදෙනුකාර මැදිහත්වීම ලබාදීම. (102 සිට 107 දක්වා පිටුවල නිෂ්පාදිත ප්‍රාග්ධනය බලන්න)

- **විශේෂිත සම්බන්ධතා කළමනාකරණය** – ගනුදෙනුකාර සම්බන්ධතා නිලධාරීන් මගින් සහභාගිත්වය ශක්තිමත් කිරිම. පුද්ගලාරෝපිත මූල්‍ය මඟ පෙන්වීම සහ පුද්ගල සහ ව්‍යාපාර අවශ්‍යතා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඔවුන් පිරිනමයි.
- **කාර්යක්ෂම පැමිණිලි විසඳීම සහ සහය** – ගනුදෙනුකාර ගමන්මඟ පළමු මැදිහත්වීමේදි ආරම්භවන අතර, යම් බැංකු ගැටළු විසඳීම දක්වා පුළුල් වේ. ගනුදෙනුකාර පැමිණිලි කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට ශක්තිමත් හා ප්‍රතිචාරාත්මක පද්ධතියක් අපි ස්ථාපිත කර ඇති අතර, සෑම ගැටළුවක්ම උපරිම මට්ටමේ වෘත්තීමය භාවයකින් සහ පරිස්සමින් විසඳනු ලබන බව ඒ මගින් සහතික කරයි. බාධාරහිත සන්නිවේදනය පහසුකම් ඇති කිරිමට, ඔවුන්ගේ විමසීම් සහ මැසිවිලි හඬනැගීමට ගනුදෙනුකරුවන් සඳහා බහුවිධ මාර්ග අපි ලබාදෙන අතර, එයට අපගේ පැය 24/7ඇමතුම් මධ්‍යස්ථානය, අන්තර්ජාල මාර්ග, දිවයින පුරා ශාඛා, සමාජ මාධ්‍ය, විද්‍යුත් ලිපි, ස්කයිප්, සහ වෙබ් කථා ඇතුළත්ය. ඊට අමතරව, ගනුදෙනුකාර ප්‍රතිපෝෂණය සඳහා යෝජනා පෙට්ටි ශාඛා පරිශ්‍රවල තබා ඇත.

අපගේ ඇමතුම් මධ්‍යස්ථානය මූලික සම්බන්ධතා ස්ථානය ලෙස සේවය කරන අතර, විමසීම් කඩිනමින් හසුරුවන සහ අවශ්‍ය විටෙක අදාළ දෙපාර්තමේන්තු වෙත ඒවා යොමු කරන ඉහළ පුහුණුව ලත් වෘත්තිකයන්ගෙන් සමන්විත වේ. සෑම විමසුමකටම අනන්‍ය යොමු අංකයක් පවරා දෙන අතර, එමඟින් ගනුදෙනුකරුවන්ට ප්‍රගතිය පහසුවෙන් හඹායාමට හැකි වේ.

තවද, අඛණ්ඩ සේවා වැඩිදියුණු කිරීම සහතික කරමින් ගනුදෙනුකාර පැමිණිලි සහ විසඳුම් ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක මාසික වාර්තාවක් කළමනාකාරිත්වයට ඉදිරිපත් කරනු ලැබේ. සුවිශේෂී සේවාව සඳහා අපගේ බැඳීම දරා ගැනීමට, "බැංකුව තුළ⌑ පුහුණු වැඩසටහන තුළින් අපි සේවකයින් අඛණ්ඩව සවිබල ගන්වන අතර, ගැටළු ඵලදායීව විසඳීමට අවශ්‍ය නිපුනතාවලින් ඒවා සන්නද්ධ කර අභියෝග ධනාත්මක ගනුදෙනුකාර අත්දැකිම් බවට පරිවර්තනය කෙරේ.




"අපගේ ගනුදෙනුකරුවන් අපි අගය කරමු." වසර තුළ, 2023 ශිෂ්‍යත්ව විභාගයේ ඉහල සාමාර්ථයක් ලත් හපන් ගිණුම හිමි සිසුවා අපි හඳුනාගෙන අගය කළෙමු.

## ගනුදෙනුකාර තෘප්තිය පිළිබඳ සංඛ්‍යාලේඛණ

| | | |
|---|---|---|
| මහ බැංකුව වෙත පැමිණිලි ගණන **104** (2023 – 62) | ලද ගනුදෙනුකාර පැමිණිලි ගණන **492** (2023 – 488) | භාවිතය තුළ කාඩ් ගණන **1,171,547** (2023 – 1,147,651) |
| **391,148** (2023 – 434,110) | මූල්‍ය ඔම්බුඩ්ස්මන් වෙත ලද පැමිණිලි ගණන **6** (2023 – 1) | විසඳන ලද විමසීම් ගණන **455** (2023 – 361) |

ගනුදෙනුකාර රහස්‍යතාව කඩකිරීම සහ ගනුදෙනුකාර දත්ත අහිමිවීම සම්බන්ධ ගනුදෙනුකාර පැමිණිලි ගණන
**නැත**
(2023 – නැත)

## විනිවිදභාවය සහ වගකීම්සහගත බැංකුකරණය GRI 206-1

බැංකුවේ දී, වගකීම යනු මූලික මූලධර්මයක් වන අතර, ඉන් නිෂ්පාදන සංවර්ධනය, සේවා ලබාදීමේ සිට අලෙවිකරණය සහ ගනුදෙනුකාර සහභාගිත්වය දක්වා අපගේ මෙහෙයුම් මුහුණත් තහවුරු කරයි.

අපගේ සියලුම මෙහෙයුම් මැදිහත්වීම තුළ විනිවිදභාවය, වගවීම සහ ගනුදෙනුකාර කේන්ද්‍රියතාව උසස්ම සදාචාර ප්‍රමිති නගා සිටුවීමට අපි කැපවී සිටිමු. වගකීම්සහගත බැංකුකරණය සඳහා අපගේ කැපවීම පහත සඳහන් ප්‍රධාන වැඩසටහන්වලින් පෙන්නුම් කෙරේ:

- ආරක්ෂිත සහ සුදුසු මූල්‍ය විසඳුම් ලබා දීම - අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා අපි අපගේ නිෂ්පාදන සහ සේවාවන් ඉතා සූක්ෂම ලෙස නිර්මාණය කරන අතර ඒවා ප්‍රවේශ විය හැකි, ප්‍රයෝජනවත් සහ ඒවායේ මූල්‍ය යහපැවැත්මට අනුකූල බව සහතික කරමු.
- පැහැදිලි සහ කාලෝචිත සන්නිවේදනය සහතික කිරීම - ගනුදෙනුකරුවන්ට හොඳින් දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට හැකි වන පරිදි, සවිස්තරාත්මක, අදාළ සහ කාලීන තොරතුරු ලබා දීමෙන් අපි විනිවිදභාවයට ප්‍රමුඛත්වය දෙමු.
- ක්‍රියාකාරී ප්‍රතිපෝෂණ කළමනාකරණය - ව්‍යුහගත මැසිවිලි හැසිරවීමේ යාන්ත්‍රණය තුළින්, විශ්වාසය සහ දිගුකාලීන සබඳතා පෝෂණය කරමින් ගනුදෙනුකාර ගැටළු සහ විමසීම් කඩිනමින් සහ කාර්යක්ෂමව විසඳනු ලැබේ.
- සේවක නිපුණතාවය වැඩි දියුණු කිරීම - පාරිභෝගික අවශ්‍යතා වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා අපගේ ශ්‍රම බලකාය අඛණ්ඩව පුහුණු කරනු ලබන අතර උසස් සේවා ලබාදීම සහ පුද්ගලාරෝපිත මූල්‍ය මග පෙන්වීම සහතික කරයි.
- අත්‍යවශ්‍ය මූල්‍ය තොරතුරු ප්‍රදර්ශනය කිරීම - පොලී අනුපාත, විනිමය අනුපාත සහ ණය දීමේ අනුපාත ඇතුළුව සම්පූර්ණ සහ ශක්තිය සහ ප්‍රවේශ්‍යතාව සහතික කිරීමට සියලුම ප්‍රධාන මූල්‍ය දත්ත අපගේ ශාඛාවල, ඩිජිටල් වේදිකාවල සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා ප්‍රධාන වශයෙන් ප්‍රදර්ශනය කෙරේ.
- නියමයන් සහ කොන්දේසි විනිවිද ලෙස සන්නිවේදනය කිරීම – මහ බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව සකස් කරන ලද ගනුදෙනුකාර ප්‍රඥප්තියට අනුකූලව, සියලුම නිෂ්පාදන නියමයන්, සේවා කොන්දේසි සහ පැමිණිලි විසඳීමේ ක්‍රියා පටිපාටි ගනුදෙනුකරුවන්ට පැහැදිලිව සන්නිවේදනය කරන බව අපි සහතික කරමු. මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා වෙත ප්‍රවේශ වීම ඇතුළුව අපගේ මැසිවිලි විසඳීමේ ක්‍රියාවලිය සියලුම ශාඛා පුරා දෘශ්‍යමානව ප්‍රදර්ශනය කෙරේ.
- තොරතුරු සඳහා මහජන ප්‍රවේශය සහතික කිරීම – තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට සම්පූර්ණයෙන්ම අනුකූලව, බැංකුව විසින් මහජන තොරතුරු නිලධාරියෙකු පත් කර ඇති අතර අදාළ බැංකු තොරතුරු සඳහා මහජන ප්‍රවේශය පහසු කිරීම සඳහා මනාව නිශ්චිත ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කර ඇත.

තවද, සියලුම අලෙවිකරණ සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය නියාමන අවශ්‍යතා දැඩිව පිළිගෙන ඇති සෑම දැන්වීමකම පහත ඇති අතර දෑ ඇතුලත් වේ.

- බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය පහසු ගනුදෙනුකාර ප්‍රවේශය සඳහා ආයතනික වෙබ් අඩවියේ විස්තර කෙරේ.
- මූල්‍ය ස්ථාවරත්වය සම්බන්ධයෙන් විනිවිදභාවය සහතික කරමින් බැංකුවේ නිල ණය ශ්‍රේණිගත කිරීම.
- 100% රජයේ ඇපකරය, නිල බැංකු ලාංඡනය සහ ආයතනික උද්යෝග පාඨය ඇතුළුව බැකුවේ සුවිශේෂී අනන්‍යතාවය.

අපි වගකීම්සහගත බැංකුකරණයට අපගේ බැඳීම සුවිශාල ගෞරවයක් ඇති කරන අතර වාර්තාකරණ කාලසීමාව තුළ, නිෂ්පාදන හා සේවා ලේබල්කරණය, අලෙවිකරණ සන්නිවේදන හෝ නියාමන මගපෙන්වීම් සමග අනුකූල නොවූ අවස්ථා නොමැත. අපගේ ව්‍යාපාරයේ මාධ්‍යයේ වගකීම ඇතුළත් කරමින්, අපි විශ්වාසී සහ සදාචාර මූල්‍ය ආයතනයක් ලෙස අපගේ කීර්තිනාමය අපි අඛණ්ඩව නගා සිටවමු.

## 4 සදාචාර හා තිරසාර බැංකුකරණය

වගකීම්සහගත මූල්‍ය ආයතනයක් ලෙස, බැංකුව සිය බැංකු මෙහෙයුම්වල සදාචාර, විනිවිදභාවය, සහ තිරසාරභාවය පිළිබඳ ඉහළම ප්‍රමිති දරා ගනිමු. සදාචාර බැංකුකරණයට අපගේ කැපවීම අපගේ ව්‍යාපාර ව්‍යවහාරවල ගැඹුරින් ඇතුළත් කරන අතර ගනුදෙනුකරුවන්, සමාජය හා ආර්ථිකය සඳහා දිගුකාලීන වටිනාකම නිර්මාණය කරමින් අඛණ්ඩතාව සමඟ අපි ක්‍රියාත්මක බව සහතික කරමු. වගවීම සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරමින්, ගනුදෙනුකාර විශ්වාසය ශක්තිමත් කිරීමට, මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමට, අපි අරමුණු කරන අතර ධනාත්මක සමාජ සහ පාරිසරික බලපෑම බලපෑම ඇති කරයි.

### සාධාරණ හා විනිවිද බැංකුකරණය

GRI 417-1, 2, 3

බැංකුවේ දී, ගනුදෙනුකාර විශ්වාසය අවංක සහ විනිවිද සන්නිවේදනය මත ගොඩ නගන බව අපි විශ්වාස කරමු. ගනුදෙනුකරුවන් දැනුවත් මූල්‍ය තීරණ ගන්නා බව සහතික කිරීමට, අපි පැහැදිලි, නිවැරදි, සහ වගකීම්සහගත නිෂ්පාදන ලේබල්කරණය සහ අලෙවිකරණ සන්නිවේදනය පවත්වා ගනිමු. වැරදි හිමිකම්, සැඟවුණු නියමයන් හෝ කූට ව්‍යවහාර වලක්වමින් අපි දැඩි සදාචාර ප්‍රමිති පිළිපදිමු. අපගේ අලෙවිකරණ ද්‍රව්‍ය මූල්‍ය නිෂ්පාදන හා සේවා පිළිබඳව අගනා විස්තර ලබාදෙන අතර ප්‍රතිලාභ, නියමයන් සහ කොන්දේසි පිළිබඳ පූර්ණ නිරාවරණ සමඟ ගනුදෙනුකරුවන් සවිමත් කරමු. ඊට අමතරව, ප්‍රචාරණය සහ අලෙවිකරණය පිළිබඳ සියලුම මහ බැංකු රෙගුලාසිවලට අපි අනුකූල වන අතර, සියලුම වේදිකා හරහා අපගේ පිරිනැමීම්වල සදාචාර නියෝජනය සහතික කරයි.

### තිරසාර මූල්‍යකරණ විසඳුම්

තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීමේදී මූල්‍ය ආයතනවල වැදගත් කාර්යභාරය හඳුනා ගනිමින්, බැංකුව හරිත හා වගකිවයුතු බැංකු මුලපිරීම් සඳහා සක්‍රිය සහාය දක්වයි. පාරිසරික, සමාජීය හා පාලන (ESG) ප්‍රතිෂ්ඨාවන් අපගේ ආයෝජන සහ ණයදීමේ තීරණවලට අපි ඒකාබද්ධ කර ඇති අතර, ආර්ථිකය, පරිසරය සහ සමාජයට ධනාත්මකව දායක වෙන ව්‍යාපෘතිවලට අපි අරමුදල් යොදන බව සහතික කරමු. අපගේ ප්‍රධාන තිරසාර අරමුදල් වැඩසටහන්වලට පහත දෑ ඇතුළත් වේ:

- පුනර්ජනනීය බලශක්තිය, හරිත යටිතල පහසුකම් සහ පරිසර හිතකාමී ව්‍යවසායන් වැනි පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම. (ස්වභාවික ප්‍රාග්ධනය පිටු අංක 148).
- වගකිවයුතු පරිභෝජනය සහ තිරසාර ආයෝජන දිරිමත් කිරීම, පරිසර හිතකාමී තීරණ ගැනීම දිරිමත් කරන මූල්‍ය නිෂ්පාදන පිරිනැමීම. (ස්වභාවික ප්‍රාග්ධනය පිටු අංක 148).

### ගනුදෙනුකාර කේන්ද්‍රීය ව්‍යාපාර අචාරධර්ම GRI 418-1

සදාචාර බැංකුකරණය අනුකූලතාවයෙන් ඉදිරියට ගමන් කරයි. එය සියලුම ගනුදෙනුකරුවන් සඳහා මූල්‍ය මෙහයුම් සඳහා සාධාරණ, ඇතුළත් සහ සමාන ප්‍රවේශය සහතික කරයි. බැංකුව සාධාරණ ණයදීමේ ප්‍රතිපත්තිවල පදනමක් මත ක්‍රියාත්මක වන අතර සිය පසුබිම නොසලකා සෑම ගනුදෙනුකරුවෙකුටම අපක්ෂපාතී මූල්‍ය සේවා ලැබෙන බව සහතික කරයි. අපගේ සදාචාර බැඳීම්වලට පහත දෑ ඇතුළත් වේ:

- **දත්ත ආරක්ෂාව සහ රහස්‍යතාව:** අපි ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවරයන් සහ දැඩි රහස්‍යතා ප්‍රොටෝකෝල හරහා ගනුදෙනුකාර දත්ත ආරක්ෂා කරන අතර තොරතුරු ආරක්ෂාව සහ දත්ත ආරක්ෂණ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කරමු.
- **වෙනස්වීමිලින් තොර බැංකු ව්‍යවහාර:** ආන්තික ප්‍රජාවන්හි පුද්ගලයින්, ආබාධිත පුද්ගලයින් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ඇතුළු විවිධ පාරිභෝගික අවශ්‍යතා සපුරාලන සේවාවන් පිරිනමන, අපි සියලු දෙනා ඇතුළත් බැංකු පරිසරයක් පෝෂණය කරමු.
- **සාධාරණ සහ වගකිවයුතු ණය දීම:** ගනුදෙනුකරුවන් කොල්ලකාරී ණය දීමේ ව්‍යවහාරවලට යටත් නොවන බව සහතික කරමින්, දැරිය හැකි ණය පහසුකම් සහ සාධාරණ ණය ආපසු ගෙවීමේ ව්‍යුහයන් අපි ප්‍රවර්ධනය කරමු.

### සදාචාර පාලනය හා වගවීම ශක්තිමත් කිරිම

සදාචාර සහ තිරසාර බැංකුකරණය සවිමත් කිරීමට, බැංකුව වගවීම සහ අනුකූලතාවය ප්‍රවර්ධනය කරන අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ පාලන රාමු ස්ථාපිත කර ඇත. අපගේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ඃඊස්ල සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ ණය අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) මගින් අපගේ සියලුම බැංකු කටයුතු සදාචාර මනා පරිචයන්, නියාමන අවශ්‍යතා සහ ආයතනික සමාජීය වගකීමේ (ĐR) බැඳීම් සමඟ පෙළ ගැසෙන බව සහතික කරයි.

තවද, සදාචාර බැංකුකරණ ප්‍රමිති, සහ මූල්‍ය ඇතුළත් මුලපිරීම් ලබාදීමට නියාමකයින්, ක්ෂේත්‍රයේ ආයතන, සහ වෙනත් පාර්ශවකරුවන් සමඟ සක්‍රීයව සහභාගී වන්නෙමු.

## 5 මූල්‍ය සාක්ෂරතාව සහ ගනුදෙනුකරුවන් සවිබලගැන්වීම

වගකීම්සහගත බැංකුකරණය හා තිරසාර ධනය නිර්මාණය ප්‍රවර්ධනය කිරීමේදී මූල්‍ය දැනුම සමඟ ගනුදෙනුකරුවන් සවිබලගැන්වීම තීරණාත්මක වේ.

### ප්‍රධාන මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්

- **ප්‍රජා මූල්‍ය අධ්‍යාපනය** - මුහුණු පොත සහ ටික්ටොක් හරහා ඉතුරුම්, ආයෝජන සහ ඩිජිටල් බැංකු ආරක්ෂාව පිළිබඳ රට පුරා වැඩමුළු පැවැත්වීම.
- **සයිබර් ආරක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන්** – මුහුණුපොත සහ ටික්ටොක් හරහා මාර්ගගත වංචා වැළැක්වීම, තතුබෑම් ප්‍රහාර සහ ආරක්ෂිත ඩිජිටල් බැංකුකරණ ව්‍යවහාර පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම.

## ගනුදෙනුකාර ප්‍රාග්ධන අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ උපායමාර්ග

| අවදානම් හා අභියෝග | බැංකුව කෙරෙහි බලපෑම | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| **ගනුදෙනුකාර විශ්වාසය හා පක්ෂපාතිත්වය බිඳ වැටීම** | තැන්පතු අඩුවීම, කීර්තිනාමය හානිය සහ ගනුදෙනුකාර ගැටීම | විනිවිදභාවය ශක්තිමත් කිරීම, සේවා තත්ත්වය වර්ධනය, ගනුදෙනුකාර සහභාගිත්ව වැඩසටහන් වැඩි කිරීම |
| **ආර්ථික පසුබෑස්ම හා ණය පැහැරහැරීම** | අක්‍රිය ණය වැඩිවීම ලාභදායිතාවයට බලපෑම | අවදානම් පදනම් ණයදීම ක්‍රියාත්මක කිරීම, නම්‍යශීලි ආපසු ගෙවීම් සැලසුම් හඳුන්වාදීම සහ ණය තක්සේරු ශක්තිමත් කිරිම |
| **ඩිජිටල් පරිනාමන අභියෝග** | ඩිජිටල්ලෝලි තරඟකරුවන් නිසා තාක්ෂණය පෙරටු කරගත් ගනුදෙනුකරුවන් අහිමිවීම | ඩිජිටල් බැංකුකරණ නව්‍යකරණ හා සයිබර් ආරක්ෂාව තුළ ආයෝජනය සහ ජංගම බැංකුකරණ සේවා වැඩි කිරිම |
| **වෙනත් බැංකුවලින් තරඟය** | වඩා යහපත් අනුපාත සහ සේවා පිරිනමන තරඟකරුවන් නිසා ඉහළ වටිනාකමැති ගනුදෙනුකරුවන් අහිමිවීම | තරඟකාරී ණය යෝජනා ක්‍රම පිරිනැමීම, පක්ෂපාතී වැඩසටහන් හඳුන්වාදීම සහ සම්බන්ධතා වැඩි කිරීම |

### අනාගත දැක්ම

**කෙටිකාලීන**

- බාධාරහිත මාර්ගගත සහ ජංගම බැංකුකරණ වේදිකා තුළින් ඩිජිටල් ගනුදෙනුකාර අත්දැකීම් වැඩි කිරීම.
- විවිධ ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට ගලපන ලද හුරුපුරුදු මූල්‍ය නිෂ්පාදන හඳුන්වාදීම
- දැනුවත් මූල්‍ය තීරණ ගැනීම සවිබල ගැන්වීමට මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් පුළුල් කිරීම

**මධ්‍ය සිට දිගුකාලීන**

- හරිත මූල්‍යකරණය හා ESG බැඳුණු විසඳුම් වැනි තිරසාර මූල්‍ය නිෂ්පාදන නවෝත්පාදනය
- පුද්ගලාරෝපිත සේවා සඳහා උසස් දත්ත විශ්ලේෂණ තුළින් ගනුදෙනුකාර සම්බන්ධතා ශක්තිමත් කිරිම
- තත්‍යකාලීන සහය සහ පුරෝකථන සහභාගිත්වය සඳහා කෘතීම බුද්ධිය පදනම් ගනුදෙනුකාර සේවාවල ආයෝජනය

# ව්‍යාපාර හවුල්කාර සැලැස්ම

## උපායමාර්ගික සහයෝගය භාවිතා කිරීම

බැංකුවේ, සැපයුම්කරුවන්, සේවා සපයන්නන්, උපායමාර්ගික සන්ධාන සහ ක්ෂේත්‍රයේ ආයතන ඇතුළත් අපගේ ව්‍යාපාර හවුල්කරුවන් බැංකුව මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සිය දැක්ම සහ ජාතික ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට සවිමත් කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ව්‍යපාර හවුල්කාර ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම ප්‍රධාන අවධානිත ක්ෂේත්‍රයක් වන අතර, බාහිර හවුල්කරුවන් සමඟ අපගේ සහභාගිත්වය කාර්යක්ෂමතාව, නව්‍යකරණය, සහ හුවමාරු සෞභාග්‍ය ඇතිකරන බව සහතික කරයි. වගකීම්සහගත ප්‍රසම්පාදනය, අර්ථවත් සහයෝගිතාව සහ උපායමාර්ගික සන්ධාන පෝෂණය කරමින්, අපි බැංකුවට සහ අපගේ වඩා පුළුල් පාර්ශ්වකාර ජාලයට දිගුකාලීන වටිනාකම නිර්මාණය කරමු.

**සැපයුම්කරුවන් ගණන**

**266**

2023 – 256

## විභව්‍ය හුවමාරුවීම්

**මූල්‍ය ප්‍රාග්ධනය** (−)
සැපයුම්කාර සංවර්ධනය හා හවුල්කාරත්වයන් හි ආයෝජන පිරිවැය වැඩිකරයි.

**නිෂ්පාදිත ප්‍රාග්ධනය** (−)
හවුල්කරුවන් සමඟ සහයෝගය අමතර යටිතල පහසුකම් ආයෝජනය අවශ්‍ය කරයි.

**බුද්ධිමය ප්‍රාග්ධනය** (−)
හවුල්කරුවන් සමඟ බුද්ධිමය සම්පත් හුවමාරුව හිමිකම් භාවිතය අඩුකළ හැකිය.

**මානව ප්‍රාග්ධනය** (−)
ව්‍යාපාර හවුල්කරුවන් මත දැඩි විශ්වාසය අභ්‍යන්තර ප්‍රවීනතාව සහ තීරණාත්මක නිපුනතා සංවර්ධනය සීමා කළ හැකිය.

**ස්වභාවික ප්‍රාග්ධනය** (+)
සම්බන්ධ තිරසාර ව්‍යවහාර නොමැතිකම හරිත ඉලක්කවලට බාධා කරයි.

බලපෑම: ධනාත්මක (+) ඍණාත්මක (−)

## තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රියකරුවන්

| | |
|---|---|
| 1 | වගකීම්සහගත ප්‍රසම්පාදන |
| 2 | ද්විත්ව මාර්ග සාකච්ඡා |
| 3 | බාහිර සේවා සපයන්නන්ට වටිනාකම ලබාදීම |
| 4 | උපායමාර්ගික සන්ධාන ශක්තිමත් කිරීම |
| 5 | ක්ෂේත්‍රයේ සාමාජිකත්වය |

## 1 වගකීම්සහගත ප්‍රසම්පාදනය

GRI 204-1

### බැංකුවේ තිරසාර හා සදාචාර ප්‍රසම්පාදන ව්‍යවහාර

බැංකුවේ දී, ප්‍රසම්පාදන යනු හුදෙක් මෙහෙයුම් අවශ්‍යතාවක් පමණක් ම නොව එය සදාචාර මූල්‍යකරණය, විනිවිදභාවය සහ තිරසාරභාවය නගා සිටුවීමට සැලසුම්කළ උපායාමාර්ගික වැඩසටහනක් ද වන අතර බැංකුව සහ එහි පාර්ශවකරුවන් සඳහා දිගුකාලීන වටිනාකම උත්පාදනය කරයි. ශක්තිමත් ප්‍රසම්පාදන රාමුවක් තුළින්, සියලුම භාණ්ඩ හා සේවා සාධාරණ තරඟය, පාරිසරික වගකීම සහ සමාජීය අනුකූලතාව සමඟ පෙළගැසීම සහතික කරන බව අපි සහතික වෙමු.

### උපායමාර්ගික හවුල්කාරත්වයන් හා දේශීය සහයෝගිතාව

අපගේ සැපයුම්කරුවන් උපායමාර්ගික හවුල්කරුවන් ලෙස අපි සලකනු ලබන අතර ඔවුන්ගෙන් ගුණාත්මක, සේවා, සහ සදාචාර පිළිබඳ උසස්ම ප්‍රමිති අපි අපේක්ෂා කරමු. බැංකුවේ ප්‍රසම්පාදන ව්‍යවහාර මඟින් දේශීය සැපයුම්කරුවන් සමඟ පමණක් කටයුතු කිරීම මගින් දේශීය සැපයුම් දාමය ශක්තිමත් කිරීම අපි අවධාරණය කරමු. මෙම ප්‍රවේශය ප්‍රජා සහභාගිත්වය වැඩිකර, ජාතික ආර්ථික වර්ධනයට සහය වි විදේශීය ප්‍රසම්පාදන මත විශ්වාසය අඩු කරනු ලබයි. 2024 දි, මුළු ප්‍රසම්පාදන වියදම රු.බිලියන 3 සැපයුම්කරුවන් 266කින් වූ අතර 100%ක්ම අපගේ භාණ්ඩ හා සේවා දේශීය වශයෙන් ප්‍රසම්පාදනය කෙරේ. එහිදි ශ්‍රී ලංකා රජය විසින් දක්වා ඇති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සමඟ අපි අනුකූල වුවෙමු.

### විනිවිද හා සියලු දෙනා ඇතුළත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය

බැංකුව සාධාරණත්වය, සමානතාව, රහස්‍යතාව සහ වගකීම පිළිබඳ මූලධර්ම මත ගොඩ නගන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියක් පිළිපදි. තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටි විනිවිද වන අතර වෙළෙන්ඳන්ට සමාන අවස්ථාව ලබාදි ඒකාකාරී ඇගයීම් පවත්වා ගනී. සදාචාර ව්‍යවහාර සහතික කිරීම සඳහා, අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරිනාමනය වන්නේ:

- ආර්ථික වටිනාකම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිම කිරීම.
- නියමිත ප්‍රමිතීන්, නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම.
- ලංසුකරුගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර නීතිවලට අනුකූල වීම.
- මෙහෙයුම් කාලරාමු සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා කඩිනම් බෙදාහැරීම.

### ප්‍රසම්පාදනය තුළට තිරසාරභාවය ඒකාබද්ධ කිරීම

ආර්ථික, සමාජීය හා පාරිසරික බලපෑම් තිරණ ගැනීමට ඒකාබද්ධ කරමින් තිරසාරභාවය බාධාරහිතව අපගේ ප්‍රසම්පාදන උපායමාර්ගයට ඒකාබද්ධ කෙරේ. අමුද්‍රව්‍ය වගකීමෙන් ලබාගන්නා බව මින් සහතික කරන අතර ESG මුලධර්ම පිළිපදින පරිසර හිතකාමි සැපයුම්කරුවන් අපි ප්‍රමුඛ කරමු.

### වගකීම්සහගත ප්‍රසම්පාදනය යටතේ ප්‍රධාන වැඩසටහන්

- **තිරසාර සැපයුම්කරු තේරීම:** පාරිසරික, සමාජීය සහ පාලන ප්‍රමිතීන්ට අනුකූල බව පෙන්නුම් කරන සැපයුම්කරුවන් සමඟ හවුල් වීම, සදාචාරාත්මකව මූලාශ්‍ර සහ පරිසර හිතකාමී ද්‍රව්‍ය සහතික කිරීම.
- **විවිධාංගීකරණය වූ සැපයුම් දාම:** අවදානම් අවම කිරීම සහ ආර්ථික අවස්ථා උපරිම කිරීම සඳහා සැපයුම්කරුවන්ගේ කළඹ සමතුලිත කිරීම.
- **සාධාරණ ටෙන්ඩර් ක්‍රියාවලිය:** වෙළෙන්දන් සඳහා සමාන තරඟකාරී අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා තරඟකාරී සහ අපක්ෂපාතී තේරීම් ක්‍රියාවලියක් පවත්වා ගැනීම.

- **සැපයුම් දාම අවදානම් කළමනාකරණය:** සැපයුම්කරුවන් අතර මූල්‍ය අස්ථාවරත්වය, සදාචාරාත්මක ගැටළු සහ නීතිමය අනුකූල නොවීම් ආමන්ත්‍රණය කිරීම සඳහා නිසි පසුවිපරම් පැවැත්වීම.

### පාලනය හා අධීක්ෂණය

ප්‍රසම්පාදනය බැංකුවේ සැපයුම් අංශය විසින් ක්‍රියාවට නංවන අතර, එය ප්‍රසම්පාදන කමිටුව, තාක්ෂණික ඇගයීම් කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩලය/සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් පත්කළ ලංසු විවෘත කිරීමේ කමිටුව හෝ බලයලත් අධිකාරයක් විසින් පරීක්ෂාකාරීව අධීක්ෂණය කරනු ලබයි. ඊට අමතරව, මූලික පාරිසරික පරීක්ෂණ (IEE), සහ පාරිසරික බලපෑම් ඇගයීම් (EIA) වැනි පාරිසරික තක්සේරු කිරීම් සහ අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතින් ලබා ගැනීම සැපයීම් අංශය සහතික කරයි.

### වෙනස්වන අවශ්‍යතා සහ අඛණ්ඩ වර්ධනය

මතුවන අවශ්‍යතා සහ මෙහෙයුම් අවශ්‍යතාවන්ට ප්‍රතිචාරාත්මකබව සහතික කරමින් වෙනස්වන අවශ්‍යතා පිළිබිඹු කිරීමට අපගේ ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කෙරේ. බාහිර සැපයුම්කරුවන්ගෙන් සේවා ස්ථිර වත්කම්, පාරිභෝගික භාණ්ඩ, ප්‍රවර්ධන අයිතම, නඩත්තුව, ඉදිකිරීම සහ විශේෂ ව්‍යාපෘති සඳහා උපදේශන සහය ඇතුළත් කෙරේ.

## 2 ද්විත්ව-මාර්ග සාකච්ඡා සහභාගිත්වය සහ සහයෝගිතාව ශක්තිමත් කිරීම

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනයට අපගේ ප්‍රවේශයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව වන්නේ අපගේ වෙළෙන්දන්, සැපයුම්කරුවන්, සහ සේවා සපයන්නන් සමඟ අඛණ්ඩ, විවෘත සහ උපකාරී සන්නිවේදනය පවත්වා ගැනීමයි.

බැංකුවේ සේවා විශිෂ්ටත්ව ප්‍රමිති සමඟ ගැලපීම මින් සහතික කරන අතර විශ්වාසය සහ දිගුකාලීන හවුල්කාරත්වයන් පෝෂණය කරයි.

ද්විත්ව-මාර්ග සාකච්ඡාව සඳහා අපගේ ප්‍රවේශයට පහත දෑ ඇතුළත්ය:

- **සැපයුම්කරු සහ හවුල්කරු ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ:** නිතිපතා සහභාගිත්ව සංසද සහ ව්‍යුහගත ප්‍රතිපෝෂණ ක්‍රියාවලීන් හවුල්කරුවන්ට ගැටළු ප්‍රකාශ කිරීමට, නවෝත්පාදන යෝජනා කිරීමට සහ සේවා වර්ධනයන්ට දායක වීමට ඉඩ සලසයි.
- **කාලානුරූපී කාර්ය සාධන සමාලෝචන:** අඛණ්ඩ වැඩිදියුණු කිරීමක් සඳහා කාලීනබව, ගුණාත්මකභාවය සහ අනුකූලතාවය වැනි ප්‍රධාන දර්ශකවලට අනුව සැපයුම්කරු සහ සේවා සපයන්නාගේ කාර්ය සාධනය තක්සේරු කිරීම.
- **සහයෝගී ගැටළු විසඳීම:** අන්‍යෝන්‍ය සාකච්ඡා තුළින් අභියෝග සක්‍රීයව විසඳීම, විභව සේවා බිඳවැටීම් ඵලදායී ලෙස අවම කරන බව සහතික කිරීම.
- **දැනුම හුවමාරුව සහ පුහුණුව:** ක්ෂේත්‍රයේ මනා පරිචයන්, නියාමන අවශ්‍යතා සහ බැංකුවේ වෙනස්වන ව්‍යාපාරික අවශ්‍යතා පිළිබඳව වෙළෙන්දන් සහ හවුල්කරුවන් යාවත්කාලීනව සිටින බව සහතික කිරීම සඳහා වැඩමුළු, කෙටි විස්තර සහ තොරතුරු සැසි සංවිධානය කිරීම.

සියලු දෙනා ඇතුළත් සහ සහයෝගී සම්බන්ධතා පෝෂණය කරමින්, සිය හවුල්කරුවන් සිය උපායමාර්ගික පරමාර්ථවලට කැපවී, සහභාගී වී, පෙළ ගැසී සිටින බව බැංකුව සහතික කරයි.

## 3 බාහිර සේවා සපයන්නන්ට වටිනාකම ලබාදීම

තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම්, ආරක්ෂක සේවා, පහසුකම් කළමනාකරණය, සහ ඩිජිටල් පරිනාමනය වැනි විවිධ කාර්යයන් සඳහා බැංකුව බාහිර සේවා සපයන්නන් පිළිබඳව විශ්වාසය තබයි. මෙම සැපයම්කරුවන්ට ප්‍රමාණවත් සහය ලැබෙන බව සහතික කිරීම මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා තීරණාත්මකය.

මෙම ක්ෂේත්‍රය තුළ ප්‍රධාන වැඩසටහන්වලට පහත දෑ ඇතුළත්ය:

- **සාධාරණ වන්දි ගෙවීම සහ කාලීන ගෙවීම්:** සැපයුම්කාර ජාලය තුළ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගනිමින් සියලුම බාහිර සේවා සපයන්නන්ට සිය සේවා සඳහා කඩිනමින් ගෙවන බව සහතික කිරීම.
- **හැකියා වර්ධනය:** සේවා තත්ත්වය සහ මෙහෙයුම් ඵලදායිත්වයන් වැඩි කිරීමට තාක්ෂණික සහය, දැනුම – හුවමාරු අවස්ථාවන් සහ තාක්ෂණික ඒකාබද්ධ කිරීමේ සහය ලබාදීම.
- **දිගුකාලීන උපායමාර්ගික හවුල්කාරත්වයන්:** නවෝත්කරණය, කාර්යක්ෂමතාව සහ පිරිවැය ප්‍රශස්ථකරණය ඇති කිරීමට ප්‍රධාන සේවා සපයන්නන් සමඟ චිරස්ථායි සම්බන්ධතා ගොඩ නැගීම.

වසර තුළ, බාහිර සේවා සපයන්නන් වෙත රු. මිලියන 573ක් අපි ගෙවා ඇති අතර, එයට බැංකුව තුළ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් ද ඇතුළත්ය. අපගේ බාහිරින් ලබාගැනීමේ ප්‍රතිපත්ති බාහිරින් ලබාගැනීම පිළිබඳ මාර්ගෝපදේශ සපයන අතර, බාහිරින් ලබාගන්නා කාර්යය, සේවාව, ක්‍රියවලිය හෝ ක්‍රියාකාරිත්වය සහ එහි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතාව තක්සේරු කිරීමට නිර්ණායක සපයයි.

## 4 වර්ධනය හා නව්‍යකරණය සඳහා උපායමාර්ගික සන්ධාන ශක්තිමත් කිරීම

බැංකුව සිය සේවා පිරිනැමීම් පුළුල් කිරීමට, සහ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට සහ මූල්‍ය අන්තර්ගතභාවය ඇති කිරීමට මූල්‍ය ආයතන, තාක්ෂණික ආයතන, නිශ්චල දේපල සංවර්ධකයින් සහ නියාමන ආයතන සමඟ උපායමාර්ගික සන්ධාන සක්‍රියව පෝෂණය කරයි.

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය සමඟ බැංකුව විසින් ගත් ප්‍රධාන වැඩසටහන්වලට පහත දෑ ඇතුළත්ය:

- මූල්‍ය ආයතන සමඟ සහයෝගිතාව: හරස් මායිම් ප්‍රේෂණ විසඳුම්, සම සන්නාම මූල්‍ය විසඳුම්, සහ විස්තීර්ණ ණය හැකියාවන් සඳහා දේශීය සහ ජාත්‍යන්තර බැංකු සමඟ හවුල්කාරිත්වය
- තාක්ෂණ හවුල්කාරිත්වයන්: ඩිජිටල් බැංකුකරණ නවෝත්පාදනයන් වේගවත් කිරීම, සයිබර් ආරක්ෂණ පියවර වර්ධනය කිරීම සහ ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය තාක්ෂණ සමාගම් (Fintec) සමඟ සහභාගි වීම.
- නිශ්චල දේපළ වෙළඳාම් සහ නිවාස අංශයේ හවුල්කාරිත්වයන්: ගනුදෙනුකරුවන්ට දැරිය හැකි නිවාස මූල්‍යකරණ විසඳුම් ලබා දීම සඳහා දේපළ සංවර්ධකයින් සහ ඉදිකිරීම් සමාගම් සමඟ වැඩ කිරීම.

- නියාමක සහ රාජ්‍ය සන්ධාන: මහ බැංකුව සමඟ සහයෝගීත්වයෙන්, මුදල් අමාත්‍යාංශය හා වෙනත් නියාමන ආයතන සමඟ මූල්‍ය සාක්ෂරතාව, ආර්ථික ස්ථාවරත්වය සහ බැංකු අංශයේ වර්ධනය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති හැඩ ගැසීම.

උපායමාර්ගික සන්ධාන ශක්තිමත් කරමින්, ව්‍යාපාර ව්‍යාප්තිය, තාක්ෂණික වර්ධනය, සහ නියාමන අනුකූලතාව බැංකුව සහතික කරන අතර ශ්‍රී ලංකා බැංකුකරණ ක්ෂේත්‍රය තුළ සිය නායකත්වය ශක්තිමත් කරයි.



හේලීස් සූර්‍ය සමාගම සමඟ අපගේ හවුල්කාරිත්වය



NSB ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා අපගේ තැපැල් ජාලය අගය කිරීම

SRI LANKA POST

හුවමාරු මධ්‍යස්ථාන 28ක් හා සහ අනුරූප බැංකු 12ක් අපත් සමඟ සම්බන්ධ වේ.

තැපැල් ජාලය

හුවමාරු මධ්‍යස්ථාන හා Eurogiro ජාලය

**තැපැල් කාර්යාල 652ක් සහ උප තැපැල් කාර්යාල 3,354ක් අපගේ නියෝජිත ජාලයේ කොටස්කරුවන් වෙති**

විදේශයන්හි පත්කළ නියෝජිතයින්

**2024 දී අපි ආයතන සමඟ උපායමාර්ගික සන්ධාන කිහිපයකට ඇතුළත් විය**

විදේශීය නියෝජිතයින් 6ක් ඉතාලිය, කුවේට්, දකුණු කොරියාව සහ එක්සත් අරාබි ඒමීර් රාජ්‍යයේ පත්කර ඇත.

උපායමාර්ගික සන්ධාන – සූර්ය/IT

සහය සේවා සැපයුම්කරුවන්

**අපගේ සේවා සපයන්නන් ටෙන්ඩර් ක්‍රියාවලිය තුළින් පරිස්සමින් තක්සේරු කර නිවාරණය කෙරේ.**

## 5 ක්ෂේත්‍රයේ සාමාජිකත්වයන්: ප්‍රගතිශීලී මූල්‍ය ප්‍රතිපත්ති සඳහා අවධානය යොමු කිරීම

GRI 2-28

ප්‍රගතිශීලී බැංකුකරණ ප්‍රතිපත්ති, නවෝත්පාදනය සහ තිරසාර ආර්ථික ව්‍යවහාර සඳහා අවධානය යොමු කිරීමට ක්ෂේත්‍රයේ සංසද, මූල්‍ය සංවිධාන, සහ නියාමන කමිටුවලට බැංකුව සක්‍රියව සහභාගි වේ.

### මෙම ක්ෂේත්‍රය තුළ ප්‍රධාන සහභාගිත්වයන් ට පහත දෑ ඇතුළත් වේ:

- **ක්ෂේත්‍රයේ සහයෝගිත්වය සඳහා සක්‍රීය සාමාජිකත්වයන්**

අපි ක්ෂේත්‍රයේ අභියෝග විසඳීමට සහ හිතකර මෙහෙයුම් පරිසරයක් පෝෂණය කිරීමට කැපවූ විවිධ සංවිධානවල ගෞරවනීය සාමාජිකයින් වේ. මෙවැනි සාමාජිකත්වයන් තුළින්, අපි ක්ෂේත්‍රයේ සංවර්ධනයට හා වර්ධනයට සක්‍රීයව දායක වන අතර සාමූහික ප්‍රගතිය ප්‍රවර්ධනය කරමු.

- ජාතික වාණිජ මණ්ඩලය
- ලංකා ක්ලියර් පුද්ගලික සමාගම
- ලංකා හාම්පුතුන්ගේ සංගමය
- වර්ල්ඩ් වයිඩ් ඉන්ටර් බැන්ක් ෆිනෑන්සියල් ටෙලිකොමියුනිකේෂන් (SWIFT) සමාජය
- ශ්‍රී ලංකා SWIFT පරිශීලක සමාජය
- ලෝක ඉතුරුම් බැංකුකරණ ආයතනය

- **ප්‍රතිපත්ති සාකච්ඡාවල සක්‍රීය සහභාගිත්වය**

ජාතික මූල්‍ය උපායමාර්ගයට සහ ඩිජිටල් පරිනාමන මාර්ග සිතියමට දායකවීමට රජයේ පාර්ශවකරුවන් සහ මූල්‍ය නියාමකයින් සමඟ සහභාගිත්වය.

# සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය



- **පර්යේෂණය සහ සංවර්ධන දායකත්වයන්:**

විශේෂයෙන් මූල්‍ය අන්තර්ගතභාවය, ඩිජිටල් බැංකුකරණ පරිනාමය, සහ නියාමන වර්ධනයන් තුළ මූල්‍ය අංශයේ පර්යේෂණවලට සහයවීම.

ක්ෂේත්‍රයේ සක්‍රිය සාමාජිකත්වයන් පවත්වා ගනිමින්, බැංකුව බැංකු ක්ෂේත්‍රයේ පරිනාමය තුළ පෙරමුනේ සිටින අතර, ධනාත්මක වෙනස්වීම්වලට බලපෑම් කරමින් ගෝලීය මූල්‍ය ප්‍රමිති සමඟ පෙළ ගැසීම සහතික කරයි.

### ගනුදෙනුකාර ප්‍රාග්ධන අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ උපායමාර්ග

| අවදානම් හා අභියෝග | බැංකුව කෙරෙහි බලපෑම | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| **නියාමකයින් සමඟ අනුකූල නොවීම** | මූල්‍ය දඩුවම් සහ කීර්තිනාම අලාභය. | නිරන්තර අනුකූලතා විගණන සහ හවුල්කාර පිළිපැදීම් පරීක්ෂාවන්. |
| **සීමිත සැපයුම්කරුවන් මත රඳාපැවැත්ම** | සැපයුම් දාමය බිඳවැටීම් සහ වැඩි වූ පිරිවැය | සැපයුම්කාර පදනම විවිධාංගීකරණය සහ අස්පෘශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කිරීම |
| **සැපයුම්කාර සදාචාර ගැටළු** | සන්නාම කීර්තිනාමයට සහ පාර්ශවකාර විශ්වාසයට හානිය. | ESG – අනුකූල සැපයුම්කරුවන් සමඟ පමණක් හවුල්කාරත්වය |

### අනාගත දැක්ම

**කෙටිකාලීන**

- කලාපීය ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා දේශීය සැපයුම්කරුවන් සමඟ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම.
- ESG ප්‍රමිතීන් සහ නීතිමය අවශ්‍යතා පිළිපැදීම සහතික කිරීම සඳහා අනුකූලතා නියාමනය වැඩි කිරීම.

**මධ්‍ය සිට දිගුකාලීන**

- රඳාපැවැත්ම අඩු කිරීම සහ සැපයුම් දාම අවදානම් අවම කිරීම සඳහා සැපයුම්කරු පදනම විවිධාංගීකරණය කිරීම.
- නවෝත්පාදන සහ තිරසාර භාවිතයන් මෙහෙයවීම සඳහා සැපයුම්කරුවන් සමඟ උපායමාර්ගික සහයෝගීතාවන් පෝෂණය කිරීම.

# නියාමන ප්‍රාග්ධනය

## ස්ථායිතාව ආරක්ෂා කිරීම සහ වර්ධනය ඇති කිරීම

### අපගේ නියාමකයින්




බැංකුවේ දී, ශ්‍රී ලංකා මූල්‍ය ක්ෂේත්‍රය තුළ බැංකුවේ ස්ථාවරත්වය, අඛණ්ඩතාව සහ දිගුකාලීන සාර්ථකත්වය සහතික කිරීමේදී නියාමන ප්‍රාග්ධනය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. අනුකූලතාව, සදාචාර බැංකුකරණය, සහ පාලන විශිෂ්ටත්වය සඳහා අපගේ කැපවීම පාර්ශවකරුවන්, ගනුදෙනුකරුවන් සහ වෙනත් පාර්ශවකරුවන්ට සමානවම විශ්වාස පෝෂණය කරයි. දැඩි නියාමන අවශ්‍යතාවන් පිළිපදිමින්, සහ ශක්තිමත් පාලන රාමු ඇතුළත් කරගනිමින්, අපි මූල්‍ය ස්ථායිතාව සුරකින අතර ජාතික ආර්ථික සංවර්ධනයට අපගේ දායකත්වය ශක්තිමත් කරමු.

ගෙවන ලද බදු

**රු. මි. 19,493**

2023 – (රු.මි. 1,628)

ගෙවන ලද විශේෂ ගාස්තු

**රු. මි. 320**

රු. මි. 320

### විභව්‍ය හුවමාරුවීම්

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | අනුකූලතා පිරිවැය ලාභදායිතාව අඩු කරයි. | − |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධනය රඳවාගැනීම යටිතල පහසුකම් නවීකරණය | − |
| මානව ප්‍රාග්ධනය | නියාමන පීඩනය සේවක වැඩි අධිකබව සහ ආතතිය වැඩිකළ හැක. | − |
| බුද්ධිමය ප්‍රාග්ධනය | නියාමන සෘජුබව නව්‍යකරණය මන්දගාමී කළ හැක. | − |
| සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | නියාමන කාර්යයන් මහජන දර්ශනයට බලපෑම් කළ හැක. | − |
| ස්වභාවික ප්‍රාග්ධනය | නියාමන අවධානය තිරසාර වැඩසටහන් පාලනය කරනු ඇත. | − |

බලපෑම: ධනාත්මක + සෘණාත්මක −

### තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රියකරුවන්

| | |
|---|---|
| 1 | රෙගුලාසි සමග අනුරූප අනුකූලතාව |
| 2 | මුදල් විශුද්ධිකරණ අල්ලස් සහ දූෂණය වැළැක්වීම |
| 3 | ශක්තිමත් පාලනය හා විචක්ෂණ අවදානම් කළමනාකරණය |
| 4 | උපායමාර්ගික සන්ධාන ශක්තිමත් කිරීම |
| 5 | රජයට දායකත්වය |

## 1 රෙගුලාසි සමග අනුකූල වීම

සියලුම බැංකු මෙහෙයුම් ජාතික හා ජාත්‍යන්තර මුදල් නීතිවලට දැඩි පිළිපැදීමක් පවත්වන බව බැංකුවේ සාර්ථකත්වයේ සහ නියාමන අනුකූලතාවයට සිය නොසැලෙන කැපවීමේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව මගින් සහතික කරයි. මූල්‍ය ප්‍රතිපත්ති, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතා සහ විචක්ෂණ ප්‍රතිමාන සමග පෙළ ගැසීමට මහ බැංකුව, මුදල් අමාත්‍යංශය, සහ වෙනත් අදාළ ආයතන වැනි නියාමකයින් සමග බැංකුව සක්‍රියව සහභාගි වේ.

ප්‍රධාන අනුකූලතා වැඩසටහන්වලට පහත දෑ ඇතුළත්ය:

- ශක්තිමත් ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීම සඳහා බාසල් ෂෂෂ ප්‍රමිතීන්ට අනුකූල වීම.
- බැංකු ව්‍යවහාර, ණය දීමේ ප්‍රතිපත්ති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ මහ බැංකුවේ නියෝග කාලිනව ක්‍රියාත්මක කිරීම.
- විභව නියාමන අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා සක්‍රීය අවදානම් මත පදනම් වූ අධීක්ෂණය.
- වගවීම සහ නියාමන විශ්වාසය සහතික කිරීම සඳහා විනිවිද පෙනෙන මූල්‍ය හෙළිදරව් කිරීම්.

වෙනස්වන රෙගුලාසිවලට අනුරූපව අනුකූල වෙමින්, බැංකුව සිය මෙහෙයුම් ඔරොත්තුදීම වැඩිකර, තැන්පතුහිමියන්ගේ විශ්වාසය ආරක්ෂා කර බැංකු ක්ෂේත්‍රය තුළ සිය නායකත්වය ශක්තිමත් කරයි.

## 2 මුදල් විශුද්ධිකරණය හා අල්ලස සහ දූෂණය වැළැක්වීම

GRI 205-2, 3

රාජ්‍ය බැංකුවක් ලෙස මහජන අරමුදල් භාරව සිටින බැංකුව, මූල්‍යමය බුද්ධි ඒකකයේ (FIU) මාර්ගෝපදේශ සහ ගෝලීය මනා පරිචයන් සහ පෙළ ගැසීමේදී බැංකුව මූල්‍ය අඛණ්ඩතාව, සදාචාර හැසිරීම, සහ වංචා වැළැක්වීම පිළිබඳ ඉහළම ප්‍රමිති පිළිගනී. මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදී අරමුදල්කරණය, අල්ලස් සහ දූෂණයට එරෙහිව සිය සටන තුළ ස්ථිරව සිටී.

අපගේ ප්‍රධාන මූලපිරීම්වලට පහත දෑ ඇතුළත් වේ:

- නීති විරෝධී මූල්‍ය කටයුතු හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ වැළැක්වීම සඳහා ශක්තිමත් මුදල් විශුද්ධිකරණය විරෝධී සහ ත්‍රස්ත විරෝධී මූල්‍යකරණ රාමුවක් ක්‍රියාත්මක කිරීම.
- ඔබේ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (KYC) ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සහ සැක සහිත කටයුතු හඳුනා ගැනීම සඳහා ගනුදෙනු අඛණ්ඩව නියාමනය කිරීම.
- සදාචාරාත්මක බැංකු පරිචයන් සහ නියාමන අනුකූලතාව පිළිබඳ පුළුල් සේවක පුහුණු වැඩසටහන්.
- අල්ලස් විරෝධී සහ දූෂණ විරෝධී ප්‍රතිපත්ති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම, ආයතනයේ සියලුම මට්ටම් හරහා සදාචාර විරෝධී හැසිරීම් සඳහා ශුන්‍ය ඉවසීමක් සහතික කිරීම. 2024 දී කිසිදු සිදුවීමක් වාර්තා නොවීය.

මෙවැනි සක්‍රීය ක්‍රියාමාර්ග තුළින්, බැංකුව වගකීම්සහගත මූල්‍ය ආයතනයක් ලෙස සිය කීර්තිනාමය ශක්තිමත් කරන අතර මූල්‍ය අපරාධ මැඩපැවැත්වීමට ජාතික සහ ජාත්‍යන්තර උත්සාහයන්ට සහය වේ.

## 3 ශක්තිමත් පාලනය හා විචක්ෂණ අවදානම් කළමනාකණය

බැංකුව දැඩි ආයතනික පාලන රාමුවක් යටතේ ක්‍රියාත්මක වන අතර, එමගින් සියලුම බැංකු කටයුතුවලදි විනිවිදභාවය, වගවීම සහ සදාචාර නායකත්වය සහතික කරයි. අපගේ පාලන ව්‍යුහය අවදානම් අවම කිරීමට, තීරණ ගැනීම වැඩි කිරීමට සහ සියලුම පාර්ශ්වකරුවන්ගේ අයිතිය ආරක්ෂා කිරීමට සැලසුම් කර ඇත.

(ආයතනික පාලන වාර්තාව පිටු අංක 169 සිට 183 දක්වා ඇත).

ශක්තිමත් පාලන සහ අවදානම් පාලන යාන්ත්‍රණ පවත්වා ගනිමින්, බැංකුව දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය සහතික කරන අතර නියාමන විශ්වාසය ශක්තිමත් කරයි.

## 4 රජයට සහ ජාතික ආර්ථික ස්ථාවරත්වයට දායකත්වය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ඉතුරුම් ආයතනය ලෙස, ජාතික සංවර්ධනය ඇතිකරන රජය මෙහෙයවන මූල්‍ය සහ ආර්ථික ප්‍රතිපත්තිවලට සහයවීමේදී බැංකුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. බැංකුව පහත දෑ හරහා ජාතික ආර්ථික වර්ධනයට සක්‍රියව දායක වේ:

- ඉතුරුම් සංචලනය, සහ ජාතික යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් යොමු කිරීම, ආර්ථික ප්‍රගතිය පෝෂණය කිරීම.
- මූල්‍ය අන්තර්ගතභාවය සඳහා රජයේ ප්‍රමුඛතා සමඟ පෙළගැසෙමින් ප්‍රධාන අංශ සඳහා දැරිය හැකි ණය ලබා දීම.
- මූල්‍ය ස්ථායිතාව සහ ගනුදෙනුකාර ආරක්ෂාව වැඩි දියුණු කරන ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා නියාමන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- ජාතික ආදායම් උත්පාදනය තුළ බැංකුවේ කාර්යභාරය ශක්තිමත් කරමින්, රජයට කාලීන බදු දායක මුදල් සහ ලාභාංශ ගෙවීම්.

රජයේ මුලපිරීම්වලට සක්‍රීයව දායක වෙමින්, බැංකුව ආර්ථික ඔරොත්තුදීම, මූල්‍ය ප්‍රවේශ්‍යතාව සහ ජාතික සෞභාගයේ ප්‍රධාන ධාවකයෙක් ලෙස සිය තත්ත්වය ශක්තිමත් කරයි.

### ගනුදෙනුකාර ප්‍රාග්ධන අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග

| අවදානම් හා අභියෝග | බැංකුව කෙරෙහි බලපෑම | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතා දැඩි කිරීම** | ප්‍රාග්ධන බෆර, සීමිත ධාරිතාව ණය ප්‍රසාරණය සහ උපායමාර්ගික ආයෝජන සඳහා පීඩනයක් ඇතිකරයි. | අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය සහ ඕනෑම අමුතු කම්පනයකට ඔරොත්තු දීමේ බැංකුවේ හැකියාව මැනීම සඳහා පීඩන පරීක්ෂණ පැවැත්වීම හරහා බාසල් III නියාමන අවම මට්ටමට වඩා ඉහළින් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීම. |
| **අවදානම බරතබන ලද වත්කම්වල උච්චාවචනය (RWAs)** | ණය ගුණාත්මකභාවය හෝ වත්කම් මුසුව මාරුවීම් හේතුවෙන් ප්‍රාග්ධන අනුපාතවලට බලපාන අතර, නියාමන මැදිහත්වීමක් ඇති කළ හැකිය. | ප්‍රාග්ධන අස්ථාවරත්වය අඩු කිරීම සඳහා ණය අවදානම් ආදර්ශකරණය වැඩි කිරීම සහ සමතුලිත වත්කම් මුසුවක් පවත්වා ගැනීම. |
| **වෙළෙඳපොළ අලාභ සහ හානිකරණය තුළින් ප්‍රාග්ධනය ඛාදනය වීම** | විශේෂයෙන් ස්වෛරී සහ භාණ්ඩාගාර වත්කම් මත ඉහළ යන හානිකරණය ප්‍රධාන ප්‍රාග්ධන මට්ටම් (CET 1) අඩු කරයි. | ප්‍රාග්ධන ශක්තිය ආරක්ෂා කර ගැනීම සඳහා අනාගතය දකින ECL ආකෘති යොදාගැනීම සහ විචක්ෂණශීලී ප්‍රතිපාදන බෆර පවත්වා ගැනීම. |

### අනාගත දැක්ම

**කෙටිකාලීන**

- යාවත්කාලීන කළ රෙගුලාසි වලට ආසන්න අනුකූලවීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම.
- නියාමන වෙනස්වීම් ඵලදායී ලෙස විසඳීම සඳහා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් වැඩි කිරීම.
- අනුකූලතා මිනුම් තත්‍ය කාලීන නියාමනය සහ වාර්තා කිරීම සඳහා තාක්ෂණය තුළ ආයෝජනය කිරීම.

**මධ්‍ය සිට දිගුකාලීන**

- වෙනස්වන නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා ශක්තිමත් ප්‍රාග්ධන සැලසුම් උපාය මාර්ග සංවර්ධනය කිරීම.
- ESG අනුකූලතාව පිළිබඳ ප්‍රවීනතාව ගොඩනගා ගැනීම සහ තිරසාරභාවය කේන්ද්‍ර කරගත් රෙගුලාසි සමඟ මෙහෙයුම් පෙළගැස්වීම.
- විභව නීතිකරණ මාරුවීම් සමඟ සිටීමට නියාමන අධිකාරීන් සමඟ සහයෝගීතාව පෝෂණය කිරීම.

# ප්‍රජා ප්‍රාග්ධනය

## සම්බන්ධතා පෝෂණය කිරීම, ප්‍රජාවන් සවිබල ගැන්වීම

බැංකුවේ දී, ප්‍රජා ප්‍රාග්ධනය වෙත අපගේ බැඳීම මූල්‍ය සේවාවන්ගෙන් ඔබ්බට විහිද යයි. එය ශ්‍රී ලංකාව තුළ තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනය ඇති කරන අපගේ මෙහෙවරේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව වේ. රජයට අයත් මූල්‍ය ආයතනයක් ලෙස, සියලු දෙනා ඇතුළත් වර්ධනය පෝෂණය කිරීම, ප්‍රජාවන් නගාසිටුවීම, සහ ජාතික සංවර්ධනයට දායකවීම සඳහා අපගේ වගකීම අපි හඳුනා ගනිමු. අපගේ මූල්‍ය ශක්තිය හා උපායමාර්ගික මුලපිරීම් භාවිතා කරමින්, අපගේ මෙහෙයුම් සමාජය කෙරෙහි දිගුකාලීන ධනාත්මක බලපෑම් නිර්මාණය කරන බව අපි සහතික වෙමු.

2024 දී, ප්‍රජා ප්‍රාග්ධනය කරා අපගේ ප්‍රවේශය තිරසාර වටිනාකම නිර්මාණය ඇති කරන ප්‍රධාන සක්‍රියකරුවන් හතරක් විසින් මෙහෙයවන ලදී.

මෙම සක්‍රියකරුවන් අපගේ ආයතනික අරමුණ සමඟ පෙළ ගැසීම පමණක් නොව ජාතියේ ප්‍රගතියට කැප වූ වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස අපගේ කාර්යභාරය ශක්තිමත් කර ඇත.

### තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රීයකරුවන්

| | |
|---|---|
| 1 | මූල්‍ය අන්තර්ගතභාවය හා ප්‍රවේශ්‍යතාව |
| 2 | සමාජීය වගකීම සහ ප්‍රජා සහභාගිත්වය |
| 3 | තිරසාර සංවර්ධනය සහ හරිත වැඩසටහන් |
| 4 | වර්ධනය සඳහා දේශීය ව්‍යවසාය හා උපායමාර්ගික සන්ධානවලට සහයවීම |

### විභව්‍ය හුවමාරුවීම්

| ප්‍රාග්ධනය | විභව්‍ය හුවමාරුව | බලපෑම |
|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | CSR වියදම් කිරීම ආදායම් අවධානිත වැඩසටහන් සීමා කළ හැක. | − |
| මානව ප්‍රාග්ධනය | සේවක සම්බන්ධතා කාලය මූලික ඵලදායීතාව අඩුකළ හැකිය. | − |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | ප්‍රජා සහය සඳහා අරමුදල් යටිතලපහසුකම් උසස් කිරීම් ප්‍රමාද කළ හැක. | − |
| බුද්ධිමය ප්‍රාග්ධනය | ප්‍රජා අවධානය පර්යේෂණ හා සංවර්ධන මුලපිරීම් මන්දගාමී කළ හැක. | − |
| සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | දේශීය ප්‍රජාවන් කෙරෙහි අධි අවධාරණය වඩා පුළුල් පාර්ශවකරුවන් නොසලකා හැරිය හැක. | − |
| ස්වභාවික ප්‍රාග්ධනය | සංචාරක, අමුද්‍රව්‍ය හෝ සිදුවීම් සම්බන්ධවන සමාජීය වැඩසටහන් පවා ඉහළ පාරිසරික පාසටහනට දායක විය හැක. | − |

බලපෑම: ධනාත්මක + සෘණාත්මක −

## 1 මූල්‍ය අන්තර්ගතභාවය සහ ප්‍රවේශ්‍යතාව

බැංකු සේවා ශ්‍රී ලාංකිකයින්ට පිවිසියහැකි, සියලු දෙනා ඇතුළත්, සහ දැරියහැකි බව සහතික කරමින් ආර්ථික විෂමතා සමනය කිරීමට සිය කැපවීම තුළ ස්ථිරව සිටී. මූල්‍ය අන්තර්ගතභාවය ජාතික සංවර්ධනයේදී තීරණාත්මක සක්‍රියකරුවෙක් වන අතර, 2024 දී, විශේෂයෙන් ග්‍රාමීය හා සේවය අඩු ප්‍රදේශවල අපගේ ලඟාවීම පුළුල් කිරීමට සැලකියයුතු පියවර අපි රැගෙන ඇත.

- **ශාඛා නැවත ස්ථානගත කිරීම සහ ඩිජිටල් බැංකුකරණය:** ප්‍රවේශ්‍යතාව වැඩි කිරීමට, රටපුරා ගනුදෙනුකරුවන්ට බාධා රහිත මූල්‍ය සේවා ලබාදීමට උපායමාර්ගික නැවත ස්ථානගත කිරීම් සඳහා අපගේ ශාඛා ජාලය නැවත ස්ථානගත කිරීම සහ ඩිජිටල් බැංකුකරණ වේදිකා ප්‍රවර්ධනය කිරීම අපි අඛණ්ඩව සිදු කරමු.

  (නිෂ්පාදිත ප්‍රාග්ධනය පිටු අංක 102 සිට 107 දක්වා සහ බුද්ධිමය ප්‍රාග්ධනය පිටු අංක 120 සිට 127 දක්වා බලන්න).
- අපගේ ජංගම බැංකුකරණ විසඳුම් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය ජනතාවට වඩාත් සමීප බැංකු සේවා ගෙනයාමේදී තීරණාත්මක වී ඇත.
- **අඩුවෙන් සේවය ලත් ප්‍රජාවන් සවිබලගැන්වීම:** කාන්තාවන්, අඩු ආදායම් පවුල්, සහ පළමුවරට ගිණුම් දරන්නන් ඇතුළත් ආන්තික කණ්ඩායම්වලට සහයවීමට විධිමත් ආර්ථිකය තුළ සහභාගිවීමට හැකියාව ඇති කරමින් විශේෂ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සහ බැංකු නිෂ්පාදන හඳුන්වා දෙන ලදී. සංක්‍රමණික සේවකයින් වෙනුවෙන් විදේශ රැකියා කාර්යාංශයේ සහයෝගයෙන් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් 16ක් අපි පැවැත් වූ අතර, ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා "ස්ත්‍රී" ඉතුරුම් තැන්පතුව ප්‍රවර්ධනය කරමින් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් 985ක් පවත්වන ලදී.
- **දැරියහැකි සහ සියලු දෙනා ඇතුළත් මූල්‍ය නිෂ්පාදන:** දැරියහැකි නිවාස මූල්‍ය සහ තරුණ ඉතුරුම් යෝජනා ක්‍රම ඇතුළත් ගලපන ලද මූල්‍ය විසඳුම් මූල්‍ය ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීමේදී හා ස්ථාවර අනාගතයක් ගොඩ නැගීමේදී පුද්ගලයින්ට සහයවීම පිණිස පිරිනමන ලදී.

  (වැඩි විස්තර සඳහා ගනුදෙනුකාර ප්‍රාග්ධනය පිටු අංක 129 සිට 136 දක්වා බලන්න).

මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රමුඛ කරමින්, බැංකුව ජාතික සංවර්ධනයට දායක වීම පමණක් නොව දිගු කාලීන මූල්‍ය යහපැවැත්ම සඳහා අවශ්‍ය මෙවලම් සහ සම්පත් සමග පුද්ගලයින් සවිබල ගන්වනු ලබයි.

## 2 ආයතනික සමාජීය වගකීම (QR) සහ ප්‍රජා සහභාගිත්වය

GRI 413-1, 2

සමාජීය වගකිම්සහගත ආයතනයක් ලෙස, බැංකුව ඉලක්කගත ආයතනික සමාජීය වගකිම්සහගත වැඩසටහන් තුළින් ප්‍රජාවන්ට නැවත සැලකීම සඳහා කැපවී සිටින අතර, එය වැඩසටහන්වලින් අධ්‍යාපනය, සෞඛ්‍යාරක්ෂාව, සහ සමාජීය සුභසාධනය වැඩි කරයි. සමාජීය යහපැවැත්ම තුළ ආයෝජනය කිරිම දිගුකාලින ආර්ථික ස්ථාවරත්වයට හා සෞභාග්‍යට පරිවර්තනය කරන බව අපි විශ්වාස කරමු.

- **අධ්‍යාපනය සහ තරුණ සංවර්ධනය:** ජාතිය ගොඩ නැංවීමේදි අධ්‍යාපනයේ ඇති වැදගත්කම හඳුනා ගනිමින්, අපි ශිෂ්‍යත්ව, පාසල් යටිතලපහසුකම් සහය, සහ රටපුරා සිසුන්ට ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් ලබා දෙන්නනෙමු. අපගේ මුලපිරිම්වලින් අධ්‍යාපන පරතරය යාකිරිම සහ සමාන ඉගෙනුම් අවස්ථා ලබාදිම අරමුණු කරමු.
- අපි දේශීය, රජයේ සහ පෞද්ගලික විශ්ව විද්‍යාල සඳහා සීමාවාසික වැඩසටහන් පිරිනමන්නෙමු. බැංකුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අනුමත පුහුණු හවුල්කරුවෙකි. බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍ය කුසලතා ඇති පුද්ගලයින් අපි සවිබල ගන්වා ඇත්තෙමු.
- ශ්‍රී ලංකාවේ වගකීම්සහගත බැංකුවක් ලෙස, අපි විදේශ රැකියා කාර්යාංශය සමඟ සහයෝග යෙන් සංක්‍රමණික සේවකයින් සඳහා රට පුරා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් පැවැත්වුනෙමු.
- **සෞඛ්‍ය සේවා සහ යහපැවැත්ම:** රෝහල් සඳහා මූල්‍ය ආධාර, මූල්‍ය යහපැවැත්ම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මානසික හා ශාරීරික සෞඛ්‍යයට සහාය වන මුලපිරීම් ඇතුළු මහජන සෞඛ්‍ය වැඩසටහන් සඳහා බැංකුව සක්‍රීයව දායක විය.
- **ආපදා සහන සහ හදිසි සහාය:** රජයට අයත් බැංකුවක් ලෙස, අවශ්‍යතා ඇති අවස්ථාවලදී අපි සැමවිටම අපගේ ප්‍රජාවන් වෙනුවෙන් පෙනී සිටිමු. ස්වාභාවික විපත් සහ ආර්ථික අභියෝගවලට ප්‍රතිචාරාත්මකව, අපි බලපෑමට ලක් වූ පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට ක්ෂණික සහන, මූල්‍ය ආධාර සහ නැවත ගොඩනැගීමේ සහාය ලබා දුන්නෙමු.
- **සේවකයින් පදනම් ප්‍රජා සහභාගිත්වය:** අපගේ සේවකයින් ප්‍රජා සංවර්ධනය තුළ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ස්වේච්ඡා වැඩසටහන් සහ සමාජීය බලපෑම්සහගත මුලපිරීම් තුළින්, බැංකුවේ කාර්ය මණ්ඩලය පුනාරුධාර කටයුතු, පරිසරය පිරිසිදු කිරීමේ වැඩසටහන් සහ මූල්‍ය අධ්‍යාපනික වැඩමුළුවල සක්‍රියව සහභාගි වී ඇත.

ප්‍රජා යහ පැවැත්ම අපගේ ආයතනික උපායමාර්ග යට ඇතුළත් කර ගනිමින්, තිරසාර සමාජ සංවර්ධනය හා ජාතික ප්‍රගතියට අපගේ කැපවීම අපි නැවත සහතික කරමු.

## 3 තිරසාර සංවර්ධනය හා හරිත මුලපිරීම්

පාරිසරික ආරක්ෂාව, හරිත මූල්‍යකරණය, සහ කාලගුණ ඔරොත්තුදිම ප්‍රමුඛ කරන වගකිම්සහගත බැංකුකරණ ව්‍යවහාර තුළින් ප්‍රජාව අවධානිත තිරසාරභාවය ඇති කිරීමට බැංකුව කැපවී සිටී. තිරසාර ආර්ථික වර්ධනය පාරිසරික භාරකාරත්වය සමඟ යායුතු බව අපි හඳුනා ගනිමු.

- **හරිත මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරිම:** 2024 දි, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, පරිසර හිතකාමී ව්‍යාපාර සහ තිරසාර ඉදිකිරීම් ව්‍යවහාර සඳහා අපගේ සහයෝගය අපි ශක්තිමත් කළෙමු. අපගේ විශේෂිත ණය යෝජනා ක්‍රමය බලශක්ති කාර්යක්ෂම නිවාස විසඳුම් සහ සූර්ය බලශක්ති පද්ධති යොදා ගැනීමට ගනුදෙනුකරුවන් දිරි ගන්වා ඇත. (ස්වභාවික ප්‍රාග්ධනය පිටු අංක 148 හි දැක්වේ).
- **කඩදාසි රහිත බැංකුකරණය සහ කාබන් අඩු කිරීම:** අපගේ ඩිජිටල් පරිවර්තන මුලපිරීම් විද්‍යුත් ප්‍රකාශන, ඩිජිටල් ගෙවීම් සහ ජංගම බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම මගින් බැංකුවේ පාරිසරික පියසටහන අඩු කිරීමට උපකාරි වූ අතර කඩදාසි භාවිතය අඩුකර ඇත.

  (ස්වභාවික ප්‍රාග්ධනය පිටු අංක 150 හි දැක්වේ).
- **තිරසාරභාවය පිළිබඳ ප්‍රජා දැනුවත්කම:** වගකිවයුතු සම්පත් භාවිතය, අපද්‍රව්‍ය අවම කිරීම සහ දේශගුණික ක්‍රියාමාර්ග සඳහා පෙනී සිටිමින් පාරිසරික අධ්‍යාපන වැඩසටහන් හරහා අපි ප්‍රජාවන් සමඟ සක්‍රීයව සහභාගි වූවෙමු.

මෙවැනි උත්සාහයන් තුළින්, බැංකුව තිරසාර සංවර්ධනය සහිත මූල්‍ය වර්ධනය සමඟ අඛණ්ඩව පෙළ ගැසෙන අතර, අනාගත පරම්පරාවන් ශ්‍රී ලංකාවේ ආර්ථිකමය සහ පාරිසරිකමය ඔරොත්තු දීමකින් ප්‍රතිලාභ ලබන බව සහතික කරයි.

## 4 දේශීය ව්‍යවසාය සහ වර්ධනය සඳහා උපායමාර්ගික සන්ධානවලට සහයවීම

ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන ආර්ථික සංවර්ධනයේදී දේශීය ව්‍යාපාර සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ඉටු කරන වැදගත් කාර්යභාරය බැංකුව හඳුනා ගනී. ක්ෂේත්‍රයේ සහයෝගීතාවයන් තුළින්, අපි රැකියා උත්පාදනය සහ ජාතික ඵලදායිතාවයට දායක වෙමු.

- ආර්ථික ප්‍රගතිය ඇතිකරන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට උපායමාර්ගික සන්ධාන ශක්තිමත් කිරිම: රජයේ ආයතන, ක්ෂේත්‍රයේ ආයතන, සහ ප්‍රජා සංවිධාන සමඟ බැංකුව සක්‍රිය හවුල්කරුවන් වේ. මූල්‍ය සාක්ෂරතාවය පුළුල් කිරීම, ව්‍යවසායකයින් සඳහා පුහුණුව ලබා දීම සහ දේශීය සැපයුම් දාම ශක්තිමත් කිරීම සඳහා මෙම හවුල්කාරිත්වයන් තීරණාත්මක වී ඇත.
- යටිතල පහසුකම් සහ රැකියා වර්ධනය ඇති කිරිම: නිශ්චල දේපල සංවර්ධකයින් සහ සේවා සපයන්නන් සමඟ සම්බන්ධීකරණ උත්සාහයන් තුළින්, මහා පරිමානයේ නිවාස ව්‍යාපාති, රාජ්‍ය අංශයේ සංවර්ධනයන් සහ ජාතික ආර්ථිකය උත්තේජනය කරන රැකියා උත්පාදන වැඩසටහන්වලට අපි සහය වී ඇත.

## ආයතනික සමාජීය වගකීම (ÐR) වැඩසටහන්

අධ්‍යාපනය, සෞඛ්‍යාරක්ෂාව, පාරිසරික තිරසාරභාවය සහ ආපදා සහන තුළ ආයතනික සමාජීය වගකීම්සහගත ව්‍යාපාති තුළින් ප්‍රජා යහපැවැත්මට අපගේ දායකත්වය පහත දැක්වේ. දේශීය උත්සව, ශිෂ්‍යත්ව සහ සමාජීය බලපෑම් ව්‍යාපෘතිවල අපගේ අනුග්‍රහය කීර්තිනාමය සහ අපගේ ප්‍රජාවන් සමඟ දිගුකාලීන සම්බන්ධතා ගොඩනංවන බව අපි විශ්වාස කරමු.



ලේ පරිත්‍යාගය – 2024



බැංකුවේ විශ්‍රාම සමාජය විසින් කොනිච්චන්කුලම වැව ප්‍රතිසංස්කරණය



කුමාරතුංග මුනිදාස අනුග්‍රාහ සම්මාන



APB අනුග්‍රාහය

### ගනුදෙනුකාර ප්‍රාග්ධන අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග

| අවදානම් සහ අභියෝග | බැංකුව කෙරෙහි බලපෑම | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| සදාචාර ව්‍යවහාර, තිරසාරභාවය, හෝ සමාජීය බලපෑම සම්බන්ධයෙන් ප්‍රජා අපේක්ෂාවන් සපුරාලීමට අසමත්වීම. | ගනුදෙනුකාර විශ්වාසය, අඩු වූ තැන්පතු, සහ වඩා අඩු ව්‍යාපාර අවස්ථා අහිමිවීම. | ශක්තිමත් ඍජු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම |

### අනාගත දැක්ම

**කෙටිකාලීන**

- ඩිජිටල් බැංකුකරණ මාර්ග යොදා ගැනීම සඳහා ප්‍රජාවන් වෙත දැනුවත් කිරීම සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම.
- සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ජීවනෝපාය වැඩසටහන් සඳහා වන ආයතනික සමාජ වගකීම් වියදම් වැඩි කිරීම.
- ආර්ථික කම්පන සහ දේශගුණික අවදානම් වලට එරෙහිව ප්‍රජා ඔරොත්තුදීම ශක්තිමත් කිරීම.

**මධ්‍ය සිට දිගුකාලීන**

- හරිත ණය, සමාජ බැඳුම්කර සහ පරිසර හිතකාමී ප්‍රජා ව්‍යාපෘතිවල ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රජා සංවර්ධන ඉලක්ක වෙනම මූලපිරීම් ලෙස සැලකීමට වඩා ව්‍යාපාර ආදර්ශවලට ඒකාබද්ධ කිරීම.
- මූල්‍ය සේවා සඳහා ප්‍රජා ප්‍රවේශය වැඩි කිරීම සඳහා කෘතිම බුද්ධිය, blockchain සහ ජංගම වේදිකා භාවිතා කිරීම.

# ස්වභාවික ප්‍රාග්ධනය





ඔබට වඩා හොඳින් සේවය කිරීමට සංරක්ෂණය

GRI 201-2

## බැංකුව සඳහා ස්වභාවික ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

**ස්වභාවික ප්‍රාග්ධනය යන්නෙන් ආර්ථික සහ සමාජීය යහපැවැත්මට සහයවන ස්වභාවික සම්පත් හා පරිසර පද්ධති අදහස් වේ.**

### අපගේ අවධානය

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ දි, අපගේ දිගුකාලින ව්‍යාපාර තිරසාරභාවයට බලපාන තීරණාත්මක වත්කම් ලෙස අපි වායුව, ජලය, භූමිය, ජෛව විවිධත්වය සහ කාලගුණ ස්ථායිතාව දකිමු.



## ස්වභාවික ප්‍රාග්ධනය අපගේ උපායමාර්ගය හා සම්බන්ධ වන ආකාරය

ස්වභාවික ප්‍රාග්ධනය යනු අපගේ ප්‍රධාන පරමාර්ථවලට බලපාන සහ බලපෑමට ලක්වන බැංකුවේ උපායමාර්ගික දිශානතියට වැඩිවන ඒකාබද්ධ අංගයකි.

- මෙහෙයුම්, සැපයුම්දාම සහ වෙළෙඳපොල තුළින් කාලගුණ වෙනස සහ ජෛව විවිධත්ව අවදානම් සක්‍රියව විසඳීම මගින්, බැංකුව ඔරොත්තුදීම වැඩිකර, බැංකුවේ දිගුකාලින තිරසාර ලාභදායිතාව සහතික කරයි.
- අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට ස්වභාවික ප්‍රාග්ධනය සහයවන ආකාරය
- හරිත බැංකුකරණය, ඩිජිටල් විසඳුම් සහ තිරසාර මූල්‍ය සාක්ෂරතාව උසස් කරමින්, බැංකුව මගින් ගනුදෙනුකරුවන්ට පාරම්පරික සවිඥාඥානික මූල්‍ය තීරණ ගැනිමට හැකියාව ඇති කරයි.
- පුනර්ජනනිය බලශක්තියට සහ පරිසර හිතකාමී නිවාස ඉදිකිරිම දිරිමත් කිරීමට අපගේ හරිත මූල්‍යකරණ කළඹ පුළුල් කරමින්, බැංකුව තිරසාර ආර්ථික වර්ධනය ඇති කරයි.

### අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට ස්වභාවික ප්‍රාග්ධනය සහයවන ආකාරය

පාරිසරික අවදානම් අවම කිරිම, සන්නාම කීර්තිනාමය වැඩි කිරිම, සහ තිරසාර මූල්‍යකරණය තුළ නව ව්‍යාපාරවලට දොරගුලු ඇරිම මගින් වටිනාකම නිර්මාණය ශක්තිමත් කරයි.

### තිරසාර කර්යසාධනය කෙරෙහි ස්වභාවික ප්‍රාග්ධනය

වටිනාකම නිර්මාණය සඳහා උත්ප්‍රේරකයක් ලෙස සහ පාරිසරික අවදානම් සඳහා පලිහක් ලෙස කටයුතු කරමින්, ජෛව විවධත්වය, කාලගුණයට ඔරොත්තු දීමේ හැකියාව, සහ සම්පත් කාර්යක්ෂමතාව කෙරෙහි අවධානය ස්ථාවරත්වය පෝෂණය කර පිරිවැය කාර්යක්ෂමතාව ඇතිකර නව වෙළඳපොලට විවෘතබව ඇති කරයි.

### සම්බන්ධිත පාර්ශව



### ප්‍රමුඛ උපායමාර්ග සමඟ සම්බන්ධතාව

| ඩිජිටල් පරිනාමනය වේගවත් කිරිම | තිරසාරභාවය |
|---|---|

### ප්‍රමාණාත්මක කරුණු

- 2 සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය
- 4 මූල්‍ය තිරසාරභාවය
- 10 නව තාක්ෂණික දියුණුව
- 14 දේශගුණික විපර්යාස සහ පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව

### SDGs ට දායකත්වය



## විභව්‍ය හුවමාරු කරගැනීම

**මූල්‍ය ප්‍රාග්ධනය**

තිරසාරතා අනුකූලතාව මෙහෙයුම් පිරිවැය වැඩි කරයි. (−)

**මානව ප්‍රාග්ධනය**

පාරිසරික ව්‍යාපෘති සඳහා අරමුදල් සේවක ප්‍රතිලාභ අවම කරයි. (−)

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**

පාරිසරික සංරෝධක වත්කම් ව්‍යාප්තිය සීමා කරයි. (−)

**බුද්ධිමය ප්‍රාග්ධනය**

පාරිසරික අවධානය නවෝත්පාදනයෙන් සම්පත් විතැන් කරයි. (−)

**සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**

පාරිසරික සීමා කිරීම පාර්ශවකාර අපේක්ෂාවන්ට බලපායි. (−)

බලපෑම: ධනාත්මක (+) | සෘණාත්මක (−)

## තිරසාර වටිනාකම් නිර්මාණයේ සක්‍රීයකරුවන්

| | |
|---|---|
| 1 | අවසාන බලපෑම සඳහා ස්වභාවික ප්‍රාග්ධනය පාලනය |
| 2 | වඩාත් හරිත අනාගතයක් ගොඩ නැගීමට තිරසාර හෙටක් සඳහා තිරසාර අවකාශ ගොඩ නැගීම |
| 3 | තිරසාර මූල්‍යකරණය |
| 4 | වගකීසහගත පරිභෝජනය |
| 5 | පරිසර තිරසාරභාවය සඳහා ඩිජිටල් පරිනාමනය |
| 6 | පාර්ශවකරු සහභාගිත්වය හා හවුල්කාරත්වයන් |

GRI 302-1, 3 GRI 303-5

ලබාදුන් හරිත ණය
**රු. මිලියන 4**

ශුද්ධ මීටර්කරණ සම්බන්ධ ශාඛා ගණන
**45**

ජාතික පද්ධතියට මාරුකළ ඒකක ගණන
**කි.වො. 467,762**
(ශාඛා 42කින් පමණක් ලබාගත් දත්ත)

බලශක්ති පරිභෝජනය
**32,883 GJ**
(ශාඛා 259ක් සඳහා)

ජල පරිභෝජනය
**62,744 $m^3$**
(NWSDB ජල සම්බන්ධතාව)

ශාඛාවකට බලශක්ති පරිභෝජනය
**125.5 GJ**

සේවකයෙකුට බලශක්ති පරිභෝජනය
**7.8 GJ**

# ස්වභාවික ප්‍රාග්ධනය



## 1 දිගුකාලීනව පවත්නා බලපෑම සඳහා ස්වභාවික ප්‍රාග්ධනය පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික තිරසාර කමිටුව (CSC) තුළින්, ස්වභාවික ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා උපායමාර්ගික දිශානතිය ලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත දෑ සඳහා වගකිව යුතුය:

- ගෝලීය ESG රාමු සහ ජාතික පාරිසරික රෙගුලාසි සමඟ ගැලපෙන පරිදි තිරසාර ප්‍රතිපත්ති සහ පරමාර්ථ සැකසීම.
- බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව තුළ තිරසාරභාවය පිළිබඳ අවදානම් සහ අවස්ථා තක්සේරු කර ඇති බව සහතික කිරීම.
- හරිත මූල්‍ය, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන ව්‍යාපාරවල ආයෝජන අනුමත කිරීම.
- දේශීය හා ගෝලීය පාරිසරික රෙගුලාසිවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම, තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණයේ විනිවිදභාවය සහතික කිරීම.

### ආයතනික තිරසාර කමිටුව (CSC)

ආයතනික තිරසාර කමිටුව බැංකුව තුළ සියලුම තිරසාරභාවයට අදාළ කටයුතු අධීක්ෂණය සඳහා වගකිව යුතු අතර, පාරිසරික, සමාජ හා පාලන මූලධර්ම අපගේ මෙහෙයුම්වලට ඵලදායීව ඒකාබද්ධ කෙරෙන බවට සහතික කරයි. බැංකුවේ තිරසාර ප්‍රතිපත්ති රාමුව යටතේ ප්‍රතිපත්ති සම්පාදනය, පාර්ශවකාර සහභාගිත්වය, වගවීම සහ පාලනය තුළ මෙම කමිටුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එහි ප්‍රධාන වගකීම්වලට පහත දෑ ඇතුළත්ය:

- **ප්‍රතිපත්ති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම:** තිරසාර ප්‍රතිපත්ති රාමුව පවත්වා ගැනීම, සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය සඳහා ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ක්‍රියාපටිපාටි සකස් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඒවා නිර්දේශ කිරීම.
- **පාර්ශවකාර සහභාගිත්වය සහ ප්‍රමාණාත්මක තක්සේරුව:** තිරසාර ප්‍රතිපත්ති රාමුව අදාළ ගැටළු ප්‍රමාණාත්මකව විසඳන බව සහ පාර්ශවකාර අපේක්ෂාවන් සමඟ ගලපන බව සහ අභ්‍යන්තර සහ බාහිර පාර්ශවකරුවන් සමඟ තීරණ, ක්‍රියා සහ සන්නිවේදනය තුළින් තිරසාර කාර්යසාධනයට බලපෑම් කරන බව සහතික කරයි.
- **නියාමනය හා වගවීම:** තිරසාර වැඩසටහන්වල වගවීම සහතික කරමින් බැංකුවේ පාර්ශවකරුවන් කෙරෙහි බැංකුවේ බලපෑම සහ පාර්ශවකරුවන්ගෙන් බැංකුවට ඇති බලපෑම ඇගයීමට ලක් කරයි. ආයතනික තිරසාර කමිටුව විසින් තිරසාර උපායමාර්ග හැඩගැස්වීමේදී පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයට පහසුකම් සලසන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කාර්තුමය ප්‍රගතිය ලබා දේ.
- **කමිටුවේ ව්‍යුහය සහ පාලනය:** සිය ඵලදායිත්වය වැඩි කිරීමට මෙම කමිටුවේ ව්‍යවස්ථාව යම් අවශ්‍ය වෙනස්වීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව නිර්දේශ කිරීම

## 2 වඩා හරිත අනාගතයක් ගොඩ නැගීම: තිරසාර හෙටක් සඳහා තිරසාර අවකාශ

බැංකුවේ දී, තිරසාරභාවය සහ සම්පත් කාර්යක්ෂමතාවයේ ප්‍රධාන ධාවකයින් ලෙස හරිත ගෘහ නිර්මාණ ශිල්පය සහ පුනර්ජනනීය බලශක්තිය අපි වැළඳ ගනිමු. පුනර්ජනනීය බලශක්තිය මත ක්‍රියාත්මක වන අපගේ ශාඛාවලින් 15%ක් සහ ශුද්ධ මීටර්කරණයට සම්බන්ධ සූර්ය බලයෙන් ක්‍රියාත්මක ස්ථාන 45ක් සමඟ, අපගේ පාරිසරික පා සටහන අවම කිරීමට අපි කැප වී සිටිමු. ඔපදැමූ වීදුරු, ස්වභාවික ආලෝකය සහිත, අපගේ බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි, සහ හරිත සේවා ස්ථාන මෙහෙයුම් තිරසාරභාවය සහ සේවක යහපැවැත්ම වැඩි කරයි.

කතරගම නිවාඩු බංගලාව, අනුරාධපුර අපජල පිරිපහදු පිරියත පරිසර හිතකාමී යටිතලපහසුකම් සඳහා අපගේ කැපවීමට නිදසුන් සපයයි. හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් විමෝචනය මැඩපැවැත්වීම සහ ගෝලීය උණුසුම අවම කිරීම අරමුණු කරගත් කිගාලි සංශෝධනයට අනුකූලව, බැංකුව අනාගත පරම්පරාවන් සඳහා තිරසාර අනාගතයක් සහතික කරමින් දේශගුණික විපර්යාසයන්ට සංවේදී බැංකු භාවිතයන් අඛණ්ඩව ඒකාබද්ධ කිරීම සිදු කරයි.

## 3 තිරසාර මූල්‍යකරණය

තිරසාරභාවයට කැප වූ මූල්‍ය ආයතනයක් ලෙස, අපගේ ණයදීමේ තීරණ පරිසරයට බලපෑමක් වියහැකි බව අපි හඳුනා ගන්නා අතර තිරසාර සංවර්ධනය සඳහා අපගේ දිගුකාලීන දැක්ම සමඟ පෙළගැසෙන වගකීම්සහගත ණය දීමේ ව්‍යවහාර සඳහා අපි කැපවී සිටිමු. පාරිසරික හා සමාජීය අවදානම් අවම කිරීමට, අපි පාරිසරික, සමාජීය සහ පාලන ප්‍රතිෂ්ඨාවන් අපගේ ණය සහ අවදානම් ඇගයීම් රාමුවට ඇතුළත් කර ඇති අතර, ඒමගින් වඩා ඉහළ ESG අවදානම් සහිත ගනුදෙනු ඉහළ සියුම් පරීක්ෂාවට ලක්වන බව සහතික කරයි. අපගේ ආයතනික ණය ප්‍රතිපත්තියේ විස්තීර්ණ ඉවත්කිරීමේ ලැයිස්තුව යටතේ, සැලකියයුතු පාරිසරික හානිමය හේතු විය හැකි කටයුතු සඳහා මූල්‍යකරණය වැලැක්වීම ඇතුළත්ය. ඊට අමතරව, සියලුම ගනුදෙනුකරුවන් දේශීය ඊය ආශ්‍රිත රෙගුලාසි සමඟ අනුකූල විය යුතු අතර, ණයගැතියන් ඔවුන්ගේ ණය අයදුම්පත් ක්‍රියාවලියේ කොටසක් ලෙස පාරිසරික බලපෑම් තක්සේරුවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. මෙවැනි ක්‍රියාමාර්ග තුළින් අපගේ මූල්‍යකරණ කටයුතු තිරසාර වර්ධනයට සහයවන බව සහ අහිතකර පාරිසරික සහ සමාජීය බලපෑම අවම කරන බව අපි සහතික කරමු.

වසර තුළ, කිසිදු අයදුම්පතක් මූල්‍ය පහසුකමක් පාරිසරික පසුබිම් මත ප්‍රතික්ෂේප කර නොමැත. අපගේ ප්‍රවේශයෙන් සිය මෙහෙයුම්වලට තිරසාර ව්‍යවහාර ඒකාබද්ධකරමින් උසස් ඊය ප්‍රමිති සමඟ ක්‍රමානුකූලව පෙළගැසීමට ගනුදෙනුකාරුවන් දිරිගැන්වීම කෙරෙහි අපි අවධානය යොමු කරමු. වගකීම්සහගත මූල්‍යකරණය සඳහා අපගේ කැපවීම, පහත සඳහන් පරිදි අපගේ පාරිසරික හා සමාජ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියේ පැහැදිලිව දක්වා ඇති විස්තීර්ණ නිසි සම්ප්‍රජන්‍ය සහ පාලන පෙරාතුලේඛණවලින් ශක්තිමත් කරයි,

**ප්‍රතිපත්තිය**

බැංකුවේ පාරිසරික සහ සමාජීය බැඳීම් සහ ප්‍රමිති

**කාර්යභාරයන් හා වගකීම් පුහුණුව**

**ක්‍රියාපටිපාටි**

**E&S අවදානම් ඇගයීම**

- ගනුදෙනු පිරික්සීම
- අවදානම් වර්ගීකරණය
- E&S නිසි සම්ප්‍රජන්‍ය
- මූල්‍යකරණ කොන්දේසි

**අවදානම් නියාමනය**

- අනුකූල නොවීය කළමනාකරණය
- සේවාදායක/ආයෝජක E&S කාර්යසාධනය සමාලෝචනය

**වාර්තාකරණය**

බැංකුවේ E&S කාර්යසාධනය සහ සේවාදායකයා/ ආයෝජකයින්

> සූර්ය බලශක්ති කෝෂ ස්ථාපිත කිරීමට ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමේ අරමුණ සඳහා හේලීස් ෆෙන්ටොන්ස් සමඟ බැංකු සම්බන්ධ විය.

> වසර තුළ, "Windscape මන්නාරම ලෙස සන්නාම කළ Ceylex Renewable" සමාගම සඳහා සුලංබල සුරැකුම්කරණය බැංකුව සාර්ථකව නිම කරන ලදි. මෙම වාර්තාගත ගනුදෙනුව ප්‍රධාන බැංකුකරු සහ භාරකරු වශයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් මෙහෙයවන ලදි.

## 4 වගකීම්සහගත පරිභෝජනය

අපගේ මෙහෙයුම් පාසටහන අඩුකිරීම ස්වභාවික ප්‍රාග්ධනය සංරක්ෂණයට බැංකුවේ කැපවීමේ අත්‍යවශ්‍ය සංරචකයකි. අපි සම්පත් කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය අඩුකිරීම සහ තිරසාර ප්‍රසම්පාදනය පරිසරය කෙරෙහි අපගේ බලපෑම අවම කිරීමට සක්‍රියව ප්‍රවර්ධනය කරමු.

### බලශක්ති කාර්යක්ෂමතාව සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම

බැංකුවේ දී, වඩා හරිත සහ වඩාත් ඔරොත්තු දෙන අනාගතයකට සහයවීමේ උත්සාහයන් මෙහෙයවන වගකීම්සහගත බලශක්ති පරිභෝජනය අපගේ තිරසාර උපායමාර්ගයේ කේන්ද්‍රය වේ. පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂම යටිතලපහසුකම් සහ පරිසරය දැනුවත් ගොඩනැගිලි නිර්මාණ ඒකාබද්ධ කිරීම තුළින්, අපි අපගේ කාබන් පාසටහන අඩුකර, සම්පත් කාර්යක්ෂමතාව වැඩි කර ඇත, අපගේ මූලික බලශක්ති මූලාශ්‍රයට ජාතික පද්ධතියෙන් මෙන්ම සූර්ය කෝෂ පද්ධතියෙන් ලබාගන්නා විදුලිය මෙන්ම ඩීසල් සහ පෙට්‍රල් ඇතුළත්ය. බැංකුව විසින් සිදුකළ ප්‍රධාන වැඩසටහන්වලට පහත දෑ ඇතුළත්ය:

- ජාතික විදුලිබල පද්ධතියේ විදුලිය මත රඳපැවැත්ම අඩු කිරීම සඳහා සූර්ය බලශක්ති උත්පාදනය වැඩි කිරීම
- ඉන්වර්ටර් මගින් ක්‍රියාත්මක වන, CFC-නිදහස් AC ඒකක ස්ථාපනය කිරීම, හා එමඟින් විදුලිය ඉතිරි වන අතර කාබන් විමෝචනය අඩු කරයි.
- වායු සමීකරණ භාවිතය සාමාන්‍ය බැංකු වේලාවන්ට සීමා කිරීම.
- බෑ සහ සබ බල්බ වැනි බලශක්ති කාර්යක්ෂම ආලෝකකරණ ස්ථාපනය කිරීම
- පරිගණක සඳහා LED තිර මොනිටර භාවිතා කිරීම
- සියලුම ශාඛා හරහා ප්‍රතිචක්‍රීයකරණය ප්‍රවර්ධනය
- අභ්‍යන්තර සන්නිවේදනය තුළින් බලශක්ති සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව සේවකයින් අඛණ්ඩව සහභාගි කරවීම

බලශක්ති පරිභෝජනය
එක් සේවකයෙකුට **7.81 GJ**

බලශක්ති පරිභෝජනය
එක් ශාඛාවකට **125.51 GJ**

### ජල පරිභෝජනය හා තිරසාර භාවිතය

බැංකුවේ දී, ජලය යනු මාහැඟි සහ සීමිත සම්පතක් වන බවත් එය ප්‍රජාවගේ සහ පරිසරයේ යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය බව අපි අවබෝධ කරගනිමු. තිරසාර ජල කළමනාකරණය සඳහා අපගේ බැඳීම අපගේ මෙහෙයුම්වලට ඇතුළත් කරන අතර, අපගේ ඒකායන තිරසාර අරමුණු සමඟ පෙළ ගස්වා ඇත.

- **වගකීම්සහගත ජල පරිභෝජනය:** 2024 දි, ජලය මෙට්‍රික් ඝණ අඩි 62,744ක් භාවිතා කර ඇති අතර, ඉදිරි වසර තුළ පරිභෝජනයේ අඩුකිරීමක් අත්කර ගැනීමට සක්‍රිය ක්‍රියාමාර්ග ගනු ලැබේ. කාර්යක්ෂම තාක්ෂණයන් හා ව්‍යවහාර මගින් අපගේ සියලුම මෙහෙයුම් හරහා ජල පරිභෝජනය අවම කිරීමට අපි උත්සාහ දරමු.

මෙයට ජල ඉතුරුම් සවිකිරීම්, ජල භාවිතය අඩු කිරීමට ප්‍රශස්තකරණ ක්‍රියාවලි සහ සේවකයින් හා පාර්ශවකරුවන් අතර ජල සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව දැනුවත්කම ප්‍රවර්ධනය කිරීම ඇතුළත්ය.

- **පාරිසරික බලපෑම් කළමනාකරණය:** අපි තිරසාරව ආපසු ගැනීම තහවුරු කිරීම තුළින්, පරිභෝජනය, සහ මුදාහැරීමේ ව්‍යවහාර තුළින් පරිසරය මත අපගේ ජල භාවිතාව පරික්ෂාකාරීව කළමනාකරණය කරමු. නිරන්තර නියාමනය සහ නියාමන ප්‍රමිතිවලට අනුකූල වීම තුළින් ස්වභාවික ජල පද්ධතිවල අවම බිඳවැටීම සහතික කරයි.
- **විනිවිද වාර්තාකරණය සහ මිණුම්:** අපගේ කාර්යසාධනය මැනීමට සහ වර්ධනය කිරීමට මුළු ජල ආපසු ගැනීම, සහ පරිභෝජනය වැනි ප්‍රධාන ජලය ආශ්‍රිත මිණුම් මත බැංකුව පසු විපරම් කර වාර්තා කරයි.

## 5 පාරිසරික තිරසාරභාවය සඳහා ඩිජිටල් පරිනාමනය

### කඩදාසි රහිත බැංකුකරණය සහ ඩිජිටල් කාර්යාල පරිනාමනය

පාරිසරිත තිරසාරභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වෙත අපගේ කැපවීමේ කොටසක් ලෙස, බැංකුව කඩදාසි රහිත බැංකුකරණය සහ ඩිජිටල් වශයෙන් ප්‍රශස්ත සේවා ස්ථානයක් කරා සංක්‍රමණය වේගවත් කර ඇත. කඩදාසි පදනම් ගනුදෙනු සහ ලියවිලි මත රඳා පැවැත්ම අඩු කිරීම මගින්, නාස්තිය අවම කිරීමට, කාබන් විමෝචන අවම කිරීමට සහ බැංකුවේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට අපි අරමුණු කරමු.

- අපගේ ඩිජිටල් බැංකු මධ්‍යස්ථානයේ මුලපිරීම් පුළුල් කිරීම
- ඩිජිටල් වෙළෙඳ දැන්වීම් සඳහා සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කිරීම
- විද්‍යුත් අලුත් කිරීමේ ලිපි නිකුත් කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ කෙටි පණිවුඩ හරහා PIN අංකය නිකුත් කිරීම
- ඉ-ප්‍රකාශන, මාර්ගගත අරමුදල් මාරුකිරීම්, සහ මුද්‍රිත ලියවිලි හා සම්ප්‍රදායික කඩදාසි පදනම් ලිපිහුවමාරුව වෙනුවෙන් ඩිජිටල් කුවිතාන්සි භාවිතා කිරීමට ගනුදෙනුකරුවන් දිරිගන්වමු. ඩිජිටල් ගෙවීම් මාර්ග වැළඳගැනීමට අපගේ ගනුදෙනුකරුවන් දිරිමත් කරමින්, අපි තිරසාර සහ තාක්ෂණය පදනම් මූල්‍ය පරිසර පද්ධතියක් කරා සැලකියයුතු පියවර ගනිමින් සිටිමු.
- අභ්‍යන්තර කඩදාසි පදනම් සංදේශ සහ අනුමැතීන් වෙනුවට විද්‍යුත් පාදක අනුමැතින් ක්‍රමයක් යොදා ගැනීම
- **OASYS පද්ධතිය ක්‍රියාත්මක කිරීම** – තොරතුරු තාක්ෂණ දෘඩාංග සහ මෘදුකාංග, පරිශ්‍ර නඩත්තුව සහ වාහන සඳහා අපගේ අතින් සිදුකරන අභ්‍යන්තර ඉල්ලීම් OASYS පද්ධතියට සංක්‍රමණය කර ඇත.
- අතින් කරන ලියකියවිලි ඉවත් කර කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා, අපි ඩිජිටල් ලේඛන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. මෙය භෞතික තොග අවශ්‍යතාවන් අඩුකර, ශාඛා මෙහෙයුම් වඩාත් ක්‍රමවත් සහ පරිසර හිතකාමී කරමින් දත්ත සමුද්ධරණ වේගය වර්ධනය කරයි.
- බැංකුවේ භෞතික මෙහෙයුම් අත්පොත් බැංකුවේ මධ්‍යගත ඩිජිටල් පුස්තකාලයක් බවට පරිවර්තනය කිරීම.
- මුදල් ප්‍රතිචක්‍රිය යන්ත්‍ර භාවිතයේ වැඩි වීම.

## 6 පාර්ශවකාර සහභාගිත්වය සහ හවුල්කාරත්වයන්

GRI 308-1 GRI 414-1

### තිරසාර ප්‍රසම්පාදනය

බැංකුව ශක්තිමත් පාරිසරික, සමාජීය සහ පාලන ප්‍රමිති පිළිපදින සැපයුම්කැවන් ප්‍රමුඛ කිරීම මගින් වගකීම්සහගත මූලාශ්‍රකරණයට කැපවී සිටී. අපගේ තිරසාර ප්‍රසම්පාදන උපායමාර්ගය මගින් බැංකු මෙහෙයුම්වල භාවිතා කරන සියලුම අමුද්‍රව්‍ය පරිසර හිතකාමීබව සදාචාරව ලබාගත්බව සහ ගෝලීය තිරසාර ව්‍යවහාර සමඟ පෙළ ගැසෙන බව සහතික කරයි. වෙළෙන්දන් සහ සේවා සපයන්නන් පිරිවැය සහ කාර්යසාධනය මත පමණක් ඇගයීමට ලක් නොකරන අතර, වගකීම්සහගත මූලාශ්‍රකරණය, විමෝචන අඩුකිරීම්, සහ සදාචාරාත්මක කම්කරු ව්‍යවහාර ඇතුළුව ඔවුන්ගේ තිරසාර අක්තපත්‍ර ද ඇගයීමට ලක් කරයි.

- **පරිසර හිතකාමී සැපයුම්කාර හවුල්කාරත්වයන්:** කාර්යාල සැපයුම්, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය වැනි අපගේ මිලදී ගැනීම් ජෛව හායනයට ලක්විය හැකි, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හෝ බලශක්ති කාර්යක්ෂම බව සහතික කරමින්, තිරසාරභාවය සඳහා මනා පරිචයන් පෙන්නුම් කරන සැපයුම්කරුවන් සමඟ අපි සහයෝග යෙන් කටයුතු කරමු.
- **හරිත නිෂ්පාදන තෝරා ගැනීම:** අපගේ ප්‍රසම්පාදන ප්‍රතිපත්ති තිරසාර විකල්ප ප්‍රමුඛ කරන අතර, එයට ප්‍රතිචක්‍රීයකළ කඩදාසි භාවිතය, පරිසරය දැනුවත් ඇසුරුම්කරණය, සහ බලශක්ති කාර්යක්ෂම උපකරණ ඇතුළත්වන අතර, ඒ තුළින් අපගේ පාරිසරික පාසටහන අවම කිරීමට උපකාරී වේ.
- **තිරසාර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්:** දෘඩාංග මත රඳාපැවැත්ම අඩුකිරීමට ඩිජිටල් මෙවලම් සහ ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය (ඊ-අපද්‍රව්‍ය) අඩුකිරීමට අඩු බලශක්ති සර්වර්, මේස පදනම් විසඳුම් තුළ අපි ආයෝජනය කරමු.

### අපද්‍රව්‍ය කළමනාකරණය

ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණය බැංකුවේ පාරිසරික වගකීමේ උත්සාහයන්හී අත්‍යවශ්‍ය කොටසක් වන අතර ඉන් උවදුරු සහිත සහ රහිත අපද්‍රව්‍ය වෙන්කරනබව, අවම කරන බව සහ වගකීමේ බැහැර කරන බව සහතික කරයි. අපගේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන්වලින් ඉඩම් පිරවීමේ දායකත්වයන්, අඩුකිරීම, ප්‍රතිචක්‍රියකරණ අනුපාත වැඩි කිරීම සහ චක්‍රිය කඩදාසි ව්‍යවහාර ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි.

- **ප්‍රතිචක්‍රියකරණය සහ අපද්‍රව්‍ය වෙන්කිරීමේ වැඩසටහන්:** බැංකුව විස්තීර්ණ අපද්‍රව්‍ය වෙන් කිරීමේ මුලපිරීමක් ස්ථාපිත කර ඇති අතර, එමගින් ප්‍රතිචක්‍රියකරණය දිරිමත් කර, කඩදාසි, ප්ලාස්ටික් හෝ ඓන්ද්‍රීය අපද්‍රව්‍ය වැනි ද්‍රව්‍ය හැකි සෑම අවස්ථාවකදීම නැවත භාවිතය දිරිමත් කරයි. අපද්‍රව්‍ය මහ නගර සභා හෝ නගර සභා සමඟ හවුල්කාරිත්වයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිති පිළිපදිමින් වගකීමෙන් බැහැර කරනු ලබයි. සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සහ උපායමාර්ගිකව ස්ථාපිත ප්‍රතිචක්‍රියකරණ ස්ථාන තුළින් අපද්‍රව්‍ය අඩුකිරීමට සක්‍රියව දිරි ගන්වනු ලැබේ. ආහාර සහ පොලිතීන් අපද්‍රව්‍ය නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට භාරදෙන අතර අනෙකුත් අපද්‍රව්‍ය සැපයීම් අංශය විසින් වෙන්දේසි කෙරේ.
- **අනතුරුදායක සහ අනතුරුදායක නොවන අපද්‍රව්‍ය නිරීක්ෂණය:** අපගේ මෙහෙයුම් මඟින් ජනනය වන අපද්‍රව්‍යවල පරිමාව සහ සංයුතිය අපි සක්‍රියව නිරීක්ෂණය, මැනීම සහ වාර්තා කිරීම සිදු කරන්නෙමු. නිසි ලෙස බැහැර කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ ආරක්ෂිතව ප්‍රතිකාර කිරීම සහතික කිරීම සඳහා කඩදාසි අපද්‍රව්‍ය සහ ජෛව හායනයට ලක්විය හැකි ද්‍රව්‍ය නිරීක්ෂණය කිරීම මෙයට ඇතුළත් වේ.
- **වගකීම්සහගත අපද්‍රව්‍ය බැහැර කිරීම:** යල්පන ගිය තොරතුරු තාක්ෂණ උපකරණ සහ රසායානික ද පදනම් ද්‍රව්‍ය ඇතුළත් අනතුරුදායක අපද්‍රව්‍ය පාරිසරික රෙගුලාසිවලට අනුකූලව බැහැරකරන බව බැංකුව සහතික කරයි.

## ස්වභාවික ප්‍රාග්ධන අවදානම්, බැංකුව කෙරෙහි බලපෑම සහ අවම කිරීමේ උපායමාර්ග

| අවදානම් | බැංකුව කෙරෙහි බලපෑම | අවම කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|
| **දේශගුණික විපර්යාස සහ පාරිසරික** | දේශගුණික සංවේදී අංශ සඳහා ණය අවදානම වැඩි වීම. | දේශගුණික අවදානම් තක්සේරු කිරීම් ණය ඇගයීම් සමඟ ඒකාබද්ධ කිරීම |
| | අහිතකර කාලගුණයෙන් මෙහෙයුම් බාධා | ආපදා ප්‍රතිසාධන සැලසුම් ශක්තිමත් කිරීම |
| | ඉහළ රක්ෂණ/අනුකූලතා වියදම් | පුනර්ජනනීය බලශක්තිය සඳහා හරිත මූල්‍යකරණය පුළුල් කිරීම |
| **නියාමනය සහ අනුකූලතාවය** | අනුකූල නොවීමෙන් ලැබෙන දඩුවම්/කීර්ති නාම හානි | අනුකූලතා අංශය හරහා අනුකූලතාව නිරීක්ෂණය කිරීම |
| | දැඩි ESG වාර්තාකරණ නීති | ණය ක්‍රියාවලීන් තුළ ESG අවදානම් තක්සේරු කිරීම් ඇතුළත් කිරීම |
| | ඉහළ විමෝචන මූල්‍යකරණය මත සීමාවන් | GRI හා මහබැංකුවේ මූලධර්ම සමඟ වාර්තාකරණය පෙළගැසීම |
| **සම්පත් ක්ෂයවීම සහ බලශක්තිය** | බලශක්ති භාවිතය හේතුවෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ යාම | සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා/බලශක්ති කාර්යක්ෂම කාර්යාල පුළුල් කිරීම |
| | ව්‍යාපාර අඛණ්ඩතා අවදානම් | බලශක්ති ඉතිරිකිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම |
| | පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීමට ඇති පීඩනය | පුනර්ජනනීය බලශක්ති සැපයුම්කරුවන් සමඟ හවුල්වීම |
| **ජෛව විවිධත්වය අහිමි වීම සහ භූමි හායනය** | හානිකර ව්‍යාපෘති වලින් ඇතිවන මූල්‍ය/කීර්තිනාම අවදානම් | පාරිසරික හා සමාජ අවදානම් කළමනාකරණ (ESRM) රාමු අනුගමනය කිරීම |
| | ඉහළ බලපෑම් ඇති කර්මාන්ත පිළිබඳ නියාමන පරීක්ෂාව | ඉහළ අවදානම් සහිත කර්මාන්ත සඳහා මූල්‍යකරණය බැහැර කිරීම |
| **අපද්‍රව්‍ය කළමනාකරණය සහ දූෂණය** | දුර්වල අපද්‍රව්‍ය ව්‍යවහාරවලින් සිදුවන පිරිවැය | කඩදාසි අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ඩිජිටල් බැංකුකරණය පුළුල් කිරීම |
| | කීර්තිනාම අලාභය | ප්‍රතිචක්‍රීකරණ/වෙන් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| | වඩා දැඩි අපද්‍රව්‍ය රෙගුලාසි | පරිසර හිතකාමී ද්‍රව්‍ය මූලාශ්‍රය හා අපද්‍රව්‍ය පසුවිපරම |
| **කීර්තිනාමය හා ගනුදෙනුකාර අපේක්ෂා / අන්දැකීම** | ගනුදෙනුකාර විශ්වාසය අහිමිවීම | මෙහෙයුම්වල ESG ඒකාබද්ධ කිරීම ශක්තිමත් කිරීම |
| | අඩුවූ ආයෝජන විශ්වාසය | හරිත මූල්‍ය සේවා දියත් කිරීම |
| | තිරසාරභාවය ප්‍රමුඛ කිරීමේ පීඩනය | තිරසාර වාර්තාකරණය තුළ විනිවිදභාවනය වැඩි කිරීම |

## අනාගත දැක්ම

**කෙටිකාලීන**

- ණය දීමේ සහ ආයෝජන තීරණවලදී දේශගුණික අවදානම් තක්සේරු කිරීම් ශක්තිමත් කිරීම.
- පුනර්ජනනීය බලශක්තිය සඳහා ණය ඇතුළුව හරිත මූල්‍යකරණ මුලපිරීම් පුළුල් කිරීම.
- පුනර්ජනනීය නොවන බලශක්තිය මත පදනම් වීම අඩු කිරීම සඳහා සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා වැඩි කිරීම සහ බලශක්ති කාර්යක්ෂම තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම.
- පාරිසරික බලපෑම අවම කිරීම සඳහා තිරසාර ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වැඩි දියුණු කිරීම.
- වර්ධිත විනිවිදභාවය සඳහා SLFRS S1, SLFRS S2, SASB සහ TCFD රාමු සමඟ තිරසාර වාර්තාකරණය හා අනාවරණ පෙළගැසීම.

**මධ්‍ය සිට දිගුකාලීන**

- කාබන් හිලව් කිරීමේ වැඩසටහන් සහ විමෝචනය අඩු කිරීමේ ඉලක්ක ඇතුළුව ශුද්ධ ශූන්‍ය සහ කාබන් උදාසීනතා මුලපිරීම් ඉදිරියට ගෙන යාම.
- හරිත බැඳුම්කර, ESG ආයෝජන කළඹ සහ තිරසාරභාවයට සම්බන්ධ ඉතුරුම් ගිණුම් වැනි හරිත මූල්‍ය සේවා පුළුල් කිරීම.
- නැවත වන වගාව, වන රෝපනය සහ සමුද්‍ර පරිසර පද්ධති ආරක්ෂණ ව්‍යාපෘති සඳහා මුදල් සැපයීම තුළින් ජෛව විවිධත්ව සංරක්ෂණයට සහාය වීම.
- බැංකුවේ ස්ථාපිතයන් වල වැසි ජලය රැස් කිරීම සහ තිරසාර ජල කළමනාකරණය ඇතුළු පුළුල් ජල සංරක්ෂණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- සාමූහික බලපෑම මෙහෙයවීම සඳහා පාරිසරික ආයතන, නියාමන ආයතන සහ තිරසාරභාවය කේන්ද්‍ර කරගත් ආයතන සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම.

# ආයතනික පාලනය පිළිබඳ ප්‍රකාශය



NSB යහ පාලනය අනුකූලතා පිරික්සුමකට වඩා බොහෝ පුළුල් පරාසයක් දක්වා විහිදුන විෂයක් ලෙස සලකන අතර, එය අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ දාමයේ සෑම අදියරකටම විනිවිද යන සදාචාරාත්මකව දැඩි සහ වගකිවයුතු කළමනාකරණයේ අඩිතාලම වේ. NSB හි ඒකාබද්ධ චින්තන දර්ශනය තුළ ගැඹුරින් කාවැදී ඇති අපගේ මූලික වටිනාකම් සහ උපායමාර්ගික අභිලාෂයන් ශක්තිමත් කරමින් සදාචාරාත්මක වගකිවයුතු සහ සදාචාරාත්මකව යහපත් මූලධර්ම සමඟ පෙළගැස්වීම සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලීන් පාලනය කිරීමට ආයතනික පාලනය ඉවහල් වේ. වේ. අපගේ පාලන ආකෘතිය සැලසුම් කර ඇත්තේ ආයතනයේ විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් අඛණ්ඩතාව සහ තිරසාරභාවය මුල් කරගත් සංස්කෘතියක් පෝෂණය කරමින්, කල් පවතින වටිනාකමක් වර්ධනය කිරීම සඳහාය.

NSB හි පාලන රාමුවට පාදක වන්නේ ශක්තිමත් නායකත්වය, අපක්ෂපාතී අධීක්ෂණය සහ කළමනාකරණ වගවීම සඳහා කැපවීමක් වන අතර, ඒ සියල්ල ශක්තිමත් සදාචාරාත්මක පදනමක් තුළ ශක්තිමත් කර ඇත. උපායමාර්ගික අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සහ ආයතනික කළමනාකරණය වෙත පවරනු ලබන අතර, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ නායකත්වය යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ මෙහෙයුම් පිළිබඳ පුළුල් අධීක්ෂණයක් පවත්වාගෙන යයි. මෙය ආර්ථික, සමාජීය සහ පාරිසරික තිරසාරභාවය මෙන්ම කොටස් හිමිගේ අපේක්ෂාවන් සමඟ පෙළගැස්වීම සහතික කරයි. බැංකුවේ උපායමාර්ගික සහ මෙහෙයුම් ඉලක්ක හැඩගැස්වීම සහ අනුමත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය දායක වන අතර, සියලුම කොටස්කරුවන්ට සාධාරණ වටිනාකමක් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරයි. එය NSB බැංකු මෙහෙයුම්වල අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව තවදුරටත් ආරක්ෂා කරන අතර, විනිවිදභාවය, වගවීම, අපක්ෂපාතීත්වය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය වැනි මූලධර්ම අවධාරණය කරයි. කර්මාන්තයේ මිණුම් දඬු, නියාමන නියෝග සහ නීතිමය ප්‍රමිතීන්ට අනුකූල වීම ආචාරධාර්මික ආයතනික පාලනය සඳහා NSB හි නොසැලෙන කැපවීම අවධාරණය කරයි.

NSB හි, ආයතනික පාලනය යනු උපායමාර්ගික සාර්ථකත්වය ළඟා කර ගැනීම, කොටස්කරුගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ සමාජයට සදාචාරාත්මකව පදනම් වූ, තිරසාර සේවාවන් සැපයීම අරමුණු කරගත් බහුමානීය මුලපිරීමකි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආයතනික පාලනය බැංකුවේ ඉහළම ප්‍රමුඛතාවයක් ලෙස පවතී. NSB හි ආයතනික පාලන රාමුව සහ අනුකූලතා තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සඳහා, වාර්තාවේ 169 සිට 183 දක්වා පිටුවල.

ඉදිරිය පිළිබඳ සැලකීමේදී, **2025 ජනවාරි 1** වන දින සිට බලාත්මක වූ **2024 අංක 05 දරන බැංකු පනතේ බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ උපදෙස් වල 6.2 වගන්තියේ දක්වා ඇති** විධිවිධාන පිළිපැදීමට බැංකුව සම්පූර්ණයෙන්ම කැපවී සිටී. නියාමන අනුකූලතාව සඳහා ක්‍රියාශීලි ප්‍රවේශයක් සමඟින්, NSB මෙම පාලන අවශ්‍යතා එහි මෙහෙයුම් සහ උපායමාර්ගික රාමුවලට බාධාවකින් තොරව ඒකාබද්ධ කිරීම සහතික කරන අතරම, විනිවිදභාවය, වගවීම සහ ආදර්ශමත් ආයතනික භාරකාරත්වය සඳහා එහි කැපවීම ශක්තිමත් කරයි.




රූපය 17 අපගේ ප්‍රතිඵල-පදනම් පාලන ප්‍රවේශය

# අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය



NSB හී දී, අපි ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙනු ලබන්නේ සංකීර්ණ හා පරිණාමය වන මූල්‍ය ක්ෂේත්‍රයක ඵලදායී ලෙස සැරිසැරීමට අපට හැකියාව ලබා දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් පවත්වා ගැනීම සඳහා ය.

ශ්‍රී ලංකාවේ විශාලතම බලපත්‍රලාභී විශේෂිත බැංකුව ලෙස, දේශීය සාර්ව ආර්ථික පරිසරය, නියාමන වෙනස්කම් සහ බාහිර වෙළඳපොළ බලවේග මගින් ඇති කරන අවදානම් පිළිබඳව අපි දැනුවත් වෙමු.

අපගේ අවදානම් කළමනාකරණ ප්‍රවේශය බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සඳහා පමණක් නොව, ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාවට දායක වීම සඳහා ද නිර්මාණය කර ඇත.

NSB හි අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහය සැලසුම් කර ඇත්තේ වගවීම, විනිවිදභාවය සහ ඵලදායී තීරණ ගැනීම සහතික කිරීම සඳහා ය. අධ්‍යක්ෂ මණ්ඩලයට ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් සහාය දක්වනු ලබන අතර, අවදානම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන අතර බැංකුවේ විකාශනය වන අවදානම් පැතිකඩ නිරීක්ෂණය කරයි.

ප්‍රාග්ධන කාර්යක්ෂමතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ඒකාබද්ධ ප්‍රවේශයක් ඇති කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකරණ කමිටුවලට බලතල පවරයි.

ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) අවදානම් කළමනාකරණ කාර්යය මෙහෙයවන අතර බැංකුවේ උපායමාර්ගික අරමුණු අවදානම් අභිරුචි මට්ටම්වලට අනුකූල වීම සහ නියාමන අවශ්‍යතා සහ ප්‍රශස්ථ පරිචයන්ට අනුකූල වීම සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය, BIRMC සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත අවදානම් වාර්තා ඉදිරිපත් කිරීමේදී අවදානම් හඳුනාගැනීම සඳහා අපි පුළුල් හා පූර්වගාමී ප්‍රවේශයක් අනුගමනය කරන්නෙමු. එයට ව්‍යාපාරික අංශවලට/සහාය සේවා අංශවලට අනුයුක්ත සම්බන්ධතා නිලධාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීම හා අවදානම් තක්සේරු කිරීම ඇතුළත් වේ.

අපගේ මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීමට සහ ඒවාට අදාළ පූර්ව අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිතිපතා ආතති පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණයන් සිදු කිරීමේදී ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අභියෝග ඉතිහාසය සැලකිල්ලට ගනිමින් විවිධ ආතති මට්ටම් යටතේ පරීක්ෂා කිරීම අපට උපකාරී වේ.

## 2024 සංවර්ධන

2024 දී, දේශීය හා ගෝලීය අභියෝගයන්වලට ප්‍රතිචාර වශයෙන් NSB අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කළ අතර, නැගී එන අවදානම් හමුවේ අපගේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කළේය.

ණය ගැතියන්ගේ ණය බැදීම් සපුරාලීමේ හැකියාව කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දෙන බහුවිධ බාධකවලට ප්‍රතිචාර වශයෙන්, ණය කළඹ වඩාත් දැඩි ලෙස නිරීක්ෂණය කිරීම මගින් අපි අපගේ ණය අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කළෙමු. ණය පැහැර හැරීමේ අවදානම අවම කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට සහ ණය නොගෙවීමේ දර්ශක කෙරෙහි ඇති විය හැකි බලපෑම තේරුම් ගැනීමට උපකාරී වන, ණය පැහැර හැරීමේ විභවයන් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ සලකුණු සහ නිරන්තර ආතති පරීක්ෂණ වැඩිදියුණු කිරීම මගින් ණය පැහැර හැරීමේ අවදානම අවම කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට උපකාරී වේ.

අභ්‍යන්තර තක්සේරුව මගින් ආයතනික ප්‍රතිපාර්ශ්වික ශ්‍රේණිගත කිරීම සඳහා භාවිතා කරන ලද ආකෘතිවල නිවැරදිතාවය, භාවිතයේ ඇති ආකෘතිවල කාර්යක්ෂමතාව, වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් ක්‍රියාත්මක කිරීමට ඉඩ සැලසුණි.




රූපය 18 → අවදානම් සංස්කෘතිය

# අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය



පාරිසරික, සමාජීය සහ පාලන (ESG) සාධක අපගේ අවදානම් කළමනාකරණ රාමුවට ඒකාබද්ධ කිරීමේ කොටසක් ලෙස, බැංකුව ණය යෝජනා හා සම්බන්ධ ESG අවදානම් තක්සේරු කළේය. විස්තීර්ණ අවස්ථා විශ්ලේෂණ ආකෘති සහ වඩාත් දැඩි ආතති පරීක්ෂණ මගින් අහිතකර තත්ත්වයන්ගෙන් පැන නගින ESG අවදානම් තේරුම් ගැනීමට සහ අවම කිරීමට බැංකුවට සහාය විය.

2024 දී, බැංකුව නව මධ්‍යගත බැංකුකරණ විසඳුමකට සංක්‍රමණය වූ අතර එය සැලකිය යුතු තාක්ෂණික දියුණුවක් සනිටුහන් කළේය. මෙම සංක්‍රමණය අපගේ බැංකු මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ පරිමාණය වැඩි දියුණු කිරීමටත්, පාරිභෝගික දත්ත වඩා හොඳින් කළමනාකරණය කිරීමටත්, වේගවත් ගනුදෙනු සැකසීමටත්, පුළුල් පරාසයක ඩිජිටල් බැංකුකරණ සේවා පිරිනැමීමේ හැකියාව ලබා දීමටත්, වඩාත් ශක්තිමත් දත්ත විශ්ලේෂණ සහ තත්‍ය කාලීන අධීක්ෂණ මෙවලම් සැපයීමෙන්, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සඳහා අපගේ කැපවීමට සහය දක්වමින් සහ තීරණ ගැනීම වැඩිදියුණු කිරීමෙන් අපගේ අවදානම් කළමනාකරණ හැකියාවන් ශක්තිමත් කිරීමටත් අපේක්ෂා කෙරේ.

## 2025 දී ප්‍රමුඛතා

2025 වසරට අප පිවිසෙන විට, නව මධ්‍යගත බැංකුකරණ ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත මූල්‍ය හා මෙහෙයුම් කාර්යක්ෂමතාව ළඟා කර ගැනීම අපගේ ප්‍රමුඛතාවයයි.

අපි වඩා හොඳ පාරිභෝගික අත්දැකීමක් ලබා දීම, මෙහෙයුම් අවදානමට නිරාවරණය වීම් සහ පිරිවැය අවම කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රියාවලීන් සහ පාලන මාර්ග ශක්තිමත් කිරීම, සහ ඩිජිටල්කරණ මුලපිරීම් සමඟ සේවා වැඩිදියුණු කිරීම් හරහා නව ආදායම් මාර්ග වෙත පිවිසීම සඳහා කැපවී සිටිමු.

තවද, 2023 අංක 17 දරන බැංකු විශේෂ විධිවිධාන පනත, ආයතනික පාලනය පිළිබඳ මහ බැ0කු උපදෙස් සහ තිරසාරභාවය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් වැනි නව නියාමන සංවර්ධනයන්ට අනුකූල වීමට බැංකුව උත්සාහ කරයි.

ඒ අනුව, ඉදිරි වසර තුළ අභ්‍යන්තර හා බාහිර වෙනස්කම් වලින් මතුවන අවදානම් ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීමට ප්‍රමුඛත්වය දෙන අතරම බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සාක්ෂාත් කරගැනීමට, අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්, වසර ගණනාවක් පුරා වර්ධනය වූ අවදානම් සංස්කෘතිය, සහ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අවදානම් ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීමට ප්‍රමුඛත්වය ලබා දීම හේතු වෙයි.

අවදානම් කළමනාකරණය සඳහා NSB ප්‍රවේශය 195 සිට 219 දක්වා පිටු වල විස්තරාත්මකව පැහැදිලි කර ඇත.



KPMG
(Chartered Accountants)
32A, Sir Mohamed Macan Markar Mawatha,
P.O. Box 186,
Colombo 00300, Sri Lanka.

Tel +94 - 11 542 6426
Fax +94 - 11 244 5872
+94 - 11 244 6058
Internet www.kpmg.com/lk

## Independent Limited Assurance Report to the Directors of National Savings Bank on Sustainability Indicators in the Integrated Annual Report for the year ended 31 December 2024

### Conclusion

We have performed a limited assurance engagement on whether the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 has been prepared in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards.

Based on the procedures performed and the evidence obtained, nothing has come to our attention that causes us to believe that the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 (summarised in the table below) are not prepared, in all material respects, in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards.

| Limited assurance sustainability indicators | Integrated Annual Report page |
|---|---|
| Highlights | 14 |
| Our triple focus: economy, society and sustainability | 15 |
| **Information provided on following** | |
| Financial capital | 92 to 101 |
| Manufactured capital | 102 to 107 |
| Human capital | 108 to 119 |
| Intellectual capital | 120 to 127 |
| Social and relationship capital | 128 to 145 |
| Natural capital | 146 to 151 |

This conclusion on the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 does not extend to any other information that accompanies the integrated report. We have read the other information, but we have not performed any procedures with respect to the other information.

### Basis for conclusion

We conducted our engagement in accordance with Sri Lankan Standard on Assurance Engagements (ISAE) 3000 (Revised), Assurance Engagements Other Than Audits or Reviews of Historical Financial Information issued by The Institute of Chartered Accountants of Sri Lanka (ICASL). Our responsibilities under this standard are further described in the "Our responsibilities" section of our report.

We have complied with the independence and other ethical requirements of the Code of Ethics for Professional Accountants issued by CA Sri Lanka (Code of Ethics).

Our firm applies Sri Lanka Standard on Quality Management 1 (SLSQM 1), Quality Management for Firms that Perform Audits or Reviews of Financial Statements, or Other Assurance or Related Services Engagements, and, accordingly, maintains a comprehensive system of quality management, including documented policies and procedures regarding compliance with ethical requirements, professional standards, and applicable legal and regulatory requirements.

We believe that the evidence we have obtained is sufficient and appropriate to provide a basis for our conclusion.

KPMG, a Sri Lankan partnership and a member firm of the KPMG global organization of independent member firms affiliated with KPMG International Limited, a private English company limited by guarantee. All rights reserved.

C. P. Jayatilake FCA
Ms. S. Joseph FCA
R.M.D.B. Rajapakse FCA
M.N.M. Shameel FCA
Ms. P.M.K. Sumanasekara FCA
T. J. S. Rajakarier FCA
W. K. D. C. Abeyrathne FCA
Ms. B.K.D.T.N. Rodrigo FCA
Ms. C.T.K.N. Perera ACA
R.W.M.O.W.D.B. Rathnadiwakara FCA
W. W. J. C. Perera FCA
G. A. U. Karunaratne FCA
R. H. Rajan FCA
A.M.R.P. Alahakoon ACA

Principals: S.R.I. Perera FCMA (UK), LLB, Attorney-at-Law, H.S. Goonewardene ACA, Ms. F.R Ziyard FCMA (UK), FCIT, K. Somasundaram ACMA (UK), R. G. H. Raddella ACA, Ms. D Corea Dharmaratne

## Criteria used as the basis of reporting

The criteria used as the basis of reporting is the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines.

## Intended purpose of our Report

We have been engaged by the Directors of National Savings Bank ("the Bank") to provide limited assurance on the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 (the "Integrated Report"), prepared in accordance with Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards.

## Restriction on use or distribution of our Report

This report has been prepared for the Directors of National Savings Bank for the purpose of providing an assurance conclusion on the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 and may not be suitable for another purpose. We disclaim any assumption of responsibility for any reliance on this report, to any person other than the Bank, or for any other purpose than that for which it was prepared.

Our report should not be regarded as suitable to be used or relied on by any party wishing to acquire rights against us other than National Savings Bank, for any purpose or in any other context. Any party other than National Savings Bank who obtains access to our report or a copy thereof and chooses to rely on our report (or any part thereof) will do so at its own risk. To the fullest extent permitted by law, we accept or assume no responsibility and deny any liability to any party other than National Savings Bank for our work, for this independent assurance report, or for the conclusions we have reached.

## Board of Directors and Management's responsibility

The Board of Directors and Management are responsible for:

- designing, implementing and maintaining internal controls relevant to the preparation of the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 that are free from material misstatement, whether due to fraud or error.
- selecting suitable criteria for preparing the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 and appropriately referring to or describing the criteria used; and
- preparation and fair presentation of the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines.
- preventing and detecting fraud and for identifying and ensuring that the Bank complies with laws and regulations applicable to its activities.
- ensuring that staff involved with the preparation and presentation of the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 are properly trained, information systems are properly updated and that any changes in reporting encompass all significant business units.

## Inherent limitations in preparing the limited assurance sustainability indicators

Due to the inherent limitations of any internal control structure, it is possible that errors or irregularities may occur in disclosures of the Sustainability Information and not be detected. Our engagement is not designed to detect all internal control weaknesses in the preparation of the Sustainability Information because the engagement was not performed on a continuous basis throughout the period and the audit procedures performed were on a test basis.

## Our responsibilities

We are responsible for:

- planning and performing the engagement to obtain limited assurance about whether the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 are free from material misstatement, whether due to fraud or error;
- forming an independent conclusion, based on the procedures we have performed and the evidence we have obtained; and;
- reporting our conclusion to the Board of Directors.

## Summary of the work we performed as the basis for our conclusion

We exercised professional judgement and maintained professional skepticism throughout the engagement. We designed and performed our procedures to obtain evidence about the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 that is sufficient and appropriate to provide a basis for our conclusion.

Our procedures selected depended on our understanding of the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 and other engagement circumstances, and our consideration of areas where material misstatements are likely to arise. In carrying out our engagement,

the procedures we performed primarily consisted of:

- interviews with senior management and relevant staff at corporate and selected site level concerning sustainability strategy and policies for material issues, and the implementation of these across the business;
- enquiries of management to gain an understanding of the Bank's processes for determining material issues for the Bank's key stakeholder groups;
- enquiries of relevant staff at corporate and selected site level responsible for the preparation of the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024;
- enquiries about the design and implementation of the systems and methods used to collect and report the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 Indicators, including the aggregation of the reported information;
- comparing the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 to relevant underlying sources on a sample basis to determine whether all the relevant information has been appropriately included in the Report;
- reading the Sustainability Indicators in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2024 presented in the Report to determine whether they are in line with our overall knowledge of, and experience with, the sustainability performance of the Bank;
- reading the remainder of the Report to determine whether there are any material misstatements of fact or material inconsistencies based on our understanding obtained as part of our assurance engagement.

A limited assurance engagement is restricted primarily to enquires and analytical procedures. The procedures performed in a limited assurance engagement vary in nature and timing from, and are less in extent than for, a reasonable assurance engagement. Consequently, the level of assurance obtained in a limited assurance engagement is substantially lower than the assurance that would have been obtained had a reasonable assurance engagement been performed.

Misstatements, including omissions, are considered material if, individually or in the aggregate, they could reasonably be expected to influence relevant decisions of the Directors of National Savings Bank.



**Chartered Accountants**
Colombo

2 May 2025



සංයුක්තය

# පාලනය


160
අධ්‍යක්ෂ මණ්ඩලය

164
ආයතනික කළමනාකාරිත්වය

165
විධායක කළමනාකාරිත්වය

168
ප්‍රධාන කළමනාකරුවන්

169
ආයතනික පාලනය

184
අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව

187
අධ්‍යක්ෂක මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

189
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

191
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

193
හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව

194
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව වාර්තාව

195
අවදානම් කළමනාකරණ වාර්තාව

# අධ්‍යක්ෂ මණ්ඩලය





**ජනාධිපති නීතිඥ ආචාර්ය**
**හර්ෂ කබ්රාල් මහතා**

සභාපති

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

BNNEC

**පත්වූ දිනය**

2023 මැයි 2

**නිපුනතා සහ අත්දැකීම්**

ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිය, වාණිජ නීතිය, වාණිජ බේරුම්කරණය, ආරක්ෂණ නීති, ජාත්‍යන්තර වාණිජ නීතිය යන ක්ෂේත්‍රයන්හි සිවිල් හා අපරාධ නීතිය සම්බන්ධයෙන් වසර 35 ක අත්දැකීම් බහුල ප්‍රවීණයෙකි. ජනාධිපති නීතිඥයෙකු ලෙස වසර 17 ක් කටයුතු කර ඇති හෙතෙම ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා වාණිජ මහාධිකරණයේ පුළුල් අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියන අතර කනිෂ්ඨ නීතිඥවරු 16 දෙනෙක් ඔහු යටතේ කටයුතු කරති.

ඔහු ඕස්ට්‍රේලියාවේ කැන්බරා සරසවියේ ආයතනික නීතිය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙක් වන අතර, 2021 වර්ෂය තෙක් වර්ෂ 06 ක්ම පැරීසියේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC) බේරුම්කරණය පිළිබඳ ජාත්‍යන්තර අධිකරණයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර තිබේ. එමෙන්ම, ඒකාබද්ධ ගැටුම් කළමනාකරණය පිළිබඳ සම්මේලනයේ නියෝජිත සාමාජිකයෙකු (FICM) සහ ජාත්‍යන්තර වාණිජ ගැටුම් පිළිබඳ විනිශ්චය සභාවේ නියෝජිත සාමාජිකයෙකු (ICDT) මෙන්ම එක්සත් රාජධානියේ හා අයර්ලන්තයේ වරලත් පාලන ආයතනයේ අධි සාමාජිකයෙකි. (UK and Ireland)

ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය පිළිබඳ උපදේශක කොමිසමෙහි සාමාජිකයකු ලෙස ආචාර්ය කබ්රාල් මහතා වත්මන් සමාගම් පනත වන 2007 අංක 07 දරන සමාගම් පනත සකස් කිරීමට දායක වී තිබේ.

මෙරට සහ විදේශ විශ්ව විද්‍යාල කිහිපයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන ආචාර්ය කබ්රාල් මහතා ප්‍රවීණ කථිකයෙක් මෙන්ම ගත්කතුවරයෙක්ද වේ. ඔහු ආයතනික නීතිය, බුද්ධිමය දේපළ නීතිය, වාණිජ බේරුම්කරණය, ජාත්‍යන්තර වාණිජ නීතිය පිළිබඳ මෙරට හා විදේශයන්හි ශාස්ත්‍රීය ලිපි පළකර ඇති විද්‍යාර්ථියෙකි. අධිකරණ කටයුතුවල නියැලීම හා දේශන කටයුතුවලට අමතරව දේශීය හා විදේශීය ඒක පුද්ගල බේරුම්කරණ ක්‍රියාවලීන් විශාල සංඛ්‍යාවක ඒකපුද්ගල බේරුම්කරු, සමබේරුම්කරු හා සභාපති ලෙස කටයුතු කර ඇත. ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලද කෘති පහත දැක්වේ.

- ආයතනික නීතිය, ව්‍යුත්පන්න ක්‍රියාමාර්ගඃ සත්සන්දනාත්මක ප්‍රවේශයක්
- ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිය
- 2007 අංක 07 දරන සමාගම් පනත හා ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය
- සමාගම් අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය හා ශ්‍රී ලංකාවේ ආයතනික පාලනය
- ශ්‍රී ලංකාවේ වාණිජ බේරුම්කරණ නීති හා පරිචය
- කබ්රාල් බේරුම්කරණ නීති වාර්තා (වෙළුම 1) [1895-2020]
- කබ්රාල් බුද්ධිමය දේපල නීති වාර්තාව (වෙළුම 1) [1888-1995]
- කබ්රාල් බුද්ධිමය දේපල නීති වාර්තාව (වෙළුම 11) [1995-2020]
- කබ්රාල් සමාගම් නීති වාර්තාව (වෙළුම 1) [1881-1982]
- කබ්රාල් සමාගම් නීති වාර්තාව (වෙළුම 11) [1983-1993]
- කබ්රාල් සමාගම් නීති වාර්තාව (වෙළුම 111) [1994-2012]
- කබ්රාල් සමාගම් නීති වාර්තාව (වෙළුම 1v) [2013-2021]

**වෙනත් වර්තමාන තනතුරු**

ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාවේ සාමාජිකයෙකි. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පිළිබඳ උපදේශක කොමිසමෙහි සාමාජිකයෙකි. අධිකරණ අමාත්‍යාංශයේ බුද්ධිමය දේපළ නීති සංශෝධන ව්‍යාපෘතියේ සභාපති මෙන්ම ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආයතනික පාලන කමිටුවේ සහ ආයතනික පාලන පීඨයේ සාමාජිකයෙකි. එමෙන්ම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය (PGIM). සඳහා නාමයෝජිත සාමාජිකයෙකුද වේතවද ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා ක්‍රීඩා අමාත්‍යාංශයට සම්බන්ධ නව ජාතික ක්‍රීඩා පිළිබඳ නීති සම්පාදනය, අධිකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද "නව අධිකරණ නිවහන" ව්‍යාපෘතිය සහ අධිකරණ අමාත්‍යාංශයේ වාණිජ නීති ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකි.

ශ්‍රී ලංකාවේ සිමෙන්ති වෙළඳපොළෙහි ඉහළම කොටස් හිමිකම සහිත ටෝකියෝ සිමෙන්ට් සමූහයේ සභාපතිත්වය දරයි. එමෙන්ම ඩිමෝ පුද්ගලික සමාගම, හේලීස් පුද්ගලික සමාගම, ඇලුමෙක්ස් පුද්ගලික සමාගම, ටෝකියෝ සිමෙන්ට් කම්පැනි (ලංකා) පුද්ගලික සමාගම, සීමාසහිත ටෝකියෝ සුපර් සිමෙන්ට් ලංකා, සීමාසහිත ටෝකියෝ සිමෙන්ට් පවර් ලංකා, සීමාසහිත ටෝකියෝ ඊස්ටන් සිමෙන්ට් පුද්ගලික සමාගම, සී/ස ටෝකියෝ සුපර් ඇග්‍රිගේට් පුද්ගලික සමාගම, සී/ස ටෝකියෝ සුපර් මික්ස් පුද්ගලික සමාගම, ෂෙව්රන් ලුබ්රිකන්ට්ස් ලංකා පුද්ගලික සමාගම, සී/ස සෙලින්කෝ ජීවිත රක්ෂණ සමාගම යන ආයතනයන්හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස මේ වන විට කටයුතු කරයි. ඩාලි ප්‍රොපර්ටි හෝල්ඩින්ස් සමාගම, CCC-ICLP ඉන්ටර්නැෂනල් ADR සෙන්ටර් (ඇපලාහී) සමාගම, ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ (NOC) ආචාර ධර්ම කමිටුව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපලාහී) සමාගම, (SLIIT) හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතන ජාත්‍යන්තර පුද්ගලික සමාගම (SLIIT International (Private) Limited) සහ නැණදිරිය (ඇපලාහී) සමාගම යන ආයතනවල සභාපති ධූරය දරන කබ්රාල් මහතා විගණන කමිටු, නාමයෝජනා කමිටු, පාරිශ්‍රමික කමිටු, ණය අයකර ගැනීම් කමිටු සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුකාර කමිටු ආදී කමිටු ගණනාවකට සම්බන්ධව හා ඉන් බොහොමයක සභාපතිත්වය දරමින් කටයුතු කරයි.

**මින් පෙර දැරූ තනතුරු**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) හිටපු සාමාජිකයෙකු වන ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයේ ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඔහු වත්මන් පනත වන 1995 අංක 11 දරන බේරුම්කරණ පනත කෙටුම්පත් කිරීමෙහිලා දායක වී ඇත. එසේම, ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනයක් වන LOLC ෆිනෑන්ස් පුද්ගලික සමාගමේ හිටපු සභාපතිවරයා වන ඒ මහතා, සීමාසහිත LOLC රක්ෂණ සමාගම, කොමර්ෂල් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්, රිචඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් සමාගම යන ආයතනයන්හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇත. එමෙන්ම, හැටන් නැෂනල් බැංකුවෙහි (HNB) වැඩ බලන සභාපතිවරයා වශයෙන්ද යූනියන් බැංකුවෙහි ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කර ඇත. ජාතික වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවෙහි සාමාජිකත්වය දැරූ ඒ මහතා ශ්‍රී ලංකාවේ නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා සාමාජිකයෙකි.



**ජූඩ් නිලුක්ෂාන් මහතා**
නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

BIRMC BAC BHRRC BNC BNNEC

**පත්වූ දිනය**
2022 පෙබරවාරි 28

**නිපුනතා සහ අත්දැකීම්**
නිලුක්ෂාන් මහතා දකුණු කොරියාවේ ක්‍යොන් (Kyung Hee) විශ්ව විද්‍යාලයෙන් අන්තර්ජාතික වෙළදාම සහ ආර්ථික සහයෝගීතාවය පිළිබඳ පශ්චාත් උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව කළමනාකරණය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු කීර්තිමත් දේශීය සහ අන්තර්ජාතික ආයතන/විශ්ව විද්‍යාල ගණනාවකින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතිකයක් ලබාගෙන ඇති අතර අනෙකුත් අදාළ කළමනාකරණ සුදුසුකම් සපුරා තිබේ. ජූඩ් නිලුක්ෂාන් මහතා, රාජ්‍ය අංශයේ වසර 22 කට වැඩි අත්දැකීම් සමුදායකට හිමිකම් කියන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. ඔහු විසින් සිය රාජ්‍ය සේවය තුළදී මහා භාණ්ඩාගාරයේ සහ කැබිනට් අමාත්‍යවරුන්ගේ කාර්යාලයේ විවිධ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරන ලදී.

**වෙනත් වර්තමාන තනතුරු**
ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු සහ අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා විසින් සභාපතිත්වය දරන ජාතික මෙහෙයුම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විවිධ නිල කමිටු වල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇත.

**මින් පෙර දැරූ තනතුරු**
2015 – 2020 කාලය තුළ කැබිනට් අමාත්‍යවරුන්ගේ කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රේගුවේ සුරාබදු අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ශ්‍රම වාසනා අරමුදල් මණ්ඩලයේ සභාපති යන තනතුරු දැරූ ඒ මහතා විසින් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය (CEB) මූල්‍ය අධ්‍යයනය පිළිබඳ ඇකඩමිය (MILODA) ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) ජාතික උද්භිත උද්‍යාන භාර අරමුදල, සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය (ITN), සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය, පළාත් පාලන ණය මණ්ඩලය, ශ්‍රී ලංකා යොවුන් සේනාංකය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) සහ රාජ්‍ය සේවකයන්ගේ අනොන්‍ය අර්ථසාධක අරමුදල (PSMPA) වැනි රජය සතු ආයතනයන්හි මහා භාණ්ඩාගාරය නියෝජනය කරන ලදී.



**එස් ආර් ඩබ් එම් රුවන් පාලිත සත්කුමාර මහතා**
නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

BNC BHRRC BIRMC BITSC

**පත්වූ දිනය**

2023 මාර්තු 27

**නිපුනතා සහ අත්දැකීම්**

සත්කුමාර මහතා කැලණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව කළමනාකරණය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත.

ඔහු ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක්ද සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් වෘත්තියවේදීන් සඳහා වූ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවද ලබා ඇත.

ඔහු සංවර්ධන පරිපාලන ආයතනයේ මහජන ප්‍රසම්පාදනය හා ගිවිසුම් පරිපාලනය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාධාරියෙකි. රාජ්‍ය අංශයේ වසර 23 කට වැඩි අත්දැකීම් සහිත සත්කුමාර මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.

**වෙනත් වර්තමාන තනතුරු**

තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව, අමාත්‍යාංශ නියෝජිත/ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**මින් පෙර දැරූ තනතුරු**
ශ්‍රී.ල.ප.සේ කැඩෙට් – ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ සහකාර කොමසාරිස් – ඉඩම් නිරවුල්කිරීමේ දෙපාර්තමේන්තුව, සහකාර ප්‍රාදේශීය ලේකම් – ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගනේවත්ත, ප්‍රාදේශීය ලේකම් – ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩුබද්දාව, අමාත්‍යාංශ නියෝජිත/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ප්‍රාදේශීය ලේකම් – ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉපලෝගම, අධ්‍යක්ෂ – කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය), නියෝජ්‍ය අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ – ශ්‍රී ලංකා රේගුව, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/අධ්‍යක්ෂ (ක්‍රීඩා සංවර්ධන), අතිරේක ලේකම් – ජන සන්නිවේදන අමාත්‍යාංශය, අධ්‍යක්ෂ – මන්තායි සෝල්ට් ලිමිටඩ්, කොමිෂන් සභා සාමාජික – ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම (LRC), අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – සී/ස කුසලතා සංවර්ධන අරමුදල් සමාගම (SDFL), වැඩ බලන සභාපති – ස්වාධීන රූපවාහිනී සංස්ථාව (ITN), අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA), අමාත්‍යාංශ නියෝජිත – ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – සැලසිනෝ රූපවාහිනී ආයතනය



**දුෂ්‍යන්ත බස්නායක මහතා**

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

BITSC BAC BNC BNNEC

**පත් කරන ලද දිනය**

2023 මාර්තු 31

**නිපුනතා සහ අත්දැකීම්**

බස්නායක මහතා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA-UK) අධිසාමාජිකයෙකු සහ වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු (CGMA) වේ. ඔහු ශ්‍රී ලංකා අලෙවි ආයතනයේ සහතිකලත් සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි. ඒ මහතා එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ (UK) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිධරයෙකු වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධියක් (EMBA) ලබා ඇත. එමෙන්ම, ඔහු එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ නීතිපති උපාධියකට හිමිකම් කියයි.

බස්නායක මහතා ලොව විශාලතම වෘත්තීය සේවා ජාලයක් වන අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් (Ernst & Young) ආයතනයෙන් තම ගණකාධිකාරී වෘත්තිය ආරම්භ කළේය. ඔහු විවිධ රාජ්‍ය ආයතන වල සහ රාජ්‍ය අංශයේ සමාගම් වල විධායක තනතුරු දැරූ පුළුල් නිපුනතාවයක් හා වසර 35 කට වැඩි අත්දැකීම් සහිත කළමනාකරණ උපදේශක වරයෙකි.

**වෙනත් වර්තමාන තනතුරු**

සභාපති – සී/ස ආයු වෙන්චර්ස් පුද්ගලික සමාගම, සී/ස මෙඩිමාකට් පුද්ගලික සමාගම අධ්‍යක්ෂ – MIDAS සෙක්‍රටේරියල් සර්විසස් පුද්ගලික සමාගම, ඒෂියන් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

**මින් පෙර දැරූ තනතුරු**

කළමනාකරණ අධ්‍යක්ෂ – ශ්‍රී ලංකා රක්ෂණ සමාගම, සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම, මූල්‍ය අධ්‍යක්ෂ – සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, අධ්‍යක්ෂ – සී/ස ගල්ඔය වැවිලි සමාගම, විධායක අධ්‍යක්ෂ – Apogee සමූහය සහ සී/ස ලංකා ප්‍රවෘත්ති පත්‍ර සමාගම



**අශේන් ජයසේකර මහතා**

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

BAC BHRRC BIRMC BITSC

**පත් කරන ලද දිනය**

2024 ජනවාරි 9

**නිපුනතා සහ අත්දැකීම්**

අශේන් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA-UK) සහ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ අධිසාමාජිකයෙකි. ඔහු සිංගප්පූරු බේරුම්කරණ ආයතනයේ සහ වරලත් අලෙවි ආයතනයේ අනුබද්ධ සාමාජිකයෙක් වන අතර එක්සත් රාජධානියේ වරලත් අලෙවි ආයතනයේ අලෙවිකරණය පිළිබඳ උපාධිධරයෙකි. ඒ මහතා ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ දකුණු ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධියක් ලබා ඇත. එසේම, ඔහු එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණය හා බුද්ධිමය දේපළ පිළිබඳ නීතිපති උපාධියක් හිමිකරගෙන තිබේ. ජයසේකර මහතා සහතිකලත් අභ්‍යන්තර විගණකවරයෙක්, සහතිකලත් වංචා විමර්ශකයෙක්, සහතිකලත් තොරතුරු පද්ධති විගණකවරයෙක් මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ පරිගණක අපහාරක චෝහාරික විමර්ශකයෙක් ද වේ. වර්තමානයේදී ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ පාලක කවුන්සිලයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කරන අතර ගිණුම්කරණ හා ව්‍යාපාර පාසලේ කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධූරය දරයි. හෙතෙම ප්‍රධාන පෙළේ රාජ්‍ය හා පෞද්ගලික විශ්වවිද්‍යාල රැසක බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස කටයුතු කරන අතර වංචා හා චෝහාරික ගිණුම්කරණය ශ්‍රී ලංකාවේ උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විෂයයක් ලෙස හඳුන්වාදීම සහ උගැන්වීමෙහිලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළේය.

**වෙනත් වර්තමාන තනතුරු**

ශ්‍රී ලංකාවේ බී ඩී ඕ පාර්ට්නර්ස් ආයතනයේ නියෝජ්‍ය කළමණාකරණ අධ්‍යක්ෂ සහ සීමාසහිත බී ඩී ඕ පාර්ට්නර්ස් පුද්ගලික සමාගමේ කළමණාකරණ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභා සාමාජික, කොළඹ විශ්ව විද්‍යාලයේ සභා සාමාජික (අයි එස් ඒ සී ඒ ග්ලෝබල් යූ එස් ඒ ආයතනයට අනුබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධති විගණන සහ පාලන සංගමයේ ශ්‍රී ලාංකික පර්ෂදයේ (ISACA Sri LANKA Chapter) උප සභාපති, ඇමෙරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයන්ගේ සංගමයේ ගෝලීය උපදේශන සභාවේ (Global ADVISORY Council of the Association of Certified Fraud Examiners USA) සාමාජික, ඇමෙරිකා එක්සත් ජනපදයේ විද්‍යුත් වාණිජ්‍ය පිළිබඳ උපදේශකවරුන්ගේ සභාවේ පරිගණක අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ගෝලීය උපදේශන සභාවේ (Global Advisory Board on Computer Forensics of EC Council USA) සාමාජික

**මින් පෙර දැරූ තනතුරු**

LB ෆිනෑන්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයෙක් ලෙස මෙන්ම බීටී කමියුනිකේෂන් පුද්ගලික සමාගම (එක්සත් රාජධානියේ බ්‍රිටිෂ් ටෙලිකොම් ග්ලෝබල් සර්විසස් ආයතනයේ පරිපාලිතයකි), බී ඩී ඕ බී පී ඕ සේවා පුද්ගලික සමාගම සහ බී ඩී ඕ ප්‍රයිම් කන්සල්ටන්ස් පුද්ගලික සමාගම යන ආයතන වල අධ්‍යක්ෂවරුයෙකු ලෙසද අශේන් මහතා කටයුතු කර තිබේ.



**ශෂී කණ්ඩම්බි මහත්මිය**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

**පත් කරන ලද දිනය**
2024 ජනවාරි 10

**නිපුනතා සහ අත්දැකීම්**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් කළමනාකරණ උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයෙන් ව්‍යාපාර සහ මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකුකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබේ.

කණ්ඩම්බි මහත්මිය සම්පත් බැංකුවේ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරිය වන අතර ඇය එහිදී දීර්ඝ සහ සාර්ථක වෘත්තීය ජීවිතයක් ගොඩනගා ගැනීමට සමත් වූවාය. ඇය ආයතන කළමනාකරණය ඇතුළුව වසර 35 කට වැඩි බැංකුකරණ අත්දැකීම් සමුදායකට හිමිකම් කියයි. ජාත්‍යන්තර බැංකු මෙහෙයුම් හා වෙළඳ සේවා, ආයතනික ණය, ආයතනික ඩිජිටල්කරණය, ආයතනික මූල්‍ය, විදේශ විනිමය බැංකුකරණ ඒකකය, භාණ්ඩාගාර, ප්‍රාථමික ගනුදෙනු ඒකකය, නීති, ණය අයකරගැනීම් සහ ජාත්‍යන්තර වෙළඳ යන අංශ සම්බන්ධයෙන් පුළුල්ව අත්දැකීම් ලද ඇය සාර්ථකව උපායමාර්ගික සැලසුම් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, මූල්‍ය සම්පත් කළමනාකරණය, අවදානම් අවම කරගැනීම සහ දැඩි ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වා ගැනීම සම්බන්ධයෙන් සිය ප්‍රවීණතාවය සනාථ කර තිබේ. ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත් නව්‍යකරණය සහ තාක්ෂණය, නියාමන අනුකූලතාවය සහ ආපදා කළමනාකරණය පිළිබඳවද හසල දැනුමක් ඇය සතුය.

**වෙනත් වර්තමාන තනතුරු**

ඒ මහත්මිය, SWIFT User Group හි සහ ජාතික සමාජික කණ්ඩායමේ (National Member Group) සභාපතිධුරය හොබවන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බඩ්ස්මන්වරයාගේ අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ – එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම හා ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ උපදේශකවරුන්ගේ කවුන්සිලයේ සාමාජික යන තනතුරුද දරයි.

**මින් පෙර දැරූ තනතුරු**

ආයතනික කළමනාකරණය සඳහා වෙන්වූ වසර 10 ක කාලයක් ඇතුළුව බැංකුකරණ ක්ෂේත්‍රයේ දශක තුනකට වැඩි අත්දැකීම් හා පළපුරුද්ද සමග ඇය සම්පත් බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර දැරුවාය. වෘත්තිය බැංකුකරුවන්ගේ සංගමයේ හිටපු සභාපතිනිය හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ අධ්‍යයන කවුන්සිලයේ සාමාජිකාවක වශයෙන්ද ඒ මහත්මිය කටයුතු කළාය.



**අනුපමා මුහන්දිරම් මිය**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

**පත් කරන ලද දිනය**
2016 දෙසැම්බර් 6

**නිපුනතා සහ අත්දැකීම්**

නීතිඥවරියක් වන අනුපමා මුහන්දිරම් මහත්මිය එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් නීතිපති උපාධියක් (LLM), ඉන්දියාවේ මනිපාල් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් (MBA) සහ නීති අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකා සංස්ථාපිත කවුන්සිලයෙන් බැංකු සහ රක්ෂණය පිළිබඳ පශ්චාත් නීතිඥ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ඇත. දැනට ඇය වරලත් ආයතනික ලේකම්වරයෙකු ලෙස සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් හදාරමින් සිටී.

2016 දෙසැම්බර් 6 වන දින ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරට පත්වීමට ප්‍රථම ඇය 2015 නොවැම්බර් මස සිට 2016 දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරිය ලෙස කටයුතු කළාය.
එසේම, ඇය 2015 සිට 2017 දක්වාවූ කාල සීමාව තුළදී එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් හි සමාගම් ලේකම් වශයෙන්ද කටයුතු කළාය. ඒ මහත්මියගේ වසර 27 කට වැඩි බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් අතුරින් වසර 18 කට වැඩි කාලයක් ඇය මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිණියක හා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරියක ලෙස සේවය කර ඇත.

සබරගමුව විශ්ව විද්‍යාලයේ වාණිජ නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරියක් ලෙසද සේවය කරන මුහන්දිරම් මහත්මිය ශ්‍රී ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල/සමාගම් ලේකම්වරුන්ගේ සංගමයේ නිර්මාතෘ ලේකම්වරිය වේ. ඇය පුහුණු නීතිවේදිනියක ලෙස ඕස්ට්‍රේලියානු නීති සමාගමකට අනුයුක්තව නීති ක්ෂේත්‍රයට අදාළව විදෙස් අත්දැකීම් ලබාගැනීමට යොමුව සිටී.

| | |
|---|---|
| **BNNEC** හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ කමිටුවේ – සාමාජික | **BNNEC** හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ කමිටුවේ – සභාපත |
| **BIRMC** ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ - සාමාජික | **BIRMC** ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ - සභාපති |
| **BAC** අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ - සාමාජික | **BAC** අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ - සභාපති |
| **BHRRC** මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ - සාමාජික | **BHRRC** මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ - සභාපති |
| **BNC** නාමයෝජනා කමිටුවේ - සාමාජික | **BNC** නාමයෝජනා කමිටුවේ - සභාපති |
| **BITSC** අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්‍ෂණික උපායමාර්ගික කමිටුවේ - සාමාජික | **BITSC** අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්‍ෂණික උපායමාර්ගික කමිටුවේ - සභාපති |

# ආයතනික කළමනාකාරිත්වය



**ශෂී කණ්ඩම්බි මිය**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී



**කේ රවීන්ද්‍රන් මහතා**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



**ජී වී ඒ ඩී ඩී සිල්වා මෙය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(භාණ්ඩාගාර සහ ජාත්‍යන්තර)



**ජී ඩබ්ලිව් ඊ ජයවීර මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන)



**එම් එන් ඒ ප්‍රනාන්දු මෙය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සංවර්ධන)



**ඩබ් එම් ආර් බී වීරකෝන් මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන)



**කේ ඩී ජයතිලක මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)/
ප්‍රධාන නීති නිලධාරී



**ලසිත් නානායක්කාර මහතා**
ප්‍රධාන තොරතුරු නිලධාරී
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)



**ඩබ්ලිව් එම් කරුණාරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)



**ජේ එච් ටී චන්ද්‍රරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)



**ඒ එල් ඒ හලීම් මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



**ඩබ්ලිව් පී යූ ඒ ද සිල්වා මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (ආයතනික මූල්‍ය)



**ආර් ඒ එන් එන් විජේසිංහ මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



**අයි කේ එල් සසී මහේන්ද්‍රන් මිය**
අනුකූලතා නිලධාරී



**ආර් පී ඒ එම් පී රාජනායක මිය**
ප්‍රධාන අවදානම් නිලධාරී



**එස් ඩබ් ඒ වීරසිංහ මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර)



**එල් සී සේනානායක මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

# අධ්‍යක්ෂ මණ්ඩලය





**එම් ඒ පී මුහන්දිරම් මිය**
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්



**එම් ඩී සුරන්ජන මහතා**
**සහකාර සාමාන්‍යාධිකාරී (විගණන)**



**එච් එම් ජී පී ජේ හේරත් මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



**එස් සිවසොරූපන් මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (තැපැල් බැංකු)



**ඩී එම් සී පී බී දිසානායක මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(මධ්‍යගත බැංකුකරණ පද්ධති)



**එස් එච් ඒ එස් කුමාරි මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (ණය අයකර ගැනීම්)



**ඩී එල් පී අබේසිංහ මහතා**
ප්‍රධාන විධායක නිලධාරී
(එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි)



**එච් එම් එම් හේරත් මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)



**කේ ඩී කේ කේ විජයවර්ධන මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



**ඒ පී ආර් ද සොයිසා මහතා**
ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරි



**සී එන් ඒකනායක මිය**
සහකාර සාමාන්‍යාධිකාරී
(නිපුණතා කළමනාකරණ)



**කේ බී එන් සී කුමාරි මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)



**එම් ඩී ටී පෙරේරා මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)

# ප්‍රධාන කළමනාකරුවන්



**එස් බී සුරංග මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (බටහිර 3)
ප්‍රාදේශීය කාර්යාලය (බටහිර 3)

**ජේ එම් ඒ කේ ජයසිංහ මිය**
ප්‍රාදේශීය කළමනාකරු (බටහිර 2)
ප්‍රාදේශීය කාර්යාලය (බටහිර 2)

**එන් බහීරදන් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (නැගෙනහිර)
ප්‍රාදේශීය කාර්යාලය (නැගෙනහිර)

**එච් ඩී යූ සුසන්ත කුමාර මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (ඌව)
ප්‍රාදේශීය කාර්යාලය (ඌව)

**ඩී ඒ වී විජේවන්ත මිය**
ප්‍රාදේශීය කළමනාකරු
(වයඹ)ප්‍රාදේශීය කාර්යාලය (වයඹ)

**කේ සන්සායන් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (උතුර)
ප්‍රාදේශීය කාර්යාලය (උතුර)

**එස් එන් ආර් සේනාධීර මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (බටහිර 1)
ප්‍රාදේශීය කාර්යාලය (බටහිර 1)

**ආර් ටී සුබසිංහ මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (මධ්‍යම)
ප්‍රාදේශීය කාර්යාලය (මධ්‍යම)

**එච් එම් ජී හේරත් මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (සබරගමුව)
ප්‍රාදේශීය කාර්යාලය (සබරගමුව)

**එස් ජී එස් පී කේ පියරත්න මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (දකුණ 2)
ප්‍රාදේශීය කාර්යාලය (දකුණ 2)

**අයි එන් එස් ඒ නානායක්කාර මහතා**
ප්‍රාදේශීය කළමනාකරු (දකුණ 1)
ප්‍රාදේශීය කාර්යාලය (දකුණ 1)

**ඒ බී සී ආර් විජයපාල මහතා**
ප්‍රධාන කළමනාකරු
ණය පරිපාලන අංශය

**එම් වී ජී සුසිල් කුමාර මහතා**
ප්‍රධාන කළමනාකරු
ශාඛා කළමනාකරණ අංශය

**එම් ඩබ්ලිව් කේ සී ද සිල්වා මහතා**
ප්‍රධාන කළමනාකරු
ආයතනික මූල්‍ය අංශය

**ඩබ් ඊ සී පෙරේරා මිය**
ප්‍රධාන කළමනාකරු
අවදානම් කළමනාකරණ අංශය

**ජේ එල් පී මංජුල මහතා**
ප්‍රධාන කළමනාකරු
සැපයුම් අංශය

**කේ සී ත්‍යානන්දන් මිය**
ශාඛා කළමනාකරු
යාපනය ශාඛාව

**ඒ එම් ජී අලහකෝන් බණ්ඩා මහතා**
ශාඛා කළමනාකරු
ගම්පහ ශාඛාව

**එන් ඩී සී ඩී කුලරත්න මහතා**
ශාඛා කළමනාකරු
මීගමුව ශාඛාව

**කේ වී ඩබ් එස් දර්ශන මහතා**
ප්‍රධාන කළමනාකරු
උකස් හා මෙහෙයුම්

**එච් එම් ආර් පුෂ්පකුමාර මහතා**
ශාඛා කළමනාකරු
කුලියාපිටිය ශාඛාව

**ටී ඒ ඩී එන් අනුරුද්ධි මිය**
ශාඛා කළමනාකරු
ගාල්ල ශාඛාව

**ඊ ඒ ආර් අබේසිංහ මහතා**
ප්‍රධාන කළමනාකරු
NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි

**ජී ඒ ඩී ගොඩමුල්ල මිය**
ප්‍රධාන කළමනාකරු (සැලසුම්)
මුදල් හා සැලසුම් අංශය

**ඩබ් එම් එම් ආර් පී පෙරේරා මහතා**
ශාඛා කළමනාකරු
නගර ශාඛාව/ජාත්‍යන්තර බැංකු අංශය

**ආර් එම් සී කේ රාජපක්ෂ මහතා**
ප්‍රධාන කළමනාකරු
තැපැල් බැංකු පාලන අංශය

**ඒ ඩී ධර්මප්‍රිය මිය**
ප්‍රධාන කළමනාකරු (නීති)
මහනුවර ශාඛාව

**ඩබ් ඒ යූ නන්දන මහතා**
ප්‍රධාන කළමනාකරු
ණය අංශය

**ඒ බී විමලදාස මහතා**
ශාඛා කළමනාකරු
මහරගම ශාඛාව

**ඩී ජී එස් ජයතිස්ස මහතා**
ශාඛා කළමනාකරු
බදුල්ල ශාඛාව

**එච් එල් එස් විජේසිංහ මහතා**
ප්‍රධාන කළමනාකරු (මුදල්)
මුදල් හා සැලසුම් අංශය

**ඊ ඒ ඒ චන්දිම මහතා**
ප්‍රධාන කළමනාකරු (පරිශ්‍ර)
පරිශ්‍ර අංශය

**බී එම් එම් සී කේ බස්නායක මිය**
ප්‍රධාන කළමනාකරු
(තොරතුරු තාක්ෂණ)
තොරතුරු තාක්ෂණ අංශය

**යූ ජී මල්ලිකා මිය**
ප්‍රධාන කළමනාකරු (IT)
තොරතුරු තාක්ෂණ අංශය

**එස් තනීස්වරන් මහතා**
ශාඛා කළමනාකරු
වැල්ලවත්ත ශාඛාව

**බී ඒ පේමරත්න මහතා**
ප්‍රධාන කළමනාකරු
විගණන හා සුපරීක්ෂණ අංශය

**කේ එච් ඒ සුනිල් මහතා**
ශාඛා කළමනාකරු
මාතර ශාඛාව

**එම් ඩී ඒ පී ගුණතිලක මිය**
ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ/විද්‍යුත්
බැංකුකරණ ඒකකය

**කේ ජී රණසිංහ මිය**
ශාඛා කළමනාකරු
පානදුර ශාඛාව

**එච් පී ටී එස් ජයසූරිය මහතා**
ප්‍රධාන කළමනාකරු
ණය අයකර ගැනීම් අංශය

**අයි එස් ජයසූරිය මහතා**
ප්‍රධාන කළමනාකරු
ශාඛා කළමනාකරණ අංශය

**බී එල් ආර් මෙන්ඩිස්**
ප්‍රධාන කළමනාකරු (ආරක්ෂක)
ආරක්ෂක අංශය

## සභාපතිගේ පණිවිඩය



ආයතනික පාලනය තිරසාර සාර්ථකත්වයේ, ආයතනික ඔරොත්තු දීමේ හැකියාවේ සහ කොටස්කරුවන්ගේ විශ්වාසයේ මූලික අඩිතාලම බව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපි හඳුනා ගනිමු. පාලනය යනු හුදෙක් නියාමන අවශ්‍යතාවයක් නොව, මහජනතාවගේ ඉතිරිකිරීම්වල විශ්වාසදායක භාරකරුවෙකු සහ ආර්ථික සංවර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස බැංකුවට තම වරම ඉටු කිරීමට බලය ලබා දෙන උපායමාර්ගික සක්‍රියකාරකයක් බව සභාපතිවරයා වශයෙන් මම තරයේ විශ්වාස කරමි.

ඩිජිටල් නවෝත්පාදනයන්, පරිණාමය වෙමින් පවතින නියාමන අපේක්ෂාවන් සහ සමාජ-ආර්ථික සංකීර්ණතාවයන් මගින් මෙහෙයවනු ලබන වේගවත් පරිවර්තනයකින් අර්ථ දක්වා ඇති යුගයක, අපගේ ආයතනික පාලන පිළිවෙත් කඩිනම්, විනිවිද පෙනෙන සහ අනාගතය කේන්ද්‍ර කරගත් ඒවා ලෙස පැවතීම අත්‍යවශ්‍ය වේ. අපගේ කොටස්කරුවන්ගේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමේ පැහැදිලි අරමුණකින් අපි මෙහෙයවනු ලබන අතර, එය අවංකභාවය, වගවීම සහ විචක්ෂණශීලී බවින් යුතුව කිරීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අපි කැපවී සිටිමු.

අපගේ ආයතනික පාලන රාමුව අධ්‍යක්ෂක මණ්ඩල කාර්යක්ෂමතාව, සදාචාරාත්මක නායකත්වය, ශක්තිමත් අවදානම් අධීක්ෂණය සහ උපායමාර්ගික කොටස්කරුවන්ගේ සහභාගීත්වය යන ප්‍රධාන කුළුණු හතරක් මත පදනම් වී ඇත. 2024 වසර පුරාම, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික දිශානතිය හැඩගැස්වීම, අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ විශ්වාසනීයත්වයේ වගකීමේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සඳහා ගැඹුරින් සම්බන්ධ විය. අපගේ දිගුකාලීන දැක්ම සහ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ සමපාත වෙමින්, මූල්‍ය සහ මූල්‍ය නොවන සාධක යන දෙකම නිසි ලෙස සලකා බලා තීරණ ගන්නා බවට අපි සහතික කළෙමු.

බැංකුව, අධ්‍යක්ෂක මණ්ඩලය සහ කළමනාකාරිත්වය තුළ පැහැදිලි වගකීම් බෙදීමක් පවත්වා ගැනීම තුලින්, අර්ථාන්විතව අභියෝගවලට මුහුනදීම, විනිවිදභාවය සහ සාමූහික වගවීමේ සංස්කෘතියක් පෝෂණය කරයි. වඩාත් සංකීර්ණ මෙහෙයුම් පරිසරයක් තුල සාර්ථකව සිය මෙහෙවර ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය කුසලතා, ස්වාධීනත්වය සහ විවිධත්වයෙන් සුදුසු මිශ්‍රණයකින් යුතු බව අපි සහතික කර ඇත්තෙමු. ඊට අමතරව, අපගේ වාර්තාකරණයේ විනිවිදභාවය, අඛණ්ඩතාව සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තවදුරටත් ඉහළ නංවන, ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත SLFRS S1 සහ S2 යන තිරසාරභාවය පිළිබඳ හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අපි කටයුතු කරමින් සිටිමු.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව තුල ආයතනික පාලනය අපගේ සංස්කෘතිය තුළ අන්තර්ගත ව්‍යුහයන් සහ ප්‍රතිපත්තිවලින් ඔබ්බට විහිදේ. පැහැදිලි ආචාර ධර්ම, තොරතුරු හෙළිකිරීම සඳහා වන යාන්ත්‍රණය සහ උනන්දුව පිළිබඳ ගැටුම් හෝ විෂමාචාර සඳහා ශුන්‍ය ඉවසීමේ ක්‍රමවේදයක් මගින් සහාය දක්වන ගැඹුරු සදාචාරාත්මක වගකීමක් ශාඛා ජාලයේ සිට අධ්‍යක්ෂ මණ්ඩලය දක්වාම වර්ධනය කර ඇත්තෙමු. බැංකුවේ පාලන දර්ශනය, පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම ව්‍යාපාර උපාය මාර්ග සහ තීරණ ගැනීමේදී අඛණ්ඩව ඒකාබද්ධ කිරීම තුළින්ද පිළිබිඹු වේ.

මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව, පිටු අංක 394 සිට 418 දක්වා ඉදිරිපත් කර ඇති අනුකූලතා හෙළිදරව් කිරීම් පිළිබඳ ඇමුණුම් සමඟින්, අපගේ ආයතනික පාලන රාමුව ප්‍රායෝගිකව ව්‍යවහාරයේදී භාවිතාවන රීතින් වලට අපගේ අඛණ්ඩ අනුගත වීම නැවත තහවුරු කරයි. එය පාලනය, වගවීම සහ සදාචාරාත්මක නායකත්වයේ විශිෂ්ටත්වය සඳහා අපගේ නොසැලෙන කැපවීම පිළිබිඹු කරයි.

අනාගතය දෙස බලන විට මෙය අඛණ්ඩ වැඩිදියුණු කිරීම සඳහා අප ස්ථිරව කැපවී සිටිමු. අපගේ ජාතික අනන්‍යතාවය සහ වටිනාකම් මත පදනම් වෙමින් ගෝලීය හොඳම පරිචයන් උපයෝගී කරගනිමින් අපගේ ආයතනික පාලන රාමුව ඇගයීමට සහ වැඩිදියුණු කිරීමට අපි දිගටම කටයුතු කරන්නෙමු. අපගේ ජාතික අනන්‍යතාවය සහ වටිනාකම් මත පදනම් වෙමින් ගෝලීය හොඳම පරිචයන් උපයෝගී කරගනිමින් අපගේ ආයතනික පාලන රාමුව ඇගයීමට සහ වැඩිදියුණු කිරීමට අපි දිගටම කටයුතු කරන්නෙමු.

පාලන මූලධර්ම කෙරෙහි දක්වන නොසැලෙන කැපවීම වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට, කළමනාකාරිත්වයට සහ සියලුම සේවකයින්ට මගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක හැසිරීම යන වටිනාකම් ආරක්ෂා කිරීමෙන්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාවරත්වයේ කුළුණක්, යහපාලනයේ ආදර්ශයක් සහ වඩාත් ඔරොත්තු දෙන සහ සියල්ල ඇතුළත් අනාගතයක් කරා යන ශ්‍රී ලංකාවේ ගමනේ විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙස දිගටම කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.



**ආචාර්ය හර්ෂ කබ්රාල් ජනාධිපති නීතිඥ**
සභාපති

2025 මාර්තු 25
කොළඹ

## ප්‍රතිඵල පාදක කරගත් අපගේ පාලන ප්‍රවේශය

**තිරසාර වර්ධනය**

**ඒකාබද්ධ චින්තනය**

සය වැදැරුම් ප්‍රාග්ධන යෙදවුම් සහ ත්‍රිත්ව ව්‍යාපාර අරමුණු

ව්‍යාපාරික අරමුණු - උපාය මාර්ගය, අවදානම් හා අවස්ථා
නිමැවුම් හා ප්‍රතිඵල - කාර්ය සාධනය හා දැක්ම

| යෙදවුම් | ප්‍රමුඛ උපායමාර්ග | ප්‍රතිඵල |
|---|---|---|
| අන්තර් සම්බන්ධිත සය වැදැරුම් ප්‍රාග්ධන<br>FC, MC, HC, IC, SRC, NC | 1. ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව<br>2. ජෛන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය<br>3. සේවක සහභාගිත්වය වැඩි කිරීම<br>4. ඩිජිටල් පරිනාමනය වේගවත් කිරීම<br>5. අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම<br>6. තිරසාරභාවය | ව්‍යාපාරික ආකෘතියට වන බලපෑම<br>ප්‍රාග්ධන කාර්ය සාධනය<br>දැක්ම |

ව්‍යාපාර ආකෘතිය

| | | |
|---|---|---|
| බැංකුව, සමාජයෙහි අත්‍යවශ්‍ය කොටසක් ලෙස | පාර්ශ්වකරුවන්ගේ ඇතුළත්වීම | ආයතනික පුරවැසිභාවය |

**පාලන ප්‍රතිඵල**

ආචාර ධර්ම පදනම් වූ සංස්කෘතිය, තිරසාර කාර්යසාධනය, ඵලදායි පාලනය හා නෛතිකභාවය

රූපය 19

## තිරසාර වටිනාකම් නිර්මාණය සඳහා අපගේ පාලන දර්ශනය

බැංකුවේ දී, අවංකභාවය, වගවීම, විනිවිදභාවය, සහ තිරසාරභාවය යන චිරස්ථායී මූලධර්මවල අපගේ පාලන දර්ශනය ගැඹුරින් මුල් බැසගෙන ඇත. අපි යහපාලනය අනුකූලතා විධානයක් ලෙස පමණක් නොසලකන අතර, පාර්ශවකාර විශ්වාසය පෝෂණය කිරීම සහ තිරසාර දිගුකාලීන වටිනාකම ලබාදීම සඳහා තීරණාත්මකව අපගේ මෙහෙයුම් ගොඩ නගන පදනමක් ලෙස එය සලකනු ලැබේ.

අවංකභාවය සහ වගවීම අපගේ පාලන ව්‍යවහාරවල සාදාචාරාත්මක පදනම සකස් කරයි. චර්යාව පිළිබඳ ඉහළම ප්‍රමිති සඳහා අපගේ කැපවීම පිළිබඳ අපි විශ්වාස කරන අතර අපගේ කොටස්හිමියන්ගේ, සේවකයින්ගේ, ගනුදෙනුකරුවන්ගේ ප්‍රජාවගේ සහ පරිසරයේ සාමූහික හිමිකම් වෙත අවංක, සාධාරණ හා අව්‍යාජ බැඳීමක් මගින් තීරණ මෙහෙයවන බව සහතික කරමු.

විනිවිදභාවය අපගේ සදාචාරාත්මක මූලධර්මවල අත්‍යවශ්‍ය කොටසකි. කාලීන, විවෘත සන්නිවේදනය හා අර්ථවත් අනාවරණ විශ්වාසය පෝෂණය කිරීමේ දී අත්‍යවශ්‍ය බවත්, එය සම්බන්ධතා වර්ධනය කරමින් ආයතනය තුළ විවෘත සංස්කෘතියත් පෝෂණය කරන බවත් අපි විශ්වාස කරමු.

තිරසාරභාවය යනු නොවැදගත් ප්‍රතිඡ්ඨාවක් නොවන අතර අපගේ පාලන ප්‍රවේශයේ කේන්ද්‍රයේ නියමු බලවේගය වේ. එය පාරිසරික බලපෑම අඩුකිරීමට, සමාජීය සමානතාව වර්ධනය කිරීමට සහ අප සේවය කරන ප්‍රජාවන්ට කල්පවත්නා ධනාත්මක දායකත්වයක් සිදු කිරීමට අපගේ කැපවීම ඉන් දැනුම් දෙන අතර වර්තමාන කටයුතු වඩාත් ඔරොත්තුදෙන සහ අන්තර්ගත අනාගතයක් සඳහා මග පෙන්වන බව සහතික කරයි.

මෙවැනි වටිනාකම් අපගේ පාලන ව්‍යවහාරවල සෑම අංගයකටම එකතු කරමින්, අපි නියාමන බැඳීම් ඉටු කිරීමට උත්සාහ කරන අතරම බැංකු ක්ෂේත්‍රය තුළ ප්‍රතිපත්තිගරුක අනාගතය දකින පාලනය සඳහා මිණුම්ලකුණක් නියම කිරීම ඉක්මවා යන්නෙමු.

## අප පාලනය කරන ආකාරය

**(ප්‍රතිපත්තිය ඈ. 6, ඈ 7.1)**

බැංකුවේ දී, පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති කරා අපගේ නොසැලෙන බැඳීම, සදාචාර විශිෂ්ටත්වය, පුද්ගල හා ආයතනික අවංකභාවය තුළ මුල් බැසගත් සංස්කෘතියක් පෝෂණය කරන අපගේ උත්සාහයන්හී පිළිබිඹු කරයි. වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස, අපි අදාළ නියාමනය විධානයන්, මනා පරිච පිළිබඳ ස්වේච්ඡා සංග්‍රහ සහ අපටම අයත් අභ්‍යන්තර ව්‍යවස්ථාපිත පාලන රාමු අපි උනන්දුවෙන් පිළිපදින්නෙමු.

තිරසාර වටිනාකම් නිර්මාණය පෝෂණය කිරීම හා පාර්ශවකාර විශ්වාසය සවිබල ගැන්වීම සඳහා ශක්තිමත් ආයතන පාලනය අත්‍යවශ්‍ය බව අපි හඳුනා ගනිමු. විනිවිදභාවය, වගවීම සහ සදාචාර තීරණ ගැනීම පිළිබඳ මූලධර්ම මත පදනම් වී, අපගේ පාලන රාමුව වෙනස්වන නියාමන හා මෙහෙයුම් වාතාවරණයට ඔරොත්තු දීමට හා ප්‍රතිචාරාත්මකවීමට සැලසුම් කෙරේ.

මෙම කැපවීම සමඟ පෙළ ගැසෙමින්, අපගේ පාලන ව්‍යුහය පහත රාමු මගින් නියම කළ අනාවරණ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

### නියාමන රාමුව

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරන බැංකුකරණ පනත සහ එහි සංශෝධන
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති සියළු නියාමන, විශේෂයෙන් ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනත් නියෝගය සහ එයට මහ බැංකුව විසින් පසුකාලීනව නිකුත්කළ සංශෝධන, මේවා 2025 ජනවාරි 1 දින සිට අවලංගු කරන ලදි. (වැඩිදුර අනාවරණ සඳහා පිටු අංක 394 සිට 412)
- බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති වෙනත් අනාවරණ අවශ්‍යතාවන්ට අනුකූලතාව (වැඩිදුර අනාවරණ සඳහා පිටු අංක 419 සිට 425)
- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන
- 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල පනත සහ එහි සංශෝධන
- 2022 අංක 09 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධව බැංකුවල අධ්‍යක්ෂවරුන් උදෙසා වන මාර්ගෝපදේශය

### බැංකුවට අදාල ස්වේච්ඡා නීති සංග්‍රහ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහ පරිච සංග්‍රහය 2023 (වැඩිදුර අනාවරණ සඳහා පිටු අංක 413 සිට 418)

### අභ්‍යන්තර උපාංග

- අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විෂය ක්ෂේත්‍රය
- සේවක ආචාර ධර්ම පද්ධතිය
- අධ්‍යක්ෂ මණ්ඩල ආචාර ධර්ම පද්ධතිය
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති හා මෙහෙයුම් ක්‍රියාපටිපාටි

## ස්වාධීන සහතික කිරීම තුළින් පාලනයේ අඛණ්ඩතාව සහතික කිරීම

බැංකුවේ බාහිර විගණක ලෙස සේවය කරන විගණකාධිපති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනත් නියෝගයට අනුකූලව තත්ත්ව සහතිකය නිකුත් කර ඇත.

## පාලන ව්‍යුහය

GRI 2-9, 13

බැංකුවේ දී, කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වටිනාකම නිර්මාණය කර දරා ගැනීමට බැංකුව සතු හැකියාව ශක්තිමත් කිරීමට අපගේ පාලන ව්‍යුහය සාකල්‍ය ලෙස ඉතා පරික්ෂා සහිතව නිර්මාණය කර ඇත. පැහැදිලි වාස්තු විද්‍යාත්මක රාමුවකින් පදනම් වූ සහ ක්‍රියාපටිපාටිමය ශක්තියකින් මෙහෙයවන, එය ඵලදායී නායකත්වය, විස්තීර්ණ අධීක්ෂණය හා මෙහෙයුම් විශිෂ්ටත්වය සවිබල ගන්වයි.

මෙම රාමුවේ හරය වන්නේ බැංකුවේ උපායමාර්ගික දිශාව මෙහෙයවන සහ යහ පාලනය සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් තුළින් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සහතික කරන අධ්‍යක්ෂ මණ්ඩලයයි.

බැංකුවේ එදිනෙදා මෙහෙයම් ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී වෙත පවරනු ලබන අතර, ඔහු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරිත්වය සහ එහි කමිටු මෙහෙයවනු ලැබේ. සෑම උපායමාර්ගික ව්‍යාපාරික ඒකකයක්ම පැහැදිලි නිශ්චිත අවදානම් සීමා තුළ ක්‍රියාත්මක වන අතර, මෙහෙයුම් තීරණ බැංකුවේ වඩාත් පුළුල් දැක්ම සහ දිගුකාලීන පරමාර්ථ සමඟ සම්පූර්ණයෙන්ම පෙළ ගැසෙන බව සහතික කරයි.

## ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පාලන ව්‍යුහය




- පත්කිරීම් ප්‍රවාහය
- වගකීම් ප්‍රවාහය
- පරිපාලන ප්‍රවාහය සංවාද
- සංවාද

| | |
|---|---|
| CMC | ආයතනික කළමනාකරණ කමිටුව |
| ALCO | වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව |
| CC | ණය කමිටුව |
| IC | ආයෝජන කමිටුව |
| EC | හිමිකම් කමිටුව |
| TNIC | ටෙන්ඩර් සහ නව ආයෝජන කමිටුව |
| PRC | කාර්යසාධන සමාලෝචන කමිටුව |
| BOSC | ශාඛා මෙහෙයුම් නියාමන කමිටුව |
| IT SC | තොරතුරු තාක්‍ෂණ නියාමන කමිටුව |
| MKTC | අලෙවිකරණ කමිටුව |
| ORMC | මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව |
| PDC | නිමැවුම් ප්‍රවර්ධන කමිටුව |
| HRC | මානව සම්පත් කමිටුව |
| CPC Major | ආයතනික ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ) |
| CPC Minor | ආයතනික ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ) |
| EPC | විධායක ප්‍රසම්පාදන කමිටුව |
| CSC | ආයතනික තිරසාර කමිටුව |
| ISC | තොරතුරු තාක්‍ෂණ ආරක්‍ෂණ කමිටුව |
| RCPSC | ආපසු අයකර ගැනීමේ සැලැස්මේ මෙහෙයුම් කමිටුව |

රූපය 20

## අධ්‍යක්ෂ මණ්ඩලය

**(ප්‍රතිපත්තිය A. 1, A. 1.5, A. 4 සහ A. 10)**

ඉහළම පාලන ආයතනය ලෙස, අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් බැංකුවේ උපායමාර්ගික දිශානතිය නිශ්චය කිරීම, එහි සංස්කෘතිය හා වටිනාකම් හැඩගැස්වීම සහ සදාචාර හැසිරීම පිළිබඳ ඉහළම ප්‍රමිති නගා සිටුවීම තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය යහපත් අවදානම් කළමනාකරණය, මූල්‍ය අධීක්ෂණය සහ අනුප්‍රාප්තික සැලසුම් සහතික කිරීම සඳහා අවසාන වගකීම දරන අතර, ආයතනය අතර ව්‍යවසායකත්ව නායකත්ව සංස්කෘතියක් පෝෂණය කරයි.

විවිධ දෘෂ්ටිකෝණ එකම ස්ථානයකට ගෙනඑමින්, තිරසාර වටිනාකම නිර්මාණය ඇති කරන ආයතනික කළමනාකාරිත්වය සාධනීය ලෙස අභියෝගයට ලක් කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය සාකච්ඡාව සහ තීරණ ගැනීමේ තත්ත්වය වැඩි කරයි. අධ්‍යක්ෂවරුන් අතර පැහැදිලි රාජකාරි බෙදීමක් තුලනාත්මක පාලනය සුරක්ෂිත කරන අතර, තනි පුද්ගල සාමාජිකයෙකුගේ අනිසි බලපෑම වලක්වනු ලබයි.

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ හා එහි සංශෝධනවල විධිවිධාන යටතේ ස්ථාපිත, අධ්‍යක්ෂ මණ්ඩලයේ බලය හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි සම්පූර්ණයෙන් විස්තර කෙරේ. එය බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය, මූල්‍ය ස්ථාවරත්වය සහ අභ්‍යන්තර පාලන පරිසරයේ ශක්තිය සඳහා ආයතනික කළමනාකාරිත්වය වගකියන බව සහතික කරයි.

විවෘත හා විනිවිද සංස්කෘතියක් මගින් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය අතර සම්බන්ධතාව විස්තර කරන අතර, සියලුම වැදගත් කරුණු සම්බන්ධයෙන් කාලීන හා අවංක සන්නිවේදනය සහතික කරයි. මෙම ඉදිරියට යන හා ගෞරවනීය අදහස් හුවමාරුව පාලනයේ තත්ත්වය වැඩිකර, වගකීම ශක්තිමත් කර, ඵලදායී හා මනාව දැනුවත් තීරණ ගැනීමට සහය වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් හා වගකීම්

**(ප්‍රතිපත්තිය A. 1.2 සිට 1.7)**

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළම පාලන ආයතනය ලෙස සේවය කරයි. එය උපායමාර්ගික නායකත්වය ලබාදීම, අධීක්ෂණය පවත්වා ගැනීම සහ දිගුකාලීන වටිනාකම නිර්මාණය සඳහා වගකීමට බැඳී සිටින අතර, පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් නගා සිටුවයි. එහි ප්‍රධාන වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ:

- **උපායමාර්ගික නායකත්වය හා සම්පත් වෙන් කිරීම:** බැංකුවේ දැක්ම, මෙහෙවර හා උපායමාර්ගික දිශානතිය සකස් කිරීමේ වගකීම හා ජාතික සංවර්ධන පරමාර්ථ සමඟ උපායමාර්ගික ප්‍රමුඛතා පෙළගැසීම අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. බැංකුවේ දිගුකාලීන අරමුණුවලට සහයවීමට හා තරඟකාරී වාසිය පවත්වා ගැනීමට මූල්‍ය, මානව, සහ තාක්ෂණික සම්පත් ඵලදායී ආකාරයෙන් වෙන්කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.
- **අවදානම් කළමනාකරණය හා මූල්‍ය අධීක්ෂණය:** අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අවදානම් රුචිය තීරණය කරන අතර සිය අවදානම් කළමනාකරණ රාමුවේ ඵලදායිත්වය සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය කාර්යසාධනය නියාමනය කර, අයවැය හා ප්‍රාග්ධන සැලසුම් අනුමත කර අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව සහතික කරයි.
- **පාලනය, අනුකූලතාව, සහ අභ්‍යන්තර පාලනය:** අධ්‍යක්ෂ මණ්ඩලය ශක්තිමත් අභ්‍යන්තර පාලනයන්, ශක්තිමත් අනුකූලතා යාන්ත්‍රණ, සහ සාදාචාර නායකත්වය තුළින් ඉහළම ආයතනික පාලන ප්‍රමිති පිළි ගනී. විනිවිදභාවය, වගවීම සමඟ සහ ව්‍යවස්ථාපිත හා නියාමන බැඳීම්වලට අනුකූලව තීරණ ගන්නා බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.
- **නායකත්වය, පත්කිරීම්, ඇගයීම, සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය:** සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් පත්කිරීම, ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම, සහ බැංකුවේ උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා ඔවුන් මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. එමෙන්ම, නායකත්ව අඛණ්ඩතාව සහ ආයතනයේ ඔරොත්තුදීමට සහයවීම සඳහා අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවට නංවා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.
- **පාර්ශවකාර සහභාගිත්වය හා පාලනයේ ඵලදායිතාවය:** විවෘත සන්නිවේදනය ප්‍රවර්ධනය හා විශ්වාසය සහ ලැදියාව පවත්වා ගැනීමට ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සහභාගිත්වය මින් අදහස් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනස්වන වාතාවරණයන්ට පාලන ව්‍යුහයන් ඵලදායිව, අදාළව හා ප්‍රතිචාරාත්මකව පවතින බව සහතික කිරීමට අඛණ්ඩවම එයට අයත් කාර්යසාධනය සහ සිය කමිටුවල ඇගයීමට ලක් කරනු ලබයි.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන හා එහි සංශෝධනවලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතකින් සමන්විත වන අතර, ඒ සෑම කෙනෙක්ම තමන්ට අදාළ ක්ෂේත්‍රයෙහි ප්‍රවීන වෘත්තිකයින් වේ. මෙම සංයුතිය තුළින් දැනුම් සම්භාරයක් හා සියලුම සාකච්ඡාවන්වලදී ස්වාධීන විනිශ්චයන් සහතික කරයි. සභාපති අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම සඳහා සමස්ත වගකීම දරන අතර සිය අධීක්ෂණ කාර්යයන් මුදා හැරීමේදී එහි ඵලදායිත්වය සහතික කරයි.

2024 දෙසැම්බර් 31 දිනට, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු පහකින් සමන්විත වූ අතර, සෑම අධ්‍යක්ෂවරයෙක්ම අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා සඳහා සැලකියයුතු ප්‍රවීනතාව ගෙන එනු ලබයි. මෙයින්, තිදෙනෙක් ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂවරුන් වන අතර, ඉතිරි දෙදෙනා ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති. සුදුසුකම් සහ ප්‍රවීනතා ක්ෂේත්‍රය ඇතුළුව විස්තර පැතිකඩ 160 සිට 162 දක්වා පිටුවල දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සම්බන්ධ තොරතුරු 175 පිටුවේ දැක්වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල නිපුණත්වය හා ප්‍රවීණතාව පිළිබඳ විවිධත්වය

**(ප්‍රතිපත්තිය A 10.1)**

බැංකුවේ දී, මනාව සමබර හා ඉහළ කුසලතාවයකින් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් ශක්තිමත් පාලනයක් සහ උපායමාර්ගික වටිනාකම් නිර්මාණයක් සඳහා මූලික වන බව අපි හඳුනා ගනිමු. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමූහික ප්‍රවීනතාව, තාක්ෂණික දැනුම, ක්ෂේත්‍රයේ තීක්ෂ්ණ බුද්ධිය, නායකත්ව අත්දැකීම් සහ විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් පොහොසත් සම්මිශ්‍රණයක් ඇතුළත් වන අතර, එමඟින් බැංකුව සංකීර්ණත්වයන් හඹායාමට සහ නැගී එන අවස්ථාවන් විශ්වාසයෙන් ග්‍රහනය කර ගැනීමට හැකියාව ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතියෙන් වෘත්තීමය පසුබිම්, දක්ෂතාවයන් සහ කාලසීමාවන් පිළිබඳ ප්‍රශස්ත මුසුවක් සහතික කිරීමේ පරීක්ෂාකාරී උත්සාහයක් පිළිබිඹු කරයි. අධ්‍යක්ෂවරු බැංකුකරණය, මූල්‍ය, ආර්ථික විද්‍යාව, නීතිය, උපායමාර්ගික සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, සයිබර් ආරක්ෂාව, ජාත්‍යන්තර සම්බන්ධතා සහ පොදු ප්‍රතිපත්ති ඇතුළුව විවිධ පරාශයක ගැඹුරු දැනුමක් ලබා දේ.

# ආයතනික පාලනය



මෙම පුළුල් දැනුම ශක්තිමත් අධීක්ෂණය ලබාදීමට, උපකල්පනයන්ට හිතකරව අභියෝග කිරීමට සහ අන්තර්ඥානය සහ පූර්ව දර්ශනය සමඟ බැංකුවේ උපායමාර්ගික වැඩසටහන මෙහෙයවීමට අධ්‍යක්ෂ මණ්ඩලය සවිබල ගන්වයි. පාලනයේ ඉහළම ප්‍රමිති නගා සිටුවීම, යහපත් විනිශ්චයන් පෙන්වාදීම, හා සදාචාර නායකත්වය හා වගවීමේ සංස්කෘතියක් පෝෂණය කිරීමට අවශ්‍ය ජාත්‍යන්තර තික්ෂණභාවය අත් කර ගැනීම අධ්‍යක්ෂවරුන්ගෙන් අපේක්ෂා කෙරේ.

විවිධත්වය සහ බහුවිනය යන දෙකම අයත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පවත්වා ගැනීම මගින්, බැංකුව නියාමන ඉල්ලීම්, ක්ෂේත්‍රයේ විතැන්වීම්, පාර්ශවකාර අපේක්ෂාවන් සහ දිගු කාලීන උපායමාර්ගික විධානයන්ට ප්‍රතිචාර දැක්වීමට මනාව ස්ථානගත වී ඇති බව සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සුදුසුකම්, කුසලතා, අනෙකුත් වැදගත් තනතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය ඇතුළු තොරතුරු පිටු අංක 160 සිට 162 දක්වා වන පිටුවල ඇතුළත් වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාවලිය

**(ප්‍රතිපත්තිය A 1.3, A. 1.4, A. 1.6, A. 1.7, A. 3.1 සහ A. 6)**

ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුකූලව, ස්ථාපිත වාර්ෂික රැස්වීම් දින දර්ශනයක් මගින් මෙහෙයවන අවම වශයෙන් සති හයකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවනු ලැබේ.

උපලේඛණගත සැසි අතර ඇතිවන කාල සංවේදී කරුණු හෝ උපායමාර්ගික ප්‍රමුඛතා විසඳීමට අවශ්‍ය පරිදි අමතර රැස්වීම් පවත්වනු ලැබේ. අධ්‍යක්ෂවරු සාකච්ඡාවන් තුළ සිය නිරන්තර පැමිණීම හා සක්‍රියව දැනුවත් දායකත්වය තුළින් ශක්තිමත් සහභාගිත්වය අනුරූපව පෙන්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීම පිළිබඳ විස්තර පිටු අංක 175 හි දැක්වේ.

අධ්‍යක්ෂවරුන් යහපත් හා මනාව දැනුවත් තීරණ ගැනීමට හැකියාව ඇතිකරන කාලීන, නිවැරදි, සහ අදාළ තොරතුරුවලින් සන්නද්ධ බව සහතික කිරීමට බැංකුව සතුව විස්තීර්ණ හා මනාව ව්‍යුහගත වැඩසටහන් සකසන ක්‍රියාවලියක් ඇත. මෙම ක්‍රියාවලිය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සමඟ සහයෝගයෙන් සභාපතිවරයා විසින් මෙහෙයවනු ලබන අතර, උපායමාර්ගික මුලපිරීම්, තීරණාත්මක ව්‍යාපාර කරුණු හා අධීක්ෂණ වගකීම් සාකච්ඡා කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කර ඇති බව සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සමහර අයිතම සාකච්ඡාව සහ තීරණ ගැනීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ඉල්ලා සිටිය හැකිය.

විවෘත සාකච්ඡා, හිතකර අභියෝග කිරීම් සහ සහයෝගී තීරණ ගැනීම් සහිත පරිසරයක් පෝෂණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පරිස්සමින් සැලසුම් කරනු ලබයි. සලකා බැලීම සඳහා න්‍යාය පත්‍ර අයිතම යෝජනා කිරීමට අධ්‍යක්ෂවරු දිරිගන්වනු ලබන අතර, ඒ තුළින් අන්තර්ගත සහ හුවමාරු වගවීම පිළිබඳ සංස්කෘතියක් ශක්තිමත් කෙරේ. පුළුල් සහය පත්‍රිකා මගින් සමන්විත රැස්වීම් න්‍යාය පත්‍ර රැස්වීමට සතියකට පෙර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර විද්‍යුත් මාධ්‍යයෙන් බෙදා හරිනු ලබන අතර, ඉන් සමාලෝචනය හා සූදානම්වීම සඳහා ප්‍රමාණවත් කාලය අධ්‍යක්ෂවරුන්ට ලබා දේ.

විශේෂ අවස්ථාවලදී, තීරණාත්මක සංවර්ධනයන්ට කාලීන ප්‍රතිචාර සඳහා පහසුකම් සැලසීමට කෙටි දැනුම්දීමකින් හදිසි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරනු ලැබේ, නැත්නම් රැස්වීම් අතරතුර සභාගත කිරීම සිදු කෙරේ. සියලුම සාකච්ඡාවන් හා තීරණ විස්තරාත්මක වාර්තාවල ඇතුළත් කරන අතර එය ආරක්ෂිතව පවත්වා ගෙන යමින් අධ්‍යක්ෂවරුන්ට පහසුවෙන් පිවිසීමේ හැකියාව ඇති කරයි, ඒ තුළින් විනිවිදභාවය අඛණ්ඩතාව සහ ආයතනික මතකයට සහය වේ.

## බැඳියා පිළිගැටුම

**(ප්‍රතිපත්තිය A. 5.5, සහ A 10.1)**

GRI 2-15

ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා 2007 අංක 12 දරණ (සංශෝධිත) ආයතනික පාලන නියෝගය මගින් පුද්ගලික ලාභය හෝ වෙනත් අයට අවිධිමත් ලාභය සඳහා සිය තනතුර හෝ රහසිගත තොරතුරු අවභාවිතය පැහැදිලිව වලක්වමින් අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසවන්තභාවය පිළිබඳ වගකීම් ස්ථාපිත කරයි.

විශේෂිත ව්‍යාපාරික කරුණු සම්බන්ධයෙන් සැබෑ හෝ වියහැකි බැඳියා පිළිගැටුමක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් වහාම අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කළ යුතුය. යම් අධ්‍යක්ෂවරයෙකුට යම් කාරණයක් සම්බන්ධයෙන් පෞද්ගලික හෝ ව්‍යාපාරික අභිලාෂයක් ඇත්නම්, අදාළ අධ්‍යක්ෂවරයා ඊට අදාළ සාකච්ඡාවට සහභාගී වීමෙන් හෝ තීරණ ගැනීමෙන් වැළකී සිටිය යුතුය. එම කරුණ පිළිබඳ සාකච්ඡාවන් හෝ තීරණ යන අතරතුර රැස්වීමෙන් ඉවත්වීම හා මෙය සම්බන්ධ වේ.

න්‍යාය පත්‍රයේ ඇතුළත් වන සහ ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් රැස්වීම් වාර්තාවට ඇතුළත් කරන ලද කිසියම් කරුණක් සම්බන්ධයෙන් කිසියම් බැඳියා පිළිගැටුමක් ඇත්නම් ඒ බව ප්‍රකාශ

**විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ධූර කාලය**

**2** වසර 2ට අඩු විධායක නොවන අධ්‍යක්ෂවරු

**3** වසර 2 - 4 විධායක නොවන අධ්‍යක්ෂවරු



**කුසලතා වල විවිධත්වය** GRI 405-1 ප්‍රස්ථාරය 42

| | |
|---|---|
| නායකත්වය | 100% |
| මූල්‍ය සේවා | 100% |
| මූල්‍ය විචක්ෂණභාවය | 60% |
| ආයතනික සැලසුම්කරණය හා උපායමාර්ගය | 100% |
| පාලනය හා අවදානම් කළමනාකරණය | 100% |
| ඩිජිටල් හා තාක්ෂණය | 20% |
| පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය | 100% |
| ජනතාව සහ සංස්කෘතිය | 100% |

කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා සම්මත න්‍යාය පත්‍ර අයිතමයක් ඇතුළත් කර ඇත. වර්ෂය තුළ බැඳියාවන් තුළ යම් වෙනස්වීම ඒ වෙනුවෙන් සංශෝධිත හිමිකම් ප්‍රකාශයක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

බැංකුව හා එහි සම්බන්ධිත පාර්ශව අතර සිදුවන ගනුදෙනු විනිවිදභාවය පිළිබඳ ප්‍රතිපත්ති මත පදනම්ව ඇති බවත් එවැනි සම්බන්ධිත පාර්ශ්ව අතර සිදුවන ගනුදෙනු වලදී බැඳියා පිළිගැටුම වැළැක්වෙන බව හා අවශ්‍ය මග පෙන්වීම සැපයෙන බව සහතික වනු පිණිස බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආශ්‍රිත පාර්ශව අතර ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කරනු ලැබ ඇත. අධ්‍යක්ෂවරුන් වෙත සපයන ලද ඕනෑම බැංකුකරණ පහසුකමක් මහ බැංකුව විසින් සිදු කරන ලද බලය පැවරීම හා අනුකූල වේ. 2024 වර්ෂය තුළ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් අංක 49.5.2 හි දක්වා ඇති පරිදි හැර බැංකුව හෝ එහි පරිපාලිත සමාගම් විසින් අත්සන් තබන ලද කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් කිසිවෙකුට සැලකිය යුතු අභිලාෂයක් නොමැත.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

### (ප්‍රතිපත්තිය A. 1.1 සහ A. 10.1)

2024 වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13 ක් පෙර සැලසුම් කරන ලද පරිදි පැවැත් වූ අතර, එම රැස්වීම් වලට අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පිළිබඳ විස්තර වගුව 30 හි දැක්වේ, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව අවම වශයෙන් සෑම සති 6කට වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වෙන අතර, විශේෂ රැස්වීම් අවශ්‍යතාව අනුව පවත්වනු ලැබේ. ඉන්ධන අර්බුදය හා නැගී එන ව්‍යාපාරික ප්‍රමුඛතා ආදියෙන් පසු මාර්ගගත රැස්වීම්වලට මාරුවීම වැනි වෙනස්වන වාතාවරණයන්ට ප්‍රතිචාර දැක්වීමට අනුවර්තනය හා නම්‍යශීලී වීමේ අවශ්‍යතාව බැංකුව හඳුනා ගන්නා අතර, බැංකුවේ ප්‍රධාන ගැටළු අඛණ්ඩව නියාමනය හා අධීක්ෂණය සහ බැංකුවට වියහැකි අවදානම් කළමනාකරණය කර ගැනීම සහතික කරයි.

තිරසාර වටිනාකම් නිර්මාණය හඹා යාමේදී, සුවිශේෂී කාලය කැපකරමින් බැංකුවේ උපායමාර්ගික දිශානතිය මෙහෙයවීමේදී සහ 2025 සිට 2027 දක්වා කාලසීමාව සඳහා බැංකුවේ තෙවර්ෂ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම සඳහා ආයතනික කළමනාකාරිත්වයට අවශ්‍ය මගපෙන්වීම ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. බැංකුවේ දිගු කාලීන දැක්ම හා උපායමාර්ගික ප්‍රමුඛතාවන් පිළිබිඹු කරන මෙම සැලැස්ම දැඩි ඇගයීමකට ලක් කළ අතර ඉන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතිය ලබාගෙන ඇත.

වසර පුරාම, අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම ඵලදායිව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය තුළ සක්‍රියව සහභාගි වී ඇත.

එය කාර්යසාධන ප්‍රතිඵල සම්පව නියාමනය කර, නිශ්චිත සන්ධිස්ථානවලට අනුව ප්‍රගතිය තක්සේරු කිරීම සහ උපායමාර්ගික යෙදවුම් ලබා දී ඇති අතර ඒ තුළ මතුවන අභියෝග හා අවස්ථාවලට ප්‍රතිචාර දැක්විමට නැවත ක්‍රමාංකණය අවශ්‍ය වේ.

බැංකුවේ ද්‍රවශීලතාවය හා ප්‍රාග්ධනය ඵලදායිව කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් අවධාරණය කරන ලදී. බැංකුවේ උපායමාර්ගික පරමාර්ථ අනුව එහි කාර්යසාධනය ඇගයීම, ප්‍රගතිය සමාලෝචනය කිරීමට ප්‍රමාණවත් කාලය වෙන් කිරීම සහ වඩාත් පරීක්ෂාව අවශ්‍ය විශේෂ පරීක්ෂණ අවශ්‍ය ක්ෂේත්‍ර කෙරෙහි මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලින් අවධානය යොමු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ණයවල තත්ත්වය, උවදුරට පත්වන ක්ෂේත්‍රයන් හී අවදානම් නිරාවරණය දැඩිව හඹායාම, හානිකරණ ව්‍යහාරවල ඵලදායිත්වය ත්කසේරු කිරීම, අවදානම් පැතිකඩ නියාමනය සහ ගැටළුසහගත ණය කළමනාකරණය පිළිබඳ සිය අධීක්ෂණය තියුණු කර ඇත.

සාකච්ඡාවන් අවදානම් කළමනාකරණය, අනුකූලතාව හා පාලනය දක්වා පුළුල් වූ අතර ඒ තුළ අධ්‍යක්ෂ මණ්ඩලය යහපත් අධීක්ෂණය, සදාචාර චර්යාව, සහ නියාමන පිළිපැදීම සඳහා සිය කැපවීම තවදුරටත් නගා සිටුවන ලදී. මෙවැනි සාමූහික උත්සාහයන් බැංකුවේ මෙහෙයුම් ඔරොත්තු දීම, උපායමාර්ගික පෙළ ගැසීම සහ පාර්ශවකාර විශ්වාසය ශක්තිමත් කිරිමේ දී අත්‍යවශ්‍ය විය.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වල සංයුතිය සහ පැමිණීම**

| අධ්‍යක්ෂවරයාගේ නම | පත්වූ දිනය | වයස | අධ්‍යක්ෂ තත්ත්වය | සහභාගී වූ/සහභාගී වීමට සුදුසුකම් ඇති | | | | | | | අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි කාලසීමාව (අවු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික කමිටුව | හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව | |
| ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් සභාපති | 2023 මැයි 2 | 63 | NED/ID | 13/13 | – | – | – | – | – | 6/6 | 1+ |
| ජුඩ් නිලුක්ෂාන් මයා නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ | 2022 පෙබරවාරි 28 | 54 | NED/NID | 12/13 | 8/9 | 8/9 | 11/11 | 7/8 | 1/3 | 6/6 | 3+ |
| එස් ආර් ඩබ්ලිව් එම් රුවන් සත්කුමාර මයා නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ | 2023 මාර්තු 27 | 54 | NED/ID | 13/13 | – | 9/9 | 11/11 | 7/8 | 6/6 | – | 2+ |
| දුෂ්‍යන්ත බස්නායක මහතා අධ්‍යක්ෂ | 2023 මාර්තු 31 | 60 | NED/NID | 13/13 | 8/9 | – | 11/11 | – | 6/6 | 6/6 | 2+ |
| අශේන් ජයසේකර මයා අධ්‍යක්ෂ | 2024 ජනවාරි 09 | 45 | NED/ID | 12/13 | 8/8 | 7/7 | – | 8/8 | 6/6 | – | 1+ |

NED - විධායක නොවන අධ්‍යක්ෂ   NID - ස්වාධීන නොවන අධ්‍යක්ෂ   ID - ස්වාධීන අධ්‍යක්ෂ

වගුව 30

# ආයතනික පාලනය



## අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

**(ප්‍රතිපත්තිය A. 7.1 සිට A. 7.3, A. 7.5 සහ/හෝ, A. 7.6, B2, D.3 - D.5)**

ස්වාධීන විනිශ්චයක් පෝෂණය කිරීම, නිසි බලතුලනයක් පවත්වා ගැනීම සහ රාජකාරි ඵලදායීව ඉටු කිරීම සඳහා බලතල බෙදා හැරීම උපකාර වන බව සහතික කරමින් සුදුසු යැයි හැඟෙන පරිදි කමිටු වෙත සිය බලතල, අභිමතයන් සහ අධිකාරිය පැවරීමට සිය ප්‍රඥප්තිය තුළ දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත. මෙම බෙදාහැරීම තුළින් උපායමාර්ගික, ඉදිරිය දකින මුලපිරීම්වලට වඩාත් කාලය කැප කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉඩ දේ. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුව සිය කාර්යභාරයන්, වගකීම් හා අභිමත මට්ටම් නිරූපනය කරන නිශ්චිත යොමු නිර්දේශ තුළ ක්‍රියාත්මක වේ. සමහර බලතල පැවරීම හමුවේ වුවත්, අනු කමිටු වල තීරණ පිළිබඳව අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය, දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව යන අනිවාර්යය කමිටු සතර 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ අවශ්‍යතාවක් අනුව ස්ථාපිත කර ඇති අතර, 2023 අංක 01 දරන බැංකු පනත් නියෝග යට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල හදිසි නොවන අත්‍යාවශ්‍ය නොවන වියදම් කමිටුව ස්ථාපිත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණික උපායමාර්ගික කමිටුව ස්වේච්ඡා කමිටුවක් ලෙස සකස් කරන ලදී. මෙම කමිටු ඒවායේ සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සියළුම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවලද ලේකම් ලෙස කටයුතු කරන අතර කමිටු රැස්වීම්ල වාර්තා තොරතුරු දැන ගැනීම, සමාලෝචනය, අදහස් දැක්වීම සහ අවශ්‍ය අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. යොමු නිර්දේශ, සංයුතිය, කාර්යභාරය හා වගකීම්, පැමිණීම, 2024 සිදුකළ කටයුතු සහ එක් එක් කමිටුවේ 2025 සහ ඉන් ඉදිරියට අවධානය තමන්ට අදාළ කමිටු වාර්තාවේ දැක්වෙන අතර, එම තොරතුරු පිටු අංක 184 සිට 194 දක්වා ඇත.

**කළමනාකරණ කමිටු**

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වලට අමතරව, අනුමත කරන ලද යොමු නිර්දෙශ පරිදි බැංකුව විසින් කළමනාකරණ කමිටු කිහිපයක් ස්ථාපිත කර ඇත. අදාළ යොමු කිරීමේ නිර්දේශ ප්‍රකාරව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ආයතනික ප්‍රසම්පාදන කමිටුව සහ විධායක ප්‍රසම්පාදන කමිටුව හැර සියලුම කළමනාකරණ කමිටුවල සභාපති ලෙස සේවය කරයි. මෙම කමිටු පහත වගුවේ දක්වා ඇති පරිදි බැංකුවේ මෙහෙයුම්වලට අත්‍යවශ්‍ය තීරණාත්මක කරුණු සාකච්ඡා කිරීමට කැඳවනු ලැබේ.

| කළමනාකරණ කමිටුව | අරමුණ හා වගකීම් | සංයුතිය |
|---|---|---|
| ආයතනික කළමනාකරණ කමිටුව (CMC) | ප්‍රතිපත්ති හා උපායමාර්ග සැකසීම හා සම්බන්ධ කරුණු අධීක්ෂණය, මෙහෙයුම් මට්ටමේදී ප්‍රතිපත්ති හා උපායමාර්ග ක්‍රියාවට නැංවීම | බැංකුව තුළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා ඊට ඉහළ තනතුරු සේවය කරන සියළු නිලධාරීන් |
| වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) | ආදායම් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවේ පූර්ව නිශ්චිත අවදානම් අභිරුචිය තුළ වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා අවදානම පවත්වා ගැනීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ජාත්‍යන්තර බැංකු, මෙහෙයුම්, ණය, භාණ්ඩාගාර සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| ණය කමිටුව (CC) | බැංකුවේ ණය ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ ආදායම් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවේ අවදානම් අභිරුචි මට්ටම තුළ හිතකර ණය කළඹක් පවත්වාගෙන යාමෙහි නිරතවීම | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ණය, ආයතනික මූල්‍ය, අයකිරීම්, භාණ්ඩාගාර, නීති අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| ආයෝජන කමිටුව (IC) | බැංකුවේ ආයෝජන ප්‍රතිපත්ති කලින් කලට සමාලෝචනය කිරීම සහ බැංකුවේ සමස්ත අවදානම් රුචි මට්ටම තුළ බැංකුවේ ආයෝජන කටයුතු අධීක්ෂණය කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ජාත්‍යන්තර, ණය, භාණ්ඩාගාර, නීති හා අවදානම් කළමනාකරණ අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| කාර්යසාධන සමාලෝචන කමිටුව (PRC) | මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය, දැනට ක්‍රියාත්මක ක්‍රියාකාරකම් වල ප්‍රගතිය, සහ කාර්යසාධනයට පහසුකම් සපයන වෙනත් ඕනෑම උපකාරක සේවාවක් සමාලෝචනය කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්, සියලුම උපදේශකයින් හා අංශ ප්‍රධානීන්, සියලුම සහකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්, සහ කමිටුව විසින් පත්කළ වෙනත් සාමාජිකයින් |
| ශාඛා මෙහෙයුම් නියාමන කමිටුව (BOSC) | පවරා ඇති මූල්‍ය අධිකාරිය තුළ ශාඛා මෙහෙයුම්වල බලාත්මක කිරීම | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, නීති, මෙහෙයුම් සහ පරිපාලන යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| තොරතුරු තාක්ෂණ නියාමන කමිටුව (ITSC) | තොරතුරු තාක්ෂණ උපායමාර්ගය බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගවලට අනුරූප බව සහතික කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ජාත්‍යන්තර මෙහෙයුම්, ණය, නීති, මානව සම්පත් සංවර්ධන,තොරතුරු තාක්ෂණය, අනුකූලතාව සහ අවදානම් කළමනාකරණ, අලෙවි භාණ්ඩාගාර යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |

| කළමනාකරණ කමිටුව | අරමුණ හා වගකීම් | සංයුතිය |
|---|---|---|
| **අලෙවිකරණ කමිටුව (MKTC)** | අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ආයතනික කළමනාකාරිත්වයට අලෙවිකරණ උපදෙස්, විශේෂඥතාව සහ සහය ලබාදීම සහ බැංකුවේ සියළු අලෙවිකරණ කටයුතු සමාලෝචනය කිරීම සහ ඒ සඳහා මග පෙන්වීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මෙහෙයුම් සහ අලෙවිකරණ යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC)** | මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය කිරීම සහ අදාළ ක්‍රියාමාර්ග ගැනීම තුළින් අභ්‍යන්තර පාලනයන්හි අඛණ්ඩභාවය පවත්වා ගැනීම අතරතුර බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මෙහෙයුම්, භාණ්ඩාගාර, ජාත්‍යන්තර, ආයතනික මූල්‍ය, ණය, මානව සම්පත් සංවර්ධන, තොරතුරු තාක්ෂණය, පරිපාලනය, නීති, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ තොරතුරු ආරක්ෂාව යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **නිමැවුම් සංවර්ධන කමිටුව (PDC)** | ඉහළ යන තරගකාරිත්වයට මුහුණදීම සඳහා නවෝත්පාදක නිමැවුම් සංවර්ධනය තුළින් දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම අධීක්ෂණය කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මෙහෙයුම්, ජාත්‍යන්තර, තොරතුරු තාක්ෂණය, පාරිභෝගික ණය, අලෙවිකරණය හා සැලසුම් කිරීම යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **මානව සම්පත් කමිටුව (HRC)** | බැංකුවේ උපායමාර්ගික අරමුණු වලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීම | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මානව සම්පත් සංවර්ධන, නීති, යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ ඊලඟ වඩාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| **ආයතනික ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)** | බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, පාරිපාලනය, සහ මුදල් අමාත්‍යංශයේ නියෝජිතයින් |
| **ආයතනික ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ)** | බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, භාණ්ඩාගාර, පාරිපාලනය, සහ මුදල් අමාත්‍යංශයේ නියෝජිතයින් |
| **විධායක ප්‍රසම්පාදන කමිටුව (EPC)** | බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම | භාණ්ඩාගාර, පාරිපාලනය, යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ සහකාර සාමාන්‍යාධිකාරී, (මූල්‍ය) |
| **ආයතනික තිරසාරභාවය පිළිබඳ කමිටුව (CSC)** | තිරසාර කාර්යසාධනය හා සංවර්ධනය හා සම්බන්ධ ආයතනික අරමුණු මගින් අර්ථ දක්වා ඇති ආකාරයට සදාචාරාත්මක, සමාජයීය හා පාරිසරික වගකීම අපගේ දෛනික ව්‍යාපාර මෙහෙයුම් සමග ඒකාබද්ධ කිරීම තුළින් ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීමට දායකවීම | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ණය, ජාත්‍යන්තර අලෙවිකරණ මෙහෙයුම්, මානව සම්පත් සංවර්ධන, මූල්‍ය හා සැලසුම්කරණ යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **තොරතුරු ආරක්ෂණ කමිටුව (ISC)** | බැංකුවේ තොරතුරු ආරක්ෂාව කළමනාකරණය කිරීම හා නියාමන අවශ්‍යතාවය හා අනුකූලවීමේ මට්ටම සහ බැංකුවේ තොරතුරු ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පාලන ක්‍රියාත්මක කිරීමට හා එවැනි පාලන වල ඵලදායීතාවය තක්සේරු කිරීමට පියවර ගැනීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී, තොරතුරු තාක්ෂණය, මානව සම්පත් හා ආරක්ෂාව යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **ණය අයකරගැනීමේ සැලසුම් නියාමන කමිටුව (RCPSC)** | බැංකුවේ ප්‍රාග්ධන, ද්‍රවශීලතා සහ සමස්ත මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කරන විවිධ දැඩි එහෙත් කළ හැකි ආතති තත්ත්වයන් හේතුවෙන් ඇති විය හැකි බිඳවැටීම්වලට විසඳුම් සැපයීම සඳහා බැංකුවේ ණය අයකරගැනීමේ සැලැස්ම සකස් කිරීම, නිරන්තරයෙන් ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, භාණ්ඩාගාර, ණය, ආයතනික මූල්‍ය, ණය අයකරගැනීම්, ජාත්‍යන්තර බැංකු, අලෙවි, මානව සම්පත් සංවර්ධන, මෙහෙයුම්, තොරතුරු තාක්ෂණ, තොරතුරු ආරක්ෂක, මූල්‍ය හා සැලසුම්, නීති, අවදානම් කළමනාකරණ, අනුකූලතා, විගණන සහ පරිපාලන යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |

## අධ්‍යක්ෂවරුන් පත් කිරීම, නැවත පත් කිරීම සහ ඉල්ලා අස්වීම

**(ප්‍රතිපත්තිය A. 7, A. 8 සහ A. 9.3)**

GRI 2-10

රජයට අයත් බැංකුවක් ලෙස, ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අධ්‍යක්ෂවරු පත් කිරීම 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන අනුව සිදු කෙරේ. ඒ අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව අධ්‍යක්ෂවරු සත් දෙනාගෙන් පස් දෙනෙකු රාජ්‍ය බැංකු සඳහා වගකිවයුතු විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර අනෙක් අධ්‍යක්ෂවරු දෙදෙනාගෙන් එක් අයෙක් භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් විය යුතුය. අනෙක් අධ්‍යක්ෂ තැපැල්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් විය යුතුය. යෝග්‍යතාව හා සම්මතය සඳහා අවශ්‍ය නිර්ණායක සපුරා ඇත්නම්, කරන ලද පත්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කෙරේ. ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරයෙක්ට සිය ධුරය දැරිය හැකි උපරිම කාලය වසර නමයකට සීමා වේ. අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම හා නැවත පත් කිරීම ද 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව සිදු කරන අතර, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිසි පරිදි දැනුවත් කෙරේ. අධ්‍යක්ෂවරුන් හා වෙනස්වීම් පිළිබඳ විස්තර පිටු අංක 175 හි දැක්වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය හා පුහුණුව

**(ප්‍රතිපත්තිය A. 1.8)**

බැංකුවේදී, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිතාවය වැඩි කිරීමේදී හා පාලනය හා උපායමාර්ගික සාකච්ඡා සඳහා අර්ථවත් දායකත්වයක් ලබාදීමට අධ්‍යක්ෂවරුන් මනාව සන්නද්ධ කරන බව සහතික කිරීමේදී සිය අත්‍යවශ්‍ය කාර්යභාරය හඳුනා ගනිමින් අපගේ අධ්‍යක්ෂවරුන්ගේ අඛණ්ඩ වර්ධනය කෙරෙහි ශක්තිමත් අවධාරණයක් අපි යොමු කරමු. තාක්ෂණය තුළ වේගවත් වර්ධනය වීම, ආර්ථික ගතිකතාවන් වෙනස්වීම, සහ වෙනස්වන නීතිකරණ හා නියාමන රාමු මගින් සලකුණු කළ වාතාවරණයන් තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය මනාව දැනුවත්ව හා කඩිසරව සිටීම අත්‍යවශ්‍යය.

මෙයට සහයවීම සඳහා, අලුතින් බඳවාගත් අධ්‍යක්ෂවරුන් සඳහා ව්‍යූහගත සහ පුළුල් ප්‍රාරම්භක වැඩසටහන් බැංකුව ආරම්භ කර ඇත. මෙම හැඩ ගැසීමෙන් බැංකුවේ මෙහෙයුම්, උපායමාර්ගික ප්‍රමුඛතා, සහ පාලනය ව්‍යූහය පිළිබඳ ගැඹුරු අවබෝධයක් අධ්‍යක්ෂවරුන්ට ලබා දෙන අතර ඔවුන්ගේ භාරකාරත්වය, ව්‍යවස්ථාපිත සහ නෛතික බැඳීම් විස්තර කරයි.

බැංකුවේ අධ්‍යක්ෂධූරයට පත්වීමෙන් පසුව, අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත හා අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ප්‍රඥප්ති ඇතුළුව ප්‍රධාන පාලන සම්පත් වෙත පිවිසීම ලබා දෙන අතර එය අත්‍යවශ්‍ය යොමු ලේඛනවල මධ්‍යම සුරක්ෂිතාගාරයක් ලෙස සේවය කරයි. මෙයට, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ නියෝග, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය, අනු කමිටු විධානයන්, සහ අනෙකුත් අදාල නීති, චක්‍රලේඛ හා ප්‍රතිපත්ති ලියවිලි ඇතුළත් වේ.

ප්‍රාරම්භක පුහුණුවෙන් ඉදිරියට, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පහසුකම් සලසන නිරන්තර යාවත් කිරීම හා පුහුණු සැසි තුළින් අඛණ්ඩව හැකියා ගොඩ නැගීම බැංකුව සහතික කරයි. මෙවැනි මුලපිරීම් මතුවන නියාමන ප්‍රවණතා, ආර්ථික සංවර්ධනයන්, සහ වෙනස් වන ක්ෂේත්‍රයේ මනා පරිචයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන් අවබෝධයෙන් ලබාගැනීමට සැලසුම් කර ඇත. අධ්‍යක්ෂවරුන්ගේ දර්ශනය, කඩිසරකම සහ උපායමාර්ගික දැක්ම තවදුරටත් ශක්තිමත් කරමින් නියාමන ආයතන හා වෘත්තීය ආයතන විසින් පිරිනමන බාහිර පුහුණු වැඩසටහන් හා වැඩමුළුවලට අධ්‍යක්ෂවරු සක්‍රියව සහභාගී වේ.

## තොරතුරු වෙත ප්‍රවේශය

අධ්‍යක්ෂවරුන්ට සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමට අවශ්‍ය තොරතුරු මෙන්ම සම්පත් වෙත අසීමිත ප්‍රවේශයක් පවතී. ස්වාධීන වෘත්තීය උපදෙස් පිළිබඳ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ හා එහි සංශෝධන ප්‍රකාරව බැංකුවේ වියදමෙන් බාහිර විශේෂඥ උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට පහසුකම් සලසා දී ඇත. අවශ්‍ය සාකච්ඡාවන් සඳහා ප්‍රමාණවත් කාලයක් අධ්‍යක්ෂවරුන්ට ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හැරීම සඳහා විද්‍යුත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඔවුන් වෙත ලබා දේ.

## 2024 වර්ෂයේ අවධානයට ලක්වූ ප්‍රධාන ක්ෂේත්‍ර

GRI 2-16

වෙනස්වන දේශපානික වාතාවරණය හා 2024 පුරා ආර්ථික ස්ථායිකරණයේ සංඥාවන්ට ප්‍රතිචාරාත්මකව, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික දිශානතිය හැඩගැස්වීම හා මෙහෙයවීම කෙරෙහි ශක්තිමත් අවධානයන් පවත්වා ගෙන ගොස් ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම සමඟ සමීපව කටයුතු කරමින්, අනුමත පරිදි බැංකුවේ දිගු කාලීන උපායමාර්ගය ඵලදායිව ක්‍රියාත්මක කිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය හා සහය ලබා දෙන ලදී. වසර පුරාම, අධ්‍යක්ෂ මණ්ඩලය සිය කටයුතුවලින් විනිවිදභාවය, විචක්ෂණභාවය සහ වගවීම පිළිබිඹු වන බව සහතික කරමින් ඉහළම පාලන ප්‍රමිති කරා සිය කැපවීම ශක්තිමත් කර ඇත.  ද්‍රවශීලතාව කළමනාකරණය සමඟ මූල්‍ය කාර්යසාධනය තුලනය කිරිමට පරීක්ෂාකාරී අවධානය ලබා දෙන ලද අතර, ශක්තිමත් අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති හා මෙහෙයුම් විනය පවත්වාගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසය හා තිරසාර වටිනාකමේ ප්‍රධාන සක්‍රීයකරුවෙක් ලෙස යහ පාලනය ස්ථානගත කරමින් ආයතනය හරහා සදාචාර හැසිරිම සහ අවංකභාවය පිළිබඳ සංස්කෘතියක් අඛණ්ඩව පෝෂණය කරයි. එමෙන්ම එය අවදානම් කළමනාකරණ ව්‍යවහාර අධීක්ෂණය කරමින් හා නව්‍යකරණය, උපායමාර්ගික පුළුල් කිරිම හා වෙනස්වන ආර්ථික හා නියාමන සන්දර්භයට ප්‍රතිචාරාත්මකව ව්‍යාපාර නැවත සකස් කිරිම සඳහා අවස්ථා ගවේෂණය කරමින් බාහිර පරිසරයේ වෙනස්වීම් පිළිබඳව සැලකිල්ලෙන් සිටී.

පහත දැක්වෙන වගුවෙහි 2024 වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වූ ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් දක්වා තිබෙන අතර, බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා හා සිය ප්‍රධාන පාර්ශවකාර කණ්ඩායම්වල බැඳියාවන් සාකච්ඡාවන් හා තීරණ සමඟ පෙළ ගැසෙන ආකාරය පැහැදිලි කරයි.

| 2024 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු | ප්‍රතිඵල | ප්‍රමුඛ උපායමාර්ග | පාර්ශවකරු | 2025 පාලන අරමුණ |
|---|---|---|---|---|
| **ආයතනික උපාය මාර්ගය කාර්යසාධනය සහ වාර්තාකරණය** | | | | |
| • 2025-2027 කාලසීමාව සඳහා බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාර හැඩ ගැස්වීම සහ අවසන් කිරීමට ගැඹුරු සාකච්ඡා සැසි පැවැත්වීම.<br>• 2025 අයවැය සහ 2024 සංශෝධිත අයවැය සමාලෝචනය කර අනුමත කිරීම.<br>• අතුරු හා සහ වාර්ෂික මූල්‍ය වාර්තා අනුමත කිරීම,නිරවද්‍යතාව, විනිවිදභාවය, සහ වාර්තාකරණ ප්‍රමිති සමඟ අනුකූලතාව සහතික කිරීම | • අදාළ අරමුණ, සහ වටිනාකම තිරසාරව නිර්මාණය සහ බෙදාහැරීම වෙනුවෙන් කැපවූ ශක්තිමත් පාලන රාමුවක් යටතේ බැංකුව ක්‍රියාත්මකවීම.<br>• බැංකුවේ උපායමාර්ග සිය මෙහෙවර හා වටිනාකම් සාක්ෂාත් කර ගැනීම සමඟ පරීක්ෂාකාරීව පෙළගැසීම<br>• බැංකුවේ වටිනාකම් උත්පාදනය තුළ වැඩිකළ සහභාගිත්වයට හේතු වන පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය පෝෂණය කිරීම. | • ගනුදෙනුකාර කේන්ද්‍රීයතාවය<br>• ඵෛන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම<br>• සේවක සහභාගීත්වය වැඩි දියුණු කිරීම<br>• ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම<br>• අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම<br>• තිරසාරභාවය | | සාර්ව ආර්ථික උච්චාවචනයන් හමුවේ ඔරොත්තුදීම පවත්වා ගනිමින් වෙනස්වන මෙහෙයුම් පරිසරය හඹා යමින් 2024 - 2027 උපාය මාර්ගික ව්‍යාපාරික සැලැස්ම පහසුවෙන් ක්‍රියාත්මක වීම සහතික කිරීමට උපායාමාර්ගික අධීක්ෂණය ලබාදීම |
| **තාක්ෂණය** | | | | |
| බාධා රහිත සේවා සැපයුම, වැඩිකළ ගනුදෙනුකාර අත්දැකීම සහ තිරසාර ප්‍රතිලාභ සහතික කරන බැංකුවේ තාක්ෂණික පරිවර්ථනය හා ඩිජිටල් පරිනාමනය මෙහෙයවීම. | • තාක්ෂණයට හුරු පරිසරයක් තුළ කඩිසර වීම | • ගනුදෙනුකාර කේන්ද්‍රීයතාවය<br>• ඵෛන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම<br>• සේවක සහභාගීත්වය වැඩි දියුණු කිරීම<br>• ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම<br>• අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම<br>• තිරසාරභාවය | | ශීඝ්‍රයෙන් වෙනස්වන ගතික වාතාවරණයක් තුළ බාධාරහිත සේවා සැපයුමක්, සුරක්ෂිත හා ඔරොත්තුදෙන පරිසයරක්, විවිධ අංශවලට ගලපන ලද ප්‍රශස්ත හා තිරසාර ගනුදෙනුකාර අත්දැකීමක් සහ කල්පවත්නා වටිනාකම් නිර්මාණය සහතික කිරීම සඳහා බැංකුවේ තාක්ෂණික හා ඩිජිටල් පරිනාමනය මෙහෙයෙවීම |
| **ගනුදෙනුකරුවන්** | | | | |
| • ගනුදෙනුකරුවන්ගේ දත්ත ආරක්ෂා කිරීම සඳහා සැලසුම්කළ ප්‍රතිපත්ති හා පද්ධතිවල පුළුල් සමාලෝචනයක් හා අධීක්ෂණයක් පැවැත්වීම, කඩකිරීම්වලට අනුව දැඩි ආරක්ෂාව සහ නියාමන අවශ්‍යතාවන්ට දැඩිව අනුකූලතාව සහතික කිරීම, මෙයට සයිබර් ආරක්ෂන රාමු. දත්ත සමමිතික ප්‍රමිති, සහ ඉහළම මට්ටමේ ආරක්ෂාව හා විශ්වාසය පවත්වා ගැනීමට නෛතික ලේඛණවලට අනුකූලතාව ඇගයීම ඇතුළත්ය. | • උපායමාර්ගික අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා පදනම ලෙස ගනුදෙනුකාර අවශ්‍යතා හා අත්දැකීම් ප්‍රමුඛ කිරීම.<br>• මෙහෙයුම් විශිෂ්ටත්වය හා දිගු කාලීන සාර්ථකත්වය ඇති කිරීමට ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශයක් ඇතුළත් කිරීම. | • ගනුදෙනුකාර කේන්ද්‍රීයතාවය<br>• ඵෛන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම<br>• ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම<br>• අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම<br>• තිරසාරභාවය | | ගනුදෙනුකරුවන් කේන්ද්‍රීය ප්‍රවේශයක් පෝෂණය කිරීමේදී බැංකුවේ වර්ධනයන් ඇගයීම හා පසු විපරම් කිරීම, සේවාවන්හි තත්ත්වය, සහභාගිත්වය හා තෘප්තිය තුළ අඛණ්ඩ වර්ධනය සහතික කිරීම. |

# ආයතනික පාලනය



| 2024 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු | ප්‍රතිඵල | ප්‍රමුඛ උපායමාර්ග | පාර්ශවකරු | 2025 පාලන අරමුණ |
|---|---|---|---|---|
| • බැංකකරණ සේවාවන්හී ප්‍රවේශ්‍යතාව සහ අන්තර්ගතභාවය පෙරමුණු කර ගනිමින්, මූල්‍ය නිෂ්පාදන හා ඩිජිටල් වේදිකා විවිධ සමාජීය අංශ පරාශයකට සේවය සලසන බව සහතික කිරීම, නව්‍යකරණ විසඳුම් ක්‍රියාත්මක කරමින් අඩුවෙන් සේවය ලත් හා සේවය රහිත අංශවල අවශ්‍යතා විසඳීම, සමාජීය බලපෑම්ගත වැඩසටහන් පුළුල් කිරීම, සහ මූල්‍ය පරතර යා කිරීමට තාක්ෂණය යොදා ගැනීම කෙරෙහි විශේෂ අවධානය ලබා දෙන ලදී, අන්තර්ගත බැංකුකරණ පරිසරයක් පෝෂණය කරමින්, බැංකුව සමාන මූල්‍ය ප්‍රවේශ හා තිරසාර වටිනාකම් නිර්මාණය කරා සිය කැපවීම ශක්තිමත් කර ඇත. | • පක්ෂපාතිකම හා තිරසාර වර්ධනය පෝෂණය කිරීමට ව්‍යාපාර උපාමාර්ග ගනුදෙනුකාර අපේක්ෂාවන් සමග පෙළ ගැසීම. | | | |
| **අවදානම් කළමනාකරණය**<br>• අවදානම් අභිරුචිය<br>• අවදානම් අභිරුචි සීමා<br>• ඒකාබද්ධ අවදනම් කළමනාකරණ රාමුව<br>• සයිබර් ආරක්ෂක අවදානම් ඇගයීම<br>• පාලන කාර්යක්ෂමතා සමාලෝචනය<br>• නිතිපතා ගනු ලබන අවදානම් වාර්තා<br>• අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා<br>• 2024 අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලි වාර්තා අනුමත කිරීම | • බැංකුව වගවීම සහ ඔරොත්තුදීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරමින් සිය උපායමාර්ගික ප්‍රමුඛතා සමග පෙළ ගැසීම සහතික කරමින් අවදානම් හා අනුකූලතා කළමනාකරණ පරිචයන් බැංකුව ඒකාබද්ධ කර ඇත.<br>• තොරතුරු හා තාක්ෂණය වගකීම් හා සදාචාරාත්මක අයුරින් භාවිතා කරන අතර, ආරක්ෂාව, විනිවිදභාවය, සහ විශ්වාසය ශක්තිමත් කරමින් තිරසාර නව්‍යකරණය හා මෙහෙයුම් විශිෂ්ටත්වය ඇති කිරීම. | • ගනුදෙනුකාර කේන්ද්‍රීයතාවය<br>• ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම<br>• ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම<br>• අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම | | බැංකුවේ සක්‍රීය අවදානම් කළමනාකරණ ප්‍රවේශයට උපායමාර්ගික අධීක්ෂණය ලබාදීම හා වෙනස්වන සාර්ව ආර්ථික සාධකවලට වගකීම් සහගතව සිටින බව සහ විභව මූල්‍ය හා මෙහෙයුම් අවදානම් ඵලදායිව අවම කිරීම. |
| **නියාමන අනුකූලතාව**<br>නියාමනයන් යාවත්කාලීන කිරීම | • නියාමන අවශ්‍යතාවන්ට අනුකූවීම | • ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම<br>• අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම | | නියාමන අවශ්‍යතා හා ක්ෂේත්‍රයේ මනා පරිච සමග බැංකුව 100% ක අනුකූලතාවයෙන් යුතු බවට සහතිකවීම |

| 2024 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු | ප්‍රතිඵල | ප්‍රමුඛ උපායමාර්ග | පාර්ශවකරු | 2025 පාලන අරමුණ |
|---|---|---|---|---|
| **පාර්ශ්වකරුවන් සමග සම්බන්ධතා** | | | | |
| • පාර්ශ්වකරුවන් හඳුනාගෙන පාර්ශ්වකරුවන් සමග අර්ථවත් සම්බන්ධතා සහ සහයෝගය පෝෂණය කිරීමට ඵලදායි සහභාගිත්ව උපායමාර්ග සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම.<br>• විශ්වාසය සහ පෙළගැසීම ශක්තිමත් කිරීමට කොටස්හිමියන් සමග නිරන්තර හා විනිවිද සන්නිවේදනය සහතික කරමින් කළමනාකාරිත්වයට උපායමාර්ගික දිශානතිය ලබාදීම. | • කාර්යභාරයන් හා වගකීම් විවිධ බැඳියාවන් හා දර්ශනයන් සමඟ පෙළ ගැසෙන බව සහතික කරමින් පාලනය තුළ පාර්ශවකරුවන් ඇතුළත් ප්‍රවේශයක් වැළඳ ගැනීම<br>• තිරසාර සම්බන්ධතා හා අන්‍යෝන්‍ය වර්ධනය පෝෂණය කරමින් පාර්ශවකාර අපේක්ෂාවන් හා බැංකුවේ විශිෂ්ඨ බැඳියාවන් අතර සාධාරණත්වය ඇති කිරීම<br>• දීර්ඝ කාලීන වටිනාකම් නිර්මාණය හා වගකීම්සහගත ව්‍යවහාර ඇති කරමින් බැංකුවේ උපායමාර්ගික රාමුවට පාරිසරික, සාමාජීය හා පාලන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම. | • ගනුදෙනුකාර කේන්ද්‍රීයතාවය<br>• ඓෙන්ද්‍රිය වර්ධනය ප්‍රවර්ධනය කිරීම<br>• සේවක සහභාගීත්වය වැඩි දියුණු කිරීම<br>• ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම<br>• අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම<br>• තිරසාරභාවය |  | සන්නිවේදනය, සහයෝගිතාව හා ප්‍රතිචාරාත්මකබව තුළ අඛණ්ඩ වර්ධනය සහතික කිරීමට පාර්ශවකාර සහභාගිත්ව ක්‍රියාවලි අධික්ෂණය හා වැඩි කිරීම, උපායමාර්ග සකස් කරමින්, ගැටළු විසඳමින්, සහ බැංකුවේ දිගු කාලීන අරමුණු සමඟ පාර්ශවකාර බැඳියාවන් පෙළ ගස්වමින් සම්බන්ධතා ශක්තිමත් කිරීම, විවෘත සාකච්ඡාව හා සක්‍රීය සහභාගිත්වය තුළින් විශ්වාසය හා අර්ථවත් සම්බන්ධතා පෝෂණය කිරීම. |
| **ආයතනික පාලනය** | | | | |
| • ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීමක් හා අනුකම්ටු ඇගයීමක් සිදු කිරීම.<br>• නියාමන බලධාරීන් විසින් නිකුත් කරන ලද ආයතනික පාලන දිශානතීන් සැලකිල්ලට ගැනීම සහ අනුකූලතා තත්ත්වය ඇගයීම | • අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය සාධනය හා ඵලදායිත්වය අඛණ්ඩව වර්ධනය<br>• නියාමන දිශානති හා මාර්ගෝපදේශ සමග අනුකූලතාවය. | • අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම |  | යහ පාලන පරිචවල ප්‍රමිති කෙරෙහි බැංකුවේ අනුකූලතාවය අධීක්ෂණය කිරීම |

## අවදානම් කළමනාකරණයේදී අධ්‍යක්ෂ මණ්ඩල කාර්යභාරය

අවදානම් කළමනාකරණය බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගය සමග ඒකාබද්ධ කිරීමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලබයි. අවදානම් කළමනාකරණ පරිච දූරදර්ශීව අධීක්ෂණය කිරීමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවධාරණය කරනු ලබන අතර, එම කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරනු ලැබ ඇත. බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීමේ වගකීම එම කමිටුව වෙත පැවරී ඇත. බැංකුවේ සිය අවදානම් පැතිකඩ ඵලදායීව නිරීක්ෂණය කිරීම සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ කාර්යරාමුවක්, සංවර්ධනය කර ඇති අතර, එයට අවදානම් රුචි සහ ඉවසුම් සීමා ඇතුළත් වේ. අවදානම දැඩිව නිරීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳ වාර්තා නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. එකඟවූ අවදානම් රුචි මට්ටම්වල යම් අපගමනයන් පිළිබඳව කළමනාකරණය සමඟ කඩිනම්ව සාකච්ඡා කරන අතර එය සුදුසු අවම කිරීමේ උපායමාර්ග සකස් කිරීමට හේතු වේ. බැංකුවේ මෙහෙයුම් හා සම්බන්ධ අවදානම් පරිස්සමින් සලකා බලා උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සමාලෝචනය තුළ පුළුල්ව ඒ පිළිබඳ සාකච්ඡා කෙරේ. ඒ තුලින් දිගු කාලින උපායමාර්ගික පරමාර්ථ ප්‍රමාණවත්ව අවදානම් සාධක විසඳන බව සහතික කරයි. අවදානම් කළමනාකරණය පිළිබඳ වැඩි දුර විස්තර පිටු අංක 195-219 දක්වා වන අවදානම් කළමණාකරන වාර්තාවේ දැක්වේ.

## සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරිගේ කාර්යභාරය

**(ප්‍රතිපත්තිය A. 2 සහ A. 3)**

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත, එහි සංශෝධන, ශ්‍රී ලංකා මහ බැංකු නියාමන සහ ක්ෂේත්‍රයේ සම්මත පරිච වලට අනුකූලව කළමනාකරණ නිළධාරීන් පත් කිරීම හා බලතල පැවරීම සඳහා බැංකුව ව්‍යුහගත රාමුවක් අනුගමනය කරයි. මෙම ප්‍රවේශය මගින් අදාළ කාර්යයන් සහ වගකීම් ඵලදායීව ක්‍රියාත්මක වන බව සහතික කරමින් කාර්යභාරවල පැහැදිලිතාව වැඩි කිරිමට සැලසුම් කෙරේ. මෙම

# ආයතනික පාලනය



පාලන ව්‍යුහයේ ප්‍රධාන අංගයක් වන්නේ එක් එක් අයට සුවිශේෂ වූ පැහැදිලි නිශ්චිත වගකීම් සහිතව සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කාර්යභාරයන් අතර සුවිශේෂි වෙනසක් සිදු කරයි. එක් එක් තනතුරට අදාළ වගකීම් බෙදීම පවත්වා ගැනීමෙන්, බැංකුව පරීක්ෂාකාරී නොවන තීරණ ගැනීමේ අවදානම අවම කරන අතර, බලතල සමබරව බෙදීම, වැඩි වූ වගවීම සහ ආයතනය තුළ ශක්තිමත් පාලනය පෝෂණය කරයි.

### සභාපති

GRI 2-12

සභාපතිවරයා විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් වන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රධාන කළමනාකරණ නිළධාරියෙක් වේ. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් නොවේ. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරියාගේ කාර්යභාරය හා වගකීම් පැහැදිලිව විග්‍රහ කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, ක්‍රමානුකූලබව පවත්වාගෙන යාම, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීතාවය සහ බැංකුව තුළ ආයතනික පාලනය ආශ්‍රිත ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම සහතික කිරීම සභාපතිවරයා වෙත පැවැරෙන වගකීම් වේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධරි සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සමග සාකච්ඡා කොට සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රය සකස් කරනු ලබයි. සිය කාර්යයන් ඉටු කිරීමේදී තොරතුරු මත පදනම්වූ තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රමාණවත් පරිදි තොරතුරු ලැබෙන බව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා එහි සාමාජිකයන්ගේ ඵලදායී සහභාගීත්වය ඇති බව සහ පාර්ශ්වකරුවන් සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගන්නා බව මෙන්ම ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග විවෘත සන්නිවේදනයක් පවත්වා ගන්නා බවද සභාපතිවරයා සහතික වේ.



### සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී

GRI 2-12

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දී ඇති පරිදි අනුමත කරන ලද අවදානම් රුචි මට්ටම්වලට යටත්ව බැංකුවේ උපායමාර්ග සහ දෛනික ව්‍යාපාරික කළමනාකරණ කාර්යයන් සකස් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී වගකිව යුතුය. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිළධාරී ආයතනික කළමනාකරණ කණ්ඩායම් වෙත නායකත්වය ලබාදෙන අතර, ආයතනික පාලන කාර්යරාමුව තුළ අවසරය පරිදි ඔහුට/ඇයට අයත් අධිකාරිය යටතේ පවතින ඇතැම් වගකීම් ආයතනික කළමනාකරණ කණ්ඩායම වෙත පවරයි. එසේම, ඔහු/ඇය කළමනාකරණ කමිටු වල සභාපතිත්වය දරණ අතර බැංකුවේ කාර්යසාධනය පිළිබඳව නිවැරදි, කාලීන හා පැහැදිලි තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබෙන බවට සහතික කරයි. බැංකුවේ කටයුතු පවත්වාගෙන යාමේදී යහපත් ආයතනික පාලනයක් හා ඉහළම ප්‍රමිතීන් යොදා ගෙන පවත්වා ගන්නා බවටද සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී විසින් සහතික කරනු ලබයි.

### ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය

**(ප්‍රතිපත්තිය A. 3.1, A. 5 සහ A. 5.1)**

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු (INEDs) පාලනය ශක්තිමත් කරමින් හා අපක්ෂපාති තීරණ ගැනීම සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය මත තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

2024 දෙසැම්බර් 31 දිනට, අධ්‍යක්ෂවරු පස් දෙනාගෙන් තිදෙනෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වූ අතර, (INEDs) ඉන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ශක්තිමත් කැපවීම හා ස්වාධීනත්වය ඉස්මතු කරයි. බැංකුව හා එහි සමූහය සමඟ ඔවුන්ගේ එකම සම්බන්ධය ඔවුන්ගේ අධ්‍යක්ෂධූර වන අතර, ඉන් ඔවුන්ගේ විනිශ්චයන් අපක්ෂපාති බව සහ බාහිර බලපෑම් හෝ බැඳියා පිළිගැටුම්වලින් තොර බව සහතික කරයි.

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ශක්තිමත් ඉදිරිපත්වීම තුළින් සදාචාර පාලනය, විචක්ෂණ තීරණ ගැනීම, සහ දිගුකාලීන පාර්ශවකාර වටිනාකම නිර්මාණය කරා බැංකුවේ කැපවීම ශක්තිමත් කරයි.

### අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය

**(ප්‍රතිපත්තිය A. 1.4)**

බැංකුව තුළ මනා ආයතනික පාලනයක් පවතින බව තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටි අනුගමනය කරන බව සහ නිතිපතා සමාලෝචනය කරන බව සහතික කිරීමේදී ඉටු කිරීමට ප්‍රධාන කාර්යභාරයක් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වෙත ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ වගකීම් පහත සාරාංශ කර දක්වා ඇත:

- සියළු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් සඳහා අවශ්‍ය පසුබිම සැකසීම.
- සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීම් වල වාර්තා පවත්වා ගැනීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන සහ ව්‍යවස්ථාපිත අනුකූලතා පවත්වාගෙන යන බවට සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ සියළු කරුණු සම්බන්ධයෙන් සභාපතිවරයාට අවශ්‍ය වෘත්තීමය සහය ලබාදීම.
- අදාළ නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෘත්තීය උපදෙස් ලබාදීම සහ ආයතනික පාලන මූලධර්ම සහ වෙනත් ආශ්‍රිත කාර්ය රාමු සමග අනුකූල වන බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් වාර්තා සහ අධ්‍යක්ෂවරුන්ට අදාළ වෙනත් ලියවිලි වල භාරකරු ලෙස ක්‍රියා කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා නිසි කලට අධ්‍යක්ෂවරුන් අතට පත්වන බවට හා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ කාලීනව කළමනාකාරීත්වය වෙත සන්නිවේදනය කෙරෙන බවට සහතික වීම.
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව විසින් ගනු ලබන තීරණ සහ ඒවායේ ප්‍රතිඵල පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මනා ලෙස දැනුවත් බව සහතික කිරීම.

- කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරන ලද ආකාරය හා එහි ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් යනු ප්‍රධාන කළමනාකරණ පිරිසට ඇතුළත් තනතුරක් වන හෙයින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත් කිරීම හෝ ඉවත් කිරීම යනු අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ උපදෙස් මත සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයම සම්බන්ධ වන කරුණකි.

## අධ්‍යක්ෂවරුන්ගේ වේතන මට්ටම හා වේතන සකස් කිරීම

**(ප්‍රතිපත්තිය A. 10, B. 1, B. 2 සහ B. 3)**

GRI 2-19

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන ප්‍රකාරව අධ්‍යක්ෂවරුවන්ගේ වේතනය අදාළ විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබයි. කිසිදු අධ්‍යක්ෂවරයෙකු ඔහුගේ/ඇයගේ වේතනය තීරණය කිරීම සඳහා සම්බන්ධ නොවේ. වසර තුනකට වරක් සමාලෝචනය කෙරෙන සාමූහික ගිවිසුම මගින් නිර්දේශිත වැටුප් මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළ වේතන පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. බැංකුව ප්‍රධාන කළමනාකරණ පිරිස සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වැටුප් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත. කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන සහ එහි සංශෝධන වලට අනුකූලව අවසාන අනුමැතිය ලබාදෙන, රාජ්‍ය බැංකු සම්බන්ධයෙන් වගකීම පැවරෙන අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ඇගයීම

**(ප්‍රතිපත්තිය A. 9)**

GRI 2-18

2007 අංක 12 දරණ බැංකු පනත් නියාමන සහ වෙනත් අදාළ වන නීති හා රෙගුලාසි මෙන්ම ආයතනික පාලනය පිළිබඳ යහපරිච මගින් ඉදිරිපත් කෙරෙන වගකීම් ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් ඉටු කරනු ලබන බවට සහතිකවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්ෂිකව ස්වයං ඇගයීමක් පවත්වනු ලැබේ. ඇගයීම් ක්‍රියාවලියේදී සෑම අධ්‍යක්ෂවරයෙක්ම අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම් පත්‍රිකාවක් සම්පූර්ණ කරන අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වෙත ඉදිරිපත් කරයි.

2024 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම් 2025 වර්ෂයේ පළමු කාර්තුව තුළදී පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සිදුකරන ලදී.

## ප්‍රධාන විධායක නිලධාරී ඇගයීම

**(ප්‍රතිපත්තිය A. 11)**

වර්ෂය ආරම්භයේදී සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමග එකඟවූ පරිදි උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මේ මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක වලට අනුකූල නිර්ණායක මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සහය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික පදනමක් මත සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධන ඇගයීම සිදු කරනු ලබයි. එහිදී මෙහෙයුම් පරිසරයේ සිදු වන වෙනස්වීම්ද නිසි සැලකිල්ලට ගනු ලැබේ. සභාපතිවරයා මේ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමග සාකච්ඡා කරන අතර විධිමත් හා අවිධිමත් ප්‍රතිපෝෂණය ලබාදේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධනය ඇගයීම අනුමත කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රතිචාර නිසි පරිදි සලකා බලනු ලැබේ.

# අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව





**අශේන් ජයසේකර මයා**
සභාපති
**අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව**

**කමිටුවේ සංයුතිය**
සාමාලෝචනයට බඳුන් වූ වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය:

| නම | සාමාජික තත්ත්වය | සහභාගිවීමට සුදුසු | සහභාගිවීම් |
|---|---|---|---|
| අශේන් ජයසේකර මයා * | සභාපති | 08 | 08 |
| දුෂ්‍යන්ත බස්නායක මයා ** | සාමාජික | 09 | 08 |
| ජූඩ් නිලුක්ෂාන් මයා ** | සාමාජික | 09 | 08 |

* විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ  ** විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 160 සිට 163 දක්වා ඇතුළත්ය

**ආරාධනය මත නිතිපතා සහභාගි වූ නිලධාරීන්**
විගණන අධිකාරී,
ජාතික විගණන කාර්යාලය,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන),
සහකාර සාමාන්‍යාධිකාරී (විගණන),
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් ආයතනික සැලසුම් හා කළමනාකරණ පද්ධති),
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

**ගණ පූරණය**
අවමය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකි.

**කමිටුවෙහි ලේකම්**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි

## අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ස්ථාපිත කරන ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බලපත්‍රලාභී විශේෂිත බැංකු නියාමනයේ 3 (6) (ii) වගන්තිය හා එහි පසුකාලීන සංශෝධන, ආයතනික යහපාලනය සඳහා වන පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ වල විධිවිධාන සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහ පරිච සංග්‍රහයට අනුකූලවයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය, නිතිපතා සමාලෝචනය කරනු ලබන අතර යොමු නියමයන් පැහැදිලිව අර්ථ දක්වා ඇත. බැංකු ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් 2024 වර්ෂයේදී කමිටුවේ ප්‍රඥප්තිය අවසන් වරට සාමාලෝචනය කෙරිණ.

## කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය

කමිටුවට එහි වගකීම් ඉටු කිරීමෙහිලා මෙන්මපහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්අධීක්ෂණ වගකීම් ඉටු කිරීමෙහිලා අධ්‍යක්ෂමණ්ඩලය විසින් කමිටුව බලගන්වනු ලැබ තිබේ.

(අ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල අඛණ්ඩතාවය
(ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයෙහි ඵලදායීතාවය
(ඇ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයෙහි කාර්යසාධනය; සහ
(ඈ) බැංකුවේ බාහිර විගණන කාර්යයෙහි කාර්යසාධනය

කමිටුවේ කාර්යයන් සහ වගකීම් මෙන්ම අධිකාරි බලතලද කමිටු ප්‍රඥප්තියේ දැක්වේග කමිටුවේ කටයුතු සහ වගකීම් ඉටු කිරීමේදී ප්‍රඥප්තිය කෙරෙහි වන අනුකූලතාවය මැන බැලීම සඳහා කමිටුවට සහායවීම පිණිස ප්‍රඥප්ති පිරික්සුම් ලැයිස්තු උපයෝගි කරගන්නා ලදි.

## අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්ථා කිරීම

සිය ක්‍රියාකාරකම් පිළිබඳව රැස්වීම් සටහන් සමගින් කමිටුව සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අභ්‍යන්තර විගණක, බාහිර විගණක සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර විවෘත සන්නිවේදන මාර්ගයක් සහතික කරයිග කමිටුවේ යොමුකිරීමේ අනුදේශ සියලු ප්‍රමාණාත්මක ක්ෂේත්‍ර යටතේ අනුකූල වන බව කමිටුව විශ්වාස කරයි.

## 2024 වර්ෂයේ ක්‍රියාකාරකම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටු රැස්වීම් 9 ක් පවත්වා තිබිණි. නිරීක්ෂකයෙකු ලෙස විගණකාධිපතිවරයා නියෝජනය කරමින් විගණන දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී,අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් 9 කට සහභාගී වී තිබේ.

අවශ්‍යතාවය පරිදි බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීන් ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ආරාධනය මත කමිටු රැස්වීම් වලට සහභාගී වූහ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් දෙකක් (02) විධායක කළමනාකාරිත්වයේ සහභාගිත්වයෙන් තොරව රජයේ විගණක සමග පවත්වන ලදී.

## මූල්‍යමය තොරතුරු වාර්තාකරණය

මූල්‍ය ප්‍රකාශවල විශ්වසනීය බව අධීක්ෂණය සඳහා හා හෙළිදරව් කිරීම් සඳහා සකසන ලද කාර්තුමය වාර්තා අධීක්ෂණය සඳහා ද නිකුත් කිරීමට ප්‍රථම වැදගත් තීරණ ගැනීමට මූල්‍ය ප්‍රකාශයන්හි විශ්වසනීය බව අධීක්ෂණ සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනයට බඳුන් කරන ලදී. ප්‍රධාන තීරණ ගැනීමේ ක්ෂේත්‍ර වෙත ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පරිචයන්ගේ වෙනස්වීම්, විගණනයෙන් පැන නගින සැලකිය යුතු ගැලපීම්, අඛණ්ඩ ව්‍යාපාරික පැවැත්ම බැංකුවේ කාර්යසාධනය හා තත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඇතිව මූල්‍ය ප්‍රකාශයන්හි වෙනත් නීතිමය අවශ්‍යතාල අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූල වීම යන කරුණු කෙරෙහි කමිටුව විසින් අවධානය යොමු කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශයෙහි සමාලෝචනය පිළිබඳ වාර්තාව ද අභ්‍යන්තර විගණන අංශය වෙතින් එහි සොයා ගැනීම් සමග ඉදිරිපත් කරන ලද වාර්තාව ද අතර කාර්තුමය පදනම මත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ කෙටුම්පත ද කමිටුව විසින් සමාලෝචනයට භාජනය කෙරිණි.

## අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගැයීම් ක්‍රියාවලිය

බැංකුවේ ප්‍රාග්ධන ඇගයීම් ක්‍රියාවලියෙහි විශ්වාසනීයත්වය, නිරවද්‍යභාවය හා පිළිගත හැකි බව පිළිබඳ ස්වාධීන සාමාලෝචනයක්, අවශ්‍ය බව 2016 අංක 06 දරන බැංකු පනතෙහි නියාමන ප්‍රකාරව වගන්ති 10 මගින් දැක්වෙයි. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගැයීම් ක්‍රියාවලියෙහි නියාමන අවශ්‍යතා සපුරාලීමට අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි කාර්යක්ෂමතාව කමිටුව විසින් සමාලෝචනය කර ඇත.

2016 අංක 1 දරන බැංකු පණතේ වගන්ති අංක 10ට අනුව කමිටුව විසින් බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය ඇගයීමේ ක්‍රියාවලිය තීව්‍ර ලෙස විමර්ෂනය කොට ඒවා නියාමන ප්‍රමිතයන්ට අනුකූල බවත්,විශ්වාසනීයත්වය, නිරවද්‍ය භාවය සහ පිළිගත හැකි බව පිළිබඳවත්  තහවුරු කර ගෙන ඇත.

කමිටුවේ අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා භාවිතා කර ඇති උපකල්පන සහ ක්‍රමවේද ඇගයීම දත්ත යෙදවුම් වල නිරවද්‍යතාවය තක්සේරු කිරීම සහ ප්‍රාග්ධන ප්‍රමාණත්මකතාවයට සම්බන්ධ මූල්‍ය විනිශ්චයන් සමාලෝචනය කිරීම දක්වා විහිදුණි.අතිරේකව, විභව පාඩු අවම කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන සංචිත පවත්වා ගෙන යාම සහතික කිරීමෙන් අහිතකර තත්වයන් යටතේ ක්‍රියාත්මක වීමට බැංකුවට ඇති හැකියාව කමිටුව ඇගයීමට ලක් කළේය.

## මූල්‍ය වාර්තාකරණය බලපාන අවදානම් සහ අභ්‍යන්තර පාලනය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි පරිපාලිත සමාගම් විසින් අවදානම් හඳුනාගැනිම සහ ඒවා ඇගයීම සම්බන්ධව මෙන්ම ව්‍යාපාරික කටයුතු වල මෙහෙයුම් සම්බන්ධයෙන් එමගින් ඇතිවිය හැකි බලපෑම් සහ මුල්‍යමය වාර්තා කිරීම් ආදිය සිදුකිරීම සම්බන්ධව වගකීමට බැඳී සිටී. තවද බැංකුව විසින් අවදානම් මත පදනම් වූ විගණන ක්‍රමයක් අනුගමනය කරන අතර කමිටුව විසින් මුල්‍ය කටයුතු වාර්තාකරණය සම්බන්ධ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලතාව සම්බන්ධයෙන් 2007 අංක 12 දරණ බැංකු පනතේ ඡේද අංක 3 (8) (ii) (බි) යටතේ සහ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් හඳුන්වාදී ඇති මාර්ගෝපදේශ මත පදනම්ව අවශ්‍ය තක්සේරු කිරීම් සිදුකර ඇත. එමෙන්ම අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව විසින් බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ක්ෂේත්‍රයේ සමස්ත පාලනයේ ප්‍රමාණාත්මතාව සහ විශේෂයෙන් අවදානමට නිරාවරණය වියහැකි අංශ ආදිය සම්බන්ධ සමාලෝචනය කර අවශ්‍ය තක්සේරුකිරීම ද සිදුකර ඇත.

තවද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ගණනය කිරීම් සහ මුල්‍ය කටයුතු වාර්තා කිරීමේදී සිදුවන දෝෂ හඳුනාගැනීම, වත්කම් අපහරණය, නීතිරීති උල්ලංගණය කිරීම් සහ ආයතනික සංග්‍රහයේ උපදේශ වල අනුකූලතා ආදිය හඳුනාගැනීමේ අභ්‍යන්තර පාලන ව්‍යුහයද සමාලෝචනයට සහ තක්සේරුවට ලක් කරන ලදී.

තවද මෙම කමිටුව විසින් මෙම කරුණුවලට අදාළව අභ්‍යන්තර හා බාහිර විගණන අංශය විසින් හෙළිකරගත් කරුණු සහ නිර්දේශ ඒ හා සම්බන්ධ කළමනාකරණයේ ප්‍රතිචාර සමග සමාලෝචනය කරනු ලබයි.අභ්‍යන්තර පාලන ව්‍යුහය සහ විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශය පිටු අංක 230 සිට 232 දක්වා පිටුවල සඳහන් වේ.

මේ සම්බන්ධයෙන් කමිටුවේ මතය වන්නේ යුක්ති සහගත තහවුරුවක් ලබාදීම පිණිස අවශ්‍ය කරන ක්‍රමවේද සහ පරීක්ෂණ කිරීමේ ක්‍රම හඳුන්වාදී ඇති බව ඉහතින් දන්වා ඇති අවශ්‍යතා බැංකුව විසින් සපුරා ඇති බවත්ය.

## අභ්‍යන්තර විගණනය සහ පරීක්ෂණ කටයුතු

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන කටයුතු සියල්ල ස්වාධීනව සිදුවන බවට තහවුරු කර ඇත. එසේම අභ්‍යන්තර විගණන අංශයේ විෂයපථයේ ප්‍රමාණාත්මතාව, ක්‍රියාකාරිත්වය සහ එහි සම්පත් සම්බන්ධව නිසි සමාලෝචන සිදුකර ඇත. එමෙන්ම මෙම අංශයට අදාළ විෂය කටයුතු සිදුකර ගෙනයාමට ඇවැසි බලය සතු බවටද කමිටු සැහීමට පත්විය.බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිය වාර්ෂික විගණන සැලසුම අනුව ශාඛා, අංශ සහ අනෙකුත් අදාළ ඒකක අවශ්‍ය විගණන කටයුතු සිදු කර ඇත. ඇගයීමට ලක්වන අවධානමේ ස්වාභාවය අනුව අවශ්‍ය කරන විගණනය අවස්ථා නිර්ණය කරනු ලැබීය. එසේම විගණන සැලසුම එය ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කරන ලදී. 2024 වසර සඳහා අනුමත කරන ලද විගණන සැලැස්ම 2024 අවසානය වන විට සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබීය.

අභ්‍යන්තර විගණන අංශය විසින් ප්‍රතිපත්ති හා ක්‍රමවේදඅනුගමනය කිරීම, අභ්‍යන්තර පාලන ව්‍යුහයේ සහ අනුකූලතා සම්බන්ධව සිදුකෙරෙන හෙළිකර ගැනීම් වලට අදාළව ගනු ලබන ක්‍රියාමාර්ග වල සඵලතා ආදිය තහවුරු කර ගැනීම පිණිස විගණන පරීක්‍ෂණ සිදුකර ඇත. තවද බැංකුවේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු සම්බන්ධව නිදහස් හා විෂය මූලික වාර්තා ලබාදීමේ අරමුණින් විගණන කටයුතු සිදුකරන ලදී.

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකරන ලද අඛණ්ඩ විගණන සහ තොරතුරු පද්ධති විගණන ආදිය හරහා හෙළිකරගත් කරුණු සමාලෝචනය කරන ලදී. අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරන ලද අභ්‍යන්තර විමර්ශන වාර්ථා නිරීක්ෂණය හා පාලනය කිරීම මෙන්ම විගණන සහ සුපරීක්ෂණ අංශයේ නිළධාරීන්ගේ කාර්‍යසාධන සමාලෝචනයද මෙම කමිටුව විසින් සිදු කරන ලදී.

බැංකුවේ අභ්‍යන්තර විගණන සංග්‍රහය අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ මෙහෙයවීම් සම්බන්ධව කෙටි විග්‍රහයක් ලබාදෙන අතර අභ්‍යන්තර විගණන ක්‍රියාවලින් මෙහෙයවීම සම්බන්ධව ප්‍රතිපත්තිල ප්‍රමිතීන් සහ ක්‍රියාවලීන් සම්බන්ධ විස්තරද ලබාදේ.අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියල (charter) අභ්‍යන්තර විගණන අංශයේ වගකීම් කාර්යක්ෂම ලෙස හා ස්වාධීනව ඉටු කිරීම සඳහා උපකාරීවීම පිණිස යොදාගනු ලැබේ. මෙම ප්‍රඥප්තිය තුළ විෂය පථය, කාර්යභාරයන්, වගකීම් අධිකාරය, වාර්තා කිරීමේ පටිපාටි සහ ස්වාධීනත්වය සහ අභ්‍යන්තර විගණන අංශයේ අරමුණු ආදිය ඇතුළත් වේ.

## බාහිර විගණක

ව්‍යවස්ථාපිතව, බැංකුවේ බාහිර විගණක වන්නේ විගණකාධිපතිවරයාය. සමාලෝචිත කාලය තුළ බාහිර විගණක සමග විධායක කළමනාකාරිත්වයේ සහභාගීත්වයෙන් තොරව අවම වශයෙන් දෙවතාවක් රැස්වී ඇත. එසේම ඔවුන්ට කමිටුව හමුවී විශේෂිත කරුණු සම්බන්ධයෙන් නිදහසේ සාකච්ඡා කිරීමටත් අදහස් ප්‍රකාශ කිරීමටත්

# අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව



අවකාශ ලබාදෙන ලදීගවිගණන ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේදී රජයේ විගණන පාලක සමග සාකච්ඡා කෙරෙයි. විගණන අරමුණු උදෙසා බාහිර විගණකවරයා හට අවශ්‍ය කෙරෙන සියලු තොරතුරු හා ලියකියවිලි සපයන බවට කමිටුව සහතික වෙයි.

ගෙවුණු වසර තුළ කමිටුව විසින්:

- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපති වාර්තාව සමාලෝචනය කරන ලදී. බැංකුවේ ආයතනික කළමනාකාරීත්වය විසින් ඉදිරිපත් කළ කළමනාකාරිත්ව ලිපිය හා ඊට අදාළ ප්‍රතිචාර ද සමාලෝචනය කෙරුණු අතර අවශ්‍ය නිරවද්‍ය කිරීමේ පියවර පසුවිපරම් කරන ලදී.
- විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සැලකිය යුතු වාර්තා සමාලෝචනයට හා සාකච්ඡාවට ගැනුණු අතර අවශ්‍ය පරිදි යෝග්‍ය පියවර සඳහා මුලපුරන ලදී.

## ආමන්ත්‍රණය කරන ලද අනෙකුත් ප්‍රධාන කරුණු

- විගණන අතරතුර හඳුනාගනු ලැබූ ගැටළු විසඳීම සඳහා පසුවිපරම් යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.
- විනයානුකූල කටයුතු හා විමර්ශන සම්බන්ධයෙන් වරින්වර සමාලෝචනය.
- වංචා හා අක්‍රමිකතාවයන් පිළිබඳ පොදු සිද්ධීන් හා කරුණු සමාලෝචනය කර ඉදිරියේදී එවැනි සිදුවීම් වාර්තාවීමට ඇති අවස්ථාව වැළැක්වීමට මුලපිරීම.
- විමර්ශන/විනය පරීක්ෂණ යුහුසුළුව පැවැත්වීමට අවශ්‍ය දිශානතිය සැපයීම.

## අචාර ධර්ම හා යහ පාලනය

බැංකුව තුළ ආයතනික යහ පාලන පරිචයන් දිගටම පවත්වා ගැනීමේ අවශ්‍යතාව කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය කර අවධාරණය කෙරිණි.

වංචා අවදානම් කළමනාකරණය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය (Whistle blowing Policy) මේ සම්බන්ධයෙන් බැංකුවේ විශ්වසනීයත්වය සුරක්ෂිත කරනු ලබන ප්‍රධානතම සාධයකන්ය. බැංකුවේ පාරදෘශ්‍යභාවය ඉහළ නැංවීමත්, එහි ක්‍රියාකාරකම් සහ කීර්තිනාමය පළුදු කළ හැකි පරිචයන් වළක්වාලීමේ පදනම සහිත පද්ධතිය ශක්තිමත් කිරීමත් උද්ගතවිය හැකි වෙනත් ගැටළු සහගත අවස්ථාවන් හෝ වංචා පෙරාතුව හඳුනාගැනීමට මඟපෑදීමත් මෙහි අරමුණු වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සියලු වංචා පිළිබඳ සිද්ධීන් කාර්තුමය පදනම මත සමාලෝචනය කරනු ලබයි. කාර්තුමය සමාලෝචනය අතරතුර, අධ්‍යක්ෂ මණ්ඩල විගණක කමිටුව විසින් සෑම සිද්ධියකම විස්තර හා සංඛ්‍යාත්මක තොරතුරුද ගනු ලැබූ පියවර සුපරීක්ෂා කරනු ලැබ අවශ්‍ය පරිදි වංචා වැළැක්වීමේ හා දඬුවම් ලබාදීමේ නියාමනය නිකුත් කරනු ලැබිණි. ඕනෑම මූලික විමර්ශණයක් හා එහි ප්‍රතිඵල පිළිබඳ සංෂිප්ත වාර්තාවක් කැඳවීමට අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවට ඕනෑම අවස්ථාවකදී අවසර ඇත.

## ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්

බැංකුවට අදාළ වන නව හා සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්/ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් මෙන්ම එහි නිර්දේශ මත අවශ්‍යතා මත අවශ්‍ය වන ප්‍රමිතීන් අනුගමනය කිරීමේ තීරණ කමිටුව විසින් සමාලෝචනය කර සංශෝධනය කෙරිණ.

## අනුකූලතාව

නීති හා රෙගුලාසිවලට අනුකූලවීම අධීක්ෂණය කරනු ලබන ක්‍රමවේදයෙහි කාර්යක්ෂමතාව කමිටුව විසින් සමාලෝචනයට බඳුන් කරන ලදී. එමෙන්ම අනුකූල නොවීමේ යම් අවස්ථා පැන නැගිය හොත් ඒ පිළිබඳ කළමනාකාරිත්වයේ විමර්ශන හා පසුවිපරම් කිරීම් ද (විනය ක්‍රියාමාර්ග ද ඇතුළුව) කමිටුව සමාලෝචනය කරයි.

## 2025 වර්ෂය සඳහා ඉන් ඉදිරියට අවධානය යොමුවන ක්ෂේත්‍ර

- බැංකුව විසින් භාවිත කරනු ලබන මූල්‍ය පද්ධති, ක්‍රියාවලීන් හා අභ්‍යන්තර පාලන, බාහිර හා අභ්‍යන්තර වාතාවරණයන් තුළ පැන නගින සංකීර්ණ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වන්නේ ද හා සඵලදායී ලෙස මෙහෙයවනු ලබන්නේද යන කරුණු පිළිබඳ අවධානය අඛණ්ඩව යොමු කිරීම.
- බැංකුව වෙත ඇති කරලනු ලබන බලපෑම් ඇගයීම තුළින් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ස්වාධීන සමාලෝචන මත පදනම් අවශ්‍ය සැලසුම් කිරීම හා අධීක්ෂණය.

## කමිටුවේ කාර්යසාධන ඇගැයීම

කමිටුවේ කාර්යක්ෂමභාවය පිළිබඳ වාර්ෂික ඇගයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.

2024 වර්ෂයට අදාල ස්වයං ඇගයීම් වාර්ථාව 2025 මුල් කාර්තුවේදී සිදු කරන ලද අතර එය අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.



**අශේන් ජයසේකර**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2025 මාර්තු 25
කොළඹදී

# අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව





**එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා**
සභාපති
**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව**

**කමිටුවේ සංයුතිය**

සාමාලෝචනයට බඳුන් වූ වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

| නම | සාමාජික තත්ත්වය | සහභාගිවීමට සුදුසු | සහභාගිවීම් |
|---|---|---|---|
| එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා * | සභාපති | 09 | 09 |
| ජුඩ් නිලුක්ෂාන් මයා ** | සාමාජික | 09 | 08 |
| අශේන් ජයසේකර මයා * | සාමාජික | 07 | 07 |

* විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ ** විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 160 සිට 162 දක්වා ඇතුළත්ය.

**ආරාධනය මත නිතිපතා රැස්වීම්වලට සහභාගීවූ නිලධාරීන්**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් කමිටුවට අවශ්‍ය තොරතුරු සපයන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන අවස්ථාවන්හි දී හැර අනෙකුත් සියලු රැස්වීම්වලට සහභාගී වේ.

අවශ්‍යතාව මත හා ආරාධනය මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන) ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය රැස්වීම් වලට සහභාගී වන ලදී.

**සණ පූරණය**

අවම සාමාජික සංඛ්‍යාව දෙදෙනෙකි.

**කමිටුවේ ලේකම්**

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

## අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටුව සංස්ථාපනය කරන ලද්දේ 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 76 J (1) වගන්තිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකු පනත් නියාමනයේ 3 (6) (i) හා (iii) වගන්තිය යටතේ වන විධිවිධාන වලට අනුකූලවය. කමිටුව සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර කමිටු රැස්වීම් පටිපාටි නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

## කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

ප්‍රඥප්තිය අනුව කමිටුවේ කාර්යභාරය සහ වගකීම් පහත කරුණු වලින් සමන්විත වේ.

- සාමූහික ගිවිසුම මත තීරණය කරනු ලබන වේතන හැර බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ වේතන ප්‍රතිපත්තිය (වැටුප, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීමේ වගකීම කමිටුව සතුවේ.
- බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ඉලක්ක සහ අරමුණු ලබාදීම. එසේ ලබාදුන් ඉලක්ක හා අරමුණු වලට සාපේක්ෂව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය නිතිපතා ඇගයීම සහ වේතන, දීමනා සහ ප්‍රතිශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම.
- ජ්‍යෙෂ්ඨ විධායක කාර්යය මණ්ඩලයට අදාල නියමයන් යන කොන්දේසි හැර වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති, මූල පිරිම් වැටුප් ව්‍යුහයන් කමිටුව විසින් සමාලෝචනය කරන ලදීග මෙම ක්‍රියාවලියේදී බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙතින් අවශ්‍ය තොරතුරු සහ නිර්දේශ ලබාගන්නා ලදී.

## අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

කමිටුව රැස්වීම්වල වාර්තා සමග එහි ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි.විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන අංශය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර විවෘත සන්නිවේදනයක් පවත්වා ගැනීමට කමිටුව කටයුතු කරනු ලැබේ.කමිටුවේ ප්‍රඥප්තිය සියලුම අත්‍යවශ්‍ය මූලිකාංග සම්පාදනය කොට සකස් කර ඇති බව කමිටුවේ අදහසයි.

## 2024 වසර තුළ කමිටුවේ ක්‍රියාකාරකම්

2024 වසර තුළ කමිටුව විසින් සිදුකළ හා සහභාගීත්වය දැක්වූ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- **2024 වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs) කාර්ය සාධන ඇගයීම:** අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ එහි උප කමිටුවකට සෘජුවම වාර්තා කරන නිලධාරීන් හැර, ඉහල කළමණාකාරිත්ව නිලධාරීන් වන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (SDGM) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් (DGMs) සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් (AGMs) ගේ කාර්ය සාධන මිනුම් ඇගයීමට ලක් කරන ලදී. උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉහල කළමණාකාරීත්වයේ දායකත්වය මැනීම සහ ඔවුන්ගේ කාර්ය සාධන දර්ශක බැංකුවේ සමස්ත අරමුණු සමග පෙළගැස්වීම සහතික කිරීම කෙරෙහි මෙහිදී අවධානය යොමු විය.

# අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව



- **බැංකුවේ අවශ්‍යතා මත පදනම්ව කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම් පරිපාටිය සමාලෝචනය කරන ලදී:** බැංකුවේ මෙහෙයුම් සහ උපායමාර්ගික අවශ්‍යතා සමඟ ඒවා ගැලපෙන බව තහවුරු කිරීම සඳහා බඳවා ගැනීමේ පිළිවෙත් සහ කාර්ය මණ්ඩල උසස්වීම් නිර්ණායක පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් සිදු කරන ලදී. මෙම ක්‍රියාවලිය අරමුණු වූයේ සේවකයින් සඳහා වෘත්තීය වර්ධන අවස්ථා ලබා දෙන අතරම ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාව පවත්වා ගැනීමයි.
- **මානව සම්පත් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීම:** මානව සම්පත් ගැටළු සම්බන්ධයෙන් සේවකයින් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා කමිටුව විසින් සලකා බලන ලද අතර, දුක්ගැනවිලි විනිවිදභාවයෙන් හා බැංකුවේ ප්‍රතිපත්ති හා සාධාරණත්ව මූලධර්මවලට අනුකූලව විසඳා ඇති බව සහතික කරන ලදී.
- **කාර්ය මණ්ඩල උසස්වීම් සඳහා විනය ක්‍රියා පටිපාටි/දඬුවම් වල බලපෑම සමාලෝචනය:** සේවක මණ්ඩලය වෙත වගවීම තහවුරු කරමින් වෘත්තීය දියුණුව කෙරෙහි විනය ක්‍රියා මාර්ග වල ඇති බලපෑම සැළකිල්ලට ගෙන අනුකූලතාවය සහ සාධාරණත්වය මත පදනම්ව උසස්වීම් තීරණ ඇගයීමට ලක් කරන ලදී,
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය සමාලෝචනය:** සුදුසුකම් ලත් අපේක්ෂකයින් ආකර්ෂණය කර ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම, බඳවා ගැනීමේ ක්‍රියාවලීන් ප්‍රශස්ත කිරීම සහ වෙළඳපල ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා එහි බඳවා ගැනීමේ ක්‍රමවේදය නිරීක්ෂණය කරන ලදී.
- **බැංකුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම:** කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරාලීමට නව සේවකයින් බඳවා ගැනීමේදී, බැංකුවේ කුසලතා සංචිතය වැඩිදියුණු කිරීමට සහ එහි පුළුල් වන මෙහෙයුම් සඳහා දායකත්වය සැපයීමට ඇති හැකියාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන් ලදී.
- **බැංකුවේ ප්‍රධාන තනතුරු සඳහා බඳවා ගැනීම් සඳහා මූලපිරීම:** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය, ආයතනික සැලසුම් සහ කළමනාකරණ තොරතුරු තාක්ෂණ) සහ සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) වැනි ප්‍රධාන තනතුරු සඳහා බඳවා ගැනීමේදී, බැංකුවේ මෙහෙයුම් සහ උපායමාර්ගික ඉලක්ක කරා ගෙන යාමට අවශ්‍ය කුසලතා සහ අත්දැකීම් වලට ප්‍රමුඛත්වය ලබා දීම.
- **2024 වර්ෂය සඳහා විනය පරීක්ෂණ:** බැංකුව ආයතනික අඛණ්ඩතාව ආරක්ෂා කිරීමින් ප්‍රතිපත්ති සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වෙමින් වසර තුළ විනය පරීක්ෂණ කළමනාකරණය කර ඇති බව සමාලෝචනය කරන ලදී.
- **මානව සම්පත් ප්‍රතිපත්ති සංශෝධනය කරන ලදී:** මානව සම්පත් කළමනාකරණය සඳහා පුළුල් හා යාවත්කාලීන රාමුවක් සහතික කරමින්, වෙනස්වන වන ආයතනිකඅවශ්‍යතා, නියාමන අවශ්‍යතා සහ ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් පිළිබිඹු කිරීම සඳහා බැංකුවේ මානව සම්පත්ප්‍රතිපත්ති සංශෝධනය කරන ලදී.
- **භාණ්ඩාගාරය සඳහා අනුප්‍රාප්තික සැලැස්ම පසුපස කාර්යාලය සහ භාණ්ඩාගාර මෙහෙයුම් කාර්යාලය:** භාණ්ඩාගාර පසු කාර්යාලය සහ මෙහෙයුම් කාර්යාලයේ තීරණාත්මක භූමිකාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා සවිස්තරාත්මක අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කරන ලද අතර, ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම සහ මෙම ප්‍රධාන කාර්යයන් සඳහා සුදුසු පිරිස් ලබා ගැනීම සහතික කරන ලදී.
- **බැංකුවේ ආයතනික ව්‍යුහය:** වැඩ ප්‍රවාහ ප්‍රශස්ත කිරීම, මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සහ උපායමාර්ගික අරමුණු සමඟ පෙළගැස්වීම සහතික කිරීම, සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා බැංකුවේ ආයතනික ව්‍යුහය නැවත සමාලෝචනය කරන ලදී.
- **පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම:** සේවකයින්ට අවශ්‍ය කුසලතාවයෙන් සහ දැනුමෙන් පරිපූර්ණ බව සහතික කිරීම සඳහාත්, වෘත්තීය වර්ධනය පෝෂණය කිරීම සඳහාත් ආයතනික සාර්ථකත්වයට සහාය වීම සඳහාත් දායක වන ආකාරයට බැංකුවේ පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තිය තක්සේරු කරන ලදී.

## 2025 වර්ෂය හා ඉන් ඉදිරියට අවධානය යොමු කිරීම

- **වේතන ප්‍රතිපත්තිය:** බැංකුවේ වේතන ප්‍රතිපත්තිය වඩාත් අනුකූල, තරඟකාරී මෙන්ම ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් සහ ආයතනික ඉලක්ක සමඟ අනුකූලව පවතින බව සහතික කිරීම කමිටුව විසින් සිදු කරයි..
- **මානව සම්පත් උපායමාර්ගය:** අන්‍යෝන්‍ය සම්බන්ධතාවය, සහයෝගීතාවය සහ සේවක තෘප්තිය සපිරුණු සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා මානව සම්පත් උපායමාර්ගය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.
- **කමිටු ප්‍රඥප්තිය:** ප්‍රඥප්තියේ සඳහන් ආකාරයට අනලස්ව සිය වගකීම ඉටුකරමින් කාර්යක්ෂම පාලනයක් සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සහතික කිරීම සඳහා කමිටුව කටයුතු කරයි.

## කමිටුවේ කාර්යසාධන ඇගැයීම

කමිටුවේ කාර්යක්ෂමභාවය පිළිබඳ වාර්ෂික ඇගයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.

මෙම වාර්තාව නිවැරදි බවත්, ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශයකින් තොර බවත් කමිටුව සම්පූර්ණයෙන්ම සහතික කරයි.



එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2025 මාර්තු 25
කොළඹදී

# අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව





**එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මහතා**
සභාපති
**අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව**

**කමිටුවේ සංයුතිය**

සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

| නම | සාමාජික තත්ත්වය | සහභාගිවීමට සුදුසු | සහභාගිවීම් |
|---|---|---|---|
| එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා ** | සභාපති | 11 | 11 |
| ජුඩ් නිලුක්ෂාන් මයා * | සාමාජික | 11 | 11 |
| දුෂ්‍යන්ත බස්නායක මයා * | සාමාජික | 11 | 11 |

* විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ ** විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 160 සිට 162 දක්වා ඇතුළත්ය.

**ආරාධනයෙන් නිතිපතා සහභාගීවන්නන්**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් කමිටුවට තොරතුරු සපයනු ලබන අතර ආරාධනය මත කමිටුවේ රැස්වීම්වලට සහභාගි වේ.

**ගණපූරණය**

අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකි.

**කමිටුවේ ලේකම්**

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ (BNC) හි ලේකම් ලෙස කටයුතු කරයි.

## කමිටුවේ ප්‍රඥප්තිය

1988 අංක 30 දරන බැංකු පනතේ 76 J (1) වගන්තිය යටතේ සංශෝධිත පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය, 2007 අංක 12 දරන බැංකු පනතේ උපදෙස්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC), ප්‍රධාන කළමනාකාරීත්ව පිරිස් තෝරා ගැනීම පිළිබඳ මණ්ඩලයේ අධීක්ෂණය සහ පාලනය සහතික කිරීම සඳහා පිහිටුවා ඇත.

## කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම/පත් කිරීමේ ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වගකිව යුතුය.

තවද, අධ්‍යක්ෂවරුන්, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් 3 (3) විධානයෙහි දක්වා ඇති සහ ප්‍රඥප්තිවල දක්වා ඇති නිර්ණායකවල දක්වා ඇති නිලතල දැරීමට සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් බවට කමිටුව සහතික කළ යුතුය. කමිටුව විසින් වරින් වර අවශ්‍යතා සලකා බලා විශ්‍රාම යන ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අමතර/නව විශේෂඥතාව සහ අනුප්‍රාප්තික සැලසුම් නිර්දේශ කළ යුතුය.

## අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

විනිවිද භාවය සහ වගවීම සහතික කරමින් කමිටුව එහි ක්‍රියාකාරකම් සහ රැස්වීම් වාර්තා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. පාලනය සහ අනුකූලතා ප්‍රමිතීන් කෙරෙහි එහි කැපවීම පිළිබිඹු කරමින්, කමිටු ප්‍රඥප්තීන් නිසි ලෙස අනුගමනය කර ඇති බව එය සනාථ කරයි.

## 2024 වර්ෂය තුළ ක්‍රියාකාරකම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ නාමයෝජනා කමිටු රැස්වීම් 11 පවත්වන ලදි.

වර්ෂය තුළ කාරක සභාව සහභාගී වූ සහ සිදු කරන ලද වැදගත් ක්‍රියාකාරකම් පහත පරිදි වේ

- **ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රම ඇගයීම:** කමිටුව බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අදාළ වන බඳවා ගැනීමේ යෝජනා ක්‍රම පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කළේය. මෙම තක්සේරුව මගින් බඳවා ගැනීම් පාලනය කරන නිර්ණායක, ක්‍රියාවලීන් සහ ප්‍රතිපත්ති විනිවිද පෙනෙන ඒවා බවත්, ඒවා ඵලදායී මෙන්ම බැංකුවේ උපායමාර්ගික අවශ්‍යතා සහ වෙළඳපල අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කර ඇති බවටත් සහතික කරන ලදී.
- **ප්‍රධාන කළමණාකරණ තනතුරුවල උසස්වීම්/පත්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම:** බැංකු සහ බැංකු නොවන ප්‍රවාහයන් හරහා උසස්වීම් හෝ පත්වීම් සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමේදී, සම්මුඛ පරීක්ෂණ සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් අනුගමනය කරන ලදී. මෙම සම්මුඛ පරීක්ෂණවල අරමුණ වූයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ භූමිකාවන් සඳහා අවශ්‍ය විශේෂඥතාව, නායකත්ව හැකියාවන් සහ සංවිධානාත්මක වටිනාකම් සමඟ පෙළගැස්වීම ඇති පුද්ගලයින් හඳුනා ගැනීමයි.

# අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව



- **තෝරා ගැනීමේ ක්‍රමවේදය නිර්ණායකයන් සකස් කිරීම:** සාධාරණ සහ කුසලතා මත පදනම් වූ ඇගයීම් ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා පැහැදිලි සහ වෛෂයික තේරීම් නිර්ණායක භාවිතා වන ක්‍රමානුකූල ක්‍රමවේදයක් ස්ථාපිත කරන ලදී.
- **අඛණ්ඩ නායකත්වයන් ශක්තිමත් කිරීම සඳහා කඩිනම් අභ්‍යන්තර උසස්වීම්:** වසර තුළ, කමිටුව බැංකුවේ අනුප්‍රාප්තික සැලසුම්කරණ රාමුවට අනුකූලව අභ්‍යන්තර උසස්වීම් කඩිනම් කිරීමට පියවර ගත්තේය. මෙම මුලපිරීමේ අරමුණ වූයේඉහළ කාර්යසාධනයක් ඇති සේවකයින් හඳුනාගෙන ඔවුන්ට ප්‍රතිලාභ ලබා දීම සහ තීරණාත්මක පුරප්පාඩු කාලෝචිත ලෙස පිරවීම සහතික කිරීම, එමඟින් නායකත්ව අඛණ්ඩතාව ශක්තිමත් කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයි.
- **බැංකුවේ කටයුතු වෙනුවෙන් අවශ්‍ය විශේෂ ප්‍රාගුණ්‍යය ලබා ගැනීමට බාහිර උපදේශකවරයෙකුගේ සහභාගීත්වය:** බැංකුවේ අභ්‍යන්තර හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා, කමිටුව විසින් කොන්ත්‍රාත් පදනමක් මත බාහිර උපදේශකයින් දෙදෙනෙකු සම්බන්ධ කර ගැනීම අනුමත කරන ලද අතර, එමඟින් බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා සමඟ සමපාත වන විශේෂිත ප්‍රාගුණ්‍යතාවයක් බැංකුවට ලැබෙණු ඇත. මෙම මුලපිරීම අරමුණු කර ඇත්තේ ස්වාධීන ඉදිරිදර්ශන සහ ක්ෂේත්‍රයේ විශේෂිත දැනුමෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය පොහොසත් කිරීම, එමඟින් බැංකුවේ දිගුකාලීන ඉලක්ක සහ මෙහෙයුම් විශිෂ්ටත්වයට සහාය වීමයි.

## 2025 සහ ඉන් ඔබ්බට අවධානය යොමු කිරීම

- ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් KMPs සම්බන්ධ කරුණු පිළිබඳ සමාලෝචනය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම.
- අනුප්‍රාප්තික සැලසුම සහ බැංකුවේ පිළිපැදීම අඛණ්ඩව අධීක්ෂණය කිරීම.
- ප්‍රඥප්තියේ වගකීම් ඉටු කිරීම

## කමිටුවේ ඇගයීම

කමිටුවේ කාර්යක්ෂමතාවය පිළිබඳ වාර්ෂික ඇගැයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.



**එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මහතා**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

2025 මාර්තු 25
කොළඹදී

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව





**ජූඩ් නිලුක්ෂාන් මහතා**
සභාපති
**අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව**

**කමිටුවේ සංයුතිය**
සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

| නම | සාමාජික තත්ත්වය | සහභාගිවීමට සුදුසු | සහභාගිවීම් |
|---|---|---|---|
| ජූඩ් නිලුක්ෂාන් මයා ** | සභාපති | 08 | 07 |
| එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා * | සාමාජික | 08 | 07 |
| අශේන් ජයසේකර මයා * | සාමාජික | 08 | 08 |

* විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ ** විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 160 සිට 162 දක්වා ඇතුළත්ය.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරී මෙම කමිටුවෙහි නිත්‍ය සාමාජිකයින් වේ.

**ආරාධනය මත නිතිපතා සහභාගි වූ නිලධාරීන්**
බැංකුවේ අනුකූලතා නිලධාරියා, ආරාධනය මත නිතිපතා සහභාගි වනු ලැබිණි.
සෙසු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් හා ප්‍රධාන කළමනාකරුවන්ද අවශ්‍ය පරිදි කමිටු රැස්වීම්වලට සහභාගිවීම සිදු වෙයි.

**ගණපූරණය**
අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකි.

**කමිටුවේ ලේකම්**
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

## කමිටුවේ ප්‍රඥප්තිය

1988 අංක 30 දරන බැංකු පනතට අනුව, මුදල් මණ්ඩලයට පැවරී ඇති බලය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය සඳහා වන 2007 අංක 12 දරන බැංකු පනතේ උපදෙස්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) පිහිටුවා ඇත

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කමිටු ප්‍රඥප්තියේ පහත් කරුණු ඇතුලත් වේ.

- බැංකුව විසින් අනුමත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ අනෙකුත් අවදානම් ආශ්‍රිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව වරින් වර යාවත්කාලීන කිරීම.
- බැංකුව මුහුණ දෙන සියලුම ණය, වෙළඳපොළ, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් හඳුනාගෙන, ඒවා ගණනය කොට, අධීක්ෂණය නිසි ලෙස ලෙස කළමනාකරණය කිරීම තහවුරු කිරීම.
- වගකිවයුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු ලබාගෙන කමිටුවට පවරා ඇති අධිකාරි සහ වගකීමේ රාමුව තුළ මණ්ඩලයට සුදුසු නිර්දේශ ඉදිරිපත් කරන්න.
- නව මෙහෙයුම් සංවර්ධනයන්හි අවදානම සහ එම ගැටළු වලට අදාළ අනුකූලතාවය හඳුනා ගැනීම, සමාලෝචනය කිරීම, වාර්තා කිරීම සහ නිර්දේශ කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බාසල් 111 නියෝග ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අනුකූල වීම සමාලෝචනය කිරීම.

බැංකුවට අදාළ අවදානම් සහ අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති, වාර්තා සහ යෝජනා කමිටුව සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව එහි විධානය තුළ යෝජනා සඳහා අනුමැතිය ලබා දෙන අතර මණ්ඩලය විසින් පරීක්ෂා කිරීමට අවශ්‍ය වන යෝජනා/වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරයි.

අවදානම් කළමනාකරණය පිළිබඳ අදාළ පරිච්ඡේදය/කොටස බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයන් සහ එහි වැදගත්කම පිළිබඳ සවිස්තරාත්මක හැඳින්වීමක් ඉදිරිපත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය, අනුකූලතා අංශ සහ අනෙකුත් මෙහෙයුම් අංශ විසින් එහි වගකීම් ඉටු කිරීම මගින් සහාය දක්වයි.

## අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

BIRMC එහි රැස්වීම්වල සවිස්තරාත්මක වාර්තාද ඇතුළුව එහි ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජු වාර්තා සපයයි. එහිදී අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර විගණනය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර බාධාවකින් තොරව සන්නිවේදනය සහ සහයෝගීතාවය වර්ධනය කරමින් විනිවිදභාවය සහ එලදායිතාවය සහතික කරයි. තවද සෑම විටම කමිටු ප්‍රඥප්තීන්ට අනුකූලව කටයුතු කරන බවද සහතික වෙයි.

## 2024 වර්ෂය තුළ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, කාර්තුමය පදනමින් රැස්වන නමුත් අවශ්‍යතා මත පදනම්ව, ඒ අනුව රැස්වීම් නියම කරමින් පවතීග 2024 වර්ෂය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව රැස්වීම් 08ක් කැඳවා ඇත.

බැංකුවට අහිතකර ලෙස බලපෑ හැකි මෙහෙයුම්, ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව වැනි සියලුම ප්‍රධාන අවදානම් කමිටුව විසින් තක්සේරු කරයි. අවදානම් කළමනාකරණය සඳහා එහි ව්‍යවස්ථාපිත, විශ්වාසනීය සහ නියාමන වගකීම් ඉටු කිරීම සඳහා එය ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ මණ්ඩලය සමග සමීප සබඳතාවක් පවත්වාගෙන යයි.

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව



අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සඵලතාවය බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබේ.

- බැංකුවේ අවදානම් රුචිය, ඉවසීමේ සීමා සහ බැංකුවේ අවදානමේ විවිධ පැති ඉස්මතු කරන අනෙකුත් වාර්තා පිළිබඳ වාර්තා සමාලෝචනය (එනම්, ණය අවදානම, වෙළෙඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම, මානව සම්පත් අවදානම, තාක්ෂණික අවදානම, සයිබර් ආරක්ෂණ අවදානම ආදිය).
- විවිධ අවදානම් සීමා සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අනුමැතිය ලබා දීම.
- ICAAP ලේඛනයේ විගණන කරුණුවලට අනුකූලව කර්මාන්තයේ ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන රෙගුලාසි/මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සපුරාලීම සඳහා බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රියාමාර්ග සහ ප්‍රමිතිවල ප්‍රමාණවත්භාවය සමාලෝචනය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඔවුන්ගේ පරීක්ෂණයේදී මතු කරන ලද අධීක්ෂණ ගැටලු නිවැරදි කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය පසුවිපරම් කිරීම.
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, මූල්‍ය වංචා, වංචා අවදානම් කළමනාකරණය වැනි බැංකුවේ ප්‍රධාන ගැටලු පිළිබඳ කාලානුරූප වාර්තා සමාලෝචනය කිරීම - විස්ල් බ්ලොවින්ග් ප්‍රතිපත්තිය.
- බැංකුවේ අනුකූලතා තක්සේරු කිරීම් සහ උකස් තැබීම, ණය, මානව සම්පත් කළමනාකරණය, KYC (ඔබේ පාරිභෝගිකයා දැන ගන්න) අවශ්‍යතා පවත්වා ගැනීම වැනි එහි මූලික කාර්යයන් පිළිබඳ සමාලෝචනය.
- බාසල් iii ප්‍රමිතීන්ට අනුකූලව බැංකුවල තත්ත්වය පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණය සහ සමාලෝචනය.

## 2025 සහ ඉන් ඔබ්බට අවධානය යොමු කිරීම

- සාර්ව හා ක්ෂුද්‍ර පාරිසරික සාධකල වෙළඳපල, දේශීය සහ ජාත්‍යන්තර අවදානම් සාධක කෙරෙහි අවධානය යොමු කිරීම අඛණ්ඩව සිදු කිරීම.
- බැංකුවේ අවදානම් සහ අනුකූලතා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණය.
- අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයේ දේශීය මෙන්ම ජාත්‍යන්තර ප්‍රවණතා තක්සේරු කිරීම.
- අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව සඳහා වෙළඳපළ ප්‍රමුඛතා ප්‍රකාර හා වෙනස්වන නියාමන අවශ්‍යතා මත පදනම්ව බැංකුවේ ප්‍රවේශය කෙරෙහි දිගටම අවධානය යොමු කිරීම.

## කමිටුවේ කාර්යසාධන ඇගැයීම

කමිටුවේ කාර්යක්ෂමභාවය පිළිබඳ වාර්ෂික ඇගයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.



**ජූඩ් නිලුක්ෂාන් මහතා**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2025 මාර්තු 25
කොළඹදී

# හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව





**ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්**
සභාපති
**හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව**

**කමිටුවේ සංයුතිය**

සාමාලෝචනයට බඳුන් වූ වසර තුළ හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

| නම | සාමාජික තත්ත්වය | සහභාගිවීමට සුදුසු | සහභාගිවීම් |
|---|---|---|---|
| ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල් * | සභාපති | 06 | 06 |
| ජුඩ් නිලුක්ෂාන් මයා ** | සාමාජික | 06 | 05 |
| දුෂ්‍යන්ත බස්නායක මයා ** | සාමාජික | 06 | 06 |

* විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ ** විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 160 සිට 162 දක්වා ඇතුළත්ය.

**ආරාධනය මත නිතිපතා සහභාගි වූ නිලධාරීන්**

ආරාධනය මත නිතිපතා රැස්වීම්වලට සහභාගිවූ නිලධාරීන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් කමිටුවට අවශ්‍ය තොරතුරු සපයන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන අවස්ථාවන්හි දී හැර අනෙකුත් සියලු රැස්වීම්වලට සහභාගී වේ.

**ගණපූරණය**

අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකි.

**කමිටුවේ ලේකම්**

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

## හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ප්‍රඥප්තිය

2023 පෙබරවාරි 02 දිනැති 2023 අංක 01 දරන බැංකු පනතේ අංක 3.5 වගන්තිය මගින් බලපත්‍රලාභී බැංකුවලට එකී බැංකුවක් විසින් දරනු ලබන යම් හදිසි නොවන සහ/හෝ අත්‍යවශ්‍ය නොවන සහ/හෝ ප්‍රාග්ධන වියදම් වෙතොත් එය තත්සේරු කිරීමේ හා අනුමත කිරීමේ වගකීම සහිත අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවක් 2023 සහ 2024 වර්ෂයන්හි පිහිටුවා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මතු කරන ලදී. ඒ අනුව ඉහත විධානය හා අනුකූල වෙමින් බැංකුව විසින් හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක් බැංකුව විසින් පිහිටුවන ලදී.

## කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

ප්‍රඥප්තිය අනුව කමිටුවේ කාර්යභාරය සහ වගකීම් පහත කරුණු වලින් සමන්විත වේ:

(අ) හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවේ පූර්ව අනුමැතිය අවශ්‍ය වියදම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්තියෙහි සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කිරීම.

(ආ) 2023 හා 2024 යන වර්ෂ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලද බැංකුවේ හදිසි නොවන සහ/හෝ අත්‍යවශ්‍ය නොවන වියදම් සහ/හෝ ප්‍රාග්ධන වියදම්, පිරිවැයට සාපේක්ෂව ඵලදායී බැව් දැඩිව සාධාරණීයකරණය කළ හැකි වියදම් බවට සහතිකවීම සහ ඒ සම්බන්ධයෙන් මෙම කමිටුවේ අනුමැතිය ලබා ගැනීම.

(ඇ) 2023 හා 2024 වර්ෂ සඳහා බැංකුව විසින් අනවශ්‍ය පිරිවැය නොදරනු ලබන බවට සහ පමණ ඉක්මවා වියදම් නොකරන බව වගබලා ගැනීම.

## 2024 වර්ෂයට අදාල ක්‍රියාකරකම්

2024 දෙසැම්බර් (31) දිනෙන් අවසන් වූ වර්ෂය තුළ, (BNNEC) රැස්වීම් හයක් (06) පවත්වන ලදී.

2024 වර්ෂය සඳහා බැංකුවේ ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් දූරදර්ශී ප්‍රවේශයක් කමිටුව විසින් සහතික කරන ලදී. අත්‍යවශ්‍ය සහ හදිසි යැයි සැලකෙන පිරිවැය පමණක් දැඩි ලෙස සමාලෝචනය කර අනුමත කරන ලදී. මූල්‍ය විනය පවත්වා ගැනීමට සහ සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීමට අත්‍යවශ්‍ය නොවන වියදම් හිතාමතාම වළක්වා ගන්නා ලදී.මෙම තීරණායකයන් මෙහෙයුම් අඛණ්ඩතාවය පවත්වා ගැනීමටත් උපායමාර්ගික අරමුණු සපුරා ගැනීමටත් අවශ්‍ය තීරණාත්මක වියදම් සඳහා අවසර ලබා දෙන අතරම බැංකුවේ යහපත් මූල්‍ය තත්ත්වයක් පවත්වා ගැනීම අරමුණු කර ගෙන ඇත. කමිටුව විසින් සපයනු ලබන අධීක්ෂණය, බැංකුවේ ප්‍රඵලම මූල්‍ය අවශ්‍යතා සමඟ මූල්‍ය වගකීම සමතුලිත කිරීම සඳහා එහි කැපවීම පිළිබිඹු කරයි.

## කමිටුවේ කාර්යසාධන ඇගැයීම

කමිටුවේ කාර්යක්ෂමභාවය පිළිබඳ වාර්ෂික ස්වයං ඇගයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.

මෙම වාර්තාව නිවැරදි බවත්, එහි කිසිදු ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශනයක් නොමැති බවත් කමිටුව තහවුරු කරයි.

**ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්**
සභාපති
හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව

2025 මාර්තු 25
කොළඹදී

# අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික තොරතුරු තාක්ෂණ කමිටුවේ වාර්තාව





**දුෂ්‍යන්ත බස්නායක මයා**
සභාපති
**අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික තොරතුරු තාක්ෂණ කමිටුවේ වාර්තාව**

**කමිටුවේ සංයුතිය**

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික තොරතුරු තාක්ෂණ කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

| නම | සාමාජික තත්ත්වය | සහභාගිවීමට සුදුසු | සහභාගිවීම් |
|---|---|---|---|
| දුෂ්‍යන්ත බස්නායක මයා ** | සභාපති | 06 | 06 |
| ජූඩ් නිලුක්ෂාන් මයා ** (19 මාර්තු 2024 - 27 මාර්තු 2024) | සාමාජික | 03 | 01 |
| එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා * | සාමාජික | 06 | 06 |
| අශේන් ජයසේකර මයා * | සාමාජික | 06 | 06 |

* විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ   ** විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 160 සිට 162 දක්වා ඇතුළත්ය.

**ආරාධනය මත නිතිපතා සහභාගි වූ නිලධාරීන්**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී කමිටුවට තොරතුරු සපයන අතරආරාධනයෙන් කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

**කමිටුවෙහි ලේකම්**

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ල අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික තොරතුරු තාක්ෂණ කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි.

## අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික තොරතුරු තාක්ෂණ කමිටු ප්‍රඥප්තිය

1988 අංක 30 දරන බැංකු පනතේ 76 J (1) වගන්තිය යටතේ සංශෝධිත පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය, 2007 අංක 12 දරන බැංකු පනතේ උපදෙස්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික තොරතුරු තාක්ෂණ කමිටුව පිහිටුවා ඇත.

තොරතුරු තාක්ෂණය කෙරෙහි බැංකුවේ විශ්වාසය සහතික කිරීම සහ තොරතුරු හා සන්නිවේදනතාක්ෂණය (ICT)ට අනුකූලව බැංකුවේ උපාය මාර්ගික අරමුණු අධීක්ෂණය කිරීම සඳහා මෙම කමිටුව පිහිටවනු ලැබීය.

## කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

බැංකුවේ තොරතුරු තාක්ෂණ පාලන රාමුව සමාලෝචනය කිරීම, වැඩිදියුණු කිරීම සහ අනුමත කිරීම සහ වෙළඳපොලේ ප්‍රවණතා සහ අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා නව තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සකස් කිරීම. නිසි පිරික්සුම් ක්‍රියාවලියක් සහතික කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ව්‍යාපෘති සහ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික තොරතුරු තාක්ෂණ කමිටුව විසින් අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සමඟ සුමට සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සහ බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධති වල ආරක්ෂාවේ ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම අවශ්‍ය වේ.

## 2024 වර්ෂය තුළ කමිටුව විසින් සිදු කළ ක්‍රියාකාරකම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ, කමිටු රැස්වීම් හයක් පවත්වන ලදී.

- බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන යෝජනා කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී.
- කමිටුවේ ප්‍රඥප්තිය සමාලෝචනය කර ඊට අදාලව වැඩි දියුණු කිරීමේ යෝජනා අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී.
- ගනුදෙනුකරුවන්ගේ දත්ත සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය සියලු ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වන බව සහතික කළේය.

## 2025 සහ ඉන් ඔබ්බට අවධානය යොමු කිරීම

- පරිණාමය වන පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සහ තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා නවෝත්පාදනයන් මෙහෙයවීම: නියාමන අවශ්‍යතා සපුරාලන අතරම, වෙළඳපොලේ තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා ගතික පාරිභෝගික ඉල්ලීම්වලට අනුවර්තනය වෙමින්, තාක්ෂණික නවෝත්පාදනයන්හි ඉදිරියෙන්ම බැංකුව රැඳී සිටින බව සහතික කිරීම සඳහා අඛණ්ඩ සුපරීක්ෂාකාරීත්වයක් පවත්වා ගැනීම.
- සයිබර් ආරක්ෂණ සූදානම: වර්ධනය වන සයිබර් ආරක්ෂණ තර්ජන ආමන්ත්‍රණය කිරීම සහජ්වයින් බැංකුව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික පියවරයන්ට අඛණ්ඩව ප්‍රමුඛත්වය දීම.
- තොරතුරු තාක්ෂණ පාලන රාමුව: මෙහෙයුම් වල සිදුවෙන වෙනස්කම් වලට ඔරොත්තු දීමේ හැකියාව, අනුකූලතාවය සහ තිරසාර නවෝත්පාදනයන් සඳහා සහය වීමේ හැකියාව සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පාලන රාමුව ශක්තිමත් කිරීම.

## කමිටුවේ කාර්යසාධන ඇගැයීම

කමිටුවේ කාර්යක්ෂමභාවය පිළිබඳ වාර්ෂික ස්වයං ඇගයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.

මෙම වාර්තාව නිවැරදි බවත්, එහි කිසිදු ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශනයක් නොමැති බවත් කමිටුව තහවුරු කරයි.



**දුෂ්‍යන්ත බස්නායක මයා**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික තොරතුරු තාක්ෂණ කමිටුවේ වාර්තාව

2025 මාර්තු 25
කොළඹදී

**සංකීර්ණ අවදානම් වාතාවරණයක් තුළ අවදානම් කළමනාකරණය කිරීමේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රවේශය**

2024 දී ආර්ථික ප්‍රතිසාධනය සමඟ සම්බන්ධ වූ අවදානම් කළමනාකරණය සහ ණය අයකිරීමේ උපායමාර්ග හේතුවෙන්, පසුගිය වර්ෂවල ඇති වූ ආර්ථික අභියෝග මත හටගත් පීඩන තත්ත්වයන් මධ්‍යයේ වුවද, සිය අවදානම් අභිරුචි මට්ටම් නුඹුන්වත් දර්ශක තුළ සාක්ෂාත් කර ගැනීමට බැංකුව සමත් විය.

## බාහිර පරිසරය

බැංකුවේ මෙහෙයුම්වලට බලපෑම් කරන වඩාත් තීරණාත්මක බාහිර සාධකයන් තුළ ආර්ථික දර්ශක ඇතුළත් වන අතර, එය අවසානයේ ලාභ තත්ත්වයන් හා ශේෂ පත්‍රයේ ගුණාත්මකභාවය සඳහා බලපෑම් ඇති කරයි. 2024 දී, ශ්‍රී ලංකා ආර්ථිකය ආර්ථික බිඳවැටීමෙන් පුනර්ජීවය ලබමින් සිටින සංඥා පෙන්වා ඇති අතර, එය මූල්‍ය ස්ථායිකරණය, සහ මූල්‍ය ප්‍රතිසංස්කරණ ඇතුළුව ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති තීරණවලින් මූලිකවම ඇති කරන ලදි. ඊට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයලබන වැඩසටහන් සහ ණය තිරසාර විශ්ලේෂණ (DSA) යටතේ රජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණ උත්සාහයන් දිගු කාලීන ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමට දායක විය.

රටේ දේශපාලනික පරිසරය තුළ සිදුවූ සැලකියයුතු වෙනස්වීම් වඩාත් විනිවිද සහ ඔරොත්තුදෙන ආර්ථික අනාගතයක් කරා මහජන හැඟීම වර්ධනය කරන ලදි. ජනාධිපතිවරණයෙන් පසු, ස්කන්ධ සහ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොල තුළ ශුද්ධ මිලදී ගන්නන් ලෙස විදේශීය ආයෝජකයින් පැමිණීම තුළින් ආයෝජක විශ්වාසය වර්ධනීය සංඥාවන් පෙන්වා ඇත. ශ්‍රී ලංකාව විසින් දෙසැම්බර් 26න් අවසන් වූ 2024 වසරේ අවසාන අඛණ්ඩ සති 15 තුළ, රජයේ සුරැකුම්පත්වල රු. බිලියන 29.9ක (ඇ.ඩොලර් මිලියන 103.1) මුළු ගලාඒමක් වාර්තා කළේය.

කොළඹ කොටස් හුවමාරුව (CSE) රු. ට්‍රිලියන 5.69ක වාර්තාසහගත වෙළෙඳපොල ප්‍රාග්ධනීයකරණයක් සමඟ වසර අවසන් කරන ලද අතර, එය පසුගිය වසරේ සිට 34%ක වැඩිවීමක් පිළිබිඹු කරයි. විදේශීය සහභාගිත්වය සැලකියයුතු ලෙස වැඩි වූ අතර 2024 වසර තුළ මුළු වෙළෙඳපොල පිරිවැටුමෙන් ආසන්න වශයෙන් 10%ක් සඳහා එය දායක විය.

මෙම අගය වසංගත වර්ෂය එනම් 2021 හි වාර්තාකළ මට්ටමෙන් දෙගුණයකටත් වඩා වැඩි අගයකි. මෙවැනි ප්‍රවනතා වැඩි වූ දේශපාලන ස්ථාවරත්වය සහ අපේක්ෂිත ආර්ථික ප්‍රතිසංස්කරණ මඟින් ඇති කරන ලදි.

ආයතනික පාලනය ශක්තිමත් කිරීම අරමුණු කරමින් බැංකු ක්ෂේත්‍රය තුළ පනවන ලද නව රෙගුලාසි වඩාත් වගවීම සහ වගකීම්සහගත බැංකු පරිචයන් පෝෂණය කිරීමේදී අත්‍යවශ්‍ය බවට පත් වී ඇත.

ණයගැතියන් ඔවුන්ගේ ණය බැඳීම් සපුරාලීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දුන් බැවින්, පැවති අභියෝගාත්මක සාර්ව ආර්ථික පරිසරය වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම කරා මෙහෙයවන ලදි. මෙය විසඳීම සඳහා, අක්‍රිය ණය ගැතියන්ගේ තිරසාර අයකිරීමට සහයවීමට සහ වත්කම්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට ව්‍යාපාර පුනර්ජීව ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා නියාමක විසින් මාර්ගෝපදේශ නිකුත් කරන ලදි.

අයහපත් කාලගුණික සිදුවීම් සහ මුහුදු මට්ටම ඉහළයාම ඇතුළුව දේශගුණික විපර්යාසවල වේගවත්වන බලපෑම්වලට ආර්ථිකය, මිහිතලයේ පරිසරය සහ මානව ශිෂ්ටාචාරය වැඩි වැඩියෙන් ගොදුරු වේ. මේවා නොවිසඳන්නේනම්, දේශගුණික අවදානම් ව්‍යාපාර කෙරෙහි සැලකියයුතු ලෙස බලපෑ හැකි අතර, විශේෂයෙන් කෘෂිකර්මය, සංචාරක කර්මාන්තය, සහ වෙරළබඩ කර්මාන්තවල ලාභදායිතාව අඩුකිරීම සහ මෙහෙයුම් පිරිවැය වැඩි කිරීමට හේතු විය හැකිය.

ආසියානු සංවර්ධන බැංකුවට අනුව, දේශගුණයට අදාළ බිඳවැටීම් හේතුවෙන් 2050 වන විට වාර්ෂිකව දකුණු ආසියාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.2%ක් දක්වා අඩුවිය හැකි අතර, අවම කිරීමේ සහ උපායමාර්ග යොදා ගැනීම සඳහා ඇති හදිසි අවශ්‍යතාව ඉන් තහවුරු වේ.

එයට ප්‍රතිචාරාත්මකම, සමාලෝචිත වසර තුළ හරිත බැංකුකරණ මූලපිරීම් සහ තිරසාර මූල්‍යකරණය ප්‍රවර්ධනය කරමින් බැංකුව සිය පාරිසරික බලපෑම අවම කිරීමට පියවර ගෙන ඇත.

තාක්ෂණය සහ නව්‍යකරණය තුළ ප්‍රගමනයන් බැංකුකරණය තුළ නව වර්ධන අවස්ථා අඛණ්ඩව නිර්මාණය කරන අතර, සේවා කාර්යක්ෂමතාව වර්ධනය කරයි. කෙසේවෙතත්, ඒවා සැලකියයුතු සයිබර් ආරක්ෂක තර්ජන ද හඳුන්වා දේ. මෙවැනි අවදානම් අවම කිරීම සඳහා, සේවකයින්, පද්ධති සහ ක්‍රියාවලි ආරක්ෂා කිරීමට ශක්තිමත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදි.

2024 දෙසැම්බර් මැද දී, ශ්‍රී ලංකාව බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණ (EDR) ක්‍රියාවලියේ කොටසක් ලෙස, නව රුපියල් භාණ්ඩාගාර බැඳුම්කර අටක් නිකුත් කරමින් දේශීය බැඳුම්කර විකල්පය යටතේ ඇමෙරිකානු ඩොලර් බිලියන 12.55ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISBs) හුවමාරුව සාර්ථකව අවසන් කරන ලදි.

මෙම ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු, 2024 අවසානය වන විට, ෆිට්ච් සහ මූඩීස් විසින් ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය මුදල් පැහැර හැරීමේ අනුපාත (IDR) පිළිවෙළින් CCC+ සහ Caa1 වශයෙන් ශ්‍රේණිගත කිරීම් ඉහළ දමා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඍජු හා වක්‍ර ආයෝජන වැඩිවනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය බැංකු ක්ෂේත්‍රයට ධනාත්මකව බලපෑම් කරමින් රජයේ ආර්ථික ස්ථාවරත්වයට දායක වේ.

## අවදානම් කළමනාකරණ රාමුව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය යනු බැංකුව තුළ අවදානම් හඳුනාගැනීමේ, කළමනාකරණය කිරීමේ සහ සන්නිවේදනය කිරීමේ අඛණ්ඩ, පූර්වගාමී, සහ ක්‍රමානුකූල ක්‍රියාවලියකි. එය බැංකුවේ සෑම මට්ටමකම විභව අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට නිරතුරුව සම්බන්ධ වන අතර, දැනුවත් තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම සඳහා වඩා ඉහළ මට්ටම්වලට ප්‍රතිඵල සන්නිවේදනය කරයි.

ඵලදායි අවදානම් කළමනාකරණ රාමුවක් නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාවය සහතික කිරීම පමණක් නොව එය ඔරොත්තු දීම ශක්තිමත් කර තිරසාර ව්‍යාපාර ආදර්ශයකට සහය වේ. විවිධ අවදානම් හඳුනාගනිමින්, තක්සේරු කරමින්, පාලනය කරමින් සහ නියාමනය කරමින්, බැංකුවලට වියහැකි මූල්‍ය කම්පනවලින් තමන් ආරක්ෂා කරගෙන තීරණ ගැනීම වැඩිදියුණු කරගත හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව (IRMF) ස්ථාපිත කර අධීක්ෂණය කිරීම සඳහා අවසාන වගකීම දරන අතර එම රාමුවට පද්ධති, ව්‍යුහයන්, ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ සේවකයින් සහය වේ.

# අවදානම් කළමනාකරණ වාර්තාව



ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමඟ අනුකූලතාව සංවර්ධනය කර නියාමනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (BIRMC) බලතල පවරා ඇත. මෙම කමිටුව සිය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරන්තරව වාර්තා කරයි.




රූපය 21 අවදානම් කළමනාකරණ රාමුව

| අවදානම් කළමනාකරණය | ණය අවදානම | වෙළෙඳපොළ අවදානම | මෙහෙයුම් අවදානම |
|---|---|---|---|
| ප්‍රතිපත්ති | ඒකාබද්ධ අවදානම් කළමනාකණ ප්‍රතිපත්තිය<br>ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය | අවදානම් කළමනාකරණ අනාවරණ ප්‍රතිපත්තිය | ICAAP කළමනාකරණ ප්‍රතිපත්තිය<br>ආකෘති අවදානම් කළමනාකණ ප්‍රතිපත්තිය |
| | ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය | වෙළෙඳපොළ හා ද්‍රවශීල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ය | මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය |
| අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු ප්‍රවේශ | • අවදානම් සීමාවන් නියාමනය කිරීම<br>• අභ්‍යන්තර ශ්‍රේණිගතකරණ ආකෘති<br>• පූර්ව අවදානම් ඇඟවීමේ දර්ශක<br>• අවස්ථා විශ්ලේෂණය<br>• ආතති පරීක්ෂණය | • අවදානම් සීමාවන් නියාමන කිරීම<br>• අවදානමේදී අගය (VaR)<br>• M – Duration<br>• සංවේදීතා විශ්ලේෂණය<br>• අවස්ථා විශ්ලේෂණය<br>• ආතති පරීක්ෂාව | • අවදානම් සීමාවන් නියාමනය කිරීම<br>• අලාභ සිදුවීම් දත්ත විශ්ලේෂණය<br>• සිදුවීම් නියාමනය<br>• ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය<br>• මූල හේතු සහ අවස්ථා විශ්ලේෂණය<br>• ආතති පරීක්ෂාව<br>• අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව (RCSA)<br>• ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (OKRTs) |
| කළමනාකරණය/ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටම්වලට වාර්තා කිරීම | • අවදානම් අභිරුචි උපකරණ පුවරුව<br>• පූර්ව අවදානම් ඇඟවීමේ දර්ශක<br>• ණය අවදානම් සමාලෝචනය<br>• ණය සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳ වාර්තා<br>• අක්‍රීය ණය අධීක්ෂණය සහ විශ්ලේෂණය | • අවදානම් අභිරුචි උපකරණ පුවරුව<br>• කොටස් අවදානම් සමාලෝචනය<br>• විදේශ මුදල් අවදානම් සමාලෝචනය<br>• පොලී අනුපාත අවදානම් සමාලෝචනය<br>• ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ සමාලෝචනය<br>• ද්‍රවශීලතා අවදානම් සමාලෝචනය | • අවදානම් අභිරුචි උපකරණ පුවරුව<br>• අලාභ සිදුවීම් විශ්ලේෂණය<br>• ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක උපකරණ පුවරුව<br>• අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව වාර්තා<br>• මූල හේතු විශ්ලේෂණය<br>• ගනුදෙනුකාර පැමිණිලි විශ්ලේෂණය<br>• ව්‍යාපාර බිඳවැටීම් සහ පද්ධති දෝෂ පිළිබඳ වාර්තාව |

වගුව 31 → අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ඒකාබද්ධ අනදාකම් කළමනාකරණ රාමුව තුළ ප්‍රවේශ හා වාර්තා

## ඒකාබද්ධ අවදානම් කළමනාකරණයː ප්‍රතිපත්ති රාමුව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මඟින් බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව අර්ථ දක්වන අතර එයට මූලික අවදානම් ක්ෂේත්‍ර, අවදානම් කළමනාකරණ ප්‍රවේශ සහ වාර්තාකරණ අවශ්‍යතා සඳහා වෙන් වූ ප්‍රතිපත්ති ඇතුළත්ය.

අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මඟින් බැංකුව ප්‍රමාණාත්මක අවදානම් හඳුනාගැනීම, මැනීම, ඇගයීම, නියාමනය, වාර්තාකරණය, සහ පාලනය කරන ආකාරය ලේඛනගත කරයි. එමෙන්ම එය පාලන යාන්ත්‍රණ හා අවදානම පාලනය සඳහා වගකියන කමිටු අර්ථ දක්වයි.

## අවදානම් කළමනාකරණ උපායමාර්ගයː අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රවේශ

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ උපායමාර්ගය තුළින් බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සාක්ෂාත්කර ගැනීමට සහයවීමට අවදානම් කාර්යය ව්‍යුහගත කරන ආකාරය විස්තර කරයි. එමෙන්ම එය ව්‍යාපාර උපායමාර්ගයෙන් ඇති වන අවදානම් කළමනාකරණ සඳහා ප්‍රවේශය අර්ථ දක්වන අතර අදාළ රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට යොමු වෙමින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව විසින් සෑම ප්‍රමාණාත්මක අවදානමක්ම ආමන්ත්‍රණය කරන ආකාරය පිළිබඳ දළ සැලැස්මක් ලබා දේ. අවදානම හඳුනාගැනීම සහ අවදානම් ප්‍රවේශවල විස්තීර්ණ කට්ටලයක් මඟින් අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණය තීරණය කිරීම සඳහා ආවේනික අවදානම්, ක්‍රියාත්මක පවතින පාලන මට්ටම් සහ ශේෂ වූ අවදානමට නිරාවරණය පිළිබඳ අවබෝධය ඇති කරයි.

අවදානම් කළමනාකරණය මඟින් බැංකුව තුළ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, නියාමනය සහ අවම කිරීම සඳහා විවිධ ක්‍රියාවලි, ආකෘති හා මෙවලම් ඒකාබද්ධ කරයි. මෙවැනි උපාංග අවදානම පදනම් තීරණ ගැනීමට සහය වන අතර, මහ බැංකුව විසින් නියම කළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ වෙනත් විචක්ෂණ අවශ්‍යතා සමඟ අනුකූලතාව සහතික කරයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව



1 අවදානම හඳුනාගැනීම

එලදායී අවදානම් කළමනාකරණ උපායමාර්ග සංවර්ධනයේ පදනම

- ආවේනික අවදානම් අවබෝධකර ගැනීම
- අවදානම් සමාහරණය
- අවදානම් ආදර්ශකරණය හා හිමිකාරිත්වය

2 අවදානම් තක්සේරුව

නිරාවරණය හා බරපතලකම හඳුනා ගැනීම

- ආවේනික අවදානම් ඇගයීම
- පාලනයේ එලදායිත්වය හඳුනා ගැනීම
- ශේෂ වූ අවදානම් තීරණය කිරිම

3 අවදානම් ප්‍රතිචාරය

අවදානම් අවම කිරිමේ යාන්ත්‍රණ සමග ඉහළ අවදානම් ක්ෂේත්‍රවලට ප්‍රතිචාරය

- ප්‍රතිචාර අවශ්‍ය අවදානම් සඳහා පරීක්ෂා කිරිම
- සෑම අවදානමනට ප්‍රතිචාර දැක්වීමේ පියවර ඇගයීම
- අවදානමට ප්‍රතිචාර දැක්වීමට පිරිවැය හා සම්පත් සලකා බැලීම

4 අවදානම් වාර්තාව

නිරන්තර නියාමනය හා වාර්තාකරණය

- අවදානම් මාදිලි හා ප්‍රවනතා විශ්ලේෂණය
- පූර්ණ මට්ටම්වලට අනුව අවදානම් හඳුනාගැනීම්
- අවදානම් හිමිකරුවන්ට, ජ්‍යෝෂ්ඨ කළමනාකාරිත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම්

රූපය 22 අවදානම් කළමනාකරණ මූලධර්ම

## අවදානම් රුචි ප්‍රකාශයː ඉවසුම් සහ පූර්ණ මට්ටම් අර්ථ දැක්වීම

අවදානම් අභිරුචියෙන් බැංකුව සිය උපායමාර්ගික අරමුණුවලට අනුව භාරගැනීමට කැමතිවන අවදානම් මට්ටම් නිර්වචනය කරන අතර මූල්‍ය ස්ථාවරත්වය, නියාමන අනුකූලතාව සහ කීර්තිනාම ආරක්ෂාව ඉන් සහතික කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව තුළ, අවදානම් අභිරුචි රාමුව ක්‍රියාත්මක කිරිම තුළින් කාලීන පාලනය හා නිවැරැදි කිරිමේ ක්‍රියා සහතික කරමින් අවදානම් හඳුනාගැනීම, මැනීම සහ නියාමනය ශක්තිමත් කරයි. අවදානම් අභිරුචි ප්‍රකාශය, නියාමන අවශ්‍යතා සහ බැංකුවේ අවදානම් දැරීමේ හැකියාව සමඟ පෙළ ගැසෙමින්, අවදානම් කළමනාකරණ කටයුතු සඳහා මඟපෙන්වන මූලධර්ම ලෙස කටයුතු කරමින් ඉහළ කළමනාකාරිත්වය සඳහා පැහැදිලි කිරීම් සහ උපදෙස් ලබා දෙයි. වටිනාකම් හා මූල්‍ය ස්ථායිතාව සඳහා අහිතකර බලපෑම් අවම කිරීමට ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රමිති භාවිතා කරමින් ආයතනික මට්ටමේදී අවදානම් අභිරුචිය සකස් කිරිමේදී බැංකුව ඉහළ සිට පහළ දක්වා ප්‍රවේශයක් යොදා ගනී.

| අවධානිත ක්ෂේත්‍ර | දර්ශක | 2024 – සත්‍ය ප්‍රතිශතය | අවදානම් රුචිය අනුව කාර්යසාධනය |
|---|---|---|---|
| ලාභදායිතාව | ශුද්ධ පොලී ආන්තිකය | 4.23 | ✓ |
| | ස්කන්ධය මත ඉපයීම | 18.07 | ✓ |
| | වත්කම මත ඉපයීම | 1.54 | ✓ |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය | CET 1 | 21.71 | ✓ |
| | Tier 1 | 23.42 | ✓ |
| | මුළු ප්‍රාග්ධනය | 25.88 | ✓ |
| ද්‍රවශීලතාව | LCR (රුපියල්) | 351.33 | ✓ |
| | NSFR | 193.53 | ✓ |
| තෝලනය | තෝලන අනුපාතය | 8.00 | ✓ |

අවදානම් මට්ටම

✓ අවදානම් අභිරුචි සීමාව තුළ ✓ උපරිම දරාගැනීමේ සීමාව තුළ
✓ අවම දරාගැනීමේ සීමාවට පහළ

වගුව 32 අවදානම් රුචිමට්ටම් අනුව මූල්‍ය දර්ශක

සියලුම උපායමාර්ගික මට්ටමේ අවදානම් දර්ශක පූර්ව නිශ්චිත අවදානම් රුචි මට්ටම්වලට (RALs) ඉහළින් පැවතුන අතර, බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අයකිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රමාණාත්මතාව සහ එලදායිතාවය පෙන්නුම් කරයි. මෙවැනි ක්‍රියාමාර්ග ආර්ථිකය පහත වැටුණු කාලසීමාව තුළ පරිස්සමින් හා උපායමාර්ගිකව ක්‍රියාත්මක කරන ලදී.

## ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ඇතුළත් කර ගැනීම

අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෝෂ්ඨ කළමනාකාරිත්වය එලදායි නායකත්වය හා අධීක්ෂණය තුළින් ශක්තිමත් අවදානම් සංස්කෘතියක වැදගත්කම තහවුරු කර ඇත. බැංකුවේ ප්‍රතිපත්ති, ක්‍රියාවලි, පද්ධති සහ පුහුණු වැඩසටහන්ව තුළ අවදානම් කළමනාකරණ මූලධර්ම අන්තර්ගත කිරීම මඟින් යහපත් අවදානම් සංස්කෘතියක් පවත්වා ගැනීමට උපකාරි වේ.

බැංකුව තෙවැදෑරුම් ආරක්ෂක මාර්ගයක් යටතේ ක්‍රියාත්මක වේ. සෑම ආරක්ෂක මාර්ගයක් සඳහාම එලදායී  අවදානම් කළමනාකරණයට සහයවීම සඳහා කාර්යභාරයන්, වගකීම් සහ ගමන්මඟ

පැහැදිලිව දක්වා ඇත. මෙම ආදර්ශය අවදානම සෑම කෙනෙකුගේම වගකීමක් වන සංස්කෘතියක් පෝෂණය කරයි.

## තෙවැදෑරුම් ආරක්ෂක මාර්ගය

තෙවැදෑරුම් ආරක්ෂක මාර්ග ආදර්ශය අවදානම් කළමනාකරණය තුළ පුළුල්ව යොදා ගන්නා රාමුවක් වන අතර ඉන් ආයතනය තුළ අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන් ඵලදායිව ක්‍රියාත්මක වන බව සහතික කරයි. මෙම ආකෘතිය අවදානම් කළමනාකරණ වගකීම් එකකට විශේෂිත කාර්යය සහ රාජකාරි සහිත විශේෂ ස්ථර තුනකට බෙදනු ලබයි.

### පළමු ආරක්ෂණ මාර්ගය

මෙහෙයුම් කළමනාකාරිත්වය දෛනික පදනමක් මත අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණට හා පාලනය සඳහා වගකිව යුතුය. මෙයට බැංකුව අවදානමට නිරාවරණය කරන ක්‍රියාවලිය තුළ ඉදිරි සෘජුව සම්බන්ධවන ඉදිරිපෙළ කාර්ය මණ්ඩලය සහ ව්‍යාපාර ඒකක ඇතුළත් වේ. පළමු පෙළේ සේවකයින්ට මෙම අවදානම් කළමනාකරණය කිරීමේ මූලික වගකීම පැවරෙන අතර, දෙවන සහ තෙවන පෙළේ සේවකයින් අධීක්ෂණය කරනු ලැබේ.

### දෙවන ආරක්ෂණ මාර්ගය

අවදානම් කළමනාකරණ අංශය (RMD) සහ අනුකූලතා අංශයෙන් සමන්විත, මෙම ස්ථරය අවදානම් නියාමනය සහ කළමනාකරණ මෙවලම් භාවිතා කරමින් පළමු මාර්ගය අධීක්ෂණය කරයි. අවදානම් කළමනාකරණ අංශය ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීම සඳහා මූලික ඒකක තුනකට ව්‍යුහගත කෙරේ. ණය අවදානම් කළමනාකරණ ඒකකය (CRMU), භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය, (TMO)/වෙළෙඳපොල අවදානම් කළමනාකරණ ඒකකය සහ අවදානම් කළමනාකරණ ඒකකය (MRMU) සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය(ORMU) මෙම ක්ෂේත්‍ර වේ.

### තෙවන ආරක්ෂණ මාර්ගය

අභ්‍යන්තර විගණන අංශය (IAD) පාලනයේ ඵලදායිත්වය, අවදානම් කළමනාකරණය සහ වර්තමාන පද්ධතිමය සහ වෙනස්වන අවදානම් පිළිබඳ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විධායක කමිටුවට ස්වාධීන සහතික ලබා දේ. නියාමන සමාලෝචන සහ බාහිර විගණන මගින් ද පළමු සහ දෙවන ආරක්ෂක මාර්ගවල ප්‍රමාණවත් බව සහ ඵලදායිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන සහතික ලබා දේ.

**1 වැනි ආරක්ෂක මාර්ගය — ව්‍යාපාර සහ සහය සේවා කාර්යයන්**

- අවදානම් සහ පාලන ක්‍රියාපටිපාටි දෛනිකව ක්‍රියාත්මක කිරීම
- අවදානම් අවම කිරීම සඳහා පාලනයන් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම
- අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ පාලනයන් සංවර්ධනය කිරීම සහ යොදා ගැනීම
- අඛණ්ඩ නියාමනය සහ කාලානුරූප සමාලෝචන
- ආයතනික අරමුණු සමඟ කටයුතු අනුරූප බව සහතික කිරීම

ව්‍යාපාර සහ සහය සේවා අංශ

**2 වැනි ආරක්ෂක මාර්ගය — කළමනාකරණය හා අනුකූලතාව**

- අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ සංවර්ධනය කිරීම
- නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම නියාමනය කිරීම.
- පළමු මාර්ගයට සහාය සහ මග පෙන්වීම
- අධ්‍යක්ෂ මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වෙත ස්වාධීන වාර්තාකරණය

අවදානම් හා අනුකූලතා අංශය

**3 වැනි ආරක්ෂක මාර්ගය — සහතික කිරීම**

- අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණාත්මතාව සහතික කිරීම
- ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා උපදේශන කාර්යභාරය
- අධ්‍යක්ෂ මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට (BAC) ස්වාධීන වාර්තාකරණය

අභ්‍යන්තර විගණන අංශය

රූපය 23 ත්‍රිවිධ ආරක්ෂක මාර්ග

## පාලන ව්‍යුහය

අවදානම් පාලන ව්‍යුහයක් කාර්යභාරයන්, වගකීම් සහ ක්‍රියාවලි පිළිබඳ රාමුවක් විස්තර කරන අතර, ඉන් අවදානම් කළමනාකරණය උපායමාර්ගික තීරණ ගැනීම සහ දෛනික මෙහෙයුම්වලට ඒකාබද්ධ කරන බව සහතික කෙරේ. ඵලදායී අවදානම් පාලන ව්‍යුහය ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන අතර, නියාමන අනුකූලතාවය සහතික කර පාර්ශවකාර හිමිකම් සුරක්ෂිත කරයි.

අවදානම් පාලනයේ ඉහළම ප්‍රමිති නගා සිටුවීමට බැංකුව කැපවී සිටින අතර අවදානම් කළමනාකරණ පිළිවෙත් මනා පරිචයන් සමඟ පෙළ ගැසෙන බව සහතික කරයි.

මෙමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ඵලදායිව සහ විචක්ෂණව අවදානමට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමට හැකියාව ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් පාලන ව්‍යුහයේ ඉහළින්ම සිටින අතර, බැංකුව වෙනුවෙන් සමස්ත අවදානම් රුචි සීමා නියම කිරීමේදී මධ්‍යම කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය

# අවදානම් කළමනාකරණ වාර්තාව



අවදානම් කළමනාකරණ රාමුව අනුමත කිරීම සඳහා වගකීමට බැඳී ඇති අතර, බැංකුවට අවදානම් ඵලදායීව කළමනාකරණය සඳහා ප්‍රමාණවත් සම්පත්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇති බව සහතික කරයි. එමෙන්ම එය අවදානම් කළමනාකරණ පරිචයන් හී ඵලදායිත්වය අධීක්ෂණය කර නියාමනය කරන අතර අනුමත අවදානම් රුචි තුළ අවදානම් කළමනාකරණය කරන බව සහතික කරයි. බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් කළමනාකරණය කර වාර්තාකරයි.

අවදානම් අධීක්ෂණයට සහය වීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ ප්‍රධාන අවදානම් කළමනාකරණ කමිටු දෙකක් ස්ථාපිත කර ඇත:

- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)

මෙම කමිටු අවදානම සම්බන්ධ වගකීම් ඉටු කිරීමට සහ අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටිවල ප්‍රමාණවත් බව සහ ඵලදායිත්වය සහතික කරයි.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් කළමනාකරණ කමිටු රාමුවක් ස්ථාපිත කරමින් මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් සම්බන්ධ පාලනය ශක්තිමත් කර ඇත.

මෙම රාමුව සියලුම ව්‍යාපාර මාර්ග හරහා දැනට පවතින නැගීඑන අවදානම්, ප්‍රවනතා සහ ගැටළු හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන අතර දැනුවත් තීරණ ගැනීම සඳහා සූක්ෂම දෘෂ්ටිය ලබා දේ.




**BIRMC –** අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව **BAC –** අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
**GM/CEO –** සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී **ISC –** තොරතුරු ආරක්ෂක නිලධාරී
**ORMC –** මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව **ALCO –** වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව
**CC –** ණය කමිටුව **IC –** ආයෝජන කමිටුව **CRMU –** ණය හා අවදානම් කළමනාකරණ ඒකකය
**ORMU –** මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය **MRMU –** වෙළෙඳපොල අවදානම් කළමනාකරණ ඒකකය

රූපය 24 අවදානම් කළමනාකරන රාමුව

බැංකුව මුහුණ පාන ප්‍රධාන අවදානම් සංරචක, අවදානම් මට්ටම් හා ඒවා කළමනාකරණය ආකාරය පහ සාරාංශ කර දැක්වේ.

| අවදානම් සංරචකය | අවදානම් කළමනාකරණ ප්‍රවේශය | ආවේනික අවදානම් මට්ටම | බලපෑම* |
|---|---|---|---|
| **ණය අවදානම** | | | |
| **ණය අවදානම** | • අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම<br>• අවදානම් තක්සේරු කිරීම් සමඟ ණය ඇගයීම්.<br>• අවදානම් ශ්‍රේණිගත කිරීම<br>• ණය අනුමැතිය සඳහා පවරා ඇති බලතල ව්‍යුහය<br>• සුරැකුම්කරණය<br>• සුරැකුම් තක්සේරු කිරීම/නැවත ඇගයීම සහ LTV අනුපාත නියාමනය කිරීම<br>• ණය සීමාවන්ට එරෙහිව නියාමනය කිරීම<br>• පූර්ව අවදානම් ඇඟවීමේ දර්ශක, අක්‍රීය ණය ප්‍රවණතා නියාමනය කිරීම<br>• ගනුදෙනු සහ කළඹ මට්ටමේදී නියාමනය/ස්වාධීන අවදානම් සමාලෝචනය<br>• පසු විසර්ජන සමාලෝචන/LRM<br>• ආතති පරීක්ෂාව<br>• හානිකරණ වෙන් කිරීම<br>• අඛණ්ඩ පුහුණුව සහ සංවර්ධනය |  | ↑ |
| **සංකේන්ද්‍රණ අවදානම** | • සීමා නියාමනයඃ නිරාවරණ සීමාවන්, සංකේන්ද්‍රණ සීමාවන්, (හර්ෆින්ඩාල් – හර්ෂ්මන් දර්ශකය – HHI)<br>• ආතති පරීක්ෂාව |  | ↑ |
| **හරස් ණය අවදානම** | • සුරැකුම්කරණය<br>• සීමා නියාමනය<br>• ආතති පරීක්ෂාව |  | → |

| | | | |
|---|---|---|---|
| **වෙළෙඳපොළ අවදානම** | | | |
| **ප්‍රති-මිලකරණ අවදානම** | • ප්‍රතිමිලකරණ පරතර සීමාවන් නියාමනය කිරීම<br>• අනුපාත සංවේදී වත්කම් (RSA) සහ අනුපාත සංවේදී වගකීම් (RSL) පිළිබඳ සීමාවන් |  | ↓ |
| **ආදායම් වක්‍ර අවදානම** | • අනුපාත කම්පන සමඟ සංවේදිතාව/ආතති පරීක්ෂාව<br>• ආයෝජන කළඹේ ආදායම, කාලසීමාව සහ කාලසීමා පරතරය නියාමනය<br>• අලාභ සීමාවන් නැවැත්වීම |  | ↓ |
| **පදනම් අවදානම** | • RSA/RSL පරතරය මත අනුපාත කම්පනවලට සංවේදීතාවය මැනීම |  | → |
| **විදේශ විනිමය අවදානම** | • විනිමය අනුපාත වෙනස්වීම්<br>• විනිමය අනුපාත අවදානමේදී වටිනාකම<br>• සීමා නියාමනය<br>• ආතති පරීක්ෂාව. |  | ↓ |
| **කොටස් මිල අවදානම** | • සීමා අධීක්ෂණය.<br>• කොටස් මිල අවදානමේදී වටිනාකම<br>• FVPL සහ FVOCI කළඹ දෛනිකව වෙළෙඳපොළ අගයට මැනීම<br>• ආතති පරීක්ෂාව |  | ↓ |
| **වෙළෙඳ භාණ්ඩ මිල අවදානම** | • උකස් කිරීමේදී LTV නියාමනය කිරීම<br>• රන් මිල නියාමනය කිරීම<br>• ආතති පරීක්ෂාව |  | → |

*ඉපැයීම් සහ ප්‍රාග්ධනය මත බලපෑම්වල වාර්ෂික වෙනස

→ වෙනසක් නැත ↑ බලපෑම්වල වැඩිවීම ↓ බලපෑම්වල අඩුවීම

| අවදානම් සංරචකය | අවදානම් කළමනාකරණ ප්‍රවේශය | ආවේණික අවදානම් මට්ටම | බලපෑම* |
|---|---|---|---|
| **ද්‍රවශීලතා අවදානම** | | | |
| ද්‍රවශීලතා අවදානම | • අවම අවශ්‍යතාවන්ට අනුව නියාමන අනුපාත නියාමනය කිරීම<br>• නියමිත කාල පරාශයන්හි සීමාවන්ට අනුව ගිවිසුම්ගත සහ චර්යාත්මක කල්පිරීමේ පරතර නියාමනය<br>• තොග ප්‍රවේශය යටතේ ද්‍රවශීලතා අනුපාත නියාමනය කිරීම<br>• ද්‍රවශීලතා හදිසි සැලසුම්කරණය<br>• ආතති පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණය |   | ↓ |
| **මෙහෙයුම් අවදානම** | | | |
| වංචා අවදානම | • වංචා අවදානම් කළමනාකරණය සහ තොරතුරු දැනුම්දීමේ ක්‍රියාවලිය.<br>• අභ්‍යන්තර පාලනයන්<br>• ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs) නියාමනය කිරීම<br>• අලාභ ජනනය කරන සිදුවීම් නියාමනය කිරීම<br>• අවදානම් පාලන ස්වයං තක්සේරුව (RCSA)<br>• අල්ලස් හා දූෂණ විරෝධී අවදානම් තක්සේරුව |   | ↑ |
| තොරතුරු තාක්ෂණ/සයිබර් ආරක්ෂාව | • අභ්‍යන්තර පාලනයන්<br>• තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පද්ධති<br>• KORIs නියාමනය කිරීම<br>• සිදුවීම් වාර්තාකරණය<br>• අවදානම් පාලන ස්වයං තක්සේරුව (RCSA) |   | ↑ |
| ව්‍යාපාර අඛණ්ඩතා අවදානම | • KORIs නියාමනය කිරීම<br>• ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය (BCMS) ක්‍රියාත්මක කිරීම |   | ↑ |
| අනුකූලතා නියාමන අවදානම | • අනුකූලතා වැඩසටහන් සහ පරීක්ෂාවන්<br>• KORIs නියාමනය කිරීම<br>• අනුකූලතා අවදානම් සඳහා ලකුණු කාඩ්පත |   | ↑ |
| නෛතික අවදානම | • සියලු ගිවිසුම්ගත බැඳීම් මත නීතිමය නිෂ්කාශනය<br>• KORIs නියාමනය කිරීම |   | → |

*ඉපැයීම් සහ ප්‍රාග්ධනය මත බලපෑම්වල වාර්ෂික වෙනස

→ වෙනසක් නැත  ↑ බලපෑම්වල වැඩිවීම  ↓ බලපෑම්වල අඩුවීම

වගුව 33 → අවදානම් සමාලෝචනය

බැංකුවේ අවදානම් ලේඛණය දැනට පවතින, නැගී එන හා මතුවන අවදානම අඩංගු වේ. අවදානම හඳුනාගැනීමේ සහ තක්සේරු කිරීමේ මෙවලම් සහ ආකෘතිය භාවිතා කරමින් අවදානම් කළමනාකරණ අංශය විසින් එය කලින් කළ යාවත් කරනු ලැබේ. ඒ අනුව, මූලික අවදානම් හතරක් ඇති අතර ඒවානම් ණය අවදානම, වෙළෙඳපොල අවදානම (එනම් කොටස්, විදේශ විනිමය සහ පොළී අනුපාතය), මෙහෙයුම් අවදානම සහ ද්‍රවශීලතා අවදානමයි. අවදානම් වර්තා ප්‍රධාන අවදානම් මෙන්ම පවතින හා නැගී එන අවදානම් පිළිබඳ අදහස් ලබාදීම සඳහා කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු වෙත ඉදිරිපත් කරයි. මෙවැනි අවදානම් කෙරෙහි ආර්ථික, සමාජීය හා පාලන (ESG) වෙනස්වීම් මත බලපෑම් කලින් කල තක්සේරු කෙරේ. දේශගුණයට අදාළ අවදානම් අඛණ්ඩව වෙනස් වන බැවින්, බැංකුව ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර විශේෂයෙන් ණය අවදානම හා මෙහෙයුම් අවදානම කෙරෙහි සිය බලපෑම ඇගයීමට ලක් කරයි.

සමාලෝචිත වසර තුළ ප්‍රධාන, පවතින හා නැගී එන අවදානම් කළමනාකරණය කරන ලද ආකාරය පිළිබඳ දළ විශ්ලේෂණයක් පහත දක්වා ඇත.

## ණය අවදානම

**ණය අවදානම යනු ණයගැණුම්කරු හට ඔහුගේ ණය මුදල ආපසු ගෙවීමට අසමත්වීම හෝ ගිවිසුම්ගත බැඳීම ඉටු කිරීමට නොහැකිවීම තුළින් ඇතිවන අලාභය සඳහා විභවතාව වේ. මෙම නිරාවරණය මූලිකවම සෘජු ණය දීමේ මුලපිරීම් මෙන්ම බැඳීම් සහ සම්භාව්‍යතාවලින් ඇතිවේ.**

**ණය අවදානමට ප්‍රධාන වශයෙන් ඇපකරු පැහැර හැරීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ පියවීමේ අවදානම් ඇතුළත්ය.**




2024 දී, ණය අවදානමට බැංකුවේ උපරිම නිරාවරණය 6.3%කින් වැඩි වූ අතර, හානිකරණ සඳහා දීමනාව රු.බිලියන 28.9 දක්වා 29.3%කින් වැඩි විය.

### ණය අවදානම සඳහා අවදානම බරතබන ලද වත්කම්

ප්‍රස්ථාරය 43




මහ බැංකුවේ 2016 අංක 1 දරන නියෝගයට අනුකූලව, ණය අවදානම සඳහා අවදානම මත බරතබන ලද වත්කම් (RWAs) සඳහා බැංකුව සම්මත ප්‍රවේශය යොදා ගනී. මෙම ප්‍රවේශය එක් එක් ගනුදෙනුකාර පාර්ශවයන්ගේ වර්ගීකරණය මත එම ගනුදෙනුකාර පාර්ශවයන්ගේ නිරාවරණයන්ට නිශ්චිත අවදානම් බර තැබීමක් මගින් සිදු කරනු ලබයි.

එහිදී සුදුසුකම් ලබන විශේෂිත සුරැකුම්වලට නිසි සැලකීම ලබා දේ.

ණය අවදානම සඳහා අවදානම බරතබන ලද වත්කම්වල අඩුවීමක් 2024 වසර තුළ නිරීක්ෂණය විය.

### පැහැරහැරීමේ අවදානම

2024 දී, ණය හානිකරණය වූ (අදියර 3) ණය සහ අත්තිකාරම් වල වටිනාකම 2023 දී පැවති රුපියල් බිලියන 27.1 සිට රුපියල් බිලියන 49.7 දක්වා ඉහළ ගියේය. 2024 දෙසැම්බර් 31 වන විට, බැංකුවේ අදියර 3 හානිකරණ ණය අනුපාතය 2023 දී පැවති 2.4% ට සාපේක්ෂව 5.2% ක් විය.

ණය කළඹ තුළ ගුණාත්මකභාවයේ පහත වැටීම රු. බිලියන 6.6ක (2023 දි රු. බිලියන 5.1ට සාපේක්ෂව) හානිකරණ අයකිරීමකට හේතු වූ අතර මුළු ණය හානිකරණ වෙන් කිරිම රු. බිලියන 28.9ක් විය. මෙම අදියර 3 වෙන් කිරීම් ආවරණය 2023 දි පැවති 53.3%ට සාපේක්ෂව වසර අගදී 44.5%ක් ලෙස වාර්තා කර ඇත.

| දෙසැම්බර් 31 දිනට | 2024 උපරිම ණය අවදානම් නිරාවරණය | | | 2023 උපරිම ණය අවදානම් නිරාවරණය | | | ශුද්ධ නිරාවරණය තුළ වාර්ෂික වෙනස |
|---|---|---|---|---|---|---|---|
| | දළ ධාරණ වටිනාකම රු. '000 | ණය හානිකරණය රු. '000 | ශුද්ධ නිරාවරණය රු. '000 | දළ ධාරණ වටිනාකම රු. '000 | ණය හානිකරණය රු. '000 | ශුද්ධ නිරාවරණය රු. '000 | % |
| උපරිම ණය අවදානම් නිරාවරණය | **1,711,564,236** | **28,947,718** | **1,682,616,520** | 1,610,623,211 | 22,386,638 | 1,588,236,573 | 5.9 |
| ශේෂ පත්‍රය මත නිරාවරණය | **1,698,436,824** | **28,947,718** | **1,669,489,108** | 1,604,618,000 | 22,386,638 | 1,582,231,362 | 5.5 |
| ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණය | **13,127,412** | **–** | **13,127,412** | 6,005,211 | – | 6,005,211 | 118.6 |
| ප්‍රධාන ණය අවදානම් නිරාවරණය | | | | | | | |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් | **561,313,699** | **28,934,686** | **532,379,013** | 548,897,902 | 22,377,372 | 526,520,530 | 1.1 |
| – ණය හා අත්තිකාරම් | **1,039,038,477** | **3,905** | **1,039,034,572** | 943,705,329 | 645 | 943,704,684 | 10.1 |
| – ණය හා අනෙකුත් උපකරණ | | | | | | | |

වගුව 34 ➔ උපරිම ණය අවදානම් නිරාවරණය

| | අදියර 3 ණය හා අත්තිකාරම් රු. '000 | තනිපුද්ගල හානිකරණය සඳහා දමනාව රු. '000 | අදියර 3 ණය හා අත්තිකාරම් දීමනාව රු. '000 | අපේක්ෂිත ණය අලාභ දීමනාව රු. '000 |
|---|---|---|---|---|
| 2023 | 27,120,378 | 4,062,127 | 10,386,780 | 14,448,907 |
| **2024** | **49,677,946** | **3,754,556** | **18,350,326** | **22,104,882** |

වගුව 35 ➔ අදියර 3 ණය හානිකරණය වූ ණය හා අත්තිකාරම් බෙදීයාම

## දළ ණය අත්තිකාරම්

ප්‍රස්ථාරය 44




◑ දළ ණය හා අත්තිකාරම් (රු.බි.)

— හානිකරණය වූ ණය (අදියර 3) අනුපාතය (%) (අදියර 3 හානිකරණයෙන් ශුද්ධ)

## අදියර 3 ණය

ප්‍රස්ථාරය 45




◑ අදියර 3 (රු.බි.)

— හානිකරණ අදියර 3 වෙන් කිරීම් ආවරණය (%)

## සංකේන්ද්‍රණ ණය අවදානම

සංකේන්ද්‍රණ ණය සීමා බැංකුවේ අවදානම් අභිරුචි ප්‍රකාශයේ දක්වා ඇත.

අනුකූලතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා ණය කමිටුව තුළ සංකේන්ද්‍රණ මට්ටම් ස්ථාපිත සීමාවන් කාර්තුමය පදනමක් මත නියාමනය කෙරේ. පීඩන තත්ත්වයන් යටතේ පමණක් දැකිය හැකි නිරාවරණ අතර සංකේන්ද්‍රණ අවදානම තක්සේරු කිරීමට හා විභව අනෝන්‍ය රැඳියාව හඳුනා ගැනීමට හර්ෆින්ඩාල්-හර්ෂ්මාන් දර්ශකය සහ ආතති පරීක්ෂණය බැංකුව භාවිතා කරයි.

## නිෂ්පාදිත අනුව නිරාවරණය

ප්‍රස්ථාරය 46




- නිවාස හා දේපල ණය
- පුද්ගල ණය
- තැන්පතුවලට අනුව ණය
- උකස් ණය
- කාලීන ණය – රජයට අයත් ව්‍යවසාය හා ශ්‍රී ලංකා රජය
- කාලීන ණය – බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන
- කාලීන ණය – වෙනත් ආයතනික
- ණය උපකරණවල ආයෝජන

## ක්ෂේත්‍රය අනුව නිරාවරණය

ප්‍රස්ථාරය 47




- කෘෂිකර්මය හා ධීවර
- සංචාරක
- කර්මාන්ත
- ප්‍රවාහනය ඉදිකිරීම/නිවාස
- මූල්‍ය හා ව්‍යාපාර සේවා
- යටිතල පහසුකම්
- විදුලි බලය හා බල ශක්තිය
- අධ්‍යාපනය
- පුද්ගලික/උකස්කර/වෙනත්

### භූගෝලීය පිහිටීම අනුව නිරාවරණ

ප්‍රස්ථාරය 48




### සුරැකුම් අනුව නිරාවරණය

ප්‍රස්ථාරය 49




බැංකුවේ ණය හා ආයෝජන කළඹ මූලිකවම පාරිභෝගික ණය නිෂ්පාදනවලින් සමන්විත වේ. පුද්ගලික ණය විශාලතම කොටස වන අතර, එය පාරිභෝගික ණය කළඹින් 48.1%ක් නියෝජනය කරයි. මේ සමඟම, ආයතනික ණය හා ආයෝජන කළඹින් 77.6%ක් දායක වන රජයට අයත් ව්‍යවසාය සඳහා නිරාවරණය (ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර ඇපවලින් පිටුබලය ලබන ණය හා ණය උපකරණ ඇතුළත් වේ.) ආයතනික ණය කළඹින් විශාලතම කොටස නියෝජනය කරයි.

බැංකුව ක්ෂේත්‍රයේ සංකේන්ද්‍රණය සඳහා මධ්‍යස්ථ අවදානම් රුචියක් පවත්වා ගනී. පුද්ගලික ණය දිම හා උකස් අංශය විශාලතම දායකයා වන අතර, එය බැංකුවේ මුළු ණය නිරාවරණයෙන් 43.1%ක් නියෝජනය කරයි. ඉදිකිරීම 31.0%ත නිරාවරණයක් සමඟ දෙවන ස්ථානය නියෝජනය කරයි.

මහ පරිමාණ ණය වලින් වැඩි ප්‍රමාණයක් ණය අංශය විසින් ලබා දී ඇති නිසා බස්නාහිර පළාත තුළ ඉහළම භූගෝලීය සංකේන්ද්‍රණය මතුවී ඇත. රජයේ (භාණ්ඩාගාර ඇපකර හෝ රජයේ සුරැකුම්පත්) පිටුබලය සහිත ණය මුළු ණය සහ ආයෝජන කළඹෙන් 33.4% ක් නියෝජනය කරයි.

## දේශසීමා ණය අවදානම

විදේශීය බැංකුවල තැන්පතුවලින් සහ ණය පහසුකම්වලින් ඇතිවන බැංකුවේ දේශසීමා ණය අවදානම් නිරාවරණය මුළු වත්කම්වලින් 0.3%ට සීමා වී පැවතියේය.

## ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

මුළු වත්කම්වලින් 39.7%ක් සඳහා ණය හා අත්තිකාරම් දායක වන බැවින් හා ණය අවදානම මුළු අවදානම බරතබන වත්කම්වලින් 76.7%කට වඩා නියෝජනය වන බැවින්, ඵලදායී ණය අවදානම් කළමනාකරණය බැංකුවේ දිගුකාලීන ස්ථාවරත්වයට බලපාන තීරණාත්මක සාධකයක් වේ.

ණය අවදානම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ණය අවදානම් කළමනාකරණ රාමුවක් මගින් පාලනය කරන අතර, එම රාමුවට ශක්තිමත් අවදානම් පාලන ව්‍යුහයක් සහ විස්තීර්ණ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි රාශියක් ඇතුළත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත ණය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලින් ක්‍රියාකාරී ක්ෂේත්‍රවල නිලධාරීන් අතර රාජකාරි වෙන් කිරීම සහතික කර, ණය ක්‍රියාවලියේ ප්‍රධාන අදියර තුන හරහා ව්‍යාපාර මාර්ග මට්ටමින් ණය අවදානම් කළමනාකරණයට සහාය වේ.

මෙවැනි ප්‍රතිපත්ති පවතින හා අපේක්ෂිත වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම් වී වාර්ෂිකව තීරණය කරන අවදානම් අභිරුචිය හා ණය සීමා සමඟ නිරන්තරව සමාලෝචනය කෙරේ.

**ණය උත්පාදනය**

- ණය ඇගයීම සහ ශ්‍රේණිගත කිරීම
- සුරැකුම්කරණය
- නීතිමය පරීක්ෂාවන්
- පරීක්ෂා කිරීම සහ තක්සේරු කිරීම
- බෙදාහැරි බලතල ව්‍යුහය යටතේ ණය අනුමැතිය

**ලේඛනගත කිරීම සහ ණය බෙදාහැරීම**

- ලියකියවිලි සත්‍යාපනය
- ණය ගිවිසුම
- නියමයන් සහ කොන්දේසි
- උකස් බැඳුම්කර
- රක්ෂණ (හිමිකම්/ගිනි රක්ෂණ/DTA)
- ණය බෙදාහැරීම
- ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM)

**පශ්චාත් බෙදාහැරීම කළමනාකරණය**

- පසු බෙදාහැරීම් නියාමනය
- නැවත සැලසුම් කිරීම/ප්‍රතිව්‍යුහගත කිරීම
- අයකිරීමේ ක්‍රියාමාර්ගය

වගුව 25 ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ණය කළමනාකරණ ක්‍රියාවලිය අවදානම් කළමනාකරණ අංශ තුළ ණය අවදානම් කළමනාකරණ අංශය (CRMU) විසින් ශක්තිමත් කරන අතර එය ගනුදෙනු හා කළඹ මට්ටම්වලදී ස්වාධීන අවදානම් විශ්ලේෂණ හා නියාමනය ලබා දේ. මෙම ප්‍රවේශය ආර්ථික, පාරිසරික හා සමාජීය සහ ක්ෂේත්‍රයට අදාළ අවදානම් ඇතුළුව අභ්‍යන්තර හා බාහිර සාධක සමඟ ගනුදෙනුකාර විශේෂ සාධක සලකා බලයි.

සක්‍රීය හා නිවැරැදි ණය අවදානම් කළමනාකරණය සහතික කිරීම සඳහා, CRMU විසින්:

- ගනුදෙනු මට්ටමින් ණය නිරාවරණ සඳහා ස්වාධීන අවදානම් තක්සේරු කිරීම් සහ ශ්‍රේණිගතකරණ වලංගු කිරීම් සිදු කරයි.
- පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා, අක්‍රීය ණයවල ප්‍රවණතා, සංකේන්ද්‍රණ අවදානම් සහ සමස්ත ණය කළඹ කාර්ය සාධනය නියාමනය කරයි.
- විවිධ අවදානම් අවස්ථා යටතේ අවදානම්වල විභව බලපෑම තක්සේරු කිරීම සඳහා ආතති පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණය සිදු කරයි.

ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාපටිපාටියේදී වැඩි දියුණු කළ යුතු අංශ හඳුනා ගැනීම සඳහා නිරන්තර පදනමක් මත ණය හා සම්බන්ධ නිෂ්පාදිත හා ක්‍රියාවලි සඳහා පවත්වනු ලබන අවදානම් සහ පාලන ස්වයං තක්සේරු කිරීමේ (RCSA) ක්‍රියාවලියෙහි ප්‍රතිඵල උපකාරී වේ. CRMU විසින් ක්‍රියාවලි සහ වෙනස්කම් පාලනයට නිර්දේශ කරයි. මෙයට අමතරව, ණය අවදානම සහ ණය දීමේ ක්‍රියාවලියෙහි පවත්නා මෙහෙයුම් අවදානම හඳුනා ගැනීම සඳහා ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM) වැදගත් කාර්යභාරයක් ඉටු කරණ අතර, එම ක්‍රියාවලිය මගින් උචිත නිවැරැදි කිරිමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම තුළින් සමස්ත ණය කළඹේ ගුණාත්මකභාවය වර්ධනය කරයි.

## වෙළෙඳපොල අවදානම

**වෙළෙඳපොල අවදානම යනු ආයතනයකට නිරාවරණයක් ඇති මූල්‍ය වෙළෙඳපොල විචල්‍යතා වෙනස්වීම්වලින් ඇතිවන අවදානමකි. එය පොලී අනුපාත, කොටස් මිල ගණන්, විනිමය අනුපාත හා වෙළෙඳ භාණ්ඩවල මිල වැනි විචල්‍යතාවල අහිතකර විතැන්වීමෙන් ඇති වන අතර, අනාගත අපේක්ෂිත මුදල් ප්‍රවාහ, ඉපයීම් සහ ප්‍රාග්ධන මට්ටම් අහිතකරව වෙනස් කරයි.**

**වෙළෙඳපොල අවදානම්වලට බැංකුවේ නිරාවරණ වෙළෙඳ කළඹ සහ වෙළෙඳ නොවන කළඹින් ඇති වේ.**




බැංකුවේ වත්කම් වෙළෙඳපොල අවදානමට නිරාවරණය වන අතර එය මුළු වත්කම්වලින් 95.3%ක් සඳහා දායක වේ. වෙළෙඳපොල අවදානම් විචල්‍යතාවන්ට නිරාවරණය වූ වගකීම් 2024 වසර අවසානයේදී මුළු වත්කම්වලින් 92.6%ක් සඳහා දායක වේ. බොහෝ මූල්‍ය වත්කම් පොලී අනුපාත අවදානමට නිරාවරණය වේ. විදේශ විනිමය අවදානම් සඳහා විවෘත ශුද්ධ නිරාවරණය මුළු වත්කම්වලින් 0.02%ක් වන අතර ස්කන්ධ මිල අවදානමට 0.3%ක් නිරාවරණය වේ.

| 2024 දෙසැම්බර් 31 දිනට | මූල්‍ය ප්‍රකාශ අනුව ප්‍රකාශය රු. '000 | වෙළෙඳ අවදානමට නිරාවරණය රු. '000 | වෙළෙඳ නොවන අවදානමට නිරාවරණය රු. '000 | වෙළෙඳ අවදානම් වර්ගය |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| මුදල් හා මුදලට සමාන දෑ | 8,358,742 | | 8,358,742 | IRR, FX |
| මහ බැංකුව සමග ශේෂ | 357,054 | | 357,054 | IRR |
| බැංකු සමඟ ස්ථාපන | 14,794,637 | | 14,794,637 | IRR, FX |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 9,131 | | 9,131 | IRR, FX |
| සාධාරණ වටිනාකමට මනින ලද මූල්‍ය වත්කම් | 21,086,781 | 21,086,781 | | IRR, Equity |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ ලැබිය යුතු දෑ | 532,379,013 | | 532,379,013 | IRR, FX |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ වෙනත් මූල්‍ය උපකරණ | 1,039,034,572 | | 1,039,034,572 | IRR |
| වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ වටිනාකමට මනින ලද මූල්‍ය වත්කම් | 53,469,178 | | 53,469,178 | IRR, Equity |
| **එකතුව** | 1,669,489,108 | 21,086,781 | 1,648,402,327 | |
| **මූල්‍ය වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවියයුතු | 487,521 | | 487,521 | IRR, FX |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 258,409 | | 258,409 | IRR, FX |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – තැන්පතු හිමියන්ට ගෙවියයුතු | 1,556,270,863 | | 1,556,270,863 | IRR, FX |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – වෙනත් ණයකරුවන්ට ගෙවිය යුතු | 48,190,057 | | 48,190,057 | IRR |
| කල්බදු වගකීම් | 1,281,561 | | 1,281,561 | IRR |
| නිකුත්කළ ණය සුරැකුම්පත් | 16,966,482 | | 16,966,482 | IRR |
| **එකතුව** | 1,623,454,893 | – | 1,623,454,893 | |

වගුව 36 → වෙළෙඳපොළ ණය නිරාවරණය

බැංකුවේ වෙළෙඳපොළ අවදානම සඳහා අවදානම් බරතබන ලද වත්කම් වසර අවසානයේ රු. බිලියන 10.9 ලෙස සටහන් විය. 15.7%කින් ඉහළ ගිය අතර, මෙම වැඩිවීමට වෙළෙඳ කළඹ තුළ ස්ථිර ආදායම සුරැකුම්පත්වල වැඩි කළ ආයෝජන හේතු විය. බැංකුව වෙළෙඳපොළ අවදානම සඳහා අවදානම් බරතබන ලද වත්කම් ගණනය කිරීමට සම්මත මිණුම් ක්‍රමය (SMM) යොදා ගනී.

### වෙළෙඳපොළ අවදානම සඳහා අවදානම් බරතබන ලද වත්කම්

ප්‍රස්ථාරය 50




## පොලී අනුපාත අවදානම

### වෙළෙඳ කළඹ තුළ පොලී අනුපාත අවදානම

වෙළෙඳ කළඹ තුළ පොලී අනුපාත අවදානම (IRR) වෙළෙඳ කළඹ තුළ ඇති පොලී අනුපාත සංවේදී ආයෝජනවලින් ඇති වේ. රජයේ සුරැකුම්පත් වෙළෙඳ කළඹ තුළ ඇති පොලී අනුපාත අවදානම පූර්ව නිශ්චිත රුචි සීමාවන්, උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුව වෙනස් කරන ලද M – Duration භාවිතයෙන් නියාමනය කරනු ලබන අතර එය වෙළෙඳ කළඹ තුළ දරන සුරැකුම්පත්වල කාලසීමාව පදනම්ව ගණනය කෙරේ.

| කළඹ වර්ගය | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| | පොත් වටිනාකම රු. '000 | සාධාරණ වටිනාකම රු. '000 | පොත් වටිනාකම රු. '000 | සාධාරණ වටිනාකම රු. '000 |
| FVPL කළඹ | 20,451,390 | 20,874,049 | 16,445,943 | 16,923,123 |
| FVOCI කළඹ | 45,234,756 | 47,900,345 | 56,102,161 | 58,894,209 |
| **එකතුව** | 65,686,146 | 68,774,394 | 72,548,104 | 75,817,332 |

වගුව 37 → ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට සහ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට රජයේ සුරැකුම්පත්

බැංකුවේ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVPL) සහ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI) රජයේ සුරැකුම්පත්වල ආයෝජන කළඹ වසර අවසානයේදී සිය රජයේ සුරැකුම්පත්වල මුළු ආයෝජනයෙන් 7.1%ක් විය.

භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම (FVPL+FVOCI) රු. බිලියන 68.8ක් විය. FVPL සහ FVOCI කළඹ මත පදනම් ලකුණක මිල වටිනාකම (PV01) කළඹේ වෙළෙඳපොල වටිනාකමින් 0.01%ට වඩා අඩුය.

### බැංකු කළඹ තුළ පොලී අනුපාත අවදානම (IRRBB)

| | <මාස 1ට අඩු | මාස 1-3 | මාස 3-6 | මාස 6-12 | අවුරුදු 1-3 | අවුරුදු 3-5 | අවුරුදු 5ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| RSA: රු. මිලියන* | 73,052 | 85,498 | 124,872 | 273,099 | 380,635 | 289,178 | 409,649 |
| RSL: රු. මිලියන* | 297,268 | 513,950 | 323,275 | 375,797 | 84,773 | 21,851 | 5,000 |
| කාලසීමා පරතරය (RSA-RSL) – (රු. මිලියන) | (224,216) | (428,452) | (198,403) | (102,698) | 295,862 | 267,327 | 404,649 |
| සමුච්චිත පරතරය – (රු. මිලියන) | (224,216) | (652,668) | (851,071) | (953,768) | (657,906) | (390,579) | 14,070 |
| RSL හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය – 2024 (%) | **-75.4** | **-83.4** | **-61.4** | **-27.3** | **349.0** | **1,223.4** | **8,093.0** |
| RSL හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය – 2023 (%) | -72.7 | -87.9 | -65.2 | -34.5 | 747.6 | 1,222.6 | 2,052.0 |

වගුව 38 ➔ පොලී අනුපාත සංවේදී පරතරය – බැංකු කළඹ

පොලී අනුපාත අවදානම වෙත බැංකුවේ නිරාවරණය වෙළෙඳපොල පොලී අනුපාතවල උච්ඡාවචනයෙන් ඇති වන අතර එය ශුද්ධ පොලී ආදායමට බලපායි. මෙය පාදක වන පොලිය උපයන වත්කම්, පොලිය දරන වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බාහිර අයිතම මත විහව බලපෑමක් ඇත. බැංකුවේ පොලී අනුපාත අවදානමට නිරාවරණය ප්‍රතිමිලකරණ අවදානම, ඵලදා වක්‍ර අවදානම සහ පදනම් අවදානම ඇතුළු විවිධ ආකාරවලින් ප්‍රකාශ විය හැකිය.

සමාලෝචිත වසර තුළ පොලී අනුපාතවල අඩුවන ප්‍රවනතාව බැංකුවේ ප්‍රාග්ධනය සහ ඉපයීම් කෙරෙහි ධනාත්මකව බලපාන ලදී.

පොලී සංවේදී වත්කම් සහ වගකීම්වල කාල ව්‍යුහය තුළ සහ උපකරණ මිලකළ පොලී අනුපාත දර්ශක වෙනස්වීම්වලින් ඇතිවන පොලී අනුපාත අවදානම ඇති වේ. එබැවින්, බැංකුවේ ප්‍රාග්ධන කළඹ පදනම සහ අනාගත ඉපයීම් මත සැලකියයුතු අහිතකර බලපෑම අවම කිරීමට බැංකු කළඹ තුළ පොලී අනුපාත අවදානම කළමනාකරණය කෙරේ.

#### රජයේ සුරකුම්පත්වල ආයෝජන
ප්‍රස්ථාරය 51




#### රජයේ සුරකුම්පත්වල ඵලදා වක්‍රය මධ්‍ය – YTM
ප්‍රස්ථාරය 52




බැංකුව මූලිකවම පොලී අනුපාත ප්‍රතිමිලකරණ පරතර විශ්ලේෂණ තුළින් පොලී අනුපාත අවදානම තක්සේරු කරන අතර, ඉන් අතිවිශේෂ අනුපාත කම්පනවලින් ඉපයීම් සහ ප්‍රාග්ධනයට අනතුර පෙන්වා දේ. මෙම විශ්ලේෂණ මගින් නිශ්චිත කල්පිරීමේ රාමු තුළ ප්‍රතිමිලකරණ කළ පොලී ඉපයීම් වත්කම් සහ පොලිය දරන වගකීම් අතර වෙනස මනිනු ලබයි. බැංකුව ඉපයීම් දර්ශනය (EAR) සහ ආර්ථික වටිනාකම් දර්ශනයන්ගෙන් (EVA) පොලී අනුපාත අවදානම ඇගයීමට ලක් කරයි.

ඵලදායී පොලී අනුපාත අවදානම් කළමනාකරණය තීරණාත්මක වේ. එයට හේතුව බැංකුවේ වත්කම් සහ වගකීම්වලින් 90%ක් පොලී අනුපාත සංවේදී වීම හා බැංකුවේ පොලී අනුපාත අවදානම හෝ ශුද්ධ පොලී ආන්තිකය පොලී අනුපාත උච්ඡාවචනයට ඉතා ඉහළින් සංවේදීවීමයි.

බැංකුවේ පොලී අනුපාත අවදානම කළමනාකරණ උපායමාර්ගවලට කල්පිරීම්වල නොගැලපීම් අවම කිරීම (ස්ථිර අනුපාත වත්කම් සහ වගකීම් සඳහා), හෝ ප්‍රතිමිලකරණ දින ගැලපීම (පාවෙන අනුපාත වත්කම් සහ වගකීම් සඳහා) ඇතුළත්ය. 2024 වසර අවසානයේදී කල්පිරීම් රාමු කිහිපයක් තුළ වර්ධනයන් නිරීක්ෂණය විය.

## කොටස් මිල අවදානම

| කළඹ වර්ගය | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| | පොත් වටිනාකම රු. '000 | වෙළෙඳපොල වටිනාකම රු. '000 | පොත් වටිනාකම රු. '000 | වෙළෙඳපොල වටිනාකම රු. '000 |
| FVPL කළඹ | **187,520** | **212,732** | 1,048,601 | 825,378 |
| FVOCI කළඹ | **2,784,598** | **5,568,833** | 2,784,598 | 3,030,202 |
| **එකතුව** | **2,972,118** | **5,781,565** | 3,833,199 | 3,855,580 |

වගුව 39 ස්කන්ධ කළඹේ තත්ත්වය

ස්කන්ධ ආයෝජනවල ප්‍රමාණය අවදානම් සීමා රාමුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය, සහ පවත්නා වෙළෙඳපොල තත්ත්වයන් මත පදනම් වී තීරණය කෙරේ. ස්කන්ධ සුරැකුම්පත්වල ආයෝජනය නියාමනය බැංකුවේ අවදානම් අභිරුචිය තුළ ස්කන්ධ මිල අවදානම කළමනාකරණය සඳහා තීරණාත්මක වේ.

### ස්කන්ධවල ආයෝජන

ප්‍රස්ථාරය 53




කොටස් මිල අවදානම යනු කොටස් වෙළෙඳපොළෙහි කොටස් මිල ගණන්වල විචල්‍යතාවයන් හේතු කොට ගෙන බැංකුවේ කොටස් ආයෝජන කළඹෙහි වෙළෙඳපොල වටිනාකමේ ඇති විය හැකි අඩුවීමයි. මෙගින් බැංකුවේ ආදායම හා සංචිතවල විභව්‍ය විචල්‍යතා ඇති විය හැකිය. බැංකුව සාමාන්‍ය කොටස් හා ඒකක භාර සඳහා ලැයිස්තුගත කොටස් උපකරණවල සිය ආයෝජනවලින් කොටස් මිල අවදානමට මුහුණ දේ. වෙළෙඳපොල විචල්‍යතා සහ වෙළෙඳ මෙහෙයුම්වල වෙනස්වීම මඟින් ඇතිවන කොටස් ගනුදෙනු සහ කළඹ අවදානම් නියාමනය කිරීමට විස්තීර්ණ සීමා ව්‍යුහයක් ස්ථාපනය කර ඇත.

බැංකුවේ ලැයිස්තුගත කොටස් කළඹ FVPL සහ FVOCI කළඹවලින් සමන්විත වේ. FVOCI කළඹට උපායමාර්ගික හා ව්‍යවස්ථාපිත අරමුණු සඳහා සිදුකළ කොටස් ආයෝජන ඇතුළත්ය.

කොටස් වෙළෙඳපොල මිල දර්ශක ඉහළ යාමත් සමඟ ආයෝජන විකිණීම හේතුවෙන් බැංකුවේ ආයෝජන කළඹ 2024 වසර අවසානයේදී අඩුවීමක් දක්නට ලැබුණි.

## විදේශ විනිමය අවදානම

බැංකුවේ ඇති විදේශ විනිමය (FX) වත්කම් හා වගකීම් සඳහා ඉදිරි සුරැකුම් නොකළ ශේෂයන්ගෙන් විදේශ විනිමය අවදානම ඇති වේ. බැංකුව, සම්මත මැනීමේ ප්‍රවේශය (SMA) යටතේ ශුද්ධ විදේශ විනිමය නිරාවරණය (NFCE) මත පදනම් වූ විදේශ විනිමය අවදානම සඳහා ප්‍රාග්ධනය වෙන් කරයි. ශුද්ධ විවෘත තත්ත්වය (NOP) නියාමන සහ අභ්‍යන්තර සීමා අනුව දෛනිකව නියාමනය කෙරේ.

2024 වසර අවසානයේදී, බැංකුවේ NFCE ඇ. ඩොලර් මිලියන 1.054ක් වූ අතර එය බැංකුවේ මුළු නියාමන ප්‍රාග්ධනයෙන් 0.4%ක් නියෝජනය කරයි.

| | මාස 1ට අඩු | මාස 1-3 | මාස 3-6 | මාස 6-9 | මාස 9-12 |
|---|---|---|---|---|---|
| ඇමෙරිකන් ඩොලර් | (11,509,080) | 18,672,796 | 164,623 | (9,137,521) | 1,809,181 |
| යුරෝ | (2,612,584) | (348,868) | 2,093,475 | (702,184) | 1,570,160 |
| බ්‍රිතාන්‍ය පවුම් | (2,063,805) | (702,660) | 612,809 | 990,791 | 1,162,864 |
| සිංගප්පූරු ඩොලර් | – | – | – | – | – |
| ඕස්ට්‍රේලියන් ඩොලර් | (2,441,415) | (487,517) | 260,856 | 1,291,431 | 1,376,645 |
| ජපන් යෙන් | – | – | – | – | – |
| AED | – | – | – | – | – |
| කැනේඩියන් ඩොලර් | – | – | – | – | – |
| CHF | – | – | – | – | – |

වගුව 40 විදේශ විනිමය මෙහෙයුම් සඳහා මුදල අනුව කල්පිරීමේ පරතර

| විදේශ විනිමය '000 | 2024 | 2023 |
|---|---|---|
| ඇමෙරිකන් ඩොලර් | **(2,520)** | (1,390) |
| යුරෝ | **902** | 2,772 |
| බ්‍රිතාන්‍ය පවුම් | **1,108** | 238 |
| ජපන් යෙන් | **2,726** | 1,900 |
| ඕස්ට්‍රේලියන් ඩොලර් | **1,600** | 1,184 |
| සිංගප්පූරු ඩොලර් | **11** | – |

වගුව 41 ව්‍යුහගත ශුද්ධ විදේශ විනිමය නිරාවරණ

## ශුද්ධ විවෘත තත්ත්වය (NOP)

ප්‍රස්ථාරය 54




බැංකුව ස්කන්ධ වෙළෙඳ කළඹ සහ විදේශ විනිමය විවෘත තත්ත්වය සඳහා අවදානමේ වටිනාකම (Value at Risk) ක්‍රියාමාර්ග භාවිතයෙන් වෙළෙඳපොල අවදානම් කළමනාකරණය යටතේ මිල උච්චාවචනය මනිනු ලබයි. අවදානමේදී වටිනාකම අවදානම් දරා ගැනීමේ සීමාව (RTL) තුළ පවතී.

## අවදානමේදී වටිනාකම (VGR) වෙනස්වීම – කොටස්

ප්‍රස්ථාරය 55




## අවදානමේදී වටිනාකම වෙනස්වීම – විදේශ විනිමය

ප්‍රස්ථාරය 56




## ද්‍රවශීලතා හා අරමුදල් අවදානම

ද්‍රවශීලතාව හා අරමුදල් අවදානම යනු පිළිගත නොහැකි අලාභ දැරීමක් නොමැතිව ගෙවීමට ඇති තත්ත්වයයට පත්වන ශේෂ පත්‍රයේ හෝ ඉන් පිටත බැඳීම් සපුරාලීමට බැංකුවට ප්‍රමාණවත් ස්ථාවර හෝ විවිධ අරමුදල් ප්‍රභවයන් නොතිබිය හැකි අවදානමයි. බැංකුවේ ද්‍රවශීල අවදානම් කළමනාකරණ රාමුව මගින් බැංකුවේ මෙහෙයුම් පූර්ව නිශ්චිත ද්‍රවශීලතා සීමාවන් තුළ පවතින බව සහ බැංකුවේ ද්‍රවශීල ප්‍රතිපත්ති හා නියාමන අවශ්‍යතා සහ ඒවා ව්‍යවහාරවලට අනුකූලව පවතින බව සහතික කිරීම අවශ්‍ය වේ.




ද්‍රවශීලතා අවදානමේ ප්‍රධාන තීරකයින්

ද්‍රවශීලතා සහ අරමුදල් අවදානම් කළමනාකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සාමාන්‍ය සහ පීඩන අවස්ථා යටතේ නිවැරදි පිරිවැයට බැඳීම් සපුරාලීම සඳහා කාලීනව අරමුදල් ලබාගැනීම සහතික කිරීමයි.

## නියාමන අනුපාත

බැංකුවේ නියාමන ද්‍රවශීලතා දර්ශක පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය වූ අතර, අවම නියාමන අවශ්‍යතාවන්ට ඉහළින් පැවතුණි.

| අනුපාතය | 2024 | 2023 | නියාමන අවමය |
|---|---|---|---|
| LCR - (රුපියල්) ප්‍රතිශතය | **351.3** | 299.2 | 100 |
| LCR - (සියලු මුදල්) ප්‍රතිශතය | **344.6** | 293.7 | 100 |
| NSFR ප්‍රතිශතය | **193.5** | 180.5 | 100 |

වගුව 42 → නියාමන ද්‍රවශීලතා අනුපාත

බැංකුව නියාමන අවශ්‍යතා සහ තොග සහ ප්‍රවාහ ප්‍රවේශවලට අනුකූලව හා ප්‍රධාන ද්‍රවශීලතා අවශ්‍යතාවන්ට අනුකූලව නියාමනය කිරීම මගින් ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. බැංකුවේ වත්කම් හා වගකීම්වල වෙනස්වීම් අරමුදල් අවශ්‍යතාවලට සමානුපාතිකව මනිනු ලබන අතර එය බැංකුවේ ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගැනීම සහතික කරන අතර බැංකුවේ අවදානම් අභිරුචිය සමඟ ගලපා ඇත. යහපත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමට රුපියල් සහ ප්‍රධාන විදේශ විනිමය සඳහා ද්‍රවශීලතා පරතර පිළිබඳ අභ්‍යන්තර සීමා නිරන්තරව නියාමනය කෙරේ.

ද්‍රවශීලතා අවදානම ඉහළ තත්ත්වයේ ද්‍රවශීල වත්කම්වල ප්‍රමාණවත් ස්වාරක්ෂක පවත්වා ගනිමින් සහ අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කරමින් අවම කෙරේ. ඊට අමතරව, බැංකුවේ සම්භාව්‍ය අරමුදල් සැලැස්ම මගින් ප්‍රමාණවත් ද්‍රවශීලතා මූලාශ්‍ර අවශ්‍ය පරිදි ක්‍රියාවට නංවා ඇති බව සහතික කරයි.

## නිෂ්පාදන මගින් අරමුදල් විවිධාංගීකරණය

විදේශ විනිමය සංචිතවල හිඟයක් විසින් සලකුණු කළ ආර්ථික අර්බුද ඓතිහාසිකව ඉහළ පොලී අනුපාතවලට හේතු විය. 2024 දී, බැංකුවේ තැන්පතු පදනම වාර්ෂිකව 5.0%කින් වර්ධනය වූ අතර රු. ට්‍රිලියන 1.56ට ළඟාවිය. මෙම වර්ධනයට මූලික වී ඇත්තේ විශේෂයෙන් රජයේ සුරැකුම්පත් සහ විකල්ප ස්ථිර ආදායම් උපකරණ මත පොලී අනුපාතවල අඩුවීමයි. බැංකුව අඩු පිරිවැය ඉතුරුම් සාර්ථකව සේවයේ යොදවන ලදී. ඉතුරුම් තැන්පතු වාර්ෂිකව 8.7%කින් වැඩි වූ අතර, ස්ථිර තැන්පතු වාර්ෂිකව 4.1%කින් වර්ධනය විය.

### නිෂ්පාදනය අනුව අරමුදල් විවිධාංගීකරණය

ප්‍රස්ථාරය 57




බැංකුව සිය ශාඛා ජාලය තුළින් පාරිභෝගික සහ ආයතනික තැන්පතු සඳහා පුළුල් වශයෙන් පිවිසීමට අවස්ථාව ලබා ගත හැකි අතර, එය මූලික ස්ථිර අරමුදල් මූලාශ්‍රය වශයෙන් පවතී. දිවයින පුරා ශාඛා ජාලය තුළින් පාරිභෝගික තැන්පතු කරා ප්‍රවේශය (එනම් ඉතුරුම් හා ස්ථාවර තැන්පතු) අරමුදල්කරණය තුළ සංකේන්ද්‍රණ අවදානම අඩු කිරීම ශක්තිමත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට අනුව භාණ්ඩාගාර අංශය තුළ වත්කම් සහ වගකීම් කළමනාකරණ (ALM) ඒකකය විසින් අරමුදල් අවදානම් කළමනාකරණය කෙරේ.

### ස්ථිවර තැන්පතු ඉතුරුම් මුසුව

ප්‍රස්ථාරය 58



# අවදානම් කළමනාකරණ වාර්තාව



## තොග ප්‍රවේශය

අරමුදල්වල ප්‍රමාණාත්මකතාව සහතික කිරීමට, සහ අවදානම් රුචිය තුළ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමට, බැංකුව තොග ප්‍රවේශය යටතේ පහත ද්‍රවශීල අනුපාත නියාමනය කරයි.

| තොග ප්‍රවේශය යටතේ අනුපාත | 2024 % | 2023 % |
|---|---|---|
| මුළු වත්කම්වලට ශුද්ධ ණය | **30.4** | 31.2 |
| ගනුදෙනුකාර තැන්පතුවලට ණය | **36.1** | 37.0 |
| කෙටි කාලීන වගකීම්වලට ද්‍රවශීල වත්කම් | **62.4** | 54.0 |
| මුළු වත්කම්වලට මිලදීගත් අරමුදල් | **17.1** | 19.7 |
| (විශාල වගකීම් – තාවකාලික ආයෝජන) සිට (ඉපයීම් වත්කම් – තාවකාලික ආයෝජන) | **-2.5** | -6.4 |
| මුළු ණයවලට බැඳීම් | **0.9** | 1.1 |

වගුව 43 ➔ තොග ප්‍රවාහය යටතේ අනුපාත

## ප්‍රවාහ ප්‍රවේශය

ප්‍රවාහ ප්‍රවාහය යටතේ, ද්‍රවශීල වත්කම් තක්සේරු කිරීමට බැංකුව විසින් ද්‍රවශීලතා පරතර විශ්ලේෂණ භාවිතා කෙරේ. ද්‍රවශීලතා පරතර ස්ථාපිත සීමා අනුව නිරන්තරයෙන් සීමා නියාමනය කරන අතර සංවේදී විශ්ලේෂණ සහ ආතති පරීක්ෂාව සඳහා දත්ත භාවිතා කෙරේ.

කල්පිරීමේ පරතර විශ්ලේෂණ නියාමනය මගින් ඉදිරියේදී වියහැකි අහිතකර ද්‍රවශීල අවස්ථා දැන ගැනීමට සහය වේ.

| බැංකුව - රු. මිලියන | මාස 0-3 | මාස 3-12 | අවුරුදු 1-3 | අවුරුදු 3-5 | අවුරුදු 5ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| ගිවිසුම්ගත කල්පිරීම සහිත වත්කම් | 181,665 | 431,524 | 399,226 | 297,876 | 442,146 | 1,752,438 |
| ගිවිසුම්ගත කල්පිරීම සහිත වගකීම් | 814,196 | 710,663 | 86,025 | 22,924 | 118,630 | 1,752,438 |
| කල්පිරීමේ පරතරය | (632,531) | (279,138) | 313,201 | 274,952 | 323,516 | (0) |
| සමුච්චිත පරතරය | (632,531) | (911,669) | (598,468) | (323,516) | 0 | (0) |
| **වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය - 2024** | -78% | -39% | 364% | 1,199% | 273% | – |
| වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය - 2023 | -80% | -51% | 850% | 1,230% | 256% | – |

වගුව 44 ➔ ගිවිසුම්ගත කල්පිරීමේ පරතරි

## මෙහෙයුම් අවදානම

**මෙහෙයුම් අවදානම යන්නෙන් ප්‍රමාණවත් නොවන හෝ අසමත් අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති, මානව දෝෂ හෝ ආයතනයේ මෙහෙයුමකට බාධා කරන බාහිර සිදුවීම්වලින් ඇතිවිය හැකි අලාභය අර්ථවත් වේ. මෙහෙයුම් අවදානම් අභ්‍යන්තර උවදුරු හෝ බාහිර තර්ජනවලින් ඇති විය හැකි බැවින් ඒවා සැමවිටම බොහෝ සෙයින් සංකීර්ණ මෙන්ම අන්තර් සම්බන්ධ වේ. මෙහෙයුම් අවදානමට නෛතික අවදානම ඇතුළත් වුවද කීර්තිනාම සහ උපායමාර්ගික අවදානම අයත් නොවේ.**




මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යය මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම, අර්ථ දැක්වීම සහ අධීක්ෂණය සඳහා වගකීමට බැඳී සිටින අතර, බැංකුවේ මෙහෙයුම් අවදානම් පැතිකඩ සක්‍රියව කළමනාකරණය කරන බවට සහතික වේ. අවදානම පිළිගත් දරාගැනීමේ මට්ටම් ඉක්මවන විට එය පූර්ව අවවාද සංඥා ලබා දෙන අතර, කාලීන තිරණ හා පළමු ආරක්ෂක මාර්ගය මගින් නිවැරදි කිරීමේ ක්‍රියා ශක්තිමත් කරයි.

මෙහෙයුම් අවදානම් ප්‍රධාන අලාභ සිදුවීම් වර්ග හතකට වර්ගීකරණය කෙරේ:

- අභ්‍යන්තර වංචාව (IF)
- බාහිර වංචාව (EF)
- ක්‍රියාත්මක කිරීම, ලබාදීම, සහ ක්‍රියාවලි කළමනාකරණය (EDPM)
- සේවා නියුක්තිකයන්ගේ පරිචයන් සහ සේවා ස්ථාන ආරක්ෂාව (EPWS)
- සේවාදායකයා, නිෂ්පාදන, සහ ව්‍යාපාර ආශ්‍රිත පරිචයන් (CPBP)
- භෞතික වත්කම්වලට හානිය (DPA)
- ව්‍යාපාර බිඳවැටීම් හා පද්ධති දෝෂ (BDSF)

2024 දී, මෙවැනි වර්ගවලින් වාර්තාකළ මුළු අලාභය වසර තුනක සාමාන්‍ය විගණිත දළ ආදායමෙන් 1.10%ක් වූ අතර වසර සඳහා බැංකුව තුළ සිය අනුමත අවදානම් අභිරුචි සීමාවන් තබාගෙන ඇත.

### අවදානම් අභිරුචිය හා දරාගැනීමේ සීමාවන්ට අනුව සැබෑ මෙහෙයුම් අලාභ

ප්‍රස්ථාරය 59




පසුගිය වසර කිහිපය තුළ, බැංකුව සිය මෙහෙයුම් අලාභ, අවදානම් අභිරුචි මට්ටමට වඩා පහළින් අලාභ පවත්වා ගන්නා ලදී. මෙය ඵලදායි පාලන ව්‍යුහයේ පැවැත්ම, මෙහෙයුම් අවදානම් කළමනාකරණය තුළ ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලනයන්, ක්‍රියාවලි, සහ ක්‍රියාපටිපාටි ඉස්මතු කර දක්වයි.

### අලාභ සිදුවීම් – උග්‍රතාවය

ප්‍රස්ථාරය 60




### අලාභ සිදුවීම් - සංඛ්‍යාතය

ප්‍රස්ථාරය 61




බැංකු ක්ෂේත්‍රය එහි මෙහෙයුම්, ක්‍රියාවලි හා නියාමන පරිසරයේ ස්වභාවය හේතුවෙන් අසමසම මෙහෙයුම් අභියෝගවලට මුහුණ දේ.

ඵලදායී අවදානම් කළමනාකරණය උවදුරු අවම කිරීමට සහ නියාමන අනුකූලතාව සහතික කිරීමට තීරණාත්මක වේ. බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව එහි අවදානම් රුචිකත්වයට අනුකූල වෙමින් මෙම අවදානම් කළමනාකරණය කිරීම සඳහා සැලසුම් කර ඇත. එය පද්ධති පාලනයන්, ප්‍රවේශ පාලනයන්, රාජකාරි වෙන් කිරීම, පැහැදිලි අධිකාරී මායිම්, ද්විත්ව පාලනය, භෞතික වත්කම් පාලනයන්, වාර්තා තබා ගැනීම, සැසඳීමේ ක්‍රියාවලිය සහ විගණන විමසුම් වැනි ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ඒකාබද්ධ කරයි.

අවදානම් කළමනාකරණ මෙවලම් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ ශක්තිමත් උපදෙස් මගින් සහය ලබන මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක්

මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන බැංකු ප්‍රවේශයේ හරය සකස් කරයි.

අවදානම හඳුනාගත් පසු, ඒවායේ බලපෑම නියාමනය කිරීමට සුදුසු උපායමාර්ග යොදා ගනු ලබයි.

අවදානම් කළමනාකරණ අංශය මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ වාර්තා කිරීමට විවිධ තාක්ෂණයන් හා ක්‍රියාවලි යොදා ගන්නා අතර, එම වාර්තා කාලීන තීරණ

# අවදානම් කළමනාකරණ වාර්තාව



ගැනීම සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුවට හා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරය.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරිමේ තිරණාත්මක කොටසක් වන්නේ අලාභ සිදුවිම් දත්ත රැස්කර විශ්ලේෂණය කිරීමයි. මූල්‍ය හෝ මූල්‍ය නොවන අලාභ ඇති කරන සිදුවීම් වලින් පැන නගින දත්ත, බාසල් ගිවිසුමේ අලාභ සිදුවීම් කාණ්ඩ හතට අනුව වර්ගීකරණය කර ඇත. මෙය අලාභ සිදුවීම්වල ස්වභාවය, බරපතලකම, සම්භාවිතාව සහ රටා හඳුනා ගැනීමට උපකාරී වේ.

ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක අනුකෘතිය (KORI) බැංකුව තුළ මෙහෙයුම් අවදානම් නියාමනය සඳහා භාවිතා කරන විගණන ගැටළු කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය, තොරතුරු ආරක්ෂාව,

නිෂ්පාදනවල තත්ත්වය, ක්‍රියාවලිවල තත්ත්වය, සහ අනුකූලතාව යන දර්ශක හයෙන් සමන්විත වේ.

KORIs කාලින ආකාරයෙන් වැලැක්වීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සලසමින්, ඵලදායි අවදානම් හඳුනා ගැනීමේ මෙවලක් ලෙස භාවිතා කරයි.

අවදානම් පාලන ස්වයං තක්සේරුව (RCSA) යනු ප්‍රධාන ක්‍රියාවලියක් වන අතර එහිදී අවදානම් කළමනාකරණ කණ්ඩායම් ක්‍රියවලි හිමිකරුවන් සමඟ මෙහෙයුම් අවදානම් සහ පවත්නා පාලනයේ ඵලදායිත්වය ක්‍රමානුකූලව තක්සේරු කරයි. බැංකුවේ අවදානම් අභිරුචියට අනුකූලතාව පවත්වා ගනිමින් අවදානම් ඵලදායීව හඳුනාගෙන, නියාමනය කරන බව මෙම ක්‍රියාවලියෙන් සහතික කෙරේ.

යම් සිදුවිමක් සහ එම සිදුවීම වැලැක්වීමේ මූල හේතුව හඳුනා ගැනීමට හේතු විශ්ලේෂණය (RCA) බැංකුව විසින් භාවිතා කරනු ලබයි. හුදෙක් ලක්ෂණ තහවුරු කිරිම වෙනුවට, RCA විසින් අලාභ සිදුවීම පසුපස ප්‍රධාන හේතු හෝ ආසන්න අතපසුවීම් හඳුනා ගනී. මෙම ප්‍රවේශය නැවත සිදුවිම වැලැක්වීමට දීර්ඝ කාලින විසඳුම් ක්‍රියාත්මක කිරිමට බැංකුවට සහය වේ.

බැංකුව අහිතකර තත්ත්වයන්ගේ සැඟවුණු අනතුර අනාවරණය කර ගැනීමට ආතති පරීක්ෂණය සහ අවස්ථා විශ්ලේෂණය භාවිතා කරන අතර, විවිධ උපකල්පිත සිදුවීම් බැංකුවේ මූල්‍ය කාර්යසාධනයට බලපෑ හැකි ආකාරය ඇගයීමට ලක් කරයි. මෙම ශිල්ප බැංකුවට වියහැකි මූල්‍ය බලපෑම් අවබෝධ කර ගැනීමට සහ වැලැක්වීමේ කාර්ය සඳහා මට්ටම් නියම කිරිමට සහය වේ.

### මෙහෙයුම් අවදානම සඳහා අවදානම බරතබන ලද වත්කම්

ප්‍රස්ථාරය 62




2016 අංක 01 දරන මහ බැංකු නියෝගයට අනුකූලව, බැංකුව ප්‍රාග්ධනය ගණනය කිරිම් සඳහා මූලික දර්ශක ප්‍රවේශය (BIA) යොදා ගනී, මෙහෙයුම් අවදානම සඳහා මූලික දර්ශක ප්‍රවේශය භාවිතා කරමින් ගණනය කළ RWAs බැංකුවේ මුළු RWAs වලින් 19.59%කි. මෙහෙයුම් අලාභ ආවරණය කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය තීරණය කිරිමට වඩා උසස් ක්‍රම වෙත ලඟාවීමට සුදුසුකම් ලබන නිර්ණායක සපුරාලීමට උත්සාහයන් ගනිමින් පවතී.

ඇතැම් මෙහෙයුම් අවදානම්වල ඉහළ බරපතලකම ඇති නමුත් සිදුවිමේ ඉඩකඩ අඩු විට ඵලදායී අවදානම් මාරු කිරිමේ උපායමාර්ගයක් ලෙස රක්ෂණය සැලකිය හැකිය. පරිපාලන අංශය මධ්‍යගතව බැංකුවේ රක්ෂණ කාර්යය කළමනාකරණය කරන අතර ඔප්පු ප්‍රමාණවත්ව සහ නිරන්තරව සමාලෝචනය කරන බව සහතික කරයි. මෙහෙයුම් අවදානම් කළමනාකරණ කණ්ඩායම (ORMU) නිරන්තර පදනමක් මත රක්ෂණ ඔප්පුවලින් අලාභය අයකිරීම නියාමනය කරයි.

ඊට අමතරව, පිරිවැය ඉතුරුම් සහ අවදානම මාරු කිරිමේ උපායමාර්ගයක් ලෙස සේවා බාහිරෙනි ලබා ගැනීම භාවිතා කෙරේ. බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත බාහිර මූලාශ්‍ර ප්‍රතිපත්තිය සහ මහ බැංකුවේ මාර්ගෝපදේශ අනුගමනය කරන අතර නව ගිවිසුම්වලට ඇතුළත්වීමේදී හෝ පවතින ගිවිසුම් අලුත් කිරිමේදී වෙළෙන්දන් පිළිබඳ නිසි පරීක්ෂාව පවත්වනු ලබන බව මෙමගින් සහතික කරයි. බාහිරින් ලබාගන්නා සේවාවන් බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති හා අවදානම් කළමනාකරණ අවශ්‍යතා සමඟ පෙළ ගැසෙන බව ද මෙමගින් සහතික කරයි.

### වංචා අවදානම GRI 205-1

වංචා අවදානම යන්නෙන් වියහැකි මූල්‍යමය, ද්‍රව්‍යමය, හෝ කීර්තිනාම අලාභ අර්ථවත් වන අතර ඒවා අභ්‍යන්තර පාර්ශව හෝ බාහිර පාර්ශව විසින් සිදුකරන වංචනික ක්‍රියාවන්ගෙන් ඇති වේ. ඵලදායී වංචා අවදානම් කළමනාකරණය මූල්‍ය අඛණ්ඩතාව සහ විශ්වාසය පවත්වා ගැනීම සඳහා තීරණාත්මකය.

වංචා අවදානම් කළමනාකරණය ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කිරිම, සදාචාර හැසිරිම් සංස්කෘතියක් පෝෂණය කිරිම, නිරන්තර වංචා අවදානම් තක්සේරු සිදු කිරිම හා සම්බන්ධ වන අතර,

ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි වංචනික ක්‍රියා වැලැක්වීමට, හඳුනා ගැනීමට සහ ප්‍රතිචාර දැක්වීමට ක්‍රියාත්මක වන බව සහතික කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය, අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තියෙන් වංචා අවදානම සහ දූෂණය හෝ අල්ලස කළමනාකරණය කරන ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි විස්තර කරයි.

වංචා අවදානම් අල්ලස් හා දූෂණය මගින් විය හැකි අතර, එබැවින් සේවකයින් සහ අදාළ සියලුම පාර්ශව සිදකරන ලද සේවය ප්‍රතිචාරයක් වශයෙන් ලබාදෙන පහසුකම් වෙනුවෙන් ත්‍යාග සහ සත්කාර හෝ ගෙවීම්, දේශපාලන දායකත්වයන්, මුදල් ගෙවීම් හෝ කොමිස් මුදල්, අනුග්‍රහක සංචාර සහ නවාතැන්, පුන්‍ය දායකත්වයන් භාරගැනීමෙන් වලක්වනු ලබයි.

### තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ අවදානම යනු මෙහෙයුම් අවදානමේ තීරණාත්මක අංගයක් වන අතර, ව්‍යාපාර දත්ත, තීරණාත්මක පද්ධති සහ විවිධ ව්‍යාපාරික ක්‍රියාවලීන්ට තර්ජනයක් එල්ල කරයි.

දත්තවල සංවේදීතාව, තොරතුරු පද්ධතිවල තීරණාත්මක බව සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වර්ගය සලකා බැලීමෙන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ශක්‍ය සහ ප්‍රමිතිගත තාක්ෂණයන් භාවිතා කිරීමෙන් ව්‍යාපාර ඔරොත්තු දීමේ හැකියාව ස්ථාපිත කිරීම බැංකුවේ තාක්ෂණ අවදානම් කළමනාකරණ උපාය මාර්ගයේ අරමුණයි.

තාක්ෂණයේ යල්පැනීමේ අවදානම අවම කිරීමට හා ක්ෂේත්‍රයේ තරඟකරුවන් සමඟ තරඟකාරීව සිටීමට බැංකුවට අවශ්‍ය තාක්ෂණය උපායමාර්ගික වර්ධනයන් උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලිය තුළින් තීරණය කෙරේ.

සලකා බලන වසර තුළ, බැංකුව Temenos මඟින් නව මධ්‍යගත බැංකුකරණ පද්ධතියකට සංක්‍රමණය වීමත් සමඟ තොරතුරු තාක්ෂණයේ සැලකියයුතු වෙනසකට මුහුණ දුන්හ. වෙනත් ප්‍රධාන තොරතුරු තාක්ෂණයට අදාළ අවදානම්වලට පද්ධති බිඳවැටීම්, දෝෂ, පද්ධති හැසිරවීම තුළින් වංචා සහ සයිබර් ප්‍රහාර ඇතුළත් වේ.

ප්‍රධාන තොරතුරු නිලධාරී/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවන තොරතුරු තාක්ෂණය අංශය තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය කරන අතර තොරතුරු තාක්ෂණයට මෙහෙයවීමේ කමිටුව (ITSC) වෙත වාර්තා කරයි.

ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී (CISO) විසින් මෙහෙයවනු ලබන තොරතුරු ආරක්ෂක අංශය (ISD) අභ්‍යන්තර මනා පරිචයන් සහ මහ බැංකුවේ අවශ්‍යතාවලට අනුකූලව තොරතුරු ආරක්ෂක අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වගකියයි. කළමනාකාරිත්ව මට්ටමින්, තොරතුරු ආරක්ෂක කමිටුව (ISC) තොරතුරු ආරක්ෂක අවදානම් කළමනාකරණයේ උපායමාර්ගික සහ මෙහෙයුම් අංශ දෙකම අධීක්ෂණය කරයි.

බැංකුව වෙනස්වන සයිබර් තර්ජනවලට අනුව ඔරොත්තුදීම වැඩි කිරීමට සිය තොරතුරු ආරක්ෂක ස්ථාපනය අඛණ්ඩව ශක්තිමත් කරයි. තොරතුරු ආරක්ෂක අංශය යටතේ 24X7X365 ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් (SOC) ක්‍රියාත්මක වේ. දත්ත කාන්දුවීම් වැළැක්වීම (DLP) සහ දත්ත වර්ගීකරණ විසඳුම යනු දත්ත ආරක්ෂා කිරීමට සහ සුරක්ෂිත කිරීමට සහ රෙගුලාසිවලට අනුකූල වීමට ගනු ලබන මුලපිරීම් වේ. තවද, බැංකුව තොරතුරු තාක්ෂණ අංශය, තොරතුරු ආරක්ෂක අංශය සහ කාඩ්පත් මධ්‍යස්ථානය වෙනුවෙන් ISO 27001:2013 සහතික කිරීම අත්කරගෙන ඇත.

මහ බැංකුවේ "බලපත්‍රලාභී බැංකුවල තාක්ෂණික අවදානම් කළමනාකරණය හා ඔරොත්තුදීම පිළිබඳ නියාමන රාමුව" සමඟ අනුකූලවීමට බැංකුව සක්‍රියව කටයුතු කරන අතර තොරතුරු තාක්ෂණය හා තොරතුරු ආරක්ෂාව කළමනාකරණ පද්ධති වර්ධනය කිරීම නිරන්තර පාලන සමාලෝචන තුළින් සහතික කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්තිය මගින් තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ රාමුව විස්තර කරයි. මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය නියාමන අවශ්‍යතා සහ මනා පරිචයන් ක්‍රියාත්මක කිරීම නියාමනය කරයි. බැංකුව විසිනි KORIs තොරතුරු තාක්ෂණ හා ආරක්ෂක අවදානම් සඳහා ස්ඛි ස්ථාපිත කර ඇති අතර, ඒවා අවදානම් පැතිකඩ තක්සේරු කිරීම සඳහා පූර්ව නිශ්චිත මට්ටම්වලට අනුව නියාමනය කරනු ලැබේ. මීට අතිරේකව, තොරතුරු තාක්ෂණ අවදානම් සහ තොරතුරු තාක්ෂණය පදනම් ක්‍රියාවලීන් හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට මෙවලමක් ලෙස RCSA භාවිතා කෙරේ.

හඳුනා ගනු ලැබූ යම් අපගමනයන් කඩිනම් අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා BIRMC හරහා ඉහළ කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

## ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම

ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම යන්නෙන් සිදුවියහැකි බිඳවැටීම් අර්ථවත් කරන අතර ඉන් ස්වභාවික ආපදා, සයිබර් ප්‍රහාර, වසංගත හෝ සැපයුම දාම බාධාවන් වැනි නොවැළැක්වියහැකි සිදුවීම්වලදී අත්‍යවශ්‍ය මෙහෙයුම් පවත්වාගෙන යාමට ආයතනයට ඇති හැකියාව කෙරෙහි බලපෑම් කළ හැකිය.

අනපේක්ෂිත අභියෝගවල මෙහෙයුම් ඔරොත්තුදීම සහතික කිරීමට හා කඩා වැටීම අවම කිරීමට මෙවැනි අවදානම් ඵලදායී ආකාරයෙන් කළමනාකරණය කිරීම තීරණාත්මක වේ.

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණයට සහාය වීම සඳහා බැංකුව පාලන ව්‍යුහයක්, පුළුල් ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් ස්ථාපිත කර ඇත. ව්‍යාපාර මෙහෙයුම් අවම බිඳවැටීම් සමඟ අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා මෙම ක්‍රියාමාර්ග සැලසුම් කර ඇත. ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම සහ නියාමනය කිරීම සඳහා පරිපාලන අංශය වගකියයි. තොරතුරු තාක්ෂණ අංශය අත්‍යවශ්‍ය ආරක්ෂණ ස්ථරයක් සපයමින් බැංකුවේ ආපදා ප්‍රතිසාධන වැඩකොටස කළමනාකරණය කරයි.

## අනුකූලතා අවදානම

වර්තමාන සංකීර්ණ හා අන්තර් සම්බන්ධිත ව්‍යාපාර පරිසරයක් තුළ, නියාමන අවශ්‍යතා ඉදිරියට ගෙන යාම ආයතනයේ සාර්ථකත්වය හා තිරසාරභාවය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍යය. නැගීඑන අවදානම් හා අභියෝගවලට ප්‍රතිචාරාත්මකව අනුකූලතා රෙගුලාසි අඛණ්ඩව වෙනස් වෙමින් පවතී.

නියාමන වාතාවරණය වේගයෙන් වෙනස් වෙමින් පවතින අතර බැංකුවට ඵලදායී අවදානම් කළමනාකරණ උපායමාර්ග, ක්‍රමවේද සහ රාමු සංවර්ධනය කර ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍යතාව ඉන් ඇති කරයි. නියාමන වෙනස්වීම් කළමනාකරණය කිරීමට, නව රෙගුලාසි සමඟ අනුකූලව සිටීමට, ව්‍යාපාරය කෙරෙහි ඒවායේ බලපෑම තක්සේරු කිරීමට හා අනුකූලතාව සහතික කිරීමට සුවිශේෂී අනුකූලතා කණ්ඩායමක් වගකීමට බැඳී සිටී.

නියාමන අවශ්‍යතාවන්හි වැඩිවන සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින්, අනුකූලතා අවදානම සඳහා සාම්ප්‍රදායික ප්‍රවේශයන් තවදුරටත් ප්‍රමාණවත් නොවේ. මෙය විසඳීම සඳහා, බැංකුව නවීන, නව්‍යකරණ අවදානම් තක්සේරු කිරීමේ උපාය මාර්ග යොදාගෙන අති අතර, නියමයන් පදනම් ප්‍රවේශයක සිට ශක්තිමත් පාලන රාමුවකින් සහාය ලබන අවදානම පදනම් ප්‍රවේශයකට මාරු වී ඇත.

අනුකූලතා නිලධාරී විසින් මෙහෙයවන අනුකූලතා අංශය ඊෂසෘඵක හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි.

2024 තුළ, අනුකූලතා සහ නියාමන අවදානම් අවම කිරීම සඳහා බැංකුව ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කර ඇත:

- 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල්කරණය වැළැක්වීමට, සෙවීමට, විමර්ෂණය කිරීමට හා අභිචෝදනා කිරීමට මූල්‍ය බුද්ධි ඒකකයට සැකසහිත ගනුදෙනු වාර්තා කිරීම මෙයට ගනුදෙනු නියාමන පද්ධතිය හා ශාඛා මට්ටමේ තොරතුරු ලැබීම් වලින් පහසුකම් ඇති කරයි.
- බලතල හා වගකීම වෙන්කිරීම තීරණය කිරීමට 1988 අංක 33 දරන බැංකු පනතේ 76 (ජේ) (1) වගන්තිය මගින් දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරන නියෝගයට අනුකූලතා සහ ඒ තුළින් බැංකුවේ ව්‍යාපාර හා කටයුතු එහි අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික කළමනාකාරිත්වය විසින් කරගෙන යනු ලැබේ. මේ තුළින් බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය, පාලනය සහ ව්‍යාපාර මෙහෙයුම් ශක්තිමත් කරයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව



- අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල කාලීන සමාලෝචනය කිරීම සහතික කිරීම.
- බැංකුවේ ශාඛා, අංශ සහ නිෂ්පාදන පිළිබඳ අනුකූලතා තක්සේරු කිරීම් සිදු කිරීම සහ බැංකුවේ සමස්ත අනුකූලතාවය තක්සේරු කිරීම.
- වරින් වර පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබන අතර, ව්‍යාපාරය දැනුවත් කර සූදානම්ව තබා ගනිමින් පද්ධති පාදක නියාමනය සහ යාවත්කාලීන කිරීම් සිදු කරනු ලැබේ.

### නෛතික අවදානම

නෛතික අවදානම යන්නෙන් බැංකුවේ ව්‍යාපාර, සම්බන්ධතා, ක්‍රියාවලි, සහ සේවාවන්ට අදාළ නීති හා රෙගුලාසි පිළිබඳ දැනුම නොමැතිකම, අනවබෝධය, බහු අර්ථතාව, වැරදි ලෙස දැක්වීම තුළින් ඇතිවන මූල්‍ය අලාභ, කීර්තිනාම හානිය, හෝ මෙහෙයුම් බිඳවැටීම්වල අවදානම අර්ථවත් වේ. නෛතික අවදානම යනු මෙහෙයුම් අවදානමේ ආවේනික සංරචකයකි.

මෙයට ලියකියවිලි අඩුපාඩු සහ/හෝ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම හේතුවෙන් ගිවිසුම් ක්‍රියාත්මක නොකිරීමෙන් ඇතිවන අලාභ ඇතුළත් වන අතර, නඩුකීම්, ගිවිසුම් ආරවුල්, මූල්‍ය වගකීම් හෝ හානි සඳහා හිමිකම් පෑමට හේතු විය හැක.

බැංකුවේ නීති අංශය නෛතික අවදානම්වල උපායමාර්ගික කළමනාකරණය සඳහා වගකියයි. වියහැකි නෛතික අවදානම් හඳුනා ගැනීමට සහ බැංකුවේ හිමිකම් ආරක්ෂා කිරීමට සුදුසු අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට වෙනත් ව්‍යාපාර අංශ සමඟ සක්‍රියව සහයෝගයෙන් කටයුතු කරයි.

නීති අංශය අර්බුද අවස්ථා කළමනාකරණය කර ගැනීමට, පරිපාලිත සමාගම්වලට අදාළ ගැටළු විසඳීමට, අයකිරීම්වලට පහසුකම් ඇති කිරීමට, බැංකුවේ මෙහෙයුම්වලට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නීතියේ සංවර්ධනය සලකා බලමින් අභ්‍යන්තර නීති හා ක්‍රියාපටිපාටි ප්‍රතිශෝධනය කිරීමට නීතිමය සහය, මඟපෙන්වීම සහ උපදේශනය ලබා දේ. එමෙන්ම, එය නෛතික අවදානම්වල බරපතලකම අවම කිරීමට කාර්යක්ෂමව හා ඵලදායිව ප්‍රතිචාර දැක්වීමේදී හා බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් සහ අදාළ ව්‍යවස්ථාපිත රාමුවට අනුකූලව ගිවිසුම්ගත සම්බන්ධතා සහතික කිරීමේදී එය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

## පාරිසරික, සමාජීය හා පාලන අවදානම

පාරිසරික, සමාජීය හා පාලන (ESG) අවදානම් විවිධ අභියෝගවලට අයත්වන අතර ඒවා ආයතනයේ මූල්‍ය කාර්යසාධනය, ව්‍යාපාර අඛණ්ඩතාව සහ කීර්තිනාමය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇත.

මෙවැනි අවදානම් බැංකුවේ පාරිසරික, සමාජීය හා පාලන ව්‍යවහාරවලින් මතුවන අතර, දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා ඵලදායි කළමනාකරණය අවශ්‍ය වේ.

**පාරිසරික අවදානම්** - දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වය නැතිවීම, සහ පාරිසරික හායනය.

**සමාජීය අවදානම්** -මානව හිමිකම් ගැටළු, ස්ත්‍රීපුරුෂ විවිධත්වය, සහ සාධාරණ ශ්‍රම ව්‍යවහාර.

**පාලන අවදානම්** - ආයතනික පාලනය, මනා පරිචයන්, වගවීම, දූෂණ විරෝධී ප්‍රතිපත්තිය, තොරතුරු දැනුම්දීමේ යාන්ත්‍රණ, මැසිවිලි විසඳීමේ යාන්ත්‍රණ, සහ බදු සාධාරණත්වය.

වඩා හරිත, දේශගුණික හිතකාමී සහ සමාජීය වශයෙන් ඇතුළත් පරිසරයකට සහාය වීම සඳහා පාරිසරික හා සමාජීය අවදානම් කළමනාකරණය කිරීමේ වැදගත්කම බැංකුව හඳුනා ගනී. පාරිසරික හා සමාජීය අවදානම් කළමනාකරණය බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවට ඇතුළත් කර ඇති අතර, ව්‍යාපාර කටයුතුවලදී තිරසාරභාවය මූලික ප්‍රතිෂ්ඨාවක් බව සහතික කරයි.

පාලන අවදානම්, අවදානම් කළමනාකරණ විෂයපථය යටතට වැටෙන බැවින්, බැංකුව ව්‍යාපාර කටයුතු තිරසාරව හඳුනාගෙන සංවර්ධනය කරන බව සහතික කරන අතර තිරසාර මූලපිරීම්වලට සහයවීම පිණිස නව්‍යකරණ මූල්‍ය විසඳුම් නිර්මාණය කරයි.

දේශගුණ විපර්යාසවල ආර්ථික, මෙහෙයුම් සහ මූල්‍යමය ප්‍රතිවිපාක මෙන්ම එය අවම කිරීමේ උත්සාහයන් දේශගුණයට අදාළ මූල්‍ය අවදානම් ඇති කරයි. බැංකුව නිරන්තර පදනමක් මත දේශගුණ අවදානම් තක්සේරු කිරීමේ පවත්වයි.

## කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම යන්නෙන් සිය කටයුතු, ව්‍යාපාර ව්‍යවහාර, නිෂ්පාදන හා සේවා පිළිබඳ සෘණාත්මක පාර්ශවකාර අදහස් හේතුවෙන් බැංකුවේ සන්නාම අගය මත වියහැකි අහිතකර බලපෑම අර්ථවත් වේ. කීර්තිනාම අවදානම ඵලදායිව කළමනාකරණයට විස්තීර්ණ උපායමාර්ග යක් අවශ්‍ය වන අතර, එයට සක්‍රීය පාර්ශවකාර සහභාගිත්වය, සදචාර නායකත්වය, විනිවිද සන්නිවේදනය, සහ ශක්තිමත් සයිබර් ආරක්ෂක ක්‍රියාමාර්ග ඇතුළත්ය. කීර්තිනාම අවදානම කළමනාකරණය බැංකුවේ සමස්ත අවදානම කළමනාකරණ රාමුවට ඒකාබද්ධ කිරීමෙන් ඔරොත්තුදීම වැඩි කර ගනුදෙනුකාර විශ්වාසය පවත්වාගනී.

අවදානම කළමනාකරණය තුළ විස්තීර්ණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, අභ්‍යන්තර පාලනයන් හා මනා පරිචයන් ක්‍රියාත්මක කරමින් සියලුම ගනුදෙනුකාර ස්පර්ශක ස්ථාන හරහා බැංකුව සිය සන්නාමය හා කීර්තිනාමය ආරක්ෂා කරයි. ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට හා පක්ෂපාතිත්වය පෝෂණය කිරීමට මෙවැනි ක්‍රියාමාර්ග සැලසුම් කෙරේ. ඊට අමතරව, අලෙවිකරණ අංශය සමාජ මාධ්‍ය, ඇතුළුව සියලුම මධ්‍ය ප්‍රකාශන සමීපව නියාමනය කරන අතර, අවශ්‍ය විට කඩිනම් ක්‍රියාමාර්ග ගනී.

බැංකුවට කීර්තිනාම අවදානම සඳහා ශුන්‍ය අවදානම් අභිරුචියක් ඇත. දෙවැනි ආරක්ෂක මාර්ගය ලෙස, අවදානම කළමනාකරණ අංශය කීර්තිනාම අවදානම සමීපව නියාමනය කරන අතර, සුදුසු ක්‍රියාමාර්ග සඳහා යම් ගැටළු කළමනාකාරිත්වයට සන්නිවේදනය කරයි. අභ්‍යන්තර ප්‍රාග්ධනය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) තුළ කීර්තිනාම අවදානම තක්සේරු කිරීමට ලකුණු කාඩ්පතක් පදනම් ආදර්ශයක් භාවිතා කරනු ලබයි.

## උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම යන්නෙන් බැංකුවේ දිගුකාලීන පරමාර්ථ හා සමස්ථ උපායමාර්ගවලට බලපාන තීරණවලින් ඇතිවියහැකි මූල්‍ය අලාභය හෝ අහිතකර සමාජීය ප්‍රතිඵලය අදහස් වේ. මෙම අවදානම අහිතකර ආර්ථික තත්ත්වයන්, පාලන ගැටළු, බාහිර වෙළඳපොල ගතිකත්වයන්, තාක්ෂණික වෙනස්කම් හෝ ගනුදෙනුකාර මනාපයන් හී වෙනස්වීම් ඇතුළු විවිධ සාධකවලින් පැන නැගිය හැකිය.

බැංකුවේ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේදී, සිය අවදානම් අභිරුචිය පෙළ ගැසීම සහතික කිරීමේදී අභ්‍යන්තර හා බාහිර පරිසරයේ වෙනස්වීම්, තරගකරුවන්ගේ හැසිරීම්, ගනුදෙනුකාර ප්‍රවනතා, සහ තාක්ෂණික වර්ධනයන් වැනි ප්‍රධාන සාධක පරිස්සමින් සලකා බලනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය බැංකුවේ නුබුත්වත්භාවය සුරක්ෂිත කිරීමේදී සහ උපායමාර්ගික අවදානම් කාලීනව කළමනාකරණය සහතික කිරීමේදී පරික්ෂාකාරීව සිටී.

2024 වසර තුළ උපායමාර්ගික පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේදී හිතකර ආර්ථික සාධක ඇති කරන ලද අතර 2023 වසරට සාපේක්ෂව වර්ධිත මූල්‍ය කාර්යසාධනයක් ඇති කරන ලදී.

ICAAP තුළ උපායමාර්ගික අවදානම තක්සේරු කිරිමට ලකුණු කාඩ්පත් පදනම් ආදර්ශයක් භාවිතා කරනු ලබයි.

## ප්‍රාග්ධන කළමනාකරණය

නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට, සිය තැන්පතුහිමියන්ට හා ණයකරුවන්ට මූල්‍ය ආරක්ෂාව ලබාදීමට සහ අනාගත ව්‍යාපාර පුළුල් කිරීම සඳහා අයබදු පවත්වා ගැනීමට සහ සිය කොටස්හිමියන්ට ප්‍රමාණවත් ප්‍රතිලාභ උත්පාදනය කිරීමට බැංකුවට ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වයක් අවශ්‍යය.

ඵලදායි ප්‍රාග්ධන කළමනාකරණය බැංකුවේ ඔරොත්තුදීම වැඩි කරන අතර ප්‍රශස්ත පාර්ශවකාර ප්‍රතිඵල සහතික කරයි. බැංකුවේ අරමුණ වන්නේ වත්කම් මත බර තැබූ අවදානම් (RWA) මුසුව සහ අවදානම් පැතිකඩෙහි වෙනස්වීම් සම්පව නියාමනය කරමින් කාර්යසාධනය හා අවදානම අතර තුලනය ප්‍රශස්ථ කිරීමයි. ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියාවලිය මහ බැංකුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශවලට අනුකූල වේ.

2019 අංක 11 දරන බැංකු පනත් නියෝගය පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ විධාන සංශෝධන මත, 45 වගුව තුළ දක්වා ඇති පරිදි අවම ප්‍රාග්ධන අනුපාත පවත්වා ගැනීම අවශ්‍ය වේ.

බැංකුව 2024 වසර සඳහා නියාමන අවම අවශ්‍යතා මට්ටමට ඉහළින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව පවත්වා ගැනීමට සමත් විය. CET1 අනුපාත තත්ත්වය වසර තුළ 2023 දෙසැම්බර් 31ට පැවති 15.33% සිට 2024 දෙසැම්බර් 31 දිනට 21.71% දක්වා වැඩි විය. බැංකුවේ ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය 2024 දෙසැම්බර් 31 දිනට 23.42% දක්වා වැඩි විය. මුළු ප්‍රාග්ධන අනුපාතය 2023 දෙසැම්බර් 31 දිනට පැවති 19.26%ට අනුව 2024 දෙසැම්බර් 31 දිනට 25.88% දක්වා වැඩි විය.

සමූහයේ මුළු ප්‍රාග්ධන අනුපාතය 2023 දෙසැම්බර් 31ට පැවති 22.24% ට අනුව 2024 දෙසැම්බර් 31 දිනට 29.06% ක් විය. 100%ක් රජයට අයත් ඉතුරුම් බැංකුවක් ලෙස, නියාමන ප්‍රාග්ධනය බාහිරින් රැස්කර ගැනීමට ලබාගත හැකි විකල්ප සීමිත වේ. එබැවින්, රඳවාගත් ඉපයීම් බැංකුවේ ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමේ ප්‍රධාන මූලාශ්‍රය වේ. ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමට රඳවාගත් ඉපයීම්වල දායකත්වය 2023 වසරේදී රු.බිලියන 7.2ක් වූ අතර 2024 වසර තුළ එය රු. බිලියන 16.2ක් විය.

### ප්‍රාග්ධන මට්ටම බැංකුව සහ සමූහය

ප්‍රස්ථාරය 63




### ප්‍රාග්ධන ප්‍රමාණාත්මකා අනුපාතය

| අනුපාත (%) | නියාමන අවමය | 2024 දෙසැම්බර් 31 දිනට සත්‍ය | | 2023 දෙසැම්බර් 31 දිනට සත්‍ය | |
|---|---|---|---|---|---|
| | | බැංකුව | සමූහය | බැංකුව | සමූහය |
| CET 1 plus CCB | 7 | **21.71** | **25.03** | 15.33 | 18.39 |
| Tier 1 plus CCB | 8.5 | **23.42** | **26.69** | 16.91 | 19.94 |
| මුළු ප්‍රාග්ධනය | 12.5 | **25.88** | **29.06** | 19.26 | 22.24 |

වගුව 45 ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය

# අවදානම් කළමනාකරණ වාර්තාව



බැංකුව ස්ථර I සහ ස්ථර II අවදානම් ආවරණය කිරීමට අවම නියාමන මට්ටම්වල අතිරික්තය තුළ සහ ආතති පරීක්ෂණ ස්වාරක්ෂකයක් ලෙස ප්‍රාග්ධනය පවත්වාගෙන යාමට අදහස් කරයි. පීඩන තත්ත්වයන් යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාව තක්සේරු කිරීමට පවතින හා ප්‍රක්ෂේපිත අවදානම් ක්ෂේත්‍ර පිළිබඳ ආතති පරීක්ෂණ පවත්වනු ලබයි.

## අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP)

බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන මට්ටම සිය අවදානම් පැතිකඩ සමග සරිලන බව සහතික කිරීමට අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සිදු කරයි. එය මඟින් ව්‍යාපාර කාර්යසාධනය, අවදානම් කළමනාකරණ කාර්යයන් සහ ව්‍යුහගත ආකාරයෙන් අවදානම් සංවේදී ප්‍රාග්ධනය ඒකාබද්ධ කරයි.

ICAAP මඟින් විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් තුළ අවදානම් රුචිය, ආතති පරීක්ෂණය, සහ ප්‍රාග්ධනය සැලසුම් කිරීම ඒකාබද්ධ කරන අතර සියලුම ප්‍රමාණාත්මක අවදානම් ඵලදායීව ග්‍රහනය කරන බව සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය BIRMC හරහා, අධීක්ෂණය ලබාදෙන අතර අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ලේඛණගත කිරීම සඳහා වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ICAAP ප්‍රතිපත්තියට අනුකූලව ICAAP පවත්වා ලේඛන ගත කරන අතර එය අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය සඳහා බාසල් III කුළුණ II මාර්ගෝපදේශ, සහ ජාත්‍යන්තර මනා පරිචයන් පිළිබඳ මහ බැංකුවේ නියෝග සමඟ පෙළ ගැසේ. බැංකුවේ අවදානම් තක්සේරු කිරීම් කුළුණ I සහ කුළුණ II අවදානම් ඒකාබද්ධ කෙරේ.

බැංකුව සහ නියාමක සඳහා මූලික මාර්ගෝපදේශ ලෙස සේවය කරන ප්‍රධාන මූලධර්ම හතරක් මඟින් බැංකුවේ ICAAP පාලනය කෙරේ. බැංකුව සිය අවදානම් පැතිකඩ සහ අභ්‍යන්තර ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කර ප්‍රමාණනය කිරීමට අභ්‍යන්තර ආදර්ශයක් භාවිතා කරයි. අවදානම් තක්සේරුව කුළුණ I සහ කුළුණ II අවදානම් ග්‍රහනය කර ගනී. අවදානම් අභිරුචි සීමාව නිරන්තර පදනමක් මත ප්‍රාග්ධන මට්ටම් නියාමනයට පහසුකම් සැලසීම සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාව සලකා බලමින් නියම කෙරේ. ICAAP ප්‍රාග්ධන මට්ටම්වලට සම්බන්ධ කරන අතර, සියලුම අවදානම් නිරාවරණ ආවරණය (කුළුණ I සහ කුළුණ II) කිරීමට නියාමන අවම අවශ්‍යතාවල අතිරික්තය තුළ බැංකුව ප්‍රාග්ධනය තබාගන්නා බව සහතික කරයි.

## ආතති පරීක්ෂණය

ආතති පරීක්ෂණය ICAAP හි අත්‍යවශ්‍ය කොටසකි. බැංකුවේ ආතති පරීක්ෂණ රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය සහ මහ බැංකුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ මඟින් පාලනය කෙරේ. බැංකුවේ ආතති පරීක්ෂණ රාමුවට ණය අවදානම, වෙළෙඳ පොතේ හා බැංකු පොතේ පොලී අනුපාත අවදානම සහ මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම, සංකේන්ද්‍රණ අවදානම, සහ ශේෂ වූ ණය අවදානම වැනි සියලුම ප්‍රමාණාත්මක අවදානම් මත ආතති පරීක්ෂණ ඇතුළත් වේ. ආතති පරීක්ෂණ අරමුණ සඳහා සුළු, මධ්‍ය හා විශාල (හෝ අඩු, මධ්‍යම හා ඉහළ) වැඩිවන බරපතලකමේ මට්ටම් තුනක් බැංකුව අර්ථ දක්වා ඇත.

ආතති පරීක්ෂණය බැංකුව ක්‍රියාත්මක පරිසරය තුළ අහිතකර ආර්ථික, දේශපාලණික, සහ භෞතික වෙනස්වීම් යටතේ වෙනස්වන අනපේක්ෂිත අවස්ථාවන්ට ඔරොත්තුදීමට බැංකුවේ හැකියාව පිළිබඳව අවබෝධයක් ලබා දේ.

පොලී අනුපාත, විනිමය හුවමාරු අනුපාත, සහ ස්කන්ධ මිල ගණන් ඇතුළුව විශේෂිත උපකරණ හෝ කළඹ කෙරෙහි තනි වෙළෙඳපොල සාධකවල වෙනස්වීමේ බලපෑම මැනීමට සංවේදී විශ්ලේෂණ භාවිතා කෙරේ. අහිතකර පොලී අනුපාත උච්චාවචනයන්, හේතුවෙන් වෙළෙඳ හා බැංකු කළඹ කෙරෙහි බලපෑම හඳුනා ගැනීමට බැංකු ප්‍රධාන වශයෙන් සංවේදී විශ්ලේෂණ භාවිතා කරන අතර වාර්තා නිරන්තර පදනමක් මත වත්කම් හා වගකීම් කමිටුවට ඉදිරිපත් කෙරේ.

මෙම වාර්තා වත්කම් හා වගකීම් කළමනාකරණය හා බැංකුවේ මිලකරණ තීරණවලට අත්‍යවශ්‍ය වේ.

| රු. මිලියන | FVPL | FVOCI | එකතුව |
|---|---|---|---|
| **2024 වසර සඳහා උපලබ්ධි නොවූ ලාභය/(අලාභය)** | **48** | **558** | **606** |
| **M2M වටිනාකම තුළ අවදනම් කම්පන වෙනස** | | | |
| ආදායමේ 100 bps වැඩිවීම | (73) | (553) | (626) |
| ආදායමේ 200 bps වැඩිවීම | (145) | (1,091) | (1,236) |
| ආදායමේ 100 bps අඩුවීම | 74 | 567 | 641 |
| ආදායමේ 200 bps අඩුවීම | 150 | 1,149 | 1,299 |

වගුව 46 සංවේදී විශ්ලේෂණ – වෙළෙඳ කළඹ රජයේ සුරැකුම්පත්වල පොලී අනුපාත

| සෘණාත්මක පරතර මත 100bp අනුපාත කම්පනය | | මාස 1 දක්වා | මාස 1-3 | මාස 3-6 | මාස 6-12 | අවුරුදු 1-3 | අවුරුදු 3-5 | අවුරුදු 5ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **තනි මට්ටම** | පරතරය (රු. මි.) | (224,217) | (428,452) | (198,403) | (102,698) | 295,862 | 267,327 | 404,649 | 14,069 |
| | NII මත බලපෑම (රු. මි.) | 2,156 | 3,580 | 1,250 | 267 | – | – | – | 7,254 |
| **ඒකාබද්ධ මට්ටම** | පරතරය (රු. මි.) | (242,908) | (428,991) | (198,510) | (103,735) | 301,707 | 269,416 | 405,850 | 2,828 |
| | NII මත බලපෑම (රු. මි.) | 2,336 | 3,585 | 1,251 | 270 | – | – | – | 7,442 |

වගුව 47 සංවේදී විශ්ලේෂණ – බැංකු කළඹ තුළ ඵලදා වක්‍රය තක්සේරු කිරීම

ආතති පරීක්ෂණ ව්‍යවහාරයෙන් ලබාගත් ප්‍රතිඵල අවදානම් අභිරුචිය හා අවදානම් සීමා, සකස් කිරීම, ප්‍රාග්ධන සැලසුම්කරණය, උපායමාර්ගික ව්‍යාපාර සැලසුම් කිරීම සඳහා සහ සක්‍රීය තීරණ ගැනීමට සහයවීමට තීරණාත්මක ව්‍යාපාර මෙහෙයුම්වල අවදානම් කළමනාකරණය කිරීමට භාවිතා කෙරේ.

විවිධ ආර්ථික තත්ත්වයන්ගේ ගම්‍යාර්ථයන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට, අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ICAAP තුළින් නියාමකට බලපෑම් වේලාසනින් සන්නිවේදනය කිරීමට පරීක්ෂා කළ පීඩනයන් වේ.

| අවදානම් ක්ෂේත්‍ර | අවස්ථා | විවිධ ආතති මට්ටම්වලදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයට බලපෑම % | | |
|---|---|---|---|---|
| | | පහළ | මධ්‍යම | ඉහළ |
| ණය අවදානම | **ණය අවදානම - PD හි වැඩිවීම**<br>10% කින්<br>20% කින්<br>30% කින් | (0.762) | (1.493) | (2.262) |
| වෙළෙඳපොළ අවදානම් | **පොලී අනුපාත අවදානම: වෙළෙඳපොළ ඉපයීම් වැඩිවීම**<br>පහළ 50bps<br>මධ්‍යම 100bps<br>ඉහළ 200bps | (0.104) | (0.207) | (0.409) |
| | **ස්කන්ධ මිල අවදානම: වෙළෙඳපොළ මිල අඩුවීම**<br>පහළ 10%<br>මධ්‍යම 20%<br>ඉහළ 30% | (0.004) | (0.007) | (0.011) |
| | **විදේශ විනිමය අවදානම: හුවමාරු අනුපාත විතැන්වීම**<br>පහළ 10%<br>මධ්‍යම 15%<br>ඉහළ 20% | (0.001) | (0.002) | (0.003) |
| මෙහෙයුම් අවදානම | බාසල් II අලාභ සිදුවීම් වර්ග යටතේ වර්ගීකරණය කළ මෙහෙයුම් අලාභවල වැඩිවීම | (0.099) | (0.138) | (0.181) |

වගුව 48 විවිධ ආතති මට්ටම්වලදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයට බලපෑම

## අයකිරීම සැලසුම්කරණය

දැඩි පීඩන අවස්ථාවක් තුළ, ආයතනික විශේෂ පීඩනයන්, වෙළෙඳපොළ අතර, පීඩනයන්ගෙන් හෝ මේ දෙකම ඒකාබද්ධවීමෙන් ඇති විය හැකි ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ වෙනත් සියලු අංශ සමඟ කටයුතු කරමින් කාලීන ආකාරයෙන් සිය ශක්තිය නැවත සකස් කර ගැනීමට සූදානම් විමට බැංකුවලින් ඉල්ලා ඇත.

අයකිරීම් සැලසුම් කිරීම වර්තමාන අවදානම් පැතිකඩ, අවදානම් අභිරුචිය හා දරාගැනීම සලකා බලමින් පූර්ව සංඥා දර්ශක සහ අයකිරීමේ පූරක මගින් බලපෑමට ලක්වේ. අයකිරීමේ සැලසුම දැඩි පීඩන අවස්ථාවල බැංකුවට රඳා පැවතීම සඳහා අයකිරීමේ විකල්ප රාශියක් හඳුනා ගනී.

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා අයකර ගැනීමේ සැලසුම් පිළිබඳ 2021 අංක 09 දරන බැංකු පනතේ උපදෙස්වලට අනුකූල වන බවට ලේඛනගත කර ඇති බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අයකිරීමේ සැලැස්මක් (RCP) ක්‍රියාවට නංවා ඇත.

## අවම අනාවරණ අවශ්‍යතා - ස්ථර III

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ අවදානම් නිරාවරණය අගය කිරීම සඳහා වෙළෙඳපොළ සහභාගිවන්නන්ට ඉඩදෙන බාසල් රාමුව III තුළ මහ බැංකුව විසින් අවම අනාවරණ අවශ්‍යතා හඳුන්වා දෙන ලදී. 2016 අංක 01 දරන බැංකු පනත් නියෝග පරිදි අවම අනාවරණ අවශ්‍යතා 426 සිට 437 දක්වා පිටුවල දැක්වේ.



සංයුක්තය

# මූල්‍ය වාර්තා


222
මූල්‍ය දින දර්ශනය

223
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

229
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය

230
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

232
අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව

233
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

234
විගණකාධිපති වාර්තාව

237
මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය

238
ආදායම් ප්‍රකාශය

239
විස්තීරණ ආදායම් ප්‍රකාශය

240
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

242
හිමිකමේ වෙනස්වීමේ ප්‍රකාශය

246
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

248
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

# මූල්‍ය දින දර්ශනය



**මූල්‍ය දින දර්ශනය 2024**

| | |
|---|---|
| 2024 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2024 මැයි 31 |
| 2024 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2024 අගෝස්තු 30 |
| 2024 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2024 නොවැම්බර් 29 |
| 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා (විගණනය කළ) ප්‍රකාශයට පත් කිරීම | 2025 මාර්තු 21 |

**යෝජිත මූල්‍ය දින දර්ශනය 2025 (දළ වශයෙන්)**

| | |
|---|---|
| 2025 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2025 මැයි 23 |
| 2025 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2025 අගෝස්තු 22 |
| 2025 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2025 නොවැම්බර් 21 |
| 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා (විගණනය කළ) ප්‍රකාශයට පත් කිරීම | 2026 මාර්තු 20 |

## 1 සාමාන්‍ය කරුණු

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධනවල අවශ්‍යතාවන්ට අනුකූල වෙමින් 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ කටයුතු පිළිබඳ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සමඟ බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි. මෙම වාර්තාවට 1988 අංක 30 දරන බැංකුකරණ පනත සහ එයට සිදුකළ සංශෝධන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා සංස්ථාපිත පාලනය පිළිබඳ නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකු පනත් නියමයේ උපදෙස් යටතේ අවශ්‍ය යම් හෙළිදරව් කිරීම් ද එයට පසුකාලීන සංශෝධන ද ඇතුළත් වේ. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලද අතර 2025 පෙබරවාරි 28 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතින් ශ්‍රී ලංකාවේදී සංස්ථාපිත කරන ලද අතර 1988 අංක 30 දරන බැංකු පනත සහ එයට සිදුකළ සංශෝධන ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය පිරිනමන ලදී. බැංකුව ශ්‍රී ලංකා රජයට සම්පූර්ණයෙන්ම අයත් වේ. බැංකුවට ලංකා රේටින්ග් ආයතනය විසින් AAA (ස්ථාවර) දිගුකාලීන ණය ශ්‍රේණිගත කිරීම් ලබා දී ඇත.

## 2 ව්‍යාපාර සමාලෝචන

### 2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

වසර තුළ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන මගින් බලය පවරන ලද ශ්‍රී ලංකාවේ ජනතාව අතර ඉතුරුම්, පාරිභෝගික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, වෙළඳ මූල්‍යකරණය, ප්‍රාථමික ගනුදෙනු, වෙනත් භාණ්ඩාගාර ගනුදෙනු සහ නියෝජිත බැංකුකරණය සහ මුදල් ප්‍රේෂණ පහසුකම්, උකස් ණය, විදේශ විනිමය ගනුදෙනු සහ අනෙකුත් මූල්‍ය සේවා ප්‍රවර්ධනය කිරීමයි.

### 2.2 දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ අගයන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 10 හි සඳහන් කර ඇත. සියලු ස්ථිර සේවකයන් බැංකුවේ දැක්ම සහ මෙහෙවර කරා ලඟා වීමේ දැක්මෙන් යුතුව බැංකුවේ ආයතනික චර්යාධර්ම සංග්‍රහයට සහ රජයේ ප්‍රතිඥාවට අනුකූලව කටයුතු කරයි.

### 2.3 රජයේ සහතික වීම

ශ්‍රී ලංකා රජය, බැංකුවේ තැන්පත් කළ මුදල් සමග පොලී මුදල් ආපසු ගෙවීමට සහතික වෙයි.

### 2.4 බැංකුවේ පරිපාලිත සමාගම්

එන්.එස්.බී. අරමුදල් කළමනාකරණ සීමිත සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගම් වේ. එන්.එස්.බී. අරමුදල් කළමනාකරණ සීමිත සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලයලත් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකුලෙස රජයේ සුරැකුම්පත් වෙළඳාම් කිරීමය. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ඉතිරිකිරීම් හා කාලීන තැන්පතු ලබා ගැනීම, ණය ලබාදීම, කල්බදු, කුලීපිට ගැණුම්, උකස් ණය සහ වෙනත් ණය පහසුකම් සැපයීම සහ ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුවේ ණය ගිණුම් ප්‍රතිනිර්මාණය කිරීමත් සමග පැහැර හරින ලද තැන්පතු වගකීම් පියවීමයි. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම්, වගකීම් සහ කාර්ය මණ්ඩලය අවශෝෂණය කර ගැනීමට බැංකුව එකඟවන ලදී. 2024 මාර්තු 31 දිනට ප්‍රථම අවශෝෂණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ සිය 2024 ජනවාරි 11 දිනැති ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විසින් සම්පාදිත කාලරාමු සහිත ක්‍රියාකාරී සැලසුමක් බැංකු පිළිබඳ අධීක්ෂණ අධ්‍යක්‍ෂ වෙත යවනු ලැබිණි. මූල්‍ය ප්‍රකාශන 24 සහ 52 සටහනෙහි ගනුදෙනු පිළිබඳ විස්තර දක්වා ඇත.

### 2.5 සමූහයේ ව්‍යුහයට වෙනස් කිරීම්

බැංකුවෙහි සහ සමූහයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනස්කම් සිදු නොවීය.

### 2.6 වසරේ ව්‍යාපාර කාර්යසාධනය සමාලෝචනය

2024 මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ සමස්ත මූල්‍ය කාර්ය සාධන සමාලෝචනය සභාපතිතුමාගේ පණිවිඩයේ (පිටු අංක 16) සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනයේ (පිටු අංක 20) තුළ දක්වා ඇත.පිටු අංක 81 සිට 151 දක්වා කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන (පිටු අංක 237 - 391) මගින් බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර මාර්ග සහ කටයුතුවල තත්ත්වය පිළිබඳ විස්තීර්ණ සහ සාධාරණ සමාලෝචනයක් සපයයි. මෙම වාර්තා වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

### 2.7 ශාඛා ජාලය පුළුල් කිරීම

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, බැංකුවේජාලයට නව ශාඛා කිසිවක් එකතු කර නොමැති අතර, එය තවමත් ශාඛා (262) කින් සමන්විත වේ.

බැංකුව ඒටීඑම් සහ සීආර්එම් යන්ත්‍ර (417) ක් ක්‍රියාත්මක කරන අතර, වෙනත් බැංකු වල ඒටීඑම් යන්ත්‍ර වෙත ප්‍රවේශ වීමෙන්ද ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව ගනුදෙනු සිදු කිරීමට හැකි වේ.

### 2.8 මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීම

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs/LKASs) සහ 1988 අංක 30 දරණ බැංකු පනතේ සහ එයට වූ සංශෝධනවල අවශ්‍යතා සහ විශේෂිත අනාවරණයන් ඇතුළුව නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව, පිළියෙල කර ඇත. 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් විධිමත්ව සහතික කරන ලද අතර, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ සභාපති ඇතුළු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් විසින් අනුමත කර අත්සන් කරන ලද පිටු අංක 238 - 241 හි සඳහන් එය, බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

### 2.8.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වසර තුළ වෙනස් වීම්

බැංකුව සහ සමූහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ශ්‍රී.ල.ගි.ප්‍ර.) අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්තාවේ පිටු අංක 248 සිට 264 දක්වා ඇතුළත් වේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ බැකුවේ සහ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවිය.

### 2.9 මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාධාරණ දැක්මක් පිළිබිඹු කරන මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. පිටු අංක 237 සිට 391 දක්වා වූ පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ශ්‍රී ල.ගි.ප්‍ර.) සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කර ඇති බව අධ්‍යක්ෂවරු විශ්වාස කරති. මෙම වාර්ෂික වාර්තාවේ 229 පිටුවේ දැක්වෙන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය මගින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සවිස්තරාත්මකව පැහැදිලි කරන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

### 2.10 විගණකවරුන්ගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 154 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව විගණකාධිපතිවරයා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විගණකාධිපතිවරයා වන්නේය. 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලදී.

තවද, විණනකාධිපතිවරයා විසින් බැංකුවේ පරිපාලිත සමාගම් වන එන්.එස්.බී. අරමුදල් කළමනාකරණ සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විගණනය කරන ලදී. 2024 වසර පුරාවටම, බැංකුව සඳහා විගණනය කරගෙන යන ලදී.ඔවුන්ගේ වාර්තාවල හඳුනා ගන්නා ලද ගැටළු කඩිනම් ක්‍රියාමාර්ග සඳහා නිරන්තරව කළමනාකරණය වෙත ඉදිරිපත් කරන ලදී. මූල්‍ය වාර්තාකරණයේ නිවැරදි බව තහවුරු කර, මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය දත්ත සහ තොරතුරු සහිතව විගණකාධිපතිගේ පරීක්ෂාව සඳහා ලබා දෙන ලදී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 234 පිටුවේ අන්තර්ගත වේ.

## 3 ඉදිරි සංවර්ධනයන්

බැංකුවේ අනාගත සංවර්ධනයන් පිළිබඳ සමාලෝචනයක් සභාපතිතුමාගේ පණිවිඩයෙහි (පිටු අංක 19), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනයෙහි (පිටු අංක 24) සහ කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණයෙහි පිටු අංක 81 සිට 157 දක්වා පිටුවල 2024 ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

## 4 දළ ආදායම

වර්ෂය සඳහා බැංකුවේ දළ ආදායම රුපියල් මිලියන 207,637 (2023 රු. මිලියන 232,064) වූ අතර සමූහයේ ආදායම රුපියල් මිලියන 213,417 (2023 රු. මිලියන 238,825) විය. බැංකුවේ සහ සමූහයේ දළ ආදායම විශ්ලේෂණය කිරීම මූල්‍ය ප්‍රකාශනවල සටහන 3 හි දක්වා ඇත. බැංකුවේ දළ ආදායම සමූහයේ දළ ආදායමෙන් 97.3% (2023 97.2%) ක් විය. බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ආදායම පොලී ආදායම වන අතර එය පිළිවෙලින් දළ ආදායමෙන් 98.1% (2023 97.8%) සහ 97.8% (2023 96.8%) කින් සමන්විත වේ.

## 5 ලාභාංශ සහ සංචිත

### 5.1 මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජනයන්

බැංකුවේ සහ සමූහයේ ආදායම් බද්දට පෙර ලාභය පිළිවෙලින් රුපියල් මිලියන 26,431 ක් සහ රුපියල් මිලියන 28,522 ක් විය (2023 - රුපියල් මිලියන 4,287 ක් සහ රුපියල් මිලියන 8,022 ක්).

බැංකුවේ සහ සමූහයේ බදු ගෙවීමෙන් පසු ලාභය පිළිවෙලින් රු. මිලියන 16,285 ක් සහ රු. මිලියන 17,660 ක් විය (2023 රු. මිලියන 7,216 ක් සහ රු. මිලියන 9,617 ක්). බැංකුවට සහ සමූහයට අදාළ ලාභය පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත:

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | **2023** රු. මිලියන | 2023 රු. මිලියන | **2023** රු. මිලියන | 2023 රු. මිලියන |
| සියලු වියදම් ගෙවීමෙන් පසුව ක්ෂයවීම්, අපේක්ෂිත ණය හානි සහ අවිනිශ්චිතතාවයන් වලට ගැලපීමෙන් පසු එකතු කළ අගය මත බදු (VAT) සහ ආදායම් බදු වලට පෙර වාර්ෂික ලාභය | **35,778** | 5,589 | **38,411** | 10,109 |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT) | **8,208** | 1,143 | **8,683** | 1,833 |
| මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) | **1,139** | 159 | **1,206** | 254 |
| ආදායම් බදු වියදම් | **10,145** | (2,929) | **10,862** | (1,594) |
| වසර සඳහා ලාභය | **16,285** | 7,216 | **17,660** | 9,617 |
| වසර සඳහා වෙනත් බදු පසු ශුද්ධ විස්තීරණ ආදායම් | **1,184** | 385 | **1,388** | 867 |
| වසර සඳහා මුළු විස්තීරණ ආදායම | **17,470** | 7,602 | **19,048** | 10,483 |
| **විසර්ජනයන්:** | | | | |
| ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කිරීම | **(326)** | (144) | **(347)** | (182) |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය (NITF) | **(163)** | – | **(163)** | – |
| ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය/ලාභාංශ | **–** | – | **–** | – |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතය | **(162)** | – | **(162)** | – |
| සංචිතයට | **(16,819)** | – | **(18,736)** | – |

### 5.2 බදු සඳහා ප්‍රතිපාදන

2022 දෙසැම්බර් 19 දින සහතික කළ 2022 අංක 45 දරන දේශීය ආදායම් පනත (සංශෝධිත) පරිදි, ආදායම් බදුවල සම්මත අනුපාතය 30% විය. 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට අනුව, 2022 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවාවන්ට එකතුකළ අගය මත 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බදු සඳහා බැංකුව යටත් වේ. බැංකුවෙහි සහ සමූහයෙහි මෙහෙයුම් මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සඳහා 18% අනුපාතිකයකට යටත් විය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 12) - "ආදායම් බදු" පිළිබඳ ගිණුම් ප්‍රමිතියට අනුකූලව වගකීම් ක්‍රමය යටතේ බැංකුව සහ සමූහය සියළු හඳුනාගත් තාවකාලික විෂමතා සඳහා විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන සිදුකොට ඇත. ආදායම් බදු වියදම් සහ විලම්බිත බදුකරණය පිළිබඳ තොරතුරු පිළිවෙළින් පිටු අංක 275 සිට 311 පිටුවල, 13 සහ 30 සටහන් යටතේ දක්වා ඇත.

### 5.3 ලාභාංශ, බදු සහ අයබදු/ජාතියට දායකත්වය

බැංකුව 2024 වසරේදී බදු සහ අයබදු ලෙස රු. මිලියන 21,234ක් රජයට දායක කර ඇත. (2022 – රු. මිලියන 813). මෙයට පහත දේ ඇතුළත්ය.

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | බැංකුව 2024 රු. මිලියන | බැංකුව 2023 රු. මිලියන | සමූහය 2024 රු. මිලියන | සමූහය 2023 රු. මිලියන |
|---|---|---|---|---|
| ආදායම් බදු | **10,145** | (2,929) | **10,862** | (1,594) |
| එකතු කළ අගය මත බදු/සමාජ ආරක්ෂණ බදු | **9,347** | 1,301 | **9,889** | 2,087 |
| විශේෂ ගාස්තු | **320** | 320 | **320** | 320 |
| ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය | **–** | – | **–** | – |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය | **163** | – | **163** | – |
| **ජාතිය සඳහා මුළු දායකත්වය** | **19,976** | (1,308) | **21,234** | 813 |

### 5.4 සංචිත

2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු සංචිත රු. මිලියන 89,443 ක් විය (2023 - රු. මිලියන 71,974). බැංකුවෙහි සංචිත පහත ඒවායින් සමන්විතය.

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | බැංකුව 2024 රු. මිලියන | බැංකුව 2023 රු. මිලියන | සමූහය 2024 රු. මිලියන | සමූහය 2023 රු. මිලියන |
|---|---|---|---|---|
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | **5,695** | 5,369 | **5,811** | 5,464 |
| ප්‍රත්‍යාගණන සංචිතය | **7,946** | 7,946 | **8,643** | 8,643 |
| රඳවා ගත් ඉපැයුම් | **28,462** | 14,408 | **33,772** | 18,606 |
| වෙනත් සංචිත | **47,339** | 44,251 | **49,209** | 45,676 |
| **මුළු සංචිත** | **89,443** | 71,975 | **97,435** | 78,389 |

සංචිතවල වෙනස් වීම පිළිබඳ තොරතුරු හිමිකම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශයෙහි 242 - 245 පිටුවල දක්වා ඇත.

## 6 තැපැල් දෙපාර්තමේන්තුව සඳහා සේවා ගාස්තු

2024 වසර සඳහා තැපැල්පති සඳහා සේවා ගාස්තුව 2023 පරිදිම එම පදනම මත, රු. මිලියන 359 ක් වෙන්කර ඇත.

## 7 විශ්‍රාමික ප්‍රතිලාභ සහ වගකීම්

බැංකුව විසින් විශ්‍රාම අරමුදල් දෙකක් පවත්වා ගෙන යනු ලබයි. එනම් කාර්ය මණ්ඩල විශ්‍රාම අරමුදල I සහ කාර්ය මණ්ඩල විශ්‍රාම අරමුදල II වශයෙනි. තවදුරටත් බැංකුව විසින් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල මෙන්ම විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් 38, සටහන්වල 322 සිට 332 දක්වා පිටු තුළ දක්වා ඇත.

## 8 දේපල, පිරියත සහ උපකරණ සහ ප්‍රාග්ධන වියදම්

වසර තුළ දේපළ, පිරියත සහ උපකරණවල සහ අස්පෘශ්‍ය වත්කම් (නොනිමි ප්‍රාග්ධන වැඩ ඇතුළුව) අත්කර ගැනීම මත බැංකුව විසින් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 3,044 (2023 රුපියල් මිලියන 1,576) ක් වූ අතර සමූහයේ වියදම රුපියල් මිලියන 3,054 ක් (2023 රුපියල් මිලියන 1,578) ක් විය. මේ පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 302 සිට 306 හා 309 පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 26 (අ) සහ 26 (ආ) 29.1 හා 29.2 හි දක්වා ඇත.

## 9 දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම

2024 වසර අවසානය බැංකුවේ සහ සමූහයේ දේපළ, පිරියත සහ උපකරණවල මුළු ශුද්ධ පොත් අගය පිළිවෙලින් රු. මිලියන 17,416ක් සහ රු. මිලියන 18.556ක් විය. (2023 රු. මිලියන 17,249ක් සහ සමූහයේ රු. මිලියන 18,389ක් විය.) විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් වල පහත පරිදි ඇත.

- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 26: දේපළ, පිරියත සහ උපකරණ පිටු අංක 300

- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 29: කීර්තිනාමය සහ අස්පෘෂ්‍ය වත්කම් පිටු අංක 309
- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 48.1: ප්‍රාග්ධන බැඳීම් පිටු අංකය 339

## 10 ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ කොටස් හිමිකම

### 10.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

බැංකුවේ අනුමත කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 10ක් වන අතර එය එකක් රුපියල් 10/- ක් වූ බිලියන 01 ක සාමාන්‍ය කොටස්වලින් සෑදී ඇත. 2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 9.4කි. භාණ්ඩාගාර ලේකම් ඔහුගේ නිල බලයෙන් නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය සියල්ල රඳවා ගනී. මේ පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 334 හි සටහන් 43 ඇති ප්‍රකාශිත ප්‍රාග්ධන/පැවරුම් ප්‍රාග්ධනය යටතේද සටහන් අංක 46.1 ඇති ඉල්ලුම් නොකළ තැන්පතු සංචිතය පිටු අංක 336 යටතේද දක්වා ඇත.

### 10.2 කොටස් හිමිකම

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එකම කොටස්කරු ශ්‍රී ලංකා රජයයි.

## 11 යටත්කාලීන ණයකර/ බැඳුම්කර නිකුත් කිරීම

2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ යටත්කාලීන වගකීම රු. බිලියන 05, අතිරේක ස්ථර, ප්‍රාග්ධනය සඳහා සුදුසුකම් ලැබූ 2020 ඔක්තෝබර් 27 වන දින පුද්ගලික ස්ථානගත කිරීම මත නිකුත් කළ ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත, යටත් රු.100 යේ සදාකාලීන ණයකර වලින් සමන්විතය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට ගෙවා අවසන් නොකළ ණයකරවල විස්තර මූල්‍ය ප්‍රකාශනවල 319 පිටුවේ යටත්කාලීන වගකීම්වල සටහන් 37.1 හි දක්වා ඇත.

## 12 ජ්‍යෙෂ්ඨ ණයකර නිකුතුව

2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ ගෙවිය යුතු ණයකර රුපියල් බිලියන11.5 කින් සමන්විත විය ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කළ, මුදවා ගත හැකි, ජ්‍යෙෂ්ඨ රු. 100 බැගින් වූ ණයකර 2021 සැප්තැම්බර් 24 වන දින පෞද්ගලික ස්ථානගත කිරීමක් ලෙස නිකුත් කරන ලදී. ජ්‍යෙෂ්ඨ ණයකර පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 320 පිටුවේ 37.2 සටහනේ දක්වා ඇත.

## 13 කොටස් තොරතුරු

සමාලෝචනය යටතේ ඇති කාල පරිච්ඡේදය සඳහා පිළිවෙළින් බැංකුවේ කොටසක මූලික ඉපැයුම සහ කොටසකට ශුද්ධ වත්කම් අගය 2024 දී රු. 17.32 (වර්ෂ 2023 දී - රු. 7.68) සහ රු. 105.15 (2023 වර්ෂයේදී - රු. 86.57) කි. සටහන 14 හි මෙම තොරතුරු ඇති අතර සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම පිටුව 277 සහ සටහන් 50 හි සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය පිළිබඳ විස්තර 346 පිටුවේ දක්වා ඇත.

## 14 පරිත්‍යාග

රජය විසින් පනවන ලද සීමා හේතුකොටගෙන ආයතනික සමාජ වගකීම්වලට අදාළ කිසිදු වැඩසටහනක් බැංකුව විසින් ක්‍රියාත්මක නොකරන ලදී.

## 15 අධ්‍යක්ෂ මණ්ඩලය

### 15.1 2024 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 11 (1) වගන්තිය සහ 1995 අංක 28 දරන පනතින් එයට කළ සංශෝධන ප්‍රකාරව, 2024 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති සහ මුදල් අමාත්‍යාංශය සහ තැපැල්පති නියෝජනය කරමින් නිල බලයෙන් පත් වූ සාමාජිකයන් දෙදෙනෙක් ඇතුළුව පස් දෙනෙකුගෙන් සමන්විතය. මුදල් අමාත්‍යවරයා සභාපති සහ අනෙකුත් අධ්‍යක්ෂවරු හතර දෙනා පත් කරයි. වසර තුළ පහත දැක්වෙන පුද්ගලයන් අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළ අතර ඔවුන්ගේ සංක්ෂිප්ත විස්තර, වාර්ෂික වාර්තාවේ පිටු අංක 160 සිට 162 දක්වා පිටුවල දක්වා ඇත

| නම | ධුර කාලය | සාමාජිකත්ව තත්ත්වය |
|---|---|---|
| ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල් සභාපති | 2023 මැයි 02 - අද දක්වා | විධායක නොවන/ ස්වාධීන |
| ජූඩ් නිලුක්ෂාන් - නිල බලයෙන් පත් අධ්‍යක්ෂ | 2022 පෙබරවාරි 28 - අද දක්වා | විධායක නොවන/ ස්වාධීන නොවන |
| එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර - නිල බලයෙන් පත් අධ්‍යක්ෂ | 2023 මාර්තු 27 - අද දක්වා | විධායක නොවන/ ස්වාධීන |
| දුෂ්‍යන්ත බස්නායක - අධ්‍යක්ෂ | 2023 මාර්තු 31 - අද දක්වා | විධායක නොවන/ ස්වාධීන නොවන |
| අශේන් ජයසේකර - අධ්‍යක්ෂ | 2024 ජනවාරි 09 - අද දක්වා | විධායක නොවන/ ස්වාධීන |

NED – විධායක නොවන අධ්‍යක්ෂ
NID – ස්වාධීන නොවන අධ්‍යක්ෂ
ID – ස්වාධීන අධ්‍යක්ෂ

### බැංකුවේ පරිපාලිත සමාගම් අධ්‍යක්ෂකවරුන්ගේ ලැයිස්තුව

**සී/ස එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂකවරුන්ගේ නම් පහත පරිදි වේ:**

දුෂ්‍යන්ත බස්නායක
ශෂී කණ්ඩම්බි මිය
ඕශධ රොද්‍රිගු
කේ රවින්ද්‍රන් මයා

**ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙහි අධ්‍යක්‍ෂවරුන්ගේ නම් පහත දැක්වේ**

බී එම් ඩී බී බස්නායක - සභාපති
එච් එම් එස් ධර්මවර්ධන (2024 පෙබරවාරි 04 දක්වා)
එච් ඩී පී ගමගේ
එන් පී ඉඹුල්ගොඩ
එම් කේ ජී ජේ අරුණශාන්ත
එච් කේ ඩී එල් ගාමිණී (2024 පෙබරවාරි 13 දක්වා)
එස් ජයරත්න

### 15.2 අධ්‍යක්‍ෂ මණ්ඩල අනුකමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමස්ත වගකීම සහ වගවීම භාර ගනිමින්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරන "ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනයට අදාල විධානයන්ට අනුකූලව අනිවාර්ය උපකමිටු හතරක් පත් කර ඇත. එනම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානවසම්පත් සහ පාරිශ්‍රමික කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මීට අමතරව 2023. අංක 1 දරණ බැංකු පනතට අනුකූලව හදිසි වියදම් හා අත්‍යවශ්‍ය වියදම් නොවන කමිටුවද පත්කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට තම රාජකාරි ඉටු කිරීමේදී සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවලෙස හැඳින්වෙන ස්වේච්ඡා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවක් ද පත් කර ඇත.

මෙම අනු කමිටුවල ප්‍රඥප්තීන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධිවිධානයන්ට, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ස්වේච්ඡාවෙන් නිකුත් කරනු ලබන නිර්දේශයන්ට අනුකූලව සකස් කර ඇත.

2024 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටුවල සංයුතිය සහ රැස්වීම්වලදී අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්ව විස්තර 175 පිටුවෙහි හෙළිදරව් කර ඇති අතර මෙම අනුකමිටු වාර්තා පිටුව 184 සිට 194 දක්වා ඇතුළත් කර ඇත.

### 15.3 අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් යන ඒවායින් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වල විස්තර සහ රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය, වාර්ෂික වාර්තාවෙහි ආයතනික පාලන වාර්තාවේ පිටුව 174 තුළ දක්වා ඇත.

### 15.4 කොන්ත්‍රාත්තු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

සෘජු සහ වක්‍ර යන දෙයාකාරයෙන්ම, අධ්‍යක්ෂවරුන්ගේ බැංකුව සමග වන කොන්ත්‍රාත්තු පිළිබඳ බැඳියාවන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 49.5.2 හි පිටු අංක 343 තුළ දැක්වේ. මෙම බැඳියාවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ප්‍රකාශ කර ඇත. අධ්‍යක්ෂවරුන් බැංකුව සමග වෙනත් කොන්ත්‍රාත්තු හෝ යෝජිතකොන්ත්‍රාත්තු පිළිබඳ කිසිදු සෘජු හෝ වක්‍ර බැඳියාවක් නැත.

### 15.5 බැංකුව මගින් නිකුත් කළ ණයකරවල අධ්‍යක්ෂකවරුන්ගේ බැඳියාව/ඇල්ම

කිසිදු අධ්‍යක්ෂකවරයකුගේ නමින් ලියාපදිංචි කළ ණයකර නොතිබිණි.

### 15.6 අධ්‍යක්ෂකවරුන්ගේ පාරිතෝෂික සහ වෙනත් ප්‍රතිලාභ

2024 මූල්‍ය වර්ෂය සඳහා බැංකුව සහ සමූහය සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ වේතන සහ වෙනත් ප්‍රතිලාභ පිළිබඳ විස්තර පිටු අංක 343 හි මූල්‍ය ප්‍රකාශනවල සටහන 49.5.1 හි දක්වා ඇත.

### 15.7 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අදාළ කර ගන්නා ලද සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 හි ප්‍රකාරව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ලෙස වර්ගීකරණය කළ හැකි, ගනුදෙනු කිසිවක් තිබේ නම් ඒවාද අධ්‍යක්ෂවරුන් හෙළිදරව් කළ යුතුය. අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කරන ලද එම ගනුදෙනු, අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 49.5.3 හි පිටු අංක 344 තුළ දැක්වේ.

## 16 පරිසරය ආරක්ෂා කිරීම

බැංකුව සහ සමූහය දැනීමේ තරමට පරිසරයට හානිකර හෝ අනතුරුදායක කිසිදු ක්‍රියාකාරකමක නියැලී නැත. පරිසර ආරක්ෂණය සඳහා ගන්නා ලද විශේෂ පියවර පිටු අංක 146 සිට 151 දක්වා ඇත.

## 17 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය, ඔවුන්ගේ දැනීමේ සහ විශ්වාසයේ තරමට, රජයට, නියාමන ආයතනවලට සහ සේවකයන් සම්බන්ධව ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කර ඇති බවට සෑහීමට පත් වෙයි.

## 18 වාර්තාකරණ දිනෙන් පසු සිදුවීම්

පිටු අංක 347 හි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 52 හි හෙළිදරව් කළ ඒවා හැර ගිණුම්වලට ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍යවන වැදගත් අවස්ථා වාර්තා කරන දින සිට පැන නැගී නැත.

## 19 අඛණ්ඩ පැවැත්ම

බැංකුව සතුව එහි ඉදිරි පැවැත්ම තුළ මෙහෙයුම් අඛණ්ඩව කර ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සමාලෝචනය කර තෘප්තිමත් වී ඇත. තවද, සීමා කිරීම් හෝ මෙහෙයුම් අඩු කිරීමට සැලසුම් වැනි බැංකුවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ අධ්‍යක්ෂවරු දැනුවත් නැත.

## 20 අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධති

### 20.1 අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂක මණ්ඩලය අවදානම් කළමනාකරණය කිරීම වෙනුවෙන් සමස්ත වගකීම භාර ගනී. බැංකුව මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් ඇත. අවදානම ලිහිල් කිරීමේදී බැංකුව මගින් ගන්නා ලද විශේෂිත ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු 195 සිට 219 දක්වා සහ අධ්‍යක්ෂක මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරන වාර්තාවේ පිටු 191 සිට 192 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

### 20.2 අභ්‍යන්තර පාලනයන් සහ කළමනාකරණ තොරතුරු පද්ධති

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව තුළින් බැංකුව තුළ ඵලදායී සහ පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධති සථාපිත කර ක්‍රියාත්මක කර ඇති බව අධ්‍යක්ෂක මණ්ඩලය සහතික කර ඇත. බැංකුව නිරාවරණය වන අවදානම් අවම කිරීමට, වැදගත් අවප්‍රකාශ සහ හානි අනුව සාධාරණ සහතිකය ලබාදීමට අභ්‍යන්තර පාලන පද්ධති සැලසුම් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තාව මෙම වාර්තාවේ 184 සිට 186 දක්වා පිටුවල දැක්වේ. බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 12 දරන බැංකු පනතේ අංක 3 [8 (ii) ආ නියෝග යට අනුකූලව බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ පිළිබඳ ප්‍රකාශයක් අධ්‍යක්ෂ මණ්ඩලය නිකුත් කර ඇති අතර, එය මෙම වාර්තාවේ 394 - 412 පිටුවල දක්වා ඇත. මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසය සම්බන්ධයෙන් සාධාරණ සහතිකය ලබාදීමට සහ බාහිර වාර්තාකරණ අරමුණ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදුකර ඇති බවට සහතික වීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබා ගෙන ඇති අතර එය පිටු අංක 232 හි දක්වා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව



## 21 විගණකවරුන් පත්කිරීම සහ ඔවුන්ගේ වේතන

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව විගණකාධිපති ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගිණුම් කාලපරිච්ඡේදය තුළ විගණන ගාස්තු සහ ලබා දුන් වෙනත් සේවා සම්බන්ධයෙන් දරන ලද වියදම් පිටුව 274 හි මූල්‍ය ප්‍රකාශන වෙත සටහන 12 හි දක්වා ඇත.

## 22 නියාමන අධීක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකුව නියාමන අධීක්ෂණ ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කළ නියෝගවලට අනුකූල වීම තහවුරු කිරීමට බැංකුවේ වාර්තා සහ කටයුතු පිළිබඳ කාලානුරූපව පරීක්ෂාවක් සිදු කරයි. එමෙන්ම එය පාර්ශ්වකරුවන්ගේ යහපත විශේෂයෙන්ම තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ලෙස අවශ්‍ය මට්ටමට අවශ්‍ය මූල්‍ය දර්ශක පවත්වාගෙන යන්නේදැයි තීරණය කරයි.

## 23 ආයතනික පාලනය

බැංකුවේ කළමනාකරණ කටයුතු සිදු කිරීමේ දී ආයතනික පාලන යහපරිචයන් සහ ක්‍රියාපටිපාටි සමග අනුකූල වීම තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු කර ඇත. ඒ අනුව, අධ්‍යක්ෂවරුන් පහත දේ ප්‍රකාශ කර ඇත.

(අ) බැංකුව එහි ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී අදාළ වන නීති සහ රෙගුලාසි සමග අනුකූල වී ඇති අතර, අදාළ නීති සහ රෙගුලාසි කඩ කරන කිසිදු ක්‍රියාවක නියැලී නැත.

(ආ) අධ්‍යක්ෂවරු බැංකුව හා සම්බන්ධ වන ප්‍රමාණාත්මක ඇල්මක් ඇති සියළු කොන්ත්‍රාත් හෙළිදරව් කර ඇති අතර ඔවුන් ප්‍රමාණාත්මක ඇල්ම ඇති කිසිදු කාරණයකට සම්බන්ධ වීමෙන් වැළකී ඇත.

(ඇ) ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලය උපායමාර්ගික ව්‍යාපාර සැලසුම සමාලෝචනය කර ඉදිරි අනාගතය තුළ බැංකුවෙහි අනාගත ගම්‍යතාව වේගවත් කිරීමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට තෘප්තිමත් වී ඇත. එබැවින්, බැංකුවේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇත.

(ඈ) බැංකුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇත.

(ඉ) බැංකුව මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලන, අවදානම් කළමනාකරණය ආවරණය කරන අභ්‍යන්තර පාලනයන් පිළිබඳ සමාලෝචනයක් පවත්වා ඇති අතර, ඒවායේ ඵලදායීතාව සහ අනුගත වීම පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා ගෙන ඇත.

## 24 තිරසාරබව

බැංකුවේ ව්‍යාපාර උපායමාර්ග ක්‍රමවත්ව සකස් කරන විට, බැංකුව තිරසාර බවේ පැති සලකා බලන අතර, පිටු අංක 440 සිට 443 දක්වා ඇති ගෝලීය වාර්තාකරණ දර්ශකයේ (GRI) විස්තරාත්මකව දක්වා ඇත.

## 25 මානව සම්පත්

බැංකුව සිය උසස් තත්ත්වයේ සේවාව ඔස්සේ තිරසාර අගය නිර්මාණය කිරීමට කැප වීමෙන් සහ ඉහළ අභිප්‍රේරණයකින් යුතුව කටයුතු කරන සේවකයන්ගේ උන්නතිය සඳහා සහ ඔවුන්ව රඳවා තබා ගැනීමට අඛණ්ඩව ක්‍රියාකරයි. බැංකුවේ මානව ප්‍රාග්ධනයෙහි සංවර්ධනය සඳහා සැලකිය යුතු ආයෝජන සිදු කර ඇත. මානව ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි 2024 වාර්ෂික වාර්තාවේ පිටු අංක 108 සිට 119 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

## 26 දැනට පවතින නඩුකර

අධ්‍යකෂකවරුන්ගේ සහ බැංකුවේ නීතිඥයන්ගේ මතය අනුව, 346 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 51 අනාවරණය කර ඇති බැංකුවට එරෙහිව ඇති නඩුකරවලින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය හෝ එහි අනාගත මෙහෙයුම් කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් නොමැත.

## 27 වාර්තාවේ අන්තර්ගතවල වගකීම භාර ගැනීම

අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් වාර්ෂික වාර්තාවේ අන්තර්ගතවල වගකීම භාර ගනී.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝගය අනුව



**ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්**
සභාපති



**එම් ඒ පී මුහන්දිරම්**
අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම්

2025 පෙබරවාරි 28
කොළඹදී

# මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ සහ එහි පරිපාලිතයේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම මෙම ප්‍රකාශයෙන් දක්වා ඇත.

## මූල්‍ය ප්‍රකාශන

බැංකුව සහ සමූහය සියලු ගනුදෙනුවල නිසි ගිණුම් තැබීම කරන බවට සහ අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී බැංකුවේ සහ සමූහයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන බවට සහතිකවීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වග කියයි. මූල්‍ය ප්‍රකාශනවලට 2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, 2024 වසර සඳහා ආදායම් ප්‍රකාශය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ එයට සම්බන්ධ සටහන් ඇතුළත්ය.

බැංකුවේ සහ පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන පහත කරුණු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙයි:

1. 2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය; සහ
2. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය කාර්ය සාධනය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අධ්‍යක්ෂවරුන් පහත දේවල් පිළිබඳව තහවුරු කිරීම අවශ්‍යය:

1. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදා ගන්නා ලද පිටු අංක 248 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පවතින මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව යෝග්‍ය ඒවා විය. මෙම ප්‍රතිපත්ති සංගත ලෙස භාවිතා කරන අතර ඒවා ප්‍රමාණාත්මකව හෙළිදරව් කරන ලදී.
2. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගනුදෙනුවේ නෛතික පදනම හා ආර්ථික හරය නිසි ලෙස පිළිබිඹු වන බව සහතික කිරීමට අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ සහ විචක්ෂණශීලී විනිශ්චයන් සිදු කර ඇත
3. අදාළ වන සියළුම ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ ලෙස අනුගමනය කර ඇත.

1971 අංක 38 දරන මුදල් පනත, 1988 අංක 30 දරන බැංකු පනත, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 7(1) වගන්ති විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු සහ බැංකුවේ ව්‍යාපාර කටයුතු පාලනය සහ පරිපාලනය කිරීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති ආකෘතියට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

සලකනු ලබන ඕනෑම කාල පරිච්ඡේදයක සාධාරණ නිරවද්‍යතාවක් සහිතව, බැංකුවේ මූල්‍ය තත්ත්වය නිවැරදිව වාර්තා කරන සහ විස්තර කරන අදාළ ගිණුම්කරණ වාර්තා ලබා දෙමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ හැකියාව තහවුරු කරන බව සහතික කිරීම සඳහාද අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය බව සහ විෂය මූලික බව සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. (මූල්‍ය ප්‍රකාශන පිටු 238 සිට 391 දක්වා දක්වා ඇත) 2024 වර්ෂය සඳහා පිළියෙළ කළ මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත සහ 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන යන ඒවායෙහි අවශ්‍යතා සමග අනුකූල වේ.

## අභ්‍යන්තර පාලන

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ සහ සමූහයේ වත්කම් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට සහ විධිවිධාන ලබා දීමට, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා හෙළිදරව් කිරීමට වගකියන ලද අතර ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ අභ්‍යන්තර විගණනයක් ඇතුළත් ඵලදායිතාව නිරීක්ෂණය කිරීමේ ඵලදායී පද්ධතියක් ද පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන ඔවුන් විසින් ඔවුන්ගේ විධිමත් රැස්වීම්වලදී සහ විගණන කමිටු මණ්ඩලයේදීද සමාලෝචනය කරන බව සහතික කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 230පිටුවේ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය දී ඇති අතර බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිගේ සහතිකකරණ වාර්තාව 232 පිටුවෙහි දක්වා ඇත.

## විගණන වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන ඇතුළුව සියලු වාර්තා විගණකාධිපති වෙත ලබා දී ඇති අතර සුදුසු යැයි ඔවුන් සලකන සියලු පරීක්ෂා කිරීම් සිදු කිරීමට සෑම ඉඩ ප්‍රස්තාවක්ම ලබා දෙන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුව පරීක්ෂා කිරීම් කර ඇති අතර විගණකාධිපතිගේ මතය ඔහු විසින් වාර්තා කළ පරිදි මෙම වාර්ෂික වාර්තාවෙහි 234 පිටුවේ දක්වා ඇත.

## අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ උපරිම දැනුමේ සහ විශ්වාසයේ තරමට බැංකුව හා සමූහය විසින් ගෙවිය යුතු සියලු බදු, ගාස්තු සහ අය බදු සහ රජයට සහ අනෙකුත් අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අධිකාරිවලට බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධව ගෙවිය යුතු සියලු දායකත්ව මුදල් සහ බදු, සහ වෙනත් දන්නා සියළු ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ සමූහය විසින් කළයුතු සහ ගෙවිය යුතු දේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට ගෙවා ඇති බව හෝ අදාළ තැනදී වෙන් කර ඇති බව තහවුරු කරයි. තවද, වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය සහ සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව නිකුත් කළ "ආයතනික යහපාලන" සංග්‍රහය තුළ දැක්වීමට අවශ්‍ය මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් තත්ත්ව සහ නියාමන සහ වෙනත් සාධක සැලකීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය එය තහවුරු කර ඇත.බැංකුවට සහ සමූහයට ඉදිරි අනාගතයේදී මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට සහ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරනීකරණය කිරීමට ප්‍රමාණවත් තරම් සම්පත් ඇති බව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති විධිවිධාන සමග අනුකූල වීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

**එම් ඒ පී මුහන්දිරම්**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2025 පෙබරවාරි 28 දින
කොළඹදී

# මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය



## වගකීම

මෙම වාර්තාව බැංකු පනතේ 2007 අංක 12 දරණ නියමයේ, 3 (8) (2) (ආ) වගන්තිය සමග අනුකූලව නිකුත් කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කර ඇති යහපරිචයන් සහිත ආයතනික යහපාලන සංග්‍රහය 2017 හි D.1.5 මූලධර්ම මත පදනම්ව පිළියෙළ කළ අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රමාණවත් තරම් සහ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) වගකියයි. කෙසේ වුවද එවැනි පද්ධතියක් බැංකුවේ ව්‍යාපාර පරමාර්ථ ළඟා කර ගැනීම අසාර්ථක වීමේ අවදානම ඉවත් කරනවාට වඩා, පිළිගත හැකි අවදානම් පරාසයක් තුළ බැංකුවේ සැලකිය යුතු අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීමට සැලසුම් කෙරේ. ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධතියට කළමනාකරණ සහ මූල්‍ය තොරතුරු සහ වාර්තාවල සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශ සහ වාර්තා හෝ මූල්‍යමය අලාභ හෝ වංචාවලට එරෙහිව පරම සහතිකයක් නොව සාධාරණ සහතිකවීමක් පමණක් සපයනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ස්ථාපනය කර ඇති අතර මෙම ක්‍රියාවලියට ව්‍යාපාර පරිසරයට හෝ නියාමන අවශ්‍යතාවලට සහ අනෙකුත් මාර්ගෙ ා්පදේශවල වෙනස් කිරීම් ඇති පරිදි සහ ඇති විට මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම ඇතුළත්ය. මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරව සමාලෝචනය කරනු ලබන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන පිළිබඳ බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා මාර්ගෝපදේශය සමග අනුකූල බව තහවුරු කර ඇත. අධ්‍යක්‍ෂ මණ්ඩලය එම මාර්ගෝපදේශයෙහි දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සඳහා වූ මූලධර්ම සැලකිල්ලට ගෙන අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කර ඇත

අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීමට තරම් යහපත් සහ ප්‍රමාණවත් බවද, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ

කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට, බැංකුව විසින් මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, මෙම අවදානම් ලිහිල් කිරීම සහ පාලනය කිරීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම මගින් සහාය වෙයි.

## මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයේ සැලසුම සහ කාර්යක්ෂමතාවය යොදා ගැනීමේදී හා සමාලෝචනය කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායීතාව සමාලෝචනය කිරීමේ පද්ධතියද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලානුරූපීව පිහිටුවනු ලැබ තිබේ. අනෙකුත් දේවල් අතර එහි මූලික ක්‍රියාවලිවල පහත දේවල් අඩංගුය:

- බැංකුවේ මෙහෙයුම්වල කාර්‍යක්‍ෂමතාව තහවුරු කිරීමටත්, අනුමත ආයතනික අරමුණු, උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සහ අනුමත කර ඇති ව්‍යාපාර නියමයන් සමග අනුකූල බව සහතික කිරීමට නිශ්චිත විෂය පථයන් සහ කාර්යයන් සහිතව අධ්‍යක්‍ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත.
- අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) විසින් බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය, බාහිර විගණකවරුන්, නියාමන අධිකාරීන් විසින් හඳුනා ගන්නා අභ්‍යන්තර පාලන දුර්වලතා වරින්වර සමාලෝචනය කරනු ලබන අතර එම දුර්වලතා නිවැරදි කිරීමට නිසි ක්‍රියාමාර්ග ගනියි. බැංකුවේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරනු ලැබේ. රජයේ විගණන අධිකාරී වෙත සාමාන්‍යයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් සඳහා ආරාධනා කෙරේ.
- විගණනයෙහි විෂයපථය සහ ගුණාත්මක බව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 184 පිටුවෙහි ඇති අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ 2024 වසර තුළ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග දක්වා ඇත. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය වාර්ෂික විගණන සැලසුම පරිදි ශාඛාවල, අංශවල සහ අනෙකුත් ඒකකවල විගණනය සිදු කරයි. විගණනය කරන වාර ගණන තක්සේරු කළ අවදානම් මට්ටම අනුව තීරණය කෙරේ. අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව විගණන සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමග අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිතාව සහතික කිරීමට විගණන පරීක්ෂා සිදු කරන අතර කිනම් හෝ අනනුකූලතාවක් සම්බන්ධව එහි සොයා ගැනීම් වාර්තා කරයි. මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් සැපයීමට විගණන සිදු කෙරේ. විගණනවල සොයා ගැනීම් අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වරින් වර පවත්වන රැ ස්වීම්වලදී සමාලෝචනය සඳහා යොමු කෙරේ. කමිටු රැස්වීම්වල සටහන් සමගින්, අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ක්‍රියාකාරකම් කාලානුරූපී පදනමකින් අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රවල සමස්ත කළමනාකරණය අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) පිහිටුවා ඇත. බැංකුවෙහි ක්‍රියාකාරකම්, අදාළ නීති, රෙගුලාසි සහ නියාමන උපදෙස්වලට අනුකූලව සිදු කරන බව සහතික කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ස්වාධීන අනුකූලතා ඒකකයක්ද ස්ථාපනය කර ඇති අතර අනුකූල නොවීම පිළිබඳ යම් ගැටලු කාලානුරූපීව අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ. අවදානම් තක්සේරුව පිළිබඳ වාර්තාව අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් කාලානුරූපීව අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම්වලදී බැංකුවේ ප්‍රධාන ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණ සහ අධීක්ෂණය සහතික කිරීමට කළමනාකරණ මට්ටමේ කමිටු ද නිසි සවිබලගැන්වීමක් සමගින් ක්‍රියාත්මකව ඇත. තක්සේරු කිරීම බැංකුව විසින් යොදන ක්‍රියාවලි පමණක් ආවරණය කරන අතර එහි පරිපාලිතය විසින් කරගෙන යන ක්‍රියාවලි අඩංගු නොකරයි.

බැංකුව 2012 වසරේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගන්නා ලදී. එකී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමෙහි සිට, හඳුනා ගැනීම, ඇගයීම,

වර්ගීකරණය, සහ හෙළිදරව් කිරීම යන ඒවායෙහි නව අවශ්‍යතා සමග අනුකූල වීමට ක්‍රියාවලිවල නිරීක්ෂණය සහ අභිවෘද්ධිමය දියුණුව අඛණ්ඩව කර ගෙන යන ලදී.

පසුගිය වසරවල මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයන්ට අදාළව බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් වර්ෂය තුළ සමාලෝචනය කර ඒවා නිවැරදි කිරීමට සුදුසු පියවර ගෙන ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳු අභ්‍යන්තර පාලනයන්ට අදාළව 2024 දී බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශවලට ඉදිරියේදී විසඳුම් ලබාදෙනු ඇත.

## තහවුරු කිරීම

ඉහත ක්‍රියාවලි මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳව සාධාරණ සහතිකයක් සැපයීමට බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇති බවත් සහ බාහිර අවශ්‍යතාවයන් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි



**ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්**
සභාපති



**අශේන් ජයසේකර**
අධ්‍යක්ෂ



**ජූඩ් නිලුක්ෂාන්**
අධ්‍යක්ෂ

2025 පෙබරවාරි 28
කොළඹදී

# අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතික වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/A/NSB/2024/IC/03
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 06 මැයි 2025

සභාපති
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳව විගණකාධිපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ස්වාධීනතා සහතික කිරීමේ වාර්තාව.**

## හැඳින්වීම

මෙම වාර්තාව, 2024 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇති ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලනය ("ප්‍රකාශය") පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය මත සහතිකවීමක් ලබා දීම සඳහා නිකුත් කර ඇත.

## කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින්, 2007 අංක 12 දරන බැංකු පනතේ 3 (8) (ii) (බී) වගන්තියට අනුකූලව නිකුත් කරන ලද"අභ්‍යන්තර පාලනය පිළිබඳ බැංකු අධ්‍යක්ෂ වරුන්ගේ ප්‍රකාශය සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශය" ට අනුකූලව ප්‍රකාශය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමණාකාරීත්වය වගකිව යුතුය.

## සංශෝධිත SLSAE 3050 ට අනුව මාගේ වගකීම් සහ ඊට අනුකූල වීම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කළ හෝ/ඔවුන් වෙත ලබාදුන් ලියකියවිලි මගින් හා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ඇති කළ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් හා එහි ඵලදායීතාවය විමර්ශනය කිරීමෙන් ඒ පිළිබඳ වාර්තාවක් ලබාදීම මාගේ වගකීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත බැංකු සඳහා වන සහතික කිරීමේ වාර්තාව සහතිකකරණ කාර්යභාරය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිත (සංශෝධිත) SLSAE 3050 සමග අනුකූලව මෙම විගණන කාර්යභාරය ඉටු කළෙමි.

කළමනාකාරිත්වය සියලුම ප්‍රමාණාත්මක අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය සකස් කර තිබේද යන්න පිළිබඳව යම් සීමාවන්ට යටත්වූ සහතිකයක් ලබා දීම සඳහා විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බව මෙම ප්‍රමිතිය සඳහන් කරයි.

මෙම කටයුත්තේ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සඳහා මා වගකිව යුතු නොවන අතර, මෙම කටයුත්ත අතරතුර මූල්‍ය තොරතුරු විගණනය කර හෝ සමාලෝචනය කිරීමක් සිදු කර නොමැත.

## සිදු කළ කාර්යභාරයේ සාරාංශය

අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් සකස් කරන ලද ලේඛන සහ බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලිය මැනවින් පිළිබිඹු වෙන ආකාරයට ප්‍රකාශය සකසා ඇත්ද යන්න ඇගයීම සඳහා මගේ මැදිහත්වීම සිදුකර ඇත.
අපගේ විෂය පථය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද ක්‍රියාවලිය තහවුරු කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලයෙන් තොරතුරු විමසීම් සහ අදාල ලියකියවිලි නියැදි පදනමකින් තහවුරු කර ගැනීමට සීමා විය.

SLSAE 3050 (සංශෝධිත), මෙම ප්‍රකාශය සියලුම අවදානම් සහ පාලන ආවරණය කරන්නේද යන්න පිළිබඳව හෝ බැංකුවේ අවදානම් සහ පාලන ක්‍රියාදාමයේ කාර්යක්ෂමතාව පිළිබඳ මතයක් සැකසීම හෝ සලකා බැලීමේ අවශ්‍යතාවක් සඳහන් නොකරයි. එසේම SLSAE 3050 (සංශෝධිත) අනුව, වාර්ෂික වාර්තාවේ සඳහන් කිනම් හෝ සුවිශේෂී ගැටලුවක් විසඳීමට අදාලව ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි ඇත්ත වශයෙන්ම එම, ගැටලු විසඳීමට යෝග්‍යද යන්න සලකා බැලීමේ අවශ්‍යතාවයක්ද නැත.

මෙම ප්‍රකාශය පිළියෙල කිරීමේදී අදාලවන ක්‍රියා පටිපාටිය මාගේ විනිශ්චයන්, බැංකුව පිළිබඳ මාගේ දැණුම, සම්බන්ධිත සිදුවීම් සහ ගණු දෙනු මත තීරණය විය.

මගේ නිගමනයට පදනමක් සැපයීම සඳහා මා රැස්කර ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

## මාගේ නිගමනය

වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලිය පිළිබඳ මගේ අවබෝධයට පටහැනි බව විශ්වාස කිරීමට හේතු වන කිසිවක් සිදු කරන ලද ක්‍රියා පටිපාටියේදී මගේ අවධානයට ලක්ව නොමැත.

ජේ එච් ඩී ධර්මපාල
වැඩබලන විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ වගකීම පිළිබඳ ප්‍රකාශය



2024 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුවේ) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ සහ එහි අනුබද්ධ සමාගම්වල (සමූහයේ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් කරුණු වලට අනුකූලව සකස් කර ඉදිරිපත් කරනු ලැබේ:

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එයට කරන ලද සංශෝධන
- 1971 අංක (38) දරන මුදල් පනත.
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත
- 1988 අංක 30 දරන බැංකු පනත හා එයට සිදුකළ සංශෝධන සහ එය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මූල්‍ය ප්‍රකාශන ආකෘති සහ තොරතුරු හෙළිදරව් කිරීම් තොරතුරුවලට අදාළ නියෝග සහ මාර්ගෝපදේශ.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs/ LKASs)/ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ඇති සංස්ථාපිත පාලනය පිළිබඳ වඩා යහපත් පරිචය සංග්‍රහය 2023.
- සංස්ථාපිත යහපාලනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකු පනත් නියමය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිත කර ඇති ආකෘති සහ සිදු කර ඇති හෙළිදරව් කිරීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (LKAS 1) - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සමගද අනුකූල වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති නිශ්චිත ආකෘති සමගද අනුකූලය. බැංකුව සහ සමූහය එහි මූල්‍ය ප්‍රතිඵල එහි පරිශීලකයන්ට කාර්තුමය පදනමකින් ඉදිරිපත් කරය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා බැංකුව සහ සමූහය විසින් නිසි ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යොදා ගෙන ඇත. ඉහළ මට්ටමේ විනිශ්චයක් සහ සංකීර්ණතාවක් සහිත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තු යොදා ගැනීම බැංකුවේ බාහිර විගණකවරුන් සහ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව සමග සාකච්ඡා කරන ලදී.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කළ දින සිට ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගණනය කිරීම් ක්‍රමවේදයෙහි කිසිදු වෙනසක් සිදු නොවීය. ඒ අනුව වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

අපි අපගේ දැනුමේ තරමට මෙම වාර්තාවේ අඩංගු මූල්‍ය ප්‍රකාශන, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු, සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ සහ සමූහයේ වත්කම්, වගකීම්, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහවල සියලු ප්‍රමාණාත්මක අංශ සාධාරණව නිරූපණය කරන බව සහ මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය සහ සාධාරණ දැක්මක් දී ඇති බව තහවුරු කරමු. තවද අපි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යාමට බැංකුවට සහ සමූහයට ප්‍රමාණවත් සම්පත් ඇති බවත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගෙන ඇති බවටත් තහවුරු කරමු.

## අභ්‍යන්තර පාලනය පිළිබඳ වගකීම සහ ක්‍රියාපටිපාටි

බැංකුව සහ එහි පරිපාලිතයේ අභ්‍යන්තර පාලන ස්ථාපනය කිරීමට, ක්‍රියාත්මක කිරීමට, සහ පවත්වාගෙන යාමට අපි වගකිව යුතු වෙමු. වත්කම් ආරක්ෂා කිරීම, වංචා සහ/හෝ වැරදි මෙන්ම අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ හෙළිදරව් කිරීම සඳහා බැංකුවට සහ සමූහයට අදාළ වැදගත් තොරතුරු අපට දැන ගැනීමට හැකි බවත් සහතික කරමින් ඵලදායී අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි නිසි ලෙස ස්ථානගත කර ඇති බව, සහ ඒවා අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය, ඇගයීම සහ යාවත්කාලීන කරන බව අපි සහතික කරමු. අපගේ දැනීමේ තරමට, අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි සැලසුම් කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ සැලකිය යුතු අඩුපාඩු සහ දුබලතා නොවූ බවට අපි සෑහීමට පත් වෙමු. අපි අපගේ ඇගයීම් මත පදනම්ව, අභ්‍යන්තර පාලනවල සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සැලකිය යුතු අඩුපාඩු හෝ කැපී පෙනෙන දුබලතා සහ කළමනාකරණ හෝ අනෙකුත් සේවකයන් සම්බන්ධ වංචා නොවූ බව අපි තහවුරු කරමු.

මූල්‍ය වාර්තාකරණය සහ ක්‍රියාපටිපාටි සම්බන්ධව අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි අඛණ්ඩව අනුගමනය කරන බව සහතික කිරීමට බැංකුවේ අභ්‍යන්තර විගණකවරුන්ද කලින් කලට විමර්ශන සිදු කරයි. කෙසේ වෙතත්, ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම්කරණ ක්‍රමයක් මගින් ලබාදෙන සහතිකය 100% ක් පිළිගැනීමේ යම් ආවේනික සීමාවන් පවතී.

මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය මෙම වාර්ෂික වාර්තාවේ 230 පිටුවේ දක්වා ඇත. විගණකාධිපතිවරයා විසින් බැංකුව විසින් යොදා ගන්නා ලද මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනයේ සඵලත්වය විගණනය කර ඇති අතර ඒ පිළිබඳ විකරණය නොකළ මතයක් ලබා දී ඇත. මෙම වාර්ෂික වාර්තාවේ 232 පිටුවේ එය දක්වා ඇත.

## බාහිර විගණනය

බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරන ලදී. බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවෙහි 234 පිටුවෙහි දක්වා ඇත. අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව අනෙක් කරුණු ද සමඟින්, සියලු අභ්‍යන්තර විගණන සහ පරීක්ෂණ වැඩසටහන්, අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියාපටිපාටිවල කාර්යක්ෂමතාව සමාලෝචනය කළ අතරම වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවන්වලට ඒවායේ අනුකූල බවද සමාලෝචනය කළ අතර, ඒවායේ විස්තර මෙම වාර්ෂික වාර්තාව තුළ 184 සිට 186 දක්වා පිටුවල ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ දී ඇත. පූර්ණ ස්වාධීනත්වය සහතික කිරීමට විගණකාධිපතිට සහ අභ්‍යන්තර විගණකවරුන්ට, වැදගත් වන කරුණු සාකච්ඡා කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයන් වෙත පූර්ණ සහ නිදහස් ප්‍රවේශය ඇත.

## තහවුරු කිරීම

අපි අපේ දැනුමේ තරමට පහත දේවල් තහවුරු කරමු. බැංකුව සහ සමූහය සියලු අදාළ විය හැකි නීති සහ රෙගුලාසි සහ විචක්ෂණශීලී අවශ්‍යතාවන් සමඟ අනුකූල වී ඇත. මූල්‍ය ප්‍රකාශනවල 346 පිටුවේ 51 සටහනේ හෙළිදරව් කර ඇති තොරතුරු හැර සැලකියයුතු අනුකූල නොවීමේ අවස්ථා සහ බැංකුවට සහ සමූහයට එරෙහිව නඩු පැවරීම් ද නැත. බැංකුව සහ සමූහය විසින් ගෙවිය යුතු සියලු බදු, තීරු බදු, අය බදු සහ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියලු දායක මුදල්, අය බදු සහ බදු 2024 දෙසැම්බර් 31 වන දිනට ගෙවා හෝ අවශ්‍ය පරිදි ප්‍රතිපාදනයන් කර ඇත



**ශෂී කණ්ඩම්බි මිය**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී



**කේ රවීන්ද්‍රන්**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

2025 පෙබරවාරි 28 දින
කොළඹදී

# විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: BAN/A/NSB/FA/2024/01
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 28 පෙබරවාරි 2025

සභාපති
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. බැංකුවේ සහ සමූහයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 බැංකුවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළයුතු අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු, බැංකුවේ 2024 වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත මාගේ විගණන වාර්තාවට ඇතුළත් නොවන තොරතුරු වලින් සමන්විත වන අතර, මෙම විගණන වාර්තාවේ දිනට පසුව එය මා වෙත ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය, අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මා ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් වෙනත් තොරතුරු ලබාගෙන හැකි විට එය කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපේ ද යන්න හෝ විගණනයේදී ලබාගත් මාගේ දැනුම හෝ එසේ නොමැති නම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් පෙන්වන්නේද යන්න සලකා බැලීමයි.

මා විසින් බැංකුවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වැරදි අර්ථකථන ඇති බව නිගමනය කළහොත් ඒවා නිවැරැදි කිරීම සඳහා වගකිව යුතු පාලකයන් සමග එම කරුණු පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමට මට අවශ්‍ය වේ. තවදුරටත් නිවැරැදි නොකළ වැරදි අර්ථකථන තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ඉදිරියේදී මා විසින් පාර්ලිමේන්තුවට සභාගත කරන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමූහය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේනම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් පදනම් වී ඇත්තේ මාගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණක සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම් වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ අදාළ විගණන සාක්ෂි ලබාගැනීම, සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය පිළිබඳ වගකීම මා සතුය. මාගේ විගණන මතයට මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුයි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 1988 අංක 30 දරන බැංකු පනතේ 39 වන වගන්තියේ (2024 අංක 24 දරන බැංකු පනත මගින් සංශෝධනය කරන ලද පරිදි) පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

**2.1.1** මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇති හෙළිදරව් කිරීම්. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 05 දරන චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

**2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

**2.2.1** 2018 අංක 19 ජාතික විගණන පනතේ 12 (a) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

**2.2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (d) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (d) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.3** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.3.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (d) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.3.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (f) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

**2.3.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (g) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුව බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.3.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (h) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**ඩබ්ලිව් පී සී වික්‍රමරත්න**
විගණකාධිපති

# මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය




| | | පිටු අංකය |
|---|---|---|
| **මූලික මූල්‍ය ප්‍රකාශය** | | |
| ආදායම් ප්‍රකාශය | | 238 |
| විස්තීරණ ආදායම් ප්‍රකාශය | | 239 |
| මූල්‍ය තත්ත්වය පිළබඳ ප්‍රකාශය | | 240 |
| හිමිකමේ වෙනස්වීම දක්වන ප්‍රකාශය - බැංකුව | | 242 |
| හිමිකමේ වෙනස්වීම දක්වන ප්‍රකාශය - සමූහය | | 244 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | 246 |
| **මූල්‍ය ප්‍රකාශනවල සටහන් - පොදු** | | |
| 1. | **වාර්තාකරණ ඒකකය** | 248 |
| 1.1 | ආයතනික තොරතුරු | 248 |
| 1.2 | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන | 248 |
| 1.3 | මූල්‍ය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය | 248 |
| 2. | **ගිණුම්කරණ ප්‍රතිපත්ති** | 248 |
| 2.1 | ගිණුම් පිළියෙල කිරීමේ පදනම | 248 |
| 2.2 | ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් | 253 |
| 2.3 | සාධාරණ අගය මිනීම | 253 |
| 2.4 | සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - පොදු | 253 |
| 2.5 | සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම මූල්‍ය උපකරණ | 254 |
| 2.6 | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම | 263 |
| 2.7 | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදුකරණය | 264 |
| 2.8 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 264 |
| 2.9 | නියාමන ප්‍රතිපාදන | 264 |
| 2.10 | වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් | 264 |
| 2.11 | නිකුත් කරන ලද මුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන් | 264 |
| **මූල්‍ය ප්‍රකාශනවල සටහන් - ආදායම් ප්‍රකාශය** | | |
| 3. | දළ ආදායම | 265 |
| 4. | ශුද්ධ පොලී ආදායම | 265 |
| 5. | ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම | 268 |
| 6. | වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 269 |
| 7. | ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 269 |
| 8. | මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 270 |
| 9. | වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 270 |
| 10. | හානිකරණ වියදම් | 271 |
| 11. | සේවක මණ්ඩල වියදම් | 272 |
| 12. | වෙනත් වියදම් | 274 |
| 13. | බදු වියදම් | 275 |
| 14. | කොටසක ඉපැයුම | 277 |
| **මූල්‍ය ප්‍රකාශනවල සටහන් - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය වත්කම්** | | |
| 15. | ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය | 278 |
| 16. | මුදල් හා මුදල් සමානයන් | 281 |
| 17. | මහ බැංකුව වෙතැති ශේෂයන් | 281 |
| 18. | බැංකුවල ඇති තැන්පතු | 282 |
| 19. | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 282 |
| 20. | ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් | 283 |
| 21. | ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් | 286 |
| 22. | ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ | 292 |
| 23. | වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 295 |
| 24. | පාලිත සමාගම්වල ආයෝජනය | 299 |
| 25. | ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය | 300 |
| 26. | දේපල, පිරියත සහ උපකරණ | 300 |
| 27. | පරිහරනය කිරීමේ අයිතිය හිමි වත්කම් | 306 |
| 28. | දේපල ආයෝජන | 307 |
| 29. | කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් | 309 |
| 30. | විලම්බිත බදු (වත්කම්)/වගකීම් | 311 |
| 31. | වෙනත් වත්කම් | 314 |
| **මූල්‍ය ප්‍රකාශනවල සටහන් - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - වගකීම් සහ හිමිකම්** | | |
| 32. | බැංකුවලට ගෙවිය යුතු | 315 |
| 33. | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 316 |
| 34. | ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම් | 316 |
| 35. | ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් | 316 |
| 36. | කල්බදු වගකීම් | 318 |
| 37. | නිකුත්කළ ණය සුරැකුම්පත් | 319 |
| 38. | සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 322 |
| 39. | ප්‍රවර්තන බදු වගකීම් | 333 |
| 40. | වෙනත් ප්‍රතිපාදන | 333 |
| 41. | වෙනත් වගකීම් | 333 |
| 42. | පරිපාලිත සමාගම්වලට ගෙවිය යුතු | 333 |
| 43. | ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | 334 |
| 44. | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 334 |
| 45. | රඳවාගත් ඉපයීම් | 334 |
| 46. | වෙනත් සංචිත | 335 |
| 47. | පාලනය යටත් නොවන හිමිකම | 337 |
| **මූල්‍ය ප්‍රකාශනවල සටහන් - අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්** | | |
| 48. | අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් | 338 |
| 49. | සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ හෙළිදරව් කිරීම | 340 |
| 50. | සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් වටිනාකම | 346 |
| 51. | බැංකුවට හා සමූහයට විරුද්ධව ඇති නීති කෘත්‍යයන් | 346 |
| 52. | මූල්‍ය ප්‍රකාශ වාර්තා කළ දිනට පසු සිදුවීම් | 347 |
| 53. | සංසන්දනාත්මක තොරතුරු | 347 |
| 54. | මූල්‍ය අවදානම් කළමනාකරණය | 347 |
| 55. | කල් පිරීමේ විශ්ලේෂණය | 379 |
| 56. | මූල්‍ය උපකරණවල සාධාරණ අගය | 383 |
| 57. | ප්‍රාග්ධන කළමනාකරණය (නියාමන වාර්තාකරණය අනුව) | 388 |
| 58. | ලියවිලි රහිත භාණ්ඩාරගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාල ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම් ගනුදෙනු | 389 |
| 59. | මෙහෙයුම් අංශ | 389 |
| 60. | තෝරාගත් කාර්යසාධක දර්ශක (මහ බැංකුවට සපයන නියාමන වාර්තාව අනුව) | 391 |

# ආදායම් ප්‍රකාශය



| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | පිටුව | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | බැංකුව වෙනස % | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|
| **දළ ආදායම** | 3 | 265 | **207,636,948** | 232,064,322 | (11) | **213,417,164** | 238,824,651 | (11) |
| පොළී ආදායම | | | **203,748,274** | 226,967,227 | (10) | **208,632,122** | 231,204,088 | (10) |
| අඩුකළා: පොළී වියදම | | | **130,966,199** | 197,402,011 | (34) | **133,360,073** | 199,266,982 | (33) |
| **ශුද්ධ පොළී ආදායම** | 4 | 265 | **72,782,075** | 29,565,216 | 146 | **75,272,049** | 31,937,106 | 136 |
| ගාස්තු සහ කොමිස් ආදායම | | | **2,078,830** | 1,593,415 | 30 | **2,085,090** | 1,605,521 | 30 |
| අඩුකළා: ගාස්තු සහ කොමිස් වියදම | | | **328,272** | 317,046 | 4 | **328,737** | 317,292 | 4 |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | 5 | 268 | **1,750,558** | 1,276,369 | 37 | **1,756,353** | 1,288,229 | 36 |
| වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය) | 6 | 269 | **911,630** | 1,425,791 | (36) | **1,791,936** | 3,701,827 | (52) |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 7 | 269 | **–** | – | – | **–** | – | – |
| මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම තුළින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 8 | 270 | **442,273** | 1,820,617 | (76) | **442,273** | 1,820,617 | (76) |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 9 | 270 | **455,941** | 257,272 | 77 | **465,743** | 492,598 | (5) |
| **මුළු මෙහෙයුම් ආදායම** | | | **76,342,477** | 34,345,265 | 122 | **79,728,354** | 39,240,377 | 103 |
| අඩුකළා: හානිකරණ වියදම් | 10 | 271 | **11,206,056** | 4,258,828 | 163 | **11,193,684** | 4,159,978 | 169 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | | **65,136,421** | 30,086,437 | 116 | **68,534,670** | 35,080,399 | 95 |
| **අඩුකළා: වියදම්** | | | | | | | | |
| සේවක මණ්ඩල වියදම් | 11 | 272 | **20,306,147** | 16,110,458 | 26 | **20,846,003** | 16,424,824 | 27 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් | | | **1,674,524** | 1,432,520 | 17 | **1,689,188** | 1,448,489 | 17 |
| වෙනත් වියදම් | 12 | 274 | **7,377,618** | 6,954,619 | 6 | **7,588,394** | 7,097,612 | 7 |
| **මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පෙර මෙහෙයුම් ලාභය** | | | **35,778,132** | 5,588,840 | 540 | **38,411,085** | 10,109,474 | 280 |
| අඩුකළා: මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | | | **8,207,522** | 1,142,716 | 618 | **8,683,243** | 1,832,755 | 374 |
| අඩුකළා: මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව | | | **1,139,934** | 158,708 | 618 | **1,205,905** | 254,298 | 374 |
| **මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පසු මෙහෙයුම් ලාභය** | | | **26,430,676** | 4,287,416 | 516 | **28,521,937** | 8,022,421 | 256 |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | | | **–** | – | – | **–** | – | – |
| **ආදායම් බදුවලට පෙර ලාභය** | | | **26,430,676** | 4,287,416 | 516 | **28,521,937** | 8,022,421 | 256 |
| අඩුකළා: ආදායම් බදු වියදම | 13 | 275 | **10,145,432** | (2,929,067) | 446 | **10,862,124** | (1,594,388) | 781 |
| **වර්ෂය සඳහා ලාභය** | | | **16,285,244** | 7,216,483 | 126 | **17,659,813** | 9,616,809 | 84 |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | | | | | |
| පාලක සමාගමේ හිමිකරුවන් | | | **16,285,244** | 7,216,483 | 126 | **17,659,813** | 9,616,809 | 84 |
| පාලනයට යටත් නොවන හිමිකම් | | | **–** | – | – | **–** | – | – |
| **වර්ෂය සඳහා ලාභය** | | | **16,285,244** | 7,216,483 | 126 | **17,659,813** | 9,616,809 | 84 |
| **ලාභය මත කොටසක ඉපයීම** | | | | | | | | |
| සාමාන්‍ය කොටසක මූලික ඉපයීම් (රු.) | 14 | 277 | **17.32** | 7.68 | 126 | **18.79** | 10.23 | 84 |
| සාමාන්‍ය කොටසක තනුක ඉපයීම් (රු.) | | | **17.32** | 7.68 | 126 | **18.79** | 10.23 | 84 |
| **වර්ෂය සඳහා ලාභය** | | | **16,285,244** | 7,216,483 | 126 | **17,659,813** | 9,616,809 | 84 |

248 පිටුවේ සිට 391 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

# විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2024** රු. '000 | 2023 රු. '000 | වෙනස % | **2024** රු. '000 | 2023 රු. '000 | වෙනස % |
| **වර්ෂය සඳහා ලාභය** | **16,285,244** | 7,216,483 | 126 | **17,659,813** | 9,616,809 | 84 |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | |
| විදේශ ගනුදෙනු පරිවර්තනය මත වූ විනිමය වෙනස්කම් | – | – | – | – | – | – |
| ඉදිරි සුරැකුම් මුදල් ප්‍රවාහ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) | – | – | – | – | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින ණය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ) | – | – | – | – | – | – |
| ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | – | – | – | – | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පත් කළ ණය උපකරණ | **996,856** | 3,742,285 | (73) | **1,053,092** | 3,919,079 | (73) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණ ඉවත් කිරීම මත සාධාරණ අගය මත ලාභ/(අලාභ) ආදායම් ප්‍රකාශයට මාරු කිරීම | **(442,273)** | (1,820,617) | (76) | **(442,273)** | (1,820,617) | (76) |
| ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම | **(166,375)** | (576,501) | (71) | **(183,246)** | (629,539) | (71) |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කලයුතු වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **388,208** | 1,345,167 | (71) | **427,573** | 1,468,923 | (71) |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින හිමිකම් උපකරණවල ආයෝජනයන්හි සාධාරණ අගයෙහි වෙනස්වීම | **2,538,631** | 1,971,371 | 29 | **2,705,001** | 2,070,885 | 31 |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වගකීම් මත බැංකුවේ ණය අවදානම ආරෝපණය කිරීමේ සාධාරණ වෙනස්වීම | – | – | – | – | – | – |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය | **(2,228,542)** | (6,107,248) | (64) | **(2,231,825)** | (6,106,664) | (63) |
| ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම | **486,042** | 1,723,862 | (72) | **487,027** | 1,723,503 | (72) |
| **සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය (බදු පසු)** | **(1,742,500)** | (4,383,386) | (60) | **(1,744,798)** | (4,383,161) | (60) |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් | – | 2,075,948 | (100) | – | 2,333,511 | (100) |
| ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම | – | (623,608) | (100) | – | (623,608) | (100) |
| **ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් (බදු පසු)** | – | 1,452,340 | (100) | – | 1,709,903 | (100) |
| ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | – | – | – | – | – | – |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණ කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **796,131** | (959,675) | 183 | **960,203** | (602,373) | 259 |
| **වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූ පසු** | **1,184,339** | 385,492 | 207 | **1,387,776** | 866,550 | 60 |
| **වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම** | **17,469,583** | 7,601,975 | 130 | **19,047,589** | 10,483,359 | 82 |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | | | |
| පාලක සමාගමේ හිමිකරුවන් | **17,469,583** | 7,601,975 | 130 | **19,047,589** | 10,483,359 | 82 |
| පාලනයට යටත් නොවන හිමිකම් | – | – | – | – | – | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **17,469,583** | 7,601,975 | 130 | **19,047,589** | 10,483,359 | 82 |

248 පිටුවේ සිට 391 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



| | | | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන | පිටුව | **2024** රු. '000 | 2023 රු. '000 | වෙනස % | **2024** රු. '000 | 2023 රු. '000 | වෙනස % |
| **වත්කම්** | | | | | | | | |
| මුදල් හා මුදල්වලට සමානයන් | 16 | 281 | **8,358,742** | 9,508,563 | (12) | **8,544,416** | 9,546,756 | (10) |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 281 | **357,054** | 246,998 | 45 | **357,117** | 247,232 | 44 |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 282 | **14,794,637** | 22,576,750 | (34) | **14,794,637** | 23,618,966 | (37) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | 282 | **9,131** | 924 | 888 | **54,892** | 11,231 | 389 |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් | 20 | 283 | | | | | | |
| – සාධාරණ අගයට ගණනය කළ | | | **21,086,781** | 17,748,501 | 19 | **46,749,528** | 40,189,162 | 16 |
| – සාධාරණ අගයට නම් කළ | | | **–** | – | – | **–** | – | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් | | | | | | | | |
| – ණය හා අත්තිකාරම් | 21 | 286 | **532,379,013** | 526,520,530 | 1 | **527,715,322** | 523,809,104 | 1 |
| – ණය හා වෙනත් උපකරණ | 22 | 292 | **1,039,034,572** | 943,704,684 | 10 | **1,048,965,769** | 953,056,324 | 10 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 23 | 295 | **53,469,178** | 61,924,412 | (14) | **55,306,512** | 62,694,519 | (12) |
| පාලිත සමාගම්වල ආයෝජනයන් | 24 | 299 | **7,311,000** | 7,311,000 | – | **–** | – | – |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනයන් | 25 | 300 | **–** | – | – | **–** | – | – |
| දේපල, පිරියත සහ උපකරණ | 26 | 300 | **17,415,792** | 17,248,961 | 1 | **18,556,112** | 18,389,400 | 1 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 27 | 306 | **1,041,185** | 1,164,595 | (11) | **1,066,014** | 1,193,161 | (11) |
| දේපළ ආයෝජන | 28 | 307 | **–** | – | – | **349,000** | 349,000 | – |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 29 | 309 | **2,183,860** | 744,715 | 193 | **2,185,087** | 747,225 | 192 |
| විලම්බිත බදු වත්කම් | 30 | 311 | **4,995,021** | 5,885,288 | (15) | **4,995,021** | 5,885,288 | (15) |
| වෙනත් වත්කම් | 31 | 314 | **50,002,248** | 72,378,671 | (31) | **50,127,502** | 72,570,357 | (31) |
| **මුළු වත්කම්** | | | **1,752,438,214** | 1,686,964,592 | 4 | **1,779,766,929** | 1,712,307,725 | 4 |
| **වගකීම්** | | | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | 32 | 315 | **487,521** | 8,984,779 | (95) | **487,521** | 15,399,100 | (97) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | 316 | **258,409** | 201 | 128,421 | **258,409** | 201 | 128,421 |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම් | 34 | 316 | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් | 35 | 316 | | | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | | | **1,556,270,863** | 1,482,532,430 | 5 | **1,556,681,918** | 1,482,951,028 | 5 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | | | **–** | – | – | **–** | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | | | **48,190,057** | 61,611,014 | (22) | **66,049,093** | 72,891,598 | (9) |
| කල්බදු වගකීම් | 36 | 318 | **1,281,561** | 1,365,547 | (6) | **1,314,177** | 1,400,575 | (6) |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | 319 | **16,966,482** | 23,806,514 | (29) | **17,039,651** | 23,879,683 | (29) |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 38 | 322 | **17,489,868** | 18,100,399 | (3) | **17,597,407** | 18,169,106 | (3) |
| ප්‍රවර්තන බදු වගකීම් | 39 | 333 | **3,648,729** | – | 100 | **4,054,844** | 305,869 | 1,226 |
| විලම්බිත බදු වගකීම් | 30 | 311 | **–** | – | – | **61,869** | 58,630 | 6 |
| වෙනත් වෙන්කිරීම් | 40 | 333 | **–** | – | – | **–** | – | – |
| වෙනත් වගකීම් | 41 | 333 | **9,002,109** | 9,189,455 | (2) | **9,387,245** | 9,463,508 | (1) |
| පාලිත සමාගම්වලට ගෙවිය යුතු | 42 | 333 | **–** | – | – | **–** | – | – |
| **මුළු වගකීම්** | | | **1,653,595,599** | 1,605,590,339 | 3 | **1,672,932,134** | 1,624,519,298 | 3 |

| දෙසැම්බර් 31 දිනට | සටහන | පිටුව | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | බැංකුව වෙනස % | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|
| **හිමිකම්** | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | 43 | 334 | **9,400,000** | 9,400,000 | – | **9,400,000** | 9,400,000 | – |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 44 | 334 | **5,694,877** | 5,369,172 | 6 | **5,810,742** | 5,464,218 | 6 |
| රඳවාගත් ඉපැයීම් | 45 | 334 | **28,462,305** | 14,408,118 | 98 | **33,771,814** | 18,605,719 | 82 |
| වෙනත් සංචිත | 46 | 335 | **55,285,433** | 52,196,963 | 6 | **57,852,239** | 54,318,490 | 7 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම | | | **98,842,615** | 81,374,253 | 21 | **106,834,795** | 87,788,427 | 22 |
| පාලනයට යටත් නොවන හිමිකම් | 47 | 337 | **–** | – | – | **–** | – | – |
| **මුළු හිමිකම** | | | **98,842,615** | 81,374,253 | 21 | **106,834,795** | 87,788,427 | 22 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | | **1,752,438,214** | 1,686,964,592 | 4 | **1,779,766,929** | 1,712,307,725 | 4 |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | 48 | 338 | **15,042,447** | 9,884,874 | 52 | **15,050,755** | 9,928,995 | 52 |
| **නාමික තොරතුරු** | | | | | | | | |
| සේවක සංඛ්‍යාව | | | **4,212** | 4,358 | | | | |
| ශාඛා සංඛ්‍යාව | | | **262** | 262 | | | | |

**සටහන:** හානිකරණයෙන් හා ක්ෂය කිරීමෙන් පසු ශුද්ධ අගයන් දක්වා ඇත.

248 පිටුවේ සිට 391 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

**සහතික කිරීම**

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පෙන්නුම් කරන බවට සහතික කරමි.

**කේ රවීන්ද්‍රන්**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.
අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ**
සභාපති

**අශේන් ජයසේකර**
අධ්‍යක්ෂ

**ශෂී කණ්ඩම්බි**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

2025 පෙබරවාරි 28
කොළඹ
ශ්‍රී ලංකාව

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය



## බැංකුව

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය /පවරන ලද ප්‍රාග්ධනය රු. '000 | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. '000 |
|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | 9,400,000 | 5,224,842 | 6,493,876 |
| 2023 වර්ෂය සඳහා ලාභය | – | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු) | – | – | 1,452,340 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | – | – | 1,452,340 |
| **හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | | | |
| වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම් | – | 144,330 | – |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු | – | – | – |
| ජාතික රක්‍ෂණ භාරකාර අරමුදලට දායකවීම් | – | – | – |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම් | – | – | – |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව** | – | 144,330 | – |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 9,400,000 | 5,369,172 | 7,946,216 |
| 2024 වර්ෂය සඳහා ලාභය | – | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු) | – | – | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | – | – | – |
| **හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | | | |
| වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම් | – | 325,705 | – |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු | – | – | – |
| ජාතික රක්‍ෂණ භාරකාර අරමුදලට දායකවීම් | – | – | – |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම් | – | – | – |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව** | – | 325,705 | – |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 9,400,000 | 5,694,877 | 7,946,216 |

248 පිටුවේ සිට 391 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | වෙනත් සංචිත | රඳවාගත් ඉපයුම් | මුළු හිමිකම |
|---|---|---|---|
| රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (1,669,876) | 42,084,235 | 11,359,152 | 72,892,229 |
| – | – | 7,216,483 | 7,216,483 |
| 2,956,339 | – | (4,023,187) | 385,492 |
| 2,956,339 | – | 3,193,296 | 7,601,975 |
| | | | |
| – | – | (144,330) | – |
| – | – | – | – |
| – | – | – | – |
| – | 880,049 | – | 880,049 |
| – | 880,049 | (144,330) | 880,049 |
| 1,286,463 | 42,964,284 | 14,408,118 | 81,374,253 |
| – | – | 16,285,244 | 16,285,244 |
| 2,926,839 | – | (1,742,500) | 1,184,339 |
| 2,926,839 | – | 14,542,744 | 17,469,583 |
| | | | |
| – | – | (325,705) | – |
| – | – | – | – |
| – | – | (162,852) | (162,852) |
| – | 161,631 | – | 161,631 |
| – | 161,631 | (488,557) | (1,221) |
| 4,213,302 | 43,125,915 | 28,462,305 | 98,842,615 |

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

## සමූහය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය /පවරන ලද ප්‍රාග්ධනය රු. '000 | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. '000 |
|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | 9,400,000 | 5,281,952 | 6,932,981 |
| පෙර වර්ෂයේ ගැලපීම්* | – | – | – |
| 2023 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ආරම්භක ශේෂය | 9,400,000 | 5,281,952 | 6,932,981 |
| 2023 වර්ෂය සඳහා ලාභය | – | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු) | – | – | 1,709,903 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | – | – | 1,709,903 |
| **හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමග සිදුකළ ගනුදෙනු** | | | |
| වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම් | – | 182,266 | – |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු | – | – | – |
| ජාතික රක්‍ෂණ භාරකාර අරමුදලට දායකවීම් | – | – | – |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම් | – | – | – |
| **හිමිකම් දරන්නන් සමග සිදුකළ මුළු ගනුදෙනු එකතුව** | – | 182,266 | – |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 9,400,000 | 5,464,218 | 8,642,884 |
| 2024 වර්ෂය සඳහා ලාභය | – | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු) | – | – | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | – | – | – |
| **හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමග සිදුකළ ගනුදෙනු** | | | |
| වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම් | – | 346,524 | – |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු | – | – | – |
| ජාතික රක්‍ෂණ භාරකාර අරමුදලට දායකවීම් | – | – | – |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම් | – | – | – |
| **හිමිකම් දරන්නන් සමග සිදුකළ මුළු ගනුදෙනු එකතුව** | – | 346,524 | – |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 9,400,000 | 5,810,742 | 8,642,884 |

*කරුණාකර සටහන් අංක 53 සංසන්දනාත්මක තොරතුරු වෙත යොමුවන්න.

248 පිටුවේ සිට 391 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | වෙනත් සංචිත | රඳවාගත් ඉපයුම් | මුළු හිමිකම |
|---:|---:|---:|---:|
| රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (1,765,659) | 42,951,306 | 13,589,101 | 76,389,681 |
| 19,900 | – | 15,438 | 35,338 |
| (1,745,759) | 42,951,306 | 13,604,539 | 76,425,019 |
| – | – | 9,616,809 | 9,616,809 |
| 3,179,609 | – | (4,022,962) | 866,550 |
| 3,179,609 | – | 5,593,847 | 10,483,359 |
| | | | |
| – | 410,401 | (592,667) | – |
| – | – | – | – |
| – | – | – | – |
| – | 880,049 | – | 880,049 |
| – | 1,290,450 | (592,667) | 880,049 |
| 1,433,850 | 44,241,756 | 18,605,719 | 87,788,427 |
| – | – | 17,659,813 | 17,659,813 |
| 3,132,574 | – | (1,744,798) | 1,387,776 |
| 3,132,574 | – | 15,915,015 | 19,047,589 |
| | | | |
| – | 239,544 | (586,068) | – |
| – | – | – | – |
| – | – | (162,852) | (162,852) |
| – | 161,631 | – | 161,631 |
| – | 401,175 | (748,920) | (1,221) |
| 4,566,424 | 44,642,931 | 33,771,814 | 106,834,795 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය



| | | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | පිටුව | **2024** රු. '000 | 2023 රු. '000 | **2024** රු. '000 | 2023 රු. '000 |
| **මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ** | | | | | | |
| පොලී ලැබීම් | | | **202,040,657** | 213,131,665 | **207,054,865** | 217,040,151 |
| පොලී ගෙවීම් | | | **(141,113,474)** | (214,047,888) | **(120,872,004)** | (215,725,905) |
| ශුද්ධ කොමිස් ලැබීම් | | | **1,750,558** | 1,276,369 | **1,756,353** | 1,288,229 |
| වෙළඳාම් ආදායම | | | **1,319,972** | 3,025,719 | **2,050,386** | 3,864,848 |
| සේවක මණ්ඩල ගෙවීම් | | | **(19,229,579)** | (13,670,876) | **(19,753,044)** | (13,985,920) |
| මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | | | **(9,495,582)** | (1,676,459) | **(10,045,524)** | (2,452,649) |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබීම් | | | **341,384** | 263,012 | **351,186** | 347,353 |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට ගෙවීම් | | | **(6,999,833)** | (6,962,648) | **(7,212,338)** | (7,076,615) |
| **මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | | **28,614,103** | (18,661,106) | **53,329,880** | (16,700,508) |
| **මෙහෙයුම් වත්කම්වල (වැඩිවීම)/අඩුවීම** | | | | | | |
| බැංකුවල ඇති තැන්පතු | | | **7,060,549** | (11,652,088) | **8,026,324** | (12,248,452) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | | **(241,327)** | 80,310 | **(276,780)** | 77,223 |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම් | | | **(3,106,029)** | (3,521,905) | **(6,325,589)** | (15,034,040) |
| ක්‍රමක්‍ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම් | | | **(15,430,619)** | 23,620,755 | **(13,466,139)** | 26,461,823 |
| ක්‍රමක්‍ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ | | | **(91,233,762)** | (13,316,612) | **(91,744,837)** | (13,853,444) |
| මූල්‍ය ආයෝජන විකිණීම හා කල්පිරීම මඟින් ලත් මුදල් | | | **–** | – | **–** | – |
| වෙනත් වත්කම් | | | **17,754,749** | (2,500,591) | **17,794,102** | (2,482,936) |
| | | | **(85,196,439)** | (7,290,131) | **(85,992,919)** | (17,079,826) |
| **මෙහෙයුම් වගකීම්වල වැඩිවීම/(අඩුවීම)** | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | | | **(8,750,000)** | 4,750,000 | **(20,625,367)** | 2,518,067 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | 316 | **258,208** | 201 | **258,208** | 201 |
| ක්‍රමක්‍ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවියයුතු | | | **85,708,062** | 9,809,431 | **85,696,513** | 11,156,350 |
| ක්‍රමක්‍ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු | | | **–** | – | **–** | – |
| ක්‍රමක්‍ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු | | | **(12,579,138)** | 44,462,152 | **(23,170,978)** | 53,457,442 |
| නිකුත්කළ ණය සුරැකුම්පත් | 37 | 319 | **(6,323,000)** | – | **(6,323,000)** | 3,617 |
| වෙනත් වගකීම් | | | **(5,895,370)** | 2,109,889 | **(5,757,565)** | 2,073,966 |
| | | | **52,418,762** | 61,131,673 | **30,077,811** | 69,209,643 |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | **(4,163,574)** | 35,180,436 | **(2,585,228)** | 35,429,309 |
| ගෙවූ ආදායම් බදු | 39 | 333 | **(5,035,397)** | (2,403,112) | **(5,637,408)** | (2,739,667) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල (යෙදවූ)/වලින් ලත් ශුද්ධ මුදල්** | | | **(9,198,971)** | 32,777,324 | **(8,222,636)** | 32,689,642 |

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | පිටුව | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|---|
| **ආයෝජන කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ** | | | | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | | **(620,581)** | (1,145,156) | **(630,105)** | (1,147,412) |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | | | **7,287** | 3,438 | **7,287** | 3,438 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට පවතින මූල්‍ය උපකරණවල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | | | **11,877,564** | (30,021,350) | **11,058,062** | (29,937,745) |
| මූල්‍ය ආයෝජන විකිණීම හා කල්පිරීම මගින් ලත් මුදල් | | | **–** | – | **–** | – |
| අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම් | | | **(177,346)** | (344,272) | **(177,346)** | (344,272) |
| ආයෝජන දේපළවල ශුද්ධ මිලදී ගැනීම් සහ වැඩිදියුණු කිරීම් | | | **–** | – | **–** | – |
| පාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජන අත්පත් කර ගැනීම මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **–** | – | **–** | – |
| පාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජනයෙන් ලද ලාභාංශ | | | **–** | – | **–** | – |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල (යෙදවූ)/වලින් ලත් ශුද්ධ මුදල්** | | | **11,086,924** | (31,507,340) | **10,257,898** | (31,425,991) |
| **මූල්‍යනය කිරීමේ කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලද ශුද්ධ මුදල් | | | **–** | – | **–** | – |
| යටත්කාලීන ණය නිකුත් කිරීම් මගින් ලත් ශුද්ධ මුදල් | | | **–** | – | **–** | – |
| යටත්කාලීන ණය ආපසු ගෙවීම් | | | **–** | – | **–** | – |
| යටත්කාලීන ණය මත ගෙවූ පොළිය | | | **(3,223,872)** | (600,000) | **(3,223,872)** | (604,003) |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම් - ලාභාංශ/විශේෂ බදු | | | **–** | – | **–** | – |
| **මූල්‍යන කටයුතු වලින් ලද ශුද්ධ මුදල්** | | | **(3,223,872)** | (600,000) | **(3,223,872)** | (604,003) |
| **මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | | **(1,335,919)** | 669,984 | **(1,188,610)** | 659,648 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන් | | | **9,564,741** | 8,894,757 | **9,603,169** | 8,943,521 |
| මුදල් හා මුදල් සමානයන්ගේ විනිමය වෙනස | | | **–** | – | **–** | – |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් වලට සමානයන්** | | | **8,228,822** | 9,564,741 | **8,414,559** | 9,603,169 |
| **මුදල් හා මුදල් සමානයන් අයිතම සැසඳීම** | | | | | | |
| අතැති මුදල් | 16 | 281 | **4,496,582** | 2,991,147 | **4,499,644** | 2,994,088 |
| බැංකුව වෙතැති ශේෂයන් | 16 | 281 | **3,645,461** | 6,185,654 | **3,828,073** | 6,220,907 |
| ඉල්ලුම් සහ කෙටිකාලීන තැන්පතු | 16 | 281 | **217,246** | 333,054 | **217,246** | 333,054 |
| ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 281 | **357,054** | 246,998 | **357,117** | 247,232 |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | 315 | **(487,521)** | (192,112) | **(487,521)** | (192,112) |
| | | | **8,228,822** | 9,564,741 | **8,414,559** | 9,603,169 |

248 පිටුවේ සිට 391 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්



## 1 වාර්තාකරණ ඒකකය

### 1.1 ආයතනික තොරතුරු

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ 1972 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. එය 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන යටතේ නියාමනය වන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය, අංක 255 "ඉතිරිකිරීමේ මන්දිරය" ගාලුපාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

| සේවක සංඛ්‍යාව | **2024** | 2023 |
|---|---|---|
| බැංකුව | **4,212** | 4,358 |
| සමූහය | **4,331** | 4,479 |

වාර්ෂික වාර්තාවේ පසුපස කවරයේ ඇතුළත ආයතනික තොරතුරු දක්වා ඇත.

සේවා සැපයුම් ස්ථාන ලෙස ශාඛා 262 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 295 ක් හා සී.ආර්.එම් යන්ත්‍ර 122 ක් ද බැංකුව සතුව පවතින අතර, නියෝජිත ජාල ලෙස තැපැල් කාර්යාල 652 ක් සහ උප තැපැල් කාර්යාල 3,354 ක් බැංකුව සතුව පවතී.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට බැංකුව (මව් සමාගම) සහ එහි පූර්ණ අයිතියට යටත් එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නම්වූ පාලිත සමාගම් දෙක ඇතුළත් වේ. (පොදුවේ "සමූහය" ලෙසද තනිව ගත් කල "බැංකුව" ලෙස ද ඇතුළත් වේ).

බැංකුවෙහි පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව සමූහයෙහි අවසන් පරිපාලකයා වේ. බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පාදක වෙයි. සෑම වසරකදීම පාර්ලිමේන්තුවේ දී සභාගත කිරීම පිණිස, දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය සඳහා "බැංකුවේ" සහ "සමූහයේ" මූල්‍ය ප්‍රකාශන බැංකුව විසින් පිළියෙල කරනු ලබයි.

### 1.3 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

#### බැංකුව

පෙර පරිදිම, ශ්‍රී ලාංකික ජනතාව අතර ඉතිරිකිරීම ප්‍රගුණ කරවීමත් එසේ එක්රැස් කරගන්නා ලද ඉතුරුම් ලාභදායී අයුරින් ආයෝජනය කිරීමත් බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. තැන්පතු භාර ගැනීම, ආයතනික සහ පාරිභෝගික ණය, ව්‍යාපාර මූල්‍යයනය, රාජ්‍ය ව්‍යාපෘති සඳහා ණය, උකස් ණය, අන්තර්ජාල බැංකුකරණය, එස් එම් එස් බැංකුකරණය යනාදී මූල්‍ය විසඳුම් රැසක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් සැපයෙයි. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාර බැංකුව එහි තැන්පතු වලින් අවම වශයෙන් 60% ක් රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජනය කිරීමට බැඳී සිටී.

#### පාලිත සමාගම්

**සීමාසහිත එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම**

සීමාසහිත එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් කටයුතු කරන අතර, රජයේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමෙහි යෙදී සිටියි.

**සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව**

ඉතුරුම් හා කාලීන තැන්පතු සංචලනය, ණය, කල්බදු, කුලී පිට ගැනුම්, උකස් ණය හා වෙනත් ණය පහසුකම් සැපයීම සහ සීමාසහිත ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ ණය ගිණුම් ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග සී.ස. ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ පැහැර හරිනු ලැබූ තැන්පතු වගකීම් පියවීම යනාදිය බැංකුවේ මූලික ක්‍රියාකාරකම් යටතට අයත් විණි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග ඒකාබද්ධවීමේ ක්‍රියාපටිපාටිය හේතුවෙන් 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නව ණය ප්‍රදානය, තැන්පතු භාර ගැනීම, නව සේවක බඳවා ගැනීම් සහ කිසියම් පාර්ශ්වයක් සමග නව ගිවිසුම්වලට එළඹීමෙන් වළකින ලදී. 2025 ජූනි 30 වන දිනට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සමග ඒකාබද්ධ වීමට නියමිතය. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම්, වගකීම් හා කාර්ය මණ්ඩලය ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අවශෝෂණය කර ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ඈවර කරනු ලැබීමට නියමිතය.

## 2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වෙනත් ආකාරයකට දක්වා ඇති බවට සඳහනක් නොවේ නම්, සෑම කාලපරිච්ඡේදයකදීම පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කරගනු ලැබ ඇත. බැංකුවේ මෙම ප්‍රතිපත්ති නොකඩවාම සමූහය විසින් උපයෝගී කරගනු ලැබ ඇති අතර ඉන් පරිබාහිර අවස්ථාවන් ඒ අනුව හෙළිදරව් කර ඇත.

### 2.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

#### 2.1.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම දක්වන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් යනාදියෙන් සමන්විත බැංකුවේ මූල්‍ය ප්‍රකාශන හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව වන අතර, එය 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන වලටද අනුකූල වේ. මුදල් ප්‍රවාහ තොරතුරු හැරුණු කොට සෙසු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ උපචිත පදනමටය.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී භාවිත කරන ලද ආකෘති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශනය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශ හා වෙනත් හෙළිදරව් කිරීම් ප්‍රකාශයට පත්කිරීම පිළිබඳ 2024 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛ අංක 05 හි 2024 මගින් නිර්දේශ කර ඇති ආකෘතියට ද අනුකූල වේ.

### 2.1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි හා එහි සංශෝධනවල ප්‍රතිපාදන ප්‍රකාර, බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීමයි.

"අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය", මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සහතිකකරණය මගින් දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශ සඳහා සිය වගකීම, අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පිළිගනු ලබයි.

මෙකී මූල්‍ය ප්‍රකාශයන්ට පහත කොටස් අන්තර්ගත වේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ විස්තර සපයන ආදායම් ප්‍රකාශය හා වෙනත් විස්තීර්ණ ආදායම (පිටු අංක 238 හා 239)

(ii) වර්ෂාවසානයට බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සපයන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (පිටු අංක 240 හා 241)

(iii) සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ බැංකුවේ හා සමූහයේ කොටස්හිමියන්ගේ අරමුදල්වල සියලු වෙනස්කම් දැක්වෙන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය (පිටු අංක 242 හා 244)

(iv) මුදල් හා මුදල්වලට සමාන දෑ ජනනය කිරීමට බැංකුව හා සමූහය සතු හැකියාව මෙන්ම එම මුදල් ප්‍රවාහ භාවිතය පිළිබඳ විස්තර සපයන මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය (පිටු අංක 246)

(v) සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් සවිස්තරාත්මක කරුණු ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් (පිටු අංක 248 සිට 391 දක්වා)

### 2.1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන (2023 වර්ෂය හා සන්සන්දනාත්මක තොරතුරු සමග) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2025 පෙබරවාරි 28 දින අනුමත කරන ලදී. (2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2024 මාර්තු 20 වන දින අනුමත කර පළ කිරීම සඳහා අවසර දෙන ලදී).

### 2.1.4 මිනුම්කරණ පදනම

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සාධාරණ අගය මත ගණනය කර ඇති පහත අයිතමයන් හැරුණු කොට බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

(i) වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සටහන් අංක 23)

(ii) ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සටහන් අංක 19 හා 33)

(iii) ලාභ හෝ අලාභ මගින් හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කම් සහ වගකීම් (සටහන් අංක 20 හා 34)

(iv) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් සහ වගකීම් (සටහන් අංක 20)

(v) අත්පත් කර ගැනීමේදී පිරිවැයට මනිනු ලබන හා පසුව සාධාරණ අගය මත ප්‍රත්‍යාගණිත අගයන් අනුව මිනුම් කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි (සටහන් අංක 26)

(vi) මූලිකව පිරිවැයට හඳුනාගනු ලබන, පසුව සාධාරණ අගයට අනුව මනිනු ලබන ආයෝජන දේපළ (සටහන් අංක 28)

(vii) නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වර්තමාන වටිනාකමෙන් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය ඉන් අඩු කිරීමෙන් පසු සේවක නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වගකීම හඳුනාගනු ලබයි. (සටහන් අංක 38) සැලසුම්ගත වත්කම්වල ශුද්ධ වටිනාකම අඩුකර, හඳුනානොගත් ආයුගණක ලැබීම් එකතුකර හඳුනා නොගත් පසුගිය සේවා පිරිවැය හා හඳුනානොගත් ආයුගණක අලාභ අඩු කළ පසු නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ශුද්ධ වගකීම හඳුනාගනු ලැබේ.

### 2.1.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල

සමූහයේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර, විශේෂයෙන් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු කොට සියලුම අගයන් ආසන්න දහස් ස්ථානයට වටයා ඇත. සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ඉදිරිපත් කළ වාර්තා වල ක්‍රියාකාරී හා ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපාර මුදල් හි වෙනසක් වාර්තා නොවිනි.

### 2.1.6 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කර ඇති බැංකුවේ සහ සමූහයේ වත්කම් හා වගකීම්, ඒවායෙහි ස්වභාවය අනුව වර්ගකර, කල්පිරීමේ රටාව හා සාපේක්‍ෂ ද්‍රවශීලතා අනුපිළිවෙල පිළිබිඹු වන අයුරින් ලැයිස්තුගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සම්බන්ධයෙන් ගැලපීමක් සිදුකර නොමැත. බැංකුවේ හා සමූහයේ වත්කම් හා වගකීම් වල කල්පිරීමේ රටාවන්හි විශ්ලේෂණය සටහන් අංක 55 (පිටු අංක 379 සිට 382) හි දක්වා ඇත.

### 2.1.7 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පදනමක් මත ඉදිරියට පැවතීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් සිදුකර ඇති අතර, ඉදිරි අනාගතයේ දී ව්‍යාපාර කටයුතුවල නිරතවීමට බැංකුව සතු ශක්‍යතාව පිළිබඳ සෑහීමට පත්වී ඇත.

තවද අඛණ්ඩ පැවැත්ම සඳහා සමූහයට ඇති හැකියාව පිළිබඳ සැක පහළ වන සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි සාධකයක් කළමනාකාරිත්වයට හමු වී නොමැත. එහෙයින් අඛණ්ඩ පැවැත්ම යන පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම තව දුරටත් සිදු කෙරෙයි.

### 2.1.8 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර. 01) "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම" මගින් ඉඩදී ඇති පරිදි අසමාන ස්වභාවයේ අයිතමයන් හෝ කාර්යයන් ප්‍රමාණාත්මක නොවන දෑ ලෙස නොසලකයි නම් පමණක් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලබයි.

### 2.1.9 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වැඩි අවබෝධයක් ලබාගැනීම සඳහා සහ කාලපරිච්ඡේද දෙක සංසන්දනය කිරීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය ප්‍රකාශනයෙහි පසුගිය කාලපරිච්ඡේදයට අදාළ සංසන්දනාත්මක තොරතුරු ප්‍රමාණාත්මකව, විස්තරාත්මකව හෙළිදරව් කර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් අරභයා මෙන්ම ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග අනුරූපවීමට අවශ්‍ය අවස්ථාවලදීද සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ග කර දක්වා ඇත. පිටු අංක 347 හි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 53 යටතේ අදාළ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

### 2.1.10 වැටයීම

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" පිළිබඳ ශ්‍රී ල.ගි.ප්‍ර. 01 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අනුමත පරිදි වෙනයම් අයුරකින් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු විට මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති අගය ආසන්න රුපියල් දහසට වටයා ඇත.

### 2.1.11 හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කරනු ලබන්නේ හඳුනාගත් අගයන් හිලව් කිරීම නෛතිකව බලාත්මක කළ හැකි වූ හා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එක්වරම වත්කම් උපලබ්ධි කර වගකීම් පියවීමට අදහස් කරන විට පමණි. ගිණුම්කරණ ප්‍රමිතියක්/අර්ථකථනයක් (අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන් අර්ථකථන කමිටුව සහ ප්‍රමිතීන් අර්ථකථන කමිටුව විසින් නිකුත් කරන ලද) සහ බැංකුවේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මගින් නිශ්චිතව අනුමත කර හෝ අවශ්‍ය බව දක්වා ඇති විටකදී හැර ආදායම් සහ වියදම්, ආදායම් ප්‍රකාශයේ හිලව් කරනු නොලැබේ.

### 2.1.12 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව වන පරිදි බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල අගයන් තීරණය කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය සම්බන්ධයෙන් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන උපයෝගී කර ගැනීමට කළමනාකාරීත්වයට සිදු වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට භාජනය කරයි. ගිණුම් ඇස්තමේන්තුවල යම් සංශෝධනයක් වෙතොත් එම සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය තුළදී, එම සංශෝධන ඉදිරි කාලපරිච්ඡේදයකට බලපාන්නේ නම්, ඉදිරි කාලපරිච්ඡේදවලදී ද ගිණුම්ගත කරනු ලැබේ.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් මත වැඩිම බලපෑමක් ඇති කිරීමට හැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයේ දී යොදාගත් සැලකිය යුතු තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන පහත දක්වා ඇත.

**අ. සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු**

මෙම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති අගයන් සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරලන අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලදී ගනු ලබන තීන්දු, පිළිබඳව තොරතුරු පහත සටහන් අංක 2.1.12.1 මගින් දැක්වේ.

#### 2.1.12.1 මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 අනුව පහත නිර්නායක මත පදනම්ව ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගය, ලාභය හෝ අලාභ මගින් සාධාරණ අගය යන විවිධ කාණ්ඩවලට මූල්‍ය වත්කම් වර්ග කිරීමට හා මැනීමට සමූහයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් අවකාශය සැලසේ.

- පිටු අංක 254 හි සටහන් අංක 2.5.1.4.1 හි දක්වා ඇති මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ආයතනික ව්‍යාපාරික ආකෘතිය
- පිටු අංක 255 හි සටහන් අංක 2.5.1.4.2 හි දක්වා ඇති මූල්‍ය වත්කම්හි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ගුණාංග

#### 2.1.12.2 ආයෝජන දේපළ වර්ගීකරණය

ආයෝජන දේපළක් ලෙස දේපළක් සුදුසුකම් ලබන්නේ ද යන්න තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සිය විනිශ්චය යොදා ගනු ලබයි. කුලී ආදායමක් ඉපයීම සඳහා හෝ ප්‍රාග්ධන ඇගැයීම සඳහා හෝ ඒ ද්විත්වයම සඳහා රඳවාගනු ලබන දේපළක් හා ඒ ඔස්සේ සමූහයේ අන් වත්කම්වලින් ස්වාධීනව මූල්‍ය ප්‍රවාහ උත්පාදනය කරනු ලබන දේපළ ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරනු ලැබෙයි. අනෙක් අතට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හෝ සැපයීම සඳහා හෝ පරිපාලනය සඳහා උපයෝගී කරගනු ලබන දේපළ සහ ඒ මගින් අදාළ දේපළට පමණක් නොව නිෂ්පාදන හා සැපයුම් ක්‍රියාවලිය සඳහා උපයෝගී කර ගනු ලබන වෙනත් වත්කම් සඳහා දායක වන මූල්‍ය ප්‍රවාහ උත්පාදනය කරනු ලබන දෑ, දේපළ, පිරියත හා උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබෙයි.

ආයෝජන දේපළෙහි ගිණුම්කරණ වර්ගීකරණයන්, එම දේපළෙහි වර්තමාන භාවිතය සැළකිල්ලට ගනිමින් සමූහය වාර්ෂිකව තක්සේරුව සිදුකරනු ලබයි.

**ආ. උපකල්පන සහ අවිනිශ්චිතතා තක්සේරු කිරීම**

සැලකියයුතු වෙනස්වීම්වලට තුඩු දිය හැකි අන්දමේ උපකල්පන හා අවිනිශ්චිතතා තක්සේරු පිළිබඳ තොරතුරු පහත සටහන් අංක 2.1.12.3 සිට 2.1.12.9 මගින් දක්වා ඇත.

#### 2.1.12.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගයන්, සක්‍රීය වෙළඳපොළ තුළින් ලබාගත නොහැකි විට, එය තීරණය කිරීම සඳහා ගණිතමය ආකෘතීන් භාවිතය ද ඇතුළත් තක්සේරුකරණ ක්‍රමවේද යොදා ගැනෙයි. මෙකී ආකෘතීන් සඳහා යෙදවුම්, නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත වෙතින් හැකි අවස්ථාවලදී ලබා ගන්නා අතර, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත නොමැති විට සාධාරණ අගයක් ස්ථාපිත කර ගැනීමට තීන්දුවක් ගත යුතු වේ.

මූල්‍ය උපකරණ අගය කිරීම පිණිස යොදාගන්නා ක්‍රමවේද සහ සාධාරණ අගයන්හි ධුරාවලිය සටහන් අංක 56 මගින් මූල්‍ය ප්‍රකාශනයෙහි පිටු අංක 383 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

### 2.1.12.4 මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

සියලුම මූල්‍ය වත්කම් කාණ්ඩ, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 සහ ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 යටතේ හානිකරණ අලාභ මිනීම සඳහා විශේෂයෙන්ම හානිකරණ අලාභ නිශ්චය කිරීමේදී ඉදිරි මුදල් ප්‍රවාහ වල අගය හා කාල වකවානුව සහ ඇප වටිනාකම්වල අගය පිළිබඳව නිසි තීන්දු ගැනීම අවශ්‍ය වේ.

ඒ අනුව, ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභ වාර්තා කළ යුතු දැයි තක්සේරු කිරීම පිණිස මූල්‍ය තත්ත්ව පිළිබඳව වාර්තා කරනු ලබන සෑම දිනයකදීම සමූහය විසින් එහි සැලකිය යුතු ණය හා අත්තිකාරම් පිළිබඳව තනි තනිව සමාලෝචනය කෙරෙයි. හානිකරණ අලාභ නිශ්චය කිරීමේ දී විශේෂයෙන්ම අනාගත මුදල් ප්‍රවාහ වල කාලය හා වටිනාකම තීරණය කිරීමට කළමනාකාරිත්වයේ තීන්දු අවශ්‍ය වේ. මෙකී ඇස්තමේන්තු පදනම් වනුයේ සාධක රාශියක් පිළිබඳ උපකල්පන ගණනාවක් මත වන හෙයින් සත්‍ය ප්‍රතිඵල මීට වෙනස්විය හැකිය.

හානිකරණය සඳහා කේවල ඇගයීමට ලක් කරනු ලබන මූල්‍ය වත්කම් සහ ඉදිරියේදී ලැබෙනැයි අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහවල වත්මන් අගය පිළිබඳ කළමනාකාරිත්වයේ නිසි ඇස්තමේන්තුව මත කේවල හානිකරණ ප්‍රතිපාදන පදනම් වේ. මෙම මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේදී ණයකරුගේ මූල්‍ය තත්ත්වය හා පාදක වූ ඇපවල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ කළමනාකාරිත්වය විසින් සලකා බැලෙයි. සෑම හානිකරණ වත්කමක්ම එහි වටිනාකම හා ප්‍රායෝගික උපාය මාර්ග, ආපසු ලබාගත හැකි යැයි සැලකෙන මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තුව මත ඇගයීමට ලක් කෙරෙයි.

පහත පරිදි සාමූහික හානිකරණ ප්‍රතිපාදන ස්ථාපිත කර ඇත.

- කේවල වශයෙන් නොසැලකෙන සමජාතීය ණය හා අත්තිකාරම් කාණ්ඩ
- කේවල වශයෙන් සැලකූ නමුත් කේවල වශයෙන් හානිකරණය වී නොමැති වත්කම් කාණ්ඩ
- ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 අනුව සමූහයේ අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම, විචල්‍ය යෙදවුම් විකල්ප සහ ඒ මත වන අන්තර් යැපීමට පාදක උපකල්පන ගණනාවකින් යුත් සංකීර්ණ ආකෘතිවල ප්‍රතිඵලයකි. ගිණුම්කරණ තීන්දු හා ඇස්තමේන්තු ගණයෙහි ලා සැලකෙන අපේක්ෂිත ණය පාඩු ආකෘතිවලට පහත සාධක ඇතුළත් වේ.
- ණය අවදානමෙහි සැලකියයුතු වැඩිවීමක් වී ඇත්දැයි ගුණාත්මක ඇගයීම සඳහා සමූහයේ නිර්නායක සහ අපේක්ෂිත ජීවකාල ණය පාඩු පදනම මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන දීමනා
- සාමූහික පදනමක් මත අපේක්ෂිත ණය පාඩු අගයනු ලබන අවස්ථාවේ මූල්‍ය වත්කම් වර්ගීකරණය
- විවිධ සංඛ්‍යාත්මක සූත්‍ර සහ යෙදවුම් විකල්ප ඇතුළත් අපේක්ෂිත ණය පාඩු ආකෘති සංවර්ධනය
- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය, උද්ධමනය, පොළී අනුපාතික, විනිමය අනුපාතික, විරැකියාව, ණය පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) නිරාවරණයවීමේ පාඩුව (EAD) හා පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) ආදී සර්ව ආර්ථික යෙදවුම් අතර සම්බන්ධතාවය තීරණය කිරීම.
- ආර්ථික යෙදවුම්, අපේක්ෂිත ණය පාඩු ආකෘති වලට අදාළ කර ගැනීම සඳහා ඉදිරි දැක්මැති සාර්ව ආර්ථික සංසිද්ධීන් හා එහි සම්භාවිතාව පිළිබඳ බර තැබීම් තෝරා ගැනීම.

### 2.1.12.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනකම විලම්භිත බදු වත්කම් හැර අනෙකුත් වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ හැඟවීමක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, එම වත්කමේ අගය නැවත අයකරගත හැකි අගය දක්වා කපා හරියි.

### 2.1.12.6 දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

සමූහය විසින් වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ කොටස් ලෙස හඳුනාගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් සහිත ප්‍රත්‍යාගණිත අගයන්ට අනුව ඉඩම් හා ගොඩනැගිලි මනිනු ලැබෙයි. "සාධාරණ අගය මැනීමට" අනුකූලව සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කිරීම සඳහා සමූහය විසින් ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් යොදවන ලදී. සින්නක්කර ගොඩනැගිලි සහ ඉඩම්වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා භාවිතා කල ක්‍රමවේද හා ප්‍රධාන උපකල්පන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3 හි තවදුරටත් විස්තර කර දක්වා ඇත.

### 2.1.12.7 දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීවකාලය

සමූහය, දේපළ, පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම, ඵලදායී ජීවකාලය හා ක්ෂය ක්‍රමය, සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේ දී කළමනාකාරිත්වයේ තීරණ භාවිතා කෙරෙන හෙයින් ඒවායෙහි අගයන් අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

### 2.1.12.8 විලම්බිත බදු වත්කම්

විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ එම බදු අලාභ අයකර ගත හැකි, බදු වන අනාගත ලාභ ලැබීමේ හැකියාවක් ඇතිතාක් දුරට පමණි. හඳුනාගත හැකි විලම්බිත බදු වත්කමේ අගය නිර්ණය කිරීම පිණිස අනාගතයේ විය හැකි බදු වන ලාභයන්හි කාලසීමාව හා ප්‍රමාණය සහ අනාගත බදු සැලසුම්කරණ උපායමාර්ග මත පදනම්ව තීරණ ගත යුතු වේ.

### 2.1.12.9 නිර්වචිත ප්‍රතිලාභ වගකීම්

ආයුගණක තක්සේරු උපයෝගී කරගනිමින් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය සහ එම වගකීම්වල වර්තමාන අගය තීරණය කෙරෙයි. වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, ඉදිරි වැටුප් වැඩිවීම්, සේවක මරණ අනුපාතය හා ඉදිරි විශ්‍රාම වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පන ආයුගණක තක්සේරුව හා සම්බන්ධ වේ.

මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය හේතුකොට ගෙන එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

යෝග්‍ය වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී විශ්‍රාම අරමුදලේ කාලසීමාවට බර තැබූ සාමාන්‍ය ශේෂයට සමාන ඉහළ ගුණාත්මක බව්න් යුතු ආයතනික බැඳුම්කරයක ප්‍රතිලාභ කළමනාකරණය විසින් සලකා බලනු ලැබෙයි. වෙළඳපොළ තුළ ගැලපෙන ඉහළ ගුණාත්මකබවින් යුතු ආයතනික බැඳුම්කර නොමැති අවස්ථාවකදී සමාන කාලසීමාවකට අවදානම ගලපන ලද රාජ්‍ය බැඳුම්කර ප්‍රතිලාභ, වට්ටම් අනුපාතය ලෙස යොදා ගනු ලැබිණි.

පොදුවේ භාවිත මර්ත්‍යතා චක්‍ර අනුව මර්ත්‍යතා අනුපාතිකය තිරණය වෙයි. අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත හා බැංකුවේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධක මත ඉදිරි වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම් තීරණය වෙයි.

### 2.1.12.10 වගකීම් හා අලාභ සඳහා ප්‍රතිපාදන, බැඳියාවන් හා අසම්භාව්‍යයන්

සමූහයේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සමූහයට එරෙහි නෛතික හිමිකම් ඉල්ලීම් ඉදිරිපත්වූ විට එම හිමිකම් ඉල්ලීම් සාර්ථක වීමේ ඉඩකඩ සම්බන්ධයෙන්, ප්‍රතිපාදන සැලසීම කළමනාකාරිත්වය විසින් තීරණය කරයි. නීතිමය හිමිකම් සම්බන්ධ ක්‍රියාමාර්ග අවසන් කිරීමට ගතවන කාලසීමාව මෙන්ම ආර්ථික ප්‍රතිලාභ ගලායෑමේ ප්‍රමාණය ද අවිනිශ්චිත වේ. මේ සඳහා ගතවන කාලසීමාව සහ පිරිවැය අවසාන වශයෙන් තීරණය වනුයේ අදාළ නෛතික බලසීමාව මතය. වර්ෂය තුළ සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් තුළදී හඳුනාගනු ලැබූ සියලුම අලාභ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

### 2.1.12.11 කල්බදු – (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.16)

බැංකුව විසින් ගිවිසුමක් ආරම්භයේදී එම ගිවිසුම කල්බදු ගිවිසුමක්දැයි හෝ එයට කල්බදු ගිවිසුමක් අයත්දැයි යන්න හා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.16 හි මාර්ගෝපදේශ අනුව සලකා බැලීම සඳහා යම් කාල පරිච්ඡේදයකදී හඳුනාගත් වත්කමක් ලෙස භාවිත කිරීමේ හැකියාව පාලනය කිරීමේ අයිතිය, එම ගිවිසුමෙන් සන්නිවේදනය වේද යන්න තක්සේරු කරනු ලබයි. මෙම තක්සේරුවේ දී නැවත භාවිත කෙරෙන කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් වත්කම භවිතයෙන් සියලු ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ අයිතිය මෙන්ම හඳුනාගත් වත්කම භාවිත කරනුයේ කවර පරමාර්ථයෙන් සහ කෙසේද යන්න විධාන කිරීමේ අයිතිය බදු ගැනුම්කරු සතු වේ.

ගිවිසුම කල්බදු ගිවිසුමක්දැයි හෝ එයට කල්බදු ගිවිසුමක් අයත්දැයි යන්න තක්සේරු කිරීමෙන් අනතුරුව ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 හි සවිස්තරාත්මක මාර්ගෝපදේශ අනුව, එයට අතිරේක කල්බදු ගිවිසුමක/කල්බදු නොවන (සේවා) අංශ ඇතුළත්දැයි යන්න බැංකුව විසින් තීරණය කරනු ලැබෙයි. ඒ අනුව තනිව ගත් විට හෝ බදු ගැනුම්කරුට පහසුවෙන් ලබාගත හැකි වෙනත් සම්පත් සමග අදාළ වත්කම භාවිත කිරීමෙන් බදු ගැනුම්කරුට ප්‍රතිලාභ ලැබිය හැකි නම් සහ අදාළ වත්කම, ගිවිසුමෙහි වෙනත් වත්කම් සමග ඉහළ අන්තර් සම්බන්ධයක් නොමැති නම් හෝ ඒ මත විශාල වශයෙන් රඳා නොපවතී නම්, හඳුනාගත් වත්කමක් භාවිත කිරීමේ අයිතිය වෙනම කල්බදු අංගයක් ලෙස සැලකෙයි.

#### 2.1.12.11.1 භාවිතයට අයිතිය ඇති වත්කම්

භාවිතයට අයිතිය ඇති වත්කම්, සමුච්චිත ක්ෂයවීම් හා හානිකරණ පාඩු අඩුකර පිරිවැයට මනිනු ලබන අතර කිසියම් කල්බදු වගකීම් ප්‍රතිමිනුම් වේ නම් ඊට ගලපනු ලැබෙයි. හඳුනාගනු ලැබූ කල්බදු වගකීම් අගය සහ ලද කල්බදු දිරිදීමනා වේ නම් එය අඩු කළ පසු ආරම්භක දිනට හෝ ඊට පෙර සිදු කරනු ලද කල්බදු ගෙවීම්, භාවිතයට අයිතිය ඇති වත්කම්වල පිරිවැයට අන්තර්ගත වේ. කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු වලට අදාළ වත්කමෙහි හිමිකාරිත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් බැංකුව සතු නොවේ නම් මිස, භාවිතයට අයිතිය ඇති වත්කම්, එහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය හා කල්බදු කාලසීමාව යන දෙකෙන් අඩු සීමාව තුළ සරල රේඛීය පදනම මත ක්ෂය කරනු ලැබෙයි. භාවිතයට අයිතිය ඇති වත්කම් හානිකරණයට බඳුන් වෙයි.

#### 2.1.12.11.2 කල්බදු වගකීම්

කල්බදු සමාරම්භක දිනට බැංකුව විසින් කල්බදු කාලසීමාව තුළ කළයුතු ගෙවීම්වල වත්මන් අගයට මනිනු ලබන කල්බදු වගකීම් හඳුනා ගැනෙයි. ස්ථාවර ගෙවීම්, ලැබිය හැකි කල්බදු දීමනා අඩු කළ පසු දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වන විචල්‍ය කල්බදු ගෙවීම් සහ ඇපකර වටිනාකම් යටතේ ගෙවීමට අපේක්ෂිත අගයන් කල්බදු ගෙවීම්වලට අයත් වේ. බැංකුව විසින් උපයෝගී කරගනු ලැබීමට හේතු සහගත ගැනුම් විකල්පයක පුරුදු මිල හා ගිවිසුම අවසන් කළ හැකිය යන විකල්පය බැංකුවට භාවිත කිරීමේ අයිතිය කල්බදු කොන්දේසි වලින් පිළිඹිබු වේ නම්, කල්බදු ගිවිසුමක් අවසන් කිරීමට අදාළ දඩ මුදල් ද කල්බදු ගෙවීම්වලට ඇතුළත් වේ. ගෙවීම් කිරීමට තුඩු දෙන යම් සිදුවීමක් හෝ තත්ත්වයක් උදාවූ කාලසීමාව තුළ යම් දර්ශකයක් හෝ අනුපාතිකයක් මත පදනම් නොවූ විචල්‍ය කල්බදු ගෙවීම් වියදම් ලෙස හඳුනා ගැනෙයි.

කල්බදු ගෙවීම්වල වත්මන් අගය ගණනය කිරීමේදී කල්බදු වලට අදාළ පොලී අනුපාතිකය එක්වරම තීරණය කළ නොහැකි වන විටක කල්බදු ආරම්භක දිනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතිකය (භාණ්ඩාගාර බැඳුම්කර කාලසීමාව කල්බදු ගිවිසුම් කාලසීමාවට සමාන විය යුතුයි) බැංකුව විසින් උපයෝගී කරගනු ලැබෙයි.

සමාරම්භක දිනට පසුව පොලිය එකතුවීම පිළිඹිබු කිරීමට කල්බදු වගකීම් ප්‍රමාණය වැඩිකර ගෙවන ලද කල්බදු ගෙවීම් ප්‍රමාණය අඩු කරනු ලබයි. ඊට අමතරව වෙනස් කිරීමක්, කල්බදු කාලසීමාවෙහි වෙනසක්, ප්‍රධාන වශයෙන් ස්ථාවර කල්බදු ගෙවීම්හි වෙනසක් හෝ පාදක වූ වත්කම මිලදී ගැනීමේදී තක්සේරුකරණයේ වෙනසක් යනාදිය ඇති අවස්ථාවලදි කල්බදු වගකීම්හි ධාරණ අගය ප්‍රත්‍යාගණනය කෙරෙයි.

කල්බදු වගකීම මෙලෙස යළි මනිනු ලබන විට වත්කම් භාවිත කිරීමේ අයිතියෙහි ධාරක අගයට අදාළ ගැලපීමක් සිදු කරනු ලබයි. නොඑසේ නම්, වත්කම් භාවිත කිරීමේ අයිතියෙහි ධාරක අගය 0 තෙක් අඩු වී ඇත්නම්, එය ලාභ/අලාභ යටතේ වාර්තා කරනු ලබයි.

සමූහය විසින් වත්කම් භාවිතා කිරීමේ අයිතිය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වන අතර කල්බදු වගකීම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි "වෙනත් වගකීම්" යටතේ දක්වනු ලැබෙයි.

#### 2.1.12.11.3 කෙටිකාලීන කල්බදු හා අඩු වටිනාකමැති කල්බදු වත්කම්

බැංකුව එහි කෙටිකාලීන කල්බදු වලට (එනම්, මිලදී ගැනීමේ විකල්පයක් නොමැති හා ආරම්භක දින සිට මාස 12 ක හෝ ඊට අඩු කල්බදු කාලසීමාවක් සහිත කල්බදු වලට) කෙටිකාලීන කල්බදු හඳුනාගැනීම් නිදහස් කිරීම අදාළ කර ගනියි. එමෙන්ම අඩු වටිනාකමක් ඇති බවට සලකනු ලබන අවස්ථාවලදී ද බැංකුව අඩු වටිනාකමැති වත්කම් කල්බදු හඳුනාගැනීම් නිදහස් කිරීම අදාළ කර ගනියි. කෙටිකාලීන කල්බදු මත හා අඩු වටිනාකමැති වත්කම් මත කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව තුළදී සරල රේඛීය පදනමක් මත වියදම් ලෙස හඳුනාග නු ලබයි. බැංකුව විසින් පාදක වූ වත්කමෙහි අගය රු. මිලියන 1ට සමාන හෝ අඩු නම්, අඩු වටිනාකමැති වත්කම්වල කල්බදු සලකා බැලෙයි.

#### 2.1.12.11.4. අළුත්කිරීමේ විකල්පය සහිත ගිවිසුම්වල කල්බදු කොන්දේසි තීරණය කිරීමේදී වැදගත් තීරණ

උපයෝගී කරගත හැකි බවට පිළිගත හැකි පරිදි තහවුරු කළ හැකි, දීර්ඝ කළ හැකි විකල්පයක් මගින් ආවරණය වන කිසියම් කාලච්ඡේද සමග හෝ උපයෝගී කරගනු ලබන බවට පිළිගත හැකි පරිදි තහවුරු කළ නොහැකි විටකදී කල්බදු අවසන් කිරීමට විකල්පයක් මගින් ආවරණය වන කාලච්ඡේද සමග අවලංගු කළ නොහැකි කල්බදු කොන්දේසි, බැංකුව විසින් කල්බදු කොන්දේසි ලෙස තීරණය කරනු ලබයි. අළුත් කිරීමේ විකල්පය උපයෝගී කරගනු ලබන බවට පිළිගත හැකි පරිදි තහවුරු කර ගැනීම උදෙසා බැංකුව තීරණ ගනු ලබයි. එනම්, අළුත් කිරීම උපයෝගී කර ගැනීම සඳහා ආර්ථිකමය දිරිදීමනාවක් උත්පාදනය කරන අදාළ සියලු සාධක එය සලකා බලනු ලබයි. ආරම්භක දිනට පසු, සිය පාලනය

යටතේ ඇති හා අළුත්කිරීමේ විකල්පය උපයෝගී කර ගැනීමට (හෝ උපයෝගී කර නොගැනීමට) ඇති හැකියාව බලපානු ලබන වාතාවරණයන්හි වෙනසක් හෝ වැදගත් සිද්ධියක් වේ නම්, බැංකුව විසින් කල්බදු කොන්දේසි යළි ඇගයීමට ලක් කෙරෙයි. කල්බදු දීර්ඝ කර ගැනීමේ හෝ අවසන් කිරීමේ විකල්ප අඩංගු ගිවිසුම්හි කල්බදු කොන්දේසි තීරණය කිරීමේදී බැංකුව පසු දැක්මක් යොදා ගනියි. ඒ අනුව, බැංකුව හා බදුහිමියා විසින් අත්සන් කරන ලද කුලී එකඟතාව මගින් ආවරණය වන කාලච්ඡේදය තුළ වසර ගණන මත පදනම්ව බැංකුව විසින් කල්බදු කොන්දේසි හඳුනාගනු ලබයි.

## 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්

පහත කරුණු හැරුණුවිට 2024 වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි ප්‍රධාන පෙළේ වෙනස්කම් සිදු නොවිණි.

## 2.3 සාධාරණ අගය මිනීම

"සාධාරණ අගය" වූ කලී විධිමත් ගනුදෙනුවකදී වත්කමක් විකිණීමට හෝ වගකීමක් ගෙවා නිදහස් වන මිල සඳහා ගෙවීමේදී හෝ එසේ නොමැති විටක මනිනු ලබන දින වෙළඳපළ පාර්ශ්වකරුවන් අතර සිදුවන නිසි ගනුදෙනුවකදී සමූහයට එදිනට පිවිසිය හැකි වඩා ප්‍රතිලාභදායී වෙළඳපළකදී ලැබෙන මිලකි. වගකීමක සාධාරණ අගය එහි කාර්යසාධනමය නොවන අවදානම පිළිඹිබු කරයි.

යම් උපකරණයක් සඳහා සක්‍රීය වෙළඳපොළක් තුළ ප්‍රකාශිත මිල භාවිත කරමින් සමූහය විසින් එකී උපකරණයෙහි සාධාරණ අගයට මනිනු ලබයි. අඛණ්ඩ පදනමක් මත මිලකරණ තොරතුරු සැපයීමට ප්‍රමාණවත් ධාරිතාවක් හා තීව්‍රතාවයක් සහිත වත්කමක හෝ වගකීමක ගනුදෙනු සිදුවන්නේ නම්, එකී වෙළඳපළ සක්‍රීය යැයි සැලකෙයි.

සක්‍රීය වෙළඳපොළක් තුළ ප්‍රකාශිත මිලකරණයක් නොවේ නම් නිරීක්ෂණය කළ හැකි අදාළ යෙදවුම්වල භාවිතය උපරිම කරවන සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වල භාවිතය අවම කරවන තක්සේරු විධික්‍රම සමූහය විසින් භාවිත කෙරෙයි. මිලකරණ ගනුදෙනුවකදී වෙළඳපළ පාර්ශ්වකරුවන් ආර්ථික අතින් ඔවුන්ගේ උපරිම යහපත තකා කටයුතු කරන්නේ නම්, වත්කම හෝ වගකීම මිලකරණයේදී ඔවුන් සාධාරණ අගයෙහි ධූරාවලිය උපයෝගී කරගනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක/වගකීමක සාධාරණ අගය මනිනු ලැබේ.

වෙනස්වීම් සිදුවී ඇති වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සාධාරණ අගයෙහි ධූරාවලි මට්ටම් අතර මාරුවීම් සමූහය විසින් හඳුනාගනු ලබයි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී වත්කමක් එහි ඉහළම/හොඳම භාවිතය තුළින් හෝ එලෙස ඉහළම/හොඳම ලෙස භාවිත කරනු ලබන වෙනත් වෙළඳපළ පාර්ශ්වකරුවෙකුහට විකිණීම තුළින් ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට වෙළඳපළ පාර්ශ්වකරුවකු සතු හැකියාව සලකා බලනු ලබයි. ඉඩම් සහ ගොඩනැගිලි වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර වෘත්තීමය අගය කරන්නන් සම්බන්ධ වේ.

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය මිනීමේ/විශ්ලේෂණයක් පිටු අංක 383 සිට 388 දක්වා සටහන් අංක 56 හි දක්වා ඇත.

## 2.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති – පොදු

### 2.4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 10) "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන" සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.27) "ඒකාබද්ධ හා තනි මූල්‍ය ප්‍රකාශන" ප්‍රකාර බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ සහ එහි පාලිතයේ මූල්‍ය ප්‍රකාශන වලින් සමන්විත වේ.

#### 2.4.1.1 ව්‍යාපාරික ඒකාබද්ධවීම්

පාලනය සමූහය වෙත සංක්‍රමණය වන අවස්ථාවේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාරික ඒකාබද්ධවීම්" යටතේ අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් ව්‍යාපාරික ඒකාබද්ධවීම් ගිණුම්ගත කෙරෙයි. අත්පත් කර ගැනීමේදී සංක්‍රමණය කෙරෙන ප්‍රතිලාභ හා අත්පත් කරගනු ලබන ශුද්ධ හඳුනාගත හැකි වත්කම් සාධාරණ අගයට මනිනු ලැබෙයි. පැන නගිනු ලබන යම් කීර්තිනාමයක් වේ නම්, වාර්ෂිකව හානිකරණය සඳහා පරීක්ෂා කරනු ලබයි. කේවල් කර මිලදී ගැනීමකදී ඇති වන ඕනෑම ලාභයක් වහාම ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. ණය හෝ හිමිකම් කොටස් සුරැකුම් නිකුතුවට අදාළ නම් හැර ගනුදෙනු පිරිවැය සිදු වූ වියදම් ලෙස ගණනය වෙයි.

පෙර පැවති සබඳතා පියවීමට අදාළ ප්‍රතිලාභ සංක්‍රමණය වූ ප්‍රතිලාභ වලට ඇතුළත් නොවෙයි. එබඳු ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබෙයි.

අත්පත් කරගනු ලබන ඕනෑම අසම්භාව්‍ය ප්‍රතිලාභයන් එය අත්පත් කරගන්නා දිනට එහි සාධාරණ වටිනාකමට මනිනු ලබයි. හිමිකම් ලෙස වර්ගීකරණය කර ඇති විට එය ප්‍රත්‍යාගණනය නොකරන අතර හිමිකම් තුළ පියවීම ගිණුම්කරණය කෙරෙයි. අඛණ්ඩ සලකා බැලීමත්. ගෙවීමට ඇති බැඳියාව මූල්‍ය උපකරණ වර්ගීකරණයෙහි හිමිකම නිර්වචනය යටතට ගැනෙන විට එය ප්‍රත්‍යාගණනය නොකරන අතර පියවීමද හිමිකම් ඇතුලත ගිණුම්ගත කරයි. නොඑසේ නම් අඛණ්ඩ සලකා බැලීමක සාධාරණ වටිනාකම පසුකාලීන වෙනස්වීම් ලාභයට හෝ අලාභයට හඳුනා ගනියි. මූල්‍ය උපකරණයක නිර්වචනයට සරිලන අසම්භාව්‍ය ප්‍රතිලාභ ගෙවීමට ඇති බැඳියාව, නොඑසේ නම්, අසම්භාව්‍ය ප්‍රතිලාභයන්හි සාධාරණ වටිනාකමෙහි පසුකාලීන වෙනස්කම් ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි.

#### 2.4.1.2 පාලනය නොවන හිමිකම

ඉහත විස්තර පිටු අංක 337 හි සටහන් අංක 47 යටතේ දක්වා ඇත.

#### 2.4.1.3 පරිපාලිත සමාගම්

බැංකුව වෙත පාලනය පැවරෙන දින පටන් පාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන මුලුමනින්ම ඒකාබද්ධ කෙරෙන අතර, එබඳු පාලනයක් අවසන් වනතුරු ඒකාබද්ධ කිරීම සිදුවෙයි. පාලනයක් පවතින්නේ බැංකුවට එකී පාලිත සමාගමේ ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි, එහි මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරිමට බලයක් ඇති විටදීය. ඒකාබද්ධ කිරිමේදී භාවිතා වන බැංකුවේ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන, ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ කාලපරිච්ඡේදය අදාළ වන අතර ඊට සමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරමින් පිළියෙල කරනු ලබයි.

#### 2.4.1.4 පාලනය අහිමිවීම

පාලිත සමාගමක පාලනය සමූහය සතු නොවන විට එය විසින් පාලිත සමාගමෙහි වත්කම් හා වගකීම් සහ අදාළ ඕනෑම පාලනයකට යටත් නොවන හා හිමිකම්වල වෙනත් උපාංග හඳුනාග නු නොලැබෙයි. එහි ප්‍රතිඵල ලෙස උත්පාදිත ලාභ හෝ අලාභ, ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. පාලනය සතු නොවන විට පෙර පාලිත සමාගමෙහි රඳවාගත් ඕනෑම පොලියක් සාධාරණ වටිනාකමට මනිනු ලබයි.

#### 2.4.1.5 ආශ්‍රිතයන්

පිටු අංක 300 හි සටහන් අංක 25 යටතේ විස්තර දක්වා ඇත.

#### 2.4.1.6 ඒකාබද්ධ කිරීමේදී ඉවත් කරනු ලැබූ ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අන්තර් සමාගම් ශේෂයන්, ආදායම් හා වියදම් මෙන්ම එවැනි අන්තර් සමාගම් ගනුදෙනුවලින් පැන නගින ලද උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කර ඇත. පිටු අංක 341 හා 342 හි දක්වා ඇති පාලිත සමාගම සමග ගනුදෙනුවලට අදාළ සටහන් අංක 49.3 හා 49.4 වෙත යොමු වන්න.

### 2.4.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂ

විදේශීය ව්‍යවහාර මුදලින් කරනු ලබන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවූ අවස්ථාවේදී පැවති විනිමය අනුපාතික මත වාර්තාකරන/ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි.

ශේෂපත්‍ර දිනට විදේශ ව්‍යවහාර මුදලින් සමන්විත මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනට පවතින මධ්‍යම විනිමය අනුපාතය යොදාගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට යළි පරිවර්තනය කරනු ලබයි. මූල්‍ය අයිතම පියවීම මත හෝ මුලින් වාර්තා කළ අනුපාතයකට වඩා වෙනස් අනුපාත වලට මූල්‍ය අයිතම පරිවර්තනය මත පැන නගින සියලුම විනිමය වෙනස්කම්, එකී වෙනස්කම් පැනනගින කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබෙයි.

ඓතිහාසික පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය නොවන විදේශ මුදලින් ප්‍රකාශිත අයිතම, ආරම්භක ගනුදෙනු සිදු වූ දින පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කරනු ලබේ. විදේශ මුදලින් ප්‍රකාශිත සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දින පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

## 2.5 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති – වත්කම් හා වගකීම් හඳුනාගැනීම

### මූල්‍ය උපකරණ

2018 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" මගින් ශ්‍රී.ල.ගි.ප්‍ර 39 ආදේශ වෙයි. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ අනුමත ප්‍රතිපත්තිමය විකල්පයක් ලෙස ශ්‍රී.ල.ගි.ප්‍ර 39 ප්‍රකාර ඉදිරි ගිවිසුම් ගිණුම්කරණ අඛණ්ඩවම යොදාගැනීමට බැංකුව තීරණය කරන ලදී.

### 2.5.1 මූල්‍ය උපකරණ – මූලික හඳුනාගැනීම්, වර්ගීකරණය සහ පසුව මිනීම

#### 2.5.1.1 හඳුනා ගැනීමේ දිනය

සමූහය විසින් ආරම්භයේදී ණය හා අත්තිකාරම්, තැන්පතු හා යටත්කාලීන වගකීම් යනාදිය ඒවා ඇති වූ දිනට හඳුනාගනු ලැබෙයි. ගනුදෙනුකරුවන්ට ලබාදෙන ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබන්නේ ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට අරමුදල් බැර වූ පසුවය. ගනුදෙනුකරුවන්ගේ අරමුදල් බැංකුවට ලැබූ පසුව තැන්පත්කරුවන්ට ගෙවිය යුතු ශේෂ ලෙස බැංකුව හඳුනාගනී.

අනෙකුත් සියලුම මූල්‍ය උපකරණ (සාමාන්‍ය ක්‍රමයට මිලදී ගැනීම් හා මූල්‍ය වත්කම් විකිණීම ඇතුළත්ව) මූලිකව ගනුදෙනු කරන දිනට එනම්, උපකරණවල ගිවිසුම්ගත ප්‍රතිලාභ සඳහා සමූහය පාර්ශ්වකරුවකු වන දිනට හඳුනා ගැනේ.

#### 2.5.1.2 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මූලික ගණනය කිරීම

මූලික ගණනය කිරීම් සඳහා මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම තීරණය වනුයේ, සටහන් අංක 2.5.1.4.1 සහ 2.5.1.4.2 හි විස්තර කර ඇති පරිදි උපකරණ කළමනාකරණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය සහ ගිවිසුම්ගත කොන්දේසි මතය.

ලාභය හෝ පාඩුව හරහා වාර්තා කළ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වලදී හැරුණුවිට මූල්‍ය උපකරණ මූලික ගණනය කිරීමේදී ඒවායේ සාධාරණ වටිනාකමට (සටහන් අංක 56 හි නිර්වචිත අයුරින්) මනිනු ලබන අතර ඊට වෙළඳ ගනුදෙනු පිරිවැය එකතු කිරීම හෝ අඩු කිරීම සිදු කෙරෙයි. වෙළඳාම් මගින් ලැබීම් ගනුදෙනු මිලට මනිනු ලබයි. මූලික ගණනය කිරීමේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය වෙළඳ ගනුදෙනු මිලෙන් වෙනස් වන අවස්ථාවේදී බැංකුව සහ සමූහය විසින් පහත සඳහන් පරිදි දින 1 ලාභය හෝ අලාභය සඳහා ගිණුම්කරණය කෙරෙයි.

#### 2.5.1.3 "දින 1" ලාභය හෝ අලාභය ("Day 1" Profit or Loss)

නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළහි දත්ත ඇතුළත් විචල්‍යයන් මත වූ ඇගයීමේ ශිල්පක්‍රම පදනම්ව ගණනය කළ සාධාරණ අගය හෝ එකම නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ ගනුදෙනු පදනම් කරගෙන නිර්ණය කළ සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස් වන විට වෙනස සමූහය විසින් වහාම හඳුනාගනී. නිරීක්ෂණය කළ නොහැකි දත්ත උපයෝගී කර ගනිමින් සාධාරණ අගය තීරණය කරනු ලබන අවස්ථාවල දී යෙදවුම් දත්ත නිරීක්ෂණය කළ හැකි වන විට හෝ අයිතමය හඳුනා නොගන්නා විට ගනුදෙනු කරන මිල හා ආකෘතියෙහි අගය අතර වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පමණක් හඳුනාග නු ලබයි. ගනුදෙනුකරන මිලෙහි සහ සාධාරණ අගයෙහි වෙනස ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

පොදු යෝජනා ක්‍රමයක් යටතේ සහනදායී පොළී අනුපාතයට සේවකයන්ට ප්‍රදානය කරන ලද ණය වලින් ජනිත වන දින 1 අලාභය සේවකයන්ගේ ඉදිරියට ඇති සේවා කාලය හෝ ණය කාලසීමාව යන දෙකෙන් අඩු අගයට පොළී ආදායම් හා පුද්ගල වියදම් හි සඵල පොළී අනුපාතය භාවිතයෙන් හඳුනාගනු ලබයි.

#### 2.5.1.4 මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පසුව මිනීම

බැංකුව විසින් පහත කවරාකාරයෙන් හෝ මනින ලදුව වත්කම්වල ගිවිසුම්ගත කාලසීමා කළමනාකරණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය මත පදනම්ව එහි සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරෙයි.

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය
- ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය

සටහන් අංක 2.5.1.6 හි විස්තර කොට ඇති පරිදි බැංකුව හා සමූහය විසින් ව්‍යුත්පන්න සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අගය කරන වෙළඳ කළඹ වර්ගීකරණය කර අගය කරනු ලබයි. බැංකුව විසින් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නියම කරනු ලබන අතුරින් එමගින් අගය කිරීමේ හෝ හඳුනාගැනීමේ අසමානතා සැලකියයුතු ලෙස අඩු කෙරෙයි.

#### 2.5.1.4.1 ව්‍යාපාරික ආකෘති ඇගැයීම

සිය අරමුණු ඉටුකර ගැනීමට මූල්‍ය වත්කම් කළමනාකරණය කරන අයුරු හොඳින්ම පිළිඹිබු වන මට්ටමට බැංකුව සහ සමූහය විසින් එහි ව්‍යාපාරික ආකෘතිය තීරණය කරනු ලබයි.

බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය, උපකරණයෙන් උපකරණය යන පදනම නොව වඩාත් ඉහළ මට්ටමේ කළඹ එකතුව මත ඇගයීමට ලක් වන අතර, පහත සඳහන් නිරීක්ෂණය කළහැකි සාධක මත පදනම් වේ.

- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනය සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම් අගයන අයුරු හා ආයතනයේ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත වාර්තා කරනු ලබන අයුරු.
- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනයට බලපානු ලබන අවදානම් (සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම්) හා විශේෂයෙන්ම එකී අවදානම් කළමනාකරණය කරන අයුරු.
- ව්‍යාපාරයේ කළමනාකරුවන් හානිපූරණය කෙරෙන අයුරු (උදා: වශයෙන් කළමනාකරණය කරනු ලබන වත්කම්වල සාධාරණ වටිනාකම මත නැතහොත් රැස් කරනු ලබන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත හානිපූරණය කෙරේද)
- අපේක්ෂිත වාර ගණන, වටිනාකම හා විකුණුම් සිදු කරනු ලබන කාලසීමාව යනාදිය ද බැංකු මගින් කරනු ලබන ඇගයීමේදී වැදගත් අංගයක් වේ.

ආතති සිදුවීම් හා වියහැකි නරකම සිදුවීම් සැලකිල්ලට නොගෙන පිළිගත හැකි අපේක්ෂිත සිදුවීම් මත පදනම්ව ව්‍යාපාරික ආකෘතිය ඇගයීම සිදුකෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව බැංකුවේ මුල් අපේක්ෂාවට වඩා වෙනස් අයුරින් මුදල් ප්‍රවාහ හඳුනාගනු ලැබේ නම්, එකී ව්‍යාපාරික ආකෘතියෙහි රඳවාගනු ලබන සෙසු මූල්‍ය වත්කම් වල වර්ගීකරණය බැංකුව විසින් වෙනස් නොකරන අතර අලුතින් ජනිත හෝ අලුතින් මිලට ගනු ලැබූ මූල්‍ය වත්කම් අගය කිරීමේදී එකී විස්තර අන්තර්ගත කරනු ලැබේ.

### 2.5.1.4.2 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හුදු මුල් මුදල සහ පොලිය ගෙවීමේ ඇති ඇගැයීම (SPPI Test)

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පරීක්ෂාව වශයෙන් මුල් මුදල හා පොලිය ගෙවීම සම්බන්ධයෙන් පමණක් අදාළ වේදැයි හඳුනාගැනීම පිණිස බැංකුව විසින් මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් අගයනු ලබයි.

මෙම පරීක්ෂාවේදී මුල් මුදල නිර්වචනය කරනු ලබන්නේ මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය ලෙස වන අතර, මූල්‍ය වත්කමෙහි ජීවකාලය තුළ එය වෙනස් වියහැකිය. (උදා: වශයෙන් මුල් මුදල යළි ගෙවීම හෝ අධිමිල/වට්ටම් ක්‍රමක්ෂයවීම් මත) ණයදීමේ ක්‍රියාවලිය තුළ වඩාත් වැදගත් පොළී සම්බන්ධ සාධක වන්නේ ණය අවදානම සහ මුදල්වල කාලීන අගය පිළිබඳ සලකා බැලීමයි. ඉහත කී ඇගයීම සිදුකිරීම පිණිස මූල්‍ය වත්කම පවතින මුදල් වර්ගය සහ පොළී අනුපාතිකය අදාළ වන කාලසීමාව ආදී කරුණු බැංකුව විසින් සලකා බලා විනිශ්චයකට එළඹෙයි.

අවදානමට ඇති අවම නිරාවරණයවීම් හෝ වෙනස්වීම් හඳුන්වාදෙනු ලබන ගිවිසුම්ගත නිරාවරණයවීම් වලට වඩා මූලික ණයදීමේ ක්‍රියාවලියට සම්බන්ධ නොමැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ, හිඟ මුදල් මත පමණක් මුල් මුදල් හා පොළී ගෙවීම් වලට තුඩු නොදෙයි. එවන් අවස්ථාවලදී මූල්‍ය වත්කම් සාධාරණ අගය මත ලාභ අලාභ අනුව ගණනය කළ යුතු වේ.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති විවිධ මූල්‍ය වත්කම් කාණ්ඩ පිළිබඳ විස්තර සඳහා සටහන් අංක 2.5.1.4.3 සිට 2.5.1.4.5 දක්වා යොමු වන්න.

### 2.5.1.4.3 ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නියම නොකෙරේ නම්, මූල්‍ය වත්කම ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබෙයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම් සඳහා වත්කම් රඳවාගැනීම අරමුණ වන ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවාගනු ලැබීම.
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි නිශ්චිත දිනයන්හි ගෙවියයුතු සම්පූර්ණ මුදලෙහි මුල් මුදල හා පොලිය ගෙවීම් පමණක් වන මුදල් ප්‍රවාහ ඇතිකරවීම.
- ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් පහත දැක්වේ.

**(අ) මුදල් හා මුදල්වලට සමානයන්**
මුදල් හා මුදල්වලට සමානයන් පිළිබඳ විස්තර පිටු අංක 281 හි සටහන් අංක 16 හි දැක්වේ.

**(ආ) මහ බැංකුව වෙතැති ශේෂයන්**
මහ බැංකුව වෙතැති ශේෂයන් පිළිබඳ විස්තර පිටු අංක 281 හි සටහන් අංක 17 හි දැක්වේ.

**(ඇ) බැංකුවල ඇති තැන්පතු**
බැංකුවල ඇති තැන්පතු පිළිබඳ විස්තර පිටු අංක 282 හි සටහන් අංක 18 හි දැක්වේ.

**(ඈ) ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම්**
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර පිටු අංක 21 හි සටහන් අංක 286 හි දැක්වේ.

**(ඉ) ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ**
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 292 හි සටහන් අංක 22 හි දැක්වේ.

### 2.5.1.4.4 වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන ණය හා හිමිකම් උපකරණ යනාදිය වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් වලට ඇතුළත්ය.

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් පිළිබඳව පහත සඳහන් සටහන් (අ) සහ (ආ) මගින් දැක්වේ.

**(අ) වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද ණය උපකරණ**

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා වත්කම් රඳවා ගැනීම අරමුණු වන ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවාගනු ලබන්නේ නම් හෝ ගෙවියයුතු මුළු මුදලින් මුල් මුදල හා පොලිය ගෙවීම පමණක් නියෝජනය කරනු ලබන වත්කමක මුදල් ප්‍රවාහ විකිණීම සිදු කරනු ලබන්නේ නම්, වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට ණය උපකරණ ගණනය කරනු ලබයි.

ඉහත විස්තර පිටු අංක 296 සටහන් අංක 23 මගින් දැක්වේ.

**(ආ) වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට නියම කරන ලද හිමිකම් උපකරණ**

මූලික හඳුනාගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද හිමිකම් උපකරණ ලෙස උපාය මාර්ගික හා ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා රඳවාගන්නා හිමිකම් ආයෝජන අතරින් ඇතැම් ඒවා යළි වෙනස් නොකළ හැකි සේ වර්ගීකරණය කිරීමට සමූහය තීරණය කරනු ලබයි. ඉහත විස්තර පිටු අංක 297 සිට 299 දක්වා සටහන් අංක 23 හි දැක්වේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්



### 2.5.1.4.5 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දක්වනු ලබයි.

කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ රැස්කිරීමට හෝ මූල්‍ය වත්කම් විකිණීම සඳහා යන කරුණු හේතුවෙන් රඳවා නොගන්නා බැවින් සාධාරණ අගය යන පදනම මත අගයනු ලබන වෙළඳාම සඳහා රඳවාගන්නා හෝ කළමනාකරණය කරන මූල්‍ය වත්කම් ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මූලිකව හඳුනාගැනීමෙන් නියම කරන ලද මූල්‍ය වත්කම් පහත සාකච්ඡාවට භාජනය කර ඇත.

**(අ) ලාභය/අලාභය මගින් සාධාරණ අගයට නියම කරන ලද මූල්‍ය වත්කම්**
ලාභය/අලාභය මගින් සාධාරණ අගයට නියම කරනු ලබන මූල්‍ය වත්කම්, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ අගයෙහි වෙනස්කම්, "ලාභය/අලාභය හරහා සාධාරණ අගයට නියම කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් මත ශුද්ධ ලැබීම් හෝ අලාභයන්හි" වාර්තා කරනු ලබයි. උපයනු ලබන පොළිය සඵල පොළී අනුපාත උපයෝගී කර ගනිමින් "පොළී ආදායම්" හි උපචිත වන අතර මුදල ලැබීමේ අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම "වෙනත් මෙහෙයුම් ආදායම්හි" වාර්තා කෙරෙයි.

කාලපරිච්ඡේදය අවසානයේදී ලාභය/අලාභය මගින් සාධාරණ අගයට ගණනය කිරීමේදී මූලිකව හඳුනාගනු ලබන නියම කරන ලද මූල්‍ය වත්කම් සමූහය සතුව නැත.

### 2.5.1.5 මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ පසුව මිනීම

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ප්‍රකාර මූල්‍ය ඇප සහ ණය බැඳීම් හැරුණු විට අනෙක් මූල්‍ය වගකීම්, සමූහය විසින් පහත කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කෙරෙයි.

- ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වගකීම්
  - වෙළඳාම සඳහා රඳවාගත්
  - ලාභ/අලාභ මගින් සාධාරණ අගයට නම් කළ
- ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම්හි පසුකාලීන මිණුම් ඒවායෙහි වර්ගීකරණය මත පදනම් වේ. මූල්‍ය වර්ගීකරණයෙහිලා පැවති ශ්‍රී ල.ගි.ප්‍ර. 39 නිර්නායක බොහොමයක් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ ද පවතී.

### 2.5.1.5.1 ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම්

වාර්තාකරන කාලය අවසානයේදී ලාභ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ කිසිම මූල්‍ය වගකීමක් සමූහය සතුව නැත.

### 2.5.1.5.2 ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කළ මූල්‍ය වගකීම්

සමූහය විසින් එළඹ ඇති ගිවිසුම්වලට අනුව, දරා සිටින්නාට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් භාරදීමට බැඳියාවක් පවතින විට හෝ බැඳියාවක් පියවීම සඳහා නිශ්චිත හිමිකම් කොටස් සංඛ්‍යාවක් නිශ්චිත මුදලකට හෝ නිශ්චිත වෙනත් මූල්‍ය වත්කම් අගයකට හුවමාරු වන අවස්ථාවක් හැරුණුවිට, සමූහය විසින් නිකුත් කරන ලද ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් නොකළ මූල්‍ය වගකීම්, "බැංකු වලට ගෙවියයුතු", "වෙනත් තැන්පත්කරුවන්ට ගෙවිය යුතු", "ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු" හෝ "නිකුත් කළ ණය සුරැකුම්පත්" මෙම වර්ගීකරණයට අයත්ය.

උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි ප්‍රකාර සමූහය විසින් ප්‍රධාන උපකරණ මූල්‍ය වගකීම් හෝ හිමිකම් උපකරණ ලෙස වර්ගීකරණය කෙරෙයි.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් එම මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. අත්පත් කර ගැනීමට අදාළ වට්ටම් හෝ අධි මිල සහ සඵල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන ගාස්තු හා පිරිවැය ද සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂයවීම් ආදායම් ප්‍රකාශයෙහි "පොළී වියදම්" යටතේ හඳුනා ගනී. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා ගැනීම අත්හරින විට ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

**(අ) බැංකු වලට ගෙවිය යුතු**
බැංකු වලට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 315 හි සටහන් අංක 32 මගින් දැක්වේ.

**(ආ) තැන්පත්කරුවන්ට ගෙවිය යුතු**
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 317 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

**(ඇ) ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු**
ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 316 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

**(ඈ) වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු**
වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 317 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

**(ඉ) නිකුත් කළ ණය සුරැකුම්පත්**
නිකුත් කළ ණය සුරැකුම්පත් පිළිබඳ විස්තර පිටු අංක 319 සිට 321 දක්වා සටහන් අංක 37 මගින් දැක්වේ.

### 2.5.1.6 ව්‍යුත්පන්න වත්කම් සහ වගකීම්

ව්‍යුත්පන්න වූ කලී පහත සඳහන් ගුණාංග තුනෙන්ම සමන්විත මූල්‍ය උපකරණයක් හෝ වෙනත් ගිවිසුමකි.

1. මූල්‍ය නොවන විචල්‍ය අතින් ගිවිසුමෙහි පාර්ශ්වයකට එය සීමා නොවේ නම්, නිශ්චිත පොළී අනුපාත, මූල්‍ය උපකරණ මිල, වෙළෙඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාත, මිල හෝ අනුපාත දර්ශක, ණය ශ්‍රේණිගත කිරීම් හෝ ණය දර්ශක හෝ වෙනත් විචල්‍ය වල වෙනස්කම්වලට ප්‍රතිචාර ලෙස එහි අගය වෙනස් වෙයි.
2. ඊට මූලික ශුද්ධ ආයෝජන හෝ වෙළෙඳපළ සාධක වල වෙනස්වීම් වලට සමාන ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂිත වෙනත් ගිවිසුම් වර්ගවලට අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු මූලික ශුද්ධ ආයෝජන අවශ්‍ය නොවේ.
3. එය ඉදිරි දිනයකදී පියවනු ලැබේ.

බැංකුව විවිධ පාර්ශ්ව සමග ව්‍යුත්පන්න ගනුදෙනුවලට එළඹෙයි. පොළී අනුපාත හුවමාරු, ණය පැහැර හැරීම් හුවමාරු, විවිධ විනිමය හුවමාරු, ඉදිරි විදේශ හුවමාරු ගිවිසුම් සහ විදේශ ව්‍යවහාර මුදල් ඊට ඇතුළත්ය. ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කරන අතර එම අගය ධන වන විට වත්කම් ලෙස සලකන අතර, සාධාරණ අගය ඍණ වන විට වගකීම් ගණයෙහිලා සැලකෙයි. එවන් ව්‍යුත්පන්නවල සාධාරණ අගය සහ නාමික අගය සටහන් අංක 19 හි වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත. ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය අදාළ කර නොගන්නේ නම් ව්‍යුත්පන්න වල සාධාරණ අගයෙහි වෙනස්වීම්, ශුද්ධ වෙළෙඳ ආදායම් හි ඇතුළත් කෙරෙයි.

### 2.5.1.6.1 ලාභ/අලාභ මගින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්න

ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් සාධාරණ අගයට වාර්තා කරනු ලැබෙයි. ව්‍යුත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම් ආදායම් ප්‍රකාශයෙහි "වෙළඳාමෙන් ලද ශුද්ධ ලාභ/(අලාභ)" යටතේ ඇතුළත් වෙයි.

### 2.5.1.6.2 අවදානම් කළමනාකරණ අරමුණු සහ ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය සඳහා රඳවාගන්නා ව්‍යුත්පන්න

වෙළෙඳ වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය නොකළ සියලු ව්‍යුත්පන්න වත්කම් හා වගකීම්, අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ගන්නා ව්‍යුත්පන්න වලට අයත් වේ. අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ගන්නා ව්‍යුත්පන්න මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට මනිනු ලබයි.

### 2.5.1.7 මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව මූල්‍ය වත්කම් ඒවායේ මූලික හඳුනාගැනීමෙන් අනතුරුව අත්පත් කර ගැනීම, ඉවතලීම හෝ ව්‍යාපාරික ක්‍රියාදාමයක් නැවතීම යනාදිය ඇතුළත්ව එවන් මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාරික ආකෘතියක අරමුණ සමූහය විසින් වෙනස් කරනු ලබන දුර්ලභ අවස්ථාවලදී පමණක් හැර ඒවායේ මූලික හඳුනාගැනීමට පසුව නැවත වර්ගීකරණය නොකෙරෙයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ප්‍රකාර නැවත වර්ගීකරණය කිරීම්වලට අවසර නොමැති හෙයින් මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකෙරෙයි.

### 2.5.1.7.1 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය හා මිනීම

#### 2.5.1.7.1.1 ලාභ/අලාභ මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණ

- **වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගය**
  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව දළ ධාරණ අගය බවට පත් වෙයි. නව දළ ධාරණ අගය මත පදනම්ව සඵල පොළී අනුපාතිකය ගණනය කෙරෙයි. සාධාරණ අගයෙහි පසුකාලීන වෙනස්කම් වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලැබෙයි.
- **ක්‍රමක්ෂය පිරිවැය**
  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව ධාරණ අගය බවට පත් වෙයි. නව දළ ධාරණ අගය මත පදනම්ව සඵල පොළී අනුපාතිකය ගණනය කෙරෙයි.

#### 2.5.1.7.1.2 වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය

- **ලාභ/අලාභ මගින් සාධාරණ අගය**
  වෙනත් විස්තීර්ණ ආදායම්හි සමුච්චිත ශේෂය, නැවත වර්ගීකරණ දිනට ලාභයට/අලාභයට නැවත වර්ගීකරණය කෙරෙයි.
- **ක්‍රමක්ෂය පිරිවැය**
  මූල්‍ය වත්කම්, සාධාරණ අගයට නැවත වර්ගීකරණ කරයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි සමුච්චිත ශේෂය, ඉවත් කර නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගයට ගැලපීම් කරයි. ගලපන ලද අගය, ක්‍රමක්ෂය පිරිවැය බවට පත් වෙයි.

මූලික හඳුනාගැනීමේදී තීරණය කරන ලද සඵල පොළී අනුපාතිකය හා දළ ධාරණ අගය, නැවත වර්ගීකරණ ප්‍රතිඵල ලෙස ගලපනු නොලබයි.

#### 2.5.1.7.1.3 ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය

- **වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගය**
  වත්කම සාධාරණ අගයට යළි මනිනු ලබන අතර වෙනස වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමේදී තීරණය කරනු ලබන සඵල පොළී අනුපාතික, නැවත වර්ගීකරණයෙහි ප්‍රතිඵල ලෙස ගලපනු නොලබයි.
- **ලාභ/අලාභ මගින් සාධාරණ අගය**
  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව ධාරණ අගය බවට පත් වෙයි. ක්‍රමක්ෂය පිරිවැය සහ ධාරණ අගය අතර වෙනස ලාභ සහ අලාභ ලෙස හඳුනාගනු ලැබෙයි.

වාර්තා කරනු ලබන කාලසීමාව සඳහා බැංකුව හා සමූහය විසින් කිසිදු මූල්‍යමය උපකරණ නැවත වර්ගීකරණය කිරීමක් සිදු නොවිණි.

### 2.5.1.8 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම

#### 2.5.1.8.1 මූල්‍ය වත්කම්

වත්කම මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය ඉකුත්වී ඇති විට හෝ වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ වත්කමෙහි සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැලකියයුතු මට්ටමකට වෙනත් පාර්ශ්වයකට පවරා හෝ සමූහය විසින් වත්කමට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකියයුතු මට්ටමකට රඳවාගෙන පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට, සමූහය විසින් මූල්‍ය වත්කමක් (හෝ අදාළ අවස්ථාවලදී මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගනු නොලබයි.

මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම තුළ වත්කමක ධාරණ අගය (වත්කමක හඳුනා ගනු නොලබන කොටසට වෙන් කරන ලද ධාරණ අගය) සහ ලද මුදල්වල (ලද නව වත්කම් අඩු කිරීම නව වගකීම් ඇතුළත්ව) වෙනස සහ වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනා ගන්නා ලද සමුච්චිත ලැබීම්/අලාභ, ලාභයට/අලාභයට හඳුනාගනු ලබයි.

කෙසේ වුවද ධාරණ අගයට වෙනස් විස්තීරණ ආදායම් හි නියම කරන ලද හිමිකම් ආයෝජන සුරැකුම් සම්බන්ධයෙන් වෙනත් විස්තීරණ ආදායම් හි හඳුනාගනු ලබන සමුච්චිත ලැබීම්/අලාභ, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 අනුව එවන් සුරැකුම් හඳුනා ගැනීම මත ලාභයට/අලාභයට හඳුනාගනු නොලබයි. සමූහය විසින් ජනිත/රඳවාගනු ලැබූ මාරු කරන ලද මූල්‍ය වත්කම්වල පොළිය හඳුනාගනු නොලැබීමට හසු වන අතර වෙනත් වත්කමක්/වගකීමක් ලෙස හඳුනාගනු ලැබෙයි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ වත්කම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වත්කම් පවරනු ලබන ගනුදෙනුවලට සමූහය ඇතුළත් වන නමුත් මාරු කරන ලද වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල හෝ සැලකිය යුතු ප්‍රමාණයක් හෝ කොටසක් රඳවා ගනු ලබයි.

වත්කම මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශ්වයකට ගෙවීමට බැඳීමක් ඇති කරගත් විට සමූහය විසින් වත්කම් වලට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකිය යුතු මට්ටමකට රඳවාගෙන හෝ පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට වත්කමෙහි කටයුතු සම්බන්ධයෙන් සමූහයේ සහභාගීත්වයේ ප්‍රමාණය අනුව අදාළ වත්කම හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී සමූහය විසින් ආශ්‍රිත වගකීමක් ද හඳුනාගනු ලබයි. සමූහය විසින් රඳවාගනු ලැබූ අයිතීන් හා වගකීම් පිළිබිඹු වන ආකාරයට පවරන ලද වත්කම් හා ආශ්‍රිත වගකීම් මනිනු ලබයි.

#### 2.5.1.8.2 මූල්‍ය වගකීම්

වගකීම් යටතට ගැනෙන ගිවිසුම්ගත බැඳියාව ඉකුත් වී හෝ අවලංගු වී හෝ නිදහස් කර ඇති විට මූල්‍ය වගකීම හඳුනාගැනීම සමූහය විසින් අත් හරිනු ලබයි.

### 2.5.1.9 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් නවීකරණය

#### 2.5.1.9.1 මූල්‍ය වත්කම් නවීකරණය

මූල්‍ය වත්කම් පිළිබඳ කොන්දේසි නවීකරණය කෙරෙයි නම්, නවීකරණය කරන ලද වත්කම්වල මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේදැයි සමූහය ඇගයීමට ලක් කරයි. මුදල් ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම්, මුල් මූල්‍ය වත්කමෙහි සිට මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වී ඇති බවට සැලකෙයි. මෙහිදී හඳුනාගත් මුල් මූල්‍ය වත්කම් ඉවත් කර නව මූල්‍ය වත්කමක් සාධාරණ අගයට හඳුනාගනු ලබයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව, ක්‍රමක්ෂය පිරිවැයට පවතින නවීකරණය වූ වත්කම්වල මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් නොවේ නම්, එකී නවීකරණය, හඳුනාගත් මූල්‍ය වත්කම් ඉවත් කිරීමකට තුඩු නොදෙයි. මේ අවස්ථාවේදී මූල්‍ය වත්කම් දළ ධාරණ අගයට, සමූහය විසින් නැවත ගණනය කර එම දළ ධාරණ අගය ගැලපීම තුළින් ඇති වන ලාභය/අලාභය නවීකරණ ලාභය/අලාභය ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී. ණයකරුගේ මූල්‍ය අපහසුතා හේතුවෙන් එවන් නවීකරණය කිරීමක් සිදුවන්නේ නම්, අදාළ ලාභය/අලාභය හානිකරණ පාඩු සමගින් ඉදිරිපත් කෙරෙයි. අනෙක් අවස්ථාවන්හිදී එය පොළී ආදායමක් ලෙස ඉදිරිපත් කෙරෙයි.

#### 2.5.1.9.2 මූල්‍ය වගකීම් නවීකරණය

පවතින මූල්‍ය වගකීමක් එකී ණයකරුගේම වෙනත් මූල්‍ය වගකීමකින් ආදේශ වන විට, පවත්නා කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම් සහ පවතින වගකීමක කොන්දේසි සැලකියයුතු ලෙස නවීකරණය වන්නේ නම්, එවන් හුවමාරු කිරීමක්/නවීකරණය කිරීමක් මුල් වගකීමෙහි ඉවත් කිරීමක් සිදුවන අතර එය නව වගකීමක් ලෙස හඳුනා ගැනෙයි. මෙහිදී නවීකරණය වූ කොන්දේසි මත පදනම් වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයට හඳුනාගනු ලබයි. ඉවත් වූ මූල්‍ය වගකීමෙහි සහ නවීකරණය වූ කොන්දේසි සහිත නව මූල්‍ය වගකීමෙහි ධාරණ අගයෙහි වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලබයි.

### 2.5.1.10 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගනු ලැබූ අගයන් හිලව් කිරීමට දැනට ක්‍රියාත්මක කළහැකි නීතිමය අයිතියක් වේ නම් පමණක් සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම් උපලබ්ධි වීමට හෝ වගකීම් පියවීමට අරමුණක් වේ නම්, මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරෙයි. බැංකුව හා සමූහය විසින් වාර්තා කරනු ලබන කාලසීමාව තුළ කිසිදු මූල්‍ය උපකරණ හිලව් කිරීමක් සිදු නොකෙරිණි.

### 2.5.1.11 ක්‍රමක්ෂය පිරිවැය සහ දළ ධාරණ අගය

මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේ පිරිවැයෙන් මුල් ආපසු ගෙවීම් අඩුකර, මූලික අගය හා කල් පිරුණු අගය අතර වෙනස සඵල පොළී අනුපාත ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් ගණනය කළ සමුච්චිත ක්‍රමක්ෂය එකතුකර හෝ අඩුකර මනිනු ලබන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල අගයයි. මූල්‍ය වත්කම්වලට අපේක්ෂිත ණය පාඩු දීමනා ද ගලපනු ලබයි.

මූල්‍ය වත්කමක දළ ධාරණ අගය වූ කලී, කිසියම් අපේක්ෂිත ණය පාඩු දීමනාවක් සඳහා ගැලපීමට ප්‍රථම මූල්‍ය වත්කමක ක්‍රමක්ෂය පිරිවැයයි.

### 2.5.1.12 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සාධාරණ අගයෙහි ධුරාවලිය ඇතුළත්ව මූල්‍ය උපකරණවල සාධාරණ අගය මිනීම පිළිබඳ අංක 253 හා 383 යන පිටුවල සටහන් අංක 2.3 හි හා 56 හි දක්වා ඇත.

## 2.5.2 මූල්‍ය වත්කම් හානිකරණය

### 2.5.2.1 අපේක්ෂිත ණය පාඩු පිළිබඳ දළ විශ්ලේෂණය

2018 ජනවාරි 01 දින සිට ලාභ/අලාභ මගින් සාධාරණ අගයට රඳවා නොගත් වෙනත් මූල්‍ය වත්කම් හා සියලුම ණය සඳහා අපේක්ෂිත ණය පාඩු දීමනා මෙම කොටසෙහි "මූල්‍ය උපකරණ" ලෙස දක්වා ඇති ණය බැඳීම් සහ මූල්‍ය ඇපකර ගිවිසුම් සමගින් බැංකුව විසින් වාර්තා කරනු ලැබ ඇත. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ හිමිකම් උපකරණ හානිකරණයට ලක් නොවේ.

ආරම්භයේ පටන් සැලකියයුතු ණය අවදානම් වර්ධනයක් නොමැති විටකදී හැර ණය පාඩු දීමනාව මාස 12 කට අපේක්ෂිත ණය පාඩු ලෙස ගණනය වෙයි. එසේ නොමැති වූ විට වත්කමක ජීවකාලය තුළ පැන නැගීමට ඉඩ ඇති ණය පාඩු මත පදනම්ව අපේක්ෂිත ණය පාඩු දීමනාව තීරණය වෙයි. ණය අවදානමෙහි සැලකියුතු වර්ධනයක් සිදුවී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වූ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ පිටු අංක 260 හි සටහන් අංක 2.5.2.7 හි දක්වා ඇත.

මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යනු වාර්තාකරනු ලබන දිනෙන් මාස 12 ක් තුළ මූල්‍ය උපකරණ මත පැහැර හැරීමේ සිදුවීම් මගින් අපේක්ෂිත ණය පාඩු මගින් නියෝජනය කරනු ලබන ජීවකාල අපේක්ෂිත ණය පාඩුවල කොටසකි. සලකනු ලබන මූල්‍ය උපකරණ කළඹේ ස්වභාවය මත පදනම්ව ජීවකාල අපේක්ෂිත ණය පාඩු සහ මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යන ද්විත්වයටම කේවල පදනම මත හෝ සාමූහික පදනම මත ගණනය කෙරෙයි.

මූල්‍ය උපකරණවල අවශේෂ ජීවකාලය පුරාවට ණය පැහැර හැරීම් සිදුවීමේ අවදානම වෙනස්වීම සලකා බලමින් බැංකුව විසින් සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම යම් මූල්‍ය උපකරණයකට ණය අවදානම මූලික හඳුනාගැනීමේ පටන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිදැයි ඇගයීමක් කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

එබඳු ක්‍රියාවලි මත පදනම්ව බැංකුව විසින් 1 අදියර, 2 අදියර, 3 අදියර ලෙස ණය කාණ්ඩ ගත කරනු ලබයි.

**1 වන අදියර**

- ණය පළමුව හඳුනාගනු ලැබූ විට බැංකුව විසින් මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු මත පදනම් වූ දීමනාවක් හඳුනාගනු ලබයි. ණය අවදානම යහපත් වී ඇති විට සහ 2 වන අදියරෙන් ණය නැවත වර්ගීකරණය කර එම පහසුකම් 1 වන අදියරේ ණය වලට ඇතුළත් කරයි.

**2 වන අදියර**

- ආරම්භයේ පටන් ණය අවදානමෙහි සැලකිය යුතු වර්ධනයක් පෙන්වනු ලබන විට බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. ණය අවදානම යහපත් වී 3 වන අදියරෙන් නැවත වර්ගීකරණය කර ණය පහසුකම් ද 2 වන අදියරේ ණය යටතට අයත් වේ.

- ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම් සිදු කළයුතු කාලසීමාව දින 30 ඉක්මවන අවස්ථාවලදී පහත 3 අදියර යටතේ වර්ගීකරණය කර ඇති ණය පහසුකම්වලදී හැර ශ්‍රී ල.මූ.වා.ප්‍ර. 9 හි ප්‍රකාශිත උපකල්පනයට යටත්ව ණය පහසුකම් ලබාදෙයි.

**3 වන අදියර**

- ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම් සිදු කළයුතු කාලසීමාව දින 90 ඉක්මවන අවස්ථාවලදී ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 හි ප්‍රකාශිත උපකල්පනවලට යටත් ණය පහසුකම්
- දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළු ණය
- සියලුම නැවත සැලසුම් කළ ණය
- ශ්‍රී ලංකා මහ බැංකු නියාමන ප්‍රකාර අක්‍රීය ලෙස වර්ගීකරණය කරන ලද සියලු ණය පහසුකම්/ගනුදෙනුකරුවන්
- ගනුදෙනුකරුවකුගේ හෝ උපකරණයක අවදානම් ශ්‍රේණිගත කිරීම, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් මගින් B+ දක්වා පහත දැමූ අවස්ථාවලදී සහ/හෝ බැංකුවල අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය මාපාංක 2 කින් පහත දැමූ අවස්ථාවලදී
- ණය පහසුකම්/ගනුදෙනුකාර ණය අවදානම් කැපී පෙනෙන ලෙස වර්ධනය (සටහන් අංක 2.5.2.7 වෙත යොමු වන්න)
- මූල්‍ය වත්කම්, උදෙසා මුළු හිඟ මුදල හෝ ඉන් කොටසක් හෝ යළි අයකර ගැනීමට බැංකුව සතු සාධාරණ අපේක්ෂාවන් නොපවතින විටදී මූල්‍ය වත්කම් හි දළ ධාරණ අගය අඩු කෙරෙයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනාගැනීම අත්හැරීමක් යැයි සැලකේ.

### 2.5.2.2 අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම

සඵල පොළී අනුපාතිකයට ආසන්න වට්ටම් අගයක් යොදාගෙන අපේක්ෂිත මුදල් හිඟය මිනීමට බැංකුව විසින් අපේක්ෂිත ණය පාඩු ගණනය කරනු ලබයි. මුදල් හිඟය යනු ගිවිසුම් අනුව ආයතනයකට ගෙවිය යුතු මුදල් ප්‍රවාහ හා ගිවිසුම ප්‍රකාර යම් ආයතනයක් විසින් ලබා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර පරතරයයි.

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත සඳහන් පරිදි සැකෙවින් දක්වා ඇති අතර ප්‍රධාන සාධක පහත පරිදි වේ.

- **පැහැර හැරීමේ සම්භාවිතාවය** (PD)
  මෙය වූ කලී යම් කාලසීමාවක් තුළ ණය ගෙවීම පැහැර හැරීමේ හැකියාව පිළිබඳ ඇස්තමේන්තුවයි. යම් ණය පහසුකමක් මීට පෙර හඳුනාගෙන නොතිබිණි නම් සහ තවමත් කළඹට අයත් නම්, ඇගයීමට බඳුන් වූ කාල පරිච්ඡේදය තුළ නිශ්චිත කාලසීමාවකදී පමණක් පැහැර හැරීම සිදුවිය හැකිය.
- **පැහැර හැරීමට නිරාවරණයවීම** (EAD)
  මෙය වූ කලී ගිවිසුම් මත හෝ වෙනත් හේතූන් මත මුල් මුදල සහ පොලිය ආපසු ගෙවීමද අතපසු වූ ගෙවීම්වල සමුච්චිත පොළිය ද ඇතුළුව වාර්තා කළ දිනට පසුව නිරාවරණයවීම්හි අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ඉදිරි පැහැර හැරීම් දිනකදී නිරාවරණය වීමේ තක්සේරුවයි.
- **පැහැර හැරීමකදී සිදුවියහැකි පාඩුව** (LGD)
  මෙය වූ කලී යම් අවස්ථාවකදී පැහැර හැරීමක් සිදුවූ විටක උද්ගත වන පාඩුව ඇස්තමේන්තු කිරීමයි. කිසියම් පාර්ශ්වයක් ඇප සුරැකුම් උපලබ්ධිවීම් ද ඇතුළුව ණය හිමියන් විසින් ලබා ගැනීමට අපේක්ෂිත සහ ලබාගැනීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමට නිරාවරණය වීමෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබයි.

  ඊට ප්‍රථම කාලසීමාවක් තුළ ඇරයුම් කිරීමට බැංකුව සතුව නීතිමය අයිතියක් වේ නම් හැර ණය පාඩු තීරණය කරනු ලබන උපරිම කාලසීමාව, මූල්‍ය උපකරණයකට ගිවිසුම්ගත ජීව කාලයයි.

  හානිකරණ පාඩු සහ මුදාහැරීම්, මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයෙහි ගැලපීමක් ලෙස ගණනය කරනු ලබන අතර නවීකරණය මගින් ජනිත වූ අලාභ/ලැබීම් වලින් වෙන්කර හෙළිදරව් කරනු ලබයි.

  අපේක්ෂිත ණය පාඩු ක්‍රමවේද යාන්ත්‍රණ පහත සැකෙවින් දක්වා ඇත.

**1 වන අදියර**

වාර්තා කරනු ලබන දිනෙන් පසුව එළඹෙන මාස 12 ක කාලසීමා තුළ පැවතිය හැකි මූල්‍ය උපකරණ මත ආපසු ගෙවීම් පැහැර හැරීම්වල ප්‍රතිඵල ලෙස ඇති වියහැකි අපේක්ෂිත ණය පාඩු, ජීව කාලය පුරා අපේක්ෂිත ණය පාඩුවල කොටසක් ලෙස මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු ගණනය කෙරෙයි. වාර්තා කරන දිනට පසුව එළඹෙන මාස 12 තුළ අපේක්ෂිත, පැහැර හැරීමේ සම්භාවිතාව පදනම් කරගෙන මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු ගණනය කරයි. එම අපේක්ෂිත මාස 12 ක් තුළ පැහැර හැරීමේ අවදානම් පැහැර හැරීම් නිරාවරණ පුරෝකථනයට යොදා ගනිමින් අපේක්ෂිත පැහැර හැරීම් නිසා ඇති වන අලාභය ගුණිත කර මුල් සඵල පොළී අනුපාතිකයට ආදේශකයක් ලෙස යොදා ගනු ලැබෙයි.

**2 වන අදියර**

ආරම්භයේ පටන් ණය අවදානමෙහි කැපී පෙනෙන වර්ධනයක් ණය මගින් පෙන්නුම් කර ඇති විට බැංකුව විසින් ජීව කාල අපේක්ෂිත ණය පාඩු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරයි. එහිදී අදාළ කරගනු ලබන යාන්ත්‍රණය ඉහත විස්තර කර ඇති කරුණු වලට සමාන වන නමුත් උපකරණයෙහි ජීව කාලය අරභයා පැහැර හැරීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම මත අලාභ තක්සේරු කෙරෙයි. මුල් සඵල පොළී අනුපාතිකය ආසන්න වශයෙන් සැලකීමෙන් අපේක්ෂිත හිඟ මුදල් වට්ටම් කෙරෙයි.

**3 වන අදියර**

හානිකරණය වී ඇතැයි සැලකෙන ණය සඳහා බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු හඳුනාගනු ලබයි. මෙම ක්‍රමවේදයේ, ණය පැහැර හැරීමේ සම්භාවිතාව 100% ලෙස සලකන අතර අනෙකුත් දෑ අදියර 2 වත්කම් සඳහා වූ ක්‍රමවේදයට සමාන වේ.

### 2.5.2.3 හානිකරණයෙහි කේවල තක්සේරුව

පෙර තීරණය කරන ලද සීමාවකට (වෙන් වෙන් වශයෙන් ගත්විට වැදගත් වන මූල්‍ය වත්කම්) වඩා ඉහළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි පවතී නම්, වත්කමෙහි ධාරණ අගය සහ අනාගත මුදල් ප්‍රවාහ (අනාගත අපේක්ෂිත ණය පාඩු ඉවත් කළ විට) වල තක්සේරුගත වත්මන් අගය අතර වෙනස, අලාභ අගය ලෙස මනිනු ලබයි.

සුරැකුම් ලෙස තබා ඇති මූල්‍ය වත්කම්වල තක්සේරුගත ඉදිරි මුදල් ප්‍රවාහවල වත්මන් අගය ගණනය කිරීම මගින් පූර්වාවරණය කිරීම හෝ නොකිරීම කෙසේ වුවද වත්කම අත්පත් කර ගැනීම හා විකිණීම සඳහා වන පිරිවැය අඩුකර පූර්වාවරණය කිරීමේ ප්‍රතිඵල ලෙස ඇති වන මුදල් ප්‍රවාහ පිළිඹිබු වේ. පිටු අංක 289 හි ඇති සටහන් අංක 21 (ඇ) මගින් කේවල හානිකරණ තක්සේරුව පිළිබඳ විස්තර දැක්වේ.

### 2.5.2.4 වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු තක්සේරුවක් ඇති නමුත් වෙන් වෙන්ව හානිකරණය නොවූ ණය

හානිකරණය නොවූ නමුත් වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු ණය ආරම්භයේ පටන් සැලකිය යුතු ණය ක්ෂයවීම් තිබී ඇත්දැයි යන නිර්ණායක මත පදනම්ව 1 වන හෝ 2 වන අදියර යටතේ හානිකරණය සඳහා සාමූහිකව අගයනු ලබයි.

බැංකුවේ සැලකියයුතු ණය අපහායනයන් සනිටුහන් කර ගැනීමේදී පහත නිර්ණායක සලකා බලනු ලබයි.

- දැනට පවතින මූල්‍ය උපකරණවල නවක ආරම්භයේදී දැනට පවතින කොන්දේසි හෝ අනුපාතිකවල මූලාරම්භයට වඩා ඇති සැලකිය යුතු වෙනස්කම්
- විශේෂිත මූල්‍ය උපකරණ හෝ සමාන මූල්‍ය උපකරණවල ණය අවදානම පිළිබඳ බාහිර වෙළඳපොළ දර්ශකවල සැලකියයුතු වෙනස්කම්
- ණයකරුවෙකුගේ ණය/හිමිකම් කොටස් උපකරණවල අගයෙහි වෙනස්කම් ආදී ණයකරුට සම්බන්ධ වෙනත් තොරතුරු
- ණයකරු සඳහා සත්‍ය/අපේක්ෂිත අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම හෝ අභ්‍යන්තර වශයෙන් ණය අවදානම ඇගයීමට යොදා ගනු ලබන චර්යාත්මක ලකුණුවල පහත වැටීම.
- ණයකරුවෙකුට සිය බැඳියාවන් පියවීමට ඇති හැකියාවට සැලකිය යුතු බලපෑම් සිදු කරන දැනට පවතින හෝ ඉදිරියට පුරෝකථනය කළ අහිතකර ව්‍යාපාරික වෙනස්වීම්, මූල්‍ය හෝ ආර්ථික තත්ත්වයන්.
- ආදායමෙහි තත්‍ය හෝ අපේක්ෂිත අඩුවීම, මෙහෙයුම් අවදානම ඉහළයාම, කාරක ප්‍රාග්ධන හිඟය, වත්කමෙහි ගුණාත්මක බව අඩුවීම, තෝලනය ඉහළ යාම, ද්‍රවශීල කළමනාකාරීත්වයට අදාළ ගැටළු නිසා ණයකරුගේ මෙහෙයුම් ප්‍රතිඵල වල සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු වෙනස්වීම්
- එකම ණයකරුගේ වෙනත් මූල්‍ය උපකරණ මත ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වීම.
- ණය බැඳීම්වලට මුහුණදීමට ණයකරුවෙකු සතු හැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීම්වලට තුඩු දෙන ණයකරුගේ නියාමන, ආර්ථික හෝ තාක්ෂණික පරිසරයෙහි සිදුවන සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු අහිතකර වෙනස්වීම්.

### 2.5.2.5 වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම්වල ධාරණ අගයට අඩු නොකෙරෙයි. ඒ වෙනුවට ක්‍රමක්ෂය පිරිවැයට වත්කම් අගය කිරීමෙන් ඇති වන වෙන් කිරීමට සමාන අගයක් සමුච්චිත හානිකරණ අගයක් ලෙස වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලබන අතර අදාළ අනෙක් සටහන ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් සමුච්චිත පාඩු වත්කම ඉවත් කිරීමේදී නැවත ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි. වාර්තාකරණ කාලසීමාව තුළ හානිකරණයට භාජනය වූ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමට මනින ලද ණය උපකරණ කිසිවක් බැංකුව හා සමූහය සතු නොවිණි.

### 2.5.2.6 ප්‍රක්ෂේපිත තොරතුරු

අපේක්ෂිත ණය පාඩු ආකෘතියේ දී බැංකුව විසින් ආර්ථික සාධක ලෙස පහත සඳහන් ආකාරයේ පුළුල් පරාසයක ප්‍රක්ෂේපිත තොරතුරු මත රඳා පවතී.

- දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය
- විරැකියා අනුපාත
- උද්ධමනය අනුපාත
- විනිමය හුවමාරු අනුපාතික
- පොළී අනුපාත

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන යෙදවුම් සහ ආකෘති සෑම විටකම මූල්‍ය ප්‍රකාශනයෙහි දිනට වෙළඳපළ හැසිරෙන ආකාරය මුළුමනින්ම ග්‍රහණය කරගනු නොලැබිය. මෙය පිළිඹිබු කිරීම සඳහා එවන් සැලකිය යුතු වෙනස්වීම් පවතින අවස්ථාවලදී තාවකාලික ගැලපුම් ලෙස ගුණාත්මක ගැලපුම් සිදුකරයි.

### 2.5.2.7 ණය අවදානය සැලකියයුතු ලෙස වර්ධනය වීම

යම් උපකරණයක් හා උපකරණ කළඹක් මාස 12 අපේක්ෂිත ණය පාඩු හෝ ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා බඳුන්වී දැයි තීරණය කරගනු පිණිස අපේක්ෂිත ණය පාඩු යටතට ගැනෙන සියලු වත්කම් බැංකුව විසින් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමේ පටන් ණය අවදානමෙහි සැලකියයුතු වර්ධනයක් සිදු වී ඇත්දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. අනවශ්‍ය පිරිවැයක් හෝ පරිශ්‍රමයක් රහිතව උපයෝජ්‍ය හා අදාළ වන සහය වන පිළිගත හැකි තොරතුරු බැංකුව විසින් සලකා බලනු ලැබෙයි. බැංකුවේ ඓතිහාසික කරුණු හා ප්‍රක්ෂේපිත තොරතුරු ඇතුළුව විශේෂඥ ණය තක්සේරු මත පදනම් වූ ප්‍රමාණාත්මක හා ගුණාත්මක විස්තර විශ්ලේෂණ මීට ඇතුළත්ය. ඒ අනුව, පහත සඳහන් නිර්ණායක වලින් එකක් හෝ සපුරාලන ලද විට ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති බව බැංකුව විසින් සලකනු ලබයි.

- ගෙවිය යුතු ගිවිසුම්ගත ගෙවීම් දින 30 ඉක්මවීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ නගී)
- අඛණ්ඩව දෙවසරක් තුළ පෙර වර්ෂය සමග සන්සන්දනය කිරීමේදී ණය ගනු ලබන ආයතනයේ බදු පෙර ලාභයෙන්/පිරිවැටුමෙන් 50% ක අඩුවීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- පෙර මූල්‍ය වර්ෂය හා සසඳන විට ණය ගනු ලබන ආයතනයේ ශුද්ධ වටිනාකම 25% කින් පමණ බාදනය වීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- ණය ගනු ලබන ආයතනයේ බාහිර ණය වර්ගීකරණ ශ්‍රේණිය, පසුව BB+ හෝ ඊට පහළ දැමීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි.) [මුල් ණය වර්ගීකරණය පසුව (ණය ප්‍රදානයේදී) පහළ දැමීම සලකා බැලිය යුතුය].
- අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් යටතේ ඒකක දෙකකින් පහළ දැමීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- ඉහළ නංවන ලද ණය පහසුකමට අමතරව ණය පහසුකම දෙවතාවක් ප්‍රතිව්‍යුහගත කිරීම.
- මුල්වරට එකඟ වූ දින සිට දෙවසරකට වඩා ප්‍රමාදයක් සහිත ව්‍යාපාරික මෙහෙයුම්/ව්‍යාපෘති ආරම්භක ප්‍රමාදවීම් (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- විශේෂිත දේපලක් සඳහා නිශ්චිත දර්ශක මත පදනම්ව සුරැකුමෙහි වටිනාකම සැලකිය යුතු ලෙස අඩුවී (25% ක් ඉක්මවා) හෝ සුරැකුම උපලබ්ධිවීමේ හැකියාව සැක සහිත වීම. (දේපළ දර්ශක) (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- පොදු ප්‍රවේශය සහිත තොරතුරු මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෝෂ්ඨ කළමනාකාරිත්වයේ නිරන්තර වෙනස්වීම් (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- ණය ගිවිසුමෙහි නිශ්චිතව දක්වා ඇති අරමුණ හැර වෙනත් අරමුණක් උදෙසා ණයකරු විසින් ණය මුදල පරිහරණය කරනු ලබන බවට සෘජු සාක්ෂි තිබීම.
- අවදානම අවම කිරීමේ කිසිදු පියවරකින් තොරව ඇපකරු විසින් ඇපකාරිත්වය ඉවත්කර ගැනීම.
- ඇස්තමේන්තුගත පිරිවැයේ සිට ව්‍යාපෘති අවසානයේ තෙක් ව්‍යාපෘති පිරිවැයෙහි සැලකිය යුතු ඉහළයාම (25%) ව්‍යාපෘති ආරම්භ වන තුරු මෙම සාධක අදාළ වේ.

- AAA ශ්‍රේණියේ සිට BBB- දක්වා ශ්‍රේණිගත කිරීම හැර වත්මන් බාහිර ශ්‍රේණිගත කිරීම් හමුවේ එක් ඒකයකින් පහළ දැමීම.
- පිළිගත හැකි තොරතුරු මත ණය පහසුකම්හි කාර්ය සාධනය වෙත සැලකිය යුතු බලපෑමක් ඇති කළහැකි නීතිමය කෘත්‍යයට ණයකරු යටත් වන බවට සාක්ෂි තිබීම (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- ගෙවීමට නියමිත පියවිය යුතු ගෙවීම් අවස්ථා වළකන සුළු, ණය පහසුකම්හි කාර්යසාධනයට සෘජු බලපෑමක් ඇති කරන භූගෝලීය පිහිටීමෙහි සැලකිය යුතු විපර්යාස/ස්වභාවික ව්‍යසන (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන ක්ෂේත්‍රයට/ණය ලබාගත් අරමුණ වන ව්‍යාපෘතියෙහි/පහසුකම්හි ආපසු ගැනීමේ හැකියාවට හානිකරණ මට්ටමට සාර්ව ආර්ථික සාධක ක්ෂයවීම. එකඟ වූ පරිදි ණය ආපසු ගෙවීමේ මෙහෙයුම් වළකන නව රෙගුලාසි/රාජ්‍ය ප්‍රතිපත්ති වල බලපෑමද මීට අයත් වේ. (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- ණය ආපසු ගෙවීමට අහිතකර බලපෑම් ඇති කරන ගිවිසුම් අත්හැරීම්, ගෙවීම් විලම්භනය, කාලය දීර්ඝ කිරීම ආදී සහන සලසන කොන්දේසි නවීකරණය (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- ණයකරු හමුවීමට හෝ සම්බන්ධ කර ගැනීමට නොහැකිවීම (පැහැර හැරීම් දර්ශකය)
- ඉහළ දමන ලද ණය පහසුකම් හැරුණුවිට අනෙක්වා දෙවතාවකට වඩා ප්‍රතිව්‍යූහගත කිරීම (ණය හානිකරණ දර්ශක)
- ඉහළ දමන ලද ණය පහසුකම් හැරුණුවිට ප්‍රතිලේඛණගත කළ ණයපහසුකම්
- ගෙවිය යුතු ගිවිසුම්ගත ගෙවීම් දින 90 ඉක්මවවීම.
- අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළු හේතුවෙන් හෝ අයිතිය අත්හැරීමේ ප්‍රකාශයක් හෝ හානිකර මතයක් හේතුවෙන් විගණකවරයා විසින් විගණන මත සීමා කර ඇති අවස්ථාවක
- ණයකරු බුන්වත් වී ඇති බවට/ද්‍රවශීලතා ක්‍රියාමාර්ග දැනටමත් ඇරඹී ඇති බවට හෝ ආරම්භවීමට නියමිත බවට ණය පැහැර හැරීම් පිළිබඳ දර්ශක) සෘජු සාක්ෂි ඇති අවස්ථාවක

#### 2.5.2.8 ණය හානිකරණය වූ හා පැහැර හැරි වත්කම් පිළිබඳ නිර්වචනය

පහත සඳහන් අවස්ථාවලදී සමූහය විසින් වෙනත් ගනුදෙනුකරුවන් ලබා දෙන ණය හා අත්තිකාරම් පැහැර හැරීම් ලෙස සලකනු ලබයි.

- සුරකුම් උපලබ්ධි කිරීම (සුරකුම් කිසිවක් රඳවාගෙන ඇත්නම්) ආදී ක්‍රියාමාර්ග වලට යොමුවීම හැර ණයකරු විසින් අදාළ බැඳීම් මුළුමනින්ම ගෙවීමට අපොහොසත් අවස්ථාවලදී හෝ
- ණයකරු තම ගිවිසුම්ගත ගෙවීම් කළ යුතු දිනය ඉක්මවා දින 90 ක් ඉකුත් වී තිබීම.

වැඩිමනත් වශයෙන්, සමූහය විසින් යම් ආයෝජනයකට පවරා ඇති බාහිර ණය ශ්‍රේණිගත කිරීම, පැහැර හැරීමක් වන විට 3 වන අදියර යටතේ මූල්‍ය ආයෝජන වර්ගීකරණය කරනු ලබයි.

### 2.5.3 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 300 හි සටහන් අංක 26 මගින් දැක්වේ.

#### 2.5.3.1 ක්ෂයවීම්

පිටු අංක 302 දක්වා ඇති සටහන් අංක 26 යටතේ ක්ෂයවීම් තොරතුරු දැක්වේ.

#### 2.5.3.2 ණය ගැනීමේ පිරිවැය

ණය ගැනීමේ පිරිවැය පිළිබඳ ල.ගි.ප්‍ර. 23 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාර සුදුසුකම් ලබන වත්කමෙහි අත්පත් කර ගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනය අදාළව සෘජුව හඳුනාගත හැකි ණය පිරිවැය වත්කමෙහි පිරිවැයෙන් කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලබයි. අපේක්ෂිත භාවිතාව හෝ විකිණීම සඳහා සූදානම් කිරීමේදී සැලකිය යුතු කාලසීමාවක් ගතවන වත්කම්, සුදුසුකම් ලබන වත්කම් නම් වේ. අනෙකුත් ණය ගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුළ ඇති ලාභයට හෝ අලාභය මත හඳුනාගනී. වාර්තා කරන ලද කාලසීමාව තුළ බැංකුව හා සමූහය විසින් කිසිදු ණය ගැනීමේ පිරිවැයක් ප්‍රාග්ධනිත නොකරන ලදී.

### 2.5.4 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර පිටු අංක 309 හි සටහන් අංක 29 මගින් දැක්වේ.

### 2.5.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විලම්බිත බදු වත්කම් නොවන වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ සළකුනක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, වත්කමේ ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම අඩු කරයි.

### 2.5.6 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

#### 2.5.6.1 නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

#### 2.5.6.1.1 සේවක විශ්‍රාම අරමුදල - I

1995 ඔක්තෝබර් 01 දිනට ප්‍රථම බැංකුවට බැඳුනු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නිර්වචිත විශ්‍රාම සැලසුම් ක්‍රමයක් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා වෙනම පාලනය කෙරෙන අරමුදලක් වෙත බැංකුව විසින් සාමාජිකයන්ගේ දායකත්වය ලබාදෙනු ලබයි. පුරෝකථන ඒකක ණය ජීවගණක තක්සේරු කිරීමේ ක්‍රමය භාවිතා කරමින් නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙන වෙනම තීරණය කරනු ලබයි. ජීවගණක ලාභ හා අලාභ ඒවා ඇතිවන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වාර්තා කරනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා  නොගත් ජීව ගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීව ගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඓක්‍යයට, සීමා වෙයි.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. පූපලානාදන් මහතා විසින් 2024 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2024 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

| | |
|---|---|
| පොළී/වට්ටම් අනුපාතය | 11% (වාර්ෂිකව) |
| ජීවන වියදම් දීමනාවේ ඉහළයාම | 6.5% (වාර්ෂිකව) |
| මූලික වැටුප් සාමාන්‍යයෙහි ඉහළයාම | 8% (වාර්ෂිකව) |

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. සේවක විශ්‍රාම අරමුදල් – I හි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාවද සහාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

සේවක විශ්‍රාම අරමුදල – I පිළිබඳ විස්තර පිටු අංක 323 සිට 325 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දැක්වේ.

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 12,917 ක ශුද්ධ බැඳීම් හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින්ම ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 323 සිට 325 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දක්වා ඇත.

### 2.5.6.1.2 සේවක විශ්‍රාම අරමුදල – II

1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් අනතුරුව බැංකු සේවයට බැඳුනු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා, බැංකුව විසින් අදාළ සාමාජිකයාගේ මාසික දළ වැටුපින් 12% ක දායකත්වයක් වෙනම පාලනය වන අරමුදලක් වෙත මාසිකව දායක කළ යුතු වන නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් බැංකුව විසින් ස්ථාපනය කර මෙහෙයවනු ලබයි.

පුරෝකථන ඒකක ප්‍රතිලාභ, ජීවදත්ත ඇගයීම් ක්‍රමයක් භාවිත කරමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙනම තීරණය කරනු ලබයි. ආයු ගණනයෙන් ඇති වූ ලාභ හා පාඩු, ඒවා පැන නගිනු ලබන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීවගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීව ගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඓක්‍යයට, සීමා වෙයි.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. පූපලානාදන් මහතා විසින් 2024 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2024 දෙසැම්බර් 31 දිනට යෙදුණු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

| | |
|---|---|
| පොළී/වට්ටම් අනුපාතය | 11% (වාර්ෂිකව) |
| ජීවන වියදම් දීමනාවේ ඉහළයාම | 6.5% (වාර්ෂිකව) |
| මූලික වැටුප් සාමාන්‍යයෙහි ඉහළයාම | 8% (වාර්ෂිකව) |

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. සේවක විශ්‍රාම අරමුදල් – I හි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාවද සහාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

සේවක විශ්‍රාම අරමුදල – II පිළිබඳ විස්තර පිටු අංක 325 සිට 328 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දැක්වේ.

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 447 ක ශුද්ධ බැඳීම් හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින්ම ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 325 සිට 328 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දක්වා ඇත.

### 2.5.6.1.3 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල

2013 දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ii හි සාමාජිකයන් වෙනුවෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ස්ථාපනය කරන ලදී. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ii හි සාමාජිකයින්හට ඔවුන්ගේ කැමැත්ත අනුව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා ගැනීමේ අවස්ථාව ඇත. බැංකුව විසින් මෙම අරමුදල සඳහා දායක නොවන අතර බැංකු සේවකයන් විසින් ඔවුන්ගේ මූලික වැටුපින් 5%ක් මාසිකව දායක මුදල් ලෙස ගෙවනු

### 2.5.6.2 විශ්‍රාම පාරිතෝෂික

සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමග 1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු සේවකයින් සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමයට ඇතුළත් වේ. එහෙයින් ඔවුන් සේවා පාරිතෝෂික ක්‍රමය යටතේ හිමිවන අයිතීන් හා වරප්‍රසාද සඳහා හිමිකම් නොකියයි. කෙසේ වුවද, මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමිකර ගැනීම සඳහා අවම වශයෙන් මාස 120 ක අඛණ්ඩ සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුව පවතී. එහෙයින් වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම යනු ලබන හෝ විශ්‍රාම යාම හැරුණු කොට වෙනත් හේතු මත වසර 05 කට පසු සේවා කාලය අවසන් වන සේවකයින්හට 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත යටතේ සේවාවසාන

පාරිතෝෂික දීමනා හිමිකර ගැනීමේ වස්ථාව හිමි වේ. මේ යටතේ සිය සේවය අවසන් කරන ලද මූල්‍ය වර්ෂයේ අවසන් මාසය සඳහා ගෙවන ලද දළ වැටුප මෙන් මාස 1/2 ක අනුපාතයක් යටතේ අඛණ්ඩ සේවයේ නියැළුණු සෑම වසරක් වෙනුවෙන්ම පාරිතෝෂික දීමනා ගෙවනු ලබයි.

කළමනාකාරිත්වයේ අදහස හා පසුගිය අත්දැකීම්වලට අනුව එබඳු සිදුවීමක් ඇතිවීමේ සම්භාවිතාවය විරලය. වාර්තා කරන දිනට සැලකිය යුතු වගකීමක් වාර්තා නොවුනහොත්, සේවා පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයෙහි ප්‍රතිපාදන වෙන් කරනු නොලබයි. 1983 අංක 12 දරණ සේවා පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ඉහත දැක්වූ අන්දමේ සිදුවීමක් මත සේවකයෙකුහට සේවා පාරිතෝෂික ගෙවීම සිදු කළහොත්, එය ගෙවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි පාරිතෝෂික වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

### 2.5.6.3 විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ

විශ්‍රාමික සේවකයින් වෙනුවෙන් බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. මේ සැලසුම යටතේ ඇති වත්කම් බැංකුවේ සෙසු වත්කම් වලින් ස්වාධීනව පවත්වා ගෙන යනු ලබන අතර, එම අරමුදලෙහි භාරකාර ඔප්පුවෙහි ප්‍රතිපාදන ප්‍රකාර බැංකුවේ කළමනාකාරිත්වය හා විශ්‍රාමිකයින් නියෝජනය කරනු ලබන කළමනාකාර/භාරකාර මණ්ඩලයක් මගින් පරිපාලනය කරනු ලබයි. ප්‍රක්ෂේපිත ඒකක භාර ජීවගණක ඇගයීම් ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ පිරිවැය තීරණය කෙරෙයි. ජීවගණක ලාභ හා අලාභ එම අගයන් පැවති කාලසීමාවට අදාළ වෙනත් විස්තීරණ ආදායම්වල හඳුනාගනු ලැබේ.

වරින් වර සිදු කරනු ලබන ජීවගණක නිර්දේශ මත බැංකුවේ කළමනාකාරිත්වය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර සැලසුම් ක්‍රමය වෙත දායක කරනු ලබයි. ඒ අනුව 2024 වර්ෂයේ ලාභයෙන් රුපියල් මිලියන 788 ක් මේ සඳහා ප්‍රතිපාදනය කර ඇත.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම් පූපලානාදන් මහතා විසින් 2024 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2024 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදාගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

| | |
|---|---|
| පොළී/වට්ටම් අනුපාතය | 11.5% (වාර්ෂිකව) |
| වෛද්‍ය පිරිවැය උද්ධමන අනුපාතය | 8% (වාර්ෂිකව) |

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම්වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කෙරෙනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. විශ්‍රාම වැටුප් II අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශය මෙන්ම විගණන වාර්තාව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබ සමාලෝචනයට බඳුන් වී ඇත. අරමුදල් සැපයුම, ප්‍රශස්ත මට්ටමින් සිදු කරනු ලැබීමේ වගකීම බැංකුව සතු වන බැවින් බැංකුවේ නිරාවරණයවීම් සමාලෝචනය සඳහා ද ඉහත වාර්තා ඉදිරිපත් කෙරෙයි. අදාළ සාමාජිකයා ජීවතුන් අතර සිටිනතාක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ පිළිබඳ විස්තර පිටු අංක 329 සිට 331 දක්වා සටහන් අංක 38(අ)3 මගින් දැක්වේ.

ජීවගණක ඇගයීම සිදුකළ වහාම අරමුදල් නොයෙදූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2024 දෙසැම්බර් 31 දිනට රු. මි. 5,143 ක ශුද්ධ බැඳීම් හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින් ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 329 සිට 331 හි සටහන් අංක 38(අ)3 හි දක්වා ඇත.

### 2.5.6.4 නිර්වචිත දායකත්ව සැලසුම්

නිර්වචිත දායකත්ව සැලසුම් පිළිබඳ විස්තර පිටු අංක 273 හි සටහන් අංක 11 මගින් දැක්වේ.

### 2.5.7 වෙනත් වගකීම්

වෙනත් වගකීම් පිළිබඳ විස්තර පිටු අංක 333 හි සටහන් අංක 41 මගින් දැක්වේ.

### 2.5.8 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහය හමුවේ ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) ඇති විට හා එකී බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වලින් යුතු සම්පත් පිටතට ගලායාම අවශ්‍යවීම භව්‍ය වන විටක සහ බැඳීම් ප්‍රමාණයෙහි විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විටකදී ප්‍රතිපාදන හඳුනාගනු ලබයි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම්, ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබන්නේ කිසියම් ප්‍රතිපූරණයක් වේ නම් එය අඩු කිරීමෙන් අනතුරුවය.

#### 2.5.8.1 වංචා සහගතව මුදල් ආපසු ගැනීම් වෙනුවෙන් සිදු කළ ප්‍රතිපාදන

2024 දෙසැම්බර් 31 දිනට හඳුනාගනු ලැබූ වංචා සහගත මුදල් ආපසු ගැනීම්වලට අදාළ මුළු වටිනාකම රු. මිලියන 290 ක් විය. වංචා සහගතව මුදල් ආපසු ගැනීම් ශේෂය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 275 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. රක්ෂණාවරණ මගින් රු. මිලියන 15 ක සහන දීමනා හිමිවිණි.

### 2.5.9 අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන්

මේ යටතට බැංකු ඇපකර, ණයවර ලිපි, නොලැබූ ණය පහසුකම්, වෙනත් වක්‍ර ණය පහසුකම් සහ ප්‍රාග්ධන බැඳියාවන් ඇතුළත් වේ. බැංකු ඇපකර වූ කලී, ණය උපකරණයක නියාමනවලට අනුව යම් ණයකරුවෙකු නියි දිනට ගෙවීම් සිදු කිරීමට අපොහොසත් වන අවස්ථාවලදී ඇති වියහැකි අලාභය වෙනුවෙන් සමූහය විසින් නිශ්චිත ගෙවීමක් සිදු කිරීමට අදාළ ගිවිසුම්ය. නොගෙවූ ණය බැඳියාවන්, ණයවර ලිපි යනු බැඳියාවට අදාළ කාලසීමාව තුළ ඇති බැඳියාවන් යටතේ බැංකුව විසින් පූර්ව නිශ්චිත කොන්දේසි යටතේ ගනුදෙනුකරුහට ණයක් ලබාදිය යුතු අවස්ථාය.

2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී.ල.මූ.ගි.ප්‍ර. 09 යටතේ හානිකරණ ඇගයීම්වලට මෙකී ගිවිසුම් යටත් වේ. අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන් පිළිබඳ විස්තර පිටු අංක 338 හි දක්වා සටහන් අංක 48 හි දක්වා ඇත.

### 2.5.10 කොටසක් සඳහා ඉපයීම්

කොටසක මූලික සහ තනුක ඉපයීම් පිළිබඳ විස්තර පිටු අංක 277 හි සටහන් අංක 14 හි දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්



### 2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති – මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම

ආදායම විශ්වසනීය ලෙස අගය කළ හැකි සහ ආර්ථික ප්‍රතිලාභ, බැංකුව වෙත ගලාඒමේ සම්භාවිතාව ඇති තාක් දුරට ආදායම හඳුනාගනු ලබයි. ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පිටු අංක 265 සිට 277 දක්වා සටහන් අංක 3 සිට 13 හි දක්වා ඇත.

#### 2.6.1 පොලී ආදායම් සහ වියදම්

පොළී ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පිටු අංක 265 සිට 267 දක්වා සටහන් අංක 3 හා 4 හි දක්වා ඇත.

#### 2.6.2 ගාස්තු සහ කොමිස් ආදායම

ගාස්තු සහ කොමිස් ආදායම විස්තර පිටු අංක 268 හි දක්වා සටහන් අංක 5 මගින් දැක්වේ.

#### 2.6.3 වෙළඳාම මගින් ලත් ශුද්ධ ලාභ/(අලාභ)

වෙළඳාම මගින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) පිටු අංක 269 හි සටහන් අංක 6 මගින් දැක්වේ.

#### 2.6.4 ලාභාංශ ආදායම

ආදායමක් ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබෙයි. සාමාන්‍යයෙන් මෙය ලැයිස්තුගත කොටස සඳහා ලාභාංශ රහිත දිනයයි. ලාභාංශ ආදායම් පිළිබඳ විස්තර පිටු අංක 270 හි සටහන් අංක 09 මගින් දැක්වේ.

#### 2.6.5 කුලී ආදායම

කුලී ආදායම, උපචිත ආදායම මත ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. කුලී ආදායම පිළිබඳ විස්තර පිටු අංක 270 හි සටහන් අංක 09 මගින් දැක්වේ.

### 2.7 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදුකරණය

#### 2.7.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු පිළිබඳ විස්තර පිටු අංක 275 හි සටහන් අංක 13 මගින් දැක්වේ.

#### 2.7.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු පිළිබඳ විස්තර පිටු අංක 275 සහ 311 හි පිළිවෙලින් සටහන් අංක 13 හා 30 මගින් දැක්වේ.

#### 2.7.3 මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 25 (අ) වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාර මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ගණනය කෙරෙයි.

ආර්ථික ක්ෂයවීම් හා සේවක පාරිශ්‍රමික සඳහා ගලපන ලද මෙහෙයුම් ලාභයෙන් මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු හා සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු ගෙවීමට පෙර, 18% ක් මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ලෙස ගෙවිය යුතුවේ.

#### 2.7.4 සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු (SSCL)

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු පනත යටතේ 2022 ඔක්තෝබර් මස 01 වන දින සිට සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු බලපැවැත්වේ. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 6 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු අරමුණ සඳහා නිශ්චිත කරගත් අයිතමවල අගය මත 2.5% ක අනුපාතයකට අයබදු අය වනු ඇත.

### 2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර. 7) අනුව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත්තේ සෘජු ක්‍රමය පදනම් කර ගෙනය. මුදල් හා මුදල් සමානයන්, කිසියම් මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජනවලින් සමන්විත වන අතර, ඒවායේ වටිනාකම වෙනස්වීමේ අවධානම නොසැලකිය යුතු තරම් වේ. අතැති මුදල්, බැංකු වල තැන්පත් කර ඇති මුදල් ශේෂයන් හා කෙටි දැනුම්දීමකින් ලබා ගත හැකි මුදල්, මුදල් හා මුදල් සමානයන්ට අයත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිටු අංක 246 හි දක්වා ඇත.

### 2.9 නියාමන ප්‍රතිපාදන

#### 2.9.1 තැන්පතු සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය මත පදනම්ව අදාළ වන ව්‍යවස්ථාපිත අනුපාතිකය වන 0.10% ක් ලෙස, බැංකුව විසින් අදාළ තැන්පතු පදනම මත රක්ෂණ වාරිකය ගණනය කරයි. රක්ෂණ නියාමන මගින් දක්වා ඇති පරිදි සෑම කාර්තුවක් අවසානයේ සිටම දින 15 ක කාලසීමාවක් ඇතුළත අදාළ වාරිකය බැංකුව විසින් ප්‍රේෂණය කරනු ලැබේ.

#### 2.9.2 බෝග රක්ෂණ අයබදු (CIL)

2013 අංක 12 දරණ මුදල් පනතෙහි 14 වන වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාර 2013 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බෝග රක්ෂණ අයබද්ද හඳුන්වා දෙනු ලැබූ අතර, එය ජාතික රක්ෂණ භාරකාර අරමුදලට ගෙවිය යුතු වේ. මේ වන විට බදු පසු ලාභයෙන් 1% ක් බෝග රක්ෂණ අයබදු ලෙස ගෙවිය යුතුය.

### 2.10 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් පිළිබඳ විස්තර පිටු අංක 347 හි සටහන් අංක 52 මගින් දැක්වේ.

### 2.11 නිකුත් කරන ලද මුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන්

බැංකුවේ/සමූහයේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලබන දිනට ප්‍රකාශිත එනමුත් මෙතෙක් බලනොපැවැත්වුණු බැංකුවට හෝ සමූහයට සැලකිය යුතු බලපෑමක් ඇති කරලන නව ප්‍රමිතීන් හෝ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකතන කිසිවක් නොතිබුණි.

රක්ෂණ ගිවිසුම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් - ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 17 යනු රක්ෂණ ගිවිසුම් වලට අදාළ හඳුනාගැනීම, මිනීම, ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම් සඳහා විස්තීර්ණ නව ගිණුම්කරණ ප්‍රමිතීන් ආවරණය කරන්නකි.

ක්‍රියාත්මක කරනු ලැබූ විට ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 17 මගින් 2005 දී නිකුත් කරන ලද "රක්ෂණ ගිවිසුම්" මත ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 4 යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ආදේශ කරනු ඇත.

2026 ජනවාරි 01 වන දින හෝ ඉන් පසුව එළඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 17 බලපැවැත්වෙනු ඇත. මූල්‍ය ප්‍රකාශයන් මත සැලකිය යුතු අන්දමේ බලපෑමක් මේ මගින් ජනිත වනු ඇතැයි සමූහය අපේක්ෂා නොකරයි.

## 3 දළ ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම හා ආදායම, විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකි මට්ටම දක්වා දළ ආදායම් හඳුනාගනු ලබයි. ආදායම් හඳුනා ගැනීමට ප්‍රථම වෙනත් විශේෂිත නිර්ණායක ඒ ඒ ආදායමට අදාළ සටහන් යටතේ දක්වා ඇත.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| පොළී ආදායම | **203,748,274** | 226,967,227 | **208,632,122** | 231,204,088 |
| ගාස්තු හා කොමිස් ආදායම | **2,078,830** | 1,593,415 | **2,085,090** | 1,605,521 |
| වෙළඳාම් කටයුතු වලින් ශුද්ධ ලාභය/(අලාභය) | **911,630** | 1,425,791 | **1,791,936** | 3,701,827 |
| ලාභය/(අලාභය) මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණවලින් ශුද්ධ සාධාරණ අගය ලාභ/(පාඩු) | **–** | – | **–** | – |
| මූල්‍ය වත්කම් හඳුනා ගැනීම අත්හැරීම තුළින් ශුද්ධ ලාභ/(අලාභ) | **442,273** | 1,820,617 | **442,273** | 1,820,617 |
| වෙනත් මෙහෙයුම් ශුද්ධ ආදායම් | **455,941** | 257,272 | **465,743** | 492,598 |
| දළ ආදායම | **207,636,948** | 232,064,322 | **213,417,164** | 238,824,651 |

## 4 ශුද්ධ පොළී ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්ත**

**පොළී ආදායම සහ පොළී වියදම හඳුනා ගැනීම්**

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන ලද සියලු මූල්‍ය උපකරණ සඳහා හා වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ලෙස වර්ග කරන ලද පොළී සහිත මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ සඳහා පොළී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොළී අනුපාත භාවිතයෙනි. මෙය මූල්‍ය උපකරණයෙන් අපේක්ෂිත ජීව කාලය තුළ හෝ ඊට අඩු කාලසීමාවක් තුළ තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගෙවීම් හෝ ලැබීම් සුදුසු විටකදී මූල්‍ය වත්කමෙහි හෝ වගකීමෙහි පවතින ශුද්ධ අගයට නිශ්චිතව අඩුකරන අනුපාතයයි. මෙම ගණනය කිරීම සඳහා මූල්‍ය උපකරණයෙහි සියලුම ගිවිසුම් ප්‍රකාර කොන්දේසි (උදාහරණ වශයෙන් කලින් ගෙවීමේ විකල්ප) සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය උපකරණයට සෘජුවම සම්බන්ධ හා සඵල පොළී අනුපාතයෙහි සංකලිත කොටසක් වන කිසියම් ගාස්තු හෝ වර්ධක පිරිවැය මීට ඇතුළු වන මුත් අනාගත ණය පාඩු ඊට අන්තර්ගත නොවේ.

සමූහය විසින් එහි ගෙවීම් හෝ ලැබීම්වල තක්සේරු අගයන් සංශෝධනය කෙරෙයි නම්, මූල්‍ය වත්කම් හෝ වගකීම් හි ධාරණ අගයද ගලපනු ලබයි. මුල් සඵල පොළී අනුපාත මත පදනම්ව අදාළ ගැලපීම් වලින් පසු ධාරණ අගය ගණනය කෙරෙන අතර, ධාරණ අගයෙහි වෙනස වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වාර්තා කරනු ලබයි. කෙසේ වුවද, ලද මුදලෙහි ඉහළ ගිය අයකර ගැනීම් හැකියාවෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව විසින් අනාගත මුදල් ලැබීම් පිළිබඳ තක්සේරු පසුව වැඩි කරනු ලබන නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් සඳහා තක්සේරුව වෙනස් කළ දින සිටම එම වැඩිකිරීම්වල බලපෑම සඵල පොළී අනුපාතිකයට කළ ගැලපීමක් ලෙස හඳුනාගනු ලබයි.

ණය හානිකරණය වූ වත්කම් හැර අනෙකුත් මූල්‍ය උපකරණ සඳහා සඵල පොළී අනුපාත ගණනය කිරීමේදී අපේක්ෂිත ණය පාඩු හැරුණුකොට මූල්‍ය උපකරණවල සියලු ගිවිසුම්ගත කොන්දේසි සලකා බලමින් බැංකුව විසින් ඉදිරි මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරයි. අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය පාඩු ඇතුළත් කරමින් තක්සේරු කළ ඉදිරි මුදල් ප්‍රවාහ භාවිත කරමින් ණය ගලපන ලද අපේක්ෂිත පොළී අනුපාත ගණනය කෙරෙයි. ණය ගලපන ලද සඵල පොළී අනුපාත යනු මුල් හඳුනා ගැනීමේදී (ණය පාඩුද ඇතුළත්ව) තක්සේරු කළ ඉදිරි මුදල් ප්‍රවාහ ක්‍රමක්ෂය පිරිවැයට වට්ටම් කරන පොළී අනුපාතයයි.

හානිකරණ අලාභය හේතු කොට ගෙන මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක වාර්තා කළ අගය අඩුවූ විටද හානිකරණ අලාභය ගණනය කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතයම භාවිත කරමින් පොළී ආදායම හඳුනාගැනීම සිදු කෙරෙයි.

## 4. ශුද්ධ පොලී ආදායම (සම්බන්ධයි)

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024<br>රු. '000** | 2023<br>රු. '000 | **2024<br>රු. '000** | 2023<br>රු. '000 |
| **04. (අ) පොලී ආදායම** | | | | |
| මුදල් හා මුදල් සමානයන් | **66,042** | 186,984 | **69,056** | 196,588 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | **–** | – | **–** | – |
| බැංකුවල ඇති තැන්පතු | **1,300,589** | 1,260,615 | **1,349,728** | 1,416,223 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **–** | – | **–** | – |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් | | | | |
| – සාධාරණ අගයට ගණනය කරන ලද | **2,193,865** | 3,214,030 | **5,374,556** | 5,797,276 |
| – සාධාරණ අගයට නම් කළ | **–** | – | **–** | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් | | | | |
| – ණය හා අත්තිකාරම් | **68,747,284** | 87,805,226 | **68,824,412** | 87,768,331 |
| – ණය හා වෙනත් උපකරණ | **127,020,632** | 127,897,236 | **128,501,143** | 129,337,433 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | **4,419,862** | 6,603,136 | **4,513,227** | 6,688,235 |
| වෙනත් | **–** | – | **–** | – |
| මුළු පොලී ආදායම | **203,748,274** | 226,967,227 | **208,632,122** | 231,204,088 |
| **04. (ආ) පොලී වියදම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | **337,623** | 699,246 | **509,448** | 1,685,203 |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම් | **–** | – | **–** | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | **123,882,172** | 185,701,754 | **123,892,009** | 185,556,313 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | **–** | – | **–** | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු | **3,427,151** | 3,443,789 | **5,639,363** | 4,468,243 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | **3,319,253** | 7,557,223 | **3,319,253** | 7,557,223 |
| මුළු පොලී වියදම් | **130,966,199** | 197,402,011 | **133,360,073** | 199,266,982 |
| ශුද්ධ පොලී ආදායම | **72,782,075** | 29,565,216 | **75,272,049** | 31,937,106 |

**පොලී ආදායමට එදිරිව පොලී වියදම** ප්‍රස්ථාරය 64



## 4. ශුද්ධ පොළී ආදායම (සම්බන්ධයි)

### 04. (ඇ) ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද ශුද්ධ පොළී ආදායම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව, පහත දැක්වෙන රජයේ සුරැකුම්පත් සඳහා පොළී ආදායම සහ පොළී වියදම් පිළිවෙලින් 4 (අ) සහ 4 (ආ) සටහන් වල දක්වා ඇති පොළී ආදායමෙන් සහ පොළී වියදම් වලින් උපුටා ගෙන වෙන වෙනම අනාවරණය කර ඇත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| **පොළී ආදායම** | | | | |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් | | | | |
| – සාධාරණ අගයට ගණනය කරන ලද | **2,193,865** | 3,214,030 | **5,374,556** | 5,797,276 |
| – සාධාරණ අගයට නම් කළ | **–** | – | **–** | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් | | | | |
| – ණය හා අත්තිකාරම් (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්) | **930,973** | 802,154 | **930,103** | 680,788 |
| – ණය හා වෙනත් උපකරණ | **109,630,388** | 95,565,494 | **110,756,375** | 96,550,554 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | **4,419,862** | 6,603,136 | **4,513,227** | 6,688,235 |
| | **117,175,088** | 106,184,814 | **121,574,261** | 109,716,853 |
| **අඩු කළා: පොළී වියදම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්) | **337,623** | 699,246 | **509,448** | 1,618,294 |
| වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්) | **3,427,152** | 3,443,789 | **5,635,552** | 4,455,234 |
| | **3,764,775** | 4,143,035 | **6,145,000** | 6,073,529 |
| **රජයේ සුරැකුම්පත් වලින් ලත් ශුද්ධ පොළී ආදායම** | **113,410,313** | 102,041,779 | **115,429,261** | 103,643,325 |

### 04. (ඈ) ණය තාවකාලික අත්හිටුවීම සහ කල්දැමීම නිසා පොළී ආදායමට වූ බලපෑම

ණය සහනය හෝ ගෙවීම් කල්දැමීම ප්‍රතික්ෂේප කළ අය හැර සෙසු සියළු ගනුදෙනුකරුවන්ට බැංකුව සිය ණය සහනය සහ ගෙවීම් කල් දැමීම ලබාදී ඇත. ණය සහනය 7% ක අනුපාතයකට ලබාදී ඇති අතර, ණය කාලය අවසන් වන තෙක් ගෙවීම් කල්දමා ඇත. ණය සහන කාලසීමාව මාස දෙකක සිට මාස හයක් දක්වා වෙනස් වී ඇති අතර ඉතා සීමිත අවස්ථාවක එය මාස හයකට වඩා වැඩි කර ඇත.

මූල්‍ය වර්ෂය තුළදී කල් දැමූ දින 1 අලාභය වූ රු. මිලියන 1,391 න් රු. මිලියන 105.9 ක පොළී ආදායමක් හඳුනාගත් අතර 2024 දෙසැම්බර් 31 දිනට කාල වෙනස සහ පාරිභෝගිකයාගේ කලින් ගෙවීම නිසා සිදුවූ කල්දැමූ දින 1 අලාභය ලෙස රු. මිලියන 379.8 වාර්තා කරන ලදී. මෙයට කාල වෙනස සහ ගනුදෙනුකරුවන්ගේ පෙර ගෙවීම් හේතු විය.

### 04. (ඉ) දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන නිසා පොළී ආදායමට වූ බලපෑම

2023 වසරේදී දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනේ විකල්ප III යටතේ බැංකුව විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කළඹ සම්පූර්ණයෙන්ම ලංකා රුපියල් බැඳුම්කර බවට පරිවර්තනය කර ඇත.

ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කරන දේශීය ණය ප්‍රශස්තකරණ වැඩ සටහන නිසා පැන නගින දින 01 වෙනස නීර්ණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන පොදු රාමුවට අනුව සිදුකර ඇති අතර, බැංකුව විසින් 2024 දෙසැම්බර් 31 දිනට දින 01 අලාභය ලෙස රු. මිලියන 155.3 වාර්තා කරන ලදී.

## 5 ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගනුදෙනුකරුවන්ට සපයනු ලබන විවිධ වූ සේවාවන්ගෙන් සමූහය, ගාස්තු සහ කොමිස් ආදායම උපයාගන්නා අතර, එම සේවාවන් කාණ්ඩ දෙකකට බෙදා වෙන් කළ හැකිය.

(අ) යම් කාලසීමාවක් පුරා සපයනු ලබන සේවාවන්ගෙන් උපයාගන්නා ගාස්තු හා කොමිස් ආදායම

යම් කාලසීමාවක් පුරා සපයනු ලැබූ සේවාවන් වෙනුවෙන් ලැබෙන ගාස්තු සහ කොමිස් ආදායම එම කාලසීමාව පුරා උපචිත කර හඳුනාගනු ලැබේ.

(ආ) ගනුදෙනු සේවා සැපයීම වෙනුවෙන් ලද ගාස්තු හා කොමිස් ආදායම

තෙවන පාර්ශව වෙනුවෙන් සිදුකරන ගනුදෙනු සාකච්ඡා කිරීම් හෝ යළි සලකා බැලීම් වලින් ලද ගාස්තු හා කොමිස් ආදායම් එම ගනුදෙනු සම්පූර්ණ වීමෙන් අනතුරුව හඳුනාගනු ලබයි. කිසියම් කාර්යයක් ඉටුකිරීම හා සම්බන්ධවී ඇති ගාස්තු හෝ ගාස්තු කොටස් එම කාර්යය ඉටු කිරීමෙන් අනතුරුව හඳුනාගනියි.

ගනුදෙනු හා සේවා, ගනුදෙනු හා සේවා ගාස්තු වලට අදාළ ගාස්තු හා කොමිස් වියදම් එම සේවාවන් ලැබීමෙන් පසුව හඳුනාගනියි. ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනමට ගිණුම්ගත කරයි.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| ගාස්තු හා කොමිස් ආදායම | **2,078,830** | 1,593,415 | **2,085,090** | 1,605,521 |
| ගාස්තු හා කොමිස් වියදම | **(328,272)** | (317,046) | **(328,737)** | (317,292) |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | **1,750,558** | 1,276,369 | **1,756,353** | 1,288,229 |
| **උපයන ලද්දේ** | | | | |
| ණය | **721,275** | 501,788 | **721,476** | 502,091 |
| කාඩ්පත් | **492,917** | 446,578 | **492,917** | 446,578 |
| වාණිජ හා ප්‍රේෂණ | **426,474** | 237,369 | **426,474** | 237,369 |
| ආයතනික බැංකුකරණය | **8,767** | 4,000 | **8,767** | 4,000 |
| තැන්පතු | **48,636** | 45,900 | **48,636** | 45,900 |
| ඇපකර | **17,038** | 22,178 | **17,038** | 22,178 |
| වෙනත් | **35,451** | 18,557 | **41,045** | 30,114 |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | **1,750,558** | 1,276,369 | **1,756,353** | 1,288,229 |

### ගාස්තු හා කොමිස් ආදායමට එරෙහි වියදම

ප්‍රස්ථාරය 65



## 6 වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පොළී ආදායම හැරුණු විට විදේශ විනිමය හුවමාරුවෙන් ලත් ආදායම, ලාභ හෝ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් වලට අදාළ ලාභාංශ සහ සියලුම ලාභ/අලාභ වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය ඇතුළත්ය.

ගෙවීම් ලබාගැනීම සඳහා සමූහය සතු අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| විදේශ විනිමය | | | | |
| – අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් | **(33,967)** | 200,367 | **(33,967)** | 200,367 |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් | **623,483** | 836,455 | **1,468,336** | 3,109,403 |
| හිමිකම් සුරැකුම්පත් | **555,233** | 335,908 | **555,233** | 335,908 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **(233,119)** | 53,062 | **(197,666)** | 56,150 |
| **එකතුව** | **911,630** | 1,425,791 | **1,791,936** | 3,701,827 |

## 7 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ලාභය හෝ අලාභය මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් වලින් ලත් සියලු උපලබ්ධි නොවූ ලාභ හා අලාභ වලට අයත් වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත ලාභ | **–** | – | **–** | – |
| ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත අලාභ | **–** | – | **–** | – |
| ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වගකීම් මත ලාභ | **–** | – | **–** | – |
| ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වගකීම් මත අලාභ | **–** | – | **–** | – |
| **එකතුව** | **–** | – | **–** | – |

## 8 මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගැනීම අත්හරින ලද වත්කම් සහ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් වලට අදාළ ලාභයෙන් අලාභය අඩු කළ විට මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) ගණනය වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **හඳුනාගැනීම** | | | | |
| ලාභ/අලාභ මගින් සාධාරණ අගයට | **–** | – | **–** | – |
| ක්‍රමක්ෂය පිරිවැයට | **–** | – | **–** | – |
| වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට | **442,273** | 1,820,617 | **442,273** | 1,820,617 |
| **එකතුව** | **442,273** | 1,820,617 | **442,273** | 1,820,617 |

## 9 වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**i. දේපල, පිරියත, උපකරණ ඉවත් කිරීමෙන් ලද ලාභය/(අලාභය)**

ඉවත් කරනු ලබන දිනට වත්කම්වල ධාරණ අගය හා ශුද්ධ විකුණුම් මිල අතර වෙනස මගින් දේපල, පිරියත, උපකරණ ඉවත් කිරීමෙන් ලද ලාභ/(අලාභ) තීරණය වේ. සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ හිමිකම විකුණුම්කරු වෙත මාරු කරනු ලබන වර්ෂයේදී මෙය වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

**ii. විදේශ විනිමය ලාභ/(අලාභ)**

සෑම වාර්තාකරණ දිනකටම විදේශ විනිමය තත්ත්වය යළි පරිවර්තනය කෙරෙයි. විනිමය අනුපාතික වෙනස්වීම මත ඇතිවන ලාභ/(අලාභ) ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබයි.

**iii. ලාභාංශ ආදායම**

ගෙවීම් ලබාගැනීම සඳහා සමූහය සතු අයිතිය ස්ථාපිත වූ විට වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් වලින් ඉපයෙන ලාභාංශ හඳුනාගනු ලබයි.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| ආයෝජිත දේපල ලාභ/(අලාභ) | **–** | – | **–** | – |
| දේපල, පිරියත, උපකරණ විකිණීමෙන් ලත් ලාභ/(අලාභ) | **4,439** | 2,311 | **4,396** | 2,311 |
| විදේශ විනිමය යළි අගය කිරීමෙන් ලත් ලාභ/(අලාභ) | **105,430** | (8,652) | **105,430** | (8,652) |
| ආයෝජිත දේපල ප්‍රත්‍යාගණන ලාභ | **–** | – | **–** | 144,023 |
| ලියා හරින ලද ණය අයකර ගැනීම | **–** | – | **9,381** | 11,908 |
| අඩුකළා - ලියා හරින ලද ණය | **–** | – | **–** | – |
| ලාභාංශ ආදායම | **164,373** | 106,614 | **167,331** | 107,276 |
| කුලී ආදායම | **25,305** | 31,106 | **19,255** | 31,149 |
| වෙනත් ආදායම | **156,394** | 125,892 | **159,950** | 204,582 |
| **එකතුව** | **455,941** | 257,272 | **465,743** | 492,598 |

## 10 හානිකරණ වියදම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 – ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් මගින් ඇගයීමට ලක් කරන සියලු මූල්‍ය උපකරණ වෙනුවෙන් සිදුකළ හානිකරණ ප්‍රතිපාදනයේ වෙනස්වීම් සමූහය විසින් හඳුනාගනු ලබයි. සියලු මූල්‍ය වත්කම් ප්‍රභේද ඔස්සේ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 යටතේ හානිකරණ අලාභ මිනීමේදී විශේෂයෙන්ම ණය අවදානමෙහි සැලකියයුතු වැඩිවීම් ඇගයීම, අනාගත මුදල් ප්‍රවාහ ප්‍රමාණය හා කාලය ඇස්තමේන්තු කිරීම, හානිකරණ අලාභ වලදී සුරැකුම් අගය තීරණය කිරීම යනාදිය සම්බන්ධයෙන් නිසි තීරණවලට එළඹිය යුතුය. මෙය ඇස්තමේන්තු සාධක ගණනාවක් මගින් මෙහෙයවනු ලබන අතර, වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස විවිධ මට්ටමේ දීමනා ලැබිය හැක. බැංකුවේ අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් විචල්‍ය යෙදවුම් සහ ඒවායෙහි අන්තර් සම්බන්ධතාවයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් පාදක වන උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ ආකෘතියක නිමයුමකි. හානිකරණ ඇගයීම වෙනුවෙන් උපයෝගී කරගත් ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් අංක 21 (ඇ) මගින් විස්තර කෙරෙයි.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| හානිකරණ වියදම් | **11,163,749** | 4,213,060 | **11,151,377** | 4,111,956 |
| ණය කපාහැරීම | **42,307** | 45,768 | **42,307** | 48,022 |
| **එකතුව** | **11,206,056** | 4,258,828 | **11,193,684** | 4,159,978 |

### 10.1 හානිකරණ වියදම්

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **මුදල් හා මුදල්වලට සමානයන්** | | | | | |
| 1 අදියර | | **(746)** | 153 | **(746)** | 153 |
| **බැංකුවල ඇති තැන්පතු** | | | | | |
| 1 අදියර | | **1,252** | (14) | **1,100** | 113 |
| 2 අදියර | | **–** | 2,847 | **–** | 2,847 |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම්** | 21(ඇ) | | | | |
| 1 අදියර | | **274,093** | (264,912) | **268,455** | (278,552) |
| 2 අදියර | | **(1,372,754)** | 878,398 | **(1,391,335)** | 858,756 |
| 3 අදියර | | **7,655,975** | 4,535,471 | **7,668,017** | 4,467,493 |
| **ක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය උපකරණ** | 22(ආ) | | | | |
| 1 අදියර | | **3,260** | (10) | **3,217** | 19 |
| 2 අදියර | | **–** | (938,873) | **–** | (938,873) |
| 3 අදියර | | **–** | – | **–** | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 23(ආ) | **–** | – | **–** | – |
| අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන් | 48 | **–** | – | **–** | – |
| පාලිත සමාගම්වල ආයෝජන | 24(ඇ) | **–** | – | **–** | – |
| ආශ්‍රිත සමාගම් හා බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 25 | **–** | – | **–** | – |
| දේපළ, පිරියත, උපකරණ | 26 | **–** | – | **–** | – |
| දේපල ආයෝජන | 28 | **–** | – | **–** | – |
| වෙනත් | 31.1 | **–** | – | **–** | – |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ | 31.2 | **4,602,669** | – | **4,602,669** | – |
| **එකතුව** | | **11,163,749** | 4,213,060 | **11,151,377** | 4,111,956 |

## 10. හානිකරණ වියදම් (සම්බන්ධයි)

### 10.2 කළමනාකරණ ආවරණ තුලින් හානිකරණ වියදමට වන බලපෑම

**කළමනාකරණ ආවරණ තුලින් අපේක්ෂිත ණය අලාභයට වන බලපෑම**

තෝරාගත් අංශ සඳහා මූලිකව අදියර 1 යටතේ වෙන් කරන ලද පාරිභෝගික ණය සහ අත්තිකාරම් අදියර 2 සඳහා මාරු කිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 5,791.1 ක ණය හා අත්තිකාරම් මුදලක් වාර්තා කළ අතර හානිකරණ වෙන්කිරීම් රු. මිලියන 556.7 කින් ඉහල යන ලදී.

**ණය සහ අත්තිකාරම් 1 අදියරෙන් 2 අදියරට**

| | 1 අදියර | 2 අදියර | ශුද්ධ බලපෑම |
|---|---|---|---|
| නිරාවරණයඃ (රු. '000) | (5,791,068) | 5,791,068 | – |
| හානිකරණ වෙන්කිරීම් (රු. '000) | (94,070) | 650,812 | 556,742 |

තෝරාගත් අංශ සඳහා අදියර 2 යටතේ මූලිකව වර්ග කරන ලද පාරිභෝගික ණය සහ අත්තිකාරම් අදියර 3 සඳහා මාරු කිරීම හේතුවෙන් රු. මිලියන 416.3 ක ණය හා අත්තිකාරම් මුදලක් වාර්තා කළ අතර 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 118.2 ක හානිකරණ වෙන්කිරීම් ඉහල යාමක් සිදුවිය.

**ණය සහ අත්තිකරම් 2 අදියරෙන් 3 අදියරට සංචලනය**

| | 2 අදියර | 3 අදියර | ශුද්ධ බලපෑම |
|---|---|---|---|
| නිරාවරණයඃ (රු. '000) | (416,274) | 416,274 | – |
| හානිකරණ වෙන්කිරීම් (රු. '000) | (46,441) | 164,593 | 118,152 |

වැඩිදුර තොරතුරු සඳහා සටහන් අංක 21 (ඊ) පිටු අංක 291 හි කොවිඩ්-19 හේතුවෙන් ණය සහ අත්තිකාරම් සහ අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම් සඳහා වූ බලපෑම වෙත යොමුවන්න.

## 11 සේවක මණ්ඩල වියදම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**i. නිර්වචිත දායකත්ව සැලසුම**

සමූහය විසින් නිර්වචිත දායකත්ව සැලසුමක් මෙහෙයවනු ලබයි. නිශ්චිත දායකත්ව සැලසුමක් වෙත දැක්විය හැකි දායකත්වය තීරණය වනුයේ සේවකයින් විසින් සමූහය වෙත ලබා දෙන සේවයට සමානුපාතිකව වන අතර, එය "සේවක මණ්ඩල වියදම්" යටතේ වාර්තා කරනු ලබයි. ගෙවිය යුතු දායකත්ව මුදල්, වගකීමක් ලෙස වාර්තා කරනු ලබයි. සමූහය විසින් පහත සඳහන් නිර්වචිත දායකත්ව සැලසුම් වෙනුවෙන් එහි දායකත්වය දක්වනු ලබයි.

**(අ) සේවක අර්ථසාධක අරමුදල**

බැංකුව හා සේවකයින් විසින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල දීමනා හැරුණු විට) පිළිවෙලින් 12% ක් හා 8% ක් බැගින් අර්ථසාධක අරමුදලට දායක වනු ලබයි. බැංකුවේ අර්ථසාධක අරමුදල වූ කලී සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමැතිය ලද අරමුදලකි. බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයින් හට වාර්ෂිකව 8% ක ප්‍රතිලාභයක් සහතික කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලට පාලිත සමාගම් සහ එහි සේවකයින් විසින් 12% සහ 8% බැගින් පිළිවෙලින් දායක කරනු ලබයි.

**(ආ) සේවක භාරකාර අරමුදල**

සමූහය විසින් (අතිකාල දීමනා හැර) සේවකයින්ගේ මාසික දළ වැටුපෙන් 3% ක් සේවක භාරකාර මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සේවක භාරකාර අරමුදලට දායක කරනු ලබයි.

**ii. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 19) "සේවක ප්‍රතිලාභවලට" අනුව සෑම නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් මත පදනම්ව ඒ ඒ නිර්විචිත ප්‍රතිලාභ සැලසුම සඳහා වෙන වෙනම කරනු ලබන ස්වාධීන ජීවගණක තක්සේරුවක් මත දායකත්වය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

## 11. සේවක මණ්ඩල වියදම් (සම්බන්ධයි)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| වැටුප් සහ ප්‍රසාද දීමනා | | **15,662,688** | 12,602,261 | **16,053,927** | 12,872,160 |
| නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය | | **1,417,025** | 1,143,867 | **1,448,931** | 1,169,720 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය | 11. (අ, ආ, ඇ, ඈ) | **2,806,163** | 2,107,483 | **2,843,838** | 2,123,031 |
| කොටස් මත පදනම් වූ වියදම් | | **–** | – | **–** | – |
| වෙනත් | | **420,271** | 256,847 | **499,307** | 259,913 |
| **එකතුව** | | **20,306,147** | 16,110,458 | **20,846,003** | 16,424,824 |

## 11. (අ) දායකත්වය – සේවක විශ්‍රාම වැටුප් අරමුදල – 1

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| වියදම් ලෙස හඳුනාගත් මුදල | 38. (අ, 1) | **1,750,753** | 1,623,871 | **1,750,753** | 1,623,871 |

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම් පූපලානාදන් මහතා විසින් 2024 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. (යොමුව සටහන් අංක 38.අ. 1 පිටු අංක 323)

## 11. (ආ) දායකත්වය – සේවක විශ්‍රාම වැටුප් අරමුදල – 11

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| වියදම් ලෙස හඳුනාගත් මුදල | 38. (අ, 2) | **267,143** | (249,176) | **268,430** | (247,891) |

1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් අරමුදල ii ස්ථාපිත කර ඇත. වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. පූපලානාදන් මහතා විසින් 2024 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. (යොමුව සටහන් අංක 38 (අ) 2 පිටු අංක 325)

## 11. (ඇ) දායකත්වය – විශ්‍රාමික සේවක වෛද්‍යාධාර ක්‍රමය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| වියදම් ලෙස හඳුනාගත් මුදල | 38. (අ, 3) | **788,267** | 732,788 | **788,267** | 732,788 |

සියලුම බැංකු සේවකයින් සඳහා විශ්‍රාමික සේවක වෛද්‍යාධාර ක්‍රමය ස්ථාපිත කර ඇත. වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම් පූපලානාදන් මහතා විසින් 2024 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී.
(යොමුව සටහන් අංක 38(අ) 3 පිටු අංක 329)

## 11. සේවක මණ්ඩල වියදම් (සම්බන්ධයි)

### 11. (ඇ) දායකත්වය - පාරිතෝෂිකය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| වියදම් ලෙස හඳුනාගත් මුදල | 38. (අ, 4) | **–** | – | **40,957** | 15,549 |

පරිපාලිත සමාගම්වල සේවක මණ්ඩලය විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොලබන අතර ඔවුන් 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ ප්‍රතිපාදන සඳහා හිමිකම් ලබයි. (පිටු අංක 331 – සටහන් අංක 38 (අ, 4).

## 12 වෙනත් වියදම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

දැරියයුතු වන පිරිවැය සහ ආදායමට සම්බන්ධ නිශ්චිත අයිතමවල ඉපයීම් අතර සෘජු සම්බන්ධතාව මත පදනම්ව ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් වියදම් හඳුනාගනු ලබයි. කාර්යක්ෂම තත්ත්වයන් යටතේ දේපළ, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමේදී හා ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේදී පැන නගින සියලු වියදම් ලාභ හෝ අලාභ වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇත. පසුගිය සිදුවීමක් හේතුවෙන් සමූහය වෙත වත්මන් බැඳීමක් ඇති විට (නෛතික හෝ සම්ප්‍රයුක්ත) එකී බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කෙරෙන සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වියහැකි අතර එමගින් බැඳීමේ ප්‍රමාණය පිළිබඳ පිළිගත හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වන අතර සෙසු වියදම්වලට අදාළ ප්‍රතිපාදන හඳුනාගනු ලබයි. දේපළ පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් අනෙකුත් වියදම් වලින් වෙන්කර ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමිකයන් | **2,413** | 1,563 | **7,641** | 6,042 |
| විගණක පාරිශ්‍රමිකයන් | **8,473** | 6,095 | **14,569** | 11,640 |
| විගණිත නොවන ගාස්තු විගණකවරුන් සඳහා | **–** | – | **–** | – |
| වෘත්තීය හා නෛතික වියදම් | **47,753** | 21,019 | **66,491** | 33,053 |
| මහ බැංකුවට ගෙවන ලද තැන්පතු රක්ෂණ වාරිකය | **1,413,300** | 1,460,374 | **1,413,488** | 1,460,591 |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ ගාස්තු | **320,000** | 320,000 | **320,000** | 320,000 |
| කාර්යාල පරිපාලන හා ආයතනික වියදම් | **4,613,329** | 4,289,781 | **4,685,660** | 4,364,486 |
| වෙනත් | **972,350** | 855,787 | **1,080,545** | 901,800 |
| එකතුව | **7,377,618** | 6,954,619 | **7,588,394** | 7,097,612 |

## 13 බදු වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.12) හි "ආදායම් බදු" අනුව බදු වියදම් යනු කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය තීරණය නිශ්චය කිරීමේදී ප්‍රවර්තන බද්ද සහ විලම්භිත බදු සඳහා ඇතුලත් කරනු ලබන සමාහාර අගයයි. හිමිකම් හෝ වෙනත් විස්තීර්ණ ආදායම්හි ඍජුවම දක්වනු ලබන අයිතමවලට අදාළ වන සීමාව හැරුණුවිට ආදායම් බදු ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

**ප්‍රවර්තන බදුකරණය**

ප්‍රවර්තන වර්ෂය මෙන්ම ඊට පෙර වර්ෂ සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් වෙත ගෙවිය යුතු හෝ අය කර ගත යුතු ප්‍රමාණයන්ගෙන් ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. එම ප්‍රමාණ ගණනය කිරීම සඳහා යොදා ගන්නා ලද බදු අනුපාත හා බදු නීති, ශේෂපත්‍ර දිනට හෝ ඉන් පසුව නීතිගත කර ඇත. ඒ අනුව, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා එහි පරිශිෂ්ඨයන් හි ප්‍රතිපාදනයන්ට අනුව සටහන් අංක 13 (අ) හි ඇති අනුපාත යොදා ගනිමින් වර්ෂයට අදාල ලාභය මත පදනම්ව බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

**විලම්බිත බදුකරණය**

වගකීම් ක්‍රමය උපයෝගී කරගනිමින් වාර්තාකරණ දිනට වත්කම් හා වගකීම් වල බදු පදනම සහ මූල්‍ය වාර්තා කිරීමේ අරමුණ පිණිස හඳුනාගන්නා අගය අතර, ඇති සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්භිත බද්ද සඳහා සලකා බැලේ.

සියලුම අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම් වලට අදාළ විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇත. ඉදිරියට ගෙන ආ, පාවිච්චි නොකළ බදු බැර සහ පාවිච්චි නොකළ බදු අලාභ සඳහා ඊට යොදාගත හැකි අනාගත බදුවල ලාභ ලැබෙතැයි ගම්‍ය වනතාක් දුරට හඳුනාගත යුතුය.

සෑම වාර්තාකරන දිනකටම විලම්බිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කරනු ලබන අතර, විලම්බිත බදු වත්කමෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන්ම කපාහැරීමට උපයෝගී කර ගැනීමේ වාසිය ලැබීමට ප්‍රමාණවත් තරම් බදු වන ලාභ ලැබෙතැයි තවදුරටත් හව්‍ය නොවන තෙක් විලම්බිත බදු වත්කමේ ධාරණ අගය අඩු කරනු ලබයි. හඳුනාගනු නොලැබ ඇති විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරන දිනක දීම යළි තක්සේරු කරන අතර අනාගත බදු වන ලාභ වලින් විලම්බිත බදු වත්කම් අයකර ගැනීමට ඇති හැකියාව දැන් හව්‍ය වන තාක් දුරට හඳුනා ගනු ලබයි.

වාර්තාකරණ දිනට නීතිගත කර ඇති හෝ ඉන්පසුව බොහෝ දුරට නීතිගත තත්වයට පත්ව ඇති බදු අනුපාත සහ බදු නීති පදනම් කරගෙන වත්කම් උපලබ්ධි වූ හෝ වගකීම් පියවූ වර්ෂයට උපයෝගී කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතය මත විලම්බිත බදු වත්කම් හා වගකීම් මනිනු ලැබේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| **ප්‍රවර්තන බදු වියදම්** | | | | | |
| ප්‍රවර්තන වර්ෂය | | **8,935,497** | – | **9,770,215** | 527,665 |
| පසුගිය වර්ෂ සඳහා (අධි)/ඌණ වෙන් කිරීම් | | **–** | (460,517) | **(105,378)** | (460,813) |
| **විලම්බිත බදු වියදම්** | | | | | |
| බදු අනුපාතිකවල වෙනසෙහි බලපෑම | | **–** | – | **–** | – |
| තාවකාලික වෙනස්වීම් | 13. (ආ) | **1,209,935** | (2,468,550) | **1,197,287** | (1,641,339) |
| පෙර වර්ෂයේ (අධි)/ඌණ ප්‍රතිපාදන | 13. (ආ) | **–** | – | **–** | (19,900) |
| **එකතුව** | | **10,145,432** | (2,929,067) | **10,862,124** | (1,594,388) |
| සඵල බදු අනුපාතිකය (%) | | **38.39** | (68.32) | **38.08** | (19.87) |
| සඵල බදු අනුපාතිකය (විලම්බිත බදු හැර) (%) | | **33.81** | (10.74) | **33.89** | 0.83 |

## 13. බදු වියදම් (සම්බන්ධයි)

### 13. (අ) බදු වියදම් සැසඳුම

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| බදු පෙර ලාභය | **26,430,676** | 4,287,416 | **28,521,937** | 8,022,421 |
| වර්ෂය සඳහා ආදායම් බදු (ගිණුම්කරණ ලාභය මත බදු අනුපාතය) | **7,929,203** | 1,286,225 | **8,556,581** | 2,406,726 |
| එකතුකළා: බදු කටයුතු සඳහා අඩු කළ නොහැකි වියදම් මගින් බදු සඳහා ඇතිවූ බලපෑම | **6,452,494** | 2,181,865 | **6,675,894** | 2,432,342 |
| :පාවිච්චි නොකල බදු අලාභ | **–** | 2,060,914 | **–** | 2,060,914 |
| අඩුකළා :බදු කටයුතු සඳහා අඩු කළහැකි වියදම් මගින් බදු සඳහා ඇතිවූ බලපෑම | **2,880,047** | 5,315,160 | **2,896,107** | 5,389,567 |
| :බදු නිදහස් ආදායම සඳහා බදු බලපෑම | **505,239** | 213,844 | **505,239** | 213,844 |
| :පාවිච්චි කල බදු අලාභ | **2,060,914** | – | **2,060,914** | 768,906 |
| **වර්ෂය සඳහා බදු වියදම** | **8,935,497** | – | **9,770,215** | 527,665 |
| **බදු අනුපාත (%)** | **30** | 30 | **30** | 30 |

### 13. (ආ) ආදායම් ප්‍රකාශයට ගලපන ලද විලම්බිත බදු (බැර)/වියදම සකස් වී ඇත්තේ පහත පරිදිය.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| විලම්බිත බදු වත්කම් | **1,209,935** | (2,468,550) | **1,199,900** | (2,471,349) |
| විලම්බිත බදු වගකීම් | **–** | – | **(2,613)** | 810,110 |
| **ආදායම් ප්‍රකාශයට ගලපන ලද විලම්බිත බදු (බැර)/වියදම** | **1,209,935** | (2,468,550) | **1,197,287** | (1,661,239) |

## 14 කොටසක ඉපැයුම

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමූහය විසින් එහි සාමාන්‍ය කොටස්වල මූලික හා තනුක කොටසක ඉපයීම් දත්ත ඉදිරිපත් කරනු ලබයි. බැංකුවේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන වර්ෂය සඳහා වූ ලාභය හෝ අලාභය එම වර්ෂය තුළ බලාත්මක හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙන් මූලික කොටසක ඉපයුම ගණනය කරනු ලැබේ. සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන වර්ෂය සඳහාවූ ලාභය හෝ අලාභය වර්ෂය තුළ බලාත්මක හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් ගණනින් බෙදා ඊට සියළුම තනුකික විභව සාමාන්‍ය කොටස් සඳහා වූ බලපෑම ගැලපීමෙන් තනුක කොටසක ඉපයුම ගණනය කෙරෙයි. 2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුව සතුව තනුකික විභව සාමාන්‍ය කොටස් නොමැත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| සාමාන්‍ය කොටස් හිමිකරුවන් සඳහා වන ශුද්ධ ලාභය | **16,285,244** | 7,216,483 | **17,659,813** | 9,616,809 |
| සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට බෙදාහරින ලද ශුද්ධ ලාභය තනුකවීමේ බලපෑම සඳහා ගැලපීමෙන් පසු | **16,285,244** | 7,216,483 | **17,659,813** | 9,616,809 |
| කොටසක මූලික ඉපයුම් සඳහා හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | **940,000** | 940,000 | **940,000** | 940,000 |
| තනුක වීමේ බලපෑම | **–** | – | **–** | – |
| තනුක වීමේ බලපෑම ගැලපීමෙන් පසු හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | **940,000** | 940,000 | **940,000** | 940,000 |
| **සාමාන්‍ය කොටසක මූලික ඉපයීම්** | **17.32** | 7.68 | **18.79** | 10.23 |
| **සාමාන්‍ය කොටසක තනුක ඉපයීම්** | **17.32** | 7.68 | **18.79** | 10.23 |

### 14. (අ) කොටසක මූලික හා තනුක ඉපයුම් සඳහා බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව

| | පවතින සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | | බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| ජනවාරි 01 දිනට නිකුත් වූ කොටස් සංඛ්‍යාව | **940,000** | 940,000 | **940,000** | 940,000 |
| එකතුකළා: වර්ෂය තුළ නිකුත් කළ කොටස් සංඛ්‍යාව | **–** | – | **–** | – |
| **කොටසක මූලික හා තනුක ඉපයුම් සඳහා බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | **940,000** | 940,000 | **940,000** | 940,000 |

## 15 ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.ගි.වා.ප්‍ර. 9) මූල්‍ය උපකරණ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වර්ගීකරණය යටතේ මූල්‍ය උපකරණවල ධාරන අගය පහත පරිදි සාරාංශගත කර ඇත.

### 15. (අ) බැංකුව 2024

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 16 | **8,358,742** | – | – | **8,358,742** |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | **357,054** | – | – | **357,054** |
| බැංකුවල ඇති තැන්පතු | 18 | **14,794,637** | – | – | **14,794,637** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | – | **9,131** | – | **9,131** |
| ණය සහ අත්තිකාරම් | 21 | **532,379,013** | – | – | **532,379,013** |
| ණය උපකරණ | 20, 22 සහ 23 | **1,039,034,572** | **20,874,049** | **47,900,345** | **1,107,808,966** |
| හිමිකම් උපකරණ | 20 සහ 23 | – | **212,732** | **5,568,833** | **5,781,565** |
| **මූල්‍ය වත්කම් එකතුව** | | **1,594,924,018** | **21,095,912** | **53,469,178** | **1,669,489,108** |

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | **487,521** | – | **487,521** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | – | **258,409** | **258,409** |
| **මූල්‍ය වගකීම්** | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 35 | **1,556,270,863** | – | **1,556,270,863** |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | 35 | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 35 | **48,190,057** | – | **48,190,057** |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | **16,966,482** | – | **16,966,482** |
| **මූල්‍ය වගකීම් එකතුව** | | **1,621,914,923** | **258,409** | **1,622,173,332** |

## 15. ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි)

### 15. (ආ) බැංකුව – 2023

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය<br>රු. '000 | ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද<br>රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කරන ලද<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 16 | 9,508,563 | – | – | 9,508,563 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 246,998 | – | – | 246,998 |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 22,576,750 | – | – | 22,576,750 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | – | 924 | – | 924 |
| ණය සහ අත්තිකාරම් | 21 | 526,520,530 | – | – | 526,520,530 |
| ණය උපකරණ | 20, 22 සහ 23 | 943,704,684 | 16,923,123 | 58,894,210 | 1,019,522,017 |
| හිමිකම් උපකරණ | 20 සහ 23 | – | 825,378 | 3,030,202 | 3,855,580 |
| **මූල්‍ය වත්කම් එකතුව** | | 1,502,557,525 | 17,749,425 | 61,924,412 | 1,582,231,362 |

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය<br>රු. '000 | ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|
| **වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | 8,984,779 | – | 8,984,779 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | – | 201 | 201 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවියයුතු | 35 | 1,482,532,430 | – | 1,482,532,430 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු | 35 | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු | 35 | 61,611,014 | – | 61,611,014 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | 23,806,514 | – | 23,806,514 |
| **මූල්‍ය වගකීම් එකතුව** | | 1,576,934,737 | 201 | 1,576,934,938 |

### 15. (ඇ) සමූහය – 2024

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය<br>රු. '000 | ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද<br>රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කරන ලද<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 16 | **8,544,416** | **–** | **–** | **8,544,416** |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | **357,117** | **–** | **–** | **357,117** |
| බැංකුවල ඇති තැන්පතු | 18 | **14,794,637** | **–** | **–** | **14,794,637** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | **–** | **54,892** | **–** | **54,892** |
| ණය සහ අත්තිකාරම් | 21 | **527,715,322** | **–** | **–** | **527,715,322** |
| ණය උපකරණ | 20, 22 සහ 23 | **1,048,965,769** | **46,536,796** | **49,366,765** | **1,144,869,330** |
| හිමිකම් උපකරණ | 20 සහ 23 | **–** | **212,732** | **5,939,747** | **6,152,479** |
| **මූල්‍ය වත්කම් එකතුව** | | **1,600,377,261** | **46,804,420** | **55,306,512** | **1,702,488,193** |

## 15. ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි)

### 15. (ඈ) සමූහය – 2024 (සම්බන්ධයි)

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | **487,521** | **–** | **487,521** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | **–** | **258,409** | **258,409** |
| **මූල්‍ය වගකීම්** | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවියයුතු | 35 | **1,556,681,918** | | **1,556,681,918** |
| – ණය සුරකුම්පත් හිමියන්ට ගෙවියයුතු | 35 | **–** | **–** | **–** |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු | 35 | **66,049,093** | **–** | **66,049,093** |
| නිකුත් කළ ණය සුරකුම්පත් | 37 | **17,039,651** | **–** | **17,039,651** |
| **මූල්‍ය වගකීම් එකතුව** | | **1,640,258,183** | **258,409** | **1,640,516,592** |

### 15. (ඈ) සමූහය – 2023

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 16 | 9,546,756 | – | – | 9,546,756 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 247,232 | – | – | 247,232 |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 23,618,966 | – | – | 23,618,966 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | – | 11,231 | – | 11,231 |
| ණය සහ අත්තිකාරම් | 21 | 523,809,104 | – | – | 523,809,104 |
| ණය උපකරණ | 20, 22 සහ 23 | 953,056,324 | 39,363,784 | 59,459,820 | 1,051,879,928 |
| හිමිකම් උපකරණ | 20 සහ 23 | – | 825,378 | 3,234,699 | 4,060,077 |
| **මූල්‍ය වත්කම් එකතුව** | | 1,510,278,382 | 40,200,393 | 62,694,519 | 1,613,173,294 |

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | 15,399,100 | – | 15,399,100 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | – | 201 | 201 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවියයුතු | 35 | 1,482,951,028 | | 1,482,951,028 |
| – ණය සුරකුම්පත් හිමියන්ට ගෙවියයුතු | 35 | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු | 35 | 72,891,598 | – | 72,891,598 |
| නිකුත් කළ ණය සුරකුම්පත් | 37 | 23,879,683 | – | 23,879,683 |
| **මූල්‍ය වගකීම් එකතුව** | | 1,595,121,409 | 201 | 1,595,121,610 |

## 16 මුදල් හා මුදල් සමානයන්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

වටිනාකම වෙනස්වීම නොසැලකිය හැකි තරම් වන අවදානමකට යටත් අතැති මුදල්, බැංකුවල ඇති තැන්පතු, කෙටි දැනුම් දීමකින් ලබාගත හැකි මුදල් යනාදිය මුදල් හා මුදල් සමානයන් යන්නට ඇතුළත්ය. දළ අගයෙන් හානිකරණ අඩු කොට මෙම මූල්‍ය වත්කම්වල වටිනාකම මූල්‍ය වාර්තාවල දක්වා ඇත. එම බැංකුවල බාහිර ශ්‍රේණිගත කිරීම් මත පදනම්ව ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 "මූල්‍ය උපකරණ" අනුව සමූහය විසින් හානිකර ප්‍රතිපාදන ගණනය කර ඇත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| අතැති මුදල් | **4,496,582** | 2,991,147 | **4,499,644** | 2,994,088 |
| බැංකුවල ඇති ශේෂයන් | **3,645,461** | 6,185,654 | **3,828,073** | 6,220,907 |
| කෙටි දැනුම් දීමකින් ආපසු ලබා ගතහැකි මුදල් | **217,246** | 333,054 | **217,246** | 333,054 |
| **දළ මුදල් හා මුදල් සමානයන් (*)** | **8,359,289** | 9,509,855 | **8,544,963** | 9,548,049 |
| අපේක්ෂිත ණය අලාභ හානිකරණය | **(547)** | (1,292) | **(547)** | (1,293) |
| **ශුද්ධ මුදල් හා මුදල් සමානයන් (*)** | **8,358,742** | 9,508,563 | **8,544,416** | 9,546,756 |

(*) දළ මුදල් සහ මුදල් සමානයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා ඇත.

## 17 මහ බැංකුව වෙතැති ශේෂයන්

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ව්‍යාවස්ථාපිත නොවන ශේෂයන් | | | | |
| ශ්‍රී ලංකා මහ බැංකුව | **357,054** | 246,998 | **357,117** | 247,232 |
| **එකතුව** | **357,054** | 246,998 | **357,117** | 247,232 |

## 18 බැංකුවල ඇති තැන්පතු

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

බැංකුව සහ සමූහය එහි කෙටිකාලීන බැඳීම් කළමනාකරණය සඳහා යොදවනු ලබන හා සාධාරණ අගය වෙනස්වීමේ අවදානම නොසැළකිය හැකි තරම් වන බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු මේ යටතට අයත් වේ. ඒවා මූල්‍ය ප්‍රකාශයන්හි ඒවායේ නාමික අගයට හෝ දළ වටිනාකමෙන් හානිකරණය අඩුකර අවශ්‍ය තැන්හි දක්වා ඇත. අදාළ බැංකුවේ බාහිර ශ්‍රේණිගත කිරීම් වලට අනුව ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 මූල්‍ය උපකරණ ප්‍රකාර සමූහය විසින් හානිකරණ ප්‍රතිපාදන ගණනය කර ඇත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| **ශ්‍රී ලංකාවේ බැංකු වල ඇති තැන්පතු** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | **–** | – | **–** | 1,042,367 |
| ඇමරිකානු ඩොලර් | **9,775,159** | 16,243,898 | **9,775,159** | 16,243,898 |
| යුරෝ | **1,790,922** | 2,009,359 | **1,790,922** | 2,009,359 |
| මහා බ්‍රිතාන්‍ය පවුම් | **1,964,241** | 1,764,938 | **1,964,241** | 1,764,938 |
| ඕස්ට්‍රේලියානු ඩොලර් | **1,272,894** | 1,827,454 | **1,272,894** | 1,827,454 |
| **ශ්‍රී ලංකාවෙන් පිටත බැංකු වල ඇති තැන්පතු** | | | | |
| ඇමරිකානු ඩොලර් | **–** | 738,430 | **–** | 738,430 |
| බැංකුවල ඇති දළ තැන්පතු | **14,803,216** | 22,584,079 | **14,803,216** | 23,626,446 |
| අඩුකළා: අපේක්ෂිත ණය අලාභ | **(8,579)** | (7,329) | **(8,579)** | (7,480) |
| බැංකුවල ඇති ශුද්ධ තැන්පතු | **14,794,637** | 22,576,750 | **14,794,637** | 23,618,966 |

## 19 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පොළී අනුපාතික, මූල්‍ය උපකරණවල මිල, වෙළඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාතික, ණය අවදානම් හා දර්ශක වල වෙනස්වීම් මත අගය, සකස් කර ගන්නා මූල්‍ය උපකරණ, ව්‍යුත්පන්නයන් වේ. ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති විට ව්‍යුත්පන්න, වෙළඳාම සඳහා ඇති ලෙස වර්ගීකරණය වෙයි. සමූහය විසින් පොළී අනුපාතික (swaps) හා විදේශ විනිමය ඉදිරි ගිවිසුම් යනාදි ව්‍යුත්පන්න භාවිතා කරනු ලබයි.

**ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්න**

ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත වන ව්‍යුත්පන්න හැරුණුවිට සෙසු ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කරන අතර, එකී සාධාරණ අගය ධනාත්මක වන්නේ නම් වත්කම් ලෙස සලකන අතර සාධාරණ අගය සෘණාත්මක වන්නේ නම් වගකීම් ලෙස සැලකෙයි. ව්‍යුත්පන්නවල සාධාරණ අගයේ වෙනස්වීම්, වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ආදායම්වල ඇතුළත් වේ.

**ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත ව්‍යුත්පන්න**

විදේශ විනිමය අනුපාතික හෝ පොළී අනුපාතික සම්බන්ධ අවදානම් රැකුම්ගත කිරීම සඳහා සමූහය විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වලට එළඹෙයි. මෙකී ව්‍යුත්පන්න සාධාරණ අගයට මනිනු ලබයි. ඉදිරි රැකුම් කාර්යක්ෂම වන අවස්ථාවලදී, සාධාරණ අගයට මනිනු ලැබූ ව්‍යුත්පන්න සහ පිරිවැයට/ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් හෝ වගකීම් මගින් මූල්‍ය ප්‍රකාශනය තුළ පැන නගින අස්ථාවර භාවය ඉවත් කිරීම සඳහා සමූහය විසින් ඉදිරි රැකුම් ගිණුම්කරණ නොගැලපීම් යොදා ගනී.

**මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම්**

වාර්තා කරනු ලබන සෑම කාලසීමාවක් අවසානයේදීම මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සාධාරණ අගයට ගණනය කරනු ලබයි.

## 19. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සම්බන්ධයි)

මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් ලෙස නම් කෙරෙන සහ එසේ නම් කිරීමට සුදුසු වන ව්‍යුත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම්වල සඵල කොටස, මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සාධාරණ අගයේ ලාභ/අලාභ යටතේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වනු ලැබේ. එසේ සඵල නොවන කොටසකට අදාළ සාධාරණ අගයෙහි කිසියම් ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශයෙන් එක්වරම හඳුනාගනු ලැබේ.

ඉදිරි රැකුම් අයිතම මගින් ලාභය හෝ අලාභයට බලපෑමක් ඇති කෙරෙන කාල සීමාවන්හි දී වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති සමුච්චිත ලාභ හෝ අලාභ, ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කරනු ලබයි. කෙසේ වුවද ඉදිරි රැකුම්ගත පුරෝකථන ගනුදෙනුවල ප්‍රතිඵල ලෙස මූල්‍ය නොවන වත්කම් හෝ මූල්‍ය නොවන වගකීමක් හඳුනා ගැනෙන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි කලින් හඳුනාගන්නා ලද ලාභ හා අලාභ, හිමිකම් වෙතින් ඉවත්කර වත්කමෙහි හෝ වගකීමෙහි මූලික පිරිවැය ගණනය කිරීමෙහි ඇතුළත් කරනු ලබයි.

ඉදිරි රැකුම්ගත උපකරණයක් කල් ඉකුත්වන විට හෝ විකුණනු ලබන විට හෝ ඉදිරි රැකුමක් තවදුරටත් අදාළ ගිණුම්කරණ නිර්නායක සමග අනුකූල නොවන විට ආදායම් ප්‍රකාශයෙහි පුරෝකථන ගනුදෙනුව හඳුනා ගැනෙන තෙක් ඒ වන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති කිසියම් සමුච්චිත ලාභයක් හෝ අලාභයක් හිමිකම් වෙත රඳවා ගැනෙයි. පුරෝකථන ගනුදෙනුවක් තවදුරටත් සිදු වෙතැයි අපේක්ෂා නොකරන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගනු ලැබ ඇති සමුච්චිත ලාභය හෝ අලාභය, එක්වරම ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලබයි.

### 19.1 ව්‍යුත්පන්න වත්කම්

| දෙසැම්බර් 31 දිනට | සටහන | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| **විදේශ විනිමය ව්‍යුත්පන්න** | | | | | |
| විනිමය හුවමාරු කිරීම් | 48.2 | **9,131** | 924 | **9,131** | 924 |
| වෙනත් | | **–** | – | **45,761** | 10,307 |
| **එකතුව** | | **9,131** | 924 | **54,892** | 11,231 |

## 20 ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය වත්කමක් ප්‍රධාන වශයෙන් අත්පත් කරගෙන ඇත්තේ නුදුරු කාලයේදී විකිණීමේ හෝ ප්‍රතිමිළදී ගැනීමේ අරමුණින් හෝ කෙටිකාලීන ලාභාපේක්ෂාවන් එක්ව කළමනාකරණය කරනු ලබන ආයෝජන කළඹක කොටසක් ලෙස රඳවා තබාගෙන ඇති විට හෝ සාධාරණ අගයට වාර්තා කර ඇති විට ඒවා ලාභය/අලාභය මගින් හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ඉදිරි රැකුම් ගිවිසුම් යටතේ ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් නොකරන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ද මෙම කාණ්ඩයට ඇතුළත් වේ. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 – මූල්‍ය උපකරණ අනුව වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේ නම් හැර මූල්‍ය වත්කම් ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මනිනු ලබයි.

ලාභය/අලාභය හරහා හඳුනාගනු ලබන මූල්‍ය වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ අගයෙහි වෙනස්වීම්, වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභ/අලාභ යටතේ හඳුනාගනු ලබන අතර ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාර හෝ ගෙවීම් සිදු කිරීමේ අයිතිය ස්ථාපිත වූ පොළී ආදායම් හා වියදම් ශුද්ධ පොළී ආදායමෙහි වාර්තා කරයි. ලාභාංශ ආදායම හා උපලබ්ධි ලාභ/අලාභ වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභ/අලාභ යටතේ වාර්තා කෙරෙයි.

නුදුරු කාලයේදී විකිණීමට ඇති අපේක්ෂාව තව දුරටත් අදාළ වන්නේ දැයි තීරණය කිරීමට සමූහය විසින් ව්‍යුත්පන්නයන් නොවන ලාභය/අලාභය හරහා හඳුනාගත් මූල්‍ය වත්කම් අගයනු ලබයි. සක්‍රීය වෙළඳපළක් නොමැතිවීම හේතුකොට ගෙන මෙම මූල්‍ය වත්කම් වෙළඳාම් කිරීමට අපොහොසත් වනවිට සහ නුදුරු අනාගතයේදී ඒවා විකිණීම සඳහා වන කළමනාකරණ අපේක්ෂාව සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති විට, සමූහයට ඉතා විරල අවස්ථාවන්හි දී පමණක් මෙම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය සඳහා සලකා බැලිය හැකිය.

## 20. ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

| දෙසැම්බර් 31 දිනට | සටහන | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| **සාධාරණ අගයට ගණනය කළ** | | | | | |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | **20,141,100** | 13,916,242 | **30,774,770** | 28,560,671 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | **732,949** | 3,006,881 | **15,762,026** | 10,803,113 |
| හිමිකම් සුරැකුම්පත් | 20(ආ) | **212,732** | 825,378 | **212,732** | 825,378 |
| ඒකක භාර | | **–** | – | **–** | – |
| **උප එකතුව** | | **21,086,781** | 17,748,501 | **46,749,528** | 40,189,162 |
| **සාධාරණ අගයට ගණනය කළ** | | **–** | – | **–** | – |
| **එකතුව** | | **21,086,781** | 17,748,501 | **46,749,528** | 40,189,162 |

## 20. (අ) විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|
| **සුරැකුම්කරණය තුළින්** | | | | |
| සුරැකුම් ලෙස ගිවිසින ලද | **–** | – | **25,662,748** | 19,493,329 |
| තබා නොමැත | **21,086,781** | 17,748,501 | **21,086,780** | 20,695,833 |
| **එකතුව** | **21,086,781** | 17,748,501 | **46,749,528** | 40,189,162 |
| **ව්‍යවහාර මුදල් ඒකක වශයෙන්** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | **21,086,781** | 17,748,501 | **46,749,528** | 40,189,162 |
| ඇමෙරිකානු ඩොලර් | **–** | – | **–** | – |
| **එකතුව** | **21,086,781** | 17,748,501 | **46,749,528** | 40,189,162 |

## 20. ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 20. (ආ) හිමිකම් සුරැකුම්පත් (නිල ලැයිස්තුගත) – බැංකුව හා සමූහය

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් ගණන | පිරිවැය රු. '000 | වෙළඳ අගය රු. '000 | කොටස් ගණන | පිරිවැය රු. '000 | වෙළඳ අගය රු. '000 |
| **1. බැංකු ක්ෂේත්‍රය** | | | | | | |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ඡන්දය රහිත) | – | – | – | 430,634 | 35,420 | 34,623 |
| ඩී. එෆ්. සී. සී. බැංකුව | – | – | – | 529,196 | 45,434 | 42,124 |
| හැටන් නැෂනල් බැංකුව පීඑල්සී (ඡන්දය රහිත) | – | – | – | 624,232 | 91,537 | 87,393 |
| සම්පත් බැංකුව පීඑල්සී | – | – | – | 1,000,000 | 71,750 | 70,500 |
| සෙලාන් බැංකුව පීඑල්සී (ඡන්දය රහිත) | – | – | – | 500,000 | 21,500 | 17,750 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව පීඑල්සී | – | – | – | 500,000 | 54,100 | 53,750 |
| ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී | – | – | – | 960,522 | 70,683 | 62,338 |
| **උප එකතුව** | | – | – | | 390,424 | 368,478 |
| **2. ප්‍රාග්ධන භාණ්ඩ ක්ෂේත්‍රය** | | | | | | |
| ඇක්සෙස් ඉන්ජිනියරින් පීඑල්සී | **2,016,000** | **62,271** | **69,552** | – | – | – |
| ඒ.සී.එල්. කේබල්ස් පීඑල්සී | – | – | – | 1,594,338 | 169,711 | 109,691 |
| ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී | **5,300,000** | **102,849** | **119,780** | – | – | – |
| ලංකා වෝල්ටයිල්ස් පීඑල්සී | – | – | – | 644,999 | 45,868 | 27,219 |
| රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී | – | – | – | 950,000 | 66,918 | 25,080 |
| **උප එකතුව** | | **165,120** | **189,332** | | 282,497 | 161,990 |
| **3. විවිධාංගකෘත මූල්‍ය ක්ෂේත්‍රය** | | | | | | |
| වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී | – | – | – | 650,000 | 26,386 | 20,800 |
| **උප එකතුව** | | – | – | | 26,386 | 20,800 |
| **4. බලශක්ති** | | | | | | |
| ලංකා අයි.ඕ.සී. පීඑල්සී | – | – | – | 538,630 | 35,957 | 54,940 |
| **උප එකතුව** | | – | – | | 35,957 | 54,940 |
| **5. ආහාරපාන හා දුම්කොළ ක්ෂේත්‍රය** | | | | | | |
| සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් පීඑල්සී | – | – | – | 200,000 | 9,600 | 8,480 |
| **උප එකතුව** | | – | – | | 9,600 | 8,480 |
| **6. ද්‍රව්‍ය** | | | | | | |
| ටෝකියෝ සිමෙන්ට් කම්පනි (ලංකා) පීඑල්සී (ඡන්දය රහිත) | – | – | – | 150,000 | 5,475 | 5,700 |
| ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් පී එල් සී | – | – | – | 1,393,313 | 72,042 | 38,873 |
| සී.අයි.සී. හෝල්ඩින්ග්ස් පීඑල්සී | – | – | – | 1,005,257 | 88,030 | 64,337 |
| චවුරෝන් ලූබ්‍රිකන්ට්ස් ලංකා පීඑල්සී | – | – | – | 709,957 | 84,781 | 64,109 |
| **උප එකතුව** | | – | – | | 250,328 | 173,019 |
| **7. විදුලි සංදේශ සේවා ක්ෂේත්‍රය** | | | | | | |
| ඩයලොග් ඇක්සියාටා පීඑල්සී | **2,000,000** | **22,400** | **23,400** | – | – | – |
| **උප එකතුව** | | **22,400** | **23,400** | | – | – |

## 20. ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 20. (ආ) හිමිකම් සුරකුම්පත් (නිල ලැයිස්තුගත) – බැංකුව හා සමූහය (සම්බන්ධයි)

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් ගණන | පිරිවැය රු. '000 | වෙළඳ අගය රු. '000 | කොටස් ගණන | පිරිවැය රු. '000 | වෙළඳ අගය රු. '000 |
| 11. ප්‍රවාහන | | | | | | |
| එක්ස්පෝ ලංකා හෝල්ඩින්ග්ස් පීඑල්සී | – | – | – | 124,846 | 17,432 | 17,884 |
| උප එකතුව | | | | | 17,432 | 17,884 |
| 12. උපයෝගිතා | | | | | | |
| එල් වී එල් එනර්ජි ෆන්ඩ් පීඑල්සී | – | – | – | 3,597,704 | 35,977 | 19,787 |
| උප එකතුව | | – | – | | 35,977 | 19,787 |
| එකතුව | | **187,520** | **212,732** | | 1,048,601 | 825,378 |

## 21 ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ණය හා අත්තිකාරම් අතරට පහත දෑ හැර සක්‍රීය වෙළඳපළක මිල ප්‍රකාශ කර නොමැති ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් අයත් වේ.

- සමූහය විසින් වහාම හෝ නුදුරු කාලයේදී විකිණීමට අපේක්ෂිත හෝ මූලික හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ දෑ.
- සමූහය විසින් මූලික හඳුනා ගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් ලෙස නම් කල දෑ.

ණය හා අත්තිකාරම් යන්නට බැංකුවලින් හා වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබියයුතු වටිනාකම් අයත් වේ. මූලික ගණනය කිරීම් වලින් අනතුරුව ණය හා අත්තිකාරම්, සඵල පොළී අනුපාතික භාවිත කරමින් අගය අඩුවීම සඳහා හානිකරණ ප්‍රතිපාදන තබමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන්නේ සඵල පොළී අනුපාතිකයෙහි සංකලිත කොටසක් වන ගාස්තු සහ පිරිවැය හා අත්පත් කර ගැනීමේදී අත්වන කිසියම් වට්ටමක් හෝ අධිමිලක් සැලකිල්ලට ගැනීමෙනි. ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම් යටතට ක්‍රමක්ෂය අන්තර්ගත වේ. හානිකරණය මගින් උද්ගතවූ අලාභ ආදායම් ප්‍රකාශයෙහි ණය සහ අනෙකුත් අලාභ හානිකරණ යටතේ වාර්තා කරනු ලබයි.

2018 ජනවාරි මස 01 දින සිට පහත සඳහන් කොන්දේසි ද්විත්වයට අදාල වන අවස්ථාවලදී බැංකුව විසින් ණය හා අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැයට පමණක් මනිනු ලබයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම පිණිස මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ ඇතිව ව්‍යාපාරික ආකෘතියක් තුළ මූල්‍ය වත්කම් රඳවා ගනු ලබයි.
- මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත නියමයන් මගින් ගෙවියයුතු මුල් මුදල මත පොළිය හා මුල් මුදලෙහි පූර්ණ ගෙවීම් සඳහා මූල්‍ය ප්‍රවාහ නිශ්චිත දිනවල එළඹේ.

ව්‍යාවහාරික ආකෘතියෙහි විස්තර පිටු අංක 254 සහ 255 හි දක්වා ඇති සටහන් අංක 2.5.1.4.1 හා 2.5.1.4.2 හි දැක්වේ.

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

| දෙසැම්බර් 31 දිනට | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2024** රු. '000 | 2023 රු. '000 | **2024** රු. '000 | 2023 රු. '000 |
| **දළ ණය හා අත්තිකාරම්** | | | | |
| 1 අදියර | **492,507,588** | 490,248,344 | **487,777,387** | 487,393,234 |
| 2 අදියර | **19,128,165** | 31,529,180 | **19,183,611** | 31,657,602 |
| 3 අදියර | **49,677,946** | 27,120,378 | **51,077,085** | 28,545,272 |
| **දළ ණය හා අත්තිකාරම්** | **561,313,699** | 548,897,902 | **558,038,083** | 547,596,108 |
| **අඩුකළා: පහත පරිදි සමුච්චිත හානිකරණය** | | | | |
| 1 අදියර | **4,700,749** | 4,426,656 | **4,703,623** | 4,435,168 |
| 2 අදියර | **2,129,055** | 3,501,809 | **2,133,932** | 3,525,267 |
| 3 අදියර | **22,104,882** | 14,448,907 | **23,485,206** | 15,826,569 |
| **මුළු හානිකරණය** | **28,934,686** | 22,377,372 | **30,322,761** | 23,787,004 |
| **ශුද්ධ ණය හා අත්තිකාරම්** | **532,379,013** | 526,520,530 | **527,715,322** | 523,809,104 |

2024 වර්ෂය සඳහා ණය හා අත්තිකාරම්වලට රු.මි 65,981 ක් වූ භාණ්ඩාගාර සහතිකය ලත් ණය ඇතුළත් විය. එවැනි ණය සඳහා අදාළ වන LGD අගය 0 වන බැවින් ඒ සඳහා හානිකරණ ප්‍රතිපාදනය ද 0 විය.

## 21. (අ) නිමැවුම් අනුව විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | සටහන | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | **2024** රු. '000 | 2023 රු. '000 | **2024** රු. '000 | 2023 රු. '000 |
| **නිමැවුම් අනුව** | | | | | |
| වෙළඳ මූල්‍ය | | **–** | – | **–** | – |
| කල් බදු කුලී හා ලැබිය යුතු කුලී පිට ගැනුම් | (21.ඉ) | **–** | – | **25,911** | 74,111 |
| උකස් | | **119,692,775** | 94,935,475 | **119,692,803** | 94,935,503 |
| සේවක මණ්ඩල ණය | | **16,307,926** | 15,219,547 | **16,648,714** | 15,557,481 |
| කාලීන ණය | | | | | |
| කෙටි කාලීන | | **95,669** | 206,092 | **95,669** | 206,092 |
| දිගු කාලීන | | **384,286,416** | 428,838,174 | **385,812,874** | 430,466,687 |
| වෙනත් | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | **–** | – | **–** | – |
| රජයට ණය ලබාදීම් | | **–** | – | **–** | – |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් | | **40,930,913** | 9,698,614 | **35,762,112** | 6,356,234 |
| **දළ එකතුව** | | **561,313,699** | 548,897,902 | **558,038,083** | 547,596,108 |

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (ආ) ව්‍යවහාර මුදල් වශයෙන් විශ්ලේෂණය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **ව්‍යවහාර මුදල් වශයෙන්** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | **557,795,130** | 545,097,593 | **554,519,514** | 543,795,799 |
| ඇමරිකානු ඩොලර් | **3,518,569** | 3,800,309 | **3,518,569** | 3,800,309 |
| දළ එකතුව | **561,313,699** | 548,897,902 | **558,038,083** | 547,596,108 |

### 21. (ඇ) කර්මාන්ත වශයෙන් විශ්ලේෂණය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **කර්මාන්ත වශයෙන්** | | | | |
| කෘෂිකාර්මික සහ ධීවර | **36,406,612** | 33,935,917 | **36,572,677** | 34,249,380 |
| නිෂ්පාදන | **–** | – | **587,812** | 569,274 |
| සංචාරක | **70,349** | 73,354 | **115,389** | 125,031 |
| ප්‍රවාහන | **–** | 16,019 | **15,415** | 53,126 |
| ඉදිකිරීම්/නිවාස | **173,805,328** | 180,302,455 | **174,296,676** | 180,635,738 |
| වෙළඳාම් | **–** | – | **391,901** | 369,412 |
| නව ආර්ථිකය | **–** | – | **27,269** | 21,717 |
| **වෙනත්** | | | | |
| මූල්‍ය හා ව්‍යාපාරික සේවා | **42,893,107** | 9,908,156 | **42,893,107** | 9,908,156 |
| යටිතල | **53,544,313** | 61,075,939 | **53,544,313** | 61,075,939 |
| විදුලිබල හා බලශක්ති | **4,026,768** | 5,698,971 | **4,026,768** | 5,698,971 |
| අධ්‍යාපනය | **8,764,010** | 8,876,295 | **8,764,010** | 8,876,295 |
| පුද්ගලික/උකස්/වෙනත් | **241,803,212** | 249,010,796 | **236,802,746** | 246,013,069 |
| දළ එකතුව | **561,313,699** | 548,897,902 | **558,038,083** | 547,596,108 |

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (ඇ) වර්ෂය තුළ හානිකරණයන්ගේ වෙනස්වීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

**කේවල හානිකරණ ඇගයීම.**

ක්‍රමක්ෂය පිරිවැයට පවතින (බැංකුවලින් අයවිය යුතු මුදල්, ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා ලැබිය යුතු දෑ මෙන්ම ක්‍රමක්ෂය පිරිවැය ඇති මූල්‍ය වත්කම් – ණය සහ වෙනත් උපකරණ) මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, වෙන් වෙන්ව ගත්විට හෝ සාමූහිකව ගත්විට සැලකිය යුතු මූල්‍ය වත්කම්වල හානිකරණය පිළිබඳ හෝ වෙන් වෙන්ව ගත්විට සැලකිය යුතු නොවන මූල්‍ය වත්කම් වල හානිකරණය පිළිබඳ විෂයය මූලික සාක්ෂි ඇත්දැයි සමූහය විසින් පළමුව ඇගයීමක් සිදුකරනු ලබයි. වෙන් වෙන්ව ඇගයීමක් සිදුකරන ලද මූල්‍ය වත්කම්වල හානිකරණය සම්බන්ධයෙන් විෂය මූලික සාක්ෂි නොමැති බවට සමූහය තීරණය කරන්නේ නම් එකී වත්කම් සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුලත් කර, ඒ සියල්ලම හානිකරණය පිළිබඳ සාමූහික ඇගයීමකට ලක් කරයි.

වෙන් වෙන් වශයෙන් හානිකරණය සම්බන්ධව කළ ඇගයීමේදී හානිකරණය පිළිබඳ අගය අඩුවීම් ඇති බවට හෝ දිගටම පවතින බවට හඳුනා ගන්නා මූල්‍ය වත්කම් මෙකී සාමූහික ඇගයීමට යොදා නොගනී.

හානිකරණයක් සිදුවී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්නම්, වත්කමෙහි ධාරණ අගය සහ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයෙහි වත්මන් අගය (දැනට ඇති නොවුණු අනාගතයේදී ඇති විය හැකි බවට අපේක්ෂිත ණය පාඩු හැරුණු කොට) අතර වෙනස අනුව එකී අලාභය මනිනු ලබයි. වත්කමෙහි ධාරණ අගය ගැලපීම හානිකරණ ප්‍රතිපාදන ගිණුමක් මගින් අඩු කරනු ලබන අතර, ආදායම් ප්‍රකාශයෙහි එම අලාභය වාර්තා කරනු ලබයි. හානිකරණය වන්නා වූ අලාභ ගණනය කිරීමේ අරමුණ සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතය භාවිතා කරමින් වත්කමෙහි අඩුකළ ධාරණ අගය මත පොළී ආදායම නොකඩවා උපචිත කිරීම සිදු කරයි. පොළී සහ සමාන ආදායම්හි, කොටසක් ලෙස පොළී ආදායම වාර්තා කෙරෙයි.

ඇස්තමේන්තු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි වත්මන් අගය මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාත මත වට්ටම් කරනු ලබයි. යම් ණය මුදලක පොළී අනුපාතය විචල්‍ය නම්, හානිකරණ අගය ගණනය කිරීම සඳහා වත්මන් සඵල පොළී අනුපාතය යොදා ගනී. සමූහය විසින් ගනුදෙනු කළ හැකි වත්කම්, ණය හා ලැබිය යුතු දෑ ලෙස නැවත වර්ගීකරණය කර ඇත්නම් හානිකරණ අලාභ ගණනය කිරීම සඳහා යොදා ගන්නේ යළි වර්ගීකරණ දිනයේදී තීරණය කරනු ලබන නව සඵල පොළී අනුපාතයයි. සුරැකුම් වශයෙන් තබන ලද මූල්‍ය වත්කම්වල ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකමට ගණනය කිරීමේදී එම උකස් තබන ලද දේපළ විකිණීමට හැකි හෝ නොහැකි වුවද, අදාළ මුදල් ප්‍රවාහයෙන් තීරණය වන්නේ එම සුරැකුම් ලබාගැනීමේ හා විකිණීමේ පිරිවැය අඩුකළ වටිනාකමය.

අනාගතයේදී යළි අයකර ගතහැකි බවට යථාර්තවාදී අදහසක් නොමැතිවිට සහ සියලු සුරක්ෂිතයන් උපලබ්ධි වී ඇති විට හෝ සමූහයට මාරුකර ඇති විට ණය ඊට අනුබද්ධ ගැලපීම් මගින් ලියා හැරීම සිදුකරනු ලැබේ. පසුකාලීන වර්ෂයකදී හානිකරණය සඳහා අදාළ ගැලපීම් සිදුකිරීමෙන් පසු සිදුවූ සිද්ධියක් නිසා තක්සේරු කරන ලද හානිකරණ අලාභය ඉහළ යාමක් හෝ පහළ යාමක් සිදුවුවහොත් ගැලපුම් ගිණුම ගලපා මීට පෙර හඳුනාගත් හානිකරණ පාඩුව වැඩිකිරීම හෝ අඩුකිරීම සිදු කරනු ලබයි. අනාගතයේදී, ලියාහරින ලද හානිකරණයන් අය කර ගනු ලැබුවහොත් එය වෙනත් මෙහෙයුම් ආදායමට බැර කරනු ලබයි.

**සාමූහික හානිකරණ ඇගයීම**

තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිකරණය පිළිබඳ සාක්ෂි නොමැති බව සමූහය තීරණය කරන්නේ නම්, එය සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක වත්කම් ඇතුලත් වන අතර ඒවා සාමූහික හානිපූරණය සඳහා තක්සේරු කරයි.

දුර්වලතා සඳහා සාමූහිකව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සමූහයක් මත ආනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේදී සමූහයේ ඒවාට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත වත්කම් සඳහා අපේක්ෂිත අලාභ අත්දැකීම් පදනම් වේ., අපේක්ෂිත අලාභ අත්දැකීම වර්තමාන නිරීක්ෂණ දත්ත මත පදනම්ව සකස් කරනු ලබන්නේ වත්මන් තත්වයන්ගේ බලපෑම පිළිබිඹු කිරීම සඳහා ඓතිහාසික අලාභ අත්දැකීම් පදනම් වී ඇති අතර ඓතිහාසික කාලපරිච්ඡේදයේ නොපවතින තත්වයන්ගේ බලපෑම ඉවත් කිරීම සඳහාය. අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි තක්සේරු කළ වෙනස්වීම්, වසරින් වසර නිරීක්ෂණය කළ හැකි අත්තවලට, සම්බන්ධ වෙනස්වීම් (විරැකියා අනුපාත, දේපළ මිල, පාරිභෝගික භාණ්ඩ මිල, ගෙවීමේ තත්ත්වයන් හෝ කාණ්ඩයට ඇති වූ අලාභ හා ඒවායේ ප්‍රමාණය දක්වන වෙනත් කරුණු ආදියේ වෙනස්වීම්) පිළිබිඹු කරයි. තක්සේරු කරන ලද අලාභ හා සත්‍ය අලාභ අත්දැකීම් අතර වෙනස්කම් අවම කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ තක්සේරු කිරීම සඳහා යොදගනු ලබන ක්‍රමවේද හා උපකල්පන නිරතුරුව සමාලෝචනය කෙරෙයි.

**ණය හා ලැබියයුතු දෑ කපා හැරීම**

ශ්‍රී ල.ගි.ප්‍ර. 39 යටතේ වූ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේද එලෙසම පවතී. අයකරවා ගැනීමට හැකි සෑම පියවරක්ම ගෙන අවසන් වූ පසුව සහ ආපසු ණය අයකර ගැනීමේ යථාර්ථවාදී පසුබිමක් නොමැති අවස්ථාවලදී සාමාන්‍යයෙන් මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් ණය කපා හරිනු ලැබේ. ණය සඳහා සුරැකුම් ඇති විට සාමාන්‍යයෙන් සුරැකුම් උපලබ්ධියෙන් මුදල් ලැබීමෙන් පසු කරනු ලැබේ. කපා හැරිය යුතු දීමනාව සමුච්චිත අලාභ දීමනාවට වඩා වැඩිවන අවස්ථාවකදී එකී වෙනස, දීමනාවට එක් වියයුතු එකතුවක් ලෙස පළමුව සලකනු ලබන අතර, අනතුරුව දළ ධාරණ අගයට එරෙහිව යොදාගනු ලැබේ. කපාහැරීමක් පසුව හඳුනාගත හොත් එය වෙනත් මෙහෙයුම් ආදායමට බැර කෙරෙයි.

**සුරැකුම් තක්සේරුකරණය**

මූල්‍ය වත්කම්වල අවදානම අවම කර ගැනීම පිණිස සමූහය විසින් හැකි අවස්ථාවලදී සුරැකුම් උපයෝගී කරගනු ලබයි. මුදල්, රත්රන්, රාජ්‍ය සුරැකුම්පත් යනාදී විවිධ ස්වරූපයෙන් සුරැකුම් පවතියි. මෙලෙස සුරැකුම් ලෙස රඳවාගනු ලබන මූල්‍ය වත්කම් ආගණනය කිරීම සඳහා බැංකුව විසින් හැකිතාක් දුරට සක්‍රීය වෙළඳපළ දත්ත උපයෝගී කර ගනු ලබයි.

හානිකරණ ප්‍රතිපත්ති පිළිබඳ විස්තර පිටු අංක 258 හි සටහන් අංක 2.5.2 මගින් දැක්වේ.

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (ඈ) වර්ෂය තුළ හානිකරණයන්ගේ වෙනස්වීම් (සම්බන්ධයි)

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **1 අදියර** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | **4,426,656** | 4,691,568 | **4,435,168** | 4,713,720 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම | **274,093** | (264,912) | **268,455** | (278,552) |
| වර්ෂය තුළ කපාහැරීම් | **–** | – | **–** | – |
| වෙනත් සංචලන | **–** | – | **–** | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **4,700,749** | 4,426,656 | **4,703,623** | 4,435,168 |
| **2 අදියර** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | **3,501,809** | 2,623,411 | **3,525,267** | 2,666,511 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම | **(1,372,754)** | 878,398 | **(1,391,335)** | 858,756 |
| වර්ෂය තුළ කපාහැරීම් | **–** | – | **–** | – |
| වෙනත් සංචලන | **–** | – | **–** | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,129,055** | 3,501,809 | **2,133,932** | 3,525,267 |
| **3 අදියර** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | **14,448,907** | 9,913,436 | **15,826,569** | 11,370,985 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම | **7,698,282** | 4,581,239 | **7,710,325** | 4,515,514 |
| වර්ෂය තුළ කපාහැරීම් | **(42,307)** | (45,768) | **(42,307)** | (48,022) |
| වෙනත් සංචලන | **–** | – | **(9,381)** | (11,908) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **22,104,882** | 14,448,907 | **23,485,206** | 15,826,569 |
| **දෙසැම්බර් 31 දිනට මුළු හානිකරණ ප්‍රතිපාදන** | **28,934,686** | 22,377,372 | **30,322,761** | 23,787,004 |

### 21. (ඉ) ලැබිය යුතු කල්බදු හා කුලී පිට ගැණුම්

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| ලැබිය යුතු දළ කල්බදු හා කුලී පිට ගැණුම් | **–** | – | **26,570** | 74,770 |
| නොපියයූ පොලී වත්කම් | **–** | – | **6,592** | 13,819 |
| නොපියයූ පොලී වගකීම් | **–** | – | **(7,251)** | (14,478) |
| **ශුද්ධ ලැබිය යුතු කල්බදු හා කුලී පිට ගැණුම්** | **–** | – | **25,911** | 74,111 |

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (ඊ) ඉදිරි දැක්මැති තොරතුරු

ණය කළඹට අදාළ ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් තීරණය කිරීම සඳහාත්, යම්කිසි කාල පරාසයක් තුළ පවතින පරාමිතීන් තීරණය කිරීම සඳහා ඉදිරි දැක්මැති තොරතුරු ගැලපිය යුතු ප්‍රමාණය තීරණය කිරීමේදී සැලකිය යුතු විනිශ්චයන් කළයුතු වේ. කාල පරාසයක් තුළ පවතින පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) පැහැර හැරීමට නිරාවරණයවීම (EAD) පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) යම්කිසි අවස්ථාවක පවතින පරාමිතීන් බවට පරිවර්තනය කිරීම සඳහා භාවිතා කරන ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ගේ වෙනස්වීම එක්තරා කාලපරාසයකදී අපේක්ෂිත ණය පාඩු දීමනා වැඩිකිරීමට හෝ අඩු කිරීමට හේතු විය හැකි අතර ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් ණය සිතියම්ගත කිරීමෙහි වෙනස්කම් කලාතුරකින් අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අපගේ අනාවැකි කාර්තුමය පදනමින් යාවත්කාලීන වන බැවින් කිසියම් නිශ්චිත අවස්ථාවක පවතින පරාමිතීන් ගණනය කිරීම සඳහා භාවිතා කරන විශේෂිත ඉදිරි දැක්මැති තොරතුරු පරාමිතීන්හි වෙනස්කම් නිතර සිදු කෙරේ. ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්හි අශුභවාදී මට්ටමේ වැඩිවීම අපේක්ෂිත ණය පාඩු වැඩි කිරීමට හේතු වන අතර ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්හි සුභවාදී වෙන්වීම් අපේක්ෂිත ණය පාඩුවෙහි අඩුවීමට හේතු වේ. මෙම වැඩිවීම් හා අඩුවීම් කිසියම් විශේෂිත කාල පරිච්ඡේදයක් තුළ සැලකිය යුතු විය හැකි අතර අනාගතය පිළිබඳ අපගේ දැක්ම වෙනස් වන කාල පරිච්ඡේදයේදී එය සිදුවීමට පටන් ගනී

ප්‍රධාන ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ට දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, විරැකියා අනුපාතය, උද්ධමන අනුපාතය, විනිමය අනුපාතය, පොලී අනුපාතය ඇතුළත් වේ. අපගේ ණය කළඹේ බහුතරයක් සඳහා ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් පිළිබඳ පුරෝකථනයන් ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී අපගේ කළමනාකාරිත්වය විසින් අභ්‍යන්තර සැලසුම් සහ පුරෝකථනයන් සඳහා යොදාගනු ලබන මූලික සිද්ධි සහ ඇතිවීමේ වැඩි සම්භාවිතාවයක් ඇති සිද්ධි යොදා ගැනේ. මූලික සිද්ධි සැකසීමේදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර සංවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුව වැනි මූල්‍ය බලධාරීන්ගේ මෙන්ම පෞද්ගලික අංශයේ ආර්ථික විද්‍යාඥයින්ගේ පුරෝකථනයන් අපි සලකා බලන්නෙමු. ඇති විය හැකි මූලික සිද්ධි තත්ත්වයට ඉහළින් සහ පහළින් ඇති බාහිර පුරෝකථනයන් සහ කළමනාකරණ විනිශ්චයන් යොදා ගනිමින් වාසිදායක සිද්ධි තත්ත්වය සහ අවාසිදායක සිද්ධි තත්වයන්ට අදාළව සම්භාවිතාවය බර තැබීම සඳහා අප විසින් කළමනාකරණ විනිශ්චයන් යොදා ගැනේ. ඉදිරි දැක්මැති තොරතුරු පිළිබඳ අපගේ අපේක්ෂාව සුබවාදී නොවීම සිදුවිය හැකි අවාසි සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය වැඩිවීමක් හෝ වාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය අඩුවීම ඇස්තමේන්තුගත අපේක්ෂිත ණය පාඩු දීමනාව වැඩි කරයි.

ඊට හාත්පසින්ම වෙනස්ව, පුරෝකථනය කරන ලද ඉදිරි දැක්ම තොරතුරු පිළිබඳ අපගේ දෘෂ්ටියේ වැඩි දියුණුවක්, වාසිදායක සිද්ධි තත්වයේ සම්භාවිතාවය වැඩිවීමක් හෝ අවාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය අඩුවීමක් ප්‍රතිවිරුද්ධ බලපෑමක් ඇති කරයි. විචල්‍යයන්ගේ අන්තර් සම්බන්ධතාවය, යම් සිද්ධියකට ආවේණික වූ අශුභවාදී මට්ටම සහ එය සම්භාවිතාවයේ අන්තර් සම්බන්ධතාවය හේතුවෙන්, යම් සිද්ධියකට අදාළව පවතින විවිධ ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ගේ වෙනස්වීමේ බලපෑම අර්ථවත් ලෙස වෙන් වෙන්ව ගත නොහැක. අපගේ පුරෝකථන මගින් ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ බොහෝ උපකල්පන සහ අවිනිශ්චිතතාවයන් පිළිබිඹු වන බැවින් ආර්ථික අර්බුදයට අදාළව ඉදිරි දැක්මැති තොරතුරු පුරෝකථනය කිරීමට සහ එම තත්ත්වයන්ට අදාළව බර තැබීම් තීරණය කිරීම සඳහා ක්ෂේත්‍ර ගණනාවකට අදාළව විනිශ්චයන් ඉහළ නැංවීමට සිදුවිය. අපගේ අපේක්ෂිත ණය අලාභය තක්සේරු කිරීම සඳහා භාවිතා කරන තොරාගත් ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් සඳහා මූලික සිද්ධි තත්ත්වය, වාසිදායක සිද්ධි තත්ත්වය සහ අවාසිදායක සිද්ධි තත්ත්වයන්ට අදාළ අවස්ථා පිළිබඳ පුරෝකථනයන් පහත වගුව මගින් සපයයි.

#### අවස්ථා සම්භාවිතා බර තැබීම (බැංකුව)

| දෙසැම්බර් 31 දිනට | **2024** % | 2023 % |
|---|---|---|
| මූලික සිද්ධි | **20** | 10 |
| වාසිදායක සිද්ධි තත්ත්වය | **5** | 10 |
| අවාසිදායක සිද්ධි තත්ත්වය | **75** | 80 |

### කළමනාකරණ ආවරණ භාවිතය

අපේක්ෂිත ණය අලාභ දීමනා ඇස්තමේන්තු සඳහා කළමනාකරණ ආවරණ යනු අපගේ පවත්නා යෙදවුම්, උපකල්පන සහ ආකෘති ශිල්පීය ක්‍රම අදාළ සියලු අවදානම් සාධක ග්‍රහණය කර නොගන්නා බවට අප විනිශ්චය කරන අවස්ථාවන්හිදී භාවිතා කරන ගැලපුම් වේ. නව සාර්ව ආර්ථික, ක්ෂුද්‍ර ආර්ථික හෝ දේශපාලන සිදුවීම්වල මතුවීම්, අපගේ වර්තමාන පරාමිතීන් තුළ ඇතුළත් නොවන පරාමිතීන්, ආකෘති හෝ දත්තවල අපේක්ෂිත වෙනස්කම්, අභ්‍යන්තර අවදානම් ඇගයීම් සංක්‍රමණ හෝ ඉදිරි දැක්මැති තොරතුරු එවැනි තත්වයන්ට උදාහරණ වේ.

සියලුම ආයතනික සේවාදායකයින් ඔවුන්ගේ අතීත ගෙවීම් රටා, ඔවුන්ගේ අංශයට හා භූගෝලීය ප්‍රදේශයට ආර්ථික අර්බුදය බලපෑම, ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රකෘතිය, ආයතනයේ මූල්‍ය ශක්තිය, රජයේ සහ මහ බැංකු සහාය සහ වෙනත් සාධක මත පදනම්ව තනි තනිව ඇගයීමට ලක් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණය ගැතියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙන ගිය අතර සමහර ණය ගැතියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

තනි ණය ගැනුම්කරුවන් සඳහා කළඹ මට්ටමේ හානිකරණ තක්සේරු කිරීම් සිදු කරන ලදී. කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී, දිගුකාලීන ණය සහන හෝ කල් දැමීම පිළිබඳ පාරිභෝගික ඉල්ලීමෙහි සාධාරණත්වය තක්සේරු කිරීමට කළමනාකරණ විනිශ්චය භාවිත කරන ලදී. ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ අංශය සහ කළමනාකරණ විනිශ්චය මත පදනම්ව අදියර අතර වෙන් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණයගැතියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙනගිය අතර සමහර ණය ගැතියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (ඊ) ඉදිරි දැක්මැති තොරතුරු (සම්බන්ධයි)

### කළමනාකරණ ආවරණ මගින් අපේක්ෂිත ණය පාඩු සඳහා වන බලපෑම

#### ණය සහ අත්තිකාරම් අදියර 1 න් අදියර 2 ට සංචලනය

අදියර 1 යටතේ මූලිකව සමූහගත වූ තෝරාගත් අංශවල සිල්ලර ණය හා අත්තිකාරම් අදියර 2 වෙත මාරු විය. ප්‍රතිඵලයක් ලෙස 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදියර 1 සිට අදියර 2 දක්වා ණය සහ අත්තිකාරම් රු. මිලියන 5,791.1 මාරුවූ අතර හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 556.7 කින් ඉහළ යන ලදී.

| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | ශුද්ධ බලපෑම<br>රු. '000 |
|---|---|---|---|
| නිරාවරණය | (5,791,068) | 5,791,068 | – |
| හානිකරණ ප්‍රතිපාදන | (94,070) | 650,812 | 556,742 |

#### ණය සහ අත්තිකාරම් අදියර 2 න් අදියර 3 ට සංචලනය

අදියර 2 යටතේ මූලිකව සමූහගත වූ තෝරාගත් අංශවල සිල්ලර ණය හා අත්තිකාරම් අදියර 3 වෙත මාරු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ණය සහ අත්තිකාරම් රු. මිලියන 416.3 අදියර 2 සිට අදියර 3 දක්වා ගෙන යන ලද අතර හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 118.2 කින් ඉහළ යන ලදී.

| | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | ශුද්ධ බලපෑම<br>රු. '000 |
|---|---|---|---|
| නිරාවරණය | (416,274) | 416,274 | – |
| හානිකරණ ප්‍රතිපාදන | (46,441) | 164,593 | 118,152 |

## 22 ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමූහයට කල්පිරීම තෙක් රඳවා ගැනීමට අදහස් කරන හා හැකියාව තිබෙන ක්‍රමක්ෂය පිරිවැය – ණය ගණනය කරන මූල්‍ය වත්කම් හා වෙනත් උපකරණයි. නිශ්චිත කල්පිරීම් සීමා හා නිශ්චිතව තීරණය කළ හැකි ගෙවීම් සීමා සමග ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් මූලික මිනීමෙන් අනතුරුව ක්‍රමක්ෂය පිරිවැය – ණය ගණනය කරන මූල්‍ය වත්කම් හා වෙනත් උපකරණ, සඵල පොළී අනුපාතික යොදා ගනිමින් හානිකරණය අඩුකර ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. සඵල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන අත්පත් කර ගැනීමෙහිලා අදාළ වාරික සහ ගාස්තු හෝ වට්ටම් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශයෙහි, පොළී හා සමාන ආදායම්, හි ක්‍රමක්ෂය ඇතුළත් වේ. එවන් ආයෝජන වලින් පැන නගින හානිකරණය ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ ගාස්තු යටතේ හඳුනා ගැනෙයි.

## 22. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ (සම්බන්ධයි)

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | **143,755,805** | 81,381,441 | **146,718,039** | 83,062,596 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | **760,751,681** | 728,230,365 | **767,251,459** | 735,219,630 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | | **–** | – | **–** | – |
| ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් | | **–** | – | **–** | 50,041 |
| ණයකර (භාණ්ඩාගාර ඇපකර) * | | **125,964,603** | 131,860,577 | **125,964,603** | 131,860,577 |
| ආයතනික ණය උපකරණ | (22.1) | **2,739,086** | 2,232,945 | **3,208,422** | 2,864,318 |
| වාණිජ පත්‍රිකා | | **–** | – | **6,000** | 6,000 |
| භාර සහතිකපත් | | **5,827,302** | - | **5,827,302** | - |
| වෙනත් ආයෝජන | | **–** | – | **165,595** | 165,595 |
| **දළ එකතුව** | | **1,039,038,477** | 943,705,329 | **1,049,141,420** | 953,228,757 |
| අපේක්ෂිත ණය පාඩු හානිකරණය | | **(3,905)** | (645) | **(175,651)** | (172,433) |
| **ශුද්ධ එකතුව** | | **1,039,034,572** | 943,704,684 | **1,048,965,769** | 953,056,324 |

* රු. මි. 26,491 ක් වූ භාණ්ඩාගාර සහතිකය ලත් ණයකර 3 වන අදියරට වර්ගීකරණය කර ඇති නමුත් අදාළ වන LGD අගය 0 බැවින් හානිකරණ ප්‍රතිපාදන 0 වී ඇත.

## 22.1 ආයතනික ණය උපකරණ – බැංකුව

| | බැංකුව | | | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 ණයකර ගණන** | **2024 ධාරණ අගය** | 2023 ණයකර ගණන | 2023 ධාරණ අගය |
| පීපල්ස් ලීසිං පීඑල්සී | **2,064,900** | **214,005** | 2,064,900 | 214,025 |
| එල්.ඕ.එල්.සී. ෆිනෑන්ස් පීඑල්සී | **7,500,000** | **775,615** | 7,500,000 | 780,336 |
| හේලීස් පීඑල්සී | **–** | **–** | 5,000,000 | 535,142 |
| කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | **1,000,000** | **107,402** | 1,000,000 | 107,422 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව පීඑල්සී | **3,212,800** | **335,375** | 3,212,800 | 335,375 |
| රේසස් බලශක්ති පීඑල්සී | **2,500,000** | **257,386** | 2,500,000 | 260,645 |
| කොමර්ෂල් බැංකුව පීඑල්සී | **2,105,800** | **224,305** | – | – |
| ලංකා බැංකුව | **5,000,000** | **520,527** | – | – |
| වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී | **3,000,000** | **304,471** | – | – |
| **ශුද්ධ එකතුව** | | **2,739,086** | | 2,232,945 |

## 22. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ (සම්බන්ධයි)

### 22.1 ආයතනික ණය උපකරණ – සමූහය

| | සමූහය | | | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 ණයකර ගණන** | **2024 ධාරණ අගය** | 2023 ණයකර ගණන | 2023 ධාරණ අගය |
| පීපල්ස් ලීසිං පීඑල්සී | **4,633,600** | **480,376** | 6,203,600 | 642,460 |
| එල්.ඕ.එල්.සී. ෆිනෑන්ස් පීඑල්සී | **7,500,000** | **775,615** | 7,500,000 | 780,336 |
| හේලීස් පීඑල්සී | **–** | **–** | 5,000,000 | 535,142 |
| කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | **1,000,000** | **107,402** | 1,000,000 | 107,422 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව පීඑල්සී | **3,212,800** | **335,375** | 3,212,800 | 335,375 |
| රේසස් බලශක්ති පීඑල්සී | **2,500,000** | **257,386** | 2,500,000 | 260,645 |
| සෙලාන් බැංකුව පීඑල්සී | **1,000,000** | **107,052** | 1,000,000 | 107,033 |
| සියපත් ෆිනෑන්ස් පීඑල්සී | **929,500** | **95,913** | 929,500 | 95,905 |
| කොමර්ෂල් බැංකුව පීඑල්සී | **2,105,800** | **224,305** | – | – |
| ලංකා බැංකුව | **5,000,000** | **520,527** | – | – |
| වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී | **3,000,000** | **304,471** | – | – |
| ශුද්ධ එකතුව | | **3,208,422** | | 2,864,318 |

### 22.2 විශ්ලේෂණය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **සුරැකුම්කරණය මගින්** | | | | |
| සුරැකුම් ලෙස ගිවිසින ලද | **40,408,287** | 47,437,615 | **47,367,819** | 55,926,347 |
| තබා නොමැති | **998,630,190** | 896,267,714 | **1,001,773,601** | 897,302,410 |
| දළ එකතුව | **1,039,038,477** | 943,705,329 | **1,049,141,420** | 953,228,757 |
| **ව්‍යවහාර ඒකක අනුව** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | **1,039,038,477** | 943,705,329 | **1,049,141,420** | 953,228,757 |
| ඇමෙරිකානු ඩොලර් | **–** | – | **–** | – |
| දළ එකතුව | **1,039,038,477** | 943,705,329 | **1,049,141,420** | 953,228,757 |

## 22. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ (සම්බන්ධයි)

### 22.3 වර්ෂය තුළ හානිකරණ සංචලන

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| **1 අදියර** | | | | |
| ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | **645** | 655 | **839** | 820 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම) | **3,260** | (10) | **3,217** | 19 |
| වර්ෂය තුළ කපාහැරීම් | **–** | – | **–** | – |
| වෙනත් සංචලන | **–** | – | **–** | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **3,905** | 645 | **4,056** | 839 |
| **2 අදියර** | | | | |
| ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | **–** | 938,873 | **–** | 938,873 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම) | **–** | (938,873) | **–** | (938,873) |
| වර්ෂය තුළ කපාහැරීම් | **–** | – | **–** | – |
| වෙනත් සංචලන | **–** | – | **–** | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **–** | – | **–** | – |
| **3 අදියර** | | | | |
| ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | **–** | – | **171,595** | 171,595 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම) | **–** | – | **–** | – |
| වර්ෂය තුළ කපාහැරීම් | **–** | – | **–** | – |
| වෙනත් සංචලන | **–** | – | **–** | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **–** | – | **171,595** | 171,595 |
| **දෙසැම්බර් 31 දිනට මුළු හානිකරණ ප්‍රතිපාදන** | **3,905** | 645 | **175,651** | 172,433 |

## 23 වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් ගණයට හිමිකම් සහ ණය සුරැකුම්පත් අයත්වේ. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය ලෙසින් වර්ගීකරණය කරනු ලබන හිමිකම් ආයෝජන, උපාය මාර්ගික ආයෝජන ලෙස පවතින අයිතමයන්ය. වෙළඳපළ තත්වයන්ගේ වෙනස්වීම් වලට ප්‍රතිචාර ලෙසින් හෝ ද්‍රවශීලතාව අවශ්‍යතාවන්ට ප්‍රතිචාර ලෙසින් විකුණනු ලබන මෙම ප්‍රභේදයට අයත් ණය සුරැකුම්පත් නිශ්චිත නොවන කාලපරිච්ඡේදයකට රඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන අයිතමයන්ය.

මූලික මිනුමෙන් පසුව වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් පසුව සාධාරණ අගයට මනිනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් පහත පරිදි ප්‍රභේද දෙකකට වර්ග කළ හැකිය.

**i. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ**

මූලික හඳුනාගැනීමෙන් පසුව, ශ්‍රී ල.ගි.ප්‍ර. 32 මූල්‍ය උපකරණ යටතේ හිමිකම් යන්නෙහි නිර්වචනයට සරිලන අවස්ථාවලදී බැංකුව විසින් ඇතැම් විටෙක එහි හිමිකම් ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ ලෙස ආපසු හැරවිය නොහැකි පරිදි වර්ගීකරණය කරනු ලබයි. එවන් වර්ගීකරණයක් උපකරණයෙන් උපකරණය යන පදනම මත තීරණය වෙයි.

උපලබ්ධි නොවූ ලැබීම් හා අලාභ, වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයෙහි සෘජුවම හිමිකම් ලෙස හඳුනාගනු ලබයි. මෙකී හිමිකම් උපකරණ මත ඇති වන ලැබීම් හා අලාභ යළි ලාභයක් ලෙස කිසි විටෙක ප්‍රතිචක්‍රීකරණය කරනු නොලබයි. උපකරණයෙහි පිරිවැයෙහි කොටසක් ලෙස යළි අයකර

## 23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

ගැනීමෙහිදී එකී අරමුදලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාවලදී හැර ගෙවීමේ අයිතිය ස්ථාපිත කර ගන්නා අවස්ථාවලදී ලාභාංශ, වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස ලාභයට/අලාභයට හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී එකී ලැබීම්, වෙනත් විස්තීර්ණ ආදායම්හි වාර්තා කරනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ හානිකරණ ඇගයීමට යටත් නොවේ.

කෙසේ වෙතත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය යටතේ ඇති ප්‍රකාශිත වෙළඳපොළ මිලක් නොමැති සහ සාධාරණ අගය විශ්වසනීය ලෙස මැනිය නොහැකි හිමිකම් ආයෝජන පිරිවැයට මනිනු ලබයි.

### ii. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති ණය උපකරණ

පහත කොන්දේසි ද්විත්වයටම අනුකූල වන අවස්ථාවලදී වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මනිනු ලබන ණය උපකරණ සඳහා සමූහය විසින් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ නව වර්ගීකරණය අදාළ කරගනු ලබයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් සාක්ෂාත් කරගත හැකි අරමුණු සහිත උපකරණ ව්‍යාපාරික ආකෘතියක් යටතේ රඳවාගනු ලබයි.
- මූල්‍ය වත්කම් ගිවිසුම්ගත නියමයන් SPPI පරීක්ෂාවට බඳුන් වෙයි.

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති ණය උපකරණ පාඩුව සාධාරණ අගයට මනිනු ලබන අතර, එමඟින් ඇතිවන ලැබීම් සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තා කරනු ලබයි. පොලී ආදායම, අපේක්ෂිත ණය පාඩු සහ අඩුවීම් ලාභය/අලාභයට හඳුනාගනු ලබයි. හඳුනාගැනීම අත්හැරීමේදී, වෙනත් විස්තීර්ණ ආදායමට කලින් වාර්තා කරන ලද මුළු ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලැබේ.

| දෙසැම්බර් 31 දිනට | සටහන | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්** | 23. (ඇ) | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | **24,302,555** | 42,428,135 | **24,302,555** | 42,428,135 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | **23,597,790** | 16,466,074 | **25,064,210** | 17,031,685 |
| **හිමිකම් සුරැකුම්පත්** | | | | | |
| නිල ලැයිස්තුගත හිමිකම් සුරැකුම්පත් | 23. (ඈ) | **5,195,626** | 2,772,958 | **5,564,375** | 2,975,291 |
| නිල ලැයිස්තුගත නොවන හිමිකම් සුරැකුම්පත් | 23. (ඉ) | **373,207** | 257,244 | **417,848** | 301,885 |
| (අඩුකළා)ඃ හානිකරණය | | **–** | – | **(42,476)** | (42,476) |
| **වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ශුද්ධ මූල්‍ය වත්කම්** | | **53,469,178** | 61,924,412 | **55,306,512** | 62,694,519 |

## 23. (අ) විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | බැංකුව 2024 රු. '000 | බැංකුව 2023 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය 2023 රු. '000 |
|---|---|---|---|---|
| **සුරැකුම්කරණය මගින්** | | | | |
| සුරැකුම් ලෙස ගිරවිසින ලද | **–** | – | **1,466,421** | 460,888 |
| තබා නොමැති | **53,469,178** | 61,924,412 | **53,840,091** | 62,233,632 |
| **දළ එකතුව** | **53,469,178** | 61,924,412 | **55,306,512** | 62,694,519 |
| **ව්‍යවහාර මුදල් ඒකක අනුව** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | **53,469,178** | 61,924,412 | **55,306,512** | 62,694,519 |
| ඇමෙරිකානු ඩොලර් | **–** | – | **–** | – |
| **දළ එකතුව** | **53,469,178** | 61,924,412 | **55,306,512** | 62,694,519 |

## 23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 23. (ආ) වර්ෂය තුළ හානිකරණ සංචලන

වර්ෂය තුළ හානිකරණ සංචලන වාර්තා නොවීය.

### 23. (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය සුරකුම්පත්

| | බැංකුව | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2024 | | | 2023 | | |
| | මුහුණත අගය<br>රු. '000 | ආයෝජන පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය<br>රු. '000 | මුහුණත අගය<br>රු. '000 | ආයෝජන පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය<br>රු. '000 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරකුම්පත් – භාණ්ඩාගාර බිල්පත් | **25,258,719** | **24,077,917** | **24,302,555** | 43,805,328 | 41,226,853 | 42,428,135 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර | **21,838,510** | **21,156,839** | **23,597,790** | 15,724,930 | 14,875,308 | 16,466,074 |
| | | **45,234,756** | **47,900,345** | | 56,102,161 | 58,894,209 |

| | සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2024 | | | 2023 | | |
| | මුහුණත අගය<br>රු. '000 | ආයෝජන පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය<br>රු. '000 | මුහුණත අගය<br>රු. '000 | ආයෝජන පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය<br>රු. '000 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරකුම්පත් – භාණ්ඩාගාර බිල්පත් | **25,258,719** | **24,077,917** | **24,302,555** | 43,805,328 | 41,226,853 | 42,428,135 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර | **23,186,832** | **22,375,888** | **25,064,210** | 16,237,616 | 15,288,000 | 17,031,685 |
| | | **46,453,805** | **49,366,765** | | 56,514,853 | 59,459,820 |

### 23. (ඈ) නිල ලැයිස්තුගත ආයෝජන – හිමිකම් සුරකුම්පත් – බැංකුව සහ සමූහය

| | බැංකුව | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2024 | | | 2023 | | |
| | කොටස් ගණන | පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය<br>රු. '000 | කොටස් ගණන | පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය<br>රු. '000 |
| හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | **13,083,066** | **1,730,274** | **4,183,310** | 12,815,744 | 1,730,274 | 2,169,065 |
| පීපල්ස් ලීසිං ෆිනෑන්ස් පීඑල්සී | **59,547,976** | **832,312** | **1,012,316** | 56,438,626 | 832,312 | 603,893 |
| | | **2,562,586** | **5,195,626** | | 2,562,586 | 2,772,958 |

## 23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 23. (ඇ) නිල ලැයිස්තුගත ආයෝජන – හිමිකම් සුරැකුම්පත් – බැංකුව සහ සමූහය (සම්බන්ධයි)

| | සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2024 | | | 2023 | | |
| | කොටස් ගණන | පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය<br>රු. '000 | කොටස් ගණන | පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය<br>රු. '000 |
| හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | **13,083,066** | **1,730,274** | **4,183,310** | 12,815,744 | 1,730,274 | 2,169,065 |
| පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සී | **59,547,976** | **832,312** | **1,012,316** | 56,438,626 | 832,312 | 603,893 |
| ජාතික සංවර්ධන බැංකුව | **19,076** | **1,448** | **2,160** | 18,340 | 1,401 | 1,190 |
| කොමර්ෂල් බැංකුව පීඑල්සී | **245** | **11** | **36** | 241 | 11 | 23 |
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම | **200** | **1** | **138** | 200 | 1 | 71 |
| සම්පත් බැංකුව පීඑල්සී | **11,095** | **325** | **1,312** | 11,095 | 325 | 782 |
| වටවල ප්ලාන්ටේෂන් පීඑල්සී | **4,046** | **21** | **508** | 4,046 | 21 | 292 |
| ට්‍රාන්ස් ඒෂියා හොටෙල් පීඑල්සී | **4,000** | **35** | **178** | 4,000 | 35 | 156 |
| ලංකා සෙරමික් පීඑල්සී | **917** | **24** | **137** | 917 | 24 | 86 |
| ලංකා වෝල්ටයිල් පීඑල්සී | **585** | **2** | **34** | 585 | 2 | 25 |
| කැළණි වැලි ප්ලාන්ටේෂන් පීඑල්සී | **11,000** | **198** | **1,063** | 11,000 | 198 | 799 |
| හපුගස්තැන්න ප්ලාන්ටේෂන් පීඑල්සී | **100** | **3** | **5** | 100 | 3 | 3 |
| එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී | **18,000** | **160** | **2,610** | 18,000 | 160 | 2,088 |
| පෑන්ඒෂියා බැන්ක් පීඑල්සී | **10,298,499** | **96,012** | **360,448** | 10,298,499 | 96,012 | 196,701 |
| හැටන් ප්ලාන්ටේෂන් පීඑල්සී | **4,000** | **30** | **120** | 4,000 | 30 | 116 |
| | | **2,660,856** | **5,564,375** | | 2,660,810 | 2,975,291 |

### 23. (ඉ) නිල ලැයිස්තුගත නොවන ආයෝජන – හිමිකම් සුරැකුම්පත්

| | බැංකුව | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2024 | | | 2023 | | |
| | කොටස් ගණන | පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය/<br>පිරිවැය<br>රු. '000 | කොටස් ගණන | පිරිවැය<br>රු. '000 | සාධාරණ අගය/<br>පිරිවැය<br>රු. '000 |
| ආයෝජනය – ණය තොරතුරු කාර්යාංශය | **30,450** | **57,364** | **57,364** | 30,450 | 57,364 | 57,364 |
| ආයෝජනය – ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ් | **20,000** | **127** | **127** | 20,000 | 127 | 127 |
| ආයෝජනය – ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) | **16,452,126** | **164,521** | **315,716** | 16,452,126 | 164,521 | 199,753 |
| (අඩුකළා:) හානිකරණ ප්‍රතිපාදන | | **–** | **–** | | – | – |
| | | **222,012** | **373,207** | | 222,012 | 257,244 |

## 23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 23. (ඉ) නිල ලැයිස්තුගත නොවන ආයෝජන – හිමිකම් සුරැකුම්පත් (සම්බන්ධයි)

| | සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2024 | | | 2023 | | |
| | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය/ පිරිවැය රු. '000 | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය/ පිරිවැය රු. '000 |
| ආයෝජනය – ණය තොරතුරු කාර්යාංශය | **30,650** | **57,528** | **57,528** | 30,650 | 57,528 | 57,528 |
| ආයෝජනය – ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ් | **20,000** | **127** | **127** | 20,000 | 127 | 127 |
| ආයෝජනය – ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) | **16,452,126** | **164,521** | **315,717** | 16,452,126 | 164,521 | 199,753 |
| ආයෝජනය – ශ්‍රී ලංකා මූල්‍ය සේවා කාර්යාංශය | **200,000** | **2,000** | **2,000** | 200,000 | 2,000 | 2,000 |
| ප්‍රමුඛ මර්චන්ට් කෝපරේෂන් | **500,000** | **5,000** | **5,000** | 500,000 | 5,000 | 5,000 |
| ප්‍රයිම් ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් | **230,000** | **2,300** | **2,300** | 230,000 | 2,300 | 2,300 |
| ජනශක්ති ලයිෆ් | **2,500,000** | **25,000** | **25,000** | 2,500,000 | 25,000 | 25,000 |
| ජනශක්ති හෝල්ඩිංග්ස් | **1,000,000** | **10,000** | **10,000** | 1,000,000 | 10,000 | 10,000 |
| වණික් ඉන්කෝපරේෂන් | **17,000** | **176** | **176** | 17,000 | 176 | 176 |
| **දළ එකතුව** | | **266,652** | **417,848** | | 266,652 | 301,885 |
| (අඩුකලා:) හානිකරණ ප්‍රතිපාදන | | **–** | **(42,476)** | | – | (42,476) |
| **ශුද්ධ එකතුව** | | **266,652** | **375,372** | | 266,652 | 259,408 |

නිල ලැයිස්තුගත නොකළ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ හිමිකම් කොටස් සියල්ල (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හැරුණු විට) ඒවායේ සාධාරණ අගය විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කල නොහැකි බැවින් පිරිවැයට වාර්තා කර ඇත. මෙම ආයෝජන සඳහා ක්‍රියාකාරී වෙළඳපොළක් නොමැති බැවින් ඒවා දිගුකාලීනව පවත්වා ගනී. නිරීක්ෂණය කරන ලද දත්ත පදනම් කරගෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කොටස් මත වූ ආයෝජන ඇගයීමේ ආකෘතිය වන සාධාරන අගයට ගණනය කර ඇත.

## 24 පාලිත සමාගම්වල ආයෝජනයන්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පාලිත සමාගම්වල ආයෝජන, හානිකරණය වෙනුවෙන් දීමනා අඩු කළ පසු පිරිවැයට ගණනය කර බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වේ. කිසියම් හානිකරණ ඇඟවීමක් ඇත්දැයි තීරණය කිරීම පිණිස සෑම වාර්තාකරන දිනකදීම පාලිත සමාගම්වල ශුද්ධ වත්කම්, සමාලෝචනය කරනු ලබයි. කිසියම් හානිකරණයක් සිදුවී ඇති බවට ඇඟිවීමක් වේ නම්, ආයෝජනයේ යළි අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබන අතර, ශුද්ධ වත්කම්වල අලාභයෙහි මට්ටමට හානිකරණ අලාභය හඳුනාගනු ලබයි.

| දෙසැම්බර් 31 දිනට | | 2024 | 2023 | 2024 | | 2023 | |
|---|---|---|---|---|---|---|---|
| | සටහන | % | % | පිරිවැය රු. '000 | තක්සේරුව* රු. '000 | පිරිවැය රු. '000 | තක්සේරුව* රු. '000 |
| **නිල ලැයිස්තුගත නොවන හිමිකම් කොටස්** | | | | | | | |
| එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් (එකක් රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස් 420,000,000) | | **100** | 100 | **4,200,000** | **6,496,550** | 4,200,000 | 5,501,307 |
| ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (සාමාන්‍ය කොටස් 8,204,464) | | **100** | 100 | **3,111,000** | **8,806,628** | 3,111,000 | 8,223,865 |
| අඩුකලා: හානිකරණ ප්‍රතිපාදන | 24.3 | | | **–** | **–** | – | – |
| **ශුද්ධ එකතුව** | | | | **7,311,000** | **15,303,178** | 7,311,000 | 13,725,172 |

* පාලිත සමාගම්වල ආයෝජන පිළිබඳ තක්සේරුකරණය, ශුද්ධ වත්කම් පදනම මත 2024 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

## 24. පාලිත සමාගම්වල ආයෝජනයන් (සම්බන්ධයි)

### 24.1 පාලිත සමාගම් අත්පත් කර ගැනීම හා විකිණීම.

2024 වර්ෂය තුළ කිසිදු අත්පත් කර ගැනීමක් හෝ විකිණීමක් සිදු කර නොමැත.

### 24.2 පොලී ආදායම හා අත්පත් කරගැනීමේ ලාභය

2024 වර්ෂය තුළ කිසිදු අත්පත් කර ගැනීමක් හෝ විකිණීමක් සිදු කර නොමැත.

### 24.3 වර්ෂය තුළ හානිකරණ සංචලන

2024 වර්ෂය තුළ හානිකරණ සංචලන වාර්තා නොවීය.

## 25 ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ආශ්‍රිතයන් යනු සමූහයට සැලකිය යුතු බලපෑමත් ඇති නමුත් ආයෝජකයාගේ බලය හරහා විචල්‍ය ප්‍රතිලාභ පාලනය කල නොහැකි ආයතනයි. අනෙක් ආයතනයේ 20% හෝ ඊට වැඩි ඡන්ද බලය පවතීනම්, සමූහය සැලකිය යුතු බලපෑමක් සිදුකළ හැකි යැයි උපකල්පනය කෙරේ.

ශ්‍රී.ල.ගි.ප්‍ර. 28, ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාර ආයෝජන, යටතේ ආශ්‍රිතයන්ගේ ආයෝජන හිමිකම් ක්‍රමයට අනුව මූලිකව පිරිවැයට ගිණුම්ගත කළ හැකිවේ. හිමිකම් ක්‍රමය යටතේ ආශ්‍රිතයන්ගේ ආයෝජන පිරිවැයට අමතරව සමූහයේ ශුද්ධ වත්කම් වල අත්පත් කර ගැනීමේ කොටසෙහි වෙනස්කම් සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ වෙනම අයිතමයක් ලෙස වාර්තා කර ඇත. ආශ්‍රිතයන්ගේ මෙහෙයුම්වල ප්‍රතිඵලවල සමූහයේ කොටස ආදායම් ප්‍රකාශයෙන් පිළිබිඹු කරයි. එම ආයෝජකයින්ගේ වෙනත් විස්තීර්ණ ආදායමේ කිසියම් වෙනසක් සමූහයේ වෙනත් විස්තීර්ණ ආදායමේ කොටසක් ලෙස ඉදිරිපත් කරයි. ඊට අමතරව ආශ්‍රිත හිමිකමෙහි සෘජුවම හඳුනාගත් වෙනසක් සිදු වූ විට සමූහය විසින් අදාළ අවස්ථාවන්හිදී අදාළ වෙනස්වීමේ කොටස වෙනත් විස්තීර්ණ ආදායමේ හිමිකම ලෙස හඳුනාගනී. සමූහය සහ ආශ්‍රිතයන් අතර ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස හඳුනා නොගත් ලාභ අලාභ ආශ්‍රිතයාගේ අනුමැතිය පරිදි ඉවත් කෙරේ.

සමූහය සැලකිය යුතු බලපෑමක් සිදු කිරීම අවසන් වන දිනයේ සිට හිමිකම් ක්‍රමය භාවිතය අවසන් කරන අතර එවැනි ආයෝජකයන් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 ක්‍රමය මූල්‍ය උපකරණ අනුව ගිණුම්ගත කරයි. ආශ්‍රිතයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නැති වූ විට සමූහය විසින් රඳවාගත් ආයෝජන මැනීම සහ හඳුනා ගැනීම සාධාරණ අගයට සිදු කරයි. ආශ්‍රිතයාගේ සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි අලාභයේ සාධාරණ අගය සහ රඳවාගත් ආයෝජනයේ ලාභාලාභ වශයෙන් හඳුනා ගනී.

2024 දෙසැම්බර් 31 දිනට ආශ්‍රිත සමාගම්වල බද්ධ ව්‍යාපාර සඳහා ආයෝජන නොමැත.

## 26 දේපල, පිරියත සහ උපකරණ

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**හඳුනාගැනීමේ පදනම**
වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි නම් සහ වත්කම් හා සබැඳි අනාගත ප්‍රතිලාභ, සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවයන් ඇති විටක දේපල, පිරියත හා උපකරණ පොත්වල හඳුනාගනු ලබයි. වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම අදාළ වන පිරිවැයද ඇතුළත්ව දේපල, පිරියත හා උපකරණ මූලිකවම පිරිවැයට ගණනය කරනු ලබයි.

**මිනීමේ පදනම**
වත්කමක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත හා උපකරණ අයිතමයක් මුල් වරට එහි පිරිවැයට මනිනු ලබයි. පිරිවැය යන්නට වත්කම අත්පත් කර ගැනීම සඳහා සෘජුව අදාළ කලහැකි පිරිවැය සහ පසුකාලීන පිරිවැය ඇතුලත් වේ. තමන් විසින්ම ඉදිකල වත්කමක පිරිවැය යන්නට සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ වත්කම කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාකරවිය හැකි තත්ත්වයට ගෙන ඒමට සෘජුව අදාළ කලහැකි අනෙකුත් පිරිවැය මෙන්ම වත්කම ස්ථානගත කර ඇති වැඩ බිමෙන් ගලවා දැමීම, ඉවත් කිරීම සහ භූමිය ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වන පිරිවැයෙහි මුල් ඇස්තමේන්තුව සහ ප්‍රාග්ධනිත කරන ලද ණය ගැණුම් පිරිවැය ඇතුළත් වේ. පරිගණක උපකරණවල ක්‍රියාකාරීත්වයේ සංකලිත කොටසක් වන මිලදී ගත් පරිගණක මෘදුකාංග, පරිගණක උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරයි.

දේපල, පිරියත හා උපකරණ අයිතමයක කොටස් විවිධ වූ ඵලදායී ජීවකාල වලින් යුක්ත වන විට එම කොටස් වෙන් වෙන් වූ දේපල, පිරියත හා උපකරණ අයිතමයන් ලෙස හඳුනාගනු ලැබේ.

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

**පිරිවැය ආකෘතිය**

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හැරුණුවිට සෙසු දේපල, පිරියත හා උපකරණ සඳහා සමූහය විසින් පිරිවැය ආකෘතිය උපයෝගී කරගනු ලබන අතර, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ සම්බන්ධ අමතර පිරිවැයද ඇතුලත්ව, සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකල පසු අගයට වාර්තා කරනු ලබයි.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

සමූහය විසින් සමස්ත සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි කාණ්ඩයටම ප්‍රත්‍යාගණන ආකෘති උපයෝගී කරගනු ලබයි. ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනට වත්කමෙහි සාධාරණ අගයෙන් පසුකාලීනව සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකල පසු අගය වන ප්‍රත්‍යාගණිත අගයට එම දේපල පවත්වාගෙන යනු ලබයි. වාර්තාකරන දිනට ඇති සාධාරණ අගය හා ධාරණ අගය අතර සැලකියයුතු වෙනසක් නොමැති බව සහතික කරනු වස් චක්‍රීය පදනම මත සමූහයෙහි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සෑම තෙවසරකටම වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබයි.

මෙබඳු වාතාවරණයක් යටතේ, ඇතිවන ඉහළයාම පෙර ලියා හැරීමේ අගය දක්වා ආදායමක් ලෙස වාර්තා කරනු ලබයි. ධාරණ අගයෙහි යම් අඩුවීමක් වේ නම්, එය ආදායම් ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගත යුතුය. කෙසේ වුවද එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි පවතින යම් බැර ශේෂයක් වේ නම් එම අගය තෙක් ප්‍රත්‍යාගණය අඩුවීමක් වෙනත් විස්තීර්ණ ආදායම් වෙත හර කරනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කරනු ලබන එම අඩුවීම මගින් ප්‍රත්‍යාගණන සංචිත යටතේ සමුච්චිත හිමිකම් වල අගය අඩුවෙයි. යම් වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඉතිරි වන යම් ශේෂයක් වේ නම්, එය විශ්‍රාම යාම මත හෝ එම වත්කම් ඉවත් කිරීම මත රඳවාගනු ලබන ඉපයීම් වෙත සෘජුවම මාරු කරනු ලබයි.

**හඳුනාගැනීම අත්හැරීම**

විකුණා බැහැර කිරීමේදී හෝ එය පාවිච්චි කිරීමෙන් අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට දේපල, පිරියත හා උපකරණ පොත් වලින් ඉවත් කරනු ලැබේ. වත්කම් ඉවත් කිරීමේදී පැන නගින කිසියම් ලාභයක් හෝ අලාභයක් (වත්කමෙහි ධාරණ අගය සහ බැහැරලීමේ ශුද්ධ අගය අතර වෙනස ලෙස ගණනය කෙරෙයි) එම වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

**ප්‍රාග්ධනිත කල හැකි කෙරීගෙන යන වැඩ**

ප්‍රාග්ධනිත කිරීමට අපේක්ෂා කරන, ගොඩනැගිලි ඉදිකිරීම්, ප්‍රධාන යන්ත්‍රෝපකරණ සහ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මේ යටතට අයත් වේ. මේවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත හානිකරණ අලාභ අඩු කරන ලද පිරිවැයට දක්වා ඇත. කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියා කල හැකි තත්ත්වයට සහ ස්ථානයට පත්වූ පසු එම ප්‍රාග්ධනිත කළ හැකි කෙරීගෙන යන වැඩ, අදාළ වත්කම වෙත මාරු කරනු ලැබේ.

**ණය පිරිවැය**

සමූහය විසින් දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමට අදාළ ප්‍රාග්ධනිත කළහැකි ණය පිරිවැය නොවීය.

**කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම්**

2017.01.01 දින සිට කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනිත කිරීම සඳහා බැංකුව විසින් තීරණය කර ඇත. එදින සිට බලපැවැත්වෙන පරිදි බදු කාලසීමාව තුළදී එකී වැඩිදියුණු කිරීම් ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

**ක්‍ෂයවීම්**

දේපල පිරියත සහ උපකරණ පිරිවැය, ඒවායේ තක්සේරු කළ ඵලදායී ජීවකාලය තුළ අවශේෂ වටිනාකම දක්වා සරළ මාර්ග ක්‍රමය උපයෝගී කරගනිමින්, ක්‍ෂයවීම් ගණනය කර ලාභ/අලාභ යටතේ වාර්තා කරනු ලබයි. ඉඩම් වල ක්‍ෂයවීමක් නොසැලකෙයි. හඳුනාගනු ලැබූ වත්කම් කාණ්ඩවලට අදාළ ක්‍ෂයවීම් අනුපාතික පහතින් දක්වා ඇත.

| වත්කම් වර්ගය | ක්‍ෂයවීම් කාලය |
|---|---|
| කල්බදු දේපල, කුලියට/බදු දීම සඳහා සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම් | බදු කාලසීමාව තුළදී |
| සිත්නක්කර ගොඩනැගිලි | වසර 20 – 50 |
| කාර්යාල හා විවිධ උපකරණ සහ ලීබඩු හා සවිකිරීම් | වසර 5 – 10 |
| මෝටර් වාහන | වසර 5 |
| පරිගණක දෘඩාංග | වසර 4 – 5 |
| පරිගණක මෘදුකාංග | වසර 4 – 5 |

සමූහය විසින් පරිහරණය කිරීමට හැකි දින සිට භාවිතයෙන් ඉවත් කරන දිනය දක්වා ක්‍ෂයවීම් ප්‍රතිපාදනය කරයි.

## 26. (අ) දේපල, පිරියත සහ උපකරණ – බැංකුව – 2024

| | ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම් රු. '000 | මෝටර් රථවාහන රු. '000 | කෙරීගෙන යන වැඩ – ගොඩනැගිලි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | **14,423,000** | **928,559** | **4,736,369** | **2,572,835** | **445,416** | **47,860** | **23,154,039** |
| එකතු කිරීම් | **3,451** | **31,052** | **636,186** | **322,962** | **–** | **6,278** | **999,929** |
| ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ) (සටහන 26 ඇ) | **–** | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| ලියාහැරීම් | **–** | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| ඉවත් කිරීම් | **–** | **–** | **(83,975)** | **(55,971)** | **–** | **–** | **(139,946)** |
| මාරු කිරීම්/ගැලපීම් | **–** | **–** | **–** | **4,326** | **–** | **(3,451)** | **875** |
| **2024 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | **14,426,451** | **959,611** | **5,288,580** | **2,844,152** | **445,416** | **50,687** | **24,014,897** |
| **අඩුකළා: සමුච්චිත ක්‍ෂයවීම්** | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | **–** | **358,909** | **3,225,533** | **1,849,517** | **435,889** | **–** | **5,869,849** |
| වර්ෂය තුළ අයකිරීම් | **116,143** | **46,272** | **502,018** | **157,232** | **9,328** | **–** | **830,993** |
| ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්‍ෂයවීම් ගැලපීම් (සටහන 26 ඇ) | **–** | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| ඉවත් කිරීම් | **–** | **–** | **(83,912)** | **(53,185)** | **–** | **–** | **(137,097)** |
| මාරු කිරීම්/ගැලපීම් | **–** | **214** | **(120)** | **42** | **(3)** | **–** | **133** |
| 2024 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | **116,143** | **405,395** | **3,643,519** | **1,953,606** | **445,214** | **–** | **6,563,878** |
| අඩුකළා: හානිකරණය | **–** | **–** | **–** | **–** | **–** | **35,228** | **35,228** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | **14,310,308** | **554,216** | **1,645,061** | **890,546** | **202** | **15,459** | **17,415,792** |

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

### 26. (අ) දේපල, පිරියත සහ උපකරණ – බැංකුව – 2023

| | ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි රු. '000 | පරිගණක දෘඪාංග රු. '000 | කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම් රු. '000 | මෝටර් රථවාහන රු. '000 | කෙරීගෙන යන වැඩ – ගොඩනැගිලි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 12,603,413 | 868,735 | 3,821,259 | 2,544,477 | 447,254 | 63,351 | 20,348,490 |
| එකතු කිරීම් | 21,208 | 90,730 | 1,041,511 | 54,111 | – | 17,477 | 1,225,037 |
| ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ) (සටහන 26 ඇ) | 1,801,405 | – | – | – | – | – | 1,801,405 |
| ඉවත් කිරීම් | – | – | (126,401) | (9,699) | (1,838) | – | (137,938) |
| මාරු කිරීම්/ගැලපීම් | (3,026) | (30,906) | – | (16,054) | – | (32,968) | (82,954) |
| **2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 14,423,000 | 928,559 | 4,736,369 | 2,572,835 | 445,416 | 47,860 | 23,154,039 |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 186,965 | 308,772 | 2,944,334 | 1,701,654 | 415,761 | – | 5,557,486 |
| වර්ෂය තුල අයකිරීම් | 90,661 | 50,137 | 407,292 | 156,736 | 21,966 | – | 726,792 |
| ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම් (සටහන 26 ඇ) | (277,626) | – | – | – | – | – | (277,626) |
| ඉවත් කිරීම් | – | – | (126,100) | (8,874) | (1,838) | – | (136,812) |
| මාරු කිරීම්/ගැලපීම් | – | – | 7 | 1 | – | – | 8 |
| **2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | – | 358,909 | 3,225,533 | 1,849,517 | 435,889 | – | 5,869,849 |
| අඩුකළා: හානිකරණය | – | – | – | – | – | 35,228 | 35,228 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | 14,423,000 | 569,650 | 1,510,836 | 723,317 | 9,527 | 12,631 | 17,248,961 |

* කල්බදු දේපළ, කුලී/කල්බදු මත ඇති ගොඩනැගිලි වැඩිදියුණුකිරීම් යනාදියට 2024 දෙසැම්බර් 31 දිනට රු. මි. 30 ක අගයක් ගත් කුලී/කල්බදු මත ඇති ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා කෙරීගෙන යන වැඩ ඇතුළත්ය.

** කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම් යනාදියට 2024 දෙසැම්බර් 31 දිනට රු. මි. 8.2ක අගයක් ගත් කාර්යාලීය උපකරණ ගණනය කිරීම සඳහා කෙරීගෙන යන වැඩ ඇතුළත්ය.

.

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

### 26. (ආ) දේපල, පිරියත සහ උපකරණ – සමූහය – 2024

| | ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම් රු. '000 | මෝටර් රථවාහන රු. '000 | කෙරිගෙන යන වැඩ – ගොඩනැගිලි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | **15,545,275** | **933,635** | **4,798,023** | **2,619,285** | **492,361** | **47,860** | **24,436,438** |
| එකතු කිරීම් | **3,651** | **31,052** | **645,401** | **323,115** | **–** | **6,278** | **1,009,497** |
| ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ) | **–** | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| ලියාහැරීම් | **–** | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| ඉවත්කිරීම් | **–** | **–** | **(83,975)** | **(55,971)** | **–** | **–** | **(139,946)** |
| ආයෝජන දේපළ මාරු කිරීම් | **–** | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| මාරු කිරීම්/ගැලපීම් | **–** | **–** | **–** | **4,248** | **–** | **(3,451)** | **797** |
| 2024 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | **15,548,926** | **964,687** | **5,359,449** | **2,890,677** | **492,361** | **50,687** | **25,306,787** |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | **6,850** | **358,910** | **3,277,499** | **1,890,477** | **478,075** | **–** | **6,011,811** |
| වර්ෂය තුල අයකිරීම් | **116,486** | **46,272** | **507,688** | **158,481** | **11,708** | **–** | **840,635** |
| ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම් | **–** | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| ලියාහැරීම් | **–** | **–** | **–** | **–** | **–** | **–** | **–** |
| ඉවත්කිරීම් | **–** | **–** | **(83,912)** | **(53,185)** | **–** | **–** | **(137,097)** |
| මාරු කිරීම්/ගැලපීම් | **–** | **214** | **(120)** | **7** | **(3)** | **–** | **98** |
| 2024 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | **123,336** | **405,396** | **3,701,155** | **1,995,780** | **489,780** | **–** | **6,715,447** |
| අඩුකළා: හානිකරණය | **–** | **–** | **–** | **–** | **–** | **35,228** | **35,228** |
| 2024 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | **15,425,590** | **559,291** | **1,658,294** | **894,897** | **2,581** | **15,459** | **18,556,112** |

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

### 26. (ආ) දේපල, පිරියත සහ උපකරණ – සමූහය – 2023

| | ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම් රු. '000 | මෝටර් රථවාහන රු. '000 | කෙරීගෙන යන වැඩ – ගොඩනැගිලි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 13,468,125 | 873,811 | 3,887,883 | 2,604,330 | 494,199 | 63,351 | 21,391,701 |
| එකතු කිරීම් | 21,208 | 90,730 | 1,042,178 | 55,703 | – | 17,477 | 1,227,295 |
| ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ) | 2,058,968 | – | – | – | – | – | 2,058,968 |
| ලියාහැරීම් | – | – | (5,637) | (14,995) | – | – | (20,633) |
| ඉවත්කිරීම් | – | – | (126,401) | (9,699) | (1,838) | – | (137,938) |
| මාරු කිරීම්/ගැලපීම් | (3,026) | (30,906) | – | (16,054) | – | (32,968) | (82,954) |
| **2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 15,545,275 | 933,635 | 4,798,023 | 2,619,285 | 492,361 | 47,860 | 24,436,439 |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 193,440 | 308,773 | 2,996,830 | 1,756,131 | 455,567 | – | 5,710,741 |
| වර්ෂය තුල අයකිරීම් | 91,036 | 50,137 | 412,398 | 158,212 | 24,346 | – | 736,129 |
| ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම් | (277,626) | – | – | – | – | – | (277,626) |
| ලියාහැරීම් | - | - | (5,636) | (14,993) | - | - | (20,629) |
| ඉවත්කිරීම් | – | – | (126,100) | (8,874) | (1,838) | – | (136,812) |
| මාරු කිරීම්/ගැලපීම් | – | – | 7 | 1 | – | – | 8 |
| **2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 6,850 | 358,910 | 3,277,499 | 1,890,477 | 478,075 | – | 6,011,811 |
| අඩුකළා: හානිකරණය | – | – | – | – | – | 35,228 | 35,228 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | 15,538,425 | 574,725 | 1,520,524 | 728,808 | 14,286 | 12,632 | 18,389,400 |

### 26. (ඇ) ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය/සාධාරණ තක්සේරුව

සෑම වසර 03 කට වරක් වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් බැංකුවෙහි ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලදී. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර එදිනට රු. මිලියන 2,076 ක ප්‍රත්‍යාගණන අගයන් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන ලදී.

### 26. (ඈ) බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි

2024 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි ශේෂයට රු. මිලියන 10,975 ක සින්නක්කර ඉඩම් අගයක් ඇතුළත්ය.

### 26. (ඉ) වගකීම් සඳහා ඇප ලෙස සහතික කරන ලද දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ කිසිවක් වගකීම් සඳහා ඇප වශයෙන් තබා නොමැත.

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

### 26. (ඊ) සම්පූර්ණයෙන්ම ක්‍ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ

වාර්තාකරණ දින දක්වා භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත දක්වා ඇති පරිදි වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| පරිගණක දෘඪාංග | **2,506,768** | 2,200,393 | **2,547,146** | 2,239,676 |
| කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් | **387,427** | 596,463 | **418,294** | 627,088 |
| විවිධ උපකරණ/මෝටර් රථවාහන සහ වෙනත් දෑ | **878,301** | 753,792 | **924,055** | 799,350 |
| **එකතුව** | **3,772,496** | 3,550,648 | **3,889,495** | 3,666,114 |

## 27 පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමූහයේ පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම් ප්‍රාග්ධනිත කල්බදු ගිවිසුමෙහි වටිනාකමින් සමන්විතය.

**හඳුනාගැනීමේ පදනම**

කල්බදු ආරම්භක දිනට (කල්බදු ගිවිසුමෙහි නිශ්චිතව දක්වා ඇති දින පරිදි) පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම් එනම් කල්බදු කාලසීමාව තුළ සිදු කළයුතු කල්බදු ගෙවීම්වල වත්මන් අගය සමූහය විසින් හඳුනාගනු ලැබෙයි.

**මැනීමේ පදනම**

ඕනෑම සමුච්චිත ක්‍ෂයවීම් හා හානිකරණ පාඩු අඩුකර, කල්බදු වගකීම්වල කිසියම් ප්‍රතිමිනීම් සඳහා ගැලපීම් සිදුකර පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම් පිරිවැයට මනිනු ලැබෙයි. හඳුනාගත් කල්බදු වගකීම්වල අගය හා ලද කල්බදු දීමනා අඩුකර, ආරම්භක දිනට හෝ ඊට පෙර සිදුකළ කල්බදු ගෙවීම්, පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්වලට ඇතුළත්ය.

**ඵලදායී ජීවකාලය හා ක්‍රමක්‍ෂය වීම්**

කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු වත්කමෙහි හිමිකාරිත්වය ලබාගැනීමට පිළිගත හැකි සහතිකයක් බැංකුව සතුවේ නම්, හැර කල්බදු කාලසීමාව හා අපේක්ෂිත ඵලදායී ජීවකාලය යන්නෙන් කෙටි කාලසීමාව තුළ හඳුනාගත් පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්, සරල රේඛීය පදනමක් මත ක්‍ෂය කරනු ලැබේ. පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්, හානිකරණයට බඳුන්වෙයි.

### 27. (අ) පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්හි ප්‍රාග්ධනිත අගය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| ආරම්භක ශේෂය | **2,713,267** | 2,403,399 | **2,779,515** | 2,469,647 |
| එකතු කිරීම් | **237,659** | 293,958 | **237,659** | 293,958 |
| ගැලපීම් | **–** | 15,910 | **–** | 15,910 |
| **අඩුකළා** | | | | |
| ඉවත්කිරීම් | **–** | – | **–** | – |
| අවසන්කිරීම්/මාරුකිරීම් | **–** | – | **–** | – |
| හානිකරණය | **–** | – | **–** | – |
| **අවසාන ශේෂය** | **2,950,926** | 2,713,267 | **3,017,174** | 2,779,515 |

## 27. පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම් (සම්බන්ධයි)

### 27. (ආ) පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්හි සමුච්චිත ක්ෂය

| දෙසැම්බර් 31 දිනට | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| ආරම්භක ශේෂය | **1,548,672** | 1,189,749 | **1,586,354** | 1,223,265 |
| වර්ෂය සඳහා අයකිරීම් | **361,069** | 358,923 | **364,806** | 363,090 |
| ඉවත්කිරීම් | **–** | – | **–** | – |
| ගැලපීම් | **–** | – | **–** | – |
| අවසන්කිරීම්/මාරුකිරීම් | **–** | – | **–** | – |
| අවසාන ශේෂය | **1,909,741** | 1,548,672 | **1,951,160** | 1,586,354 |
| දෙසැම්බර් 31 දිනට ධාරණ වටිනාකම | **1,041,185** | 1,164,595 | **1,066,014** | 1,193,161 |

## 28 දේපළ ආයෝජන

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ඉපැයීමට රඳවාගත් කුලී හෝ ප්‍රාග්ධන ඇගයීම් හෝ ගොඩනැගිල්ලක කොටසක් හෝ ද්විත්වයම දේපළ ආයෝජන ලෙස වර්ගීකරණය කෙරෙයි.

**පිරිවැය ආකෘතිය**

ගනුදෙනු පිරිවැය ඇතුළත්ව ගොඩනැගිලි ආයෝජන හැර දේපළ ආයෝජන (මූලිකව) පිරිවැයට (ල.ගි.ප්‍ර. 40 – 56 වගන්තිය) මනිනු ලබයි. කළමනාකාරිත්වය විසින් දේපළ ආයෝජනවල සාධාරණ අගය වාර්ෂික පදනම මත මනිනු ලබන අතර එය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ වෙනම දක්වනු ලබයි.

**සාධාරණ වටිනාකම**

යම් පසුකාලීන සමුච්චිත ක්ෂයවීම් හා පසුකාලීන සමුච්චිත හානිකරණ පාඩු අඩු කළ පසු ප්‍රත්‍යාගණිත දිනට සාධාරණ අගය වන හා ඒවායෙහි සාධාරණ වටිනාකම පිළිගත හැකි අයුරකින් මැනිය හැකි ඉඩම් ආයෝජන ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණිත අගයට සලකනු ලැබේ. සෑම වසර 3කට වරක්ම ධාරණ අගය, වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සාධාරණ වටිනාකම උපයෝගී කර ගනිමින් තීරණය කරගත හැකි, සැලකිය යුතු ලෙස නොවෙනස් වන බවට වගබලා ගනු පිණිස ප්‍රත්‍යාගණනය කෙරෙයි. කල්බදු සීමාව තුළ සරල රේඛීය පදනමක් මත ලැබිය හැකි කුලී පැතිරී පවතී. කල්බදු කාලසීමාව තුළදී දිරිමත් කිරීම්, කල්බදු ලබන්නෙකුහට ලබාදෙන අවස්ථාවකදී මෙම පදනම යටතේ කුලී ආදායම හඳුනාගැනීමේ ප්‍රතිඵල ලෙස දේපළ ආයෝජනවල ධාරණ අගයෙන් වෙන් වෙන් වත්කම් ලෙස වාර්තා කරනු ලබන අගයන් ඉවත් කෙරෙයි.

## 28. දේපළ ආයෝජන (සම්බන්ධයි)

### 28. (අ) දේපළ ආයෝජනවල සාධාරණ අගය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **ඉඩම්** | | | | |
| ආරම්භක ශේෂය | **–** | – | **341,000** | 195,785 |
| එකතු කිරීම් | **–** | – | **–** | – |
| ඉවත්කිරීම් | **–** | – | **–** | – |
| ප්‍රත්‍යාගණන ලාභය | **–** | – | **–** | 145,215 |
| දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම් | **–** | – | **–** | – |
| දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම් | **–** | – | **–** | – |
| හානිකරණය | **–** | – | **–** | – |
| **අවසාන ශේෂය** | **–** | – | **341,000** | 341,000 |
| **ගොඩනැගිලි** | | | | |
| ආරම්භක ශේෂය | **–** | – | **8,000** | 9,192 |
| එකතු කිරීම් | **–** | – | **–** | – |
| ප්‍රත්‍යාගණන ලාභය | **–** | – | **–** | (1,192) |
| දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම් | **–** | – | **–** | – |
| දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම් | **–** | – | **–** | – |
| හානිකරණය | **–** | – | **–** | – |
| **අවසාන ශේෂය** | **–** | – | **8,000** | 8,000 |

### 28. (ආ) දේපළ ආයෝජනවල සමුච්චිත ක්ෂය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| ආරම්භක ශේෂය | **–** | – | **–** | – |
| වර්ෂය සඳහා අයකිරීම් | **–** | – | **–** | – |
| දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම් | **–** | – | **–** | – |
| දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම් | **–** | – | **–** | – |
| **අවසාන ශේෂය** | **–** | – | **–** | – |
| **දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | **–** | – | **349,000** | 349,000 |

දේපල ආයෝජනවල සාධාරණ අගයෙහි වැඩිවීම වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, සෑම වසර 03 කට වරක් දේපළ ආයෝජන යළි මැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කෙරෙයි. එහෙයින් ල.ගි.ප්‍ර. 40 අනුව දේපළ ආයෝජන, සාධාරණ අගයට මනිනු ලබන අතර, සෑම වසර 03 කට වරක්ම ප්‍රත්‍යාගණනය කෙරෙයි.

## 29 කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම්

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

මිලදී ගත් පරිගණක මෘදුකාංගවල වටිනාකම සමූහයේ අස්පෘශ්‍ය වත්කම් ගණනයට ඇතුළත් වේ.

**හඳුනාගැනීමේ පදනම**

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ, එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනීමට හැකි විට සහ ඊට අදාළව අනාගතයේදී අපේක්‍ෂිත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමේ හව්‍යතාවයක් ඇති විටදීය.

**මැනීමේ පදනම**

වෙන් වෙන්ව අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් මුල් වරට හඳුනා ගැනිමේදී අගය කරනු ලබන්නේ ඒවායේ පිරිවැයටයි. ව්‍යාපාර සංයෝජනයේදී අත්පත් කර ගත් අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ එසේ අත්පත් කර ගත් දිනට ඒවායේ සාධාරණ අගයයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්‍ෂය සහ යම් සමුච්චිත ප්‍රත්‍යාගණන හානිකරණ අලාභයක් අඩු කල පසු අගයට ඉදිරියට ගෙනයා යුතුයි.

**ඵලදායී ජීවකාලය හා ක්‍රමක්‍ෂය වීම්**

සමූහය අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවකාලය සීමිත හෝ අසීමිත ද යන්න තක්සේරු කරනු ලබයි. සීමිත ජීව කාලයකින් යුත් අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ඵලදායී ජීව කාලය තුළ ක්‍රමක්‍ෂය කරනු ලබයි. සීමිත ජීව කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්‍ෂය කාලපරිච්ඡේදය සහ ක්‍රමක්‍ෂය, ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතුවේ. වත්කම්වල අපේක්‍ෂිත ඵලදායී ජීව කාලයක් හෝ වත්කම් වල අන්තර්ගත අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජන රටාවේ වෙනස්වීම් සඳහා ගිණුම් තබනු ලබන්නේ සුදුසු පරිදි ක්‍රමක්‍ෂය කාලසීමාව හෝ ක්‍රමක්‍ෂය ක්‍රමය වෙනස් කිරීමෙනි. මේවා ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ජීව කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්‍ෂය වියදම ආදායම් ප්‍රකාශනයේ අදාල අස්පෘශ්‍ය වත්කම්වල කාර්යයට අනුරූප වියදම් කාණ්ඩය යටතේ හඳුනාගනු ලබයි.

**හඳුනා ගැනීම අත්හැරීම**

අසීමිත ඵලදායී ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සමූහය සතුව නොපවතී. සමූහයේ පරිගණක මෘදුකාංගවල තක්සේරු කරන ලද ඵලදායී ජීවකාලය වසර 4 හෝ 5 කි. (වාර්ෂිකව 20% සිට 25% බැගින්) අස්පෘශ්‍ය වත්කම් ඉවත් කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්‍ෂා නොකරන විට බැහැර කිරීම සඳහා හඳුනාගනු ලබයි.

බැහැර කිරීමේදී හඳුනාගත් වත්කම් මත යම් ලාභයක් හෝ අලාභයක් පැන නගීනම් (ඉවත් කිරීමේ වටිනාකම හා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම අතර වෙනස) අදාල හඳුනාගත් වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" තුල හඳුනාගෙන ඇත.

**කීර්තිනාමය**

කීර්තිනාමය මූලිකව පිරිවැයට අගය කරනු ලබයි. හුවමාරු ගැණුම් ප්‍රතිෂ්ඨාව, අත්පත් කරගැනීමට භාජනය වන්නාගේ පාලනයට යටත් නොවන හිමිකම් වටිනාකම සහ කලින් දරණ ලද ස්කන්ධ හිමිකමෙහි අත්පත් කරගන්නා දිනට සාධාරණ වටිනාකම යන සමාහාරයට අතිරික්තව ඇති අත්පත් කරගන්නා දිනට හඳුනාගතහැකි, අත්පත්කරගත් වත්කම් සහ පවරාගත් වගකීම්වල ශුද්ධ අගය කීර්තිනාමය ලෙස මූලිකව හඳුනාගැනේ.

මූලිකව හඳුනාගැනීමෙන් පසුව කීර්තිනාමය මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත හානිකරණ පාඩු අඩුකිරීමෙනි. පසුකාලීන මිනුම්කරණයේදී කීර්තිනාමය අත්පත්කරගත් දිනට හඳුනාගත් පිරිවැයේ යම් සමුච්චිත හානිකරණ අලාභ ඇතොත් අඩුකර මිනුම්කරයි. හානිකරණ පරීක්ෂා කිරීමේ අරමුණු සඳහා ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය අත්පත් කරගත් දිනයේ සිට අත්කරගන්නාසේ වෙනත් වත්කම් හෝ වගකීම් මුදල් උත්පාදන ඒකක වලට පවරා තිබේද යන්න නොසලකා සංයෝජනය නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ලබන සෑම මුදල් උත්පාදන ඒකක වලට කීර්තිනාමය බෙදාහැරිය යුතුය.

**පරිගණක මෘදුකාංග**

සමූහය මිලදීගත් පරිගණක මෘදුකාංග එහි පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකිරීමෙන් පසු අගයට අගය කරනු ලබයි. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංග සඳහා වන වියදම වත්කමක් ලෙස හඳුනාගත හැක්කේ සමූහය විසින් එම මෘදුකාංගය අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකි පරිද්දෙන් සම්පූර්ණ කර භාවිතයට ගැනීමේ අභිප්‍රාය සහ ශක්‍යතාවය තහවුරු කිරීම මත සහ අභ්‍යන්තර උත්පාදනය සම්පූර්ණ කිරීම සඳහා වැය වන පිරිවැය විශ්වසනීය ලෙස නිශ්චය කළහැකි නම් පමණි. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංගවල ප්‍රාග්ධනීකරණය කරන ලද පිරිවැයට එම මෘදුකාංග උත්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපනය කළ හැකි සියලු වියදම් සහ ප්‍රාග්ධනීකරණය කළ ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වන අතර එම පිරිවැය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවටම ක්‍රමක්ෂය කර ඇත. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංගවල ප්‍රාග්ධනීකරණය කරන ලද පිරිවැය එහි සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු වටිනාකමට දැක්වේ.

## 29. කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් (සම්බන්ධයි)

පහත හෙළිදරව් කර ඇති මිලදී ගත් පරිගණක මෘදුකාංග හැර බැංකුවට සහ සමූහයට වෙනත් අස්පෘශ්‍ය වත්කම් නොමැත.

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| පරිගණක මෘදුකාංග | 29.1 | **2,178,638** | 715,222 | **2,179,865** | 717,732 |
| සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග | 29.2 | **5,222** | 29,493 | **5,222** | 29,493 |
| **එකතුව** | | **2,183,860** | 744,715 | **2,185,087** | 747,225 |

### 29.1 පරිගණක මෘදුකාංග

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **පිරිවැය/තක්සේරුව** | | | | |
| ආරම්භක ශේෂය | **3,011,622** | 2,674,623 | **3,034,516** | 2,697,517 |
| වර්ෂය තුළ එකතු කිරීම් | **1,946,216** | 336,999 | **1,946,216** | 336,999 |
| වර්ෂය තුළ ඉවත්කිරීම් | **–** | – | **–** | – |
| ගැලපීම් | **(337)** | – | **(337)** | – |
| **අවසාන ශේෂය** | **4,957,501** | 3,011,622 | **4,980,395** | 3,034,516 |
| **අඩුකළා: සමුච්චිත ක්‍රමක්ෂය** | | | | |
| ආරම්භක ශේෂය | **2,296,399** | 1,949,595 | **2,316,784** | 1,967,516 |
| වර්ෂය සඳහා අයකිරීම් | **482,464** | 346,805 | **483,746** | 349,268 |
| ඉවත්කිරීම් | **–** | – | **–** | – |
| **අවසාන ශේෂය** | **2,778,863** | 2,296,399 | **2,800,530** | 2,316,784 |
| අඩුකළා: හානිකරණය | **–** | – | **–** | – |
| **ශුද්ධ පොත් අගය** | **2,178,638** | 715,222 | **2,179,865** | 717,732 |

### 29.2 සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024 රු. '000** | 2023 රු. '000 | **2024 රු. '000** | 2023 රු. '000 |
| **පිරිවැය/තක්සේරුව** | | | | |
| ආරම්භක ශේෂය | **29,493** | 22,220 | **29,493** | 22,220 |
| වර්ෂය තුළ එකතු කිරීම් | **98,015** | 13,608 | **98,015** | 13,608 |
| වර්ෂය තුළ ඉවත්කිරීම් | **–** | – | **–** | – |
| මාරුකිරීම්/ගැලපීම් | **(122,286)** | (6,335) | **(122,286)** | (6,335) |
| **අවසාන ශේෂය** | **5,222** | 29,493 | **5,222** | 29,493 |

## 29. කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් (සම්බන්ධයි)

### 29.3 සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කළ අස්පෘශ්‍ය වත්කම්

වාර්තාගත දිනයේදී තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය කළ අස්පෘශ්‍ය වත්කම්වල මූලික පිරිවැය පහත පරිදි වේ. (පරිගණක මෘදුකාංග)

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| අස්පෘශ්‍ය වත්කම්/පරිගණක මෘදුකාංග | **1,862,575** | 1,538,107 | **1,879,070** | 1,554,602 |
| **එකතුව** | **1,862,575** | 1,538,107 | **1,879,070** | 1,554,602 |

## 30 විලම්බිත බදු (වත්කම්)/වගකීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

හිලව් කිරීමට කිසිදු නීතිමය බලාත්මක අයිතියක් නොපවතින බැවින් සමූහයේ එක් ආයතනයක විලම්බිත බදු (වත්කම්)/වගකීම් තවත් ආයතනයක විලම්බිත බදු වගකීම්/(වත්කම්) හා හිලව් කළ නොහැක. විලම්බිත බදු සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය පිළිබඳ විස්තර පිටු අංක 275 හි 13 වන සටහනෙහි දක්වා ඇත.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර ඇති විලම්බිත බදු සහ ආදායම් බදු වියදමට වාර්තා වී ඇති වෙනස්කම් පහත වගුවෙන් දැක්වේ.

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| වත්කම් යටතේ හඳුනාගත් | 30.(අ) | **(4,995,021)** | (5,885,288) | **(4,995,021)** | (5,885,288) |
| වගකීම් යටතේ හඳුනාගත් | 30.(ආ) | **–** | – | **61,869** | 58,630 |
| **ශුද්ධ විලම්බිත බදු (වත්කම්)/වගකීම්** | 30.(ඇ) සහ (ඈ) | **(4,995,021)** | (5,885,288) | **(4,933,152)** | (5,826,658) |

### 30. (අ) විලම්බිත බදු වත්කම්

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 | **2024**<br>**රු. '000** | 2023<br>රු. '000 |
| ආරම්භක ශේෂය | | **5,885,288** | 2,892,984 | **5,885,288** | 3,663,879 |
| විලම්බිත බදු වගකීම් වෙත මාරු කිරීම් | | – | – | **–** | (770,894) |
| වර්ෂය සඳහා හඳුනාගත් ගෙවීම් | | | | | |
| – ආදායම් ප්‍රකාශය | 13 (ආ) | **(1,209,935)** | 2,468,550 | **(1,209,935)** | 2,468,549 |
| – පෙර වර්ෂවල ගැලපීම් | | **–** | – | **–** | – |
| – වෙනත් විස්තීර්ණ ආදායම් | | **319,668** | 523,754 | **319,668** | 523,754 |
| **අවසාන ශේෂය** | | **4,995,021** | 5,885,288 | **4,995,021** | 5,885,288 |

## 30. විලම්බිත බදු (වත්කම්)/වගකීම් (සම්බන්ධයි)

### 30. (ආ) විලම්බිත බදු වගකීම්

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන | **2024** රු. '000 | 2023 රු. '000 | **2024** රු. '000 | 2023 රු. '000 |
| ආරම්භක ශේෂය | | **–** | – | **58,630** | 4,155 |
| විලම්බිත බදු වත්කම් වෙත මාරු කිරීම් | | **–** | – | **–** | (770,894) |
| වර්ෂය සඳහා හඳුනාගත් ගෙවීම් | | | | | |
| – ආදායම් ප්‍රකාශය | 13(ආ) | **–** | – | **(12,647)** | 807,310 |
| – පෙර වර්ෂවල ගැලපීම් | 13(ආ) | **–** | – | **–** | (35,338) |
| – වෙනත් විස්තීර්ණ ආදායම් | | **–** | – | **15,886** | 53,397 |
| **අවසාන ශේෂය** | | **–** | – | **61,869** | 58,630 |

### 30. (ඇ) ශුද්ධ විලම්බිත බදු (වත්කම්)/වගකීම් සැසඳුම – බැංකුව

| | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | | ලාභය/අලාභය | | වෙනත් විස්තීර්ණ ආදායම | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024** රු. '000 | 2023 රු. '000 | **2024** රු. '000 | 2023 රු. '000 | **2024** රු. '000 | 2023 රු. '000 |
| **විලම්බිත බදු වගකීම් මත;** | | | | | | |
| 3 (1) (xiv) | බැංකුව බුන්වත්වීමට ආසන්න හෝ එහි වගකීම් ඉටු කිරීමට අපොහොසත්වීමට හෝ එසේ වීමට ඉඩ ඇති බවට හෝ එහි තැන්පත්කරුවන්ට හා වෙනත් ණය හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් අත්හිටුවීමට සිදුවන බව පෙනී යන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සම්බන්ධ කිසිදු තීරණයක්/ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙරාතුව ඒ බව වහාම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ වෙත දැන්විය යුතුය. | අනුකූලවී ඇත.<br><br>බැංකුව නුබුන්වත් වන අතර අදාළ වර්ෂය තුළදී බැංකුවේ නුබුන්වත්භාවයට අභියෝග කරන කිසිදු අවස්ථාවක් පැන නැගුණේ නැත. |
| 3 (1) (xv) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය සහ වෙනත් ආරක්ෂාකාරී පදනම් මත මූල්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇති මට්ටම් වලදී බැංකුව ප්‍රාග්ධනිත බව තහවුරු කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගතයුතුය. | අනුකූලවී ඇත.<br><br>අවදානම් රුචිය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් නිතිපතා මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අතර, නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රමාණවත් බව සහ අනෙකුත් විචක්ෂණශීලී පියවරයන් මණ්ඩලය විසින් නිරීක්ෂණය කරනු ලැබේ. |
| 3 (1) (xvi) | මෙකී නියමයන්හි තෙවන නියමය හා බැංකුවේ අනුකූලතාවය දැක්වෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ප්‍රකාශයට පත් කළ යුතුය. | අනුකූලවී ඇත.<br><br>මෙම වාර්තාව බැංකුවේ පිටු අංක 169 සිට 183 දක්වා දක්වා ඇති ආයතනික පාලන වාර්තාවේ කොටසකි. |
| 3 (1) (xvii) | එක් එක් අධ්‍යක්ෂවරයෙකු විසින් වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං ඇගයීමේ පටිපාටියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු අතර එවන් ඇගයීම් වල වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. | අනුකූලවී ඇත.<br><br>බැංකුව විසින් සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං තක්සේරු ක්‍රමයක් අනුගමනය කර ඇති අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් නඩත්තු කරනු ලැබේ. මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම වාර්ෂිකව පුද්ගලයෙකු ලෙස තමාගේම කාර්යක්ෂමතාව පිළිබඳ ස්වයං තක්සේරුවක් සිදු කරන ලද අතර එය මණ්ඩලයේ ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සභාගත කරනු ලැබේ. |

| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| **3 (2)** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය** | |
| 3 (2) (i) | අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට වඩා නොඅඩු හෝ 13 ට වඩා වැඩි නොවිය යුතුය. | ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයා ඇතුළුව අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වෙයි. 2024 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 05 දෙනෙකුගෙන් සමන්විත විය. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර පිටු අංක 160 සිට 162 දක්වා මෙම වාර්තාවේ ඇතුළත් වේ. |
| 3 (2) (ii) | (අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුර හොබවන අධ්‍යක්ෂවරයෙකු හැරුනු කොට වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර 9 නොඉක්මවිය යුතුය. | අනුකූලවී ඇත.<br>වත්මන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වසර 09 කට අඩු කාලයක් බැංකුවේ සේවය කර ඇත. ඔවුන්ගේ සේවා කාලය පිළිබඳ විස්තර පිටු අංක 175 දක්වා ඇත. |
| | (ආ) 2008 ජනවාරි මස 01 දිනට වසර 09 සම්පූර්ණ කර ඇති හෝ 2008 දෙසැම්බර් මස 31 දිනට ප්‍රථම ඕනෑම අවස්ථාවකදී එවන් සේවා කාලයක් සම්පූර්ණ කරන අධ්‍යක්ෂවරයෙකු හට 2009 ජනවාරි මස 01 දින සිට ඇරඹෙන ඉදිරි වසර 3 ක උපරිම කාලයක් සඳහා සේවය කළ හැකිය. | අදාළ නොවේ. |
| 3 (2) (iii) | අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව මුළු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් 1/3 නොඉක්මවන්නේ නම් බැංකුවේ සේවකයෙකු බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස (මෙහි මින් මතු විධායක අධ්‍යක්ෂ ලෙස හැඳින්වෙන) පත් කිරීමට, තෝරා පත් කිරීමට හෝ නම් කිරීමට හැකිය. එවන් අවස්ථාවකදී විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු බැංකුවේ ප්‍රධාන විධායක නිළධාරියා විය යුතුය. | අනුකූලවී ඇත.<br>සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ. |
| 3 (2) (iv) | අවම වශයෙන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් 1/3 ක් හෝ මින් කවර හෝ ඉහළ අගයට සරිලන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතුය. | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු සිටින අතර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ස්වාධීන නොවන අය වෙති. අධ්‍යක්ෂ ධුරයේ කාණ්ඩය 175 පිටුවේ දක්වා ඇත. |
| 3 (2) (v) | ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීමට විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබන අවස්ථාවකදී එසේ පත් කරන ලද පුද්ගලයාද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන නිර්නායක සපුරන අයෙකු විය යුතුය. | අදාළ නොවේ. |
| 3 (2) (vi) | විධායක නොවන අධ්‍යක්ෂවරුන් පිළිගත හැකි වෘත්තිමය පසුබිමක් ඇති සහ/හෝ උපායමාර්ග, කාර්යසාධනය හා සම්පත් ආදී කරුණු සම්බන්ධව ස්වාධීන තීරණයන්ට එළඹිය හැකි අත්දැකීම් හා සුදුසු කුසලතාවයන්ගෙන් සපිරි පිරිසක් විය යුතුය. | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ ඇතුළුව අවශ්‍ය තොරතුරු 160 සිට 162 දක්වා පිටුවල සඳහන් කර ඇත. |
| 3 (2) (vii) | සනපූරණයට අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සපිරුණද සපැමිණි විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සපැමිණි මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අඩක් නොඉක්මවයි නම් එවන් අවස්ථාවකදී නියමාකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්විය නොහැකිය. | අනුකූලවී ඇත.<br>ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සනපූරණය 4 කි. එය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අඩකට වඩා වැඩි වන අතර අධ්‍යක්ෂවරුන් පස්දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ. |
| 3 (2) (viii) | බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළිදරව් කෙරෙන සියළු ආයතනික සන්නිවේදනයන්හීදී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විශේෂයෙන් හඳුන්වා දිය යුතුය. | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළත් කෙරෙන සියළු ආයතනික සන්නිවේදනයන්හී බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විශේෂිතව හඳුන්වාදී ඇත. සභාපතිවරයාගේ, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ, ස්වාධීන හා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂවරු කාණ්ඩය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පිටු අංක 175 හි දැක්වේ. |

# 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සමග අනුකූලතාවීම



| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (2) (ix) | අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා විධිමත්, සැලකිල්ලට භාජනයවූ හා විනිවිද භාවයෙන් යුත් කාර්ය පටිපාටියක් පැවතිය යුතුය. එමෙන්ම ක්‍රමවත්ව අනුප්‍රාප්තිකයන් පත්කිරීම පිණිස ද පටිපාටියක් තිබිය යුතුය. | අනුකූලවී ඇත.<br>බැංකුවේ අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) (අ) වගන්තිය ප්‍රකාරවය. ඒ අනුව, බැංකුවේ අධීක්ෂණය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පස් දෙනෙක් පත් කෙරේ.එක් අධ්‍යක්ෂවරයෙක් භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ තැනැත්තෙක් විය යුතු අතර තවත් අධ්‍යක්ෂවරයෙක් තැපැල්පති හෝ ඔහු විසින් නම් කරනු ලැබූ තැනැත්තෙක් විය යුතුය. |
| 3 (2) (x) | තාවකාලික ලෙස පුරප්පාඩුවක් පිරවීම පිණිස පත් කරනු ලබන සියළු අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්වීමෙන් අනතුරුව පවත්වනු ලබන පළමු මහා සභා රැස්වීමේදී පාර්ශවකරුවන්ගේ ඡන්ද විමසීමකට භාජනය විය යුතුය. | අදාළ නොවේ.<br>විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කිරීම සිදු කරන හෙයින් මෙවැනි තත්ත්වයක් පැන නොනගී. |
| 3 (2) (xi) | අධ්‍යක්ෂවරයෙකු සිය තනතුරින් ඉල්ලා අස්වන්නේ නම් හෝ ඉවත් කරනු ලබන්නේ නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්;<br>(අ) එම අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම, එවන් ඉල්ලා අස්වීමකට හෝ ඉවත් කරනු ලැබීමකට බලපෑ හේතුද, එසේ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට බැංකුව සමග යම් එකඟතාවයකට නොපැමිණීමට හේතුවක් තිබේ නම් එයද ඇතුළුව නිවේදනය කිරීම | අනුකූලවී ඇත.<br>බැංකුවේ එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය, අධ්‍යක්ෂවරුන් පත් කිරීම මෙන්ම ඉවත් කිරීම සිදු කරනු ලබන්නේ බැංකුව අයත් වන විෂයභාර අමාත්‍යවරයා හරහාය. ඕනෑම ඉල්ලා අස්වීමක් එම අමාත්‍යවරයා වෙත ද යොමු කෙරේ. ඉල්ලා අස්වීම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කෙරේ. |
| | (ආ) හිමිකරුවන්ගේ අවධානයට යොමු කළ යුතු කරුණු වේද/නොවේද යන්න සහතික කරමින් ප්‍රකාශයක් නිකුත් කළ යුතුය. | බැංකුවේ කොටස් හිමිකරුවා ශ්‍රී ලංකා රජය වන අතර නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරුන් හැර අනෙකුත් අධ්‍යක්ෂවරු පස්දෙනාගේ වෙනස්වීම් සිදු කරනු ලබන්නේ රජය විසින් අදාළ විෂයභාර අමාත්‍යවරයා හරහාය. |
| 3 (2) (xii) | බැංකු අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකු අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම එකී බැංකුව, පළමුව සඳහන් කළ බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වන්නේ නම් පමණක් හැර සිදු නොකළ යුතුය. | අදාළ නොවේ. |
| **3 (3)** | **අධ්‍යක්ෂවරුන්ගේ හැකියා හා යෝග්‍ය බව ඇගයීමේ නිර්ණායක** | |
| 3 (3) (i) (අ) සහ (ආ) | අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන තැනැත්තෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවා තිබිය යුතුය. | අනුකූලවී ඇත.<br>වයස අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩලයේ නොමැත. |
| 3 (3) (ii) | යම් පුද්ගලයකු බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාග මද ඇතුළුව සමාගම්/ආයතන 20 කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධුර නොදැරිය යුතුය. | අනුකූලවී ඇත.<br>කිසිදු අධ්‍යක්ෂවරයෙක් බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම්ද ඇතුළුව සමාගම්/ආයතන 20 කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධුර දරන්නේ නැත. |

| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (3) (iii) | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස ඔහුගේ සේවය අවසන් වූ දින සිට මාස 06 ක කාලයක් ඉකුත්වීමට පෙර පත් නොකළ යුතුය. ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීමේදී විශ්‍රාම යන බැංකුකරුවන්ගේ ප්‍රවීණත්වය අවශ්‍ය විය හැකි අවස්ථා වැනි සුවිශේෂී අවස්ථාවන්හි එහි යම් වෙනසක් මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත්ව සිදු කළ යුතුය. මේ සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීමේදී සිසිලන (Cooling – off) කාලසීමාවේ අවශ්‍යතා පිළිපැදීමට සහතික විය යුතුය. බලපත්‍රලාභී බැංකුවට අධ්‍යෂවරයෙකු පත් කරනු ලැබුවහොත්, බලපත්‍රලාභී බැංකුව එවැනි පත් කරන්නෙකුට යම් බලතල ක්‍රියාත්මක කිරීමෙන් හෝ යම් වරප්‍රසාද භුක්ති විඳීමෙන් හෝ ඔහුගේ මග පෙන්වීමට පටහැනිව වැළැක්වීමට බලපත්‍රලාභී බැංකුව පියවර ගතයුතුය. | අනුකූලවී ඇත.<br>සමාලෝචිත වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් ඇති වී නොමැත. |
| **3 (4)** | **අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවරන ලද කළමනාකරණ කාර්යභාරය** | අනුකූලවී ඇත. |
| 3 (4) (i) | අධ්‍යක්ෂවරුන් විසින් දැනට ක්‍රියාත්මක වන බලතල පැවරීමේ ක්‍රියාපිළිවෙත සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කර පැහැදිලිව අවබෝධ කර ගත යුතුය. | බලය පැවරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ කටයුතු හා වගකීම් පැවරීමේ ක්‍රමවේදය කලින් කලට සමාලෝචනය කරනු ලබයි. කිසිදු බාධාවකින් තොරව කාර්යක්ෂමව සිය කාර්යයන් ඉටු කිරීමේ අවස්ථාව අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පැවරීමේ පටිපාටිය සමාලෝචනය හා අනුමත කරන අතර බලතල පැවරීම බැංකුවේ අවශ්‍යතා ආමන්ත්‍රණය කරන බවට සහතික වේ. |
| 3 (4) (ii) | සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය සතු කාර්යභාරය ඉටු කිරීමේ හැකියාව අවම කිරීමට හෝ ඊට සැලකිය යුතු ආකාරයෙන් බාධාවක් වන මට්ටමකට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය කටයුතු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට හෝ ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස් වලට පැවරීම නොකළ යුතුය. | අනුකූලවී ඇත. |
| 3 (4) (iii) | බැංකුවේ අවශ්‍යතාවලට අදාළ වන ලෙස බලතල පැවරීමේ කාර්ය පටිපාටිය පවතින බවට සහතික කරගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින්වර එය සමාලෝචනය කරනු ලබයි. | අනුකූලවී ඇත. |
| **3 (5)** | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී** | |
| 3 (5) (i) | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන භූමිකා වෙනම පැවතිය යුතු අතර, එකම පුද්ගලයෙකු විසින් ඉටු නොකළ යුතුය. | අනුකූලවී ඇත.<br>සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකා අතර පැහැදිලි කාර්යභාර වෙන්කිරීමක් ඇත. සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ වගකීම් විග්‍රහ කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියක් ක්‍රියාත්මකය. |

# 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සමග අනුකූලතාවීම



| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (5) (ii) | සභාපති, විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු වන්නේ නම් වඩාත් සුදුසුය.<br>සභාපතිවරයා, ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු නොවන අවස්ථාවකදී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සුදුසු පරිදි සීමා නීර්ණ ලේඛනගත කිරීමෙන් අනතුරුව ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂවරයෙක් ලෙස පත් කළ යුතුය.<br>ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවේ අනාවරණය කළ යුතු වේ. | අනුකූලවී ඇත.<br>බැංකුවේ සභාපතිවරයා ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකි. |
| 3 (5) (iii) | අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් එහි ආයතනික පාලන වාර්තාවෙහි, සභාපතිගේ හා ප්‍රධාන විධායක නිළධාරියාගේ අනන්‍යතාවයද, ඔවුන් අතර පැවතිය හැකි යම් සම්බන්ධතාවයක ස්වභාවයද හෙළිදරව් කළයුතුය. | අනුකූලවී ඇත.<br>සභාපතිගේ හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක 182 හි සඳහන් කර ඇත.<br>සභාපතිවරයා සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී අතර කිසිදු භෞතික, මූල්‍ය, ව්‍යාපාරික හෝ පවුල් සබඳතාවයක් නොමැති බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය දැනුවත්ව සිටී. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් අතරද එවැනි සබඳතා නොමැත. |
| 3 (5) (iv) | සභාපති විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම; අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් එහි වගකීම් ඉටු කරන බව හා කාර්යක්ෂමව කටයුතු කරන බව සහතික කිරීම; හා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සියළු ප්‍රධාන හා අවශ්‍ය කරුණු කාලෝචිතව සාකච්ඡාවට බඳුන් කරන බවට වගබලා ගත යුතුය. | අනුකූලවී ඇත.<br>සභාපති විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයට නායකත්වය සපයනු ලබන අතර, අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් එහි වගකීම් කාර්යක්‍ෂමව ඉටු කරන බවට වගබලා ගනියි. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සියළුම ප්‍රධාන කරුණු කාලීන අයුරින් සාකච්ඡාවට ගැනෙයි.<br>ඊළඟ රැස්වීමේදී සභාගත කිරීමට පෙර කෙටුම්පත් අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තා සභාපතිවරයා විසින් සමාලෝචනය කරනු ලැබේ. |
| 3 (5) (v) | සෑම අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය සැකසීමේ හා අනුමත කිරීමේ මූලික වගකීම සභාපති සතුය. | අනුකූලවී ඇත.<br>සභාපති රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කරයි. |
| 3 (5) (vi) | අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ජාවට ගැනෙන කරුණු සම්බන්ධයෙන් සියළු අධ්‍යක්‍ෂවරුන් නිසි ලෙස දැනුවත් කර ඇති බවට මෙන්ම අධ්‍යක්‍ෂවරුන් වෙත කලට වේලාවට ප්‍රමාණවත් තොරතුරු සැපයෙන බවටද සභාපති විසින් වග බලා ගත යුතුය. | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ජාවට ගැනෙන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් පරිදි දැනුවත් කර ඇති බවට සභාපති සහතික වේ. ඒ බව සහතික කිරීමෙහිලා පහත දැක්වෙන ක්‍රමවේදය භාවිතයට ගැනේ.<br>• අතිරේක තොරතුරු සහ පැහැදිලි කිරීම් සඳහා සමාලෝචනය කිරීමට සහ කැඳවීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින හතකට පෙර, පෙර රැස්වීමේ වාර්තා ඇතුළුව මණ්ඩල පත්‍රිකා සංසරණය කිරීම, සහ රැස්වීමෙන් පසු රැස්වීමට අදාළ කාරණා පිළිබඳව පසු විපරම් කිරීම.<br>• අවශ්‍යවූ විටෙක ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් පැහැදිලි කරගැනීම් ලබාගැනීම. |

| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (5) (vii) | සභාපති අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ හා සක්‍රිය දායකත්වයක් ලබාදීමට සියළුම අධ්‍යක්‍ෂවරුන් දිරිමත් කිරීම සහ බැංකුවේ උපරිම යහපත පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන බවට වගබලා ගැනීම සඳහා ප්‍රමුඛත්වය ගැනීම සභාපති විසින් කළ යුතුය. | අනුකූලවී ඇත. |
| 3 (5) (viii) | විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් වෙතින් කාර්යක්ෂම දායකත්වයක් ලබා ගැනීම උදෙසා සභාපති විසින් පහසුකම් සැලසිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් අතර සඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතුය. | අනුකූලවී ඇත.<br>සමස්ත අධ්‍යක්‍ෂ මණ්ඩලයම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. |
| 3 (5) (ix) | සභාපතිවරයා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් සම්බන්ධව හෝ කිසිදු ආකාරයකින් අනෙකුත් විධායක රාජකාරී කටයුතු සෘජු අධීක්ෂණයට ලක්කිරීමෙහි නොයෙදිය යුතුය. | අනුකූලවී ඇත<br>සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ඔහු ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධීක්ෂණය කිරීම හෝ වෙනත් කිසිදු ආකාරයක විධායක කාර්යයන්හි නියුක්ත නොවේ. |
| 3 (5) (x) | කොටස්හිමිකරුවන් සමග සඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට යෝග්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමිකරුවන්ගේ මත/අදහස් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය කෙරෙන බවට සභාපති වග බලා ගත යුතුය. | අනුකූලවී ඇත.<br>බැංකුව සිය කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යයි. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරයා, අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ කොටස් හිමිකරු අතර සන්නිවේදන මාර්ගය ලෙස ක්‍රියා කරයි. |
| 3 (5) (xi) | ප්‍රධාන විධායක නිලධාරියා, බැංකුවේ එදිනෙදා සිදුකෙරෙන මෙහෙයුම් හා ව්‍යාපාර කළමනාකරණයේ මුදුන් මට්ටමේ භාරකාරත්වය දරන විධායක ලෙස කටයුතු කරයි. | අනුකූලවී ඇත.<br>බැංකුවේ එදිනෙදා කටයුතු සාමාන්‍යාධිකාරී/විධායක නිලධාරී වෙත පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි සාමාන්‍යාධිකාරී/විධායක නිලධාරියාට පැවරෙන එවැනි බලතල පිළිබඳව විශේෂයෙන් කරුණු ඉදිරිපත් කර ඇත. |
| **3 (6)** | **අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ කමිටු** | |
| 3 (6) (i) | මෙම නියමන්හි 3 (6) (ii), 3 (6) (iii), 3 (6) (iv), සහ 3 (6) (v), යන නියමයන් මගින් දක්වා ඇති පරිදි සෑම බැංකුවක්ම අවම වශයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල අනු කමිටු 4 ක් පිහිටු විය යුතුය. සියළුම අනු කමිටු සඳහා ලේකම්වරයෙකු පත් කළ යුතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂික මහා සභා රැස්වීමේදී එක් එක් අනු කමිටුවේ කාර්යසාධනය, වගකීම් සහ කාර්යභාරය පිළිබඳව වාර්තාවක් සැපයිය යුතුය. | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටු හයක් පිහිටුවා ඇත. 2017 අංක 12 දරන බැංකු පනතේ උපදෙස් අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව යන අනිවාර්ය කමිටු පිහිටුවා ඇති අතර හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් මණ්ඩලය පත් කරනු ලබන්නේ බැංකුවේ වියදම් අවශ්‍යතා සපුරාලීම සඳහාය. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවක්ද පිහිටුවා ඇත. සියලුම කමිටු කමිටු සභාපතිවරුන් හරහා මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි.<br>ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ලේකම්/අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ලේකම් අදාළ කමිටුවල සභාපතිවරයාගේ අධීක්‍ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම සහ වාර්තා ආදිය පවත්වාගෙන යන අතර සියලුම කමිටුවල ලේකම් වරයා ලෙස කටයුතු කරයි. අධ්‍යක්‍ෂ මණ්ඩල කමිටු වාර්තා පිටු අංක 184 සිට 194 දක්වා පිටුවල ඇත.<br>රජය තනි කොටස් හිමියා වන අතර, බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ බැංකුව පිළිබඳ කාර්ය භාර අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරේ. |
| 3 (6) (ii) | විගණන කමිටුව සම්බන්ධයෙන් පහත සඳහන් නීති අදාළ වේ.<br>(අ) කමිටුවේ සභාපතිවරයා ගණකාධිකරණයේ සහ/හෝ විගණනයෙහි සුදුසුකම් හා අත්දැකීම් සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු විය යුතුය. | අනුකූලවී ඇත.<br>විගණන කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.<br>වත්මන් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සභාපතිවරයාට අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇත. කමිටුවේ වත්මන් සභාපතිවරයාගේ පැතිකඩ 162 පිටුවේ දක්වා ඇත. |
| | (ආ) කමිටුවේ සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් විය යුතුය. | අනුකූලවී ඇත.<br>බැංකුවේ සියළු අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. එහෙයින්, කමිටුවේ සියළුම සාමාජිකයෝ විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. |

# 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සමග අනුකූලතාවීම



| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඇ) පහත කරුණු සම්බන්ධයෙන් කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.<br>(i) අදාළ නීතිවලට අනුකූල වෙමින් විගණන සේවා සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම;<br>(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින්වර විගණකවරුන් හට නිකුත් කරන ලද උපදෙස් ක්‍රියාත්මක කිරීම;<br>(iii) අදාල ගිණුම්කරණ ප්‍රමිති භාවිතයට ගැනීම සහ;<br>(iv) විගණන කොටස්කරුවන් සමග බැඳීම වසර 5 නොඉක්මවයි නම් සහ පූර්ව කාලසීමාව සම්පූර්ණ කළ දින පටන් වසර 3 ක් ඉකුත්වීමට ප්‍රථම අදාළ විගණන කොටස්කරුවන් හා යලි විගණන බැඳීමකට ඇතුළු නොවන්නේ නම් සේවා කාලය, විගණන ගාස්තු හා විගණකවරයාගේ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහකිරීම. | අනුකූලවී ඇත.<br>නිර්දේශ නියමයන්ට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:<br>* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින්වර විගණකවරුන් හට නිකුත් කරන ලද උපදෙස් ක්‍රියාත්මක කිරීම.<br>* අදාල ගිණුම්කරණ ප්‍රමිති භාවිතයට ගැනීම.<br>ව්‍යවස්ථාවට අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණකවරයා වශයෙන් කටයුතු කරයි. එබැවින්, බාහිර විගණකවරයා සම්බන්ධයෙන් කමිටුවට වගකීමක් නොපැවරේ. |
| | (ඈ) අදාළ වන ප්‍රමිති සහ යහපරිච අනුව විගණන ක්‍රියාවලින්හිදී බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂයය මූලිකත්වය සහ කාර්යක්ෂමතාවය කමිටුව විසින් සමාලෝචනය හා නිරීක්ෂණය කළ යුතුය. | අනුකූලවී ඇත.<br>විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස කටයුතු කරන බැවින් ස්වාධීනත්වය සහ විෂයය මූලිකත්වය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කොට පවත්වාගැනීම සිදු වෙයි. විගණන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වලදී රජයේ විගණන අධිකාරී සමග සාකච්ඡා කරනු ලැබේ. |
| | (ඉ) විගණන නොවන සේවා ලබාදීම සඳහා බාහිර විගණකවරයෙකු යොදා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කමිටුව විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. | අදාළ නොවේ.<br>විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා ලෙස කටයුතු කරයි.<br>කෙසේ වුවත්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය ප්‍රකාරව, තමාට සහයවීම සඳහා විගණකාධිපතිවරයා තවත් බාහිර විගණකවරයෙකු පත් කරන්නේ නම් එමගින් විගණන සේවා සපයන ආයතනයේ ස්වාධීනත්වය, විෂයය මූලිකත්වය සහ කාර්යක්ෂමතාවය කෙරෙහි බලපෑමක් ඇති නොකරයි. 2024 වර්ෂයේ විගණනය සඳහා විගණකාධිපති විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම (Messers Earnest and Young) උපදේශන කටයුතු සඳහා පත් කරගන්නා ලදී. |
| | (ඊ) කමිටුව විසින් විගණනය ඇරඹීමට ප්‍රථම විගණනයේ ස්වභාවය හා විෂයය පථය පිළිබඳ බාහිර විගණකවරුන් සමග සාකච්ඡා කර අවසන් නිගමනයකට පැමිණිය යුතුය. | අදාළ නොවේ.<br>විගණනයේ විෂයය පථය හා සීමාව බාහිර විගණකවරයා ලෙස කටයුතු කරන විගණකාධිපති විසින් නිර්ණය කරනු ලබයි. 2024 වර්ෂයේ විගණන සැලසුම අභ්‍යන්තර විගණන අංශයෙන් පිළියෙල කොට කමිටුව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගෙන ඇත. |
| | (උ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල, වාර්ෂික වාර්තාවේ ගිණුම්වල හා හෙළිදරව් කිරීම පිණිස සකසා ඇති ත්‍රෛමාසික වාර්තාවන්හි විශ්වසනීය බව හා ඒවායෙහි අන්තර්ගතය, සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ තීරණ අධීක්ෂණය කරනු පිණිස කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සාමාලෝචනය කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම බැංකුවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් හා ත්‍රෛමාසික වාර්තා සමාලෝචනය කිරීමේදී කමිටුව පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය. (i) ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර; (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති හා යහපරිච වල කිසියම් වෙනස්වීමක්; (iii) විගණනයෙන් පැන නගින සැලකිය යුතු ගැළපීම්; (iv) ව්‍යාපාර අඛණ්ඩතා උපකල්පනය සහ (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතා වලට අනුකූලවීම. | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ප්‍රකාශනය සඳහා සූදානම් වන විට හෙළිදරව් කිරීමේ අරමුණු සඳහා සකස් කරන ලද බැංකුවේ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තාව සමාලෝචනය කර ඇත. මෙම සෑම අවස්ථාවකදීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අවධානය පිණිස අභ්‍යන්තර විගණන අංශය විසින් ලබාදෙන සමාලෝචන වාර්තාවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්කම්, ප්‍රධාන තීරණාත්මක ක්ෂේත්‍රයන්හි විචලන ආදිය පිළිබඳ වෙනම සමාලෝචන වාර්තාවක් අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කෙරේ.<br>එසේ කිරීමේ අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. |

| | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|
| (ඐ) අවසන් හා අතුරු විගණනවලින් පැන නගින කරුණු, ගැටළු හා සීමා සහ එම කරුණු ඇතුළුව විගණකවරයා විසින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන කරුණක් කමිටුව විසින් සාකච්ඡා කළ යුතුය. | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවසන් හා අතුරු විගණනවලින් පැන නගින කරුණු, ගැටළු හා සීමා සාකච්ඡා කරනු ලබයි. විගණකාධිපතිවරයාගේ නියෝජිතයෝ වසර පුරාම කමිටු රැස්වීම් සඳහා සහභාගී වූහ. |
| (එ) කමිටුව විසින් බාහිර විගණකවරයාගේ කළමණාකරණ ලිපිය හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනයට ලක් කළ යුතුය. | මුදල් පනතේ 14 (2) (ඇ) සහ 13 (7) (අ) යන වගන්ති යටතේ ඉදිරිපත් කරන ලද බාහිර විගණකවරයාගේ වාර්තාව සහ ඊට අදාළව කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. |
| (ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යභාරය සම්බන්ධයෙන් කමිටුව විසින් පහත සඳහන් පියවර ගත යුතුය.<br>(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සම්පත්, කාර්ය භාරය හා විෂයය පථය ආදියෙහි ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ එහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය අධිකාරි බලය දෙපාර්තමේන්තුව සතුව පවතින බවට තෘප්තිමත් වීම. | අනුකූලවී ඇත.<br>අභ්‍යන්තර විගණන අංශය විසින් සකස් කරන ලද 2024 වර්ෂය සඳහා වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර, එහි සැලැස්මට අදාළ විෂය පථය, කාර්යයන් සහ සම්පත් අවශ්‍යතා ඇතුළත් විය. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව එම සැලැස්ම අනුමත කරන ලදී. |
| (ii) අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විටෙක අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත යෝග්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම.<br>(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ යම් කාර්යසාධන ඇගයීමක් සමාලෝචනය කිරීම. | අනුකූලවී ඇත.<br>අභ්‍යන්තර විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන ක්‍රමවේදයන්හි ප්‍රතිඵල සමාලෝචනය කරනු ලබන අතර වැඩි දියුණු කිරීම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික වේ.<br>ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්ය සාධන ඇගයීම සහ අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රතිඵල සාමාන්‍යයෙන් වසරේ පළමු කාර්තුව තුළ විගණන කමිටුව විසින් ඇගයීමට ලක් කරනු ලැබේ. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීම ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇගයීම් ක්‍රියාවලියට අනුව සිදු කරනු ලබන අතර එය විගණන කමිටුව ඉදිරියේ සභාගත කරනු ලැබේ. |
| (iv) අභ්‍යන්තර විගණන කාර්යභාරය සඳහා පත්කළ ප්‍රධානියාගේ, ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ පත්වීමක් හෝ සේවය අවසන් කිරීමක් නිර්දේශ කිරීම හා කුලී පදනම මත සේවය සපයන ආයතන පත් කිරීම/ඉවත් කිරීම නිර්දේශ කිරීම. | අදාළ නොවේ.<br>වසර තුළදී එවැනි සිදුවීමක් පැන නැගුනේ නැත. |
| (v) අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ වෙනත් සමාගම් හරහා සේවා සපයන්නන් ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කෙරෙන බවට වග බලා ගැනීම සහ එලෙස ඉල්ලා අස්වූ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්හට සහ බාහිර සමාගම් හරහා සේවා සපයනු ලබන සේවකයින්හට ඔවුන්ගේ ඉල්ලා අස්වීම් සම්බන්ධ හේතු සැපයීමට අවස්ථාව සැපයීම. | අදාළ නොවේ.<br>වසර තුළදී එවැනි සිදුවීමක් පැන නැගුනේ නැත. |
| (vi) අභ්‍යන්තර විගණන කාර්යයන් ස්වාධීනව සිදුකරනු ලබන බවට සහතිකවීම වස් එහි කටයුතු අපක්ෂපාතීව, ප්‍රවීනත්වයකින් හා නිසි වෘත්තීමය සැලකිල්ලකින් යුතුව සිදු කිරීම. | අනුකූලවී ඇත.<br>බැංකුවේ පාලන ව්‍යුහය අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුව වාර්තා කරන අතර බැංකුවේ වෙනත් මෙහෙයුම් වලින් ස්වාධීන වේ. |
| (ඔ) සිදුකරන අභ්‍යන්තර විමර්ශනවල මූලික හෙළිදරව් කිරීම් සහ ඊට කළමණාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතුය. | අනුකූලවී ඇත.<br>කමිටුව විසින් අභ්‍යන්තර විමර්ශනවලදී සිදු කරන ලද මූලික හෙළිදරව් කිරීම් සහ ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කර ඇත. එවැනි පරීක්ෂණ වල නිර්දේශ ක්‍රියාත්මකවූ බවද සහතික කෙරේ. |

# 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සමග අනුකූලතාවීම



| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඕ) ප්‍රධාන මුල්‍ය නිලධාරියා, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම් වලට සහභාගී වෙති. විධායක අධ්‍යක්‍ෂවරුන් නොමැතිව කමිටුව විසින් බාහිර විගණකවරුන් සමග අවම වශයෙන් රැස්වීම් 2 ක් පවත්වා ඇත. | අනුකූලවී ඇත.<br><br>2024 වර්ෂය තුළ රැස්වීම් 09 ක් පවත්වා ඇති අතර, විගණකාධිපති කාර්යාලයේ නියෝජිතයා සියළු රැස්වීම් වලට පැමිණ ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගිවේ. ඉහත රැස්වීම්වලට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල වීගණන කමිටුව (BAC) බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ අභ්‍යන්තර විගණක නොමැතිව බාහිර විගණක ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී සමග රැස්වීම් 02 ක් පවත්වන ලදී. |
| | (ක) කමිටුවලට,<br><br>(i) කමිටුවේ විෂයය ක්ෂේත්‍රයට අයත් ඕනෑම කරුණක් පිළිබඳව විමර්ශනය කිරීමේ පැහැදිලි බලයක්;<br><br>(ii) ඒ සදහා අවශ්‍ය සම්පත් ;<br><br>(iii) තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව; සහ<br><br>(iv) අවශ්‍ය විටෙක අදාළ අත්දැකීම් සහිත බාහිර පාර්ශ්වයන්ට ආරාධනා කිරීමේ හා බාහිර පාර්ශ්වයන් වෙතින් වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ අධිකාරිය තිබිය යුතුය. | අනුකූල වී ඇත.<br><br>අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය අනුව කමිටුවට පහත බලතල ඇත.<br><br>* සිය යොමු කිරීමේ අනුදේශයට අනුකූලව ඕනෑම කරුණක් විමර්ශනය කිරීමේ පැහැදිලි බලය<br>* එසේ කිරීමට අවශ්‍ය සම්පත්<br>* තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව<br>* බාහිර වෘත්තිය උපදෙස් ලබාගැනීමේ සහ අවශ්‍ය වෙතොත් සහභාගීවීම සඳහා අදාළ සුදුසුකම් සහිත පුද්ගලයන්ට ආරාධනා කිරීමේ බලය<br><br>පිටු අංක 184 සිට 186 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව බලන්න. |
| | (ග) සාකච්ඡා කළ යුතු කරුණු සම්බන්ධයෙන් නිසි දැනුම්දීමකින් පසුව නිරතුරුව කමිටුව රැස්ව, එහි වගකීම් හා රාජකාරී ඉටු කිරීම සම්බන්ධ නිගමන වාර්තාකර තබා ගත යුතුය. | අනුකූලවී ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිතිපතා රැස්වීම් සැලසුම් කර ඇත. අවශ්‍යවූ විට අමතර රැස්වීම් සංවිධානය කෙරේ. වර්ෂය තුල කමිටුව 09 වතාවක් රැස් වී තිබේ. සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයන්ට නිසිලෙස පෙර දැනුම්දීමක් සිදු කරනු ලබන අතර එහි රාජකාරී හා වගකීම් ඉටු කිරීමට අදාළ නිගමන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ලේකම්/ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා වල සටහන් කෙරේ. |
| | (ච) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පහත කරුණු විස්තරාත්මකව හෙළිදරව් කළ යුතුය.<br><br>(i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු;<br><br>(ii) වර්ෂය තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව; සහ<br><br>(iii) එම රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්‍ෂවරයාගේ සහභාගීත්වය පිළිබඳ විස්තර | අනුකූලවී ඇත.<br><br>පිටු අංක 184 සිට 186 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ පහත කරුණු අඩංගු වේ.<br><br>(i) විගණන කමිටු ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර<br><br>(ii) 2024 වසර තුල පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් ගණන<br><br>(iii) එම රැස්වීම් වලට අදාළ එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු |
| | (ජ) කමිටුවේ ලේකම්, සමාගමේ ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්යයෙහි ප්‍රධානියා වන අතර, කමිටු රැස්වීම් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය. | අනුකූලවී ඇත.<br><br>ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම් කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරන අතර විස්තරාත්මක කමිටු වාර්තා පවත්වාගෙන යාම සිදු කෙරේ. |
| | (ට) මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කටයුතුවලදී සිදුවිය හැකි විෂමාචාර සම්බන්ධයෙන් සේවකයින්ට සිය රහස්‍යභාවය රැකගනිමින් කරුණු දැක්විය හැකි ආකාරය පිළිබඳ කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව, එවන් කරුණු සම්බන්ධයෙන් ස්වාධීන හා සාධාරණ විමර්ශන පැවැත්වීම සඳහා සුදුසු පියවර ගන්නා බවටත්, බාහිර විගණකවරුන් සමග බැංකුව පවත්වන සබඳතා අධීක්‍ෂණය සඳහා වන ප්‍රධාන නියෝජිත අධිකාරිය ලෙස ක්‍රියා කිරීමටත් කමිටුව වග බලා ගත යුතුය. | අනුකූලවී ඇත.<br><br>මෙම අංශ ආවරණය වන පරිදි මණ්ඩලය විසින් අනුමත කරන ලද වංචා අවදානම් කළමනාකරණය සහ රහසේ හඬ නැගීමේ ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. සැලකිය යුතු සොයාගැනීම් පිළිබඳ සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කරනු ලැබේ. බැංකුවේ සේවකයින් විසින් මතු කරන ලද ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් සාධාරණ හා ස්වාධීන පරීක්ෂණයක් සහ සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ගයක් පැවැත්වීම සඳහා ක්‍රියාවලියක් සහ නිසි පියවරයන් ක්‍රියාත්මක වේ.<br><br>අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකවරයා සමග බැංකුවේ සබඳතා අධීක්‍ෂණය කිරීමේ ප්‍රධාන නියෝජිතයා ලෙස කටයුතු කරයි. |

| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (6) (iii) | මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් පහත නීති අදාළ වේ.<br>(අ) බැංකුවේ අධ්‍යක්ෂවරුන්ට, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි හා ප්‍රධාන කළමණාකාරිත්වයට අදාළ පිරිස් වලට අදාළ පාරිශ්‍රමික පිළිබඳ ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා හා වෙනත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීම. | 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 10 වන වගන්තිය හා එහි සංශෝධන අනුව අධ්‍යක්ෂවරුන්ගේ වේතනය විෂයයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබයි. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වල වේතන සාමූහික එකඟතා ගිවිසුම මත අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් තීරණය කරනු ලබන ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරයි |
| | (ආ) කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා හා ප්‍රධාන කළමණාකාරීත්වයට අදාළ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක ලබාදිය යුතුය. | 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 08 වන වගන්තිය හා එහි සංශෝධන අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර ඉන් පස්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසිනි. අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති. එබැවින්, නිශ්චිත අරමුණු හා ඉලක්ක ඔවුන් වෙත පවරා නැත.<br>සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහාවූ ඉලක්ක හා අරමුණු සකස් කරන්නේ උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම පදනම් කරගෙන වන අතර ඒ පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් බැංකුවේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇත. ඒවා ප්‍රධාන කාර්යසාධන දර්ශක හා සම්බන්ධ වේ. |
| | (ඇ) කමිටුව විසින්, දෙන ලද ඉලක්ක වලට අනුව ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වල කාර්යසාධනය කලින් කලට ඇගයීම සිදු කළ යුතු අතර වේතන, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත ලබාදෙන වෙනත් දිරිදීමනා සංශෝධනය කිරීමේදී මූලික කරගත යුතු පදනම තීරණය කළ යුතුය. | වාර්ෂිකව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරිත්ව අංශයේ කාර්ය සාධනය පිළිබඳ නිර්ණායක පූර්ව ඇගයීම්, නියමිත ඉලක්ක සහ ඉලක්ක වලට එරෙහිව ඉදිරි වර්ෂයේ පළමු කාර්තුවේදී කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. |
| | (ඈ) ප්‍රධාන විධායක නිලධාරි හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැරුණුවිට අනෙකුත් සෑම කමිටු රැස්වීමකටම ප්‍රධාන විධායක නිළධාරියා සහභාගී විය යුතුය. | අනුකූලවී ඇත.<br>සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැරුණුවිට අනෙකුත් සෑම කමිටු රැස්වීමකටම සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරියා සහභාගී වී තිබේ. |
| 3 (6) (iv) | නාමයෝජනා කමිටුව සම්බන්ධයෙන් පහත නීති අදාළ වේ.<br>(අ) කමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිළධාරියෙකු සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් තෝරා ගැනීම/පත් කිරීම සඳහා කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක කළයුතුය. | අනුකූලවී ඇත.<br>ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගෙන් පස්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසින් වන අතර අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති.<br>11 වගන්තිය වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණඩලයේ එක් අධ්‍යක්ෂවරයෙකු එහි සභාපති වශයෙන් පත් කළ යුතු වේ. 26 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු හා යෝග්‍ය පුද්ගලයෙකු බැංකුවේ සාමාන්‍යාධිකාරී ලෙස පත් කළ යුතු අතර එම තැනැත්තා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරීද වේ. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කිරීමේ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් පත් කරනු ලැබේ. |
| | (ආ) වත්මන් අධ්‍යක්ෂවරුන් යළි තෝරා පත් කිරීම, කමිටුව විසින් සලකා බලා නිර්දේශ කිරීම (හෝ නොකිරීම) සිදු කරනු ලබයි. | අදාළ නොවේ.<br>ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගෙන් පස්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසින් වන අතර අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති. |
| | (ඇ) ප්‍රධාන විධායක නිළධාරී තනතුරට සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ තනතුරු සඳහා තෝරා පත් කිරීමේ හෝ උසස්කිරීමේ සුදුසුකම් සලකා බැලීමේ නිර්නායක, කමිටුව විසින් සකස් කළ යුතුය. | අනුකූලවී ඇත.<br>1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට හා එහි සංශෝධන වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව පිළිගත් ක්‍රමවේදයක් මත පදනම්ව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස්වීම් ක්‍රමවේදයක් බැංකුව තුල ක්‍රියාත්මක කර තිබෙන අතර ප්‍රධාන කළමනාකරණ තනතුරු වලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා එහි සඳහන් කර ඇත. |

# 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සමග අනුකූලතාවීම



| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඈ) 3 (3) නියාමනයෙහි අන්තර්ගත නිර්නායක මගින් නිශ්චිත ලෙස දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිළධාරී හා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ තනතුරු හොබවන පිරිස ඊට සුදුසු හා යෝග්‍ය බවට කමිටුව විසින් සහතික විය යුතුය. | අනුකූලවී ඇත.<br><br>අධ්‍යක්ෂවරුන් සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ පත්කරන අවස්ථාවේදී ඔවුන්ගෙන් අත්සන් සහිත දිව්රුම් ප්‍රකාශ සහ සහතික කිරීමේ ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් භාරගනු ලබන අතර ඉන් පසුව එම ප්‍රකාශ මානව සම්පත් සංවර්ධන අංශය විසින් ලබාගෙන යෝග්‍යතාව ඇගයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරේ. |
| | (ඉ) විශ්‍රාම යාමට නියමිත අධ්‍යක්ෂවරුන් /ප්‍රධාන කළමණාකාරිත්වයට අදාළ පිරිස් සඳහා අනුප්‍රාප්තික වැඩ පිළිවෙලක් සහ නව විශේෂඥතාවය/අතිරේක අවශ්‍යතා පිළිබඳව සලකා බලා කමිටුව විසින් වරින්වර නිර්දේශ ඉදිරිපත් කළයුතුය. | අනුකූලවී ඇත.<br><br>සභාපති, අධ්‍යක්ෂවරුන් හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ පත්වීම් සිදු කෙරෙන්නේ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට හා එහි සංශෝධන වලට අනුවය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ නිර්දේශය මත අනුප්‍රාප්තික වැඩපිළිවෙලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් පත් කරනු ලබයි. |
| | (ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපති ධූරය දැරිය යුතුය. ආරාධනය පිට ප්‍රධාන විධායක නිළධාරී හට රැස්වීම් වලට සහභාගි විය හැකිය. | අනුකූලවී ඇත.<br><br>කමිටුවේ සභාපතිත්වය දරනු ලබන්නේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසිනි. |
| 3 (6) (v) | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව: | |
| | (අ) ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කිරීම සඳහා අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්, ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වලින් කමිටුව සමන්විත විය යුතුය. කමිටුව ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග සමීපව කටයුතු කළ යුතු අතර කමිටුව වෙත පවරා ඇති අධිකාරිය සහ වගකීම යන රාමුව තුල අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය. | අනුකූල වී ඇත.<br><br>කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් සමන්විත වන අතර ප්‍රධාන අවදානම් නිලධාරියා පුළුල් අවදානම් කාණ්ඩ, එනම් ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් අධීක්ෂණය සඳහා වගකිව යුතුය. අනුකූලතා නිලධාරියා සියලුම කමිටු රැස්වීම්වලට ආරාධනාව මත සහභාගී වේ. අවශ්‍යතාවය මත ඕනෑම ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු හෝ සේවක මණ්ඩලයේ නිලධාරියෙකුට ආරාධනා කෙරේ. කමිටුව වෙත පවරා ඇති අධිකාරිය හා වගකීම් රාමුව තුල ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග කමිටුව සමීපව කටයුතු කරයි. |
| | (ආ) කමිටුව විසින්, බැංකුව මුහුණදෙන සියළු අවදානම්, එනම්, ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම, දර්ශක හා කළමනාකරණ තොරතුරු මත පදනම්ව මාසිකව ඇගයිය යුතුය. පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් වල අවදානම් කළමනාකරණය, බැංකු පදනම හා සමූහ පදනම යන දෙයාකාරයෙන්ම සිදු කළ යුතුය. | අනුකූල වී ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණය අවදානම් කළමනාකරණය, වෙළඳපොල හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය හා මෙහෙයුම් අවදානම් කළමනාකරණය හා සම්බන්ධ ප්‍රතිපත්ති අනුමත කරනු ලැබ ඇත. එය බැංකුවේ අවදානම් ඇගයීම හා කළමනාකරණ රාමුව සකස් කරනු ලබයි.<br><br>කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන පූර්ව නිශ්චිත අවදානම් අභිරුචි මට්ටම මත පදනම්ව අවදානම් කළමනාකරණ අංශය විසින් බැංකු පදනමෙන් හා සමූහ පදනමෙන් අවදානම් දර්ශක පිළිබඳ මාසික වාර්තා ඉදිරිපත් කරනු ලබයි. |
| | (ඇ) කමිටුව විසින් ණය කමිටුව, වත්කම් හා වගකීම් කමිටුව ආදී සියළු කළමනාකරණ කමිටුවල ප්‍රමාණාත්මකභාවය හා ඵලදායීතාවය සමාලෝචනය කරන අතර එමගින් ඒ හා ආශ්‍රිත නිශ්චිත අවදානම් හඳුනාගෙන ඒවා කමිටුව විසින් හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා යටතේ කළමනාකරණය වගබලාගනු ලබයි. | අනුකූල වී ඇත.<br><br>ප්‍රමාණවත් බව සහ සඵලතාවය තක්සේරු කිරීමට නිශ්චිත අවදානම් ආමන්ත්‍රණය කිරීම සහ එම අවදානම් කළමනාකරණය කිරීම සහතික කිරීමට නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් තුළ බැංකුවේ අවදානම් රුචි මට්ටම අනුව ණය කමිටුව, ආයෝජන කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි කළමනාකරණ මට්ටමේ කමිටු වල වාර්තා නිතිපතා කමිටුව විසින් සමාලෝචනය කරයි.<br><br>සියළුම කළමනාකරණ මට්ටමේ කමිටු වල ප්‍රමාණාත්මකභාවය හා ඵලදායීතාවය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි. |

| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඇ) නිශ්චිත අවදානම් වලින් ඇතිවන ප්‍රතිඵල අවම කිරීම සඳහා කමිටුව විසින් කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි. | අනුකූල වී ඇත.<br>කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද දූරදර්ශී මට්ටම් ඉක්මවන ආකාරයේ අවදානම් පැන නගින අවස්ථාවලදී නියාමන හා ප්‍රතිපත්ති මට්ටමේ අවශ්‍යතා මත පදනම්ව එවැනි අවදානම් අවම කිරීම සඳහා කමිටුව විසින් ක්ෂණික නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි. |
| | (ඉ) යාවත්කාලීන කළ ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියළු අංශ ඇගයීම සඳහා කමිටුව අවම වශයෙන් ත්‍රෛමාසිකව රැස්විය යුතුය. | අනුකූලවී ඇත.<br>වසර තුළ කමිටුව රැස්වීම් අටක් පවත්වා ඇත. රැස්වීම් සහ පැමිණීම් පිළිබඳ විස්තර 191 පිටුවේ දක්වා ඇත. |
| | (ඊ) කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි සහ/හෝ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්‍ෂ විසින් නියම කර ඇති පරිදි නිශ්චිත අවදානම් හඳුනාගැනීමට හා ඒ සම්බන්ධයෙන් නිසි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වන නිළධාරීන්ට එරෙහිව කමිටුව විසින් යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අනුකූලවී ඇත.<br>එවැනි ගැටළු විසඳීම සඳහා බැංකුව විසින් විනය ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කරන ලදී. වසර තුල එවන් අවශ්‍යතාවයක් පැන නොනැගුණි. |
| | (උ) කමිටුව විසින් සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය සහ/ හෝ උපදෙස් සඳහා අවදානම් ඇගයීම් වාර්තාවක් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය | අනුකූලවී ඇත.<br>කමිටුවේ නිර්දේශ සහ අවදානම් කළමනාකරණ වාර්තා සමග රැස්වීමට අදාළ සවිස්තරාත්මක වාර්තාව රැස්වීමෙන් පසුව ඊළඟට පැවැත්වෙන පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කෙරේ. |
| | (ඌ) බැංකුවේ සියළු මෙහෙයුම් ක්ෂේත්‍ර ආශ්‍රිතව නීති, රෙගුලාසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව ඇගයීම පිණිස කමිටුව විසින් අනුකූලතා ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය. ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස අතුරෙන් තෝරාගන්නා ලද කැපවීමෙන් කටයුතු කරන අනුකූලතා නිලධාරියෙකු විසින් අනුකූලතා ක්‍රියාවලිය ක්‍රියාවට නැංවිය යුතු අතර, ඒ පිළිබඳව වරින්වර කමිටුවට වාර්තා කළ යුතුය. | අනුකූලවී ඇත.<br>බැංකුවේ සියළු මෙහෙයුම් ක්ෂේත්‍ර ආශ්‍රිතව නීති, රෙගුලාසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව ඇගයීම පිණිස අනුකූලතා ක්‍රියාවලිය ස්ථාපිත කර තිබේ. මෙම කාර්යය පිළිබඳව ප්‍රධානත්වය දරනු ලබන්නේ අනුකූලතා නිළධාරියා විසිනි. අනුකූලතා නිළධාරියා විසින් කලින් කලට අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කරනු ලබයි. |
| 3 (7) | **සම්බන්ධිත පාර්ශවවල ගනුදෙනු** | |
| 3 (7) (i) | කිසියම් පුද්ගලයෙකු හා බැංකුව අතර කිසියම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් පැන නැගිය හැකි ඕනෑම ආකාරයේ අනිසි සට්ටනයක් වැළැක්වීමට අවශ්‍ය පියවර අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ගනු ලැබිය යුතුය. | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය අභිලාෂ ගැටීම වළක්වාලීම අරමුණු කරගෙන සම්බන්ධිත පාර්ශවයන්ට වඩා වාසිදායක ලෙස සැලකීම සීමා කිරීම සඳහා සම්බන්ධිත පාර්ශව, ඔවුන්ගේ ගණුදෙනු සහ ඒ ආශ්‍රිත සීමා ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව වල ගණුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියක් බැංකුව තුල ක්‍රියාත්මක වේ.<br>අධ්‍යක්ෂවරුන් තම අදාළ පාර්ශව ගනුදෙනු තනි තනිව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින අතර, හෙළිදරව් කිරීම වාර්ෂික වාර්තාවේ 343 පිටුවේ ප්‍රකාශයට පත් කර ඇත. |
| 3 (7) (ii) | සම්බන්ධිත පාර්ශව සමග සිදු කරන ගනුදෙනු වල ස්වභාවය මේ නියාමනය තුලින් ආවරණය විය යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව සමග සිදු කරන ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තිය මගින් පහත දැක්වෙන ගනුදෙනු ආවරණය වේ.<br>* ප්‍රදානයේ උපරිම සීමාව පිළිබඳව මූල්‍ය මණ්ඩල නියාමනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඕනෑම ආකාරයක ප්‍රදානයක් ලබාදීම.<br>* තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන ලෙස බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම.<br>* මූල්‍ය හෝ මූල්‍ය නොවන ඕනෑම සේවාවක් බැංකුවට සැපයීම හෝ බැංකුවෙන් ලබාගැනීම.<br>* එවැනි සම්බන්ධිත පාර්ශව වලට එළදායී විය හැකි හිමිකාරීත්ව විභවතාවයකින් යුත්, රහස්‍ය නැතහොත් වෙනත් ආකාරයකින් සංවේදී තොරතුරු බෙදාගැනීමට මග පාදන, බැංකුව හා සම්බන්ධිත පාර්ශව අතර වාර්තාකරණ ක්‍රමවේදයක් සහ තොරතුරු ප්‍රවාහයක් පවත්වාගැනීම.<br>මේ සම්බන්ධයෙන් තොරතුරු 343 පිටුවේ ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීම් සටහන 49 හි අනාවරණය කර ඇත. |

# 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සමග අනුකූලතාවීම



| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (7) (iii) | ඉහත 3 (7) (ස) නියමයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි ඒ හා සමාන ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන බැංකුවේ වෙනත් පාර්ශ්වයන්ට ලබා දෙන සැලකීමට වඩා වැඩි සැලකීමක් එවන් පාර්ශව වෙත පිරිනැමෙන ආකාරයෙන් ආශ්‍රිත පාර්ශව සමග ගනුදෙනුවල නියැලීමෙන් වළකින බවට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය. | අනුකූලවී ඇත.<br><br>බැංකුවේ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් අනෙකුත් ගනුදෙනුකරුවන්ට ලබා දෙන ප්‍රමාණයට වඩා සම්බන්ධිත පාර්ශවයන්ට වඩාත් හිතකර සැලකිලි ලබා දෙන සම්බන්ධිත පාර්ශව ගනුදෙනු තහනම් කර ඇත. ඒවාට පහත සඳහන් දෑ ඇතුළත් වේ.<br><br>එවැනි ගනුදෙනු හඳුනාගෙන ඒවා පිලිබඳ වාර්ෂික ප්‍රකාශන අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගනු ලැබේ. එකම ආකාරයේ ව්‍යාපාරයක් කරගෙන යන බැංකුවේ අනෙකුත් ආයතනයකට ලබා දෙන ගනුදෙනුවට වඩා "වඩා හිතකර සැලකීමක්" සහිත ඕනෑම ගනුදෙනුවක් හඳුනා ගැනීමට සහ වරින් වර මණ්ඩලයට වාර්තා කිරීමට පද්ධතියක් ද සංවර්ධනය කර ඇත.<br><br>සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී අදාළ පාර්ශ්වයන් සමඟ සිදු කරන ලද ගනුදෙනු (ඇත්නම්) 343 පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශනවල "ආශ්‍රිත පක්ෂ හෙළිදරව් කිරීම්" සටහන 49.5 හි හෙළිදරව් කර ඇත. |
| 3 (7) (iv) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අදාළ අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු පිරිසකගේ ඡන්දයෙන් අනුමැතිය ලැබී ඇති විට හැර බැංකුවක් එහි අධ්‍යක්ෂවරයෙකුට හෝ එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුට කිසිදු ආකාරයක ප්‍රදානයක් ලබාදීමට කටයුතු නොකළ යුතුය. | අනුකූලවී ඇත.<br><br>එවැනි සිදුවීම් වාර්තා වී නොමැත. |
| 3 (7) (v) | (අ) බැංකුවක් මගින්, යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ පුද්ගලයෙකුගේ සැලකිය යුතු උනන්දුවක් ඇති අරමුණක් වෙනුවෙන් කිසියම් ප්‍රදානයක් ලබාදී ඇති විටක, පසු කාලීනව එකී පුද්ගලයා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වුවහොත් එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමෙන් වසරක් ඇතුළත ඒ සඳහා මූල්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද හැකි වන පරිදි සුදුසු ඇපකරයක් ලබා ගැනීමට බැංකුව කටයුතු කළ යුතුය. | අනුකූලවී ඇත.<br><br>අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීම් ලැබීමට පෙර සියළුම අධ්‍යක්ෂවරුන් වෙතින් ප්‍රකාශ ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරන අතර එයට වැඩිමනත් ගනුදෙනු ඇත්නම් ඒවාද ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටී.<br><br>අවශ්‍යතාවයක් ඇති වුවහොත්, මුදල් මණ්ඩලය විසින් අර්ථ දක්වා ඇති පරිදි අවශ්‍ය ආරක්ෂාව ලබා ගැනීමේ අවශ්‍යතාවය පිලිබඳ බැංකුවේ සේවකයින් දැනුවත්ය. |
| | (ආ) 3 (7) (v) (අ) නියාමනයෙන් එවැනි ඇපකරයක් ලබාදී නොමැති විටක එවැනි ප්‍රදානයක් ලබාදෙන අවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුල හෝ පත්වීම් ලද දින සිට මාස දහඅටක කාලයක් ඉකුත්වී ඇති විට හෝ ඉහත අවස්ථා දෙකෙන් කලින් යෙදෙන අවස්ථාවට අනුව ඕනෑම ප්‍රදානයක් හේතුවෙන් ගෙවිය යුතු ඕනෑම මුදලක් පොලිය සමග එම අධ්‍යක්ෂවරයාගෙන් අයකරගැනීමට බැංකුව පියවර ගත යුතුය. | අනුකූලතා අංශය විසින් මෙම නියාමනය සම්බන්ධ ක්‍රියාවලිය නිරීක්ෂණය කරනු ලබන අතර ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ත්‍රෛමාසික වාර්තාවක් ඉදිරිපත් කෙරේ. |
| | (ඇ) ඉහත උප නියාමන වලට අනුකූලවීමට අපොහොසත් වන ඕනෑම අධ්‍යක්ෂවරයෙක් අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත්වූ බවට සැලකෙන අතර බැංකුව එවැන්නක් පිළිබඳ කරුණු මහජනතාවට හෙළි කළ යුතුය. | |
| | (ඈ) කෙසේවෙතත්, ප්‍රදානය කරන අවස්ථාවේදී බැංකුවේ සේවකයෙක්වූ සහ එම බැංකුවේ සියළු සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රදානය ලබාදුන් අධ්‍යක්ෂවරයෙකුට මෙම උපනියාමනය අදාළ නොවේ. | |
| 3 (7) (vi) | බැංකුවේ කාර්යමණ්ඩලයට අදාළ වන යෝජනා ක්‍රමයක් හැරුණු කොට වෙනත් කිසිදු ආකාරයක ප්‍රදානයක් හෝ "වඩා වාසිදායක සැලකීමක්" ලබාදීමට බැංකුවක් කටයුතු නොකළ යුතුය. | අනුකූලවී ඇත. |
| 3 (7) (vii) | ඉහත 3 (7) (v) සහ 3 (7) (vi) යන නියමන් යටතේ බැංකුවක් විසින් ලබාදෙන ලද ප්‍රදානයක් හෝ එවැනි ප්‍රදානයක කිසිදු කොටසක් හෝ ඊට අදාළ වන කිසිදු පොලියක් හෝ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව ප්‍රේෂණය නොකළ යුතු අතර එවැනි අනුමැතියකින් තොරව සිදු කරනු ලබන ඕනෑම ප්‍රේෂණයක් බල රහිත හා ඵල රහිත වේ. | අනුකූලවී ඇත.<br><br>එවැනි සිදුවීම් වාර්තා වී නොමැත. |

| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| **3 (8)** | **හෙළිදරව් කිරීම්** | |
| 3 (8) (i) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත කරුණු සම්බන්ධයෙන් සහතික විය යුතුය. | |
| | (අ) අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් නිර්දේශ කරනු ලබන ආකෘති වලට අනුකූල වන ලෙස සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළ වන පරිදි වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සහ ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ප්‍රකාශයට පත් කිරීම. | අනුකූලවී ඇත. |
| | (ආ) එවන් ප්‍රකාශ සංක්ෂිප්තව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පුවත්පත්හි පළ කිරීම. | අනුකූලවී ඇත. |
| 3 (8) (ii) | පහත සඳහන් අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවෙහි සිදුකර ඇති බවට සහතික කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය. | |
| | (අ) නිශ්චිත හෙළිදරව් කිරීම් ඇතුළුව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන උපදෙස් වලට අනුව විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවට සඳහන් කෙරෙන ප්‍රකාශයක්. | අනුකූලවී ඇත.<br>වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම පිළිබඳ හෙළිදරව් කිරීම 229 පිටුවේ "මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය" සහ 233 පිටුවේ "සාමාන්‍ය අධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ වගකීම් ප්‍රකාශය" යන ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇත. |
| | (ආ) මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වාසනීය බව සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් සැපයීම අරමුණු කරගනිමින් මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බවට සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන උපදෙස් වලට අනුකූලව සිදු කෙරෙන බව තහවුරු කිරීම සඳහා වන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්. | අනුකූලවී ඇත.<br>මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වාසනීය බව සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන උපදෙස් වලට අනුකූලව සිදු කර ඇති බව වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති බව පහත දැක්වෙන වාර්තා ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සනාථ කරනු ලැබ ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිටු අංක 223 සිට 228 දක්වා.<br>මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය 229 පිටුව.<br>මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 230 සහ 231 පිටුවල. |
| | (ඇ) 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව පිළියෙල කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද කිසියම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් ඉහත 3 (8) (ii) (ආ) නියාමනයෙහි සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි ඵලදායීතාවය පිළිබඳ බාහිර විගණකවරයාගේ සහතිකය. | අනුකූලවී ඇත.<br>මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාව පිළිබඳව පිටු අංක 232 හි දැක්වෙන සහතිකය බැංකුව විසින් ලබාගෙන ඇත. |
| | (ඈ) අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු<br>(i) නම්, නිසි යෝග්‍යතාවය සහ දේපළ<br>(ii) බැංකුව සමග ඇති ගනුදෙනු සහ;<br>(iii) බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු/පාරිශ්‍රමික | අනුකූලවී ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ 160 සිට 162 දක්වා පිටුවල දක්වා ඇත.<br>343 පිටුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 49.5 බලන්න.<br>343 පිටුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 49.5.1 බලන්න. |
| | (ඉ) 3 (7) (iii) හි නියම කර ඇති පරිදි, සම්බන්ධිත පාර්ශවයන්ගේ එක් එක් කොටසකට ලබාදී ඇති සමස්ත ශුද්ධ ප්‍රදාන. අදාළ පාර්ශවවල එක් එක් කොටසකට ප්‍රදානය කර ඇති සමස්ත ශුද්ධ ප්‍රදාන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කළ යුතුය. | අනුකූලවී ඇත<br>බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස ලබා දී ඇති ශුද්ධ නවාතැන් පහසුකම් මූල්‍ය ප්‍රකාශනවල 344 පිටුවේ 49.5.3 සටහනේ දක්වා ඇත. |

| | | 2024 දී අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඊ) බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වෙත ගෙවන ලද වේතන වල සමුච්චිත අගය සහ වේතන ආදී පුළුල් වර්ගීකරණ යටතේ දක්වා ඇති බැංකුව හා එහි ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් අතර සිදු කෙරුණු ගනුදෙනුවල සමුච්චිත අගය. | අනුකූලවී ඇත.<br>පිටු අංක 343 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශ යටතේ අංක 49.5.1 සටහන මගින් අදාළ විස්තර දක්වා ඇත. |
| | (උ) ආයතනික පාලන වාර්තාවේ මෙම නියාමන සමග අනුකූලවීම සම්බන්ධයෙන් බාහිර විගණකවරයාගේ වාර්තාව | අනුකූලවී ඇත.<br>2007 අංක 12 දරන ආයතනික පාලන විධානයට අනුකූලතා මට්ටම පිළිබඳව බැංකුව විගණකාධිපතිවරයාගෙන් සහතිකයක් ඉදිරියේදී ලබා ගනු ඇත. විගණකාධිපතිවරයාගේ සියලු සොයාගැනීම් මෙම ආයතනික පාලන වාර්තාවට ඇතුළත් කරනු ලබන අතර ඕනෑම නිර්දේශයක් ඉදිරි වර්ෂයේදී සලකා බලනු ඇත. |
| | (ඌ) විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති, අභ්‍යන්තර පාලන සහ කිසියම් සැළකිය යුතු අනුකූල නොවීමේ අවස්ථාවක් නිවැරදි කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග යනාදිය ඇතුළත් වාර්තාවක් | අනුකූල වී ඇත.<br>පිටු අංක 229 හි සඳහන් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති, අභ්‍යන්තර පාලන සමග අනුකූලවීම පිළිබඳ තොරතුරු පැහැදිලිව දක්වා ඇත. |
| | (එ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුලුහුඩුකම් පිළිබඳ නියාමන හා අධීක්ෂණ කරුණු හෝ බැංකු අධීක්ෂණ අංශයෙහි අධ්‍යක්‍ෂ විසින් පෙන්වා දෙන ලද, මෙකී නියාමයන්ට අනුකූල නොවන අවස්ථා සහ එසේ මූල්‍ය මණ්ඩලය විසින් මහජනතාවට හෙළිදරව් කළ යුතු යැයි නියම කරන ලද එවැනි කරුණු මෙන්ම එම කරුණු සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලැබූ පියවර ඇතුළත් ප්‍රකාශයක් | 2024 කාලය තුළ එවැනි ආකාරයේ කිසිදු සිදුවීමක් සිදු නොවූ අතර, එබැවින්, මුදල් මණ්ඩලය විසින් වසර තුළ කිසිදු හෙළිදරව් කිරීමක් ප්‍රසිද්ධියට පත් කරන ලෙස නියෝග කර නොමැත. |
| **3 (9)**<br>3 (9) (i) | **සංක්‍රාන්තික හා වෙනත් පොදු ප්‍රතිපාදන**<br>2008 ජනවාරි 01 වෙනිදා සිට මෙම විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම ආරම්භ වන අතර, මෙම විධිවිධානයන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති නම් සියළුම ලියාපදිංචි වාණිජ බැංකු විසින් 2009 ජනවාරි 01 වන දිනට හෝ ප්‍රථමව මෙම විධිවිධානයන්හි ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කළ යුතුය. | අනුකූල වී ඇත.<br>බැංකුව විසින් අදාළ සංක්‍රාන්තික ප්‍රතිපාදන සමග අනුකූල වී ඇත. |
| 3 (9) (ii) | නිශ්චිත ප්‍රඥප්තියක් මගින් ශ්‍රී ලංකාව තුළ ස්ංස්ථාපිත බැංකු විසින් අදාළ ප්‍රඥප්තිවල සඳහන් කර ඇති ආකාරයට කටයුතු කරන බවට අනුකූල වන බවටත් එසේ නොවන අවස්ථාවලදී මෙම විධිවිධානවලට අනුකූල වන බවටත් අධ්‍යක්‍ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය. | අනුකූල වී ඇත.<br>1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධනවලට මෙම විධිවිධානයෙහි සඳහන් ප්‍රතිපාදනවලට නොගැලපෙන අවස්ථාවන්හිදී අනුකූලවීම සඳහා අදාළ සියළු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව මෙහි සඳහන් විධිවිධාන වලට අනුකූල නොවී ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අදාළ ප්‍රඥප්තිවලට අනුකූලව කටයුතු කරන අවස්ථාවන්වලදී ඒවා ඒ ඒ අංශවලදී විශේෂයෙන් සඳහන් කර ඇත. |
| 3 (9) (iii) | එවැනි බැංකුවක සංස්ථාපිත රටෙහි අදාළ වන රෙගුලාසි සහ නීතිවලට පටහැනි නොවන තරමට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශීය බැංකුවල ශාඛාවලට මෙම උපදෙස් අදාළ වේ. විදේශීය බැංකුවක ශාඛාව විසින් එහි මව් බැංකුවේ වාර්ෂික ආයතනික පාලන වාර්තාව එහි වාර්ෂික වාර්තාව සහ ශ්‍රී ලංකාවේ ශාඛා මෙහෙයුම් පිළිබඳ ගිණුම් ද ප්‍රකාශයට පත් කළ යුතුය. | අදාළ නොවේ. |
| 3 (9) (iv) | මෙම විධානයේ යම් විධිවිධාන සහ කිසියම් බැංකුවකට අදාළ සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර රීති) අතර ගැටුමක් ඇති වුවහොත් මෙම විධානයේ විධිවිධාන බල පැවැත්වේ. කෙසේ වෙතත් කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය මෙම විධානයෙහි ප්‍රමිතියට වඩා දැඩි ප්‍රමිතියක් සකසන්නේ නම්, එවැනි සාංගමික ව්‍යවස්ථාවලියේ විධිවිධාන අනුගමනය කළ හැකිය. | අදාළ නොවේ. |

# ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද 2023 ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය (the code) සමග අනුකූලතාව



| කේතය යොමුව | මූලධර්ම |
|---|---|
| **A** | **අධ්‍යක්ෂවරු** |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | **1,751** | **1** | 1,276 | 1 | 1,940 | 1 | 2,843 | 2 | 2,556 | 2 |
| වෙනත් පොළී නොවන ආදායම | **1,810** | **1** | 3,504 | 2 | (583) | (0) | 450 | 0 | 2,325 | 2 |
| මුළු මෙහෙයුම් ආදායම | **76,342** | **37** | 34,345 | 15 | 33,820 | 19 | 57,923 | 43 | 39,771 | 31 |
| හානිකරණ අයකිරීම් | **(11,206)** | **(5)** | (4,259) | (2) | (4,862) | (3) | (4,304) | (3) | (4,874) | (4) |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | **65,136** | **31** | 30,086 | 13 | 28,958 | 17 | 53,619 | 40 | 34,897 | 27 |
| සේවක මණ්ඩල වියදම් | **(20,306)** | **(10)** | (16,110) | (7) | (13,791) | (8) | (12,970) | (10) | (9,967) | (8) |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් | **(1,675)** | **(1)** | (1,433) | (1) | (1,415) | (1) | (1,386) | (1) | (1,241) | (1) |
| වෙනත් වියදම් | **(7,378)** | **(4)** | (6,955) | (3) | (5,990) | (3) | (4,719) | (3) | (4,258) | (3) |
| බදු වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව) | **35,778** | **17** | 5,589 | 2 | 7,763 | 4 | 34,544 | 26 | 19,431 | 15 |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | **(8,208)** | **(4)** | (1,143) | (0) | (3,186) | (2) | (6,162) | (5) | (3,787) | (3) |
| මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු | **(1,140)** | **(1)** | (159) | (0) | (67) | (0) | – | – | – | – |
| ආදායම් බදුවලට පෙර ලාභය/(පාඩුව) | **26,431** | **13** | 4,287 | 2 | 4,510 | 3 | 28,381 | 21 | 15,645 | 12 |
| ආදායම් බදු වියදම | **(10,145)** | **(5)** | 2,929 | 1 | (1,980) | (1) | (6,262) | (5) | (5,537) | (4) |
| කාල සීමාව සඳහා ලාභය/(පාඩුව) | **16,285** | **8** | 7,216 | 3 | 2,530 | 1 | 22,120 | 16 | 10,108 | 8 |

# මූල්‍ය තත්ත්වය පිලිබඳ තිරස් විශ්ලේෂණය



| දෙසැම්බර් 31 දිනට | 2024 | | 2023 | | 2022 | | 2021 | | 2020 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % |
| **වත්කම්** | | | | | | | | | | |
| මුදල් සහ මුදලට සමානයන් | **8,359** | **(12)** | 9,509 | 9 | 8,734 | 14 | 7,656 | 18 | 6,492 | 21 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | **357** | **45** | 247 | 4 | 236 | – | – | – | – | – |
| බැංකුවල ඇති තැන්පතු | **14,795** | **(34)** | 22,577 | 116 | 10,466 | 47 | 7,121 | (46) | 13,253 | 7 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **9** | **888** | 1 | (97) | 28 | – | – | (100) | 20 | 71 |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් | | | | | | | | | | |
| – සාධාරණ අගයට ගණනය කළ | **21,087** | **19** | 17,749 | 25 | 14,174 | (28) | 19,573 | 74 | 11,222 | (2) |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| – ණය හා අත්තිකාරම් | **532,379** | **1** | 526,521 | (5) | 553,027 | 3 | 538,942 | 4 | 516,795 | 14 |
| – ණය හා වෙනත් උපකරණ | **1,039,035** | **10** | 943,705 | 3 | 919,129 | (2) | 935,350 | 24 | 754,233 | 23 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | **53,469** | **(14)** | 61,924 | 124 | 27,663 | 100 | 13,818 | (10) | 15,272 | 339 |
| පාලිත සමාගම්වල ආයෝජනයන් | **7,311** | **–** | 7,311 | – | 7,311 | 52 | 4,811 | – | 4,811 | – |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනයන් | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| දේපල, පිරියත සහ උපකරණ | **17,416** | **1** | 17,249 | 17 | 14,756 | (2) | 15,046 | (2) | 15,316 | 13 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | **1,041** | **(11)** | 1,165 | (4) | 1,214 | 1 | 1,206 | (2) | 1,226 | 14 |
| දේපළ ආයෝජන | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | **2,184** | **193** | 745 | (0) | 747 | (8) | 816 | 19 | 688 | 15 |
| විලම්බිත බදු වත්කම් | **4,995** | **(15)** | 5,885 | 103 | 2,893 | 162 | 1,105 | (24) | 1,446 | – |
| වෙනත් වත්කම් | **50,002** | **(31)** | 72,379 | 29 | 56,307 | 67 | 33,655 | 46 | 23,034 | (35) |
| මුළු වත්කම් | **1,752,438** | **4** | 1,686,965 | 4 | 1,616,686 | 2 | 1,579,099 | 16 | 1,363,808 | 18 |
| **වගකීම්** | | | | | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | **488** | **(95)** | 8,985 | 120 | 4,087 | (47) | 7,687 | (40) | 12,862 | (63) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **258** | **128,462** | 0 | – | – | – | – | – | – | – |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම් | | | | | | | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | **1,556,271** | **5** | 1,482,532 | 0 | 1,476,740 | 3 | 1,428,467 | 15 | 1,237,124 | 22 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | **48,190** | **(22)** | 61,611 | 267 | 16,766 | 117 | 7,720 | (5) | 8,160 | (62) |
| කල්බදු වගකීම් | **1,282** | **(6)** | 1,366 | (1) | 1,377 | 7 | 1,292 | 1 | 1,275 | 19 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | **16,966** | **(29)** | 23,807 | 0 | 23,778 | (37) | 37,529 | 18 | 31,774 | 19 |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | **17,490** | **(3)** | 18,100 | 45 | 12,489 | 45 | 8,591 | (26) | 11,600 | 131 |
| ප්‍රවර්තන බදු වගකීම් | **3,649** | **–** | – | (100) | 2,761 | (40) | 4,596 | 651 | 612 | – |
| විලම්බිත බදු වගකීම් | **–** | **–** | – | – | – | – | – | – | – | (100) |
| වෙනත් වෙන්කිරීම් | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| වෙනත් වගකීම් | **9,002** | **(2)** | 9,189 | 59 | 5,796 | (19) | 7,200 | 20 | 5,984 | 1 |
| පාලිත සමාගම්වලට ගෙවිය යුතු | **–** | **–** | – | – | – | (100) | 4 | (7) | 4 | 586 |
| මුළු වගකීම් | **1,653,596** | **3** | 1,605,590 | 4 | 1,543,794 | 3 | 1,503,086 | 15 | 1,309,394 | 18 |
| **හිමිකම්** | | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | **9,400** | **–** | 9,400 | – | 9,400 | – | 9,400 | – | 9,400 | – |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | **5,695** | **6** | 5,369 | 3 | 5,225 | 1 | 5,174 | 27 | 4,068 | 14 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | **4,213** | **228** | 1,286 | (177) | (1,670) | 154 | (658) | 51 | (435) | (237) |
| රඳවාගත් ඉපැයීම් | **28,462** | **98** | 14,408 | 27 | 11,359 | (17) | 13,728 | (5) | 14,400 | 76 |
| වෙනත් සංචිත | **51,072** | **0** | 50,911 | 5 | 48,578 | 0 | 48,369 | 79 | 26,981 | 10 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම | **98,843** | **21** | 81,374 | 12 | 72,892 | (4) | 76,013 | 40 | 54,414 | 18 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **1,752,438** | **4** | 1,686,965 | 4 | 1,616,686 | 2 | 1,579,099 | 16 | 1,363,808 | 18 |

| දෙසැම්බර් 31 දිනට | 2024 | | 2023 | | 2022 | | 2021 | | 2020 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % |
| වත්කම් | | | | | | | | | | |
| මුදල් සහ මුදලට සමානයන් | **8,359** | **0.5** | 9,509 | 0.6 | 8,734 | 0.5 | 7,656 | 0.5 | 6,492 | 0.5 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | **357** | **0.0** | 247 | 0.0 | 236 | 0.0 | – | – | – | – |
| බැංකුවල ඇති තැන්පතු | **14,795** | **0.8** | 22,577 | 1.3 | 10,466 | 0.6 | 7,121 | 0.5 | 13,253 | 1.0 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **9** | **0.0** | 1 | 0.0 | 28 | 0.0 | – | – | 20 | 0.0 |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| – සාධාරණ අගයට ගණනය කළ | **21,087** | **1.2** | 17,749 | 1.1 | 14,174 | 0.9 | 19,573 | 1.2 | 11,222 | 0.8 |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්** | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| – ණය හා අත්තිකාරම් | **532,379** | **30.4** | 526,521 | 31.2 | 553,027 | 34.2 | 538,942 | 34.1 | 516,795 | 37.9 |
| – ණය හා වෙනත් උපකරණ | **1,039,035** | **59.3** | 943,705 | 55.9 | 919,129 | 56.9 | 935,350 | 59.2 | 754,233 | 55.3 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | **53,469** | **3.1** | 61,924 | 3.7 | 27,663 | 1.7 | 13,818 | 0.9 | 15,272 | 1.1 |
| පාලිත සමාගම්වල ආයෝජනයන් | **7,311** | **0.4** | 7,311 | 0.4 | 7,311 | 0.5 | 4,811 | 0.3 | 4,811 | 0.4 |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනයන් | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| දේපල, පිරියත සහ උපකරණ | **17,416** | **1.0** | 17,249 | 1.0 | 14,756 | 0.9 | 15,046 | 1.0 | 15,316 | 1.1 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | **1,041** | **0.1** | 1,165 | 0.1 | 1,214 | 0.1 | 1,206 | 0.1 | 1,226 | 0.1 |
| දේපළ ආයෝජන | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | **2,184** | **0.1** | 745 | 0.0 | 747 | 0.0 | 816 | 0.1 | 688 | 0.1 |
| විලම්බිත බදු වත්කම් | **4,995** | **0.3** | 5,885 | 0.3 | 2,893 | 0.2 | 1,105 | 0.1 | 1,446 | 0.1 |
| වෙනත් වත්කම් | **50,002** | **2.9** | 72,379 | 4.3 | 56,307 | 3.5 | 33,655 | 2.1 | 23,034 | 1.7 |
| **මුළු වත්කම්** | **1,752,438** | **100.0** | 1,686,965 | 100.0 | 1,616,686 | 100.0 | 1,579,099 | 100.0 | 1,363,808 | 100.0 |
| **වගකීම්** | | | | | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | **488** | **0.0** | 8,985 | 0.5 | 4,087 | 0.3 | 7,687 | 0.5 | 12,862 | 0.9 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **258** | **0.0** | 0 | 0.0 | – | – | – | – | – | – |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම් | | | | | | | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | **1,556,271** | **88.8** | 1,482,532 | 87.9 | 1,476,740 | 91.3 | 1,428,467 | 90.5 | 1,237,124 | 90.7 |
| – ණය සුරැකුපත් හිමියන්ට ගෙවිය යුතු | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | **48,190** | **2.7** | 61,611 | 3.7 | 16,766 | 1.0 | 7,720 | 0.5 | 8,160 | 0.6 |
| කල්බදු වගකීම් | **1,282** | **0.1** | 1,366 | 0.1 | 1,377 | 0.1 | 1,292 | 0.1 | 1,275 | 0.1 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | **16,966** | **1.0** | 23,807 | 1.4 | 23,778 | 1.5 | 37,529 | 2.4 | 31,774 | 2.3 |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | **17,490** | **1.0** | 18,100 | 1.1 | 12,489 | 0.8 | 8,591 | 0.5 | 11,600 | 0.9 |
| ප්‍රවර්තන බදු වගකීම් | **3,649** | **0.2** | – | – | 2,761 | 0.2 | 4,596 | 0.3 | 612 | 0.0 |
| විලම්බිත බදු වගකීම් | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| වෙනත් වෙන්කිරීම් | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| වෙනත් වගකීම් | **9,002** | **0.5** | 9,189 | 0.5 | 5,796 | 0.4 | 7,200 | 0.5 | 5,984 | 0.4 |
| පාලිත සමාගම්වලට ගෙවිය යුතු | **–** | **–** | – | – | – | – | 4 | 0.0 | 4 | 0.0 |
| හිලව් වන ගිණුම් | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| **මුළු වගකීම්** | **1,653,596** | **94.4** | 1,605,590 | 95.2 | 1,543,794 | 95.5 | 1,503,086 | 95.2 | 1,309,394 | 96.0 |
| **හිමිකම්** | **–** | **–** | – | – | – | – | – | – | – | – |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | **9,400** | **0.5** | 9,400 | 0.6 | 9,400 | 0.6 | 9,400 | 0.6 | 9,400 | 0.7 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | **5,695** | **0.3** | 5,369 | 0.3 | 5,225 | 0.3 | 5,174 | 0.3 | 4,068 | 0.3 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | **4,213** | **0.2** | 1,286 | 0.1 | (1,670) | (0.1) | (658) | (0.0) | (435) | (0.0) |
| රඳවාගත් ඉපැයීම් | **28,462** | **1.6** | 14,408 | 0.9 | 11,359 | 0.7 | 13,728 | 0.9 | 14,400 | 1.1 |
| වෙනත් සංචිත | **51,072** | **2.9** | 50,911 | 3.0 | 48,578 | 3.0 | 48,369 | 3.1 | 26,981 | 2.0 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම | **98,843** | **5.6** | 81,374 | 4.8 | 72,892 | 4.5 | 76,013 | 4.8 | 54,414 | 4.0 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **1,752,438** | **100.0** | 1,686,965 | 100.0 | 1,616,686 | 100.0 | 1,579,099 | 100.0 | 1,363,808 | 100.0 |

# අනුරූප බැංකු



**Banca Popolare Di Sondrio – Italy**
Piazza Garibaldi 16
23100,
Sondrlom SO, Italy
POSOIT22
www.popso.it
Phone: +390342528111
+390342528204

**Citi Bank – New York – USA**
388, Greenwich Street New York,
NY 10013,USA CITIUS33
www.citibank.com
Phone: +800-285-3000

**DBS Bank – Singapore**
DBS Bank Ltd.,
2 Changi Business Park
Crescent, Lobby A # 04-02, DBS
Asia Hub,
Singapore 486029
DBSSSGSG
www.dbs.com
Phone: +65-6-2222200/
+65-6-8789010

**Deutsche Bank AG Frankfurt – Germany**
Deutsche Bank AG,
P.O. Box: 60202 Frankfurt am
Main, Germany
DEUTDEFF
www.deutsche-bank.com.de
www.db.com
Phone: +49 6991000/
+49 6991034225

**Deutsche Bank Trust Company**
Americas – New York – USA
No. 60, Wall Street, New York,
NY 10005, USA BKTRUS33
www.db.com
Phone: +1 212 2502500/
+1 212 7970291

**Emirates NBD Bank PJSC – Dubai – UAE**
P.O. Box 777, Deira, Dubai
United Arab Emirates
EBILAEAD
www.emiratesnbd.com
Phone: +971-600 540000

**Keb Hana Bank – Seoul – Korea**
55, Eulji-ro, Jung-gu,
Seoul-Republic of Korea
KOEXKRSE
www.kebhana.com
Phone: +82-02-2002-1111

**Kookmin Bank – Seoul – Korea**
9-1,Namdaemunno 2-GA,
Jung-Gu Seoul 100-092
CZNBKRSE
www.kbfg.com
Phone: +82-(2)-2073-2869

**MUFG Bank (Bank of Tokyo Mitsubishi Ltd) – Tokyo – Japan**
2-7-1, Marunouchi, Chiyoda-ku,
Tokyo, 100-8388,
Japan BOTKGPJT
www.bk.mufg.jp
Phone: +81-3-3240-1111

**Post Finance AG – Bern – Switzerland**
Mingerstrasse 20,
3030 Berne,
Switzerland
POFICHBE
Phone: +4184888710

**Unicredito Italiano SPA – Milano – Italy**
Piazza Gae Aulenti 3 Tower
A20154 Mingerstrasse 20,
54, Italy
UNICRITMM
www.unicreditgroup.eu
Phone: +39 02 88 621/
+390288623340

**Woori Bank – Seoul – Korea**
1-203,
Hoehyeon-dong, Jung-gu,
Seoul HVBKKRSE
www.wooribank.com
Phone: +82-2-2006 5000

**Al Ahalia Exchange**
P.O. Box: 35245 Electra Street,
Abu Dhabi, UAE
Phone: +971229666

**Al Ansari Exchange**
Al Ansari Exchange LLC
Al Ansari Business Centre
Level 8, Al Barshal
P.O. Box: 6176, Dubai UAE
Phone: +97143772890/
+97143772788

**Al Fardan Exchange – Qatar**
P.O. Box: 9948, Doha Qatar
Phone: +974444408408

**Al Mulla International**
P.O. Box: 177
Safat 13002 Kuwait
Phone: +96522478250/
+22478242

**Al Rajhi Bank**
Olaya Street, Aqaria 3,
Riyadh, 1111,
Kingdom of Saudi Arabia
www.alrajhibank.com.sa
Phone: +96614603333

**Al Rostamani International**
The Maze Tower Level 18
Sheikh Zayed RD
POB 10072, Dubai UAE
Phone: +97144543200/
+97144543284

**Al Dar for Exchange Works**
AlDar for Exchange works
IBA bldg C Ring
Doha Qatar

**ANB Bank - Saudi Arabia**
PO Box 56921 Riyadh 11564.
Kingdom Of Saudi Arabia
Phone: +966 800 124 4040

**Bahrain Exchange**
Bahrain Exchange Company
W.L.L.M Floor Al Hajery Building
P.O. Box: 29149,
Safat 13152 Kuwait
Phone: +96522089039/
+96522280520

**Bahrain Finance Company**
(Easy remit is a product of BFC)
P.O. Box: 243, 3rd Floor,
Bab Al Bahrain Building
Manama Bahrain
Phone: +97339958195

**Bank Al Bilad**
Corporate Banking Division
P.O. Box: 140 Riyadh
11411 Saudi Arabia
Phone: +96692000/002

**City Exchange Company – Qatar**
City Exchange Co. LLC,
Al Wathan Doha Qatar
City-Exchange Main Branch
and Head Office
Phone: +974 4476 9777

**City Int. Exchange Company – Kuwait**
City Exchange Co. LLC,
Al Wathan Doha Qatar
City-Exchange Main Branch and
Head Office
Phone: +974 4476 9777845

**Doha Bank – Qatar**
Doha Bank Head Office Tower,
Corniche Street West Bay
P.O. Box: 3818, Doha, Qatar
Phone: +97444257633

**Federal Exchange – UAE**
Shop No.7, Ground Floor,
Ahmed Eissa Al Hameli
Building, Thiqah Street, M-17,
Mussafah, Abu Dhabi UAE
Phone: +971 4 325 0077

**Gmoney Trans Co Ltd – Korea**
305-2, Jong ro, Jongno-gu, Seoul,
Republic of Korea
www.gmoneytrans.com
Phone: +82-2-1670-4565

**Hanpass Company Ltd.**
4th Floor,
92 Achasan-ro
(Gwangmyeong Tower)
Seongdong-gu, Seoul,
South Korea
Phone: +82-10-6610-4351

**Harbour & Hills Ltd**
Shop 302/23-31 La Trobe St,
Melbourne VIC3000, Australia
Phone: +61 8 7150 1508

**Index Exchange(Habib) UAE**
Office 201, 2nd Floor,
Sons of Jassim Darwish
Building,
Zayad 1st street, Khalidiyah
P.O. Box: 2370, Abu Dhabi UAE
Phone: +97126272656

**Instant Cash**
Instant Cash FZE
P.O. Box: 3014 Dubai, UAE
Phone: + 971 4 2059000/
Ext: 260

**Japan Remit Finance**
Co., Ltd (JRM)
3F Modulo
Hamamatsucho BLDG, 1-2-15,
Hamamatsucho, Minato-ku,
Tokyo, 105-0013, Japan
Website: www.jpremit.com
Phone: +81 3 5733 4337

**Joyalukkas Exchange**
(Majan Exchange – Oman)
P.O. Box:583
P.C.117 Ruwi
Sultanate of Oman
Phone: +96824794017/18

**Lulu Exchange**
(Asia Express Exchange)
P.O. Box: 881 Postal Code 112,
Ruwi High Street Muscat,
Sultanate of Oman
Phone: +97126547019

**National Exchange**
Company – Italy
Via Ferruccio 30,00185
Rome Italia
Phone: + 390644341221

**Ria Money Transfer**
6565 Knott Ave, Buena Park,
CA 90620, United States
Phone: +1 562-345-2100

**Transfast LLC**
44 Wall Street, 4th Floor
New York NY10005
Trans-Fast GCC 903
Al Thurayya 2 Dubai Media City
Dubai UAE
Phone: +971 4 4587251

**Unistream**
20, Verhnyaya Maskovka Street
Building 2, 127083
Moscow, Russia
Phone: +74955179260

**Western Union LLC**
Denver, Colorado, United States

# මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂිත වචන මාලාව



## A

**ජීවගණක උපකල්පනයන්**

ජීවගණක උපකල්පන ආයතනයක අපක්ෂපාතී සහ අන්‍යෝන්‍ය වශයෙන් ගැලපෙන ජන විකාස සහ මූල්‍ය විචල්‍යයන්ගේ හොඳම ඇස්තමේන්තු මගින් පශ්චාත් රැකියා ප්‍රතිලාභ ලබාදීමේ අවසාන පිරිවැය තීරණය කරනු ඇත.

**ගිණුම්කරණ ප්‍රතිපත්තීන්**

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ආයතනයක් විසින් භාවිතකර ඇති නිශ්චිත මූලධර්ම, පදනම්, ගිවිසුම්, නීති හා පරිචයන්.

**උපචිත පදනම**

ගණුදෙනු හා වෙනත් සිද්ධීන් වලින් වන බලපෑම මුදල් හෝ මුදල් සමාන දෙයකින් ලැබීම හෝ ගෙවීම තෙක් ප්‍රමාද නොකොට ගනුදෙනු හා වෙනත් සිද්ධීන් සිදුවන අවස්ථාවේදීම එහි බලපෑම හඳුනාගැනීම.

**ජීවගණක ලාභ/අලාභ**

ආයතනයක විශ්‍රාම සැලැස්මේ ඇස්තමේන්තුව සහ සත්‍ය අත්දැකීම් අතර වෙනසින් ඇතිවන්නා වූ ලාභ හෝ අලාභ.

**ක්‍රමක්ෂය**

අස්පෘශ්‍ය වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිතකාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත විභජනය කිරීම.

**ක්‍රමක්ෂය පිරිවැය**

ක්‍රමක්ෂය පිරිවැය යනු මූල්‍ය වත්කම්/මූල්‍ය වගකීම්, මූලික හඳුනාගැනීමේදී ගණනය කරනු ලබන අගයෙන් සඵල පොළී ක්‍රමය උපයෝගී කරගනිමින් ආපසු ගෙවූ මුල් මුදල අඩුකර, සමුච්චිත ක්‍රමක්ෂය අඩුකර/එකතුකර හෝ ආරම්භක වටිනාකම හා කල්පිරීමේදී ඇති වටිනාකම අතර වෙනස හා හානිකරණය හෝ රැස්කිරීමට නොහැකිවීම මත සිදු කරන අඩුකිරීම් හැර මෙය ගණනය කරනු ලබයි.

**විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්**

මේ යටතට විකිණීම සඳහා පවතින ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් හෝ ණය හා අත්තිකාරම් ලෙස හෝ ලාභ/අලාභ තුළින් සාධාරණ වටිනාකමට ගලපන ලද මූල්‍ය වත්කම් හෝ කල්පිරෙන තෙක් දරා සිටින ආයෝජන ලෙස වර්ගීකරණය නොකළ වත්කම් අයත් වේ.

## B

**බාසල් III**

බාසල් III යනු බැංකු වල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ ද්‍රවශීලතාවය පිළිබඳ බැංකු අධීක්ෂණ බාසල් කමිටුව විසින් නිකුත් කරන ලද ගෝලීය ස්වේච්ඡා නියාමන කාර්යරාමුවකි.

**පදනම් අංකය (BP)**

සියයට දශම බිංදුවයි එක යන අවස්ථාව (සියයට 0.01); පදනම් අංක 100ක් සියයට 1කි. පොළී අනුපාතයන් හෝ සුරැකුම්වල ප්‍රතිලාභවල චලනයන් නියම කිරීමේදී භාවිතා කරනු ලැබේ.

**ව්‍යාපාර ආකෘති ඇගයීම**

මෙය මූල්‍ය වත්කම් වර්ගීකරණ ක්‍රියාවලියේ පළමු පියවරයි. ව්‍යාපාර ආකෘතිය යනු ආයතනයක් විසින් මුදල් ප්‍රවාහ උත්පාදනය සඳහා මූල්‍ය වත්කම් කළමනාකරණය කරනු ලබන ආකාරයයි. එය උපකරණ මට්ටමට වඩා සාමූහික මූල්‍ය වත්කම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබිඹු වන මට්ටමක එය තීරණය වේ. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 ව්‍යාපාර ආකෘති තුනක් හඳුනාගෙන ඇත. "එකතුකර ගැනීම සඳහා රඳවාගත්", "එකතුකර ගැනීම සඳහා රඳවාගත් සහ විකිණීම" සහ "වෙනත්", ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීමට එක් එක් ව්‍යාපාර ආකෘතියේ අරමුණු වටහා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ව්‍යාපාරයේ කාර්යසාධනය ප්‍රධාන කළමනාකාරිත්වයට වාර්තා කරන ආකාරය සහ ව්‍යාපාරයේ කළමනාකරුවන්ට වන්දි ගෙවීම වැනි ව්‍යාපාරයේ සියලුම අදාළ තොරතුරු සලකා බැලිය යුතුය.

## C

**ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත**

අන්තර්ජාතික පියවීම් (BIS) සඳහා බැංකුව විසින් සැලසුම් කළ හා දේශීය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නවීකරණය කරන ලද රාමුවට අනුව නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන හා අවදානම් බර තැබූ වත්කම් අතර ඇති සම්බන්ධතාවය.

**ප්‍රාග්ධන සංරක්ෂක අවරෝධකය**

නියාමනයන් විසින් බාසල් iii යටතේ ප්‍රාග්ධන අවරෝධකය විස්තර කරනු ලබන්නේ ආතති වලින් ඔබ්බට කාලවලදී බැංකු විසින් ස්ථාපිත කරන ලද ප්‍රාග්ධන සංරක්ෂකයන් අලාභ ලබන අවස්ථාවලදී එය අඩු කිරීම සඳහා ආපසු ගතහැකි පරිදි නිර්මාණය කරන සහතිකවීමක් ලෙසයි. බැංකුවල ප්‍රාග්ධන මට්ටම ප්‍රාග්ධන සංරක්ෂණ අවරෝධක පරාස මට්ටමට වඩා අඩු වූ විට ප්‍රාග්ධන බෙදාහැරීම් නියාමනයන් විසින් සීමා කරනු ලබයි.

**ප්‍රාග්ධන වියදම්**

දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා දරන ලද වියදම්.

**ප්‍රාග්ධන ලාභ**

වත්කමක් ඉවත් කිරීමෙන් (විකිණීමෙන්) ලැබෙන මුදලින් වත්කමේ පිරිවැය හා විකිණීම සඳහා වූ පිරිවැය අඩු කළ පසු ලැබෙන්නා වූ ලාභ ප්‍රාග්ධන ලාභ වේ.

**ප්‍රාග්ධන සංචිත**

1988 අංක 30 දරණ බැංකු පනත යටතේ නිශ්චිතව සඳහන් කර ඇති අරමුණු සඳහා වෙන්කර ඇති සංචිත අරමුදල් වලින් සහ දේපළ ප්‍රත්‍යාග ණන සංචිත අරමුදල් වලින් ප්‍රාග්ධන සංචිත සමන්විත වේ. මෙය අඩුකිරීමට හෝ බෙදාහැරීමට මූල්‍ය කමිටුවේ අනුමැතිය ලැබිය යුතුය.

**ධාරණ අගය**

වත්කම් හා වගකීම්වල සාධාරණ අගයට ගැලපුම් කිරීමට පෙර පවතින පොත් අගයයි.

**මුදල් උත්පාදන ඒකකය**

ස්වාධීන මුදල් ප්‍රවාහ ජනනය කරන සහ වෙනත් වත්කම්වලින් ස්වාධීනව ජනනය කරන මුදල් ප්‍රවාහයන්ගෙන් සමන්විත කුඩාම වත්කම් සමූහයයි.

**මුදල් හා සමාන දෑ**

වටිනාකම වෙනස්වීම පිළිබඳ සැලකියයුතු අවදානමක් නොමැතිව ව්‍යවහාර මුදල් බවට වහාම පරිවර්තනය කළහැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතා තත්ත්වයක් පවත්නා වූ ආයෝජන.

**සාමූහික ගිවිසුම**

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, මුදල් අමාත්‍යාංශය සහ වෘත්තීය සමිති අතර ඇති කරගන්නා ලද ත්‍රෛපාක්ෂික ගිවිසුම.

**ණය හානිකරණය සඳහා සාමූහිකව අගය කර සිදු කරනු ලබන වෙන් කිරීම්**

මෙය කළඹ හානිකරණ වෙන්කිරීම ලෙසද හැඳින්වේ. තනිව ගත් කළ විශේෂිත වටිනාකමක් නැති හෝ පාඩුවක් ඇතිවී ඇතත් ගිණුම් වාර්තා දිනයට එම වටිනාකම හඳුනා ගත නොහැකි එක සමාන ලක්ෂණයන්ගෙ න් යුතු ණය සමූහයක් වෙනුවෙන් සාමූහික පදනමට කරනු ලබන ණය හානිකරණ අගය ගණනය කිරීමයි. ණය හා අත්තිකාරම්, ණය ආයෝජන කළඹ මත අගයනු ලබයි.

**බැඳියාවන්**

ණය පහසුකම් අනුමත කළ නමුත් වාර්තා කරන දිනට සේවා දායකයන් විසින් භාවිතා නොකරන ලද ප්‍රමාණය.

**සංකේන්ද්‍රණයවීමේ අවදානම**

ප්‍රතිපාර්ශ්වයේ ඇති අසමාන ව්‍යාප්තිය සහ ආයෝජන කළඹ අනාවරණය වී ඇති ව්‍යාපාර අංශය හෝ භූගෝලීය ප්‍රදේශය මත ජනිත වන අවදානම.

**අසම්භාව්‍යයන්**

අනාගත සිද්ධියක් හෝ සිද්ධීන් කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක්, ප්‍රතිඵලය (ලාභ/අලාභ) තහවුරු වන ශේෂපත්‍ර දිනට පවතින තත්ත්වය/අවස්ථාව.

**ආයතනික පාලනය**

සංස්ථාපිත ආයතන පාලනය කිරීමට උපයෝගී කරගනු ලබන ක්‍රියාවලියයි. ආයතන කළමනාකරණය කිරීම හා මෙහෙයවීමේදී විධායක කටයුතු සුපරීක්ෂණය කිරීමේදී සහ අයිතිකරුවන්ට මෙන්ම අනෙකුත්

පාර්ශ්වකරුවන් වෙත වගවීමේ කාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් අධිකාරී බලය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය මෙහිදී සැලකිල්ලට ගැනේ.

**පිරිවැයට ආදායම් අනුපාතය**

ණය පාඩු ප්‍රතිපාදන හැරුණු කොට මෙහෙයුම් වියදම් සහ ගනුදෙනු කළහැකි සුරැකුම්පත්වල අගය පහත වැටීම් සඳහා වන ප්‍රතිපාදන ශුද්ධ ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීම.

**පිරිවැය ක්‍රමය**

ආයෝජනය එහි පිරිවැයට වාර්තාගත කරන ගිණුම්කරණ ක්‍රමයකි. ආයෝජිතයාගේ සමුච්චිත ශුද්ධ ලාභයෙන් බෙදාහැරීම් ලැබුණු ප්‍රමාණය දක්වා පමණක් ආයෝජකයාගේ ආදායම් ප්‍රකාශයේ එම ආයෝජනයේ ආදායම හඳුනාගනී.

**ණය ශ්‍රේණිගත කිරීම්**

සංස්ථාපිත ආයතනයකට එහි ණය පියවීමේ හැකියාව හෝ එය පැහැර නොහැරීමේ සම්භාවිතාව සම්බන්ධයෙන් ස්වාධීන ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් විසින් සිදු කරනු ලබන ඇගයීම.

**ණය අවදානම**

ණයගැතියෙකු හෝ අදාළ පාර්ශ්වයක් විසින් ගිවිසගත් කොන්දේසි ප්‍රකාර කටයුතු කිරීමට අපොහොසත්වීමෙන් පැන නගින තත්ත්වය, ණය අවදානම නැතහොත් පැහැර හැරීමේ අවදානම වශයෙන් සරලව අර්ථ දැක්වේ.

**මුදල් හුවමාරුව (SWAPs)**

මුදල් ඒකක තත්කාලීන විනිමය ගෙවීම් ක්‍රමය යටතේ මිලදී ගැනීම සහ මෙම මුදල් ප්‍රමාණය එම මුදල් ඒකකයෙන්ම ඉදිරි ගිවිසුම් ගෙවීම් ක්‍රමය යටතේ විකිණීම සඳහා සමගාමීව කටයුතු කිරීම මුදල් හුවමාරුවක් වේ.

**පාරිභෝගික තැන්පතු**

ගිණුම් හිමියන් විසින් තැන්පත් කරන මුදල් වේ. මෙම අරමුදල් වගකීම් ලෙස වාර්තා කර ඇත.

**ණය අවදානම අවම කිරීම**

ඇපවීම්, ඇපකර සහ ණය ආරක්ෂණය වැනි ණය අවදානම් අවම කිරීමේ යෙදීමෙන් 'තිරාවරණයන් සහ සම්බන්ධ ණය අවදානම අඩු කිරීමේ ක්‍රමවේදයකි.

## D

**ණය ආපසු ගෙවීමේ සැලසුම්/ණය නැවත උපලේඛනගතකරණය**

නොගෙවූ ණය ගිවිසුම්වල නියමයන් සහ විධිවිධාන වෙනස් කිරීම වේ. මෙය බොහෝ විට සිදුකරනුයේ මුදල් ප්‍රමාණය සහ ණය ගැණුම්කරුගේ ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහාය. එයට ආපසු ගෙවීමේ කාලසටහන් වෙනස් කිරීම මෙන්ම ණය හෝ පොලී ගාස්තු අඩු කිරීම ඇතුළත් විය හැකිය.

**ගනුදෙනු කළහැකි සුරැකුම්පත්**

කෙටිකාලීනව යළි විකිණීමේ අදහස පෙරදැරිව අත්පත් කරගත් හා රඳවාගත් අලෙවි කළ හැකි සුරැකුම්පත්.

**ණයකර**

සංස්ථාපිත ආයතනයක් විසින් නිකුත් කරන ලද මධ්‍යකාලීන ණය උපකරණයකි.

**විලම්භිත බදු**

ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළදී හැර අනෙකුත් මූල්‍ය වර්ෂයන්හිදී ගෙවීමට සිදුවන බදු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වල වෙන්කර තබනු ලබන ප්‍රමාණය.

**ක්ෂය කිරීම**

වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම එහි ඵලදායී ජීවිත කාලය තුළ විධිමත්ව ප්‍රතිපාදනය කිරීම.

**හඳුනානොගත් ඉවත් කිරීම්**

මින් පෙර මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ වලදී හඳුනාගන්නා ලද මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් පොත්වලින් ඉවත් කිරීම.

**පැහැර හැරීම**

ණය හෝ වෙනත් මූල්‍ය වගකීමක් සඳහා වූ ගෙවීම් අනුක්‍රමයෙන් නොලැබීම පැහැර හැරීමකි. ණය සහ අත්තිකාරම් සඳහා වූ ගෙවීම් අඛණ්ඩව මගහැරීම, පැහැර හැරීම ලෙස සලකනු ලැබේ.

**ව්‍යුත්පන්නයන්**

මූල්‍ය උපකරණයක් වන අතර, එහි මිල ඒ සඳහා භාජනය වන වත්කම් වල අගය මත තීරණය වෙයි.

**ණයවර ලිපි (LCs)**

තම ගනුදෙනුකරුවන් වෙනුවෙන් විශේෂිත නියමයන් සහ කොන්දේසි යටතේ නියම කර ඇති මුදල දක්වා බැංකුවෙන් ලබා ගැනීමට තුන්වන පාර්ශවයක් වෙත බැංකුව විසින් බලය ලබා දෙන්නා වූ ලිඛිත පොරොන්දුවයි. ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීමේ අරමුණින් මෙය පිහිටුවා ඇත.

**දේශීය වශයෙන් පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු (d-Sibs)**

දේශීය වශයෙන් පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු යනු අසාර්ථක වීමට ඉඩදිය නොහැකි විශාල බැංකුයි. මෙවැනි බැංකු, අර්බුදයකදී රටේ සැබෑ ආර්ථිකයට අත්‍යාවශ්‍ය බැංකු සේවා අඛණ්ඩව ලබාගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුලු වත්කම් රු.බිලියන 500 ට සමාන හෝ වැඩි බලපත්‍රලාභී වාණිජ බැංකු, දේශීය වශයෙන් පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු ලෙස නම් කර ඇත.

**වට්ටම් අනුපාතය**

අනාගත මුදල් ප්‍රවාහයන් මත වත්මන් අගයක් තැබීමට භාවිතා කරන අනුපාතයකි. මුදලට කාල වටිනාකමක් ඇති බව පිළිබිඹු කිරීම සඳහා අවශ්‍ය වේ.

## E

**සාමාන්‍ය කොටසක ඉපයුම (EPS)**

සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වූ ලාභය සාමාන්‍ය කොටස් ගණනින් බෙදූ විට ලැබෙන අගයයි.

**ආර්ථිකමය එකතුකළ අගය**

ඵලදායිතාව පිළිබඳ මිනුමක් වන අතර, ඒ සඳහා සමස්ත ආයෝජිත හිමිකම් පිරිවැය සැලකිල්ලට ගනු ලැබේ.

**සඵල බදු අනුපාතය**

බදු පෙර ලාභයෙන් බෙදන ලද බදු සඳහා වන ප්‍රතිපාදන.

**සඵල පොළී අනුපාතිකය**

මූල්‍ය උපකරණයෙන් අනාගතයේදී ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් හෝ ලැබීම් අපේක්ෂිත ජීව කාලය තුළ හෝ සුදුසු පරිදි ඊට අනුරූප කෙටිකාලයක් තුළ මූල්‍ය වත්කම්/වගකීම් වල ශුද්ධ ප්‍රවර්තන අගයට අනුව වට්ටම් කිරීමට යොදාගනු ලබන පොළී අනුපාතය.

**හිමිකම් උපකරණ**

ආයතනයේ වගකීම් අඩුකර ගැනීමෙන් පසු වත්කම්වල ඉතිරිව ඇති ප්‍රමාණය.

**හිමිකම් ක්‍රමය**

ආයෝජනය මුලදී පිරිවැයට ගිණුම්ගත කොට ඉන්පසු ඇති වූ වෙනස්කම් මත ආයෝජකයාගේ ගිණුම්වල ශුද්ධ වටිනාකමට/ආයෝජකයාට ඇති හිමිකමට වෙනස්කම් සිදුකොට ගිණුම් තැබීමේ ක්‍රමයයි. ආයෝජකයාගේ ලාභය හෝ අලාභයෙන් ආයෝජිතයාගේ කොටස ආයෝජකයා විසින් ඇතුලත් කරනු ලබයි.

**හිමිකම් අවදානම**

කොටස් වෙළඳපල විචලනයන් හේතු කොට ගෙන හිමිකම් වටිනාකම ක්ෂය වීමට ඇති අවදානම.

**පැහැර හැරීමට නිරාවරණය වීම (EAD)**

මෙය වූ කලී ගිවිසුම් මත හෝ වෙනත් හේතූන් මත ලේඛනගත කර ඇති මුදල සහ පොලිය ආපසු ගෙවීමද ඇතුළුව වාර්තා කළ දිනට පසු නිරාවරණයවීම්හි අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ඉදිරි පැහැර හැරීම් දිනකදී නිරාවරණයවීමේ තක්සේරුවයි.

**අපේක්ෂිත ණය අලාභ (ECLs)**

මෙය ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09- මූල්‍ය උපකරණ යටතේ පවතින ණය අලාභ හානිකරණ කිරීමේ ක්‍රමයකි. මෙය පැහැර හැරීමේ සම්භාවිතාව, පැහැර හැරීමට නිරාවරණය වීම, පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව ලෙස වට්ටම් සහිත නිෂ්පාදිත වේ. අපේක්ෂිත ණය අලාභ, අපක්ෂපාතී මිනුම් වන අතර එය තීරණය කරනු ලබන්නේ විය හැකි ප්‍රතිඵල පරාසයක් තක්සේරු කිරීමෙනි.

**විදේශ විනිමය ලාභය/අලාභය**

විදේශ විනිමය ගණුදෙනු සිදුවන දිනය/ අවසන් වාර්තාගත දිනය සහ පියවීම්/ වාර්තා කරන දිනය අතර විදේශ විනිමය අනුපාත අතර ඇති වෙනස මත විදේශ විනිමය ලාභ උපදී. මෙය විදේශ මුදල් වෙළඳාම මතද උපදී.

# මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂිත වචන මාලාව



## F

**සාධාරණ අගය**

දැනුවත් හා කැමැත්ත දක්වන පාර්ශ්වයන් අතර සිදුවන අතේ දුරින් ගනුදෙනුවකදී ණයක් පියවීම සඳහා හෝ වත්කමක් හුවමාරුකර ගැනීම සඳහා යොදාගත හැකි අගයයි.

**මූල්‍ය වත්කම්**

යම් වත්කමක් එනම් මුදල් හා වෙනත් ඒකකයක හෝ වෙනත් ඒකකයකින් මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලැබීමට ඇති ගිවිසුම්මය අයිතියකි.

**ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන ලද මූල්‍ය වත්කම්**

වත්කම පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුල වත්කමක් පවත්වා ගෙන යනු ලැබේ නම්, කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහයන් රැස් කිරීමට, වත්කම් තබා ගැනීම සහ මූල්‍ය වත්කමේ ගිවිසුම් නියමයන් නිශ්චිත දිනයක් මත පදනම්ව ගෙවනු ලබන මුදල් ප්‍රවාහයන් සඳහා ගෙවනු ලබන ප්‍රාග්ධනය සහ නොගෙවූ ප්‍රාග්ධනය සඳහා වූ පොලිය.

**විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්**

මෙහි විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ ණය සහ හිමිකම් උපකරණ ඇතුළත් වේ. ණය උපකරණයක් මෙසේ ගණනය කරනු ලබන්නේ, එය කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකම මගින් ව්‍යාපාරයේ ආකෘතිය තුල පවත්වාගෙන යනු ලබන්නේ නම් එය නියමිත දිනට නිශ්චිත දිනයන් මත ඉහළ යන මුදල් ප්‍රවාහයන් සඳහා ගෙවනු ලබන ප්‍රාග ʼධනය සහ නොගෙවූ ප්‍රාග්ධන සඳහා වූ පොලියෙනි. හිමිකම් ආයෝජන, විස්තීර්ණ ආදායමේ සාධාරණ අගයට අනිවාර්යයෙන් වර්ගීකරණය කළ හැක්කේ ශ්‍රී.ල.ගි.ප්‍ර. 32 මූල්‍ය උපකරණ ප්‍රමිතයෙහි හිමිකම් නිර්වචනයට අනුව ණයඉදිරිපත් කිරීම සහ විකිණීමට තබා නොමැති, යටතේය.

**ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට හෝ විස්තීර්ණ ආදායමේ සාධාරණ අගයට වර්ගීකරණය කර නොමැති සියලු මූල්‍ය වත්කම් මේ යටතට ගැනේ. මෙය විකිණීමට පවතින හෝ කළමනාකරණයට පවතින සහ ඒවායේ කාර්යසාධනය සාධාරණ අගයේ පදනම මත ඇගයීමට ලක් කෙරේ. එමෙන්ම මේවා රඳවා ගැනීමට කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ මත එකතු නොකළ හෝ කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ මත එකතු නොකළ සහ විකිණීම සඳහා නොපවතින මූල්‍ය වත්කම් යන දෙයාකාරයෙන් පවතින රඳවාගත් මූල්‍ය වත්කම් වේ.

**මූල්‍ය උපකරණ**

එක් පාර්ශ්වයකට මූල්‍ය වත්කමක් සහ අනෙක් පාර්ශ්වයට මූල්‍ය වගකීමක් හෝ හිමිකමක් ජනනය කරනු ලබන ගිවිසුමකි.

**මූල්‍ය වගකීම**

වෙනත් ඒකකයකට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් භාරදීමට ඇති ගිවිසුම් ගත බැදීමක්.

**ඇපයට තබන ලද පවරාගත් දේපල**

පූර්ණ හෝ අර්ධ වශයෙන් ණය තෘප්ත කිරීමෙන් අත්පත් කරගන්නා ලද දේපල.

**විදේශ ව්‍යවහාර මුදල් අවදානම**

දේශීය විනිමය හැරුණු විට අනෙකුත් විදේශ විනිමයන් සමග ගනුදෙනු කිරීමේදි ඇතිවන අවදානම මෙහිදී සැලකේ. විදේශ මුදල් හුවමාරු අනුපාතයේ අහිතකර වෙනස්වීම් මත විදේශ මුදලින් පවතින වත්කම්/වගකීම් වල අගය අඩු විය හැක.

**විදේශ විනිමය ගිවිසුම්**

ව්‍යවහාර මුදල් ඒකකයක් තවත් මුදල් ඒකකයක් සමග අනාගත දිනයක වර්තමානයේ එකඟවන අනුපාතයට හුවමාරු කිරීමට දෙපාර්ශ්වයක් විසින් ඇති කර ගන්නා එකඟතාවයකි.

## G

**පොදු ප්‍රතිපාදන**

තනි පුද්ගල පහසුකම් මත ණය පාඩු තීරණය කළ නොහැකි අවස්ථාවලදී සමුච්චිත නිරාවරණයවීම් හමුවේ ණය හා අත්තිකාරම් මත අනාගතයේදී සිදු වෙතැයි අපේක්ෂිත අලාභයන් ගෙවා දැමීම සඳහා වෙන්කර ඇති අරමුදල්.

**සමූහය**

සමූහය යනු, පරිපාලකය සහ එහි සියලුම පරිපාලිතයන්ය.

**ඇපවීම්**

ණය ගෙවීමට නියමිත තැනැත්තෙකු එය පියවීමට අපොහොසත් වුවහොත් එම වගකීම ඉටු කිරීමට එක් පාර්ශ්වයක (ඇපකරු) පොරොන්දුව මත බැඳෙන ත්‍රෛපාර්ශ්වික ගිවිසුමකි.

**ගෝලීය වාර්තාකරණ මූලපිරීම්**

මෙය ව්‍යාපාර සඳහා උපකාරී වන්නා වූ අන්තර් ජාතික ස්වාධීන ප්‍රමිත ආයතනයක් වන අතර මෙය ව්‍යාපාර, රාජය සහ අනෙක් සංවිධාන සඳහා ඒවායේ ගැටළු වලට බලපාන්නාවූ දේශගුණික විපර්යාස, මානව හිමිකම් සහ දූෂණය වැනි දෑ තේරුම් ගැනීමට සහ සන්නිවේදනයට උපකාරී වන්නා වූ අන්තර්ජාතික ස්වාධීන ප්‍රමිත ආයතනයකි. මෙය තිරසාර සංවර්ධනයක් ලබාගැනීමට ව්‍යාපාරයට අවශ්‍ය වන්නා වූ මාර්ගය ප්‍රවර්ධනය කරයි.

**අඛණ්ඩ පැවැත්ම**

යම් ආයතනයක මූල්‍ය ප්‍රකාශ සකසනු ලබන්නේ එම ආයතනය අපේක්ෂා කළහැකි කාලපරිච්ඡේදයන් සඳහා දිගටම ක්‍රියාත්මක වනු ඇතැයි උපකල්පනය මතය. එබැවින් ආයතනයකට ඈවර කිරීමට හෝ තම මෙහෙයුම්වල ප්‍රමාණාත්මක බව සහ පරිමාව සීමා කිරීමට චේතනාවක් හෝ අවශ්‍යතාවයක් නොමැති බවට උපකල්පනය කෙරේ.

**කීර්තිනාමය**

තනි තනිව හඳුනා නොගත් සහ වෙන් වෙන් වශයෙන් හඳුනා නොගත් ව්‍යාපාර සංයෝජනයකින් අත්පත් කරගත් වෙනත් වත්කම්වලින් මතුවන අනාගත ආර්ථික ප්‍රතිලාභ නියෝජනය කරන වත්කමකි.

## H

**ඉදිරි රැකුම්**

අවාසිදායක මිල වෙනස්වීම් (පොළී අනුපාත සහ භාණ්ඩ මිළ) නිසා ඇතිවන්නා වු අවදානමත් එම අවදානම බලපැවැත්වෙන ගනුදෙනු ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රමෝපායන්ය.

**කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන**

කල් පිරීම තෙක් රඳවා ගැනීමේ අභිලාශය හා හැකියාව ඇති නිශ්චිත වටිනාකමක් සහ නිශ්චිත කල් පිරීමේ කාලයක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්.

**වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය ආයෝජන**

කෙටි කාලීනව (අවුරුදු 1 ක කාලසිමාවට අඩු) යළි විකිණීමේ අදහස පෙරදැරිව අත්පත් කර ගත් ණය සහ හිමිකම් ආයෝජන

**ගුණාත්මක බවින් ඉහළ ද්‍රවශීල වත්කම්**

ආතති කාලසීමාවන් තුළ ද්‍රවශීල හා ශ්‍රී ලංකා මහ බැංකුවට යෝග්‍ය බැඳීම් රහිත වත්කම්. නිදසුන් ලෙස මුදල් හා මහ බැංකුව හා මධ්‍යම බැංකු මත හිමිකම් මීට ඇතුළත්ය.

## I

**අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP)**

පවතින බැංකුකරණ අවදානම් සඳහා අමතර ප්‍රාග්ධනයක් යොමු කරන බවට බැංකුව විසින් සහතික වීමේ ක්‍රියාවලියයි.

**හානිකරණය**

වත්කමක් මගින් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය, එහි ප්‍රවර්තන අගයට වඩා අඩුවූ විට උද්ගත වන තත්ත්වයකි.

**හානිකරණයට ගැලපීම් සිදූකරන ලද වත්කම් කළඹ**

තනිව ගත්කළ වැදගත් වන, හානිකරණය සඳහා ගැලපීම් සිදූකරන ලද ණය කළඹ හා තනිව ගත්කළ වැදගත් නොවන නමුත් දින 180 ට වැඩිකාලයක් ගෙවීම් පැහැර හරින ලදූව ඇති ණය කළඹ මේ නමින් හැඳින්වේ.

**හානිකරණය සඳහා වූ දීමනාව**

සිදූවී ඇති අලාභයක් වෙනුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට ලාභයෙන් සිදුකරන වෙන් කිරීමකි. මෙය තනිව හෝ සාමූහිකව හඳුනාගනු ලබයි.

**හාණිකරණ ගාස්තු/නැවත අයවීම්**

වත්කමකින් ජනිත වන අනාගත වට්ටම් කළ මුදල් ප්‍රවාහයන්ගේ සහ වත්කමේ වර්තමාන වටිනාකම අතර වෙනස.

**හානිකරණ ණය**
සමාගම් විසින් ගිවිසුම් පරිදි ලැබිය යුතු ණය මුදල් ප්‍රමාණ සියල්ල එකතු කිරීමට බලාපොරොත්තු නොවන හෝ එම ණය මුදල් ප්‍රවාහ ගිවිසුම් ප්‍රකාර දිනයට පසු දිනයකදී එකතු කිරීමට බලාපොරොත්තු වීම.

**කේවල හානිකරණය**
තනි තනිව ගත් කල සැලකිය යුතු ගිණුම් සහ සාමූහික හානිකරණයට අයත් නොවන සියලු ගිණුම් අලාභය සඳහා කොතරම් දුරට අනාවරණය වනවාද යන්න තක්සේරු කිරීම.

**අස්පෘශ්‍ය වත්කම්**
අස්පෘශ්‍ය වත්කමක් යනු භෞතිකමය තත්ත්වයක් නොමැති හඳුනාගත හැකි වත්කමකි. ආයතනික බුද්ධිමය දේපල (උදාහරණ ලෙස, පේටන්ට් බලපත්‍රය, පුරස්කාරය වෙළඳ ලකුණ, ව්‍යාපාර පටිපාටි), කීර්තිනාමය, වෙළඳ නාමය ආදිය වර්තමාන වෙළඳපොළේ පොදු අස්පෘශ්‍ය වත්කම් ගණයට අයත් වේ.

**අවිනිශ්චිත පොලී**
අක්‍රීය ණය හා අත්තිකාරම් මත ඇතිවන පොලී.

**පොලී ආන්තිකය**
ප්‍රකාශිත ශුද්ධ පොලී ආදායම, සාමාන්‍ය පොලී උපයන වත්කම්වල ප්‍රතිශතයක් ලෙස.

**පොලි අනුපාත අවදානම**
මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහ වෙළඳපොළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් උච්චාවචනය වීමේ අවදානම.

**පොලී ව්‍යාප්තිය**
පොලී අනුපාතික, විනිමය අනුපාතික, ණය ව්‍යාප්තිය සහ වෙනත් වත්කම් මිල වැනි විචල්‍යයන් නිසා පොලී උපයන වත්කම් හා පොලී සහිත වගකීම් මත උපයන ලද පොලී අනුපාතිකයෙහි සාමාන්‍යය හා ගෙවන ලද පොලී අනුපාතිකයෙහි සාමාන්‍යය අතර ඇති වෙනස නිරූපණය කරයි.

**ආයෝජන දේපල**
භාවිතයට හෝ විකිණීමට හැර හුදෙක් බදු කුලී ඉපයීමට හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම හෝ දෙකම සඳහා (අයිතිකරු විසින් හෝ මූල්‍ය කල්බදු යටතේ බදු ගැණුම්කරු විසින්) තබා ගෙන ඇති දේපල (ඉඩම් හෝ ගොඩනැගිල්ලක්, ගොඩනැගිල්ලකින් කොටසක් හෝ ඒ දෙකම) වේ.

**ආයෝජන සුරැකුම්පත්**
ඉපයීම පිණිස, ප්‍රාග්ධන වර්ධන අරමුණු සඳහා අත්පත් කරගත් හා රඳවාගත් සහ සාමාන්‍යයෙන් කල්පිරීම තෙක් රඳවාගන්නා සුරැකුම්පත්.

**පොලී අනුපාත හුවමාරු**
නිශ්චිත මුල් මුදලක් මත පදනම්ව අනාගත පොලී ගෙවීම සම්බන්ධයෙන් එක් ඉදිරි පොලී ගෙවීම් ප්‍රවාහයක් තවත් වර්ගයේ ඉදිරි පොලී ගෙවීම් ප්‍රවාහයකට හුවමාරු වීමට අදාළ පාර්ශ්ව 2 ක් (පාර්ශ්වකරුවන්) අතර එකඟතාව.

## K

**ප්‍රධාන කළමනාකරණ පිරිස**
අධ්‍යක්ෂවරුන්ද ඇතුළුව ආයතනයේ ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රාකාරව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය සඳහා අධිකාරය සහ වගකීම් ඇති පුද්ගලයින් වේ.

## L

**තෝලන අනුපාතය**
මෙය ස්ථර i ප්‍රාග්ධනය හා මුළු නිරාවරණය වීම් අතර මනින ලද අනුපාතයකි. අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා බැංකු ක්ෂේත්‍රය තුළ අතිරේක තෝලනයන් ගොඩනැගීම සීමා කිරීම මෙම අතිරේක මිනුම් මගින් අපේක්ෂිතය.

**ද්‍රවශීල වත්කම්**
මුදල් ලෙස රඳවාගන්නා ලද හෝ වෙනත් බැංකුවල තැන්පතු විනිමය බිල්පත් සහ භාණ්ඩාගාර බිල්පත් වැනි පහසුවෙන් මුදල් බවට පත් කළහැකි ආකාරයෙන් පවතින වත්කම් මේ මගින් දක්වා ඇත.

**ද්‍රවශිල වත්කම් අනුපාතය**
මහ බැංකුව විසින් ප්‍රකාශිත පරිදි මුදල් හෝ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි ආකාරයෙන් පවතින වත්කම්, අසම්භාව්‍ය වගකීම්ද ඇතුළුව මුළු වගකීම් වලින් බෙදීමෙන් මෙම අනුපාතය ලබාගැනේ.

**ජීවකාල අපේක්ෂිත ණය පාඩු**
මූල්‍ය උපකරණයක අපේක්ෂිත ජීව කාලය තුළ ඇති විය හැකි සියලු පැහැර හැරීම්වල ප්‍රතිඵල ලෙස පැන නගින අපේක්ෂිත ණය පාඩු. "මූල්‍ය උපකරණ" පිළිබඳ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9ට අනුව, මූලාරම්භයේ පටන් ණය පාඩුවල සැලකිය යුතු වර්ධනයක් නොමැති විටකදී හැර අපේක්ෂිත ණය පාඩු දීමනාව, ජීවකාල අපේක්ෂිත ණය පාඩු මත පදනම් විය යුතුය.

**ද්‍රවශීලතා ආවරණ අනුපාතය**
බැංකුව විසින් කෙටිකාලීන වගකීම් ඉටු කිරීම පිණිස පවත්වා ගෙන යනු ලබන වත්කම් මෙයින් අදහස් වේ. මෙම අනුපාතය තුළින් වෙළඳපොළ පුරා ඇති විය හැකි කම්පන ආතති පරීක්ෂාවක් සිදුවේ.

**ද්‍රවශීලතා අවදානම**
ඒකකයක් විසින් මූල්‍ය වගකීම සම්බන්ධ බැඳීම් සපුරාලීම සඳහා මුහුණ පෑමට සිදු වන දුෂ්කරතාවය පිළිබඳ අවදානම.

**ණය සහ ලැබිය යුතු දෑ**
වෙළඳපොළේදී වටිනාකමක් තීරණය වී නොමැති සාම්ප්‍රදායික ණය වත්කම්ය. (උපදවන ලද හෝ අත්පත් කරගත්)

**ගෙවීම් පැහැර හැරීම නිසා ඇතිවන පාඩුව**
ණයගැතියා ගෙවීම් පැහැර හැරීම නිසා ණය හිමියාට සිදුවන අලාභය මුළු මුදලෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීම.

**ණයට වටිනාකම් අනුපාතය**
මුල් උකස් අයිතියෙහි වටිනාකම, සැබෑ දේපළක සමස්ත ඇගයුම් වටිනාකමෙහි ප්‍රතිශතයක් ලෙස ගණිතමය අනුසාරයෙන් ඉදිරිපත් කිරීම. ණය සඳහා යෝග්‍ය අවදානම් මට්ටම තීරණය කිරීමෙහි ලා ණයට වටිනාකම් අනුපාත ප්‍රතිශතය භාවිතා කෙරෙන අතර, එමගින් ණයකරුට ලබා දෙන ණයෙහි නිවැරදි මිල තීරණය කළ හැකි වේ.

## M

**වෙළඳපොළ අවදානම**
පොලී අනුපාත, විනිමය අනුපාත, ණය ව්‍යාප්තිය සහ වෙනත් වත්කම් මිල ආදී වෙළඳපළ විචල්‍යයන්ගේ වෙනස්වීම හේතුකොටගෙන මූල්‍ය උපකරණයන්හි අගය වෙනස්වීම මත අලාභ ඇතිවීමේ හැකියාව.

**ප්‍රමාණාත්මක බව**
යම් ගනුදෙනුවක හෝ සිදුවීමක සාපේක්ෂ වැදගත්කම හෝ යම් ගනුදෙනුවක් හෝ සිදුවීමක් අත්හැරීම හෝ සාවද්‍ය ප්‍රකාශයක් වීම මූල්‍ය ප්‍රකාශන ප්‍රයෝජනයට ගන්නා පාර්ශ්වයන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බාධාවක් සිදු කරන්නේ නම් එය ප්‍රමාණාත්මක ගනුදෙනුවකි.

## N

**ශුද්ධ පොලී ආදායම**
ණය හා සුරැකුම්පත් වැනි බැංකුව සතු වත්කම්වලින් උපයන දේ සහ තැන්පතු ප්‍රතිමූල්‍ය අරමුදල් හා අන්තර් බැංකු ණයගැනීම් යනාදී මූල්‍ය වගකීම් අතර වෙනස වේ.

**ශුද්ධ පොලී ආන්තිකය**
පොලී උපයන සාමාන්‍ය වත්කම් වලින් බෙදන ලද ආන්තිකය, ශුද්ධ පොලී ආදායම ලෙස හඳුන්වයි.

**අක්‍රීය ණය**
තුන් මසකට වඩා වැඩි කාලයක් නොගෙවන ලද ණය.

**නොස්ට්‍රෝ ගිණුම්**
දේශීය බැංකුවක් විසින් විදේශීය රටක එම රටෙහි ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුම් මගින් විදේශ ව්‍යවහාර මුදලින් සිදු කළ වෙළඳ ගනුදෙනු පියවීමට පහසුකම් සැපයේ.

**අක්‍රීය ණය අනුපාතය**
සමස්ත අක්‍රීය ණය හා අත්තිකාරම් ප්‍රමාණය, (විලම්භිත පොලී රහිතව) සමස්ත ණය හා අත්තිකාරම් කළඹින් (විලම්භිත පොලී රහිතව) බෙදන ලද විට ලැබෙන අනුපාතය.

**ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය**

මූල්‍යනය කිරීම සඳහා යොදාගත් වත්කම්වල ද්‍රවශීලතාවය සහ ශේෂපත්‍රයේ සඳහන් නොවන අවිනිශ්චිත බැඳීම්වලට සාපේක්ෂව බැංකුවක් විසින් භාවිතා කරනු ලබන දිගුකාලීන, ස්ථාවර අරමුදල් ප්‍රභවයන් ගණනය කිරීම මෙම අනුපාතයෙන් සිදුවේ.

**පාලනයට යටත් නොවන හිමිකම්/සුළුතර හිමිකම්**

සුළුතර හිමිකම් ලෙසද හඳුන්වනු ලබන පාලනය සම්බන්ධයෙන් තීරණ ගැනීමට හිමිකමක් නොමැති පාර්ශවයයි.

## O

**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙන් පරිබාහිර වූ ගනුදෙනු**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනට හඳුනා නොගත් නමුත් අසම්භාව්‍යයන් හෝ වගකීම් ජනිතවන්නා වූ වත්කම් හෝ වගකීම් මේ නමින් හැඳින්වේ.

**මෙහෙයුම් අවදානම**

ප්‍රමාණවත් නොවන හා අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයන් සහ පද්ධතීන් නෛතික අවදානම් හෝ බාහිර සිදුවීම් නිසා පාඩු ඇති විය හැකි අවදානම.

**විවෘත ණය නිරාවරණ අනුපාතය**

මුළු ශුද්ධ අක්‍රීය ණය සහ අත්තිකාරම්, නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීම මෙම අනුපාතයයි.

## P

**පරිපාලකය**

පරිපාලනය යනු එක් පරිපාලක සමාගමක් හෝ ඊට වැඩියෙන් ඇති ආයතනයකි.

**කළඹ**

රාජ්‍ය සුරැකුම්, ණය හා අත්තිකාරම්, කොටස් ඇතුළු ආයෝජන සංචිතයකි.

**පැහැර හැරීමේ සම්භාවිතාව**

යම් වගකීමකට බැඳී සිටින තැනැත්තා එම වගකීම පැහැර හැරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සෑම ගණුදෙනුකරුවෙක් පිළිබඳවම සිදු කෙරෙන අභ්‍යන්තර තක්සේරුවකි.

**ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය**

සෑම සේවා කාල පරිච්ඡේදයක්ම අතිරේක ප්‍රතිලාභවලට හිමිකම් ලැබීමට ඉඩ සලසන අතිරේක ඒකකයක් ලෙස සලකන සහ අවසාන ගොඩනැගීම සඳහා සෑම ඒකකයක්ම වෙන් වශයෙන් මනිනු ලබන ආයු ගණක තක්සේරු කිරීමේ ක්‍රමයකි. අවිනිශ්චිත තත්වයන් යටතේ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය තීරණ ගැනීමේදී යම් මට්ටමක හෝ අවධානයක් පවත්වාගැනීම මගින් වත්කම් හෝ ආදායම් වැඩියෙන් ප්‍රකාශවීම සහ වගකීම් හෝ වියදම් අඩුවෙන් ප්‍රකාශවීම සිදු නොවනු ඇත.

## R

**වත්කම් වල සාමාන්‍ය මත ආදායම**

වත්කම් වල සාමාන්‍යයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශිත බදු පසු ලාභය.

**හිමිකම් වල සාමාන්‍ය මත ආදායම**

සාමාන්‍ය කොටස් හිමියන්ගේ කොටස් වල ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශිත හිමිකරුවන් වෙත ලැබිය යුතු ශුද්ධ ලාභය.

**සම්බන්ධිත පාර්ශවයන්**

මූල්‍ය හෝ මෙහෙයුම් තීරණ ගැනීමෙහිලා සෘජුව හෝ වක්‍රව එක් පාර්ශවයකට අනෙක් පාර්ශවය පාලනය කිරීමේ හෝ එම පාර්ශවය කෙරෙහි සැලකිය යුතු ආකාරයේ බලපෑමක් ඇති කිරීමේ හැකියාව සහිත පාර්ශවයන්.

**සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු**

මිලක් අයකරන්නේද නැද්ද යන්න ගැන නොසළකා. වාර්තාකරණ ආයතනය සහ සම්බන්ධිත පාර්ශවයන් අතර සම්පත්, සේවා හෝ බැඳීම් හුවමාරුවීමයි.

**ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්**

පොලිය සමඟ ස්ථාවර මිලක් යටතේ පසු දිනයක ආපසු මිලදීගැනීමේ අරමුණෙන් ගැණුම්කරුවන් වෙත අලෙවි කෙරෙන සුරැකුම්.

**ප්‍රතිවිකුණුම් ගිවිසුම්**

බැංකුවක් හෝ ගණුදෙනුකරුවෙක් විසින් සුරැකුම් මිලට ගෙන නිශ්චිත මිලක් යටතේ පසු දිනෙක අලෙවිකරු වෙත සුරැකුම් ආපසු අලෙවි කිරීමට අදාළ ගණුදෙනුවකි.

**ආදායම් සංචිත**

අනාගතයේදී බෙදාහැරීම සහ ආයෝජනය සඳහා වෙන් කර තැබෙන සංචිත.

**අවදානම මත බර තැබූ වත්කම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව වත්කම් වල අගය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් නොවන හා අදාළ අවදානම් මත බර තැබූ සාධක වලින් ගුණකරන ලද වත්කම් වලට සමවන ණය අගය.

**රුපියල් ණය**

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන රුපියල් සුරැකුම්.

**ප්‍රේෂණ**

ප්‍රේෂණ යනු විදේශික ශ්‍රමිකයෙකු විසින් ඔහුගේ හෝ ඇයගේ මව් රටෙහි සිටින පුද්ගලයෙකුට මුදල් මාරු කිරීමකි.

## S

**කොටස්හිමිකරුවන්ගේ අරමුදල්**

1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව සකස් කරන ලද ප්‍රාග්ධන සංචිතයකි.

**ණය අවදානමේ සැලකිය යුතු ලෙස ඉහළයාම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 අනුව ප්‍රථම වරට හඳුන්වාදීමෙන් පසු යම් මූල්‍ය උපකරණයකට අදාළව ආපසු ගෙවීම පැහැර හැරීමේ අවදානම සැලකිය යුතු ආකාරයෙන් ඉහළ ගොස් තිබේද යන්න යම් ආයතනයක් විසින් තක්සේරු කරනු ලැබිය යුතුය. ගිවිසුම්ගත ගෙවීම් දින 30 ක් පසුවන විටත් නොගෙවී නම් ප්‍රථම වරට හඳුන්වාදීමෙන් පසු යම් මූල්‍ය වත්කමක් ආශ්‍රිත ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බවට බිඳ හෙළිය නොහැකි පූර්ව නිගමනයක් සම්මතයේ පවතී.

**මුල් මුදල හා පොලිය ගෙවීම් පමණක් පරීක්ෂාව**
**(Solely Payments of Principal and Capital - SPPI)**

ණය වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන අදියර ලෙස මෙම පරීක්ෂාව සිදු කෙරේ. ප්‍රථම වරට හඳුන්වාදීමේදී මූල්‍ය වත්කමක සාධාරණ අගය "මුල් මුදල" ලෙස නිර්වචනය කෙරෙන අතර මුල් මුදල ආපසු ගෙවීම හෝ වාරිකය හෝ වට්ටම ක්‍රමක්ෂය වීම හේතුවෙන් එය වෙනස්විය හැකිය. මුදලේ කාලීන වටිනාකම සහ මුදල් මුදලෙන් නොගෙවූ කොටස ආශ්‍රිත ණය අවදානම සඳහා වන සැලකිල්ල "පොලිය" ලෙස නිර්වචනය කෙරේ. යම් මූල්‍ය උපකරණයක් මෙම පරීක්ෂාව සමත්වීමෙන් පසු එය "රැස්කිරීම සඳහා රඳවාගත්" ව්‍යාපාරික ආකෘතියට අනුකූල වේ නම් ක්‍රමක්ෂයවූ පිරිවැය මත වර්ගීකරණය කෙරෙන අතර එය "රැස්කිරීම සහ අලෙවිය සඳහා රඳවාගත්" ව්‍යාපාරික ආකෘතියට අනුකූලවේ නම් වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ තක්සේරු කරන ලද සාධාරණ වටිනාකම් මත වර්ගීකරණය කෙරේ. යම් මූල්‍ය උපකරණයක් මෙම පරීක්ෂාව අසමත්වුවහොත් එය සම්පූර්ණයෙන්ම ලාභ හෝ අලාභ මත තක්සේරු කරන ලද සාධාරණ වටිනාකම මත වර්ගීකරණය කළ යුතුය.

**ව්‍යවස්ථාපිත සංචිත අරමුදල**

1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව සකස් කරන ලද ප්‍රාග්ධන සංචිතයකි.

**යටත්කාලීන වගකීම්**

බුන්වත්වීමකදී හෝ ඈවර කිරීමකදී මූල්‍ය උපකරණ නිකුත්කරන්නා විසින් වෙනත් ණයහිමියන්ට ගෙවිය යුතු මුදල් ගෙවීමෙන් පසු ශේෂ වන වගකීම්.

**ආතති පරීක්ෂාව**

විවිධ තීව්‍රතා සහිත අනපේක්ෂිත තත්වයන් දරාගැනීමට බැංකුවට හැකියාව තිබේද යන්න විවිධ මට්ටම් වලින් පෙන්නුම් කරන ඒකාබද්ධ පරීක්ෂාවකි.

**පරිපාලිතය**

එක් ආයතනයක් විසින් පාලනය වන තවත් ආයතනයක්.

**ස්වරූපයට වඩා යථාතත්වය**

ගනුදෙනු සහ අනිකුත් සිද්ධීන් ඒවායේ හුදු නෛතික ස්වරූපය අනුව පමණක් නොව ඒවායේ හරය හා නියම ආර්ථික ස්වභාවය අනුව ගිණුම්ගත කර ඉදිරිපත් කිරීම අවශ්‍යය යන මූලධර්මය.

**හුවමාරු (මුදල් ඒකක)**

ස්ථානීය ගෙවීම් සඳහා යම් මුදල් ඒකක ප්‍රමාණයක් එකවර මිලදීගැනීම සහ ඉදිරි ගෙවීම් සඳහා එම මුදල් ඒකකයේ එම ප්‍රමාණයම අලෙවි කිරීම. එසේ නොමැතිනම්, යම් මුදල් ඒකකයක් ස්ථානීය අලෙවිය සහ ඉදිරිය සඳහා මිලට ගැනීම.

## T

**ස්ථර I ප්‍රාග්ධනය**

සාමාන්‍ය සමකොටස් ස්ථර i ප්‍රාග්ධනය සහ අතිරේක ස්ථර i ප්‍රාග්ධනය යන සාධක වලින් සමන්විත නියාමන ප්‍රාග්ධනයේ එක් අංගයකි. බැංකුවේ මූල්‍ය ශක්තිය මනින ප්‍රධාන මිනුම ස්ථාවර කොටස් හිමියන්ගේ සමකොටස් සහ රඳවාගත් ඉපයීම් හා වෙනත් අතිරික්ත විසර්ජනය කිරීම ඔස්සේ නිර්මාණය කරන ලද හෝ ඉහළ නංවන ලද සංචිත නියෝජනය කරයි.

**ස්ථර II ප්‍රාග්ධනය**

ප්‍රත්‍යාගණන ලාභ, සාමාන්‍ය වෙන් කිරීම් හා නිශ්චිත හිමිකම් ලක්‍ෂණ පෙන්නුම් කරන අනෙකුත් ප්‍රාග්ධන උපකරණ මෙන්ම යටත්කාලීන, කාලීන ණය වැනි දෑ ඇති ණය මීට ඇතුලත්වය.

**සමස්ත ප්‍රාග්ධනය**

සමස්ත ප්‍රාග්ධනය යනු ස්ථර i ප්‍රාග්ධනය සහ ස්ථර ii ප්‍රාග්ධනය යන සාධක දෙකෙහි සමාකරණයයි.

**භාණ්ඩාගාර බිල්පත්**

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙන්දේසි පදනමක් මත නිකුත් කරනු ලබන කෙටි කාලීන ණය උපකරණයකි.

**භාණ්ඩාගාර බැඳුම්කර**

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙන්දේසි පදනමක් මත නිකුත් කරනු ලබන දිගු කාලීන ණය උපකරණයකි.

**මාස 12ක කාලය සඳහා අපේක්ෂිත ණය අලාභ (12 month ECL)**

වාර්තා කරන ලද දිනට පසු එළඹෙන මාස 12 ඇතුළත ඇතිවිය හැකි යම් මූල්‍ය උපකරණයක් ආශ්‍රිත ගෙවීම පැහැර හැරීමේ සිදුවීම් හේතුවෙන් පැන නැගිය හැකි අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන පූර්ණ කාලීන ණය අලාභ වල කොටස.

## U

**ඒකක භාර**

ඒකක ඔප්පුවකට අදාල වගන්ති යටතේ සුරැකුම් වල ආයෝජනය කිරීම සඳහා භාරගැනීම.

**ප්‍රයෝජනවත් ජීව කාලය**

යම් ආයතනයක් විසින් යම් වත්කමක් ප්‍රයෝජනයට ගැනීම පිණිස සූදානම් කරනු ලැබීමට ගත වේ යැයි අපේක්ෂිත කාල සීමාව හෝ යම් ආයතනයක් වෙතින් යම් වත්කමක් ලබාගන්නා බවට අපේක්ෂිත නිමැවුම් සංඛ්‍යාව හෝ ඊට සමාන ඒකක සංඛ්‍යාව.

## V

**එකතු කළ වටිනාකම්**

බැංකු හා වෙනත් සේවා සැපයීම ඔස්සේ, එම සේවා සැපයීම සඳහා දරණ ලද පිරිවැය අඩු කිරීමෙන් පසු ජනනය වූ ධනය. එකතු කළ වටිනාකම් සේවකයන් හා ප්‍රාග්ධන සැපයුම්කරුවන් සඳහා මෙන්ම පුළුල් කිරීම සහ වර්ධනය සඳහා රඳවාගත් සහ බදු ලෙස රජය සඳහාද වෙන් කෙරේ.

**අවදානමේදී වටිනාකම**

පොලී අනුපාත, මිල උච්චාවචනයන් වැනි වෙළඳපොළ අවදානම් සාධක ආශ්‍රිත අහිතකර විචලන වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අවදානම් තත්ත්ව හේතුවෙන් කිසියම් නිශ්චිත කාලපරාසයකදී හා දී ඇති විශ්වාසනීය මට්ටමකදී ජනිත වන අලාභ තක්සේරු කිරීම සඳහා යොදාගන්නා ක්‍රමවේදයකි.

## Y

**කල්පිරීමේ ඵලදා අනුපාතය**

අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම, සුරැකුම් වල වත්මන් මිල සමග සමාන වන වට්ටම් අනුපාතිකය

# ආයතනික තොරතුරු



**බැංකුවේ නම**

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

**නෛතික ස්වරූපය**

1971 අංක 30 දෙරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පණත මගින් ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද රජයට අයත් බැංකුවක් වන අතර, 1988 අංක 30 දරණ බැංකු පණත මගින් ඊට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය පිරිනමන ලදී.

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**

"ඉතිරිකිරීමේ මන්දිරය",
නො. 255, ගාලු පාර,
කොළඹ 03, ශ්‍රී ලංකාව.
දුරකථනය: +94 11 257 3008-15
ෆැක්ස්: +94 11 257 3178
පාරිභෝගික ක්ෂණික ඇමතුම් +94 11 237 9379
කෙටි අංකය: 1972
ඊමේල්: nsbgen@nsb.lk
වෙබ් අඩවිය: http://www.nsb.lk
ස්විෆ්ට් අංකය: NSBALKLX
බැංකු අංකය: 7719
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 409046266

**සේවා මධ්‍යස්ථාන**

ශාඛා - 262
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර - 417

**නියෝජිතායතන ජාලය**

දිවයින පුරා පැතිර පවතින තැපැල් කාර්යාල 652 ක් සහ උපතැපැල් කාර්යාල 3,354

**දේශීය ශ්‍රේණිගත කිරීම**

(SL) AAA (stable) ණය ශ්‍රේණිගත කිරීම ලංකා රේටින් ඒජන්සි (LRA)

**අධ්‍යක්ෂ මණ්ඩලය**

ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා - සභාපති
ජුඩ් නිලුක්ෂාන් මහතා - අධ්‍යක්ෂ (නිල බලයෙන් පත්)
එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා අධ්‍යක්ෂ - (නිල බලයෙන් පත්)
දුෂ්‍යන්ත බස්නායක මහතා - අධ්‍යක්ෂ
අශේන් ජයසේකර මහතා - අධ්‍යක්ෂ

**සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී**

ශෂී කණ්ඩම්බි මිය

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

අනුපමා මුහන්දිරම් මිය

**අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)***

අශේන් ජයසේකර මහතා - සභාපති
දුෂ්‍යන්ත බස්නායක මහතා
ජුඩ් නිලුක්ෂාන් මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)**

එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා - සභාපති
ජුඩ් නිලුක්ෂාන් මහතා
අශේන් ජයසේකර මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)***

එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා - සභාපති
ජුඩ් නිලුක්ෂාන් මහතා
දුෂ්‍යන්ත බස්නායක මහතා

**අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)**

ජුඩ් නිලුක්ෂාන් මහතා - සභාපති
එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා
අශේන් ජයසේකර මහතා

**හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව (BNNEC)**

ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා - සභාපති
දුෂ්‍යන්ත බස්නායක මහතා
ජුඩ් නිලුක්ෂාන් මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව (BITSC)**

දුෂ්‍යන්ත බස්නායක මහතා - සභාපති
එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා
අශේන් ජයසේකර මහතා

**අනුකූලතා නිලධාරී**

අයි කේ එල් සසී මහේන්ද්‍රන් මිය

**මහජන තොරතුරු නිලධාරී**

(2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුව)
කර්ණිකා ජයතිලක මිය

**විගණකවරුන්**

විගණකාධිපති

**ගිණුම්කරණ වසර**

දෙසැම්බර් 31

**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිපාලිත සමාගම් සමාගමේ නම**

සී.ස. එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**

අංක 400, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකා.
දුරකථනය: +94 11 2425010-12, +94 11 256 5956
ෆැක්ස්: +94 11 257 4387
ඊමේල්: nsbfmc@nsb.lk
ස්විෆ්ට් අංකය: NSBFLKLX
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 134008512

**ප්‍රධාන විධායක නිලධාරී**

ඩී එල් පී අබයසිංහ මහතා

**විගණකවරුන්**

විගණකාධිපති

**සමාගමේ ලේකම්**

ෆර්සානා අනීෆ් මිය

**සමාගමේ නම**

සී.ස. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**

අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකා.
දුරකථනය: +94 11 267 4700/1/2/3, 269 1721-2
ෆැක්ස්: +94 11 267 4705/6
ඊමේල්: info@slsbl.lk
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 134013370

**සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී**

එම් ඒ එස් ප්‍රනාන්දු මහතා

**විගණකවරුන්**

විගණකාධිපති

**සමාගමේ ලේකම්**

ඩී ආර් එන් යූ පෙරමුණ මිය

GSARN©
www.gsarn.org
Global Standard Annual Report Number©
LKA8355NSBXX0240000S111

SMART MEDIA
The ANNUAL REPORT Company
Produced by Smart Media,
a GHG-neutral company
since 2011

NSB

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

"ඉතිරිකිරීමේ මන්දිරය"
නොː 255, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
දුරකථනයː +94 11 257 3008-15
ෆැක්ස්ː +94 11 257 3178
ඊමේල්ː nsbgen@nsb.lk
වෙබ් අඩවියː http://www.nsb.lk

ISBN 978-624-5790-10-4

9 786245 790104

Scan the QR code with your smart device or login to https://www.nsb.lk/

Follow NSB